එස් එස් කුමාරි

**රියදුරු**
ආර් එම් එන් ප්‍රේමතිලක
කේ බී වී යූ එන් ගුණසේන
ජී ජී එම් රණසිංහ
එස් පී ධම්මික තරංග
ටී කේ ඒ කුමාරසිංහ
ඩබ්ලිව් ඩී විජේසූරිය
පී ඩී ඩී පෙරේරා
ඒ පී ජී ඒ අන්වාරම
සී පී කරුණානායක
ඩී රත්නකුමාර්
එන් ප්‍රදීපන්
ජී පී ජේ ජේ ගලහිටියාව
ආර් දිනේෂ්කුමාර්
ඒ ජේ එම් ඒ ජයසේකර
ඩබ්ලිව් එම් ඩී එන් විජේසිංහ

**පොදු සේවක**
ඩබ්ලිව් එම් එස් ජේ වීරසිංහ (2022 දෙසැම්බර් දක්වා)
එස් එල් ජෝසප්
එම් දසරදන්
ඒ මුනිෂ්වරන්

## මෝටර් ගරාජය

**මෝටර් කාර්මික**
ඒ පී ජී අයි එච් අන්වාරම (NVQ 4)

**පොදු සේවක**
වී ක්‍රිෂ්ණමූර්ති
මෝහනසෙල්වම්

## මූල්‍ය අංශය

**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී (රාජකාරි ආවරණ) /ගණකාධිකාරී**
එම් වී මෝහන් (APFASL)

**ගණකාධිකාරී**
ඩබ්ලිව් එම් ටී බී වීරසේකර (APFASL)

**ගිණුම් නිලධාරී**
ඩබ්ලිව් ඒ නිශාන්ත
එම් එස් කේ ආර් ජයලත්, BBM (Sp) HRM (Kelaniya, Sri Lanka), Intermediate (ICASL)

## ගබඩාව

**ගබඩා සහකාර**
පුරප්පාඩු වී ඇත

**කළමනාකරණ සහකාර**
ඒ ඒ ඒ පී අමරතුංග (ගිණුම්)
ආර් එම් එන් එම් ආරියරත්න (ගිණුම්)
ඩී එස් සී වීරසූරිය (ගිණුම්)
එච් පී පී සංජීව (ගිණුම්)
එච් එම් සී පී කේ ජයතිලක (ලිපිකරු)
ජී ඒ ඩී ගාල්ලගේ (ලිපිකරු)
අයි ජී එන් ඩී බණ්ඩාර (දත්ත සටහන්කරු)
ජේ ඒ පී එස් ජයසිංහ (අයකැමි)
එස් ඩී කේ නදීශානි (ලිපිකරු)

**පොදු සේවක**
පී එස් රාජු
පී කේ සරත්
කේ ජෙගතීස්වරන්
පී මුතුකුමාර්
එස් එන් එන් සමන්තිකා
එස් රාජනායගම්

## අභ්‍යන්තර විගණන ඒකකය

**අභ්‍යන්තර විගණක**
වී ආර් පී එච් කරුණාතිලක, BSc (Sp) in Finance (Sri Jayewardenapura, Sri Lanka)

**අභ්‍යන්තර විගණක නිලධාරී**
අයි ජී එන් සී ජයවීර, AAT Final (Association of Accounting Technicians Sri Lanka)

**කළමනාකරණ සහකාර**
ඩී එම් ආර් එල් දිසානායක

**පොදු සේවක**
ආර් මනෝහරන්

## තේ පර්යේෂණායතන පහතරට පර්යේෂණ, උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, රත්නපුර

**ප්‍රධානි**
ආචාර්ය එම් ඒ විජේරත්න, BSc Agric (Ruhuna, Sri Lanka) PhD (London,UK)

**පරිපාලන නිලධාරී**
බී එම් බී බස්නාගොඩ, BA (Sp) Mass Media (Colombo, Sri Lanka)

**තාක්ෂණික නිලධාරී (සිවිල්)**
කේ ගුණවර්ධන

**කළමනාකරණ සහකාර**
කේ ඒ එස් පියතිලක, (ලිපිකරු)
කේ ඒ ඩී සුදත් ප්‍රදීප්, (ගිණුම්)

**විදුලි කාර්මික (සිවිල්)**
ජේ එම් පී ඩබ් ජයවීර, National Certificate of Technology - Electrical and Electronics Engineering (Technical Collage, Badulla) (2022 මාර්තු සිට)

**ජලනළ කාර්මික**
පුරප්පාඩු වී ඇත

**ආගන්තුක නිවාස භාරකරු**
එම් ඩී සරත්

**රියදුරු**
පී ඩී ආර් ද සිල්වා
එස් එම් සී එම් සේනානායක
ජී වී එස් ජයලත්
ජේ ටී එස් වීරක්කොඩි
කේ එම් ටී ටී බණ්ඩාර

**පොදු සේවක**
ඒ කේ ජේ අතුකෝරල (2022 නොවැම්බර් දක්වා)
ඩී වී එස් පී දෙනගම
ඩබ් එම් ඩී සී පෙරේරා
එච් ඒ ටී කේ කේ සුමනවීර
අයි ඩී සුබසිංහ
පී ඩී එන් බී ඩී සිල්වා
ඒ එම් යූ ලියනගේ
එම් දේවරාජ්
ආර් චන්ද්‍රකුමාර්
කේ පී ටී කරුණාරත්න
කේ ඒ කරුණාතිලක
එම් පාර්වතී
කේ පී එන් ධර්මදාස
එස් මානික්කවාසගම්
එම් මහේස්වරන්
එස් සෙල්වේන්ද්‍රන්
ජී කේ ප්‍රියන්ත
ජී ජී චන්ද්‍රකීර්ති (2022 දෙසැම්බර් දක්වා)
එස් සුරේෂ්කුමාර්

සී සංජීවකුමාර
ජී ඒ එම් මධුරංග
පී යූ ඒ පතිරණ
ආර් එම් සී පී ඩයස්
ජී ටී ජී ජේ පෙරේරා
එන් පුෂ්පරාජ්
පී එස් ශිවශක්තිකුමාර
වී රිශේන්ද්‍රන්

## තේ පර්යේෂණායතන මැදරට පර්යේෂණ, උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, හන්තාන

**ස්ථාන භාර නිලධාරී / උපදෙස් නිලධාරී**
කේ ආර් ඩබ්ලිව් බී කහඳව, BSc Agric (Peradeniya, Sri Lanka) MSc (PGIA Peradeniya, Sri Lanka)

**කළමනාකරණ සහකාර**
ආර් එම් ඩී කේ රත්නායක, (ලිපිකරු)

**විදුලි කාර්මික**
ජේ එම් ආර් කේ බණ්ඩාර

**ආගන්තුක නිවාස භාරකරු**
ඩබ්ලිව් එම් ඒ වීරවන්නි

**රියදුරු**
ජී පද්මසිරි
එම් ජී බී එස් ප්‍රියශාන්ත
යූ කේ ඒ බී උඩුවැල්ල
ඩබ්ලිව් ඒ ඩී පී යූ අත්තනායක

**පොදු සේවක**
ආර් එම් ජේ බී රත්නායක
ඩබ්ලිව් ආර් ජී එන් ඩී වික්‍රමසිංහ
ඒ ඩී ජී එස් ප්‍රේමරත්න

## තේ පර්යේෂණායතන උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, දෙනියාය

**ප්‍රධානී/උපදෙස් නිලධාරී**
පී කේ ආර් සී ඊ මුණසිංහ, BSc Agric (Wayamba,Sri Lanka) MSc (PGIA, Peradeniya, Sri Lanka)

**කළමනාකරණ සහකාර (ස්ථාන)**
පුරප්පාඩු වී ඇත

**රියදුරු**
එම් ඩී චන්දන

**ආගන්තුක නිවාස භාරකරු**
ආර් පී ශිරාන් (NVQ 3)

**තේ පර්යේෂණායතන උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොට්ටව**

**ස්ථාන භාර නිලධාරී /ව්‍යාප්ති නිලධාරී**
පී ඩී ද අල්විස්, BSc Agric (Ruhuna, Sri Lanka)

**කළමනාකරණ සහකාර (ස්ථාන)**
වයි සී එන් ගුණරත්න
ඩබ් එස් ටී විජේසිංහ (2022 අගෝස්තු සිට)

**ක්ෂේත්‍ර සුපරීක්ෂක**
පී එස් කුලසිරි (2022 දෙසැම්බර් දක්වා)

**සංචාරක නිවාස භාරකරු**
කේ එම් ජගත් ප්‍රසන්න

**රියදුරු**
කේ ඩබ්ලිව් කපිල චමින්ද

**පොදු සේවක**
ඩී ජී චන්ද්‍රලාල්
ඩබ්ලිව් ගාමිණී

**තේ පර්යේෂණායතන උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම**

**ස්ථාන භාර නිලධාරී / ව්‍යාප්ති නිලධාරී**
එච් ජයවීර, MBA (AeU, Malaysia)

**කළමනාකරණ සහකාර (ලිපිකරු)**
ඒ ඒ එච් චින්තක
ටී සී සමන්මලී

**රියදුරු**
එස් ඒ සී සුරවීර

**පොදු සේවක**
ජී ඒ ඒ එන් ගුරුසිංහ
එම් විජේතිලක
ජී ඩී කේ ලක්මිණී

**තේ පර්යේෂණායතන උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර**

**ස්ථාන භාර නිලධාරී/ ව්‍යාප්ති නිලධාරී**
ඒ අබේසූරිය, BSc Agric (Peradeniya, Sri Lanka)

**රියදුරු**
කේ එම් ටී සෙනෙවිරත්න

**ආගන්තුක නිවාස භාරකරු**
එම් රාමසාමි (NVQ 3)

**පොදු සේවක**
ආර් එච් සී නිසංසල, National Diploma in Plantation Management (NIPM)
එස් එම් පී රම්‍යලතා
ආර් ඩබ්ලිව් එස් සී කුමාර
එස් එම් චූලරත්න

# පර්යේෂණ කඩඉම්

## බෝග වැඩි දියුණු කිරීම



**තේ වගාකරුවන් මුහුණදෙන නව අභියෝගයන්ට ගැලපෙන පරිදි, ඉහළ ඵලදායීතාවකින් හා ගුනාත්මයකින් යුත් ප්‍රභේද නිපදවීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයෙහි සැලසුම් හා අරමුණු පදනම් කර ගනිමින් "බෝග වැඩි දියුණු කිරීම උදෙසා තේ අභිජනනය" යන තේමාව යටතේ පර්යේෂණ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අතර එම පර්යේෂණවල ට අයත් සියලුම ව්‍යාපෘතිවල 2022 වසරේ දී අත්පත් කරගත් ප්‍රගතිය මෙම වාර්තාවෙ හි අඩංගු කර ඇත.

මෙම ව්‍යාපෘති අතරින්, A1, A2, A3 සහ A4 යන ප්‍රධාන ව්‍යාපෘතිවල මූලික ඉලක්කය වනුයේ දැනට නිර්දේශිත තේ ප්‍රභේදයන්හි නොමැති වඩාත් හිතකර ගුණාංග අඩංගු කර, වැඩි දියුණු කරන ලද නව තේ ප්‍රභේද වගා කරුවන් වෙත ලබා දීමයි. ඒ සමගම කෘෂි-පාරිසරික කලාප පදනම් කොට ගත් නව ප්‍රභේද නිර්දේශයක් තුලින් වගා කරුවන්හට තම ඉඩම් සදහා ඉතාමත් යෝග්‍ය තේ ප්‍රභේද තෝරා ගැනීමට වැඩි අවස්ථාවක් ලබාදීමට ද මෙමගින් බලාපොරොත්තු වේ.

A5 ප්‍රධාන ව්‍යාපෘතිය, ආන්තික ඉඩම් සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යයක් ලෙස වැඩි දියුණු කල තේ බීජ හඳුන්වාදීම ඉලක්ක කොට ගෙන ක්‍රියාත්මක වේ.

A51 ප්‍රධාන ව්‍යාපෘතිය තේ ජාන ප්ලාස්මය (Germplasm) සංරක්ෂණ, චරිතායනය සහ ඇගයීම තුලින් වැඩි දියුණු කල තේ ප්‍රභේද නිපදවීම සඳහා ජාන ප්ලාස්මය උපයෝගී කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

නවීන කෘෂිකාර්මික පිළිවෙත් සහ ඉහළ යෙදවුම් සඳහා වැඩි වශයෙන් යොමු නොවන කුඩා තේ වතු හිමියන් සඳහා වඩාත් උචිත තේ ප්‍රභේද පිළිබඳ මූලික පරීක්ෂා කිරීම වෙනුවෙන් A52 ප්‍රධාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## නව තේ ප්‍රභේද නිපදවීම

**ප්‍රධාන ව්‍යාපෘති A1. උඩරට තේ වගාකරන කලාපයට අයත් කෘෂි පාරිසරික කලාප සඳහා ඉහළ අස්වැන්නක් සහ ඉහළ නිමි තේ ගුණාත්මයක් සහිත, බුබුළු අංගමාරයට, කඳ ගුල්ලාට, වටපණුවන්ට, මුල් රෝගවලට හා කඳ පාමුල පිළිකාවලට (Phomopsis) ප්‍රතිරෝධී, නව තේ ප්‍රභේද නිපදවීම.**

**ව්‍යාපෘති A 1.1. උඩරට තේ වගාකරන කලාපය සඳහා මුහුම්කරණය හා වරණය යන සම්ප්‍රදායික අභිජනන ක්‍රමවේදයන් මෙන් ම ඉන් ඔබ්බට ගිය සම්ප්‍රදායික නොවන අභිජනන ක්‍රමවේදයන් ද උපයෝගී කරගෙන වැඩි දියුණු කල තේ ප්‍රභේද නිපදවීම.**

**පාලිත තත්ත්ව යටතේ දෙමුහුම්කරණය:**

<u>**2022 වසරේ දෙමුහුම් අභිජනන වැඩසටහන**</u>

මෙම වැඩසටහන යටතේ TRI 2043, ප්‍රභේදයෙන් ලබාගත් ගැමා කිරණ වලට නිරාවරණය කිරීම හරහා විකරණයන්ට භාජනය කරන ලද හා සාමාන්‍ය පරාග භාවිතා කරමින් මුහුම් 499ක් සිදු කරන ලදී. ගැමා කිරණ වලට නිරාවරණය කරන ලද පරාග භාවිතයෙන් මුහුම්, (crosses) (399 සාමාන්‍ය පරාග භාවිතයෙන් මුහුම් 100) කෙසේ වුව ද, ප්‍රරෝහණ ප්‍රතිශතය ඉතා අඩු වීම හේතුවෙන් විකරණය කරන ලද පරාග භාවිතයෙන් සිදුකල මුහුම් සියල්ල අසාර්ථක වූ අතර, සාමාන්‍ය පරාග භාවිතයෙන් සිදු කල මුහුම්වල ද සාර්ථකත්වය අවම විය. මෙහි දී ප්‍රරෝහණ ප්‍රතිශතය සුක්‍රෝස් පරීක්ෂාව මගින් තහවුරු කර ගනු ලැබීය. වැඩසටහනෙහි සාරාංශයක් වගුව 1 හි අන්තර්ගත කර ඇත.

වගුව 1. 2022 වසරේ දෙමුහුම් අභිජනන වැඩසටහන මගින් සිදුකරන ලද මුහුම්වල විස්තර

| සංයෝජනය | සිදුකල මුහුම් ප්‍රමාණය | සාර්ථක වූ මුහුම් ප්‍රමාණය |
|---|---|---|
| A: PBGT 41 x TRI 2043 | 278 | 0 |
| B: PBGT 49 x TRI 2043 | 67 | 0 |
| C: PBGT 48 x TRI 2043 | 54 | 0 |
| පාලක | | |
| PBGT 41 x TRI 2043 | 87 | 9 |
| PBGT 49 x TRI 2043 | 10 | 0 |
| PBGT 48 x TRI 2043 | 3 | 1 |

**2021 වසරේ දෙමුහුම් අභිජනන වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ ගැමා කිරණවල ට නිරාවරණය කිරීම හරහා විකරණයන්ට භාජනය කරන ලද TRI 2043 ප්‍රභේදයෙහි පරාග භාවිතා කරමින් 2021 වසරෙහි සිදු කරන ලද මුහුම් 144 හි මූලික වර්ධනය අවම වීම හේතුවෙන් අසාර්ථක විය.

**2020 වසරේ දෙමුහුම් අභිජනන වැඩසටහන**

2020 වසරේ මුල් කාර්තුව තුළ දී පැවති වියළි කාලගුණික තත්වය නිසා පරාග ප්‍රරෝහණ ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක (<12%) පැවතුන අතර එම කාරණය හේතුකොට ගෙන, 2020 වසරේ දී මුහුම් කටයුතු සිදුකිරීමට නොහැකි විය.

**2019 වසරේ පිළි මුහුම් අභිජනන වැඩසටහන (Backcross Breeding)**

මෙම වැඩසටහන මගින් නිපැයූ 2021 ජූලි මාසයේදී ශාන්ත කූම්බ්ස් වතුයායේ ක්ෂේත්‍ර අංක 9හි ස්ථාපනය කරන ලද බීජ පැළ 88ක අස්වනු නෙළීම දක්වා සිදු කර ගෙන යනු ලබන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**2018 වසරේ පිළි මුහුම් අභිජනන වැඩසටහන (Backcross Breeding)**

මෙම වැඩසටහන මගින් නිපැයූ ශාක වල පළමු කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී .

**2017 වසරේ පිළි මුහුම් අභිජනන වැඩසටහන**

මෙම වැඩසටහන මගින් නිපැයූ ශාකවල පළමු කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී .

**2016 වසරේ දෙමුහුම් අභිජනන වැඩසටහන**

මෙම වැඩසටහන මගින් නිපැයූ ශාකවල පළමු කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී .

**2014 සහ 2015 වසරවල දෙමුහුම් අභිජනන වැඩසටහන්**

මෙම වැඩසටහන් මගින් නිපැයූ ශාකවල පළමු කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී .

**2012 සහ 2013 වසරවල දෙමුහුම් අභිජනන වැඩසටහන්**

මෙම වැඩසටහන් මගින් නිපැයූ ශාකවල ,දෙවන කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී .

**2004, 2005, 2006, 2007 සහ 2008 වසරවල දෙමුහුම් අභිජනන වැඩසටහන් මගින් නිපැයූ ශාක**

මෙම වැඩසටහන් මගින් නිපැයූ ශාක අඩංගු පිරික්සුම් ස්ථානවල සතිපතා අස්වනු නෙලීම් හා අධීක්ෂණ කටයුතු කරගෙන යනු ලබන අතර ඒවායින් තෝරා ගත් ශාක ප්‍රභේද හන්තාන, පස්සර, රත්නපුර යන තේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල පිහිටුවා ඇති පළමු අදියර (Phase 1) පිරික්සුම් ස්ථාන වල ස්ථාපනය කර ඇත (වැඩි විස්තර සඳහා A2.1, A3.1 සහ A4.1 ව්‍යාපෘති යටතේ බලන්න).

එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, කේ කේ රණවීර, සී ජේ රැටියලගේ,
එච් ඩබ් එම් එම් ජයරත්න, එන් එන් දයාරත්න සහ ජේ එම් කේ උදයංගනී

**අභිජනන පෙළ ඇගයීම - පළමු සහ දෙවන අදියර පර්යේෂණ නියැදි (Phase I and Phase II) - උඩරට කලාපය**

**පළමු අදියර (Phase I) පර්යේෂණ නියැදි**

මෙම කලාපයේ පිහිටුවා ඇති පළමු අදියර පිරික්සුම් ස්ථාන වල මූලික විස්තර සහ 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් වගුව 2 හි අන්තර්ගත කර ඇත.

වගුව 2. පළමු අදියර (Phase I) පිරික්සුම් - උඩරට කලාපය
(සියලුම පිරික්සුම් ස්ථාන ශාන්ත කූම්බ්ස් වතු යායේ ක්ෂේත්‍ර අංක 13 හි පිහිටා ඇත)

| නියැදි අංකය | ස්ථාපිත වසර | ප්‍රභවය * | පරික්ෂා කරන දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|
| VP 92 | 2011 | D, E, F, G | 74 | TRI 3019, TRI 4052 | තෙවන කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| VP 93 | 2011 | H | 24 | TRI 2025, TRI 3072, TRI 4052, PK 2 | තෙවන දෙවැනි  කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| VP 94 | 2015 | L | 119 | K136, TC10, TRI 4071, TRI 4052, DEL40, DUN7, 2025 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| VP 95 | 2016 | K | 88 | TRI 2025,  TRI 3019, TRI 4052 , TRI4071 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම ආරම්භ කරනු ලැබීය |
| VP 96 | 2020 | O | 84 | TRI 26. TRI 2043, TRI 3055 | අස්වනු නෙලීම දක්වා සිදු කර ගෙන යනු ලබන ක්‍රියාකාරකම් |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

## වතු ප්‍රභේද වරණය කිරීමේ (තෝරා ගැනීමේ) වැඩසටහන

<u>ෆෙයාලෝන් වතුයායෙන් තෝරා ගන්නා ලද ප්‍රභේද</u>

තෙවන  කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කරන ලදී

<u>ග්ලේනනෝර් වතුයායෙන් තෝරා ගන්නා ලද ප්‍රභේද</u>

පස්සර (UVP 12)  හා හන්තාන (MVP 14)  ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි පිහිටුවා ඇති දෙවන අදියර (Phase II)  පිරික්සුම් දෙකක, දෙවන කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කරන ලදී (වැඩි විස්තර සඳහා ව්‍යපෘති A2.1 සහ  A 3.1 යටතේ බලන්න).

එම් ඒ බී  රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, කේ කේ  රණවීර, සී ජේ රැටියලගේ,
එච් ඩබ් එම් එම්  ජයරත්න, එන්  එන්  දයාරත්න සහ ජේ එම් කේ උදයංගනී

## තේ ශාකයේ පටක/ශාක කොටස්වල, ගැමා කිරණ  භාවිතයෙන් සිදුකරන ප්‍රේරිත විකරණ (Induced Mutations) බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන සඳහා භාවිතා කිරීම

**අරමුදල් ප්‍රදානය: ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය (IAEA), වියානා, ස්විට්සර්ලන්තය**

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ප්‍රේරිත විකරණ හරහා සිදුවන සාධනීය වෙනස්කම්, තේ ශාකයේ සම්ප්‍රදායික අභිජනන වැඩසටහන වඩාත් වේගවත් කිරීම සඳහා යොදාගැනීමයි. 2022 වසර තුළ දී තේ ප්‍රභේද  03කින් (TRI 2025, TRI 2043 සහ  KEN16/3) ලබාගත් බීජ 1636 ක් ගැමා කිරණවලට) මාත්‍රා කිහිපයකින් $LD_{50}$ – 25Gy  සිට  150Gy  දක්වා නිරාවරණය කරන ලදී. මෙම මාත්‍රා අතරින්, 25  Gy මාත්‍රාව  සාපේක්ෂව වඩාත් සාර්ථක බව පැහැදිලි විය. ගැමා කිරණවලට  නිරාවරණය කිරීමෙන් පසුව  මෙම බීජ අතුරින් 87 ක් ජීව්‍ය තත්වයෙන් පැවති අතර එම බීජ තවාන් මලුවල සිටුවා, වර්ධනය පිළිබඳ නිරීක්ෂණයන් සිදුකරමින් පවතී.

රෝපණ ද්‍රව්‍ය ගැමා කිරණවලට නිරාවරණය කිරීම ගන්නෝරුව පිහිටි, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී සිදු කරනු ලැබීය.

එම් ඒ බී  රණතුංග, කේ කේ  රණවීර, සී ජේ රැටියලගේ, එච් ඩබ් එම් එම්  ජයරත්න,
එන්  එන්  දයාරත්න සහ ජේ එම් කේ උදයංගනී (තේ පර්යේෂණ ආයතනය)
ජගත් සේනානායක (උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - HORDI, ගන්නෝරුව)
සහ ශෝභා සිවශංකර්, අංශ ප්‍රධානී, ශාක අභිජනන හා ප්‍රවේණි විද්‍යා අංශය,
ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය ( IAEA)

**ව්‍යාපෘතිය A 1.2. බුබුළු අංගමාරය සහ රතු මුල් රෝගය සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද අනාවරණය**

**VP 96 අදියර I හි බුබුළු අංගමාරය සඳහා සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද අනාවරණය**

අතු රිකිලි මගින් ප්‍රචාරණය කරන ලද ප්‍රවේශ (accessions) 84 කින් සමන්විත TRI 3055 X TRI 2043 හි I අදියර ජනිතයින් (Phase I population) සහ TRI 2043, TRI 3055 පරීක්ෂණ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත. අත්හදා බැලීම් කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

පී ඩී සින්නයියා, ඩී ජී එන් පී කරුණාජීව, ආර් පී වී ටී චන්ද්‍රලාල්,
කේ එල් එස් සී ගුණවර්ධන සහ ශාක අභිජනන අංශය

**ව්‍යාපෘතිය A 1.3. උඩරට ප්‍රදේශ සඳහා කඳ ගුල්ලාගේ (SHB) හානියට ප්‍රතිරෝධී (ඔරොත්තු දෙන) නව ප්‍රභේද හඳුනා ගැනීම**

ශාක අභිජනන අංශය විසින් නව ප්‍රභේද සඳහා වන පර්යේෂණාත්මක බිම් කොටස් නඩත්තු කරනු ලබන අතර ඇගයුම් රඳා පවතින්නේ කප්පාදුවේ දී පවතින තේ කඳ ගුල්ලාගේ ස්වභාවික ගහන ඝනත්වය මත ය.

එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල, එස් පී ආර් විජේවර්ධන, එම් කේ ඩී දමයන්ති,
ඒ එම් පී සම්මානි සහ ආචාර්ය පී ඩී සේනානායක

**ව්‍යාපෘති A 1.4. උඩරට ප්‍රදේශය සඳහා පැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂයට ප්‍රතිරෝධී නව ප්‍රභේද හඳුනා ගැනීම**

**පර්යේෂණය: N1A (2022/2023)**

**ස්ථානය:** වටපණු ව්‍යාධිවේදී පර්යේෂණාගාරය,තේ පර්යේෂණ ආයතනය,තලවාකැලේ.

**අරමුණ:** උඩරට ප්‍රදේශය සඳහා පැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනා ගැනීම සහ තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛවල අදාළ ඇතුලත් කිරීම සහ සංශෝධන කිරීම.

**ප්‍රතිඵල සහ නිගමනය :**

පැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනා ගැනීමට අදාළ මීළඟ පර්යේෂණය සඳහා පරීක්ෂක ප්‍රභේද 9ක් (612, 626,244, 925, 743, 952, 613, 704 සහ 703) සහ සම්මත ප්‍රභේද 5ක් (DT1, DT95, TRI 4052, TRI 2025 සහ TRI 2024) තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ පිහිටි ක්ෂේත්‍ර පාත්ති තුළ පවත්වා ගනිමින් පවතී. ඉදිරි පර්යේෂණ සහ උඩරට ප්‍රදේශය සඳහා නව ප්‍රභේද හඳුනා ගැනීමට අදාළ ව පැටිලෙන්චස් ලූසයි වටපණු ගහණ තලවකැලේ ක්ෂේත්‍ර පාත්ති තුල තවදුරටත් පවත්වා ගනිමින් පවතී. නියමිත කාල පරතරයන් තුළ දී වටපණු ගහණ තක්සේරු කරන ලදි.

පී ජී ඩී එස් අමරසේන, යු බී හේරත්, බී එම් ජී කේ ගොඩවිට, බී ජනනි,
ජී කේ ඩබ්ලිව් එච් ධර්මදාස සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**ප්‍රධාන ව්‍යාපෘතිය A 2. මැදරට තේ වගා කරන කලාපයට අයත්, කෘෂි පාරිසරික කලාප සඳහා ඉහළ අස්වැන්නක් සහ ගුණාත්මයක් සහිත, කඳ ගුල්ලාගේ හානියට, බුබුළු අංගමාරයට, වටපණුවන් නිසා ඇතිවන මුල් රෝග හා කඳ පිළිකාවලට ප්‍රතිරෝධී, නව තේ ප්‍රභේද නිපදවීම**

**ව්‍යාපෘති A 2.1. මැදරට තේ වගා කරන කලාපය සඳහා දෙමුහුම්කරණය හා වරණය යන සම්ප්‍රදායික අභිජනන ක්‍රමවේදයන් මෙන්ම ඉන් ඔබ්බට ගිය සම්ප්‍රදායික නොවන අභිජනන ක්‍රමවේදයන්ද උපයෝගී කරගෙන වැඩි දියුණු කල තේ ප්‍රභේද නිපද වීම.**

**අභිජනන පෙළ ඇගයීම - පළමු සහ දෙවන අදියර පිරික්සුම් (Phase I and Phase II) - මැදරට කලාපය**

මෙම කලාපයේ ස්ථාපනය කර ඇති පළමු සහ දෙවන අදියර පිරික්සුම් වල මූලික විස්තර සහ 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් වගුව 3 සහ 4 හි පිළිවෙලින් අඩංගු කර ඇත. මෙම සියලුම නියැදි හන්තාන ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කර ඇත.

වගුව 3: පළමු අදියර (Phase I) පිරික්සුම් - මැදරට කලාපය

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | ප්‍රභවය * | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|
| MVP 13 | 2012 | D, E, F, G | 43 | TRI 3019, TRI 4071 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| MVP 14 | 2014 | I | 26 | DN, TRI 2025 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| MVP 15 | 2014 | L | 110 | TC 10, DEL 40, GF 7/6, LLEF 2, TRI 62/3, TRI 2137 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම ආරම්භ කරන ලදී |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

වගුව 4: දෙවන අදියර (Phase II) පිරික්සුම් - මැදරට කලාපය

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | සම්භවය* | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|
| MVP 16 | 2016 | A, B, C | 21 | TRI 3019, TRI 4006, TRI 4078 | 2022 ජුනි මාසයේදී පළමු කප්පාදුව සිදු කරනු ලැබීය |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

MVP 16 පිරික්සුමෙහි පළමු කප්පාදු චක්‍රයේ වාර්ෂික අස්වනු සාමාන්‍යයයන්හි හා කප්පාදු අතුවල බරෙහි සාමාන්‍යයන්ගේ සාරාංශය වගුව 5හි අන්තර්ගත කොට ඇත

වගුව 5. MVP 16 පිරික්සුමෙහි පළමු කප්පාදු චක්‍රයේ වාර්ෂික අස්වනු සාමාන්‍යයන්ගේ හා කප්පාදු අතු වල බරෙහි සාමාන්‍යයන්ගේ සාරාංශය

| ප්‍රභේදය / දර්ශය | වාර්ෂික අස්වනු සාමාන්‍යය (හෙක්ටයාරට නිමි තේ කිලෝ ග්‍රෑම්) | කප්පාදු අතුවල බරෙහි සාමාන්‍යය (එක් පදුරකට කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| 704 | 4148.8[a] | 2.06[a-d] |
| 952 | 3963.7[ab] | 2.34[abc] |
| 626 | 3648.5[abc] | 1.90[a-d] |
| 963 | 3628.1[abc] | 1.61[a-d] |
| 743 | 3583.9[abc] | 1.93[a-d] |
| 703 | 3549.4[abc] | 2.04[a-d] |
| 244 | 3528.6[a-d] | 2.12[a-d] |
| TRI 3019 | 3418.7[a-d] | 1.80[a-d] |
| 700 | 3249.9[a-e] | 2.80[a] |
| TRI 4006 | 3172.6[a-f] | 1.38[cd] |
| LSD | 1123.40 | 1.27 |
| CV% | 18.12 | 34.14 |

සමාන ඉංග්‍රීසි අක්ෂර දරන සාමාන්‍යය අගයන් (Mean values) අතර සැලකිය යුතු වෙනසක් නොමැත (not significantly different at $p = 0.05$)

පිරිසුමට භාජනය කල දර්ශ අතරින් 08ක, පාලක TRI 4006 ප්‍රභේදයට වඩා ඉහල සාමාන්‍යය අස්වනු මට්ටමක් සහ සාමාන්‍යය කප්පාදු බරක් වාර්තා විය. තෝරාගත් දර්ශ ඉදිරියේදී (2023 වසරේ සිට) බහු-ස්ථානීය අනුවර්තී පිරික්සුම් හරහා අගැයුමට භාජනය කිරීමට නියමිත අතර, ඒ වෙනුවෙන් අවශ්‍යවන පැළ නිපැයුම සඳහා එම දර්ශවල රිකිලි තේ.ප.ආ. හන්තාන ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පැළ තවානේ දැනටමත් සිටුවා ඇත.

එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටව ආරච්චි, කේ කේ රණවීර,
සී ජේ රැටියලගේ සහ එච් ඩබ් එම් එම් ජයරත්න

## ව්‍යාපෘතිය A 2.3 මැදරට ප්‍රදේශ සඳහා තේ කඳ ගුල්ලාට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන නව ප්‍රභේද හඳුනා ගැනීම

තේ කඳ ගුල්ලාට දක්වන ප්‍රතිරෝධීතාවය ඇගයීම සඳහා සඳහා MVP 15 සහ MVP 16 වන ක්ෂේත්‍ර පර්යේෂණයන්හි පළමු කප්පාදුවේ දී ඇගයීම් සිදු කරන ලදී. MVP 16 පර්යේෂණයේ පරීක්ෂා කරන ලද ප්‍රභේදයන් අතරින්, මධ්‍යස්ථ ප්‍රතිරෝධී ප්‍රභේද හයක්, මධ්‍යස්ථ ග්‍රාහී ප්‍රභේද නවයක් සහ තේ කඳ ගුල්ලා සඳහා ග්‍රාහී ප්‍රභේද හයක් හඳුනා ගන්නා ලද අතර MVP 15 පර්යේෂණයේ දී, තේ කඳ ගුල්ලා සඳහා මධ්‍යස්ථ ප්‍රතිරෝධී ප්‍රභේද 14 ක්, මධ්‍යස්ථ ග්‍රාහී ප්‍රභේද 21 ක් සහ ග්‍රාහී ප්‍රභේද 16 ක් ලෙසත් හඳුනා ගන්නා ලදී.

එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල, එස් පී ආර් විජේවර්ධන, එම් කේ ඩී දමයන්ති,
ඒ එම් පී සම්මානි සහ ආචාර්ය පී ඩී සේනානායක

## ව්‍යාපෘතිය A 2.4. මැදරට ප්‍රදේශය සඳහා ප්‍රැට්ලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂ සඳහා ප්‍රතිරෝධී නව ප්‍රභේද හඳුනා ගැනීම.

**පර්යේෂණය : N1B (2022/2023)**
**ස්ථානය :** තේ පර්යේෂණ ආයතනය, හන්තාන.
**අරමුණ :** මැදරට ප්‍රදේශය සඳහා ප්‍රැට්ලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනා ගැනීම සහ තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛවල අදාළ ඇතුලත් කිරීම සහ සංශෝධන කිරීම.

**ප්‍රතිඵල සහ නිගමනය :**
මැදරට ප්‍රදේශය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනාගැනීමට අදාළ මීලඟ පර්යේෂණය සඳහා පරීක්‍ෂක ප්‍රභේද 5ක් (703, 704, 244, 612 සහ 925) සහ සම්මත ප්‍රභේද, හන්තාන තේ පර්යේෂණ ආයතනයේ පිහිටි තවාන් තුල පවත්වා ගන්නා ලදි.

පී පී ඩී එස් අමරසේන, යූ බී හේරත්, බී එම් ජී කේ ගොඩවිට, බී ජනනි,
ජී කේ ඩබ්ලිව් එච් ධර්මදාස සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**ව්‍යාපෘතිය A 2.8 මැදරට තෙත් කලාපයේ නියං තත්වයන් සඳහා ටීආර්අයි 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදයන්ගේ යෝග්‍යතාවය අධ්‍යයනය කිරීම (2013)**
මැදරට තෙත් කලාපය සඳහා ටීආර්අයි 5000 කාණ්ඩයේ නව තේ ප්‍රභේදයන්ගේ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව, ඉතාම වැදගත් ශාක කායික විද්‍යාත්මක පරාමිතීක සහ තේ දළු අස්වැන්න භාවිතාකරමින් නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙම අධ්‍යයනය තේ පර්යේෂණ ආයතනයේ මැදරට මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර අංක 2හි පවත්වාගෙනයන ටීආර්අයි 5000 කාණ්ඩයේ පර්යේෂණ භූමියේ සිදුකරන ලදී. මේ සඳහා නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දන්නා ටීආර්අයි 2025 සහ ටීආර්අයි 4042 ප්‍රභේද සමග 12/11, 139, 15, 10/1, 23/5 සහ 62 යනාදී වූ නව වගා දර්ශවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සංසන්දනය කරන ලදී.

විවිධ පාංශු තෙතමන තත්ව යටතේ දත්ත ලබාගත් නමුදු, යොදා ගන්නා ලද අතේ ගෙනයාමට හැකි අධෝරක්ත වායු විශ්ලේෂකය සහ විද්‍යාත්මක තරාදිය වැනි උපකරණවල දෝෂ ඇතිවීම වැනි නොවැළැක්විය හැකි හේතු නිසාවෙන් නිගමනයකට එළැඹීමට තරම් ප්‍රමාණවත් දත්ත ලබා ගැනීමට නොහැකි විය. පාංශු තෙතමනය සමග ශාක කායික විද්‍යාත්මක දත්තයන් වන ප්‍රභාසංශ්ලේෂණය උත්ස්වේදනය ශාකයේ සාපේක්ෂ ජල ප්‍රමාණය සහ පූටිකාවල හැසිරීම යනාදී දත්ත එක් රැස් කරන ලදී. ශාක පත්‍රවල අඩංගු මුලු ද්‍රාවක සීනි ප්‍රමාණය මැනීම සඳහා ශාක පත්‍ර නියැදිද ලබා ගන්නා ලදී. වර්ග මීටර 0.3 X 0.3 ක්වූ සිවුරැස්සක් භාවිතා කර අස්වනු සංරචක නිර්ණය කරන ලදී. පාංශු තෙතමනය 19.6% 17.6% 18.1% 18.7% සහ 19.0% වශයෙන්වූ තෙතමන තත්ව පහක් යටතේ දත්ත ලබාගත් නමුදු එම තෙතමන අගයන් ඉතා ආසන්න අගයන්වූ බැවින් නියඟයට පාත්‍රවීමේ දර්ශකය ගණනය කල නොහැකි විය.

විශ්ලේෂණය කරන ලද ප්‍රභේද සහ නව වගා දර්ශ අතර සාපේක්ෂ ජල අන්තර්ගතයෙහි සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දත්ත ලබා ගනු ලැබූ සියලුම අවස්ථාවන්හි සාමාන්‍ය පාංශු තෙතමන තත්ව යටතේ දැක ගත නොහැකි විය (රූපසටහන 1).




රූපසටහන 1. දත්ත ලබා ගනු ලැබූ සියලුම අවස්ථාවන්හි සාමාන්‍ය පාංශු තෙතමන තත්ව යටතේ විවිධ වගා දර්ශවල (Cultivar/Accession) සාපේක්ෂ ජල අන්තර්ගතය (Relative Water Content) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

අතේ ගෙනයාමට හැකි අධෝරක්ත වායු විශ්ලේෂකයේ දෝෂ ඇතිවීම නිසා වායු හුවමාරු පරාමිතීකයන්ගේ දත්ත ලබා ගැනීමට හැකිවූයේ 19.6% පාංශු තෙතමන අගයේදී පමණි. විශ්ලේෂණය කරන ලද ප්‍රභේද සහ නව වගා දර්ශ අතර පූටිකාවල හැසිරීමෙහි සැලකිය යුතු වෙනස්කම් දත්ත ලබා ගනු ලැබූ සියලුම පාංශු තෙතමන තත්ව යටතේ දැක ගත හැකිවිය. 19.6% පාංශු තෙතමන අගයේදී ටීආර්අයි 2025 සහ වගා දර්ශ 15 හි පූටිකාවල හැසිරීමෙහි සැලකිය යුතු ඉතා ඉහළ පූටිකා විවරවීමක් (p=0.05) පෙන්වූ අතර වගා දර්ශ 23/5 සහ 62 අවම පූටිකා විවරවීමක් පෙන්වන ලදී (රූපසටහන 2).




රූපසටහන 2. දත්ත ලබා ගනු ලැබූ 19.6% පාංශු තෙතමන අගයේදී විවිධ වගා දර්ශවල (Cultivar/Accession) පූටිකාවල හැසිරීම (Stomatal Conductance) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත)

සියලුම ප්‍රභේද සහ වගා දර්ශවල ශාක පත්‍රවල උත්ස්වේදනයද දත්ත ලබා ගනු ලැබූ 19.6% පාංශු තෙතමන අගයේ දී සැලකිය යුතු වෙනස්කම් පෙන්වන ලදී. 19.6% පාංශු තෙතමන අගයේදී ටීආර්අයි 2025 සහ වගා දර්ශ 15 හි සැලකිය යුතු ඉතා ඉහළ උත්ස්වේදනයක් (p=0.05) පෙන්වූ අතර වගා දර්ශ 23/5 සහ 62 අවම උත්ස්වේදනයක් පෙන්වන ලදී (රූපසටහන 3).




රූපසටහන 3. දත්ත ලබා ගනු ලැබූ 19.6% පාංශු තෙතමන අගයේදී විවිධ වගා දර්ශවල (Cultivar/Accession) ශාක පත්‍රවල උත්ස්වේදනය (Rate of Transpiration) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

සියලුම ප්‍රභේද සහ වගා දර්ශවල ශාක පත්‍රවල ප්‍රභාසංශ්ලේෂණය ද දත්ත ලබා ගනු ලැබූ 19.6% පාංශු තෙතමන අගයේදී සැලකිය යුතු වෙනස්කම් පෙන්වන ලදී. 19.6% පාංශු තෙතමන අගයේ දී ටීආර්අයි 2025, වගා දර්ශ 139 සහ 10/1 හි සැලකිය යුතු ඉතා ඉහළ ප්‍රභාසංශ්ලේෂණයක් (p=0.05) පෙන්වූ අතර වගා දර්ශ 23/5 සහ 62 අවම ප්‍රභාසංශ්ලේෂණයක් පෙන්වන ලදී (රූපසටහන 4).




රූපසටහන 4. දත්ත ලබා ගනු ලැබූ 19.6% පාංශු තෙතමන අගයේදී විවිධ වගා දර්ශවල (Cultivar/Accession) ශාක පත්‍රවල ප්‍රභාසංශ්ලේෂණය (Rate of Photosynthesis) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

මෙම පර්යේෂණ කටයුතු තවදුරටත් ඉදිරියට සිදුකරනු ලබයි. .

ඩී එම් එස් නවරත්න, ඒ ඩී අයි යූ ජයවර්ධන, එන් එම් විතානගේ,
එම් එම් එන් දමයන්ති සහ ටී එල් විජේරත්න

## ප්‍රධාන ව්‍යාපෘතිය A 3. මැදරට අර්ධ - වියළි (ඌව) කෘෂි පාරිසරික කලාප සඳහා ඉහල අස්වැන්නක් සහ ගුනාත්මයක් සහිත, නියඟයට, කඳ ගුල්ලාගේ හානියට, බුබුළු අංගමාරයට, වටපණුවන් නිසා ඇතිවන මුල් රෝග හා කඳ පිළිකා වලට ප්‍රතිරෝධී, නව තේ ප්‍රභේද නිපදවීම

### ව්‍යාපෘතිය A3.1. දෙමුහුම්කරණය හා වරණය යන සම්ප්‍රදායික අභිජනන ක්‍රමවේදයන් මෙන්ම ඉන් ඔබ්බට ගිය සම්ප්‍රදායික නොවන අභිජනන ක්‍රමවේදයන්ද උපයෝගී කරගෙන වැඩි දියුණු කල තේ ප්‍රභේද නිපදවීම.

#### අභිජනන පෙළ ඇගයීම - පළමු සහ දෙවන අදියරේ පිරික්සුම් (Phase I and Phase IItrials ) - මැදරට (අර්ධ- වියළි ) කලාපය

මෙම කලාපයේ ස්ථාපනය කර ඇති, පළමු සහ දෙවන අදියර පිරික්සුම් වල මූලික විස්තර සහ 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් වගුව 6 සහ 7 හි පිළිවෙලින් අඩංගු කර ඇත. මෙම පිරික්සුම් සියල්ලම පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කර ඇත.

වගුව 6.  පළමු අදියර (Phase I) පර්යේෂණ නියැදි - මැදරට අර්ධ - වියළි (ඌව ) කලාපය

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | ප්‍රභවය * | ක්ෂේත්‍ර අංකය | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|
| UVP 11 | 2012 | D, E, H | 02 | 43 | TRI 4042 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| UVP 12 | 2014 | I | 03 | 22 | TRI 2023, TRI 2025, DN | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම |
| UVP 13 | 2014 | J | 03 | 15 | TRI 2025, TRI 3019 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම ආරම්භ කරන ලදී |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

වගුව 7. දෙවන  අදියර (Phase II) පිරික්සුම් - මැදරට අර්ධ - වියළි (ඌව ) කලාපය

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | සම්භවය* | ක්ෂේත්‍ර අංකය | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|
| UVP 14 | 2015 | A, B, C | 02 | 21 | TRI 2025, TRI 4071 | දෙවැනි කප්පාදු චක්‍රයේ අස්වනු නෙලීම ආරම්භ කරන ලදී |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

UVP 14 පිරික්සුමෙහි පළමු කප්පාදු චක්‍රයේ වාර්ෂික අස්වනු සාමාන්‍යයන්හි හා කප්පාදු අතු වල බරෙහි සාමාන්‍යයන්හි  සාරාංශය වගුව 8 හි අන්තර්ගතකොට ඇත.

වගුව 8. UVP 14 පිරික්සුමෙහි පළමු කප්පාදු චක්‍රයේ ඉහලම වාර්ෂික අස්වනු සාමාන්‍යයයන් හා කප්පාදු අතු වල බරෙහි සාමාන්‍යයන් පෙන්වූ දර්ශ 09හි විස්තර

| ප්‍රභේදය / දර්ශය | වාර්ෂික අස්වනු සාමාන්‍යය (හෙක්ටයාරට නිම් තේ කිලෝ ග්‍රෑම්) | කප්පාදු අතුවල බරෙහි සාමාන්‍යය (එක් පදුරකට කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| 612 | $2742.5^{a}$ | $1.46^{a-d}$ |
| 925 | $2714.3^{a}$ | $2.03^{ab}$ |
| TRI 2025 | $2368.7^{ab}$ | $1.88^{a-c}$ |
| 613 | $2281.8^{abc}$ | $1.95^{a-c}$ |
| 696 | $2274.0^{abc}$ | $1.35^{a-d}$ |
| 626 | $2245.4^{abc}$ | $1.43^{a-d}$ |
| 703 | $2220.9^{abc}$ | $1.45^{a-d}$ |
| 952 | $2219.1^{abc}$ | $1.72^{a-d}$ |
| 244 | $2124.7^{abc}$ | $1.60^{a-d}$ |
| 568 | $2004.1^{a-d}$ | $0.98^{cd}$ |
| TRI 4071 | $1971.7^{a-d}$ | $1.33^{a-d}$ |
| LSD | 909.11 | 1.05 |
| CV% | 22.63 | 35.18 |

සමාන ඉංග්‍රීසි අක්ෂර දරන සාමාන්‍යය අගයන් (Mean values) අතර සැලකිය යුතු වෙනසක් නොමැත ( not significantly different at $p = 0.05$)

පිරිසුමට භාජනය කල දර්ශ අතරින් 02ක, පාලක TRI 2025 ප්‍රභේදයට වඩා ඉහළ සාමාන්‍යය අස්වනු මට්ටමක් වාර්තා විය. තෝරාගත් දර්ශ ඉදිරියේ දී (2023 වසරේ සිට)බහු-ස්ථානීය අනුවර්තී පිරික්සුම් හරහා අගැයුමට භාජනය කිරීමට නියමිත අතර, ඒ වෙනුවෙන් අවශ්‍යවන පැළ නිපැයුම සඳහා එම දර්ශවල රිකිලි තේ.ප.ආ. පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පැළ තවානේ දැනටමත් සිටුවා ඇත.

**ඌව කලාපය සඳහා TRI 5000 කාණ්ඩයේ නව ප්‍රභේද 03ක් නිර්දේශය කොට නිකුත් කිරීම**

සියලු ඇගයීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව 2022.02.24 දින ඌව කලාපය සඳහා නව ප්‍රභේද නිර්දේශය වෙනුවෙන් ස්ථාපිත කල වන තාක්ෂණික කමිටුව රැස්වූ අතර එහිදී TRI 5000 කාණ්ඩයේ නව ප්‍රභේද 03 ක් නිර්දේශය කොට නිකුත් කරන ලදි. TRI 5002, TRI 5005 සහ TRI 5006.

එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි ,කේ කේ රණවීර සී ජේ රැටියලගේ,
එච් ඩබ් එම් එම් ජයරත්න, එන් එන් දයාරත්න සහ ජේ එම් කේ උදයංගනී

**ව්‍යාපෘතිය A.3.3. ඌව ප්‍රදේශය සඳහා තේ කඳ ගුල්ලාට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන නව ප්‍රභේද හඳුනා ගැනීම**

ශාක අභිජනන අංශය විසින් නව ප්‍රභේද සඳහා වන පර්යේෂණාත්මක බිම් කොටස් නඩත්තු කරනු ලබන අතර ඇගයුම් රඳා පවතින්නේ කප්පාදුවේදී පවතින තේ කඳ ගුල්ලාගේ ස්වභාවික ගහණ ඝනත්වය මත ය.

එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල, එස් පී ආර් විජේවර්ධන, එම් කේ ඩී දමයන්ති,
ඒ එම් පී සම්මානි සහ ආචාර්ය පී ඩී සේනානායක

**ව්‍යාපෘතිය A 3.4. ඌව ප්‍රදේශය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂය සඳහා ප්‍රතිරෝධී නව ප්‍රභේද හඳුනා ගැනීම.**

**පර්යේෂණය : N1B (2019/2020)**

**ස්ථානය :** උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, තේ පර්යේෂණ ආයතනය, පස්සර

**අරමුණ :** ඌව ප්‍රදේශය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනා ගැනීම සහ තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛවල අදාළ ඇතුලත් කිරීම සහ සංශෝධන කිරීම.

**ප්‍රතිඵල සහ නිගමනය :**

ඌව ප්‍රදේශය සඳහා නව ප්‍රතිරෝධී තේ ප්‍රභේද හඳුනා ගැනීමට යොදා ගන්නා වටපණු ගහන වන ප්‍රැටිලෙන්චස් ලූසයි ගහන ක්ෂේත්‍ර පාත්ති තුල තවදුරටත් පවත්වා ගනිමින් පවතී. නියමිත කාල පරතරයන් තුළ දී වටපණු ගහන තක්සේරු කරන ලදි.

පරීක්ෂක ප්‍රභේද 6ක් (ක්ෂේත 37, 31, 13, 8,7 සහ 3) සහ සම්මත ප්‍රභේද 3ක් (TRI 2025, TRI 2024 සහ TRI 4052) තවාන් ප්‍රභේද තේ පර්යේෂණ ආයතනයේ ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පිහිටි ක්ෂේත්‍ර පාත්ති තුලට හඳුන්වා දීම සිදු කරන ලදි.

පී පී ඩී එස් අමරසේන, යු බී හේරත්, බී එම් ජී කේ ගොඩවිට, බී ජනනි,
ජී කේ ඩබ්ලිව් එච් ධර්මදාස, සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**ප්‍රධාන ව්‍යාපෘතිය A 4. පහතරට කෘෂි පාරිසරික කලාප සඳහා ඉහළ අස්වැන්නක් සහිත, නියඟයට, කඳ පිළිකාවලට, පහතරට සජීවී දැව වේයාගේ හානියට, කඳ ගුල්ලාගේ හානියට සහ වටපණුවන්ගේ හානියට ප්‍රතිරෝධී, නව තේ ප්‍රභේද නිපදවීම**

**ව්‍යාපෘතිය A 4.1. දෙමුහුම්කරණය හා වරණය යන සම්ප්‍රදායික අභිජනන ක්‍රමවේදයන් මෙන්ම ඉන් ඔබ්බට ගිය සම්ප්‍රදායික නොවන අභිජනන ක්‍රමවේදයන් ද උපයෝගී කරගෙන වැඩි දියුණු කල තේ ප්‍රභේද නිපදවීම.**

**පාලිත තත්ත්ව යටතේ දෙමුහුම්කරණය:**

**<u>2002 සහ 2003 වසරවල දෙමුහුම්කරණ වැඩසටහන්වලින් නිපැයූ ශාක (2004/2005)</u>**

සිව්වන කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙලීම සිදු කරන ලදි

**<u>2004 සිට 2007 දක්වා දෙමුහුම්කරණ වැඩසටහන්වලින් නිපැයූ ශාක (2008)</u>**
තෙවන කප්පාදු චක්‍රයේ සතිපතා අස්වනු නෙළීම සිදු කරන ලදී

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ

**අභිජනන පෙළ ඇගයීම - පළමු අදියර, දෙවන අදියර පර්යේෂණ නියැදි (Phase I and Phase II) - පහතරට කලාපය**

**පළමු අදියර පර්යේෂණ නියැදි (Phase I)**

මෙම කලාපයේ ස්ථාපනය කර ඇති, පළමු අදියර පිරික්සුම්වල (Phase I) මූලික විස්තර සහ 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම්, වගුව 9 හි අන්තර්ගත කොට ඇත.

වගුව 9. පළමු අදියර (Phase I) පිරික්සුම් - පහතරට කලාපය
(සියලුම නියැදි, රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ ක්ෂේත්‍ර අංක 02 හි ස්ථාපනය කොට ඇත.)

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | ප්‍රභවය * | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|
| LVP 87 | 2011 | D, E, F | 50 | TRI 2026, TRI 4042, TRI 4049 | දෙවන කප්පාදු චක්‍රයේ අස්වනු නෙළීම |
| LVP 88 | 2014 | J | 28 | TRI 4042, DG 39, KEN 16/3 | පළමු කප්පාදු චක්‍රයේ අස්වනු වාර්තා කිරීම. |
| LVP 89 | 2017 | M, G | 40 | TRI 2026, TRI 4042, TRI 4049 | පළමු කප්පාදු චක්‍රයේ අස්වනු වාර්තා කිරීම |
| LVP 90 | 2017 | N | 12 | TRI 2026, TRI 4042, TRI 4049 | පළමු කප්පාදු චක්‍රයේ අස්වනු වාර්තා කිරීම |
| LVP 91 | 2018 | O | 96 | TRI 2043, TRI3055 , TRI4042 | පළමු කප්පාදු චක්‍රයේ අස්වනු වාර්තා කිරීම |

*දැනට ඇගයීම් කටයුතු කරමින් පවතින දර්ශයන්හි ප්‍රභවය- වැඩි විස්තර සඳහා අමුණුම් 1 බලන්න

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ

**දෙවන අදියර පර්යේෂණ නියැදි (Phase II)**

මෙම කලාපයේ ස්ථාපනය කර ඇති, පළමු අදියර පිරික්සුම් (Phase II) වල මූලික විස්තර සහ 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම්, වගුව 10 හි අන්තර්ගත කොට ඇත

වගුව 10. දෙවන අදියර පිරික්සුම් (Phase II) - පහතරට කලාපය
(සියලුම පිරික්සුම් රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ ක්ෂේත්‍ර අංක 01 හි ස්ථාපිත කොට ඇත).

| පිරික්සුම් අංකය | ස්ථාපිත වසර | සම්භවය | දර්ශ ගණන | සම්මත ප්‍රභේද | 2022 වසරේ ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|
| LVP 75 | 1997 | LVP 75 -I<br>LVP 75 - II<br>LVP 75- III<br>LVP 75 - IV | 11<br>21<br>05<br>08 | TRI 2023, TRI 2025,<br>TRI 2026 , TRI 2027<br>TRI 2025, TRI 2027<br>TRI 2023, TRI 2025,<br>TRI 2026, TRI 2027 | * |
| LVP 76<br>LVP 77<br>LVP 78<br>LVP 79 | 1999 | LVP 76<br>LVP 77<br>LVP 78<br>LVP 79 | 22<br>13<br>18<br>06 | TRI 2023, TRI 2025, TRI 2027 | **<br>. |
| LVP 83 | 2000 | LVP 83 | 18 | TRI 2023, TRI 4042 | ***<br>. |

*මෙම පැරණි පිරික්සුම් ක්ෂේත්‍රයේ මේ වනවිට ඉතිරිව තිබූ පඳුරු ඉවත්කොට නැවත වගාව සඳහා පුනරුත්ථාපන තෘණ වගා කිරීම 2022 වසරේදී සිදුකරනු ලැබීය. නව මව් වගා ව්‍යාපෘතියක් යටතේ 2023/2024 වසරවල දී නැවත වගා කිරීම සැලසුම් කොට ඇත.

**හත්වන කප්පාදු චක්‍රයේ අස්වනු නෙළීම සිදු කරන ලදී. වැඩිදුර පිරික්සුම් සඳහා භාවිතා කිරීම වෙනුවෙන් මූලික ඇගයුම්වලදී ඉහල ප්‍රතිඵල පෙන්වූ දර්ශවල, තවාන් පැළ නිපදවීම මේ වන විටත් ආරම්භ කොට ඇත.

***වැඩිදුර පිරික්සුම් සඳහා භාවිතා කිරීම වෙනුවෙන් මූලික ඇගයුම් වල දී ඉහළ ප්‍රතිඵල පෙන්වූ දර්ශවල තවාන් පැළ නිපදවීම මේ වන විටත් ආරම්භ කොට ඇත. මෙම පැරණි පිරික්සුම් ක්ෂේත්‍රයේ ඉතිරිව ඇති පදුරු ඉවත්කොට නව මව් වගා ව්‍යාපෘතියක් යටතේ 2024/2025 වසරවල දී නැවත වගා කිරීමට සැලසුම් කර ඇති අතර ඒ වෙනුවෙන් වන පුනරුත්ථාපන තෘණ වගා කිරීම 2023 වසරේදී සිදුකිරීමට නියමිතය

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ

**තෙවන අදියර (Phase III) පර්යේෂණ නියැදි - පහතරට කලාපය**

**<u>TRI 5000 කාණ්ඩයේ තෙවන අදියර (Phase III) පිරික්සුම්</u>**

පහතරට කලාපයේ වතුයායන් 4 ක TRI කොට්ටව මධ්‍යස්ථානය, සිසිල්ටන් වතුයාය, බලන්ගොඩ, දෙණියාය වතුයාය, දෙණියාය සහ ඉන්දොළ වතුයාය, මාවරල, ස්ථාපිත කර ඇති තෙවන අදියර (Phase III) පිරික්සුම්වල අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. එම ක්ෂේත්‍රවල නඩත්තු / කළමනාකරණ කටයුතු අදාල මධ්‍යස්ථානය / වතු සමාගම් විසින් සිදු කරගෙන යනු ලැබේ.

**<u>TRI 5000 කාණ්ඩයේ නිරීක්ෂණ බිම්</u>**

ඉහත තෙවන අදියර (Phase III) පිරික්සුම් වලට අමතරව පහතරට කලාපයේ; කිරිවානාගඟ වතුයාය, බලන්ගොඩ වතුයාය, කොට්ටව සහ දෙණියාය තේ. ප. ආ. ප්‍රාදේශීය මධ්‍යස්ථාන, ස්ථාපිත කර ඇති TRI 5000 කාණ්ඩයේ නිරීක්ෂණ බිම් 4ක අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. එම ක්ෂේත්‍රවල නඩත්තු / කළමනාකරණ කටයුතු අදාල මධ්‍යස්ථානය / වතු සමාගම් විසින් සිදු කරගෙන යනු ලැබේ.

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ

**ව්‍යාපෘතිය A 4.2. අතු පිළිකා සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද අනාවරණය (පහතරට කලාපය)**

TRI 5000 ශ්‍රේණියේ ප්‍රවේශයන්ගෙන් (accessions) තෝරාගත් පැළ සහ අතු පිළිකා කෙරෙහි ප්‍රතිරෝධීතාව හෝ සංවේදීතාව පෙන්නුම් කරන නිර්දේශිත තේ ප්‍රභේදයන් (සංසන්දනාත්මක පැළ ගොනු), කෘත්‍රිම ආමුකුලනය (Artificial innoculation) මගින් ජෛව විශ්ලේෂණය අරමුණු කරමින් කඳේ ඝනකම ප්‍රමාණවත් තරමට ලඟා වන තෙක් නඩත්තු කරමින් පවතී.

ඩී ජී එන් ජී කරුණාජීව, ජී ඩී සින්නයියා සහ ශාක අභිජනන අංශය

**ව්‍යාපෘතිය A 4.3. පහතරට ප්‍රදේශ සඳහා තේ කඳ ගුල්ලා සහ පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන නව ප්‍රභේද හඳුනා ගැනීම**

ශාක අභිජනන අංශය විසින් නව ප්‍රභේද සඳහා වන පර්යේෂණාත්මක බිම් කොටස් නඩත්තු කරනු ලබන අතර ඇගයුම් රඳා පවතින්නේ කප්පාදුවේදී පවතින තේ කඳ ගුල්ලාගේ සහ පහතරට සජීවී දැව වේයාගේ ස්වභාවික ගහණ ඝනත්වය මත ය.

බී එස් විතාන, ඒ එම් පී සම්මානි සහ පී ඩී සේනානායක

**ව්‍යාපෘතිය A 4.4. දෙනියාය ප්‍රදේශය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂ සඳහා ප්‍රතිරෝධී නව ප්‍රභේද හඳුනා ගැනීම.**

**පර්යේෂණය - N1B (2020/2021)**

**ස්ථානය :** උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, තේ පර්යේෂණ ආයතනය, දෙනියාය

**අරමුණ :** පහතරට ප්‍රදේශය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව/ ප්‍රතිරෝධී බව සහිත නව ප්‍රභේද හඳුනා ගැනීම සහ තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛවල අදාළ ඇතුළත් කිරීම සහ සංශෝධන කිරීම.

**ප්‍රතිඵල සහ නිගමනය :**
පහතරට ප්‍රදේශය සඳහා නව ප්‍රතිරෝධී තේ ප්‍රභේද හඳුනා ගැනීමට යොදා ගන්නා වටපණු ගහණ වන ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් දෙනියාය තේ පර්යේෂණ ආයතන උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පිහිටි ගහණ ක්ෂේත්‍ර පාත්ති තුළ තවදුරටත් පවත්වා ගනිමින් පවතී. පරීක්ෂක ප්‍රභේද සහ සම්මත ප්‍රභේද තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ පිහිටි තවාන් තුළ පවත්වා ගනිමින් පවතී.

පී පී ඩී එස් අමරසේන, යු බී හේරත්, බී එම් පී කේ ගොඩවිට සහ බී ජනනි
පී කේ ඩබ්ලිව්. එච්. ධර්මදාස, සහ එල් ආර් යු එල් සෙනෙවිරත්න

**ව්‍යාපෘතිය A 4.7. පහතරට තෙත් කලාපය සඳහා නියඟයට ප්‍රතිරෝධී 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදයන් අධ්‍යයනය කිරීම (2013).**
පහතරට තෙත් කලාපය සඳහා ටීආර්අයි 5000 කාණ්ඩයේ නව තේ ප්‍රභේදයන්ගේ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඉතාම වැදගත් ශාක කායික විද්‍යාත්මක දත්ත භාවිතා කරමින් නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

මෙම අධ්‍යයනය ටීආර්අයි 5000 කාණ්ඩයේ තෙවන අදියරේ අනුවර්තී පර්යේෂණයක් ලෙස රත්නපුරයේ පලාවල ග්‍රාමයේ සිරිදොල වත්ත නම්වූ කුඩා තේවතු භූමියේ සිදු කරන ලදී. මේ සඳහා නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දන්නා ටීආර්අයි 4042, ටීආර්අයි 2026 සහ ටීආර්අයි 4049 ප්‍රභේද සමග 29, 93, 168, 195, 278,741, 751, 23/5, 12/11 යනාදී වූ නව වගා දර්ශවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සංසන්දනය කරන ලදී. මේ සඳහා පාංශු තෙතමනය සමග ශාක කායික විද්‍යාත්මක දත්තයන් වන ශාකයේ සාපේක්ෂ ජල අන්තර්ගතය මනිනු ලබූ අතර ශාක පත්‍රවල අඩංගු මුලු ද්‍රාවක සීනි ප්‍රමාණය සහ ප්‍රෝලීන ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා පත්‍ර නියැදි ලබා ගන්නා ලදී. වර්ග මීටර 0.3 X 0.3 ක්වූ සිවුරැස්සක් භාවිතා කර අස්වනු සංරචකද නිර්ණය කරන ලදී. පාංශු තෙතමන තත්ව දෙකක් යටතේ එනම් 15.14 % සහ 20.49 % වශයෙන් වූ පාංශු තෙතමන තව යටතේ දත්ත ලබා ගත් නමුදු උපකරණවල දෝෂ ඇතිවීම වැනි නොවැළැක්විය හැකි හේතු නිසාවෙන් නියඟයට සංවේදීතා දර්ශකය ගණනය කිරීමට නොහැකි විය.

සියලුම ප්‍රභේද සහ වගා දර්ශවල ක්‍රියාකාරී රිකිලි වල වියලි බරෙහි සැලකිය යුතු වෙනස්කම් දත්ත ලබා ගනු ලැබූ පාංශු තෙතමන අගයන් දෙකෙහිදීම පෙන්වන ලදී (රූපසටහන 5).




රූපසටහන 5. විවිධ වගා දර්ශවල (Cultivar/Accession) ක්‍රියාකාරී රිකිලි වල වියලි බර (Active shoot dry weight) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

වගා දර්ශ 168 සහ 23/5 හි ක්‍රියාකාරී රිකිලි වල වියලි බරෙහි සැලකිය යුතු ඉහළ අගයන් (p=0.05) දත්ත ලබා ගනු ලැබූ පාංශු තෙතමන අගයන් දෙකෙහිදීම පෙන්වූ අතර ටීආර්අයි 2026 හි ක්‍රියාකාරී රිකිලි වල වියලි බරෙහි සැලකිය යුතු ඉතා ඉහළ අගයක් දත්ත ලබා ගනු ලැබූ අවම පාංශු තෙතමන තත්වය යටතේදී පෙන්වන ලදී. ක්‍රියාකාරී රිකිලිවල වියලි බරෙහි සැලකිය යුතු අවම අගය (p=0.05) දත්ත ලබා ගනු ලැබූ පාංශු තෙතමන අගයන් දෙකෙහිදීම වගා දර්ශ 12/11 මඟින් පෙන්වන ලදී.

වංගි රිකිලිවල වියලි බරෙහි සැළකිය යුතු වෙනස්කම් දත්ත ලබා ගනු ලැබූ ඉහළ පාංශු තෙතමන තත්වය යටතේදී දක්නට ලැබුණු නමුත් අඩු පාංශු තෙතමන තත්වය යටතේදී දක්නට නොලැබිණ (රූපසටහන 6).




රූපසටහන 6. විවිධ වගා දර්ශවල (Cultivar/Accession) වංගි රිකිලි වල වියලි බර (Banji shoots dry weight) වෙනස්වූ ආකාරය (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

ලබා ගන්නා ලද ශාක පත්‍ර නියැදිවල රසායනික සංයුතීන් විශ්ලේෂණය සිදු කෙරෙමින් පවතී.
මෙම පර්යේෂණ කටයුතු තවදුරටත් ඉදිරියට සිදුකරනු ලබයි.

එම් එස් නවරත්න, ඒ ඩී අයි යූ ජයවර්ධන, එන් එම් විතානගේ,
එම් එම් එන් දමයන්ති සහ ටී එල් විජේරත්න

**ප්‍රධාන ව්‍යාපෘතිය A 5. විවිධ කෘෂි ආර්ථික කලාපයන්හි නියගයට නිතර පාත්‍ර වන ප්‍රදේශවල භාවිතය සඳහා ද්වි සහ බහු ප්‍රභේද බීජ නිපදවීම, ආශ්‍රිත අධ්‍යයනයන් සහ නව බීජ උද්‍යාන ස්ථාපනය.**

**ව්‍යාපෘති A 5.1. විවිධ කෘෂි ආර්ථික කලාපයන්හි නියගයට නිතර පාත්‍ර වන ප්‍රදේශවල භාවිතය සඳහා ද්වි සහ බහු ප්‍රභේද බීජ නිපදවීම වෙනුවෙන් මූලික පිරික්සුම් හා වාණිජ පිරික්සුම් සිදුකිරීම සහ නව බීජ උද්‍යාන ස්ථාපනය.**

**බීජ තේ සඳහා වන මූලික පිරික්සුම් හා වාණිජ පිරික්සුම්**
ශා.ජෝකිම් වතුයායේ ක්ෂේත්‍ර අංක 2 , ඇන්දාන වතුයාය, කහවත්ත සහ සිත්තම්ගල වත්ත, වරාපිටිය (කුඩා තේ වතු) පිහිටි පිරික්සුම් ක්ෂේත්‍ර 03 හි අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී. කෙසේ වුව ද පැවති ප්‍රවාහන / ඉන්ධන දුෂ්කරතා හේතුවෙන් මෙම අධීක්ෂණ කටයුතු සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය.

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ

**ද්වී ප්‍රභේද සහ බහු ප්‍රභේද බිජ උද්‍යාන**

<u>තේ බිජ උද්‍යාන ස්ථාපනය කිරීම සහ නඩත්තුව</u>

නව බහු ප්‍රභේද බීජ උද්‍යාන 09ක් මෙම වසර තුලදී ස්ථාපනය කරන ලදී වැඩි විස්තර විශේෂ ව්‍යාපෘති GL 390 යටතේ අන්තර්ගත කොට ඇත

පහතරට කලාපයේ බහු ප්‍රභේද බිජ උද්‍යාන 4 ක සාලාව, හල්පේ, රඹුක්කන්ද සහ කිරිපෝරුව නඩත්තු කටයුතු ශාක අභිජනන අංශය මගින් සිදු කරගෙන යනු ලැබීය. කෙසේ වුවද පැවති ප්‍රවාහන / ඉන්ධන දුෂ්කරතා හේතුවෙන් මෙම නඩත්තු කටයුතු සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය.

ලලාන්ස් රබර් පුද්ගලික සමාගම මගින් කළමනාකරණ කටයුතු සිදුකරන සපුමල්කන්ද සහ රුකාසල් වතුයායන්හි ස්ථාපිත කර ඇති බිජ උද්‍යාන 02හි නඩත්තු කටයුතු සිදුකිරීමට එම සමාගම ඉදිරිපත් වී ඇති අතර, ඒ අනුව GL 390 විශේෂ ව්‍යාපෘතිය යටතේ එම බීජ උද්‍යාන 02 ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. 2012-2021 කාලසීමාව තුළ දී ස්ථාපනය කරන ලද නව බිජ උද්‍යාන 09ක නඩත්තු කටයුතු ද, අදාළ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි / වතුයායන්හි සහයෝගය ද සහිතව ශාක අභිජනන අංශය මගින් සිදුකරනු ලැබීය.

බහු ප්‍රභේද බිජ උද්‍යාන - 08 - කොට්ටව, රත්නපුර (02), හන්තාන හා පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථාන, කිරිවනාගඟ හා කැරොලිනා වතුයායවල
ද්වී ප්‍රභේද බිජ උද්‍යාන - 01- කීරිපිටිය වතුයාය

**<u>වැඩිදියුණු කරන ලද තේ බිජ වගා කරුවන් අතර බෙදා හැරීම.</u>**
තේ වගා කරුවන්ගේ විධිමත් ඉල්ලීම් වලට අනුකූලව බිජ බෙදා හැරිම අදාල බිජ උද්‍යාන පිහිටුවා ඇති වතු හා එක්ව අඛණ්ඩ ව සිදු කරමින් පවතී. කෙසේ වුවද පැවති ප්‍රවාහන / ඉන්ධන දුෂ්කරතා හේතුවෙන් බිජ බෙදා හැරීමේ කටයුතු සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය.

කෙසේ වුවද 2022 වසරේදී බීජ උද්‍යාන වලින් ලබාගත් තේ බීජ 15 kg පමණ වගාකරුවන් අතර බෙදාහරිනු ලැබූ අතර, තවත් බීජ 24 kg පමණ පර්යේෂණ / ආදර්ශන කටයුතු සඳහා යොදා ගන්නා ලදී. මීට අමතරව කීරිපිටිය වතුයායේ ස්ථාපිත කර ඇති බීජ උද්‍යානයෙන් ලබාගත් බීජ 8 kg පමණ එම වතුයායේ තවානෙහි සිටුවා ඇති අතර සපුමල්කන්ද වතුයායේ පාලනාධිකාරිය විසින් එම වතු යායේ ස්ථාපිත බීජ උද්‍යානයෙන් ලබාගත් බීජ තවාන් කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත .

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ<br>සී ජේ රැටියලගේ සහ එම් ජයරත්න

**ව්‍යාපෘතිය A 5.3. තේ කඳ ගුල්ලාට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන බීජ තේ ප්‍රභේද හඳුනා ගැනීම**
ශාක අභිජනන අංශය විසින් නව ප්‍රභේද සඳහා වන පර්යේෂණාත්මක බිම් කොටස් නඩත්තු කරනු ලබන අතර ඇගයුම් රඳා පවතින්නේ කප්පාදුවේදී පවතින තේ කඳ ගුල්ලාගේ සහ පහතරට සජීවී දැව වේයාගේ ස්වභාවික ගහණ ඝනත්වය මත ය.

ඒ එම් පී සම්මානි, එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල, එම් කේ ඩී දමයන්ති,<br>එස් පී ආර් විජේවර්ධන සහ ආචාර්ය පී ඩී සේනානායක

## ප්‍රධාන ව්‍යාපෘතිය A 51. තේ ජාන ප්ලාස්මය සංරක්ෂණ, චරිතායනය සහ ඇගයීම.

**තේ ශාකයේ වැදගත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සහ ජානමය චරිතායනය කඩිනම් කිරීම සඳහා අධි තාක්ෂණික ප්‍රවේණිකරණය.**
**අරමුදල් ප්‍රදානයඃ ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය**
මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ තේ ශාකයේ වැදගත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සහ ජානමය චරිතායනය කඩිනම් කිරීම සඳහා අධි තාක්ෂණික ප්‍රවේණිකරණය භාවිතා කිරීමයි. මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කොට , අවසන් වාර්තාව අරමුදල් ප්‍රදානය කල නියෝජිත ආයතනය වෙත බාර දෙන ලදී .

ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මයට අයත් දර්ශවල අධි තාක්ෂණික ප්‍රවේණිකරණය තවදුරටත් සිදු කරමින් පවතී .

**ශ්‍රී ලංකාවේ තේ (*Camellia sinensis* (L.) O. Kuntze) ජාන දර්ශ වල, අණුක විවිධත්වය සහ ජෛව රසායනික සංයුතිය පිළිබඳ විශ්ලේෂණයක් සිදුකිරීම**

Microsatellite markers, genomic SSRs (gSSRs), expressed sequence tag based SSRs (EST-SSRs) සහ single nucleotide polymorphism (SNP) වැනි නවතම DNA සලකුණු පද්ධති (Marker system) තේ ශාකයේ ජානමය චරිතායන සඳහා මේ වනවිටත් භාවිතයට ගනී. මෙවැනි ඉහල බහුරූපීතාවයක් (Polymorphism) සහිත සලකුණු පද්ධති චරිතායනය සඳහා භාවිතයට ගැනීම, ආර්ථික වැදගත් කමකින් යුත් තේ ප්‍රභේද හඳුනාගැනීමට මෙන්ම, පරිණාමික / ප්‍රවේණික අධ්‍යයනයන්ට හා ජාන සිතියම් සැකසීම යනාදියට ද ප්‍රයෝජනවත් වේ.

උක්ත කරුණු සැලකිල්ලට ගෙන, තේ ශාකයේ බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා භාවිතයට ගත හැකි, ජාන දර්ශ හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මයට අයත් ප්‍රභේද/ දර්ශ , නවීන ඉහල බහුරූපීතාවයක් සහිත සලකුණු පද්ධති යොදාගෙන චරිතායනය කිරීම සහ ඒවායේ ජෛව රසායනික සංයුති සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණවේ.

**ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර ජාන බැංකුවල සංරක්ෂණය කොට ඇති විදෙස් සම්භවයක් සහිත තේ ප්‍රභේද / දර්ශ වල අඩංගු කැටකීන හා කැෆෙන් සංයුතියෙහි විවිධත්වය**

මෙහිදී ශ්‍රී ලංකාවේ තේ ජාන ප්ලාස්මයට අයත් දර්ශ 131 ක (accessions including different seed stocks from exotic origins, old seedling selections, improved cultivars and un-adapted accessions) අමු දළු වල අඩංගු flavan-3-ols කාණ්ඩයට අයත් ජෛව රසායනික සංඝටක :catechin (+C), epicatechin (EC), epicatechin gallate (ECg), epigallocatechin (EGC) and epigallocatechin gallate (EGCg), caffeine and gallic acid වර්ණාලේඛ ක්‍රම (HPLC) භාවිතා කරමින් ඒවායේ සංයුතියෙහි වෙනස්කම් කාලගුණික කාල පරාසයන්ට (Seasonal variations) නිර්ණය කරන ලදී.

එම සංඝටක අතුරින් වඩාත් බහුලව හමුවුයේ EGCg වන අතර EGCg වලට පසුව EGC, ECg, EC and +C බහුලව හමුවිය. මෙම සංඝටකවල සංයුතියෙහි වෙනස්කම් පදනම් කොට, කාණ්ඩවලට වෙන්කිරීමේ සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම (hierarchical clustering) භාවිතයෙන් මෙම ජාන දර්ශ ප්‍රධාන කාණ්ඩ 2 කට වෙන්කර ගත හැකි විය. මෙහි දී සාපේක්ෂව වැඩි කැෆෙන් ප්‍රමාණයක් අඩංගු ඉන්දියානු සම්භවයක් සහිත දර්ශ (වැඩි දියුණු කළ TRI ප්‍රභේද ඇතුළුව) එක් කාණ්ඩයකටත්, සාපේක්ෂව අඩු කැෆෙන් ප්‍රමාණයක් (20 mg $g^{-1}$) අඩංගු විදෙස් සම්භවයක් සහිත දර්ශ තවත් කාණ්ඩයකටත් පැහැදිලිව වෙන් විය. මෙහි දී සාපේක්ෂව වැඩි කැෆෙන් ප්‍රමාණයක් අඩංගු තේ ප්‍රභේද/දර්ශ ඉහළ ගුණාත්මයකින් යුත් කළු තේ නිපදවීමටත්, සාපේක්ෂව අඩු කැෆෙන් ප්‍රමාණයක් අඩංගු තේ ප්‍රභේද/දර්ශ කැෆෙන් අඩු තේ /ඖෂධීය ගුණ සහිත තේ වැනි විශේෂිත තේ වර්ග (speciality tea) නිපදවීමටත් යොදා ගත හැකි බව පැහැදිලි විය .

**ශ්‍රී ලකාවේ සහ ඉන්දියාවේ තේ ජාන ප්ලාස්මයෙහි දර්ශවල රූප විද්‍යාත්මක සහ අණුකමය විවිධත්වයට අනුව එම දර්ශවල ජානමය විවිධත්වය හඳුනාගෙන ඒ හරහා එම තේ ජාන ප්ලාස්මයෙහි හරය ලෙස සැලකිය හැකි ප්‍රධාන ප්‍රභේද / දර්ශ විශ්ලේෂණය කිරීම (Morpho-molecular genetic diversity and population structure analysis to enrich core collections in tea germplasm of Sri Lanka and India)**

වර්තමාන අධ්‍යයනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකා සහ ඉන්දියානු ජාන ප්ලාස්මයට අයත් තේ ප්‍රභේද/ දර්ශවල රූප විද්‍යාත්මක හා ප්‍රවේණික චරිතායනය සිදුකොට දෙරටේම තේ අභිජනන වැඩසටහන් කඩිනම් කිරීම සඳහා භාවිතා කල හැකි වැඩි විවිධත්වයකින් යුත් ප්‍රභේද / දර්ශ හඳුනා ගැනීමයි. මේ සඳහා ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මයට අයත් ප්‍රභේද / දර්ශ 94 ක් සහ ඉන්දියානු ජාන ප්ලාස්මයට අයත් ප්‍රභේද / දර්ශ 77ක් (මුළු ප්‍රභේද / දර්ශ 171) ක් භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රභේද/ දර්ශ රූප විද්‍යාත්මක ලක්ෂණ 16ක් පදනම් කර ගනිමින් සිදුකල චරිතායනයයේදී ලබාගත් දත්ත (Principle Component) සංඛ්‍යාන ක්‍රමවේද භාවිතා කොට විශ්ලේෂණය කරන ලදී. එහිදී මුළු රූප විද්‍යාත්මක විවිධත්වයෙන් 79.05 % පළමු (Principle Component) 06 ට අයත් වූ අතර ( first six PCs accounted

for 79.05 % of the total phenotypic variation) ප්‍රධාන සමූහ 02 ක් හඳුනාගත හැකිවිය. (රූපසටහන 1 - scatter plot). මෙහිදී සියලුම කොරියානු සම්භවයක් සහිත ප්‍රභේද / දර්ශ එකම සමූහයක ස්ථානගත වූ අතර (A) ඉන්දියානු සම්භවයක් සහිත ප්‍රභේද / දර්ශ සහ වැඩි දියුණු කල TRI ප්‍රභේද බොහොමයක් (B) අනෙක් සමූහය තුළ ස්ථානගත විය.

මෙම තේ ගහනයන් හි ව්‍යුහමය හා ජානමය විවිධත්වය නිර්ණය කිරීම සඳහා බහුරූපී SSR සලකුණු 28ක් යොදාගෙන අණුකමය චරිතායනය සිදුකරන ලද අතර එහි දී ලබාගත් දත්ත Neighbor-joining tree cluster සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමවේද භාවිතා කොට සිදු කළ විශ්ලේෂණයේ දී සියලුම ශ්‍රී ලාංකික දර්ශ එක් තනි පොකුරකටත්, ඉන්දියානු දර්ශ වෙනත් පැහැදිලි පොකුරු 02 කටත් ස්ථානගත විය. මෙම දත්ත විශ්ලේෂණට උපයෝගී කරගත් Neighbor-joining tree cluster ක්‍රමවේද 05 අතරින් Gower’s distance ක්‍රමවේදය වඩාත් නිවැරදි විශ්ලේෂණ ක්‍රමවේදය බව පැහැදිලි විය.

මෙම විශ්ලේෂණ තුළින් ලැබුණු ප්‍රතිඵලවලට අනුව, ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මයේ හරය (core) ලෙස සැලකිය හැකි ප්‍රධාන ප්‍රභේද 21ක් ද ඉන්දියාවේ ජාන ප්ලාස්මයේ හරය (core) ලෙස සැලකිය හැකි මූලික ප්‍රභේද 18ක් ද හඳුනාගනු ලැබීය ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මයේ හරය ලෙස හඳුනාගත් ප්‍රභේද 21 අතුරින් 11ක් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් ප්‍රභේද වන අතර, 05ක් තේ පර්යේෂණායතනය විසින් නිපදවූ ප්‍රභේද වේ. මෙම අධ්‍යයනය දෙරටේ තේ ජානප්ලාස්මන් පිළිබඳ සිදුකල ප්‍රථම විස්තරාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනය වන අතර එහි ප්‍රතිඵල දෙරටේම අනාගත තේ බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන්වලට සහ ජානප්ලාස්ම සංරක්ෂණ, ඇගැයීම් හා උපයෝජන වැඩසටහන් සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.




රූපසටහන 1. ශ්‍රී ලංකාවේ ජාන ප්ලාස්මියට අයත් ප්‍රභේද / දර්ශ 94 හි වල රූපවිද්‍යාත්මක විවිධත්වය පෙන්වන ප්‍රස්තාරමය සටහන (PCA scatter plot)

ජේ ඩී කොට්ටාවආරච්චි, එම් ඒ බී රණතුංග (තේ පර්යේෂණ ආයතනය)
එච් කේ චෞද්රි (මහාචාර්ය -අංශ ප්‍රධානී) සහ වී කේ සුද් (ප්‍රධාන විද්‍යාඥ) බෝග වැඩිදියුණු කිරීම්,
ආර් කැටෝච් ( විද්‍යාඥ- ජෛව රසායනික)
CSK- හිමාචල් ප්‍රදේශ් කෘෂි විශ්ව විද්‍යාලය, (ඉන්දියාව)
ආර් කේ ශර්මා ප්‍රධාන විද්‍යාඥ, - ජෛව තාක්ෂණික (CSIR- හිමාලයානු ජෛව සම්පත් තාක්ෂණික
ආයතන, ඉන්දියාව / ඩී. කේ. බන්යාල්)
ප්‍රධාන විද්‍යාඥ, ව්‍යාධිවේදය ( CSK- හිමාචල් ප්‍රදේශ් කෘෂි විශ්වවිද්‍යාලය, ඉන්දියාව)

**තේ ජානමය විශ්ලේෂණය සහ තේ පත්‍ර වල අඩංගු වර්ණක පිළිබඳ ජාන සිතියම්කරණය (*Camellia sinensis*)**

**අරමුදල් ප්‍රදානය: ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, කෘෂිකර්ම අමාත්‍යංශය**

මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කොට , අවසන් වාර්තාව අරමුදල් ප්‍රදානය කල ආයතනය වෙත බාර දෙන ලදී .

එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, ටී එල් විජේරත්න (ශාක කායික විද්‍යා අංශය),
ආර් එන් අත්තනායක (උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)
ඒ එම් ටී අමරකෝන් (රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)

<u>ක්ෂේත්‍ර ජාන බැංකු පිහිටුවීම සහ නඩත්තුව</u>
තලවාකැලේ සහ රත්නපුර පිහිටුවා ඇති ක්ෂේත්‍ර ජාන බැංකුවල නඩත්තු කටයුතු සිදු කරන ලදී.

<u>තේ ජාන ප්ලාස්මයෙහි හරය ලෙස හඳුනාගත් දර්ශ (core collection of tea germplasm) හන්තාන සහ පස්සර පිහිටි ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල ස්ථාපනය කිරීම</u>
තේ ජාන ප්ලාස්මයෙහි හරය ලෙස හඳුනාගත් දර්ශ පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කරන ලදී. හන්තාන ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අදාල, මූලික බිම් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ
සී ජේ රැටියලගේ, සහ එච් ඩබ් එම් එම් ජයරත්න

**ප්‍රධාන ව්‍යාපෘති A52: නවීන කෘෂිකාර්මික පිළිවෙත් සහ ඉහළ යෙදවුම් සඳහා වැඩි වශයෙන් යොමු නොවන කුඩා තේ වතු හිමියන් සඳහා වඩා උචිත තේ ප්‍රභේද නිපදවීම සහ මූලික පරීක්ෂා කිරීම**
කුඩා තේ වතු හිමියන්ට අයත් පරිශ්‍ර 15ක ස්ථාපිත කර ඇති TRI 5000 කාණ්ඩයේ අනුවර්ති පර්යේෂණ ක්ෂේත්‍ර වල අධීක්ෂණ කටයුතු 2022 වසරදී තව දුරටත් ක්‍රියාත්මක විය.

කළුතර දිස්ත්‍රික්කයේ පරිශ්‍ර 03 (මීගහතැන්න, හොරණ ,පැලවත්ත) ගාල්ල දිස්ත්‍රික්කයේ පරිශ්‍ර 05 (නෙළුව, උනන්විටිය, ඉහලකීබිය, තල්ගම්පොළ, බටපොල), මාතර දිස්ත්‍රික්කයේ පරිශ්‍ර 02 (අකුරැස්ස , මොරවක), රත්නපුර දිස්ත්‍රික්කයේ පරිශ්‍ර 02 (පලාවෙල ,ඇහැලියගොඩ), බදුල්ල දිස්ත්‍රික්කයේ 01 පරිශ්‍රයක් (හාලිඇල), මහනුවර දිස්ත්‍රික්කයේ පරිශ්‍රයක් (හේවාහැට) සහ නුවරඑලිය දිස්ත්‍රික්කයේ 01 පරිශ්‍රයක් (කොත්මලේ)

පරිශ්‍ර 05ක අස්වනු සංරචක පිළිබඳ අධ්‍යයනයන්ද (Yield Component Assessments) සිදු කරන ලදී (හොරණ, පැලවත්ත, නෙළුව, මොරවක, පලාවෙල)

එම් ඒ බී රණතුංග, ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ
සී ජේ රැටියලගේ, සහ එච් ඩබ් එම් එම් ජයරත්න

**ව්‍යාපෘතිය B 128: සම්ප්‍රදායික තේ අභිජනන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා නාලස්ථ ක්‍රමවේද භාවිතය**
ද්‍රව මාධ්‍යයක් තුලදී නව තේ ප්‍රභේදවල දඬු කැබලි මගින් විශාල පැළ ප්‍රමාණයක් සීඝ්‍රව ප්‍රචාරණය කරගැනීම සඳහා වන පර්යේෂණ තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී

පටක රෝපණ තාක්ෂනය භාවිතයෙන් නිපදවා, ක්ෂේත්‍ර ස්ථාපිත කර ඇති තේ පැළවල අස්වනු නෙලීම දක්වා ක්‍රියාකාරකම් සිදුකරන ලදී

එම් ඒ බී රණතුංග, කේ කේ රණවීර, එච් ඩබ් එම් එම් ජයරත්න

**තේ ශාකයෙහි දෛහික කළල ජනනය සහ තනි සෛල රෝපණය (somatic embryogenesis and single cell regeneration) සඳහා නව ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම**

තේ , කෝපි වැනි බහුවාර්ෂික ශාක වල දෛහික කළල ජනනය සහ තනි සෛල පුනර්ජනනය සිදුකිරීමේදී විකෘති සහිත පැළ ඇතිවීම (chimeric mutant plants) මෙවැනි පර්යේෂණවලට ඇති ප්‍රධාන බාධාවකි. කෝපි ශාකය සඳහා මෙම තත්වය මගහරවාගෙන, සාර්ථකව දෛහික කළල ජනනය මෙවැනි පර්යේෂණවලට ඇති ප්‍රධාන බාධාවකි. කෝපි ශාකය සඳහා මෙම තත්වය මග හරවාගෙන, සාර්ථකව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියට අයත් ශාක අභිජනන හා ප්‍රවේණි විද්‍යාගාරයේ ආරම්භකොට ඇත. එම ආයතනයේ අනුග්‍රහයෙන් හා එම ආයතනය හා ඒකාබද්ධව සිදුකරන තේ ශාකයේ ජානමය පදනම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් හරහා අදාළ ක්‍රමවේදය තේ ශාකය සඳහා ගැලපෙන පරිදි වෙනස්කම්වලට ලක්කොට භාවිතා කිරීම මේ වන විට අරඹා ඇත .

මීට අමතරව මේ වනවිටත් තේ පත්‍ර වලින් දෛහික කළල ජනනය (direct embryogenesis) ඉතා ශසාර්ථකව සිදුකරන අතර, රෝපණය කොට සතියකින් පසුව ලබාගත් කළල විකරණයන් ජනනය කිරීම සඳහා ගැමාකිරණවලට නිරාවරණය කිරීම ද සිදු කෙරේ. තව ද දෛහික කළල ජනනය සිදුකරන ක්‍රමවේද 2ක් (direct and indirect somatic embryogenesis) භාවිතා කොට තේ ප්‍රභේද කිහිපයක කළල ජනනය සිදුකොට ඇති අතර එම රෝපණ ශාක අභිජනන අංශයේ විද්‍යාගාරය තුළ අධීක්ෂණය කරමින් පවතී.

කේ කේ රණවීර, එච් ඩබ් එම් එම් ජයරත්න සහ එම් ඒ බී රණතුංග

**D/BREED- ශාක අභිජනන අංශයේ සාමාන්‍ය කටයුතු**

**ව්‍යාපෘතිය GL 365 (ASMSC) : තේ වර්ධක ප්‍රචාරණය (අතු කැබලි මඟින්) සඳහා වැඩි දියුණු කළ ප්‍රචාරණ ක්‍රමවේදයන් අත් හදා බැලීම**

**ජිෆි නිෂ්පාදන පුද්ගලික සමාගම (Jiffy products Pvt Ltd ,Sri Lanka) සමඟින් සිදු කෙරෙන ඒකාබද්ධ ව්‍යාපෘතියකි**

මෙම පිරික්සුම් හරහා නිපැයූ, පැළ 24ක (ක්ෂේත්‍ර අංක 9: ශාන්ත කූම්බ්ස් වතුයාය පැළ) 78ක (ක්ෂේත්‍ර අංක 02: ශාන්ත ජෝකිම් වතුයාය) සහ 2021 වසරේදී ක්ෂේත්‍රයේ සිටවූ පැළ 61 ක (ක්ෂේත්‍ර අංක 9: ශාන්ත කූම්බ්ස් වතුයාය) අස්වනු නෙලීම දක්වා ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී.

එච් ඩබ් එම් එම් ජයරත්න, ඒ කේ මුදලිගේ, ජේ එච් එන් පියසුන්දර සහ එම් ඒ බී රණතුංග

**ව්‍යාපෘතිය GL 390: නියගයෙන් වැඩි බලපෑමක් සිදුවන ප්‍රදේශ සඳහා වැඩි දියුණු කල තේ බීජ නිපදවීම අරමුණු කරගෙන, නව තේ බීජ උද්‍යාන ස්ථාපනය කිරීම – තේ බීජ උද්‍යාන 15 ක්**

**අරමුදල් ප්‍රදානය : වැවිලි අමාත්‍යාංශය**

මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ නියගයෙන් වැඩි බලපෑමක් සිදුවන ප්‍රදේශව වගාකරුවන් අතර වැඩි දියුණු කළ තේ බීජ සඳහා පවතින ඉල්ලුම සපුරාලීම පිණිස නව තේ බීජ උද්‍යාන ස්ථාපනය කිරීමයි.

වැඩි දියුණු කළ තේ බීජ සියලුම වගාකරුවන් (මහා පරිමාණ හා කුඩා පරිමාණ) හට ලබාගත හැකි වන පරිදි මෙම බීජ උද්‍යාන තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථාන, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ වතු සමාගම් වලට අයත් පරිශ්‍ර වල ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇති අතර, මෙම වසර තුළ දී නව බීජ උද්‍යාන 09ක් ස්ථාපනය කරනු ලැබීය. ඒ අනුව මේ දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ නව බීජ උද්‍යාන 10ක් ස්ථාපිත කර ඇත.

වගුව 11. GL 390 ව්‍යාපෘතිය යටතේ 2022 වසරේ දී ස්ථාපනය කරන ලද නව බහු - ප්‍රභේද බීජ උද්‍යානවල විස්තර

| පරිශ්‍රය | ස්ථාපිත කල දිනය | මාපිය ප්‍රභේද (Parental Cultivars ) |
|---|---|---|
| හෝමදොල වත්ත - උඩුගම | 19.05.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 3055, KEN 16/3, S 106, KP 204 |
| කු. තේ. සං. අ. -රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය, උඩුවෙල. | 30.05.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 2043, TRI 3019, TRI 3055, KEN 16/3 |
| ඇන්දාන වත්ත - කහවත්ත | 29.06.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 3055, KEN 16/3, S 106, KP 204 |
| වෝගන් වත්ත - මතුගම | 25.07.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 3055, KEN 16/3, S 106, KP 204 |
| ලෙල්වල වත්ත - වඳුරඹ | 27.07.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 3055, KEN 16/3, S 106, KP 204 |
| කු. තේ. සං. අ. -වැලිමඩ | 25.10.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 2043, KEN 16/3 |
| කු. තේ. සං. අ. - හාලිඇල | 25.10.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 2043, TRI 3055, KEN 16/3, S 106 |
| කු. තේ. සං. අ. -පස්සර | 26.10.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 2043, TRI 3055, KEN 16/3, S 106 |
| රයිගම් වත්ත - ඉංගිරිය | 01.11.2022 | TRI 2016, TRI 2022, TRI 2025, TRI 2027, TRI 3055, KEN 16/3, S 106 |

කු. තේ. සං. අ. = කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

බීජ උද්‍යාන සඳහා අවශ්‍ය පැළ නිපදවීම තේ පර්යේෂණායතනයට අයත් (තලවාකැලේ, රත්නපුර, දෙනියාය හා පස්සර ) පැළ තවාන් වලදී සිදුකරනු ලැබීය.

ජේ එච් එන් පියසුන්දර, එම් ඒ බී රණතුංග , ඒ කේ මුදලිගේ, කේ කේ රණවීර ,
සී ජේ රැටියලගෙ සහ එච් ඩබ් එම් එම් ජයරත්න

**GL 395: නව තේ ප්‍රභේදවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් අතර බෙදා හැරීමට මව් වගාවන්හි වපසරිය වැඩි කිරීමේ නව ව්‍යාපෘතිය - හෙක්ටයාර 14**

උක්ත ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව වැවිලි අමාත්‍යාංශය මගින් පිලිගෙන 2022 වසරේ සිට ප්‍රතිපාදන අනුමත කරන ලදී.

2017-2021 දක්වා වැවිලි අමාත්‍යංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල විශේෂ ව්‍යාපෘතියක් (GL 340) හරහා නව තේ ප්‍රභේදවල මව් වගා බිම් හෙක්ටයාර 22 ක් පමණ, ස්ථාපනය කොට ඇති අතර නව ව්‍යාපෘතියේ අරමුණ වනුයේ මෙම මව් වගා බිම් වල වපසරියන්, නව ප්‍රභේද සඳහා වගාකරුවන්ගේ අනාගත ඉල්ලුම සපුරාලන පරිදි තවදුරටත් වර්ධනය කිරීමයි. මෙම නව ව්‍යාපෘතිය තේ පර්යේෂණායතනයට අයත් ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ සහ ශාන්ත ජෝකිම්, රත්නපුර යන වතුවලද, තේ පර්යේෂණායතනයේ කොට්ටව, හන්තාන සහ පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ද ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කිරීමට නියමිත මුළු මව් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 14 කි.

2022 වසර තුළ දී පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානය හැර අන් සියලු පරිශ්‍රවල බිම් සකස් කිරීමේ සහ තවාන් පැළ නිපදවීමේ කටයුතු ආරම්භකර ඇති අතර පස්සර ප්‍රාදේශීය මධ්‍යස්ථානය සතුව වගාව සිදුකිරීමට අවශ්‍ය ඉඩම් නොමැතිවීම හේතවෙන් යාබද ගෝනකැලේ වතුයායෙන් අවශ්‍ය හෙක්ටයාර 02 ක් පමණ ඉඩමක් තෝරාගෙන ඇති අතර, අදාළ පවරාගැනීමට අමාත්‍යංශ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

ශාක අභිජනන සහ උපදෙස් හා ව්‍යාප්ති අංශවල නිලධාරීන්
සහ ශාන්ත කූම්බ්ස් හා ශාන්ත ජෝකිම් වතුවල වතු අධිකාරීවරුන්

**NRC – 20 – 123: පැරණි බීජ තේ ශාක සංරක්ෂණය සහ ඵලදායී ලෙස භාවිතා කිරීම: කාලගුණ විපර්යාස වලින් සිදුවන බලපෑම සඳහා උපයෝජන ක්‍රමෝපායක් ලෙස**

**අරමුදල් ප්‍රදානය ( ජාතික පර්යේෂණ කවුන්සිලය , ශ්‍රී ලංකාව (NRC)**

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වසර 2 ක කාලයක් සඳහා ජාතික පර්යේෂණ කවුන්සිලය විසින් රුපියල් මිලියන 3.44 ක මුදලක් ප්‍රදානය කොට ඇත.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ දැනට ඉතිරිව ඇති පැරණි බීජ තේ ශාකවල ජානමය විවිධත්වය පිළිබඳ අධ්‍යයනයක් සිදු කොට, සංරක්ෂණය කලයුතු ජාන සම්පත් (hotspots) හඳුනාගැනීම සහ එම ජාන සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන ක්‍රමෝපායන් සංවර්ධන කිරීමයි. මෙම ව්‍යාපෘතිය හරහා උකහාගන්නා දැනුම / රැස්කරගන්නා තොරතුරු අනාගත තේ ශාක අභිජනන වැඩසටහන් සඳහා උපයෝගී කරගැනීමට හා අදාල වතුයායන් හි කළමනාකරණය සඳහා ඵලදායී ලෙස යොදා ගැනීමට හැකිවනු ඇත .

මෙම ව්‍යාපෘතිය සඳහා සාපේක්ෂව වැඩිම පැරණි බීජ තේ බිම් ප්‍රමාණයක් සහිත ඌව කලාපය තෝරාගත් අතර එම කලාපයහි වතු සමාගම් 7 කට අයත් වතු 62 ක් පිහිටා ඇත. එම වතු 62 අතුරින් 25 ක් පමණ මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත අතර මෙම තෝරා ගැනීමේ මූලික පදනම වූයේ අදාල වතුයායන්හි පැරණි බීජ වගාවන්හි වපසරිය සහ ස්ථාපිත කල කාල සීමාවයි. මෙහිදී අදාල වතුයායන්හි මුළු වපසරියෙන් 60%කට වඩා වැඩි ප්‍රමාණයක් වසර 70 කට වඩා පැරණි (ස්ථාපිත වසර / ක්ෂේත්‍ර වල වයස පිළිබද තොරතුරු අදාල වතුවල ලිපි ලේඛන පරීක්ෂා කිරීමෙන් සහ අදාල නිලධාරීන්ගෙන් සිදුකළ විමසීම් හරහා සිදුකරන ලදී) බීජ තේ වගාවන් ගෙන් යුක්ත වීම නිර්ණායක ලෙස භාවිතා කරන ලදී. මීට අමතරව ඌව කලාපයට අයත් සියලුම කෘෂි-පාරිසරික කලාප නියෝජනය ආවරණය වන පරිදි මෙම තෝරාගැනීම සිදුකරන ලදී.

ඇගයීම (bush assessment) සිදුකිරීමේදී පිළිගත් නියැදි ලබාගැනීමේ ක්‍රමවේදයක් (transect and point sampling method) භාවිතා කරන ලදී .මෙහිදී එක් එක් ක්ෂේත්‍රය තුළ, 10 m x 10 m සිව්රැසක් අවම වශයෙන් මීටර 50 පරතරයක් සහිතව අහඹු ලෙස යෙදීමෙන් අනතුරුව ඒ එක් එක් සිව්රැසෙහි එක් පසෙක (corner) 5 m × 5 m කොටසක් (subplot) සලකුණු කරන ලද අතර ඒ එක් සලකුණු කරන ලද කොටස්වල ඇති බීජ තේ පදුරුවල රූපවිද්‍යාත්මක විවිධත්වය අගැයුමට භාජනය කරන ලදී. ස්ප්‍රින් වැලි (IM 1a), ෂවලන්ඩ්ස් (IM2b), මහදෝව (IU2), උඩවේරිය (IU3b), වේවැස්ස, නාහවිල, දම්මේරිය ඊ (IU3c), විර්වික් (IU3d) සහ වැලිමඩ (IU3e) වතුවල ඇගැයුම් කටයුතු මේ වනවිට අවසන්ව ඇත.

IU3c කෘෂි පාරිසරික කලාපයට අයත් වතුවල පැරණි බීජ තේ ගහනයන්හි රූපවිද්‍යාත්මක විවිධත්වය, දළු ඝනත්වය, නිරීක්ෂිත රෝග හා පළිබෝධ ව්‍යාප්තිය රූප සටහන් අංක 7 (Radar Chart) හි සංක්ෂිප්ත ලෙස ඉදිරිපත් කර ඇත. මෙහි දී වේවැස්ස වතුයායේ පැරණි බීජ තේ ගහනයන්හි සාපේක්ෂව ඉහළ රූපවිද්‍යාත්මක විවිධත්වයක් දක්නට ලැබිණි. අනෙකුත් කෘෂි පාරිසරික කලාපයන්හි දත්ත විශ්ලේෂණය කරමින් පවතී.




රූපසටහන 7. IU3c කෘෂි පාරිසරික කලාපයට අයත් වතුවල පැරණි බීජ තේ ගහනයන්හි රූපවිද්‍යාත්මක විවිධත්වය, දළු ඝනත්වය, නිරීක්ෂිත රෝග හා පළිබෝධ ව්‍යාප්තිය (Radar chart)

එම් ඒ එස් කේ ප්‍රේමරත්න සහ එම් ඒ බී රණතුංග

# භූමි ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ බෝග පාලනය



**භූමි ඵලදාව වැඩි දියුණු කිරීම සහ බෝග පාලනය**

## ප්‍රධාන ව්‍යාපෘතිය A 15. කෘෂි පාරිසරික කලාප පදනම්ව ප්‍රාදේශීය පාංශු පෝෂක හා ඩොලමයිට් නිර්දේශය

### ව්‍යාපෘතිය A 15.1: මහා පෝෂක (N, P, K, S සහ P) සඳහා කෘෂි දේශගුනික කලාප මට්ටමින් බෝග ප්‍රතිචාරය ඇස්තමේන්තු කිරීම

#### අ) මේරූ තේ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස භාවිතා කිරීම (අනුවර්තී පොහොර පර්යේෂණය)

මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූයේ, කර්මාන්තශාලා දර අළු සහ කසල තේ/ කොම්පෝස්ට්, තේ වගාවේ පෝෂක ප්‍රභවයන් ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව තේ වගාකරුවන් යටතේ අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය 2019 ජනවාරි පහතරට ප්‍රදේශයේ දෙනියාය, කරිලපන, කිරුවනාගඟ වතුයායේ ස්ථාපනය කරන ලදී.

මූලික පර්යේෂණයෙන් ලැබුණු ප්‍රතිඵලවලට අනුකූලව දැව අළු අවුරුද්දකට හෙක්ටයාරකට කිලෝ ග්‍රෑම් 500, 1000 සමඟ කසල තේ හෝ කොම්පෝස්ට් අවුරුද්දකට හෙක්ටයාරයකට මෙ.ටොන් 20ක් සහ යූරියා කිලෝ ග්‍රෑම් 270 සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන පොහොර නිර්දේශය වන VP/LC 880 අනුවර්ති පොහොර පර්යේෂණය සඳහා ප්‍රතිකාරක ලෙස තෝරා ගන්නා ලදී.

## II. දැව අළු යෙදීමෙන් පාංශු pH කෙරෙහි බලපෑම.

දැව අළු යෙදීමෙන් පසු පාංශු pH අගයන් හි විචලනය අංක 1 වගුවෙන් දැක්වේ.

ප්‍රතිකාරක වල අස්‍රැත ජලය හා $CaCl_2$ මගින් නිර්ණය කල පාංශු pH අගයන් අතර පැහැදිලි වෙනසක් දැකිය හැක. වර්තමාන පොහොර නිර්දේශය සහිත ප්‍රතිකාරකය සමඟ සැසඳූ විට ගැඹුරු මට්ටම් දෙකෙහිම පාංශු pH අගයේ පැහැදිලි වැඩිවීමක් දැව අළු 1000 kg/ha/yr ක් කසල තේ සමඟ යෙදූ ප්‍රතිකාරකයෙහි දක්නට ලැබුණි. වැඩිම පාංශු pH අගයක් දැව අළු 1000 kg/ha/yr ක් කසල තේ (20 t/ha/yr) හා යූරියා(270 kg/ha/yr) සමඟ යෙදූ ප්‍රතිකාරකයෙහි වාර්තා විය. මෙසේ වීමට දැව අළු වල භාෂ්මිකතාවය බලපායි.

වගුව 1. දැව අළු යෙදීමෙන් පාංශු pH කෙරෙහි බලපෑම.

| ප්‍රතිකාරකය | ගැඹුරු මට්ටම 0 - 15 cm | | ගැඹුරු මට්ටම 15 - 30 cm | |
|---|---|---|---|---|
| | † පාංශු pH අගය (අස්‍රැත ජලය) | †පාංශු pH අගය ($CaCl_2$) | † පාංශු pH අගය (අස්‍රැත ජලය) | †පාංශු pH අගය ($CaCl_2$) |
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270kg /ha/yr) | 4.25b | 3.69b | 4.32ab | 3.73ab |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 4.36ab | 3.78b | 4.43ab | 3.80ab |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 4.61ab | 3.93ab | 4.65a | 3.93ab |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 4.91a | 4.11a | 4.88a | 4.04a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 4.01b | 3.68b | 3.99b | 3.65b |
| LSD (p=0.05) | 0.62 | 0.32 | 0.60 | 0.32 |
| CV% | 5.06 | 3.02 | 4.85 | 3.01 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

රසායනික පොහොර පමණක් යෙදූ ප්‍රතිකාරකයේ පාංශු pH වල පහළ අගයන් පෙන්නුම් කරයි. පසේදී යූරියා ජල විච්ඡේදනයෙන් ඇමෝනියම් අයන ($NH_4^+$) සාදයි. එම ඇමෝනියම් අයන නයිට්‍රීකරණය වීමේදී ආම්ලිකතාවය වැඩි වීමක් වන හෙයින් එය පාංශු pH අගය අඩුවීමට බලපායි. දැව අළුවල භාෂ්මිකතාවය නිසා රසායනික පොහොර මගින් සිදුකරන ආම්ලිකතාවය උදාසීන කරයි.

අදාල කාල සීමාව තුළ දී රසායනික පොහොර යෙදීමට නොහැකිවූව ද දැව අළු යෙදූ ප්‍රතිකාරකවල පාංශු pH අගය සැලකිය යුතු ලෙස වෙනස් වීමට හේතුව ඉකුත් වසරවල දී යොදන ලද දැව අළුවල අවශේෂ බලපෑම විය හැක. එ බැවින් දැව අළු ප්‍රතිකාරක, පාංශු pH අගය තේ වගාවට යෝග්‍ය පරාසයක දිගුකාලීනව පවත්වා ගැනීමට දායක වේ.

## II. දැව අළු යෙදීමෙන් ශාකයට ලබා ගත හැකි පාංශු පොස්ෆරස් (P) හා පොටෑසියම් (K) කෙරෙහි බලපෑම.

දැව අළු යෙදීමෙන් ශාකයට ලබා ගත හැකි පාංශු P හා K අගයන් අංක 2 වගුවෙන් දැක්වේ. ශාකයට ලබාගත හැකි පාංශු P හා K ප්‍රමාණයන්හී සැලකිය යුතු වෙනසක් පාංශු ගැඹුරු මට්ටම් දෙකේදීම ප්‍රතිකාරක අන්තර දක්නට නොලැබේ. ගෙවුනු වසර තුල ප්‍රතිකාරක යෙදීමට නොහැකි වීම මේ සඳහා හේතු විය හැකිය

වගුව 2. දැව අළු යෙදීමෙන් ශාකයට ලබා ගත හැකි පාංශු P හා K වල ප්‍රමාණයන්.

| ප්‍රතිකාරකය | † පාංශු P (මි. ග්‍රෑ/ කි. ග්‍රෑ.) | | පාංශු K (මි. ග්‍රෑ/ කි. ග්‍රෑ.) | |
|---|---|---|---|---|
| | ගැඹුරු මට්ටම 0 - 15 cm | ගැඹුරු මට්ටම 15 - 30 cm | ගැඹුරු මට්ටම 0 - 15 cm | ගැඹුරු මට්ටම 15 - 30 cm |
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 70a | 59a | 110a | 103a |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 64a | 26a | 140a | 135a |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 114a | 105a | 110a | 96a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 89a | 65a | 96a | 88a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 56a | 46a | 130a | 127a |
| LSD (p=0.05) | 65.5 | 82.3 | 72.6 | 72.4 |
| CV% | 32.4 | 49.2 | 22.3 | 23.7 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

## III. දැව අළු යෙදීමෙන් ශාකයට ලබා ගත හැකි පාංශු Mg හා Ca කෙරෙහි බලපෑම.

ප්‍රතිකාරක යෙදීමෙන් පසු ශාකයට ලබා ගත හැකි පාංශු Mg හා Ca ප්‍රමාණයන් හි අගයන් අංක 03 වගුවෙන් දැක්වේ. පාංශු Mg හා Ca ප්‍රමාණයන්ගේ පැහැදිලි ඉහළ අගයන් කොම්පෝස්ට් සමඟ දැව අළු හා කසල තේ සමඟ දැව අළු යෙදූ ප්‍රතිකාරකවල දක්නට ලැබේ.

දැව අළු වල Mg හා Ca පෝෂක බහුලව තිබෙන බැවින් රසායනික පොහොර යෙදූ ප්‍රතිකාරකය සමඟ සංසන්දනයේ දී පාංශු Mg ප්‍රමාණයේ ඉහළ අගයක් දැව අළු සමඟ කොම්පෝස්ට් හෝ කසල තේ යෙදූ ප්‍රතිකාරකවල, නිරීක්ෂණය වේ.

වගුව 03. දැව අළු යෙදීමෙන් ශාකයට ලබා ගත හැකි පාංශු Mg හා Ca කෙරෙහි බලපෑම.

| ප්‍රතිකාරකය | † පාංශු Mg (මි. ග්‍රෑ/ කි. ග්‍රෑ.) | | පාංශු Ca (මි. ග්‍රෑ/ කි. ග්‍රෑ.) | |
|---|---|---|---|---|
| | ගැඹුරු මට්ටම 0 - 15 cm | ගැඹුරු මට්ටම 15 - 30 cm | ගැඹුරු මට්ටම 0 - 15 cm | ගැඹුරු මට්ටම 15 - 30 cm |
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 23b | 20c | 118bc | 103ab |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 34a | 23bc | 149bc | 121ab |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 38a | 33ab | 252ab | 176a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 45a | 37a | 330a | 198a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 17b | 15c | 65c | 59b |
| LSD (p=0.05) | 11.0 | 11.3 | 174.9 | 104.7 |
| CV% | 12.8 | 16.1 | 34.4 | 28.7 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

පාංශු Ca වල පැහැදිලි විචලනයක් දැව අළු, කසල තේ සමග යෙදූ ප්‍රතිකාරකයේ (1000 kg/ha/yr දැව අළු + කසල තේ 20 t/ha/yr) දක්නට ලැබේ. දැව අළුවල ඉහළ Ca ප්‍රමාණයන් අඩංගු බැවින් ශාකයට ලබා ගත හැකි පාංශු Ca ප්‍රමාණය වැඩිවීමක් දැව අළු යෙදූ ප්‍රතිකාරකවල පෙන්නුම් කරයි.

## IV. දැව අළු යෙදීමෙන් පාංශු කාබනික කාබන් සහ කැටායන හුවමාරු ධාරිතාව (CEC) කෙරෙහි බලපෑම.

පාංශු කාබනික කාබන් සහ CEC අගයන් අංක 4 වගුවෙන් දැක්වේ. පාංශු කාබනික කාබන් අගයන්හි පැහැදිලි වෙනසක් ප්‍රතිකාරක අතර නිරීක්ෂණය නොවේ.

වගුව 04. දැව අළු යෙදීමෙන් පාංශු කාබනික කාබන් සහ CEC ප්‍රමාණයන් කෙරෙහි බලපෑම.

| ප්‍රතිකාරක | † පාංශු කාබනික කාබන් % | † පාංශු CEC (මිලි සමක/100 ග්‍රෑම්) |
|---|---|---|
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා(270 kg/ha/yr) | 2.06a | 20.7a |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 1.86a | 19.7a |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 1.84a | 20.9a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 1.71a | 19.4a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 2.01a | 20.3a |
| LSD (P= 0.05) | 1.13 | 2.14 |
| CV% | 21.4 | 3.82 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

## V. දැව අළු යෙදීමෙන් ශාක පත්‍රවල නයිට්‍රජන් (N) , පොස්ෆරස් (P) සහ පොටෑසියම් (K), පෝෂක කෙරෙහි බලපෑම.

නයිට්‍රජන්, P සහ K පෝෂක, මිරිස් පත්‍රවල අඩංගු ප්‍රමාණයන් අංක 5 වගුවෙන් දැක්වේ. මිරිස් පත්‍රවල අඩංගු N, P, K ප්‍රමාණයන්වල පැහැදිලි විචලනයක් ප්‍රතිකාරක අතර නිරීක්ෂණය නොවන අතර එය වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) සමගද පැහැදිලි විචලනයක් නිරීක්ෂණය නොවේ.

වගුව 05. දැව අළු යෙදීම ශාක පත්‍රවල නයිට්‍රජන් (N) , පොස්ෆරස් (P) සහ පොටෑසියම් (K), පෝෂක කෙරෙහි වන බලපෑම.

| ප්‍රතිකාරක | † N % | † P % | † K % |
|---|---|---|---|
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 3.96a | 0.25a | 1.18a |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 3.99a | 0.26a | 1.17a |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 3.92a | 0.24a | 1.07a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 3.95a | 0.24a | 1.07a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 4.08a | 0.23a | 1.17a |
| LSD (P= 0.05) | 0.19 | 0.03 | 0.29 |
| CV% | 1.72 | 4.34 | 9.23 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

**VI. දැව අළු යෙදීම ශාක පත්‍ර වල මැග්නීසියම් (Mg), කැල්සියම් (Ca) සහ සල්ෆර් (S) පෝෂක කෙරෙහි වන බලපෑම.**

මව් පත්‍රවල අඩංගු Mg, Ca සහ S පෝෂක ප්‍රමාණයන් අංක 6 වගුවෙන් දැක්වේ. දැව අළු යෙදූ ප්‍රතිකාරක වල Mg, Ca සහ S පෝෂක ප්‍රමාණයන්හි පැහැදිලි වෙනසක් දක්නට නොලැබිණි. එමෙන්ම එම අගයන් වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) සමඟ සංසන්දනයේ දී ද වෙනසක් නොපෙන්වන ලදි.

වගුව 06. දැව අළු යෙදීම ශාක පත්‍රවල මැග්නීසියම් (Mg), කැල්සියම් (Ca) සහ සල්ෆර් (S) පෝෂක කෙරෙහි වන බලපෑම.

| ප්‍රතිකාරක | † Mg % | Ca % | S % |
|---|---|---|---|
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270kg /ha/yr) | 0.27a | 1.47a | 0.27a |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 0.29a | 1.40a | 0.24a |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 0.31a | 1.50a | 0.22a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 0.30a | 1.38a | 0.24a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 0.26a | 1.47a | 0.22a |
| LSD (P= 0.05) | 0.09 | 0.17 | 0.10 |
| CV% | 11.69 | 4.45 | 15.5 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

**VII. දැව අළු යෙදීමෙන් නිමි තේ අස්වැන්න කෙරෙහි බලපෑම.**

ප්‍රතිකාරක අතර නිමි තේ අස්වැන්නේ විචලනය අංක 7 වගුවෙන් දැක්වේ. ප්‍රතිකාරක අතර නිමි තේ අස්වැන්නේ පැහැදිලි වෙනසක් දක්නට නොලැබේ. නිර්දේශිත රසායනික පොහොර යෙදූ ප්‍රතිකාරකය සමඟ දැව අළු යෙදූ ප්‍රතිකාරකවල සංසන්දනාත්මක නොවෙනස් නිමි තේ අස්වැන්නක් දැකිය හැකිය. එබැවින් දැව අළු කසල තේ හෝ කොම්පෝස්ට් සමඟ පරිණත තේ වගාවට යෙදීම මගින් රසායනික පොහොර අඩු කිරීමේ හැකියාවක් පවතින බව ගම්‍ය වේ.

වගුව 07. දැව අළු යෙදීමෙන් නිමි තේ අස්වැන්න කෙරෙහි වන බලපෑම.

| ප්‍රතිකාරක | † නිමි තේ අස්වැන්න (කි. ග්‍රෑම් /හෙක්ටයාර) |
|---|---|
| දැව අළු (500 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270kg/ha/yr) | 2800a |
| දැව අළු (1000 kg/ha/yr) + කොම්පෝස්ට් (20 t/ha/yr) + යූරියා (270kg/ha/yr) | 2827a |
| දැව අළු (500 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 2887a |
| දැව අළු (1000 kg/ha/yr) + කසල තේ (20 t/ha/yr) + යූරියා (270 kg/ha/yr) | 2789a |
| වර්තමාන පොහොර නිර්දේශය (VPLC 880) | 2838a |
| LSD (P= 0.05) | 103 |
| CV% | 1.31 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

ජේ ආර් වයි අබේවර්ධන, එස් කේ වීරතුංග, ඩබ් එම් එස් විජයතුංග සහ එල් ආර් එම් සී ලියනගේ

**ආ) පුනරුත්ථාපන තෘණ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස සහ පසේ ආම්ලිකතාවය නිවැරදි කිරීමට ප්‍රතිකාරකයක් ලෙස භාවිතා කිරීම (අනුවර්ති පොහොර පර්යේෂණය)**

මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූයේ, කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස සහ පසේ ආම්ලිකතාවය නිවැරදි කිරීමට ප්‍රතිකාරකයක් ලෙස පුනරුත්ථාපන තෘණ සඳහා භාවිතා කිරීමට ඇති විභවය තේ වගාකරුවන් යටතේ අධ්‍යයනය කිරීමයි. පුනරුත්ථාපන තෘණ සඳහා දැව අළු යෙදීම පිළිබඳ පර්යේෂණ අත්හදා බැලීම්වල ප්‍රතිඵල මත පදනම්ව, අනුවර්ති පරීක්ෂණ සඳහා ප්‍රතිකාරක ලෙස, දැව අළු කිලෝග්‍රෑම් 1000/හෙක්ටයාර්/වසරකට, වත්මන් (තේ. ප. ආ.) ඩොලමිටික් හුණුගල් නිර්දේශය සහ (තේ. ප. ආ.) අකාබනික පොහොර නිර්දේශය ((U625)) තෝරාගනු ලැබූ අතර ගොවි ක්ෂේත්‍ර තත්ත්වය යටතේ පර්යේෂණ සොයාගැනීම් වලංගු කිරීම සිදුකරන ලදී.

මෙහි දී මූලික පර්යේෂණයන් සහ අනුවර්ති පර්යේෂණයන්ගෙන් ලබා ගත් දත්ත සහ ප්‍රතිඵල තේ ක්ෂේත්‍රය සඳහා නිර්දේශ කිරීමට අවශ්‍ය පර්යේෂණ පත්‍රිකාව පිළියෙල කිරීම සහ එය තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ් එම් එස් විජයතුංග, ජේ ආර් වයි අබේවර්ධන සහ ඩබ් ටී බී ඩී ප්‍රියන්ත

**ව්‍යාපෘතිය 15.3: තේ වගාව සඳහා ජෛව කාබනික සහ ඛණිජ හෝ සංයුක්ත පොහොර සෑදීම සඳහා ක්‍රම ප්‍රවර්ධනය කිරීම**

**(අ) පර්යේෂණය : තේ ආශ්‍රිත ශාක වර්ධන ප්‍රවර්ධන රයිසොබැක්ටීරියා (PGPR) හඳුනා ගැනීම සහ ඇගයීම**

විද්‍යාත්මක උපදේශන කමිටු නිර්දේශය මත පදනම්ව, පහත සඳහන් ප්‍රතිකාරක සමඟ (2020) ජනවාරි මාසයේ දී තනි මුහුන් ලෙස නයිට්‍රජන් (N) තිර කරන බැක්ටීරියා (NFB) පොස්ෆරස් (P) දියකරන බැක්ටීරියා (PSB) වල බලපෑම ඇගයීම සඳහා වැඩි ප්‍රතිකාර සංඛ්‍යාවක් සහිත අත්හදා බැලීමක් නයාපාන වතුයාය, නයාපාන දී ආරම්භ කරන ලදී.

T1: වත්මන් පොහොර නිර්දේශය
T2: 2/3N + 100% P + 100% K
T3: 100% N + 50% P + 100% K
T4: 2/3 N + 50% P + 100% K
T5: NFB + 2/3N + 100% P +100% K
T6: PSB + 100% N + 50% P + 100% K
T7: NFB + PSB + 2/3N + 50% P + 100% K
T8: NFB පමණක්
T9: PSB පමණක්
T10: කිසිදු පොහොරකින් තොරව නිරපේක්ෂ පාලකය

පර්යේෂණ කොටු (RCBD) ආකාරයෙන් ප්‍රතිවලිත තුනක් බැගින් වන පරිදි සකස් කරන ලදී. රසායනික පොහොර එක් වසරක කාලයක් තුළ සමාන බෙදීම් හතරකට බෙදා ප්‍රතිකාර කාලසටහනකට අනුව යොදන ලදී. පළමු හා තෙවැනි රසායනික පොහොර යෙදීමට දින 15-20 කට පෙර තෙත් කාලගුණික තත්ත්වයන් තුළ බැක්ටීරියා මුහුන් දෙවරක් එකතු කරන ලදී. අත්හදා බැලීම වසරක කාලයක් සඳහා සිදු කරන ලදී. අත්හදා බැලීමේ කාලය පුරාම අස්වැන්න වාර්තා පවත්වා ගෙන යන ලදී. අංකුර සහ පළමු පත්‍ර දෙක හෝ තුන අඩංගු ළපටි රිකිලි දින 7-10 ක පරතරයකින් නෙළා එක් එක් බිම් කොටසෙන් නෙළන ලද රිකිලි වෙන වෙනම කිරා ගන්නා ලදී. වසරක කාලයක් තුළ ප්‍රතිකාර මඟින් බලපෑමට ලක් වූ තේ අස්වැන්න වගුව 8 හි දක්වා ඇත.

වගුව 08. නිමි තේ අස්වැන්න මත තනි මුහුන් ලෙස (PGPR) යෙදීමේ බලපෑම

| ප්‍රතිකාරකය | නිමි තේ අස්වැන්න (kg/ha/year) |
|---|---|
| T1 | 3320 ab |
| T2 | 3144 b |
| T3 | 3226 ab |
| T4 | 3194 b |
| T5 | 3433 ab |
| T6 | 3534 ab |
| T7 | 3618 a |
| T8 | 2717 c |
| T9 | 2554 c |
| T10 | 2671 c |
| LSD ($p$=0.05) | 406.33 |

සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

ප්‍රතිකාර අතර තේ අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය කළ හැක (වගුව 8). අඩු කරනලද N සහ P හි අනුපාත සමග බැක්ටීරියා මුහුන් දෙකම එකතු කරන ලද 7 වන ප්‍රතිකාරකය (T7) ඉහළම අස්වැන්න වාර්තා කළ අතර එය T1, T3, T5 සහ T6 හි ලබාගත් අස්වැන්න සමඟ සැසඳිය හැකිය. අඩු කරන ලද අනුපාත සහිත N හෝ P රසායනික පොහොර (එනම්, T5 සහ T6) සමඟ එකතු කරන ලද තනි බැක්ටීරියා එන්නත් ඊට අදාල පොහොර පාලක (එනම්, පිළිවෙලින් T2 සහ T3) සමඟ සැසඳීමේදී සැලකිය යුතු ලෙස වෙනස් නොවීය. T10 හැර, තනි එන්නත් T8 සහ T9 සමඟ පමණක් යොදන ප්‍රතිකාරක සෙසු ප්‍රතිකාරකවලට සාපේක්ෂව සැලකිය යුතු අඩු අස්වැන්නක් වාර්තා කළේය. පසෙහි pH අගය, කාබනික කාබන් අන්තර්ගතය, පත්‍ර N සහ පත්‍ර P ප්‍රමාණයන් 9 වගුවේ දක්වා ඇත.

වගුව 09. ප්‍රතිකාර යෙදීමෙන් වසරක් අවසානයේ පාංශු pH අගය, කාබනික කාබන් ප්‍රමාණය, පත්‍ර N සහ පත්‍ර P ප්‍රමාණය මත තනි මුහුන් ලෙස ශාක වර්ධන ප්‍රවර්ධන රයිසොබැක්ටීරියා (PGPR) යෙදීමේ බලපෑම.

| ප්‍රතිකාරකය | පාංශු pH අගය | කාබනික කාබන් % | පත්‍ර N % | පත්‍ර P% |
|---|---|---|---|---|
| T1 | 5.09 | 1.78 b | 4.06 ab | 0.143 |
| T2 | 5.16 | 1.87 b | 3.80 cde | 0.126 |
| T3 | 5.33 | 1.86 b | 3.87 cd | 0.150 |
| T4 | 5.19 | 1.91 b | 3.69 ef | 0.137 |
| T5 | 5.31 | 2.26 a | 3.90 bcd | 0.160 |
| T6 | 4.96 | 2.16 a | 3.96 abc | 0.160 |
| T7 | 5.55 | 2.21 a | 4.08 a | 0.146 |
| T8 | 5.01 | 2.16 a | 3.69 ef | 0.153 |
| T9 | 5.33 | 2.14 a | 3.61 f | 0.120 |
| T10 | 5.48 | 2.15 a | 2.39 g | 0.080 |
| LSD ($p$=0.05) | NS | 0.162 | 0.162 | NS |
| CV% | 4.32 | 4.63 | 2.55 | 23.49 |

සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

පසෙහි pH අගය සහ පත්‍ර P ප්‍රමාණයෙහි සැලකිය යුතු වෙනසක් නොතිබුණි (වගුව 9). නමුත් පාංශු කාබන් ප්‍රමාණය සහ පත්‍ර N ප්‍රමාණයේ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය කළ හැක. ප්‍රතිකාරක, T1, T2, T3 සහ T4 අනෙකුත් ප්‍රතිකාරකවලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු පාංශු කාබන් අන්තර්ගතයක් පෙන්නුම් කළේය. T7 ප්‍රතිකාරකය ඉහළම පත්‍ර N අන්තර්ගතයක් පෙන්නුම් කළ අතර එය වත්මන් පොහොර නිර්දේශය වන T1 සහ T6 ප්‍රතිකාරකයන් වාර්තා කර ඇති පත්‍ර N අන්තර්ගතය සමග සැසඳිය හැකිය. කෙසේ වෙතත්, T10 හැර, ඉතිරි ප්‍රතිකාරකවලින් පෙන්නුම් කල පත්‍ර N ප්‍රමාණයන්, තේ මවු පත්‍ර සඳහා තිබියයුතු N පරාසය තුළ විය.

පී එල් කේ තෙන්නකෝන්, ඩබ්ලිව් එම් එස් විජයතුංග සහ එල් ආර් එම් සී ලියනගේ

**තේ වගාකරුවන්ගේ ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ මැදරට වගා කළ තේ සඳහා ශාක වර්ධන ප්‍රවර්ධන රයිසොබැක්ටීරියා (PGPR) මිශ්‍ර මුහුන් ඇගයීම**

ශාක වර්ධන ප්‍රවර්ධන රයිසොබැක්ටීරියා PGPR මිශ්‍ර මුහුන් ඇගයීම සඳහා නව අත්හදා බැලීම් තුනක් මඩුල්කැලේ කැලෑබොක්ක වත්ත, උකුවෙල රත්වත්ත වත්ත, හන්තාන හන්තානේ වත්ත යන ස්ථානවල ආරම්භ කරන ලදී. එක් ප්‍රතිකාරයකට පඳුරු 1000 බැගින් පර්යේෂණ කොටු වෙන් කර ඇත. ප්‍රතිකාරක යෙදීමට පෙර අස්වැන්න අධීක්ෂණය සිදු කරන ලදී. අත්හදා බැලීම් අඛණ්ඩව සිදු කර ඇත.

පී එල් කේ තෙන්නකෝන්, ඩබ්ලිව් එම් එස් විජයතුංග සහ එල් ආර් එම් සී ලියනගේ

**පහතරට වැඩුණු තේ සඳහා ශාක වර්ධන ප්‍රවර්ධන රයිසොබැක්ටීරියා (PGPR) ක්ෂුද්‍රජීවී සංයෝග ඇගයීම**

දොඩන්ගොඩ, පල්ලෙගොඩ, මලබොඩ සහ වැද්දාගල පාංශු ශ්‍රේණි නියෝජනය කරමින් කළුතර, ගාල්ල, මාතර, රත්නපුර සහ දෙනියාය පිහිටි පහතරට තේ වතුවලින් එකතු කරන ලද රයිසෝස්පියර් පස් සාම්පලවලින් සුවිශේෂිත මාධ්‍යක් භාවිතයෙන් නයිට්‍රජන් තිරකරන *Azospirillum* spp. සහ phosphate දියකරන බැක්ටීරියා (PSB) වෙන්කර හඳුනාගන්නාලදි. පහතරට වැඩුණු තේ සඳහා PGPR මුහුන් සංවර්ධනය කිරීම. නයිට්‍රජන් තිර කිරීම, පොස්පේට් ද්‍රාව්‍යකරණය සහ ශාක වර්ධනය ප්‍රවර්ධනය කරන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ඒවා පරීක්ෂා කරන ලදී. එක් එක් පාංශු ශ්‍රේණි වලින් වඩාත් කාර්යක්ෂම *Aozspirillum* spp. සහ PSB අදාළ පාංශු ශ්‍රේණි සඳහා ද්විත්ව මුහුන් සැකසීම සඳහා තෝරාගෙන අදාළ පාංශු ශ්‍රේණි නියෝජනය කරන පසෙහි තේ තවාන්වල පරීක්ෂා කරන ලදී.

කොට්ටව සහ දෙනියාය TRI උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානවල තේ තවාන්වලින් මාස තුනක් වයසැති තේ පැළ පිළිවෙලින් දොඩන්ගොඩ සහ වැද්දාගල පස් ශ්‍රේණි නියෝජනය කරන පසෙහි තවාන් අත්හදා බැලීම් දෙකක් ආරම්භ කරන ලදී.

තවාන් වලදී, ද්විත්ව මුහුන් කාරක, නව්‍යකරණය කරන ලද T65 (50% N සහ P ප්‍රභවය DAP වෙනුවට ERP වලින් සමන්විත) පොහොර (T3) පහත ප්‍රතිකාරයක (T1, T2 සහ T4) සමඟ පරීක්ෂා කරන ලදී.

ප්‍රතිකාරක

T1: කිසිදු ප්‍රතිකාරකයක් නොයෙදූ නිරපේක්ෂ පාලකය

T2: නව්‍යකරණය කරන ලද T65 පොහොර පාලකය

T3: අදාළ පාංශු ශ්‍රේණි වලින් වෙන්කර ගන්නාලද ද්විත්ව මුහුන් සමඟ එක්කළ ප්‍රතිකාරය + T2

T4: නිර්දේශිත T65 පාලකය

ආරම්භයේදීම ද්විත්ව මුහුන් එකතු කරන ලද අතර සති දෙකකට වරක් රසායනික පොහොර යොදන ලදී. එක් එක් ප්‍රතිකාරක සඳහා ප්‍රතිවලිත පනහක් පවත්වා ගෙන යන ලදී. මාස 10 ක කාලයක් සඳහා අත්හදා බැලීම් සිදු කරන ලද අතර වර්ධන මිනුම් සිදු කරනු ලැබුවේ ප්‍රතිකාර යෙදීමෙන් මාස 05 කට

පසුව සහ පරීක්ෂණය අවසන් කිරීමේදී ය. පරීක්ෂණ කාලය අවසානයේ තේ පැළ ගලවා නියැදීම සිදු කරන ලද අතර වියළි බර සටහන් කර ගන්නා ලදී. උඳුනේ වියලන ලද ශාක සාම්පල සිහින් කුඩු බවට පත් කර පෝෂක විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදී.

වගුව 10. පර්යේෂණාත්මක කාලසීමාව අවසානයේ දොඩංගොඩ සහ වැද්දාගල පස් ශ්‍රේණිවලට අයත් පස්වල වගා කරන ලද තේ පැළවල වර්ධනයට ද්විත්ව මුහුන් යෙදීමේ බලපෑම (එන්නත් කිරීමෙන් දින 240කට පසුව)

| ප්‍රතිකාරකය | දොඩංගොඩ ශ්‍රේණිය | | | වැද්දාගල ශ්‍රේණිය | | |
|---|---|---|---|---|---|---|
| | පැළයේ උස (cm) | පැළයේ පත්‍ර ගණන | පැළයේ මුලු පත්‍ර වල වර්ගඵලය ($cm^2$) | පැළයේ උස (cm) | පැළයේ පත්‍ර ගණන | පැළයේ මුලු පත්‍ර වල වර්ගඵලය ($cm^2$) |
| T1 | 16.7 c | 4.20 c | 66 c | 10.0 c | 3.90 c | 58.2 c |
| T2 | 44.6 b | 12.2 b | 271 b | 38.6 a | 12.3 a | 320 a |
| T3 | 56.8 a | 15.9 a | 384 a | 35.2 a | 10.9 ab | 272 ab |
| T4 | 47.7 b | 16.6 a | 361 a | 25.6 b | 9.10 b | 203 b |
| LSD ($p$=0.05) | 5.99 | 2.397 | 62.491 | 7.868 | 2.612 | 74.1 |
| CV% | 15.77 | 21.37 | 25.17 | 31.35 | 31.46 | 37.87 |

සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

කොට්ටව TRI උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ තේ තවානෙහි දොඩංගොඩ පාංශු ශ්‍රේණියට අයත් පස් යොදා සිදු කරන ලද පරීක්ෂණයේදී, මුහුන් යෙදීමෙන් දින 240කට පසු මනින ලද සියලුම වර්ධන පරාමිතීන්හි ප්‍රතිකාරක අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය (වගුව 10 සහ රූපසටහන 1).

T65 හි N 50% අඩු සහ ERP මඟින් ප්‍රතිස්ථාපනය කරන ලද P සමඟින් මුහුන් කරන ලද ප්‍රතිකාරය (T3 ප්‍රතිකාරකය) අනෙකුත් ප්‍රතිකාරකවලට වඩා ශාක උස සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරන ලද නමුත් නිර්දේශිත පොහොර ප්‍රතිකාරකය (T4) සමඟ සැසඳිය හැකි කොළ සහ පත්‍ර ප්‍රමාණයක් පෙන්නුම් කෙරිණි.




රූපසටහන 1. මුහුන් යෙදීමෙන් දින 240 කට පසු කොට්ටව TRI උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන තවානෙහි දොඩංගොඩ පස් ශ්‍රේණියට අයත් පසෙහි වගා කරන ලද තවාන් තේ පැළවල වර්ධනයට ශ්‍රේණියේ විශේෂිත ද්විත්ව මුනුන් යෙදීමේ බලපෑම

කෙසේ වෙතත්, දෙනියාය TRI උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ තවානෙහි, වැද්දාගල පාංශු ශ්‍රේණියට අයත් පසෙහි සිදු කරන ලද පරීක්ෂණයේදී, මුහුන් කරන ලද ප්‍රතිකාරයේදී (T3), ශාකවල පත්‍ර ගණන සහ පත්‍ර වර්ගඵල ප්‍රමාණය, මුහුන් නොකළ පොහොර පාලකය (T2) සහ නිර්දේශිත අනුපාතය (එනම්, T4) යන දෙකම සමඟ සැසඳිය හැකි විය (වගුව 10). කෙසේ වෙතත්, මුහුන් නොකළ පොහොර පාලකයේදී (T2), අක්‍රීය අංකුර (බැන්ජි) සහ අඩු වර්ධන වේගයක් දක්නට ලැබුනු අතර මුහුන් යොදන ලද T3 ප්‍රතිකාරකයේදී වේගවත් වර්ධනයක් මෙන්ම වැඩි සක්‍රීය අංකුර ප්‍රමාණයක්ද දක්නට ලැබිණි.

පී එල් කේ තෙන්නකෝන්, ඩබ්ලිව් එම් එස් විජයතුංග, එල් ආර් එම් සී ලියනගේ,
පී ද අල්විස් සහ සී කේ මුණසිංහ

**ව්‍යාපෘතිය 15.4. තේ වගා කරන ප්‍රදේශවල පාංශු ශ්‍රේණි මට්ටමට ඩොලමයිට් අවශ්‍යතාවය ඇස්තමේන්තු කිරීම.**

**පර්යේෂණය: ඩොලමයිට් යෙදීමේ විවිධ උපක්‍රම සැසඳීම.**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ පාංශු pH ස්වාරක්ෂක ධාරිතාවය මත තේ වගා කරන පසෙහි ආම්ලිකතාවය නිවැරදි කිරීම, වර්තමාන තේ පර්යේෂණායතනයේ නිර්දේශයන් සමඟ සැසඳීම යි.

මෙම පර්යේෂණ පහත සඳහන් ස්ථානවල පිහිටුවන ලදී.

අ) ශාන්ත කූම්බ්ස් වතුයාය - මට්ටකැලේ පාංශු ශ්‍රේණිය සඳහා
ආ) ඔපල්ගල වතුයාය - උකුවෙල පාංශු ශ්‍රේණිය සඳහා
ඇ) එල්ටැබ් වතුයාය - බදුල්ල පාංශු ශ්‍රේණිය සඳහා
ඈ) ක්‍රෙග්හෙඩ් වතුයාය - නුවර පාංශු ශ්‍රේණිය සඳහා
ඉ) මොරගොල්ල වතුයාය - පල්ලේගොඩ පාංශු ශ්‍රේණිය සඳහා

**ප්‍රතිකාරක :**

$T_1$ - පාලිතය (ඩොලමයිට් යෙදීම රහිතව)
$T_2$ - ඩොලමයිට් යෙදීම වර්තමාන නිර්දේශය අනුව
$T_3$ - ඩොලමයිට් යෙදීම පාංශු pH ස්වාරක්ෂක ධාරිතාවය මත

දොලොස්බාගේ ක්‍රෙග්හෙඩ් වතුයායේ පිහිටි පර්යේෂණයේ ප්‍රතිඵල පහත දැක්වේ.

**I. ඩොලමයිට් යෙදීමේ විවිධ ක්‍රම පසේ pH අගය කෙරෙහි බලපෑම**

ප්‍රතිඵලවලට අනුව, pH ස්වාරක්ෂක ධාරිතාව මත පදනම් වූ ඩොලමයිට් යෙදීම, ගැඹුර මට්ටම් දෙකෙහිම මෙන්ම pH මනින ලද ක්‍රම දෙකෙහිම (ආස්‍රැත ජලය සහ $CaCl_2$ ද්‍රාවණයෙන් මනිනු ලබන pH) ඉහළම අගයන් වාර්තා කෙරිණි. 15-30 cm ගැඹුර මට්ටමේදී පසෙහි pH හි සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය කළද, 0-15 cm ගැඹුර මට්ටමේදී එවැනි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි. එය වගු අංක 11 හි දක්වා ඇත.

වගුව 11: ඩොලමයිට් යෙදීමේ විවිධ ක්‍රම අනුව ප්‍රතිකාරක යෙදීමෙන් පසු මතු පිට පසෙහි (0 - 15 සෙ. මී.) සහ උප පසෙහි (15 - 30 සෙ. මී.) පසෙහි pH අගය (ආස්‍රැත ජලය හෝ $CaCl_2$ ද්‍රාවණය)

| ප්‍රතිකාරකය | † pH (ආස්‍රැත ජලය) | | † pH ($CaCl_2$) ) | |
|---|---|---|---|---|
| | 0-15 cm | 15-30 cm | 0-15 cm | 15-30 cm |
| පාලිත ප්‍රතිකාරකය (ඩොලමයිට් යෙදීම රහිතව) | 4.55a | 4.43b | 4.23a | 4.02a |
| ඩොලමයිට් යෙදීම වර්තමාන නිර්දේශය අනුව | 4.55a | 4.38ab | 4.17a | 4.10a |
| ඩොලමයිට් යෙදීම පාංශු pH ස්වාරක්ෂක ක්‍රියාව මත | 4.69a | 4.56a | 4.37a | 4.25a |
| LSD | 0.50 | 0.52 | 0.47 | 0.42 |
| CV% | 4.80 | 5.14 | 4.88 | 4.56 |

†සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

**II. ඩොලමයිට් යෙදීමේ විවිධ ක්‍රම හුවමාරු කල හැකි මැග්නීසියම් (Mg) සහ කැල්සියම් (Ca) ප්‍රමාණ කෙරෙහි බලපෑම.**

පාංශු ගැඹුර මට්ටම් දෙකෙහිම pH ස්වාරක්ෂක ධාරිතාව මත පදනම්ව ඩොලමයිට් යෙදීමත් සමග පස හුවමාරු කළ හැකි පාංශු මැග්නීසියම් (Mg) හි වැඩි වීමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, පසෙහි pH ස්වාරක්ෂක ධාරිතාව මත පදනම්ව ඩොලමයිට් යෙදීම මගින් (15-30 සෙ. මී.) ගැඹුරකදී පස හුවමාරු කළ හැකි Ca සැලකිය යුතු ලෙස වැඩි කරන ලදී (වගුව 12).

වගුව 12: ඩොලමයිට් යෙදීමේ විවිධ ක්‍රම අනුව ප්‍රතිකාරක යෙදීමෙන් පසුව මතු පිට පසෙහි (0-15 සෙ. මී.) සහ උප පසෙහි (15-30 සෙ. මී.) හුවමාරු කල හැකි Mg සහ Ca ප්‍රමාණය.

| ප්‍රතිකාරකය | † හුවමාරු කළ හැකි Mg | | † හුවමාරු කළ හැකි Ca | |
|---|---|---|---|---|
| | 0-15 cm | 15-30 cm | 0-15 cm | 15-30 cm |
| පාලිතය (ඩොලමයිට් යෙදීම රහිතව) | 159a | 327a | 467a | 99b |
| ඩොලමයිට් යෙදීම වර්තමාන නිර්දේශය අනුව | 141a | 307a | 435a | 157ab |
| ඩොලමයිට් යෙදීම පාංශු pH ස්වාරක්ෂක ක්‍රියාව මත | 174a | 387a | 526a | 216a |
| LSD | 153 | 417 | 264 | 77.3 |
| CV% | 42.6 | 53.9 | 24.4 | 21.5 |

සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

සියලුම ප්‍රතිකාරවල මැග්නීසියම් මට්ටම තේ පැළ සඳහා ප්‍රමාණවත් මට්ටමට (60 mg/kg) වඩා බෙහෙවින් වැඩිය.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග, එස් පී එස් කේ විජේසිංහ,
බී එම් ටී ටී කේ සේනාරත්න, ආර් එම් එන් එස් බංඩාර, ඩී එන් කහවෙව්තාන,
එස් කේ වීරතුංග සහ ජේ ආර් වයි අබේවර්ධන

**ව්‍යාපෘතිය 15.5. පසට නයිට්‍රජන් (N), පොස්පරස් (P), පොටෑසියම් (K) සහ මැග්නීසියම් (Mg) පෝෂක සැපයීම සඳහා ආර්ථිකව වැඩදායක සෙමින් පෝෂක නිකුත් කරන සංයුක්ත පොහොර ප්‍රවර්ධනය කිරීම.**

**අ) සෙමින් පෝෂක මුදාහරින (Slow Releasing Fertilizer) පොහොර යෙදීම පසෙහි සහ ශාකයේ පෝෂක ප්‍රමාණයට සහ අස්වැන්න ට බලපෑම ඇගයීම. (අනුවර්තී පොහොර පර්යේෂණය)**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) විසින් නිපදවන ලද සෙමින් පෝෂක නිකුත් කරන පොහොර සඳහා පරිණත තේවල අස්වැන්න සඳහා දක්වන ප්‍රතිචාරය තේ වගාකරුවන්ගේ තත්ත්ව යටතේ අධ්‍යයනය කිරීම සහ එමගින් ආර්ථික වශයෙන් ඵලදායි, සෙමෙන් පෝෂක නිකුත් කරන සංයුක්ත පොහොරක් හඳුන්වා දීමයි.

සෙමින් පෝෂක නිකුත් කරන සංයුක්ත පොහොර (NANO යූරියා දෙමුහුන්) භාවිතය පිළිබඳ පර්යේෂණ අත්හදා බැලීම් සහ අනුවර්තන අත්හදා බැලීම් අවසන් කර අවසන් වාර්තාව සකස් කර ඇත. අවසාන වාර්තාවට ඇතුළත් කළ යුතු, ස්ථිර නිර්දේශයක් ඉදිරිපත් කිරීමට පෙර නිෂ්පාදනය පිළිබඳ කුඩා තේ වතු හිමියන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ගොවි කේන්ද්‍රීය පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. කෙටුම්පත් වාර්තාව තාක්ෂණ නිකුත් කිරීමේ කමිටුව (TRC) වෙත ඉදිරිපත් කරන ලදී.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග සහ ඕ ජී කේ ගුණරත්න

**ව්‍යාපෘතිය A 15.6. පසෙහි අඩංගු ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය පදනම් වූ ක්ෂුද්‍ර පෝෂක පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීම. (අනුවර්ති පර්යේෂණය)**

මූලික පර්යේෂණයේ ලැබුණු ප්‍රතිඵල වලට අනුකූලව සින්ක් (11 kg/ha/yr) (T1), සින්ක් (11 kg/ha/yr) + මැංගනීස් (3.32 kg/ha/yr) (T2) සහ සින්ක් (11 kg/ha/yr) + මැංගනීස් (3.32 kg/ha/yr) + බෝරෝන් (1.18 kg/ha/yr) (T3) ප්‍රතිකාරක අනුවර්තී පොහොර පර්යේෂණ සඳහා තෝරා ගන්නා ලදී.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වුයේ ඵලදායී, ආර්ථික ලාබදායී ක්ෂුද්‍ර පෝෂක අඩංගු මිශ්‍රණයක් හඳුන්වාදීමයි. මෙම පර්යේෂණය තේ වගාකරුවන්ගේ තත්ත්ව යටතේ සිදුකරයි. මෙම අනුවර්ති පර්යේෂණ නටුවාකැලේ වතුයාය, වේරපිටිය, දෙනියාය වතුයාය, දෙනියාය සහ ඊස්ලැබේ වතුයාය, බණ්ඩාරවෙල ස්ථාපනය කරන ලදී.

දෙනියාය වතුයායේ සහ නටුවකැලේ වතුයායේ අත්හදා බැලීම් එක් කප්පාදු චක්‍රයක් සම්පූර්ණ කිරීමෙන් පසු පිළිවෙලින් (2021) දෙසැම්බර් සහ (2022) පෙබරවාරි මාසවලදී අවසන් කරන ලදී.

ඊස්ලැබේ වතුයායේ ස්ථාපිත පරීක්ෂණයේ ප්‍රතිඵල වගු අංක 13 හි දක්වා ඇත.

**පර්යේෂණ 1. ක්ෂුද්‍ර පෝෂක පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණය යෙදීමෙන් පත්‍රවල ක්ෂුද්‍ර පෝෂක සහ අස්වැන්න කෙරෙහි බලපෑම - දෙනියාය වතුයාය, දෙනියාය**

**I. ක්ෂුද්‍ර පෝෂක පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණය යෙදීමෙන් පත්‍රවල ක්ෂුද්‍ර පෝෂක කෙරෙහි බලපෑම**

මව් පත්‍රවල සින්ක් සාන්ද්‍රණය ප්‍රතිකාරක අතර සැලකිය යුතු ලෙස වෙනස් විය (වගුව (13). මව් පත්‍රවල ප්‍රශස්ත Zn සාන්ද්‍රණය (10-40 mg/kg) අතර විය යුතුය. පොහොර නොමැතිකම හේතුවෙන් (2022) වර්ෂය තුළ එක් පොහොර යෙදීමක් පමණක් සිදු කර පසුව ප්‍රතිකාර කිරීමක් සිදු කරන ලදී. මව් පත්‍රවල පත්‍ර ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය අඩු මට්ටමක පැවතීමට මෙය හේතුවක් විය හැකිය.

මව් පත්‍රයේ මැංගනීස් (Mn) සහ බෝරෝන් (B) සාන්ද්‍රණ ප්‍රතිකාර අතර සැලකිය යුතු ලෙස වෙනස් නොවීය. කෙසේ වෙතත්, පාලක ප්‍රතිකාරකය විසින් මව් පත්‍රවල Zn, Mn සහ B හි අඩුම ප්‍රමාණයන් වාර්තා කර ඇත. Mn හි ප්‍රමාණවත් මට්ටම (100 mg/kg) වුවද, ප්‍රතිකාරක දෙකක් ප්‍රමාණවත් මට්ටමට වඩා අඩු Mn මට්ටම් වාර්තා කර ඇත. Zn, Mn සහ B මිශ්‍රණයක් ලෙස (T3) යෙදීමේ සංයුක්ත බලපෑම තහවුරු කරමින් මව් පත්‍රවල ඉහළම Zn අන්තර්ගතය වාර්තා කරන ලදී.

වගුව 13. පත්‍ර මතට යොදන ක්ෂුද්‍ර පෝෂක පොහොර මිශ්‍රණය යෙදීමෙන් මව් පත්‍රයේ සින්ක්, මැංගනීස් සහ බොරෝන් ප්‍රමාණය (ඊස්ලැබේ වතුයාය, බණ්ඩාරවෙල)

| ප්‍රතිකාරක | †Zn (මිලි ග්‍රෑම්/ කි. ග්‍රෑ.) | Mn (මිලි ග්‍රෑම්/ කි. ග්‍රෑ.) | B (මිලි ග්‍රෑම්/ කි. ග්‍රෑ.) |
|---|---|---|---|
| පසට යොදන NPK (පාලක) + Zn දියර පත්‍ර මතට | 17ab | 124a | 14.2a |
| පසට යොදන NPK (පාලක) + Zn+Mn දියර පත්‍ර මතට | 14bc | 82a | 17.1a |
| පසට යොදන NPK (පාලක) +Zn+Mn + B දියර පත්‍ර මතට | 18a | 115a | 16.4a |
| පසට යොදන NPK (පාලක) | 11c | 73a | 15.0a |
| LSD | 4.6 | 54 | 6.06 |
| CV% | 9.52 | 17.14 | 12.10 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

**II. පත්‍ර මතට යොදන ක්ෂුද්‍ර පෝෂක දියර පොහොර මිශ්‍රණය යෙදීමෙන් නිමි තේ අස්වැන්න කෙරෙහි බලපෑම.**

ප්‍රතිකාරක අතර නිමි තේ අස්වැන්න සැලකිය යුතු ලෙස වෙනසක් දක්නට ලැබිණි (වගුව 14). පසට පමණක් පොහොර යෙදූ පාලකය අඩුම අස්වැන්නක් වාර්තා කළ අතර සියලුම පත්‍ර ප්‍රතිකාරක මගින් සැලකිය යුතු ලෙස ඉහළ තේ අස්වැන්නක් පෙන්නුම් කළේය.

වගුව 14. පත්‍ර මතට යොදන ක්ෂුද්‍ර පෝෂක දියර පොහොර මිශ්‍රණය යෙදීමෙන් නිමි තේ අස්වැන්න වෙනස් වූ ආකාරය

| ප්‍රතිකාරක | †නිමි තේ අස්වැන්න (කි. ග්‍රෑ./හෙක්/වසරකට) |
|---|---|
| පසට යොදන NPK (පාලක) + Zn දියර පත්‍ර මතට | 2403a |
| පසට යොදන NPK (පාලක) + Zn + Mn දියර පත්‍ර මතට | 2416a |
| පසට යොදන NPK (පාලක) +Zn + Mn + B දියර පත්‍ර මතට | 2381a |
| පසට යොදන NPK (පාලක) | 2328b |
| LSD | 42.3 |
| CV% | 0.55 |

† සිරස් තීරුවල සමාන ඉංග්‍රීසි අක්ෂර සහිත අගයන් අතර පැහැදිලි වෙනසක් නැත ($p \leq 0.05$).

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග, එස් කේ වීරතුංග
සහ බී එම් ටී ටී කේ සේනාරත්න

**ව්‍යාපෘතිය B 78. ශාකයේ පොළොවට ඉහළ සහ පහළ කොටස් විමර්ශනය කිරීම සඳහා මූල මණ්ඩලයේ ව්‍යුහය සහ පැතිරීම සමඟ පෝෂක අවශෝෂණය අධ්‍යයනය කිරීම.**

**පර්යේෂණය 1: මුල්වල ව්‍යුහය පෝෂක අවශෝෂණය ශාක වර්ධනය කෙරෙහි බලපෑම අධ්‍යයනය ක්ෂේත්‍ර අංක 13, ශාන්ත කූම්බ්ස් වතු යාය, තලවාකැලේ.**

මෙහි මූලික පරමාර්ථය වන්නේ මුල්වල ව්‍යුහය හා පැතිරීම පෝෂක අවශෝෂණය කෙරෙහි බලපෑම අධ්‍යයනය කිරීමයි. මෙහිදී තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශිත නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් අඩංගු VPUM 910 පොහොර මිශ්‍රණය අර්ධයක් හෝ සම්පූර්ණ ප්‍රමාණය සමඟ තේ ප්‍රභේදවන TRI 2023, TRI 2025, TRI 3072, TRI 4071, DT1, DN, බීජ තේ ප්‍රතිකාරක ලෙස යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය ක්ෂේත්‍ර අංක 13, ශාන්ත කූම්බ්ස් වතුයායේ සිදු කරන අතර නොමේරූ අවධිය සඳහා අධ්‍යයනය අවසන් කරන ලදී. කප්පාදුවෙන් පසු මේරූ අවධිය සඳහා මෙම අධ්‍යයනය සිදුකරයි.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග, එස් පී එස් කේ විජේසිංහ,
එස් කේ වීරතුංග සහ ඩී එම් එස් නවරත්න

**ව්‍යාපෘතිය B 125. ශ්‍රී ලංකාවේ නිමි තේවලට දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය (Rare Earth Elements) ලැබීම කෙරෙහි බලපාන සාධක සමීක්ෂණය කිරීම**

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ නිමි තේවල REE මඟින් ඇති විය හැකි අපවිත්‍ර වීම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. REE සඳහා පස, පත්‍ර, නිමි තේ සහ පෙරන ලද තේ විශ්ලේෂණය කර අවසන් වාර්තාව සකස් කරමින් පවතී.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග සහ එස් කේ වීරතුංග

**D/SPND. පාංශු හා ශාක පෝෂක අංශයේ ක්‍රියාකාරකම්**

නව ප්‍රාග්ධන උපකරණ ස්ථාපනය, පර්යේෂණ ප්‍රකාශන, අධ්‍යයන කටයුතු, සිසුන් පුහුණු කිරීම සහ පාංශු හා ශාක පෝෂණ අංශයේ තාක්‍ෂණ ව්‍යාප්ති කටයුතු ඇතුළුව සියලුම පර්යේෂණ පොදු කාර්ය ආවරණය වන ක්‍රියාකාරකම්

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග, ඕ පී කේ ගුණරත්න, ඩබ්ලිව් ටී බී ඩී. ප්‍රියන්ත ,
ජේ ආර් වයි අබේවර්ධන, එස් කේ වීරතුංග, එස් පී එස් කේ විජේසිංහ, බී එම් ටී ටී කේ සේනාරත්න,
ආර් එම් එන් එස් බංඩාර, ඩී එන් කහවෙවිතාන, බී වී ආර් සනාලි, එම් පී කේ මධුශානි, ඩී ආර් ගමගේ

# ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මගින් භූමි ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

**ප්‍රධාන ව්‍යාපෘතිය A 10. පැළ නැවත සිටුවීමට පෙර පස පුනරුත්ථාපනය නොකිරීම/ පුනරුත්ථාපන කාල පරාසය අඩු කිරීම සඳහා ආර්ථිකමය වාසිදායි ක්‍රමවේදයක් සකස් කිරීම.**

**ව්‍යාපෘතිය A 10.2. විකල්ප පුනරුත්ථාපන තෘණ ලෙස නව තෘණ විශේෂ භාවිතා කිරීමේ ශක්‍යතාව අධ්‍යයනය කිරීම**

ඉහළ ජෛව ස්කන්ධ නිෂ්පාදකයන් ලෙස හැඳින්වෙන (T1) Hybrid Napier (*Pennisetum Purpureum* x *Pennisetum americanum*) (Variety CO-3) සහ (T2) East Indian Lemongrass (*Cymbopogon flexuosus*) යන නව තෘණ විශේෂ දෙකක් වර්ධනය ඇගයීම සඳහා (T3) Guatemala (*Tripsacum laxum*), (*T4*) *Mana (Cymbopogon confertiflorus)* සහ (T5) No-Rehabilitation ප්‍රතිකාර සමඟ ස්ථාපනය කරන ලදී. නව Hybrid Super Napier විශේෂයක් වූ (*Pennisetum Purpureum* x *Pennisetum americanum*) (Variety-Pakchong 1) උඩරට පිහිටි පර්යේෂණ භූමියේ ප්‍රතිකාරයක් ලෙස ඇතුළත් කරන ලදී.

මෙම පර්යේෂණය ස්ථාන තුනක ක්‍රියාත්මක කරන ලදී.
1. ගෝනකැලේ වත්ත, තේ පර්යේෂණ ආයතනය, පස්සර (2018)
2. තේ පර්යේෂණ ආයතනය, හන්තාන, මහනුවර (2019)
3. ක්ෂේත්‍ර අංක 13, ශාන්ත කුම්බිස් වත්ත, තේ පර්යේෂණ ආයතනය, තලවකැලේ (2019)

පහත ප්‍රතිකාරකයන් මේ සඳහා යොදා ගන්නා ලදී.

T1 - හයිබ්‍රිඩ් නේපියර් (*Pennisetum purpureum X Pennisetum americanum*) =*Pennisetum typhodieu purpureum*-Variety CO-3
T2- මානා (*Cymbopogon confertiflorus*)
T3- ගෞතමාලා *(Tripsacum laxum)*
T4 - නැගෙනහිර ඉන්දියානු පැඟිරි තෘණ (ලේමන්ග්රාස්) (*Cymbopogon flexuosus*)
T5- පස පුනරුත්ථාපනය රහිත (පාලිතය)

**1. ගෝනකැලේ වත්ත, තේ පර්යේෂණ ආයතනය, පස්සර**

මෙම අත්හදා බැලීම 2018 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර, 16'x24' ක බිම් ප්‍රමාණයකින් යුත් අනුරූ 04 ක් සහිත ඉහත ප්‍රතිකාර පහක් භාවිතා කර ඇත. තෘණ රෝපණ අවකාශයන් 9'x 2' (T2 සහ T4) සහ 1'x 2' (T1 සහ T3) වේ. පුනරුත්ථාපන කාලයෙන් පසුව, TRI 4078 ප්‍රභේදය 2021 දී රෝපණය කරන ලදී. දෙවන මධ්‍යගත කැපීමේ පැළ බර වගු අංක 01හි දක්වා ඇත.

වගුව 1. දෙවන මධ්‍යගත කැපීමේ පැළ බර (පැළ සිටුවා මාස 18කට පසු)

| Treatments | FW(g/plant) | DW(g/plant) |
|---|---|---|
| CO3 (T1) | 163.5(±7.3)[a] | 57.2(± 2.6)[a] |
| Mana (T2) | 158.8(±2.0[a]) | 55.4(± 0.7)[a] |
| Guatemala (T3) | 158.4(±5.7)[a] | 56.3(±2.2)[a] |
| Lemon grass (T4) | 143.9(± 13.5)[a] | 50.3(±4.7)[a] |
| No Rehabilitation (T5) | 116.0(± 6.2)[b] | 40.2(± 2.1)[b] |
| CV% | 10.47 | 10.38 |
| R Square | 0.70 | 0.72 |
| P | 0.0058 | 0.0041 |
| LSD | 23.891 | 8.299 |

සැලකිය යුතු අඩුම (P<0.05) කේන්ද්‍රගත බර සටහන් වූයේ පුනරුත්ථාපනය නොවන බිම් කොටස්වලින්. වසර අවසානයේ දී, නෙළීම ආරම්භ කිරීම සඳහා සෙන්ටිමීටර 45 ක උසකින් යුත් තේ පඳුරු ඉඟි කිරීම සිදු කරන ලදී.

**2. තේ පර්යේෂණ ආයතනය, හන්තාන, මහනුවර**

මෙම අත්හදා බැලීම 2019 ඔක්තෝම්බර් මාසයේ දී ස්ථාපනය කරන ලද අතර, 16' x 24' ක බිම් ප්‍රමාණයකින් යුත් අනුරූ 03 ක් සහිත ප්‍රතිකාර පහක් භාවිතා කර ඇත. තේ (TRI 4042) 2021 ඔක්තෝම්බර් මාසයේදී වගා කරන ලද්දේ ඉහත තෘණ විශේෂ හතරක් සමඟ පස පුනරුත්ථාපනය කිරීමෙන් පසුවය. නියඟය නිසා පැළ විශාල ප්‍රමාණයක් මිය ගිය අතර පුරප්පාඩු වූ ස්ථානවල තේ නැවත වගා කරන ලදී.

**3. ශාන්ත කුම්බිස් වත්ත, තේ පර්යේෂණ ආයතනය, තලවකැලේ**

මෙම අත්හදාබැලීමට Hybrid Super Napier - Pakchong 01 (space:2'x1') හි අතිරේක ප්‍රතිකාරයක් ඇතුළත් විය හැකි පාංශු පුනරුත්ථාපන තණකොළ ලෙස, තෘණ වර්ග 2020 සැප්තැම්බර් මාසයේදී, අනුරූ 04ක් සහිත ප්‍රතිකාර හයක් භාවිතා කරමින් සිටුවා ඇත. බිම් ප්‍රමාණය 10' x 32' විය. ප්‍රතිකාර පහත දැක්වේ.

T1- හයිබ්‍රිඩ් නේපියර් (*Pennisetum purpureum x Pennisetum americanum*)- Variety CO-3
T2- හයිබ්‍රිඩ් සුපර් නේපියර් (*Pennisetum purpureum x Pennisetum americanum*) - Variety - Packchong 1
T3- ග්වාතමාලා (*Tripsacum laxum*)
T4- මානා (*Cymbopogon confertiflorus*)
T5- නැගෙනහිර ඉන්දියානු පැඟිරි තෘණ (*Cymbopogon flexuosus*)
T6- පස පුනරුත්ථාපනය රහිත (පාලිතය)

සිටුවීමෙන් වසර දෙකකට පසු තණකොළවල බර අඩු වීම වගුව 02 හි දක්වා ඇත. පැක්චොං පුනරුත්ථාපන ප්‍රතිකාරය යටතේ තෙත් සහ වියළි පදනම මත ඉහත බිම්වල ජෛව ස්කන්ධ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි විය. දෙවන ජෛව ස්කන්ධ නිෂ්පාදනය CO3 ප්‍රතිකාරයේ දී ග්වාතමාලා, මානා සහ ලෙමන් තෘණ වර්ග තුන යටතේ ඇති ප්‍රමාණයට වඩා ඉහළ අගයක් ගන්නා ලදී (p<0.05) (වගුව 2).

වගුව 2: සිටුවා වසර 2 කට පසු මුළු කැපුම් බර (මෙ.ටොන්/හෙ)

| ප්‍රතිකාරකය | අමු බර | වියළි බර |
|---|---|---|
| CO3 (T1) | 227.3(±34.5)[b] | 50.4± 7.1[b] |
| Packchong 1 (T2) | 354.0± 44.5[a] | 77.8 ± 9.6[a] |
| Mana (T3) | 126.7± 11.2[cd] | 30.3 ± 3.1[cd] |
| Guatemala (T4) | 199.9± 18.9[bc] | 37.4 ± 4.1[bc] |
| Lemon grass (T5) | 63.0 ± 5.9[d] | 19.7± 2.0[d] |
| CV% | 27.14 | 26.16 |
| R Square | 0.86 | 0.84 |
| P | <0.0001 | <0.0001 |
| LSD | 81.1 | 10.5 |

Packchong සහ CO3 පුනරුත්ථාපන ප්‍රතිකාර යටතේ බිම් යට (මුල) වියළි පදනමේ ජෛව ස්කන්ධ නිෂ්පාදනය ග්වාතමාලා, මානා සහ ලෙමන් වලට වඩා සැලකිය යුතු ලෙස වැඩි වී වසරක් සහ මාස හයකට පසු (p<0.05) (වගුව 3).

වගුව 3. සිටුවා වසර 11/2 කට පසු මුල් බර (මෙ.ටොන්/හෙ)

| ප්‍රතිකාරකය | අමු බර | වියළි බර |
|---|---|---|
| CO3 (T1) | 31.2 (±0.94)[ab] | 20.8 (±0.72)[a] |
| Packchong 1(T2) | 39.2 (±1.32)[a] | 19.8 (±1.67)[a] |
| Mana (T3) | 22.2 (±2.1)[b] | 13.1 (±1.4)[b] |
| Guatemala (T4) | 37.8 (±6.4)[a] | 15.1 (±2.9)[b] |
| Lemon grass (T5) | 23.5 (±2.6)[b] | 11.0 (±1.4)[b] |
| CV% | 22.17 | 17.57 |
| R Square | 0.66 | 0.80 |
| P | <0.0107 | <0.0018 |
| LSD | 10.5 | 4.3 |

වගුව 4 පෙන්නුම් කරන්නේ මෙම අත්හදා බැලීමේ දී පස් පණු ගහනය සහ සුදු පණු ගහනය අතර ප්‍රතිකාර අතර සැලකිය යුතු වෙනසක් නොතිබූ නමුත් ඉහළම පස් පණුවන් පැටවුන් Packchong 1 (T2) තෘණ ප්‍රතිකාරයේදී (වගුව 4) ($P<0.05$) නිරීක්ෂණය කරන ලදී.

වගුව 4. සිටුවා වසර එකහමාරකට පසු පස් පණුවන් සහ සුදු කම්බිලි පනුවන් ගහණය (ගණන/වර්ග මීටරයට)

| ප්‍රතිකාරකය | පස් පණුවන් | සුදු කම්බිලි පණුවන් |
|---|---:|---:|
| CO3 (T1) | 16.25 (±4.94) | 5.25 (±2.10) |
| Packchong 1 (T2) | 30.25 (± 16.81) | 7.50 (±4.99) |
| Mana (T3) | 15.25 (± 3.88) | 6.33 (±4.11) |
| Guatemala (T4) | 19.50 (±10.84) | 2 (±0.82) |
| Lemon grass (T5) | 22.25 (± 9.04) | 5 (±2.12) |
| No Rehabilitation (T6) | 7.25 (± 2.43) | 10.75 (±5.81) |
| CV% | 74.70 | 103.76 |
| R Square | 0.62 | 0.53 |
| P | NS | NS |
| LSD | NS | NS |

පාංශු නියැදීම (2022) pH අගය, පාංශු කාබන්, සම්පූර්ණ නයිට්‍රජන්, පොටෑසියම් සහ පොස්පරස් විශ්ලේෂණය කරන ලදී. අත්හදා බැලීමේ ස්ථානය කප්පාදු කිරීම සඳහා නියමිත වේ. කප්පාදුව තක්සේරු කිරීමෙන් පසු මෙම අත්හදා බැලීම අවසන් කරනු ලැබේ.

## ව්‍යාපෘතිය A 10.3. පාංශු තත්ත්ව දර්ශකය

### 1. වගා ඉඩම් ඇගයීම - පේඩ්රෑ වත්ත, නුවරඑළිය

2017 වසරේ නුවරඑළිය පේඩ්රෑ වතුයායේ PK-2 ප්‍රභේදය පහත සඳහන් ප්‍රතිකාර ක්‍රම තුනක් සමගින් අත්හදා බැලීමක් ආරම්භ කරන ලදී.

T 1 - පස පුනරුත්ථාපනයෙන් පසු පැළ සිටුවීම
T 2 - පුනරුත්ථාපනයෙන් තොරව පැළ සිටුවීම
T 3 - පස මුල්ලුකර, පුනරුත්ථාපනයෙන් තොරව පැළ සිටුවීම

එක් ප්‍රතිකාරකයක්, අනුකරණ තුනකින් සමන්විත විය.ප්‍රතිකාර අතර සැලකිය යුතු වෙනස්කම් ඇති 5 අතර පුනරුත්ථාපන ප්‍රකාශය (වගුව 5) ($p<0.05$) යටතේ ඉහළම තේ නිෂ්පාදනය ලබා ගන්නා ලදී, එය සෘජුව වගා කරන ලද ක්ෂේත්‍රයට වඩා 23% ක අස්වැන්නක් වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, තේ අස්වැන්න වැඩි කිරීමට ඉඩම දෙබලක යෙදීමෙන් ප්‍රයෝජනයක් ලැබී නැත.

වගුව 5. 2022 නිම් තේ අස්වැන්න (වසරකට කිලෝ ග්‍රෑම්/හෙක්ටයාරයකට)

| ප්‍රතිකාරකය | අස්වැන්න |
|---|---|
| පස පුනරුත්ථාපනයෙන් පසු පැළ සිටුවීම | 2390.3(±43.3)[a] |
| පුනරුත්ථාපනයෙන් තොරව පැළ සිටුවීම | 1947.1(±142.5)[b] |
| පස මුල්ලුකර, පුනරුත්ථාපනයෙන් තොරව පැළ සිටුවීම | 1659.4(±103.8)[b] |
| CV% | 9.38 |
| R Square | 0.86 |
| P | 0.0217 |
| LSD | 424.96 |

එම් ජී එස් ලියනගේ, එන් පී එස් එන් බණ්ඩාර, ඊ ඩබ් ටී පී ප්‍රේමතුංග සහ ඊ එම් ජී පී ඩබ් ඒකනායක

**ව්‍යාපෘතිය A 10.5. ශ්‍රී ලංකාවේ මධ්‍යම උන්නතාංශ තේ ඉඩම්වල ජලය මගින් ඇතිවන පාංශු ඛාදනය හා එහි සංරක්ෂණය**

ශ්‍රී ලංකාවේ ජල ප්‍රේරිත ඛාදනය හේතුවෙන් බලපෑමට ලක් වූ මධ්‍ය උන්නතාංශ තේ ඉඩම්වල පාංශු ඛාදනය සහ සංරක්ෂණය ක්‍රමවල බලපෑම තක්සේරු කිරීම සඳහා ගිනිගත්හේන, කෙනිල්වර්ත් වතුයායේ 2020 දී පර්යේෂණය ආරම්භ කරන ලදී. එහි දී ප්‍රතිකාරක පහක්, බෑවුම් මට්ටම් දෙකක (20% - 30% සහ 60% -72%) අනුරූ තුනකින් ආරම්භ කරන ලදී. ගලා බසින වැසි ජලය හා අවසාදිත එකතු කිරීම සඳහා අවසාදිත ටැංකි සහිත පාංශු ඛාදන බිම් කොටස් සකස් කරන ලදී. 2020 අගෝස්තු සිට 2021 නොවැම්බර් දක්වා වසරක කාලයක් සඳහා දත්ත රැස් කරන අතර ක්ෂේත්‍රයේ ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානය මගින් කාලගුණ දත්ත රැස් කරන ලදී. ප්‍රතිකාර ආරම්භ කිරීමට පෙර 2020 අගෝස්තු මාසයේදී ක්ෂේත්‍ර පාංශු නියැදීම සිදු කල අතර ඉන් පසුව 2021 මාර්තු සහ 2021 දෙසැම්බර් මාසයේ දී ක්ෂේත්‍රයේ සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ පාංශු තත්ත්වය විශ්ලේෂණය කිරීම සඳහා පාංශු රසායනික, භෞතික හා ජීව විද්‍යාත්මක පරාමිතීන් පරීක්ෂා කරන ලදී. ගලා බසින ජලය සහ අවසාදිත පස් හරහා පෝෂක කොටස ඉවත් වීම තීරණය කිරීම සඳහා ගලා බසින ජලය සහ අවසාදිත නියැදීම සහ විශ්ලේෂණය සිදු කරන ලදී.

**අරමුණ:** ශ්‍රී ලංකාවේ තේ වගා කරන කලාපවලින් තෝරාගත් කලාපයන්හි පාංශු ඛාදනය සහ පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතයේ බලපෑම, ක්ෂේත්‍ර ක්‍රමය මගින් ප්‍රමාණනය කිරීම හා පාංශු ඛාදනය ආකෘතිය මගින් තක්සේරු කිරීම.

**ප්‍රතිකාරක**

T1 - ගල් වැටිය

T2 - සැවන්දරා වැටිය සහිත ගල් වැටිය

T3 - ගල් බැම්ම

T4 - තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති)

T5 - හිස් භූමිය

**ප්‍රතිඵල: විවිධ බෑවුම්වල ස්ථාපිත පාංශු සංරක්ෂණ ක්‍රමවල වර්ෂා ජලය ගලා යාම ගණනය කිරීම**

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වලට අනුව, තේ ඉඩම්වලින් (පාංශු සංරක්ෂණය නොමැති) ගලා බසින වැසි ජලය ප්‍රමාණය හිස් භූමියෙන් ගලා බසින ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු විය (pr>0.0001). එම අඩු වීම 116% ක් ලෙස පෙන්වා ඇත. ප්‍රතිකාරක සැලකීමේ දී, දැඩි බෑවුමේ (60% -72%) වැසි ජලය ගලායාමේ මධ්‍යන්‍ය අඩු බෑවුමේ (20% - 30%) වැසි ජලය ගලා යාමට වඩා 9% කින් වැඩිය. නමුත් හිස් භූමිය නොසලකා වැසි ජලය ගලා යන දත්ත විශ්ලේෂණය කිරීමේ දී, බෑවුම ජලය ගලා යාම සඳහා සැලකිය යුතු බලපෑ අතර (p>f 0.046) එය අඩු බෑවුමේ (20% - 30% ) 42% ක වැඩිවීමකි. අඩු බෑවුමේ සැලකිය යුතු ඉහළ පාංශු ඝනත්වය (1.588 ට/$cm^3$) පෙන්නුම් කර ඇති අතර එම හේතුවෙන් ගලා යාම වැඩිවී ඇත. ඉහළ පාංශු ඝනත්වය නිසා පසෙ හි සිදුරු අවකාශය අඩු වන අතර එම නිසා පාංශු පැතිකඩ හරහා ජලය විනිවිද යෑම අඩු වීම හේතු වේ. එ බැවින්, මෙම

අධ්‍යයනයේ දී පහත් බෑවුමේ ගොඩබිම හරහා ඉහළ ගලා යාමක් පෙන්නුම් කළේය. ප්‍රවාහය අඩු කිරීමේ ගණනයට අනුව, තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති - T5) හා සසඳන විට දැඩි බෑවුමක දී සැවන්දරා වැටිය සහිත ගල් වැටිය (T2) හි 80% ද, ගල් බැම්ම (T3) හි 68% ද සහ ගල් වැටිය (T1) හි 55% කින් ද ගලා යාමේ පරිමාව අඩු විය. අඩු බෑවුම් ප්‍රතිකාර ක්‍රම තුළ ගලා යාමේ සැලකිය යුතු වෙනසක් නොමැති බව ද සොයා ගන්නා ලදී. මෙයට හේතුව අඩු බෑවුමේ සැලකිය යුතු ඉහළ පාංශු ඝනත්වය (1.588 ට/$cm^3$) නිසා විය හැක.

වගුව 1. පාංශු සංරක්ෂණ ක්‍රම සහ වැසි ජලය ගලා යාම

| බෑවුම | පාංශු සංරක්ෂණ ක්‍රම | වැසි ජලය ගලා යාම (1000 ලී/හෙ/වසර) |
|---|---|---|
| දැඩි බෑවුම | T1- ගල් වැටිය | 753.5 c |
| | T2- සැවන්දරා වැටිය සහිත ගල් වැටිය | 332.9 c |
| | T3- ගල් බැම්ම | 535.7 c |
| | T4- තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති) | 1681.8 b |
| | T5- හිස් භූමිය | 4178.1 a |
| අඩු බෑවුම | T1- ගල් වැටිය | 1029.9 b |
| | T2- සැවන්දරා වැටිය සහිත ගල් වැටිය | 1181.7 b |
| | T3- ගල් බැම්ම | 1238.5 b |
| | T4- තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති) | 1245.0 b |
| | T5- හිස් භූමිය | 2160.5 a |

**විවිධ බෑවුම්වල ස්ථාපිත පාංශු සංරක්ෂණ ක්‍රමවල පාංශු හානිය ගණනය කිරීම**

වැහි බිංදුවල චාලක ශක්තිය නිසා භූමියක ඇති පස් ඛාදනය වී ගලා යන ජලයෙන් සෝදා හරිනු ලැබේ. එ ලෙස මෙම පර්යේෂණයේ පාංශු හානිය විශ්ලේෂණ ප්‍රතිපල පහත විස්තර කර ඇත. බෑවුම නොසලකා විශ්ලේෂණය කිරීමේ දී හිස් භූමියෙහි පාංශු හානිය 8.1 ටොන්/හෙ/වසර සහ තේ ඉඩමේ එය 0.62 ටොන්/හෙ/වසර විය. බෑවුම් මට්ටම මත පදනම් වූ විවිධ පාංශු සංරක්ෂණ ක්‍රමවල පාංශු අලාභය පිළිබඳ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය නොවීය. කෙසේ වෙතත්, පාංශු සංරක්ෂණ ක්‍රම හේතුවෙන් දැඩි බෑවුම්වල පාංශු හානිය අඩු බෑවුමට වඩා අඩු අගයක් ඇත්තේ එහි ගලා යන ජල ප්‍රමාණය වැඩිවීම (ඉහළ පාංශු ඝනත්වය නිසා) හේතුවෙනි. තේ ඉඩම සමග සැසඳීමේ දී විවිධ පාංශු සංරක්ෂණ ක්‍රමවල පාංශු හානිය ඉහළ බෑවුමේ සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කර ඇත. එහිදී පාංශු අලාභය සැවන්දරා වැටිය සහිත ගල් වැටිය (T 2) හි 78% ක්, ගල් බැම්ම (T 3) හි 67% ක් සහ ගල් වැටිය (T1) හි 50% ක් විය.

වගුව 2. පාංශු සංරක්ෂණ ක්‍රම සහ එහි පාංශු හානිය

| බෑවුම | පාංශු සංරක්ෂණ ක්‍රම | පාංශු හානිය (ටොන්/හෙ/වසර) |
|---|---|---|
| දැඩි බෑවුම | T1- ගල් වැටිය | 0.40 |
| | T2- සැවන්දරා වැටිය සහිත ගල් වැටිය | 0.17 |
| | T3- ගල් බැම්ම | 0.26 |
| | T4-තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති) | 0.80 |
| | T5- හිස් භූමිය | 12.84 |
| අඩු බෑවුම | T1- ගල් වැටිය | 0.56 |
| | T2- සැවන්දරා වැටිය සහිත ගල් වැටිය | 0.66 |
| | T3- ගල් බැම්ම | 0.57 |
| | T4- තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති) | 0.45 |
| | T5- හිස් භූමිය | 3.44 |

**පාංශු ඛාදනය නිසා සිදුවන පෝෂක කොටස් අහිමි වීම**

පාංශු අවසාදිතය හා ගලායාම සමඟ පෝෂක අහිමි වීම ස්වභාවික භූමියේ සුලභ සිදුවීමකි. නමුත් විවිධ ඉඩම් පරිහරණ ක්‍රම යටතේ එම පෝෂක කොටස් ඉවත් වීම වෙනස් විය හැක. එය තේ ඉඩමට ද එලෙසම බලපායි. පස් හා ජල හානිය අවම කිරීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම වැදගත් වන අතර එම නිසා තේ ඉඩමෙහි අවසාදිත හා ගලා යන ජලය හරහා පෝෂක හානිය පාලනය කළ හැකිය. විවිධ පාංශු සංරක්ෂණ පියවරයන්හි දී ප්‍රධාන පෝෂක ඉවත් වීම වගුව 03 න් පෙන්වා ඇත. මෙහි දී නයිට්‍රජන් සහ පොස්පරස් යන පෝෂක අවසාදිත සහ ගලා යන ජලය යන දෙකෙහිම පරීක්ෂා කළ අතර පොටෑසියම් ගලා යන ජලයේ පමණක් පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵලවලට අනුව, පාංශු සංරක්ෂණ ක්‍රමවලින් තොර තේ ඉඩම් ඛාදනය නිසා ඉහළ පෝෂක කොටස් ඉවත් වී ඇති අතර අඩුම පෝෂක ප්‍රමාණයක් ඉවත් වී ඇත්තේ සැවන්දරා වැටිය සහිත ගල් වැටිය යන පාංශු සංරක්ෂණ ක්‍රමය යටතේය.

වගුව 3. විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම වල සිදුවන පෝෂක හානිය නිර්ණය කිරීම

| පාංශු සංරක්ෂණ ක්‍රම | නයිට්‍රජන් (කි/හෙ/වසර) | පොස්පරස් (කි/හෙ/වසර) | පොටෑසියම් (කි/හෙ/වසර) |
|---|---|---|---|
| T1- ගල් වැටිය | 6.29 | 0.93 | 3.37 |
| T2- සැවන්දරා වැටිය සහිත ගල් වැටිය | 2.81 | 0.40 | 1.27 |
| T3- ගල් බැම්ම | 4.33 | 0.51 | 2.09 |
| T5- තේ ඉඩම (පාංශු සංරක්ෂණය නොමැති) | 14.19 | 2.34 | 8.39 |

එල් ඒ එස් පී ජයසිංහ සහ ඒ එම් පී පි බී ඒකනායක

## ප්‍රධාන ව්‍යාපෘතිය A 19. ජල සම්පාදනය සහ ජල කළමනාකරණය

### ව්‍යාපෘතිය A 19.1. නියඟය පවතින ප්‍රදේශවල තේ සඳහා ජල කළමනාකරණ ශිල්පීය ක්‍රම සංවර්ධනය කිරීම සහ පහතරට තේ සඳහා බිංදු සහ ඉසින වාරි පද්ධති ඇගයීම

රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ තේ වර්ධනය සඳහා බිංදු සහ ඉසින ජල සම්පාදනයේ කාර්යක්ෂමතාවය සොයා බැලීම සඳහා අත්හදා බැලීම් දෙකක් සිදු කෙරේ. A අත්හදා බැලීමේ දී, TRI 4061 සහ TRI 2021 යන තේ වගාවන් දෙකක් 2013 ජුනි මාසයේ දී බිංදු වාරිමාර්ග සමඟ සහ රහිතව රෝපණය කරන ලදී. (මුල දී, පැළ සොරකම් කිරීම හේතුවෙන් TRI 2021 වෙනුවට TRI 2023 සමඟ රෝපණය කරන ලදී). අත්හදා බැලීම යනු තරුණ තේ පැළ ඉසින ජල සම්පාදනයට දක්වන ප්‍රතිචාරය ඇගයීමයි. පර්යේෂණාත්මක නිර්මාණය CRD ය; TRI 2023, TRI 2027 සහ TRI 4004 යන වගාවන් අත්හදා බැලීමේදී භාවිතා වේ. මෙම වෙනම අත්හදා බැලීම් දෙකේ දී බිංදු සහ ඉසින වාරිමාර්ග යටතේ තරුණ තේ පැළවල මුල් වර්ධනය ඇගයීමට ලක් කරන ලදී.

A අත්හදා බැලීමේ දී, වගාවන් දෙකෙහිම වාරිමාර්ග හා වැසි සහිත ප්‍රතිකාර යටතේ සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය විය. ප්‍රතිකාර අනුව හෝ වගාව අනුව සැලකිය යුතු වර්ධන වෙනස්කම් දක්නට නොලැබුණි.

වගුව 8. බිඳිති ජල සම්පාදිත සහ වැසිදිය වගා කරන ලද ශාකවල කඳෙහි වට ප්‍රමාණය (සෙ.මී.)

| ප්‍රභේදය | වැසිදිය | ජල සම්පාදිත |
|---|---|---|
| TRI 2021 | 6.10(±0.34) | 6.23(±0.37) |
| TRI 4061 | 6.32(±0.30) | 6.73(±0.49) |

B අත්හදා බැලීමේ දී, වාරි තත්වයන් යටතේ TRI 2027 ප්‍රභේදයෙන් ශාක වර්ධනයේ ඉහළම වට ප්‍රමාණය නිරීක්ෂණය කරන ලද අතර, වර්ෂාපතන ප්‍රතිකාර ක්‍රම 6.14 (සෙ.මී. ± 0.28) ට සාපේක්ෂව 6.49 (සෙ.මී. ± 0.21) වට ප්‍රමාණය පෙන්නුම් කරන ලදී. TRI 2027 සහ TRI 4004 ප්‍රභේද සඳහා වර්ධනයේ වෙනසක් එතරම් වැදගත් නොවීය. පහත වගුවේ දැක්වෙන්නේ වර්ෂාපතන සහ වාරි තත්ත්ව යටතේ විවිධ ප්‍රභේද තුනක වට ප්‍රමාණයයි.

වගුව 9. විසිරි ජල සම්පාදිත සහ වැසිදිය වගා කරන ලද ශාකවල කඳෙහි වට ප්‍රමාණය (සෙ.මී.)

| ප්‍රභේදය | වැසි දිය | ජල සම්පාදිත |
|---|---|---|
| TRI 2023 | 6.02 (±0.05) | 6.24 (±0.51) |
| TRI 2027 | 7.69 (±0.54) | 7.82 (±0.66) |
| TRI 4004 | 5.76 (±0.48) | 5.95 (±0.16) |

**තේ සහ පොල් අතුරු වගාව සඳහා, විසිරි ජල සම්පාදනයේ බලපෑම**

ඉන්දියාවේ හෝල්මාර්ක් වාරිමාර්ග ආයතනය සහ කුඩා තේ වතු හිමියන්ගේ සහාය ඇතිව, 2018 දෙසැම්බර් මාසයේ දී TRI 2021 (2014 සිටුවා, අවුරුදු 5 ක් වයසැති) පරිණත තේ ක්ෂේත්‍රයක, ශාන්ත ජෝකිම් වත්ත, ක්ෂේත්‍ර අංක 01 හි පොල් අතුරු බෝග වගා ක්‍රමයක අත්හදා බැලීම ආරම්භ කරන ලදී. කෙටි නියඟයක දී වාරිමාර්ග යොදන ලදී. අස්වැන්න වාර්තා කර ඇත, බිම් කොටස් හයකින් (3 වාරිමාර්ග, 3 වැසි සහිත).

TRI 2021, TRI 2026 සහ TRI 2027 යන ප්‍රභේදවලින් පැළ 10 බැගින් ඉසින වාරි ජලය සහ වර්ෂාපතනය සඳහා පැළ 10 බැගින් තෝරා ගනිමින් 2020 අවසානයේ පැළ වට ප්‍රමාණය මනිනු ලැබිණි.

වගුව 10. විසිරි ජල සම්පාදිත සහ වැසි දිය වගා කරන ලද ශාකවල කඳෙහි වට ප්‍රමාණය (සෙ.මී.)

| ප්‍රභේදය | වැසි දිය | ජල සම්පාදිත |
|---|---|---|
| TRI 2021 | 3.95 (±0.17) | 4.35 (±0.19) |
| TRI 2026 | 4.80 (±0.11) | 5.07 (±0.17) |
| TRI 2027 | 5.39 (±0.18) | 5.38 (±0.19) |

TRI 2021 ප්‍රභේදයේ බිම් කොටස් 6ක් (වැසි ජලය භාවිතයෙන් බිම් කොටස් 3ක් සහ ජල සම්පාදනයෙන් බිම් කොටස් 3ක්) සඳහා සතිපතා අමු දලු අස්වැන්න වාර්තා කරන ලදී. සෑම බිම් කැබැල්ලක්ම පැළ 51 (± 1) කින් සමන්විත වේ. පහත වගුවේ දැක්වෙන්නේ 2022 සඳහා සාදන ලද තේ කිලෝග්‍රෑම්/හෙක්ටයාර් ලෙස මුළු අස්වනු නෙළන ලද දලු අස්වැන්නයි. වැසි ජලයෙන් වගා කළ බිම් කොටස්වලට වඩා ජල සම්පාදනයෙන් වගා කළ බිම් කොටස්වල අස්වැන්න 7% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2022 වසර ප්‍රමාණවත් තරම් මාසික වර්ෂාපතනයක් සහිත තෙත් වසරක් වීම මෙයට හේතු විය හැක. මීට අමතරව, බිම් කොටස් නිසි ලෙස පොහොර යෙදීමට බාධා ඇති විය. කෙසේ වෙතත්, වසරේ මුල් මාස 3 තුළ ජල සම්පාදනයෙන් වගා කරන ලද ඉඩම් වැසි ජලයෙන් වගා කළ බිම්වලට වඩා 18% ක වැඩි අස්වැන්නක් වාර්තා කර ඇත.

**ශ්‍රී ලංකාවේ ආන්තික තේ වගා ප්‍රදේශයන්හි, තේ වගාවේ ක්‍රියාකාරිත්වය (*Camellia sinensis*)**

ආන්තික වැඩෙන ප්‍රදේශයක් වන රඹුක්කන ප්‍රදේශයේ වගා කරන තේ පැළවල කායික ක්‍රියාකාරිත්වය වියළි කාලය සහ තෙත් කාල සඳහා 2022 දී ඇගයීමට ලක් කරන ලදී. පරිණත තේ පැළ ජල සම්පාදනය කරන ලද ඉඩම්වල් වගා කෙරේ. වසරේ මුල් මාස තුන තුළ දෛනික වර්ෂාපතනය මත දැඩි තෙතමන පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, තෙත් සමයේදී ද පත්‍ර උෂ්ණත්වය ඉහළ මට්ටමක පැවතුනි. තෙත් සමයේ දී ප්‍රභාසංශ්ලේෂණය වැඩි වූයේ 24% කින් පමණි. උත්ස්වේදනය අඩු වූයේ 4%කින් පමණි. කෙසේ වෙතත්, තෙත් සමයේ දී පුටිකා සන්නයනය 110% කින් වැඩි විය.

වගුව 11: වියළි කාලවලදී සහ තෙත් කාලවලදී ශ්‍රී ලංකාවේ රඹුක්කන ප්‍රදේශයේ වගා කරන තේවල කායික විද්‍යාත්මක ප්‍රතිචාරය

| මැනීම | වියළි කාලය | තෙත් කාලය |
|---|---:|---:|
| පත්‍ර උෂ්ණත්වය ($^0$C) | 42.2(±0.19) | 39.2(±0.28) |
| උත්ස්වේදනය (mmolm$^{-2}$s$^{-1}$) | 7.4(±0.15) | 7.1(±0.18) |
| පුටිකා සන්නයනය (mmolm$^{-2}$s$^{-1}$) | 0.388(±0.02) | 0.829(±0.04) |
| ප්‍රභාසංස්ලේෂණය (μmolm$^{-2}$s$^{-1}$) | 11.04(±0.27) | 13.73(±0.30) |
| ජල භාවිත කාර්යක්ෂමතාව | 1.49 | 1.93 |

**ව්‍යාපෘතිය A 19.4. යෝග්‍ය වැසි ජලය රැස්කිරීමේ සහ රඳවා ගැනීමේ ක්‍රමයක් සහ තේ සඳහා වැසි ජලය භාවිතයේ සඵලතාවය ඇගයීම**

**වැසි ජලය රැස් කිරීම සහ අනෙකුත් කෘෂි විද්‍යාත්මක භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා පාංශු ආකලන සහිත තිරසාර හෙල්මළු වගා බිම් සකස් කිරීම**

TRI 4049 ප්‍රභේදය සමඟ නව වගාවක් සමඟ ප්‍රතිසංස්කරණය කරන ලද තේ ක්ෂේත්‍රයක් පරිවර්තනය කරමින් 2021 ජූලි මාසයේදී අත්හදා බැලීමක් ආරම්භ කරන ලදී. හෙල්මළු වගා බිම් ගොවිතැන පිළිබඳ මීට පෙර සිදු කරන ලද අත්හදා බැලීම්වලින් පෙන්නුම් කර ඇත්තේ එය ගොනුවේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි දියුණු කරන අතර ගලායාම අඩු කරන බවයි. පහත සඳහන් ප්‍රතිකාර, සිටුවීමට පෙර පාංශු සංශෝධන ලෙස එකතු කරන ලදී.

1. Paddy husk biochar – 1.25 kg/plant (T1)
2. Charcoal application – 750 g/plant (T2)
3. Compost application – 2 kg/plant (T3)
4. Burning of wood debris – 0.6 m height (T4)

T4 ප්‍රතිකාරය යටතේ, රෝපණ සිදුරු සෑදීමට පෙර, බිම් කොටසෙහි පැරණි කොළ සහ අතු වැනි කාබනික අපද්‍රව්‍ය පුළුස්සා දමනු ලැබේ. එම කාබනික අපද්‍රව්‍ය සෑම බිම් කොටසකම මීටර 0.6 ක උසකට ගොඩගසන ලදී. සෑම බිම් කැබැල්ලක්ම පැළ 10 කින් සමන්විත වේ. පහත වර්ධන පරාමිතීන් 2023 ජනවාරි මාසයේදී මනිනු ලැබීය. දහයියා භාවිතයෙන් සාදන ලද ජෛව අඟුරු යෙදීමෙන් හොඳම කාර්ය සාධනය නිරීක්ෂණය විය.

වගුව 12. සිටුවා මාස 18 කට පසු, ශාක වර්ධනය

| ප්‍රතිකාරකය | කඳෙහි වටය (සෙ මි) | අතු ගණන | පත්‍ර ගණන |
|---|---|---|---|
| Paddy husk biochar (T1) | 1.84 (±0.06)[a] | 10.55 (±0.94) | 150.8 (±13.3)[a] |
| Charcoal (T2) | 1.55 (±0.08)[b] | 10.20 (±1.0) | 102.7 (±11.7)[b] |
| Compost (T3) | 1.54 (±0.08)[b] | 9.05 (±1.0) | 105.2 (±9.6)[b] |
| Burnt wood debris (T4) | 1.66 (±0.07)[ab] | 9.30 (±0.88) | 113.7 (±5.5)[b] |
| CV% | 20.5 | ns | 39.53 |
| $R^2$ | 0.112 | ns | 0.15 |
| P | 0.023 | ns | 0.0054 |
| LSD | 0.21 | ns | 29.39 |

එන් පී එස් එන් බණ්ඩාර, ඊ ඩබ් ටී පී ප්‍රේමතුංග, ආර් බී එල් හේමකුමාර සහ පී ජී ඕ එන් ගුණවර්ධන

## ප්‍රධාන ව්‍යාපෘතිය 24. වල් පැළෑටි කළමනාකරණය

### ව්‍යාපෘතිය A 24.3. වල් පැළෑටි කළමනාකරණය

1. Avenger AG Optima Burndown  වල් නාශකය

Avenger AG Optima Burndown, පවතින සම්මත රසායනික වල් නාශක සමඟ සසඳන විට ඇගයීමට ලක් කරන ලදී. අත්හදා බැලීම සඳහා පහතරට, මැදරට සහ උඩරට යන ප්‍රදේශවලින් ස්ථාන තුනක් තෝරා ගන්නා ලදී, එනම් ක්ෂේත්‍ර අංක 01, ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර, (6043'N, 80021'E, 29m amsl), නායපාන වත්ත, පුස්සැල්ලාව (705' N, 80036'E, 986m amsl), සහ ශාන්ත කූම්බ්ස් වත්ත, තලවාකැලේ (6054'N, 80042'E, 1394m amsl), පිළිවෙලින්. එක් එක් ප්‍රතිකාර සඳහා අනුරූ 03ක් සමඟ සසම්භාවී සම්පූර්ණ බ්ලොක් සැලසුමක පහත ප්‍රතිකාර යොදන ලදී. සියලුම ස්ථානවල අත්හදා බැලීම් 2021 නොවැම්බර් සිට 2022 පෙබරවාරි දක්වා කාලය තුළ සිදු කරන ලදී. ග්ලයිෆොසේට්

යෙදීමෙන් හොඳම වල් මර්දනය නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, Avenger වල්නාශකය ද මැද රටෙහි සති 12 ක් දක්වා සමාන කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත.

T 1 – Avenger 20 L/ha
T 2 – Avenger 30 L/ha
T 3 – Avenger 40 L/ha
T 4 – Avenger 50 L/ha
T 5 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් (28%) 0.7 L/ha
T 6 – ග්ලයිෆොසේට් (36%) 1.4 L/ha
T 7 – Untreated control

**2. ග්ලුෆෝසිනේට් ඇමෝනියම් වල් නාශකය අත්හදාබැලීම**

අත්හදා බැලීම සඳහා පහතරට, මැදරට සහ උඩරට ස්ථාන තුනක් තෝරා ගන්නා ලදී. ඒවා නම් ක්ෂේත්‍ර අංක 01, ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර (6043'N, 80021'E, 29m amsl), ඉහළ කොට්ඨාසය, නායපාන වත්ත, පුස්සැල්ලාව (705'N, 80036'E, 986m amsl) සහ ක්ෂේත්‍ර අංක 08, ශාන්ත කුම්බ් වත්ත, තලවාකැලේ (6054'N, 80042'E, 1394m amsl) (රූපසටහන 2). එක් එක් ප්‍රතිකාරය සඳහා අනුරූ 03ක් සමඟ සසම්භාවී සම්පූර්ණ බ්ලොක් සැලසුමක් තුළ පහත ප්‍රතිකාර ක්‍රම යොදනු ලැබේ. සියලුම ස්ථානවල අත්හදා බැලීම් 2020 ජූනි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ සිදු කරන ලදී. හොඳම වල් මර්දන යෙදුම ග්ලයිෆොසේට් යෙදුම මගින් පෙන්වා ඇත. කෙසේ වෙතත්, ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.4 ලීටර/හෙක්ටයාරයකට යෙදුම ද 8 වන සතිය දක්වා සමාන කාර්ය සාධනයක් ඇත.

T 1 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 0.9L/ha
T 2 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.0L/ha
T 3 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.2L/ha
T 4 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3L/ha
T 5 – ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.4L/ha
T 6 – ග්ලයිෆොසේට් (36%) 1.4L/ha
T 7 – Untreated control

එන් පී එස් එන් බණ්ඩාර, ඊ ඩබ් ටී පී ප්‍රේමතුංග, එම් ජී එස් ලියනගේ,
එස් එන් විජේසේකර සහ ඒ එම් පී පි බි ඒකනායක

**ප්‍රධාන ව්‍යාපෘතිය 34. විවිධ තේ වගා කලාප සඳහා සෙවණ කළමනාකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම**

**ව්‍යාපෘතිය A 34.1 නව සෙවණ ශාක වර්ගවල වර්ධනය නිර්ණය කිරීම**

**a) උස් සෙවණ + මධ්‍යම සෙවණ- හවුපේ වතුයාය, කහවත්ත**
**b) උස් සෙවණ + මධ්‍යම සෙවණ - හවුපේ වතුයාය, කහවත්ත**

වර්ෂ 2014 ආරම්භ කළ මෙම ක්ෂේත්‍ර පර්යේෂණයෙහි යෝජිත නව උස් සෙවණ ශාක වර්ග දෙකක් (ඩෙරිස් මයික්‍රොපයිලා සහ කැසියා නොඩෝසා) ඇල්බීසියා මොලුකානා ශාකය සමග සංසංදනය කෙරෙන අතර, ග්ලිරිසීඩියා ශාකය මධ්‍යම සෙවණ ලෙස සියළුම පර්යේෂණ කොටු තුළ වගා කර ඇත.

T1. ඩෙරිස් මයික්‍රොපයිලා (*Derris microphylla*) (40'x40') + ග්ලිරිසීඩියා (10'x10')
T2. ඩෙරිස් මයික්‍රොපයිලා (30'x30') + ග්ලිරිසීඩියා (10'x10')
T3. ඩෙරිස් මයික්‍රොපයිලා (20'x30') + ග්ලිරිසීඩියා (10'x10')
T4. කැසියා නොඩෝසා (*Cassia nodosa*) (40'x40') + ග්ලිරිසීඩියා (10'x10')
T5. කැසියා නොඩෝසා (30'x30') + ග්ලිරිසීඩියා (10'x10')
T6. කැසියා නොඩෝසා (20'x30') + ග්ලිරිසීඩියා (10'x10')
T7. ඇල්බීසියා මොලුකානා (*Albizzia molluccana*) (40'x40') + ග්ලිරිසීඩියා (10'x10')

පර්යේෂණ කටයුතු සඳහා ගමනාගමනයට අවශ්‍ය ඉන්ධය සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් 2022 වර්ෂයේ දී බොහෝ කටයුතුවලට බාධා එල්ල වූ නමුදු, සෙවණ ශාක සහ තේ බෝගයේ වර්ධනය පිලිබඳ පාරාමිතීන් වාර්තාගත කරන ලදී. අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු හැකි උපරිමයෙන් ඉටු කරන ලදී.

ඇල්බීසියා ශාකවල කඳ වට ප්‍රමාණ ඩෙරිස් ශාකවලට වඩා සැලකිය යුතු ලෙස වැඩි අගයක් වාර්තා කල අතර, ඩෙරිස් ශාකවල උස ඇල්බීසියා ශාකවලට වඩා සැලකිය යුතු අඩු අගයක් පෙන්වන ලදී. එම ශාක කප්පාදුවට ලක් කර තිබූ බැවින්, පත්‍ර වියනෙහි ප්‍රමාණය සහ ද්වීතීක අතු සංඛ්‍යාවන් වාර්තා කර ගැනීම සිදු නොකරන ලදී.

කැසියා ශාකයේ කඳ පාදස්ථය ඉත්තෑවන් විසින් ඉතා අධිකව හානි කර තිබූ නමුදු, ඩෙරිස් ශාකවල කිසිදු රෝග පලිබෝධක හානියක් වාර්තා නොවිණ.

යෝජිත නව සෙවණ ශාක සමඟ වගා කර තිබූ තේ බෝගයෙ හි කඳ පාදස්ථ වට ප්‍රමාණයන් (වර්ධනය) ඇල්බීසියා සෙවණ යටතේ වගා කළ තේ සමග සැලකිය යුතු වෙනසක් වාර්තා නොකරන ලදී.

පර්යේෂණය තව දුරටත් සිදු වෙමින් පවතී.

**b) උස් සෙවණ + මධ්‍යම සෙවණ - තල්ගස්වල වතුයාය.**

මෙම පර්යේෂණය 2014 වර්ෂයේ දීආරම්භ කළ අතර ඩෙරිස් රොබස්ටා සහ කැසියා සියාමියා ශාක ඇල්බීසියා ශාකය සමග, තේ වගාවේ උස් සෙවණ සඳහා සංසන්දනය කිරීම මෙහි අරමුණයි. මධ්‍යම සෙවණ ශාකය ලෙස පොදුවේ ග්ලිරිසීඩායා සේපියම් ශාක සිටුවා ඇති අතර යොදා ගන්නා ප්‍රතිකාර තත්ව පහත වගුවේ පෙන්වා ඇත.

| | | |
|---|---|---|
| T1 | ඩෙරිස් රොබස්ටා | (*Derris robusta*) (40'x40') + ග්ලිරිසීඩියා (10'X10') |
| T2 | කැසියා සියාමියා (*Cassia siamea*) (40'x40') | + ග්ලිරිසීඩියා (10'X10') |
| T3 | ඇල්බීසියා මොලුකානා (*Albizzia molluccana)* (40'x40') + ග්ලිරිසීඩියා (10'X10') | |

ප්‍රවාහන අපහසුතා හේතුවෙන් මෙම පර්යේෂණයේ දත්ත එක් රැස් කිරීමට නොහැකි විය.
පර්යේෂණය තව දුරටත් සිදු වෙමින් පවතී.

**c) උස් සෙවණ + මධ්‍යම සෙවණ - ඇල්කඩුව වතුයාය**

වර්ෂ 2017 හි ස්ථාපිත මෙම පර්යේෂණයෙ හි ප්‍රතිකාරක තත්ත්ව පහත පරිදි වෙයි.

T 1 ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T 2 ඩෙරිස් රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T 3 ග්‍රැවීලියා රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T 4 උස් සෙවණ ශාක නොමැතිව එරිත්‍රිනා පමණක් (10’x10’)

ඩෙරිස් මයික්‍රොපයිලා ශාකවල කඳ වට ප්‍රමාණය මෙම පර්යේෂණයේ වගා කර ඇති අනෙකුත් උස් සෙවණ ශාක වලට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. ඩෙරිස් රොබස්ටා ශාකයේ කඳ වට ප්‍රමාණය ග්‍රැවීලියා රොබස්ටා ශාකය සමඟ සංසන්දනාත්මක විය. තේ බෝගයේ වර්ධනය සහා අස්වැන්න උස් සෙවණ ශාක අනුව වෙනසක් නොපෙන්වන ලදී.

පර්යේෂණය තවදුරටත් සිදුකෙරෙමින් පවතී.

**d) උස් සෙවණ + මධ්‍යම සෙවණ  - බටාවත්ත වතුයාය.**
පිටරත්මලේ වතුයායේ ස්ථාපිත කර තිබූ මෙම පර්යේෂණය දැඩි නියඟ තත්වය හේතුවෙන් විනාශ වී යාම හේතුවෙන්, වර්ෂ 2022 දී බටාවත්ත වතුයායෙ හි ප්‍රතිස්ථාපනය කරන ලදී. පර්යේෂණයේ උස් සෙවණ ප්‍රතිකාරක තත්වයන් පහත පරිදි වන අතර සියලු ප්‍රතිකාරක තත්ව යටතේ මධ්‍යම සෙවණ ලෙස එරිත්‍රිනා ශාකය වගා කර ඇත.

T1) ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T2) ඩෙරිස් රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T3) ග්‍රැවීලියා රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T4) උස් සෙවණ ශාක නොමැතිව එරිත්‍රිනා පමණක් (10’x10’)

ප්‍රවාහන අපහසුතා හේතුවෙන්, උස් සෙවණ ශාක සිටුවීමේ කටයුතු බෙහෝ සෙයින් ප්‍රමාද විය. 2022 වර්ෂයේ නව උස් සෙවණ ශාක සිටුවීම සිදු කරගෙන ගිය අතර පර්යේෂණයෙහි වැඩකටයුතු සිදු කෙරෙමින් පවතී.

**e) උස් සෙවණ + මධ්‍යම සෙවණ  - එල්ටන්හෝල් වතුයාය**
උස් සෙවණ ශාක බොහෝ සෙයින් මියයාම හේතුවෙන්, මැදකුඹුර වතුයායෙ හි පවත්වාගෙන ගිය මෙම පර්යේෂණය එල්ටන්හෝල් වතුයායෙහි ප්‍රතිස්ථාපණය කරන ලදී. පර්යේෂණයේ ප්‍රතිකාරක තත්ව පහත පරිදි වෙයි.

T1) ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’)  + එරිත්‍රිනා (10’x10’)
T2) ඩෙරිස් රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T3) ග්‍රැවීලියා රොබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T4) උස් සෙවණ ශාක නොමැතිවා එරිත්‍රිනා පමණක් (10’x10’)

ප්‍රවාහන අපහසුතා හේතුවෙන්, උස් සෙවණ ශාක සිටුවීමේ කටයුතුවලට බෙහෝ සෙයින් බාධා එල්ල වූ අතර, 2022 වර්ශයේදී සෙවණ ශාක සංස්ථාපනය නිම කරන ලදී.

පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී.

**ව්‍යාපෘතිය 34.3. විවිධ කෘෂි පාරිසරික කලාපයන් හි (AERs) සෙවණ ගස් ආශ්‍රිත පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම**
Botryosphaeriacea දිලීර ආසාදනය හේතුවෙන් සිදුවන ග්‍රැවීලියා පසු මැරීමේ රෝගය සහ පිළිකා රෝගය කළමනාකරණ උපක්‍රම අත්හදා බලා ඇත. ශාන්ත කූම්බ්ස් වතුයාය ආශ්‍රිත ග්‍රැවීලියා ශාකයන්හි  රෝග ආසාධිත පිළිකා සඳහා ප්‍රතිකාරක ලබා දීමෙන්  අනතුරුව දීර්ඝ කාලීන ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

ජී ඩී සින්නයියා සහ ඩී ජී එන් පී කරුණාජීව

# බෝග ආරක්ෂණය



**ප්‍රධාන ව්‍යාපෘතිය A 22. තේ කඳ ගුල්ලා පාලනය සඳහා පිරිවැය-ඵලදායි ක්‍රමවේදයන් දියුණු කිරීම**

**ව්‍යාපෘතිය A 22.1. නොමේරූ සහ පරිණත තේ වගාවේ තේ කඳ ගුල්ලාගේ හානිය අවම කිරීම සඳහා කෘතිම පළිබෝධනාශක පරීක්ෂා කිරීම**

ව්‍යාපෘතිය B 133 යටතේ ප්‍රගතිය වාර්තා වේ.

මෙය කීට විද්‍යා අංශය, තාක්ෂණික හා කෘෂි ආර්ථික විද්‍යා අංශයේ සහයෝගිතා ව්‍යාපෘතියකි.

**ව්‍යාපෘතිය A 22.2. පරිණත සහ අපරිණත තේ වල කඳ විදින ගුල්ලා පාලනය කරගැනීමට ජෛව පළිබොධකයින් හඳුනා ගැනීම**

කෘමි ව්‍යාධිජනක දිලීරයක් වන *Beauvaria bassiana* විද්‍යාගාරය තුළ ගුණනය කිරීම අඛණ්ඩව සිදු කෙරිනි. ව්‍යාපෘතිය B 146 යටතේ ප්‍රගතිය වාර්තා වේ.

එන් ඒ අයි එම් නිස්සංක, ඒ එම් පී සම්මානි සහ පී ඩී සේනනායක

**ව්‍යාපෘතිය A 22.6. තේ කඳ ගුල්ලා පාලනය සඳහා ශාක ආරක්ෂණ ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම**

**පර්යේෂණය E 414 (II). තේ කඳ ගුල්ලා සමූහ වශයෙන් හසු කර ගැනීම සඳහා තේ කඳ සහ පොතුවල අඩංගු වාෂ්පශීලී ද්‍රව්‍ය ආකර්ශක උගුල් ලෙස භාවිතා කිරීමට සුදුසු උස තහවුරු කිරීම**

අරමුණ: තේ කඳේ පොත්තෙන් නිස්සාරනය කරන ලද වාෂ්පශීලී ද්‍රව්‍ය උගුලක් ලෙෂ ක්ෂේත්‍රයේ යොදාගැනිමට සුදුසු උස ඇගයීම

ක්ෂේත්‍ර පර්යේෂණ ස්ථානය: ක්ෂේත්‍ර අංක 07, ඇටම්පිටිය වතුයාය, ඇටම්පිටිය

පර්යේෂණ සැලසුම: අනුරූ 03 කින් සමන්විත Split Plot සැකසුම

ප්‍රතිකාරක:

T1: තේ කඳ සහ පොත්තෙහි අඩංගු වාෂ්පශීලී ද්‍රව්‍ය මිශ්‍රණය

T2: එතනෝල් 70%

T3: පාලිත ප්‍රතිකාරකය

ඉහත ප්‍රතිකාරක බිම් මට්ටමේ සිට H1 (අඩි 3) සහ H2 (අඩි 6) යන උස දෙකෙහි තැබීමෙන් තේ කඳ ගුල්ලා ආකර්ෂණය කර ගැනීම සඳහා ඵලදායි ආකර්ෂක උස තීරණය කරන ලදී. බහු පුනීල උගුල් (Synergy Semiochemicals සමාගමෙන් ආනයනය කරන ලද) ක්ෂේත්‍රයේ මීටර් 15 ක් දුරින් සිටුවා තේ කඳ ගුල්ලාගේ ආකර්ෂණය මැයි සිට දෙසැම්බර් දක්වා මාසික කාල සීමාවන් තුළ නිරීක්ෂණය කරන ලදී.




රූපසටහන 1. විවිධ ප්‍රතිකාර ක්‍රමවලදී උගුලට හසු වූ තේ කඳ ගුල්ලාගේ ගහනය

උගුලට හසුවූ තේ කඳ ගුල්ලන් සංඛ්‍යාව මැයි මස සිට ඔක්තෝබර් දක්වා කාලයත් සමඟ ක්‍රමයෙන් වැඩි වූ අතර ඉන් පසුව අඩු විය. බිම් මට්ටමේ සිට අඩි 3 ක් උසින් තැබූ T1 (තේ කඳ සහ පොත්තෙහි අඩංගු වාෂ්පශීලී ද්‍රව්‍ය මිශ්‍රණයට) ආකර්ෂණය වූ තේ කඳ ගුල්ලන් සංඛ්‍යාව, බිම් මට්ටමේ සිට අඩි 6 ක් උසින් තබා තිබූ T1 (තේ කඳ සහ පොත්තෙහි අඩංගු වාෂ්පශීලී ද්‍රව්‍ය මිශ්‍රණයට) වඩා සැලකිය යුතු ලෙස වැඩි විය. මාසික ඇගයීම් සමඟ පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල, එස් පී ආර් විජේවර්ධන,
ඒ එම් පී සම්මානි සහ ආචාර්ය පී ඩී සේනානායක

**ව්‍යාපෘතිය A 23.4 බුබුළු අංගමාර රෝගය පාලනය සඳහා කෘතිම දිලීර නාශක සහ ඒවාට අදාල පෙර අස්වනු කාල නිර්ණය කිරීම.**

**තේ වගාවේ බුබුළු අංගමාර රෝගයට එරෙහිව නැනෝ කොපර් හි සඵලතාව අධ්‍යයනය කිරීම.**

තේ වගාවේ බුබුළු අංගමාර රෝගයට එරෙහිව නැනෝ කොපර් සංයුතියෙහි (Copper sulphate pentahydrate 5.2% w/w) කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම, ඵලදායී සාන්ද්‍රණය තීරණය කිරීම සහ ඵලදායී සාන්ද්‍රණය භාවිතයෙන් අතුරුව නිම් තේ වල අනතර්ගත විය හැකි පලිබෝධනාශක අවශේෂ සීමා, භායනික පරීක්ෂණ මගින් නිර්ණය කිරීම මෙම අධ්‍යයනයේ පරමාර්ථ විය. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කරන ලද සියලුම පරීක්ෂණ පහත සාරාංශ ගත කර ඇත.

**නිෂ්පාදකයේ ද්‍රාව්‍යතාව**

කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2 % w/w (ICC60) මිලි ලීටර් 10 ක් ජලය මිලි ලීටර් 100 ක දිය කර ඇත. ද්‍රාවණයේ ද්‍රාව්‍යතාව, වර්ණය, ද්‍රාවණයේ පැහැදිලි බව සහ අවසාදිත බව නිරීක්ෂණය කරන ලදී. සංසන්දනය කිරීම සඳහා කොපර් හයිඩ්‍රොක්සයිඩ් WG සහ කොපර් ඔක්සයිඩ් WP ග්‍රෑම් 10 බැගින් මිලි ලීටර් 100 ක ජලයේ වෙන වෙනම දියකරන ලදී.



රූපසටහන 2. කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 0.1 % ද්‍රාවණය 5.2 % w/w (a), 37.5 % කොපර් හයිඩ්‍රොක්සයිඩ් WG (b) සහ 50 % කොපර් ඔක්සයිඩ් (c).

කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2 % w/w ද්‍රාවණය සම්පූර්ණයෙන්ම ජලයේ දිය වී පැහැදිලි, තරමක් නිල් පැහැති ද්‍රාවණයක් ලබා දෙයි. මිනිත්තු 30 කට පසුව කරන ලද නිරීක්ෂණයේදී පවා අවසාදිත හමු නොවුණි. කොපර් හයිඩ්‍රොක්සයිඩ් සහ කොපර් ඔක්සයිඩ් ජලයේ දිය වී ඇති නමුත් මිශ්‍ර කිරීම නැවැත්වීමෙන් පසු නිෂ්පාදන දෙකෙහිම අවසාදිත නිරීක්ෂණය විය. කොපර් හයිඩ්‍රොක්සයිඩ් හා සසඳන විට කොපර් ඔක්සයිඩ් වල අවසාදිත මට්ටම ඉහලය.

**කාර්යක්ෂමතා පරීක්ෂණ (Efficacy trial)**

**අත්හදා බැලීම 1:** අත්හදා බැලීම 2020 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා කාලය තුළ තලවාකැලේ, ශාන්ත කූම්බ්ස් වත්ත, අංක 11 පහළ කොටස ආශ්‍රිතව සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ පැවති තේ ප්‍රභේදය TRI 2025 වන අතර කප්පාදුවෙන් පසු පළමු වසර තුළ ක්ෂේත්‍රය පැවතිණි.

**අත්හදා බැලීම 2:** 2021 ජූලි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ තලවාකැලේ, ශාන්ත කූම්බ්ස් වත්ත, පහළ කොටසේ අංක 8 ක්ෂේත්‍රයේදී අත්හදා බැලීම සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ පැවති තේ ප්‍රභේදය TRI 2024 වන අතර කප්පාදුවෙන් පසු පළමු වසර තුළ ක්ෂේත්‍රය පැවතිණි.

**අත්හදා බැලීම 3:** 2022 මැයි සිට ජූලි දක්වා කාලය තුළ තලවාකැලේ, ශාන්ත කූම්බ්ස් වත්ත, පහළ කොටසේ අංක 8 ක්ෂේත්‍රයේදී තහවුරු කිරීමේ අත්හදා බැලීම සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ පැවති තේ ප්‍රභේදය TRI 2025 වන අතර කප්පාදුවෙන් පසු දෙවන වසර තුළ ක්ෂේත්‍රය පැවතිණි.

**පර්යේෂණාත්මක සැලැස්ම :**

සසම්භාවිත පූර්ණ කට්ටි සැලැස්ම (RCBD) භාවිතයට ගැනුණි. ප්‍රතිකාරක 6 ක් අත්හදා බලන ලදී. අත්හදා බලන ලද ප්‍රතිකාරක පිළිවෙලින් $T_1$ - 0.05% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2% w/w, $T_2$ - 0.1% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2% w/w, $T_3$ - 0.2% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2% w/w, $T_4$ - 0.3% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 5.2% w/w, $T_5$ - 0.1% නිර්දේශිත කොපර් හයිඩ්‍රොක්සයිඩ් WG [පාලකය] සහ $T_6$ - ප්‍රතිකාර නොකරන ලද පාලකය විය. එක් එක් ප්‍රතිකාරකය තෙවරක් ප්‍රතිවලිත කරන ලදී. පර්යේෂණය සඳහා යොදා ගන්නා ලද සෑම කට්ටියක්ම තේ පඳුරු 30-35 කින් පමණ සමන්විත විය. සතියක විරාම කාලයක් තබමින් රසායන ද්‍රව්‍ය යෙදීම සිදු විය. දින 7-8 කට වරක් තිරය සහ දළු 3 ක් සහිත සක්‍රීය දළු නෙලා ගන්නා ලද අතර අහඹු ලෙස තෝරාගන්නා ලද දළු සියයක, බුබුළු අංගමාර රෝගයේ ප්‍රචණ්ඩත්වය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා සම්මත ක්‍රමය භාවිතයෙන් රෝග තක්සේරුකරණය සිදු කෙරුණි.

**සංඛ්‍යානමය විශ්ලේෂණය:**

ප්‍රතිකාර සහ කට්ටි අතර සංඛ්‍යානමය විචල්‍යතා අධ්‍යයනය සඳහා R මෘදුකාංග 4.2 හි ද්වි- මාර්ග ANOVA භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

**ප්‍රතිඵල: අත්හදා බැලීම 1**

රූපසටහන 3a මගින් අත්හදා බැලීම අතරතුර බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය නිරූපණය කරන අතර 3b මඟින් රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) පෙන්නුම් කරයි. ප්‍රතිකාර අතර බුබුළු අංගමාරය රෝගයේ බරපතලකම සැලකිය යුතු ලෙස වෙනස් කම් ($p<0.05$)පෙන්වන අතර කොපර් හයිඩ්‍රොක්සයිඩ් WG ප්‍රතිකාරය සැලකිය යුතු ලෙස අඩු රෝග තීව්‍රතාවයක් පෙන්නුම් කරයි. සියලුම කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් ප්‍රතිකාර වලදී බුබුළු අංගමාර රෝගයේ බරපතලකම ප්‍රතිකාර නොකළ පාලකයේ රෝග බරපතලකම හා සංසන්දනාත්මක වේ.




රූපසටහන 3. 2020 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා කාලය තුළ ශාන්ත කූම්බ්ස් හි පහළ කොටසේ ක්ෂේත්‍ර අංක 11 හි (3a) බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය (3b) රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) . එකම අකුරක් සහිත තීරු $p \leq 0.05$ හිදී සැලකිය යුතු ලෙස වෙනස් නොවේ.

**අත්හදා බැලීම 2**

ප්‍රතිකාර නොකළ පාලකයට සාපේක්ෂව කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් සහ සම්මත කොපර් හයිඩ්‍රොක්සයිඩ් දිලීර නාශක ($p<0.05$) ප්‍රතිකාර කරන ලද බිම් කොටස්වල රෝග තීව්‍රතාව සහ AUDPC අගයන් සැලකිය යුතු ලෙස අඩු බව නිරීක්ෂණය විය (රූපසටහන 4). AUDPC අගයන්ට අනුව සැලකිය යුතු ලෙස අඩු රෝග තීව්‍රතාවය, සම්මත කොපර් හයිඩ්‍රොක්සයිඩ් ප්‍රතිකාරය මගින් ලබා ගන්නා ලද බිබිලි අංගමාර රෝග පාලනය හා සසඳන කල 0.1% සහ 0.3% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් යෙදුමෙන් වාර්තා වී ඇත (රූපසටහන 4b). ඉහළ රෝග තීව්‍රතාවයක් පෙන්නුම් කරන ප්‍රතිකාර නොකළ පාලකයට සාපේක්ෂව, 0.2% සාන්ද්‍රණයෙන් යොදන ලද කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් ප්‍රතිකාරය රෝගයේ තීව්‍රතාවය සැලකිය යුතු ලෙස අවම කිරීමෙහි දායකත්වයක් ලබා නොදෙන බව නිරීක්ෂණය විය.




රූපසටහන 4. 2021 ජූලි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ ශාන්ත කූම්බ්ස් හි පහළ කොටසේ ක්ෂේත්‍ර අංක 8 හි (4a) බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය (4b) රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC). එකම අකුරක් සහිත තීරු $p \leq 0.05$ හිදී සැලකිය යුතු ලෙස වෙනස් නොවේ.

අත්හදා බැලීම 3







රූපසටහන 5: 2022 මැයි සිට ජූලි දක්වා කාලය තුළ ශාන්ත කුම්බිස් හි පහළ කොටසේ ක්ෂේත්‍ර අංක 8 හි (5a) බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය (5b) රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC). එකම අකුරක් සහිත තීරු $p \leq 0.05$ හිදී සැලකිය යුතු ලෙස වෙනස් නොවේ.

රූපසටහන 5 a සහ 5 b හි ප්‍රතිකාරක අතර බුබුළු අංගමාර තීව්‍රතාවයෙහි සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරන්නා සේම ප්‍රතිකාර නොකළ පාලකය ඉහළම රෝග තීව්‍රතා දර්ශකයන් (DSI) සහ රෝග උන්නති වක්‍ර වර්ගඵලයන් (AUDPC) පෙන්නුම් කරයි. 0.1% කොපර් හයිඩ්‍රොක්සයිඩ් ප්‍රතිකාරකය සමග සංසන්දනාත්මක විශ්ලේෂණයේදී කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් දිලීර නාශක ප්‍රතිකාර අතර, අවම රෝග බරපතලකම 0.3% සාන්ද්‍රණයකින් වාර්තා විය. ප්‍රතිකාර නොකළ පාලකයට සාපේක්ෂව කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 0.05%, 0.1% සහ 0.02% ප්‍රතිකාරකයන් ද සැලකිය යුතු ලෙස අඩු රෝග තීව්‍රතාවයන් පෙන්නුම් කරයි. කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 0.05% සහ 0.1% ඇසුරින් ලත් රෝග තීව්‍රතාව, 0.1% කොපර් හයිඩ්‍රොක්සයිඩ් ප්‍රතිකාරකයට වඩා සැලකිය යුතු ලෙස වැඩිය.

**කප්පාදු කළ ක්ෂේත්‍ර අත්හදා බැලීම**
**පර්යේෂණාත්මක ක්ෂේත්‍රය**
2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ තලවාකැලේ, ශාන්ත කුම්බිස් වත්ත, පහළ කොටසේ අංක 7 ක්ෂේත්‍රයේදී අත්හදා බැලීම සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ පැවති තේ ප්‍රභේදය TRI 2025 වන අතර කප්පාදුවෙන් පසු මූලික අවධිය තුළ ක්ෂේත්‍රය පැවතිණි.

**පර්යේෂණාත්මක සැලැස්ම:**
සසම්භාවිතා පූර්ණ කට්ටි සැලැස්ම (RCBD) භාවිතයට ගැනුණි. පහත සඳහන් පරිදි ප්‍රතිකාරක 3 ක් අත්හදා බලන ලදි.

T1 - 0.3% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට්
T2 - 0.5% කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට්
T3 - ප්‍රතිකාර නොකළ පාලකය

එක් එක් ප්‍රතිකාරකය දෙවරක් ප්‍රතිවලිත කරන ලද අතර පර්යේෂණය සඳහා යොදා ගන්නා ලද සෑම කට්ටියක්ම තේ පඳුරු 20-25 කින් පමණ සමන්විත විය. කාලගුණික තත්ත්වයන් මත පදනම්ව දින 5-7 ක විරාම කාලයක් තබමින් රසායන ද්‍රව්‍ය යෙදීම සිදු විය. දින 10 ක කාලාන්තරයෙන්, කප්පාදු කරන ලද ක්ෂේත්‍ර සඳහා වන "රෝග තක්සේරුකරණ සූචිය" භාවිතයෙන් එක් එක් බිම් කොටසෙහි තනි පඳුරු වල රෝග තීව්‍රතාව තක්සේරු කරන ලදී. රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) ගණනය කිරීම සහ සංඛ්‍යානමය විශ්ලේෂණය ඉහත විස්තර කර ඇති පරිදි සිදු කරන ලදී. එක් එක් බිම් කොටසෙහි මට්ටම්කරණ ස්කන්ධය (දළු ස්කන්ධය සහ අවශේෂ අතු ස්කන්ධය වෙන වෙනම) මට්ටම් කපන අවස්ථාවේදී මනිනු ලැබිණි.

ප්‍රතිඵල :







රූපසටහන 6. 2022 මැයි සිට ජූලි දක්වා කාලය තුළ ශාන්ත කුම්බිස් හි පහළ කොටසේ ක්ෂේත්‍ර අංක 8 හි (6a) බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය (6b) රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC). එකම අකුරක් සහිත තීරු $p \leq 0.05$ හිදී සැලකිය යුතු ලෙස වෙනස් නොවේ.

රූපසටහන 6 මඟින් කප්පාදු කරන ලද ක්ෂේත්‍රයක ඇති බුබුළු අංගමාරයේ රෝග ප්‍රගති වක්‍රය (6a) සහ රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) (6b) පෙන්නුම් කරයි. ප්‍රතිකාර නොකළ පාලකයට සාපේක්ෂව කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 0.3% යෙදීමේදී බුබුළු අංගමාරය රෝගයේ තීව්‍රතාව සැලකිය යුතු ලෙස අඩු විය. කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් සාන්ද්‍රණය 0.5% දක්වා වැඩි කිරීමෙන් රෝගයේ සැලකිය යුතු අඩුවීමක් සිදු නොවීය.

**අවශේෂ පරීක්ෂාව**

ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන සංවිධානය (OECD) මගින් නිකුත් කර ඇති උපදෙස් සහ ක්‍රමවේදයන්ට අනුකූලව තෙත් සෘතු පරිහානීය පරීක්ෂණයක් (2022 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා) තලවාකැලේ ශාන්ත කුම්බිස් වතුයාය කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලදි. මෙහිදී 0.3% සාන්ද්‍රණයෙන් කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට්, ප්‍රතිවලිත(replicate) දෙකක් යොදා ගනිමින් පරීක්ෂා කරන ලදී. දලු නෙලන ක්ෂේත්‍ර ඇසුරින් සිදු කරන ලද අත්හදා බැලීම් දෙකකදී බුබුළු අංගමාර රෝග තීව්‍රතාවයෙහි අඩුවක් පෙන්නුම් කල හෙයින් මෙම සාන්ද්‍රණය තෝරාගනු ලැබිණි. රසායනිකය යෙදීමෙන් පිළිවෙලින් දින 0, 1, 3, 5, 7, 10, 14, 21 ට පසු සාම්පල ලබා ගන්නා ලදී. නියැදි, කුඩා පරිමාණ සැකසුම් (miniature manufacturing) යටතේ සකස් කරන ලදුව කොපර් අවශේෂ විශ්ලේෂණය සඳහා පාංශු හා ශාක පෝෂණ අංශය (SPND) වෙත යොමු කරන ලදි.




රූපසටහන 7. කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් WG 0.3% ඉසින විට අවසාන නිෂ්පාදනයේ Cu අවශේෂ මට්ටම්. රේඛාව මගින් යුරෝපා සංගමය (EU) Cu සඳහා වන උපරිම අවශේෂ සීමාව (MRL) 40 ppm දක්වයි.

**ප්‍රතිඵලඃ** කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් 0.3% සාන්ද්‍රණයෙන් ඉසීමෙන් පසු කුඩා පරිමාණ සැකසුම් (miniature manufacturing) මගින් සැකසූ අවසාන නිෂ්පාදනයේ කොපර් අවශේෂ මට්ටම් රූපසටහන 6 මගින් පෙන්වයි. පර්යේෂණාත්මක කාලපරිච්ඡේදය පුරා (දින 1 - දින 21) කොපර් සල්ෆේට් පෙන්ටාහයිඩ්‍රේට් ප්‍රතිකාර කළ නියැදිවල කොපර් අවශේෂ මට්ටම්, කොපර් සඳහා යුරෝපා සංගමය (EU) විසින් අවසර දී ඇති උපරිම අවශේෂ සීමාව (MRL) 40 ppm ට වඩා අඩු විය.

ජී. ඩී. සින්නයියා, ඩී. ජී. එන්. පී. කරුණාජීව, ආර් පී වී ටී චන්ද්‍රලාල් සහ කේ එල් එස් සී ගුණවර්ධන

**ව්‍යාපෘතිය A 23.5. තේ ශාකයේ වසංගත රෝග පදනම් කරගත් කඳ ආශ්‍රිත රෝග කළමනාකරණ උපාය මාර්ග ඇගයීම සහ හඳුන්වා දීම**
**අශ්ව කෙඳි අංගමාරය රෝග කාරකයට එරෙහිව දිලීර නාශක සහ ජෛව පාලන කාරකය පරීක්ෂා කිරීම**

**රසායනාගාර ජෛව විශ්ලේෂණය**
දින 7 ක වර්ධනයක් සහිත අශ්ව කෙඳි අංගමාර රෝග කාරක *Marasmius equirinus* දිලීර රෝපණ තැටියක සක්‍රියව වැඩෙන මායිමෙන් මිලිමීටර් 5 ක විෂ්කම්භයක් ඇති රෝග කාරක ඒගාර් තැටියක් ලබාගෙන PDA රෝපණ මාධ්‍යය සහිත තැටියක එක් පසෙකට වන්නට තබා ගන්නා ලදි. ද්විත්ව වගා තාක්ෂණය (Dual culture technique) අරමුණු කරමින් දින 7 ක වර්ධනයක් සහිත මිලිමීටර් 5 ක විෂ්කම්භයක් ඇති ට්‍රයිකොඩර්මා (*Trichoderma* Tric 33) ඒගාර් තැටියක් ඉහත PDA තැටියේම අනෙක් පසට වන්නට තබන ලදි. අශ්ව කෙඳි අංගමාර රෝග කාරක *Marasmius equirinus* දිලීරය ආමුකුලනය කරන ලද PDA තැටියක් මෙහිදී පාලකය ලෙස යොදා ගන්නා ලදි. සියළු දිලීර රෝපිත 25°C හි බීජෞෂණය කෙරිණ. එක් එක් ප්‍රතිකාරක සඳහා ප්‍රතිවලිත තුනක් පවත්වා ගෙන යන අතර අත්හදා බැලීම තුන් වතාවක් පුනරාවර්තනය විය. ප්‍රතිරෝධී ක්‍රියාකාරකම් ගණනය කර අරීය වර්ධනයේ ප්‍රතිශත නිෂේධක (PIRG) ලෙස නිරූපණය කරන ලදී. *Trichoderma* Tric 33 මගින් *M equirinus* හි අරීය වර්ධනයෙහි 89.6 ± 1.1 % ක සාමාන්‍ය නිෂේධන ප්‍රතිශතයක් නිරූපණය විය.

**ක්ෂේත්‍ර අත්හදා බැලීම**
අශ්ව කෙඳි අංගමාර රෝග කාරක *Marasmius equirinus* දිලීරයට එරෙහිව ජෛව පාලන කාරක *Trichoderma* විශේෂයක් වන Tric 33 හි කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම සඳහා මූලික ක්ෂේත්‍ර පරීක්ෂණයක් රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ ස්ථාපිත කරන ලදී. ක්ෂුද්‍ර බිම් කොටස් බිම් කැබැල්ලකට පඳුරු 5 බැගින් සලකුණු කර ඇති අතර එක් එක් ප්‍රතිකාර සඳහා අනුරූ බිම් කැබැල්ලක් පවත්වා ගෙන යන ලදී. පඳුරු කප්පාදු කිරීමෙන් පසු පහත සඳහන් ප්‍රතිකාර ලබා දෙන ලදි.

T1 - ප්‍රතිකාර නොකළ පාලකය
T2 - *Trichoderma* ප්‍රතිකාරකය
T3 - සංස්ථානික දිලීර නාශක Tebuconazole ප්‍රතිකාරකය

ප්‍රතිකාරක යෙදීම්වලට පෙර සහ පසු අශ්ව කෙඳි අංගමාර ඇගයුම් සඳහා සම්මත රෝග තක්සේරුකරණ සුචියක් භාවිතයෙන් රෝග තීව්‍රතාව තක්සේරු කරන ලදි. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ ප්‍රතිකාර නොකළ පාලකය සහ සංස්ථානික දිලීර නාශක ප්‍රතිකාරක ලබා දුන් කට්ටි හා සසඳන විට *Trichoderma* Tric 33 ජෛව පළිබෝධනාශක ප්‍රතිකාරක ලබා දුන් කට්ටි අඩු රෝග තීව්‍රතා දර්ශකයක් පෙන්නුම් කරන බවයි (රූපසටහන 8).




රූපසටහන 8. පර්යේෂණාත්මක බිම්කඩ වල අශ්ව කෙඳි අංගමාරයේ රෝග තීව්‍රතා සාමාන්‍යයන්. ඊ හිස් මගින් ප්‍රතිකාරක ලබා දුන් කාලයන් දක්වයි.

**කඳ සහ අතු පිළිකා රෝග කාරකයන්ට එරෙහිව *Trichoderma* Tric 33 ජෛව පළිබෝධනාශක පරීක්ෂා කිරීම**

**රසායනාගාර ජෛව විශ්ලේෂණය**

දින 7 ක වර්ධනයක් සහිත කඳ සහ අතු පිළිකා රෝග කාරක *Lasiodiplodia theobromae* දිලීර රෝපණ තැටියක සක්‍රියව වැඩෙන මායිමෙන් මිලිමීටර් 5 ක විෂ්කම්භයක් ඇති රෝග කාරක ඒගාර් තැටියක් ලබාගෙන PDA රෝපණ මාධ්‍යය සහිත තැටියක එක් පසෙකට වන්නට තබා ගන්නා ලදි. ද්විත්ව වගා තාක්ෂණය (Dual culture technique) අරමුණු කරමින් දින 7 ක වර්ධනයක් සහිත මිලිමීටර් 5 ක විෂ්කම්භයක් ඇති ට්‍රයිකොඩර්මා (*Trichoderma* Tric 33) ඒගාර් තැටියක් ඉහත PDA තැටියේම අනෙක් පසට වන්නට තබන ලදි. කඳ සහ අතු පිළිකා රෝග කාරක *Lasiodiplodia theobromae* දිලීරය ආමුකුලනය කරන ලද PDA තැටියක් මෙහිදී පාලකය ලෙස යොදා ගන්නා ලදි. සියළු දිලීර රෝපිත 25°C හි බීජෞෂණය කෙරිණ. එක් එක් ප්‍රතිකාරක සඳහා ප්‍රතිවලිත තුනක් පවත්වා ගෙන යන අතර අත්හදා බැලීම තුන් වතාවක් පුනරාවර්තනය විය. ප්‍රතිරෝධී ක්‍රියාකාරකම් ගණනය කර අරීය වර්ධනයේ ප්‍රතිශත නිෂේධක (PIRG) ලෙස නිරූපණය කරන ලදී. *Trichoderma* Tric 33 මගින් රෝග කාරකය සම්පූර්ණයෙන් මර්දනය කිරීම නිරීක්ෂණය විය.

*Trichoderma* Tric 33 හි ක්ෂේත්‍ර ඵලදායිතාව තහවුරු කර ගැනීම සඳහා කඳ පිළිකා රෝගය පාලනය කිරීමේ පර්යේෂණ ගාල්ල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත.

ජී. ඩී. සින්නයියා, ඩී. ජී. එන්. පී. කරුණාජීව, ආර් පී වී ටී චන්ද්‍රලාල් සහ කේ එල් එස් සී ගුණවර්ධන

**ව්‍යාපෘතිය B 132: තේ ගස් ගුල්ලා (Shot-hole Borer (*Xyleborus fornicatus Eichh.*)) කුරුම්ණි විශේෂය හා සම්බන්ධ *Fusarium ambrosium* දිලීර වර්ධනය පාලනයට එන්ඩොෆිටික් දිලීර යොදාගැනීම පිළිබඳ අධ්‍යයනය හා විභව එන්ඩොෆිටික් දිලීර ජෛව පාලක කාරකයක් ලෙස හෝ රසායනික සලකුණු ලෙස ස්ථාපිත කිරීම (2019)**

*F. ambrosium* දිලීර වර්ධනයට එරෙහිව එන්ඩොෆිටික් දිලීර තුනක් තේ ප්‍රභේද තුනකින් හඳුනා ගන්නා ලදී. දිලීර හඳුනා ගැනීම සඳහා DNA නිස්සාරණය කර ජාන අනුක්‍රමණය සඳහා සාම්පල සකස් කරන ලදී.

කේ ජී එන් පී පියසේන සහ එන් සී වීරකෝන්, ශාක ව්‍යාධිවේදී අංශය සමඟ සහයෝගී අධ්‍යයනයකි

**ව්‍යාපෘතිය A 23.7 තේ රෝග කළමනාකරණය සඳහා ශාක ආරක්ෂණ නිෂ්පාදන ලෙස ශාක නිරාවරක (Elicitors) ඇගයීම**

ආරක්ෂක ශාක නිරාවරක (Defence Elicitors) මගින් සක්‍රීය කරන ලද ශාකයක පවත්නා ආරක්ෂක යාන්ත්‍රණයන් ඇගයීම සඳහා තෝරාගත් නිෂ්පාදන වන සැලිසිලික් අම්ලය, සිලිසික් අම්ලය යනාදිය ක්ෂුද්‍ර බිම් කොටස් සඳහා යොදනු ලැබේ. නෙලාගන්නා ලද කොළ පැහැති පත්‍ර අස්වැන්න ශීත

වියළනයට භාජනය කරන ලදී. ආරක්ෂක යාන්ත්‍රණය හා සම්බන්ධ සංයෝග පිළිබඳ විශ්ලේෂණයන් සිදු කෙරෙමින් පවතී.

ජී ඩී සින්නයියා, ඩී ජී එන් පී කරුණාජීව සහ ජෛව රසායන අංශය

**ප්‍රධාන ව්‍යාපෘතිය A 32. කාබනික තේ වගාව සහ අඩු යෙදවුම් තේ වගා පද්ධතිවල තිරසාර බව අධ්‍යනය කිරීම.**

**ව්‍යාපෘතිය A32.3 තේ සඳහා තිරසාර, කාබනික සහ අඩු යෙදවුම් කෘෂිකාර්මික පද්ධති ඇගයීම**

කාබනික සහ අඩු යෙදවුම් තේ වගාව යටතේ පාංශු සහ බෝග ඵලදායීතාව සහ ස්වාභාවික ජීව විද්‍යාත්මක පාලන යාන්ත්‍රණ මට්ටම සහ පළිබෝධ, රෝග සහ වල් පැළෑටිවල පැවැත්ම පිළිබඳ නව තොරතුරු උත්පාදනය කිරීම.

**ස්ථානය:** තේ පර්යේෂණ ආයතනය,තලවකැලේ.

**අරමුණ:** තිරසාර කාබනික සහ අඩු යෙදවුම් කෘෂිකාර්මික ක්‍රම යටතේ පළිබෝධ, රෝග සහ වල් කළමනාකරණය ඇගයීම ජීව විද්‍යාත්මක හා ස්වාභාවික පළිබෝධ සඳහා විද්‍යාත්මක වලංගුකරණය රෝග සහ වල් පාලන පිළිවෙත් පරිශීලක හිතකාමී තිරසාර ජීව විද්‍යාත්මක හා ස්වාභාවික පළිබෝධ රෝග සහ වල් පාලන ක්‍රම සංවර්ධනය

සමාලෝචනය සිදු කරන ලද කාල සීමාව තුළ, වලංගු කිරීමේ අරමුණින් තලවකැලේ සිදු කළ TRIORCON සහ BIDORCON හි දිගුකාලීන අත්හදා බැලීම්වල දී පස සහ බෝග ඵලදායීතාව, ස්වාභාවික ජීව විද්‍යාත්මක පාලන යාන්තණ මට්ටම, කාබනික සහ අඩු යෙදවුම් තේ වගා ක්‍රම යටතේ පළිබෝධ, රෝග සහ වල් පැළෑටි පිළිබඳ දත්ත අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. TRIORCON සහ BIDORCON අත්හදා බැලීම්වල ක්ෂේත්‍ර මෙහෙයුම් සහ අස්වැන්න සහ පළිබෝධ සහ රෝග ශ්‍රේණිගත කිරීම් මෙම කාල සීමාව තුළ නිරීක්ෂණය කරන ලදි.

නයිට්‍රජන් සඳහා ප්‍රතිචාරය තක්සේරු කිරීම සඳහා ප්‍රභේද 7 කින් (TRI 5002, TRI 5003, TRI 4052, TRI 4071, TRI 3073, TRI 2043, DT1, KEN 16/3) තවාන් පැළ 3 බැගින් හඳුන්වා දෙන ලදි.

වසරක නිරාවරණයෙන් පසු පැළ ගලවා, වර්ධක පරාමිතීන්; කඳෙහි නැවුම් බර, කඳෙහි වියලි බර, මුලෙහි නැවුම් බර, මුලෙහි වියලි බර සහ මුලෙහි ගැඹුර නිර්ණය කරන ලදි (රූපසටහන 5). පත්‍රවල නයිට්‍රජන් විශ්ලේෂණය සිදු කරමින් පවතී.






Mean Root Fresh Weight (g)












රූපසටහන 9. ප්‍රතිකාර කිරීමෙන් මාස හයකට පසු තේ පැළවල වර්ධක පරාමිතීන්

ප්‍රතිකාර ක්‍රමය අනුව, කඳෙහි නැවුම් බර, කඳෙහි වියලි බර, මුලෙහි නැවුම් බර, මුලෙහි වියලි බර සහ මුලෙහි ගැඹුර යන පරිමාණවල සැලකිය යුතු වෙනස්කම් පවතින බව 9 වන රූප සටහනෙන් දැක්වේ. පත්‍රවල නයිට්‍රජන් විශ්ලේෂණය සිදු කරමින් පවතින අතර, ප්‍රතිඵල නිමා කිරීම සඳහා එම දත්ත සහසම්බන්ධ කළ යුතුය.

**කුඩා තේවතු හිමියන්ගේ ඉඩම්වල නයිට්‍රජන් ප්‍රමාණයේ සංසන්දනාත්මක අධ්‍යයනය සහ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිය** *(N Tea Project)* **යටතේ TRIORCON ක්ෂේත්‍ර පරීක්ෂණය**

ස්විට්සර්ලන්තයේ ETH Zurich හි, සවිස්තරාත්මක ගැඹුරු අධ්‍යයනයන් සඳහා පාංශු නියැදීම අඛණ්ඩව සිදු කරන ලදි. පාංශු පැතිකඩ වලවල් සහ සත්‍ය ඝණත්ව අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කරන ලදි. ශාකවල නයිට්‍රජන් සංචිත ප්‍රමාණනය සඳහා ක්ෂේත්‍ර තෝරා ගැනීම, ශාක සමීක්ෂණය, තේ සහ සෙවණ ශාකවල ජෛව ස්කන්ධ ඇස්තමේන්තුගත කිරීම සිදු කරමින් පවතී; ඌව සහ උඩරට ප්‍රදේශයේ භූමි කොටස් 22ක ක්ෂේත්‍ර තෝරා ගැනීම් අවසන් කර ඇති අතර, ශාක සමීක්ෂණය සහ මායිම් සිතියම් සහ උන්නතාංශ සිතියම් පිළියෙළ කිරීම් අවසන්ව ඇත. නයිට්‍රජන් විශ්ලේෂණය සඳහා TRIORCON ක්ෂේත්‍ර පරීක්ෂණයේ තේ පඳුරු උදුරා දැමීම සහ කොටස් කිරීම සම්පූර්ණ කර ඇති අතර භූමි කොටස් 22න් 5ක් අවසන් කර ඇත.

කේ මොහොට්ටි, පී පී ඩී එස් අමරසේන, බී ජනනි, ජී කේ ඩබ්ලිව්. එච් ධර්මදාස,
සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**තේ වගා භූමිවල *Erigeron sumatrensis* සහ *Panicum repens* පාලනය සඳහා ස්පර්ශීය සහ සංස්ථානික වල්නාශක සමග *Artemisia vulgaris* හි පත්‍ර නිස්සාරකවල සංසන්දනාත්මක ඇගයීම**

*Artemisia vulgaris* (මරිකොලොන්ද) හි ජලීය පත්‍ර සාරවල වල් පැළෑටි මර්දන හැකියාව එහි කාර්යක්ෂමතාව පිළිබඳ මූලික පර්යේෂණයන් තුළින් තහවුරු කර ඇත. *Artemisia vulgaris* ජලීය පත්‍ර සාරවල 50, 100, 150, 300 g/l මාත්‍රාවන්, කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය වන, ග්ලයිෆොසේට් (Glyphosate), ග්ලූෆොසිනේට් ඇමෝනියම් (Glufosinate ammonium), ඔක්සිෆ්ලුරන් (Oxyfluorofen), ඩයියුරෝන් (Diuron), ට්‍රයිසල්ෆියුරෝන් (Triasulfuron), MCPA සහ පෙලගොනික් අම්ලය (Pelargonic acid), යුකැලිප්ටෝල් (Eucalyptol) සහ පයින් තෙල් (Pine oil), ප්‍රතිකාර නොකළ පාලකය සමඟ ඇගයීම මෙහිදී සිදු කර ඇත. *Erigeron sumatrensis* (Alavangu pillu) සහ *Panicum repens* (Couch grass) පාලනය සඳහා ජෛව කාර්යක්ෂමතා අත්හදා බැලීම් මාලාවක් වීදුරු ගෘහයක පාලිත තත්ත්ව යටතේ හා කප්පාදු කරන ලද තේ වගාවක දී සිදු කරන ලදි. පරීක්ෂා කරන ලද වල් නාශකවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා වල් පැළෑටි මුල් පිළිබඳ පැරණි මූලශ්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදි. වල් පැළෑටි මත *A. vulgaris* හි ඉලක්කගත නොවන බලපෑම ද මෙහි දී අධ්‍යයනය කරන ලදි. පාලක පරීක්ෂණයේ හැර අනෙක් සියලුම ප්‍රතිකාරක වල *E. sumatrensis* ගේ පාලනය වාර්තා විය. වගා මාධ්‍ය යොදා සිදුකළ අධ්‍යයනයක දී, *E. sumatrensis* ට යුකැලිප්ටෝල් යෙදීමෙන් දින 8කට පසුත්, ට්‍රයිසල්ෆියුරෝන් (Triasulfuron) සහ MCPA යෙදීමෙන් දින 24කට 100%ක පාලනයක් වාර්තා විය. *Artemisia* 150g / l ප්‍රතිකාරකය යෙදීමෙන් දින 16කට පාලනයක් පසු පෙන්විය. *E. sumatrensis* ට එරෙහිව යුකැලිප්ටෝල්වලට වැඩි ජෛව කාර්යක්ෂමතාවයක් තිබුනි. කෙසේවෙතත්, *Artemisia* යෙදීමෙන් දින 60කට පසු තණකොළ නැවත මතුවීම නිරීක්ෂණය වූ අතර ග්ලයිෆොසේට් (Glyphosate) යෙදීම මගින් එවැනි නැවත මතුවීම වාර්තා නොවීය. *Artemisia*හි පද්ධතිමය ක්‍රියාකාරීත්වය මුල පටකමය වෙනස්කම්, මැරුණු/දුර්වර්ණ වූ සෛල සහ තේ රිකිලි මැලවීම මගින් ඔප්පු කරන ලදි. *A. vulgaris*හි ජලීය පත්‍ර සාරය, වල් නාශක සඳහා විකල්ප ලෙස සලකා බැලිය හැක. එළදායී ජීවීන් සහ තේ කෙරෙහි, ඇති ඉලක්ක නොවන බලපෑම් ඇගයීම සහ කාර්යක්ෂමතාව හා යෙදුම් ක්‍රම සඳහා වැඩිදුර අත්හදා බැලීම් යෝජනා කර ඇත.

කීර්ති මොහොට්ටි, පී ජී ඩී එස් අමරසේන සහ බී ජනනි

## ප්‍රධාන ව්‍යාපෘතිය A 45. වටපණු ආසාදනය අවම කිරීමේ උපාය මාර්ග සැකසීම

**ව්‍යාපෘතිය A 45.1. තේ ශාක ප්‍රචාරණයේදී සහ පාංශු ධූමකරණයේ දී, ආරක්ෂිත තේ තවාන් පාලන මූලධර්ම මගින් වටපණු ආසාදනය අවම කිරීම සහ රෝපණ ද්‍රව්‍ය මගින් සිදුවන වටපණු ව්‍යාප්තිය අවම කිරීමට විකල්ප හඳුන්වා දීම.**

**පර්යේෂණය N 470: පැළ සිටුවීමේ දී සහ පසු කප්පාදු අවධියේ දී රෝග නිවාරණය සඳහා විකල්ප වටපණුනාශකයක් ලෙස ෆ්ලුඑන්සල්ෆෝන් (නිමිට්ස්) භාවිතය පරීක්‍ෂා කිරීම.**

**ස්ථානය :** වටපණු ව්‍යාධිවේදී පර්යේෂණාගාරය,තේ පර්යේෂණ ආයතනය,තලවකැලේ.

**අරමුණු :** මේරූ සහ නොමේරූ තේ වගාවන් හි වටපණුවන් කළමණාකරණය කිරීම සඳහා රෝග නිවාරණ ක්‍රම ඇගයීම.

**ප්‍රතිඵල සහ නිගමනය :**
නිමිට්ස් (Nimitz) (ෆ්ලුඑන්සල්ෆෝන් 20 g/kg GR), නව වටපණු නාශකය විකල්ප වටපණු නාශකයක් ලෙස පරීක්‍ෂා කරන ලදි. නිමිට්ස් (ෆ්ලුඑන්සල්ෆෝන් 20 g /kg GR) තෝරාගත් මාත්‍රාවන් එක් පැළයකට 3 g, 5 g සහ 7 g ලෙස ගෙන ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහණය සඳහා, ප්‍රතිකාර නොකළ පාලකයට එරෙහි ව විද්‍යාගාර ජෛව විශ්ලේෂණ සහ බීජෞෂණ අත්හදා බැලීම් මගින් ජෛව කාර්යක්‍ෂමතාව පරීක්‍ෂා කරන ලදි. මූලික අධ්‍යයනවලට අනුව, නිමිට්ස් (ෆ්ලුඑන්සල්ෆෝන් 20 g /kg GR) එක් පැළයක් සඳහා 7 g, පසෙහි පරපෝෂී වටපණු ගහණය පාලනය සඳහා කාර්යක්‍ෂම ලෙස ක්‍රියා කරන ලදි.

ප්‍රතිකාර 4ක් යටතේ ක්ෂුද්‍ර බිම් පරීක්‍ෂණ සිදු කරන ලද අතර නිමිට්ස් එක් පැළයක් සඳහා 7 g ක්, වෙලම් (නිර්දේශිත වටපණුනාශකය) හෙක්ටයාරයකට 800 g ක අනුපාතයකිනුත්, ජෛව ධූමකාරකය සහ ප්‍රතිකාර නොකළ පාලිතය යොදා ප්‍රතිකාර නොකළ පාලිතයට එරෙහි ව සිදු කළ පරීක්‍ෂණ මගින් නිමිට්ස් එක් පැළයක් සඳහා 7 g ක පදනම පසෙහි පරපෝෂී වටපණු ගහණය පාලනය සඳහා කාර්යක්‍ෂම බව තහවුරු කරන ලදි (රූපසටහන 10).




රූපසටහන 10. ප්‍රතිකාර කිරීමෙන් මාස හයකට පසු පස් 100 gක අඩංගු පාංශු ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහන මධ්‍යයනය




රූපසටහන 11. ප්‍රතිකාර කිරීමෙන් මාස හයකට පසු තේ මුල ආක්‍රමණය කළ ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහණ මධ්‍යයනය

පරීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, නිමිට්ස් එක් පැළයක් සඳහා 7 g ක අනුපාතය, ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහණය මගින් ශාක මූල ආක්‍රමණය සැලකිය යුතු ලෙස අඩු වූ බව පෙන්නුම් කරන ලදි (රූපසටහන 11) .

විවිධ කලාප සඳහා තවදුරටත් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට නියමිතය.

## ව්‍යාපෘතිය A 45.2. මේරූ සහ නොමේරූ තේ වගාවන්හි වටපණු ආසාදනය පාලනය කිරීම.

### කුඩා තේ වතු සහ පුනර්ජීවන ව්‍යාපෘතිය

### 1. නැවත වගා කිරීම සඳහා පාංශු ගුණාත්මක දර්ශක (SQI) පරීක්ෂාව සඳහා යෝජිත ඉඩම්වල වටපණු ආක්‍රමණ තක්සේරු කිරීම

පාංශු ගුණාත්මක දර්ශක (SQI) පරීක්ෂාව සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම සඳහා යෝජිත රත්නපුර, මාතර, ගාල්ල, මහනුවර දිස්ත්‍රික්කවල කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් වලින් මුල් සහ පාංශු නියැදි එකතු කරනා ලදි. වටපණු ඇස්තමේන්තු කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ වටපණු ව්‍යාධිවේදී අංශයේ සාමාජික කණ්ඩායම් සහභාගී විය.

මෙම කාල පරාසය තුල කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් 120ක නියැදි ලබාගෙන සුදුසු නිර්දේශ ලබා දෙන ලදි. රත්නපුර, ගාල්ල, මාතර, සහ මහනුවර දිස්ත්‍රික්කවල පහත සඳහන් පරීක්ෂක කොට්ඨාශ ආවරණය කර ඇත.

### 2. පාංශු පුනරුත්ථාපන කටයුතු සඳහා විකල්ප තෘණ විශේෂ පරීක්ෂා කිරීම

පාංශු පුනරුත්ථාපන කටයුතු සඳහා තෘණ විශේෂ (මානා, CO3, ගෝතමාලා, පැචොන්, ලොමේන්ඩ්‍රා) බඳුන්ගත පරීක්ෂණ සිදුකරන ලදි.
ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා තෘණ විශේෂ පරීක්ෂා කිරීම් සම්පූර්ණ කරන ලදි. ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා පරීක්ෂා කිරීම් තලවකැලේ සහ හන්තානේ දී පිළිවෙලින් සිදුකරන ලදි. ප්‍රතිඵලවලට අනුව, ඉහත තෘණ විශේෂ කිසිවක් ප්‍රැටිලෙන්චස් ලූසයි සහ රැඩපොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා ධාරක ශාකයන් නොවන බව හෙළිදරව් විය. වටපණු දත්ත සහ වර්ධන පරාමිතීන් විශ්ලෙෂණයේ දී දත්ත සැලකිය යුතු ලෙස වෙනස් විය.




රූපසටහන 12. මුලෙහි ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහනය

රූපසටහන 12 හි දැක්වෙන පරිදි පරීක්ෂා කරන තෘණ විශේෂ, ප්‍රැටිලෙන්චස් ලූසයි පරපෝෂී වටපණු විශේෂය සඳහා ධාරක ශාක නොවේ.




රූපසටහන 13. මුලෙහි රැඩපොලස් සිමිලිස් වටපණු ගහනය
එකම අකුරකින් දක්වා ඇති අගයන් $p = 0.05$ ට සාපේක්ෂව වෙසෙසි ලෙස වෙනස් නොවේ.

රූපසටහන 13 හි දැක්වෙන පරිදි මානා, CO3, පැචොන්, සහ ලොමේන්ඩ්‍රා පරීක්ෂා කරන තෘණ විශේෂ, රැඩපොලස් සිමිලිස් පරපෝෂී වටපණු විශේෂය සඳහා ධාරක ශාක නොවන බව තහවුරු වේ.

පී ජී ඩී එස් අමරසේන, යූ බී හේරත්, බී එම් ජී කේ ගොඩවිට, බී ජනනි,
ජී කේ ඩබ්ලිව් එච් ධර්මදාස සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**ප්‍රධාන ව්‍යාපෘතිය A 54. පහතරට සජීව දැව වේයා පාලනය කිරීමට ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම පරීක්ෂා කිරීම**

**ව්‍යාපෘතිය A 54.2. පහතරට තේ වගාවේ සජීවී දැව වේයා පාලනය කිරීමට සහ කඳ දිරා යාම වලක්වා ගැනීමට දැව ආලේපනයක් හඳුනා ගැනීම**

මූලික අත්හදා බැලීමේ ප්‍රතිඵල මත පදනම්ව, දැව ආලේපනයක් ලෙස Skim coat (ස්කිම් කෝට්)හි සඵලතාවය ඇගයීම සඳහා පරීක්ෂණයක් ආරම්භ කරන ලදී.

**පර්යේෂණය LE 151. පහතරට සජීවී දැව වේයා සහ කඳ දිරා යාම වලක්වා ගැනීමට දැව ආලේපනයක් පරිකෂා කිරීම**

අරමුණ : ඵලදායී දැව ආලේපනයක් සොයා ගැනීම
පර්යේෂණ ස්ථානය : ක්ෂේත්‍ර අංක 01, පහතරට තේ පර්යේෂණ ආයතනය, රත්නපුර
තේ ප්‍රභේදය : TRI 4042
පර්යේෂණ සැලසුම : RCBD සැලසුම
ප්‍රතිකාරක

T1: ස්කිම් කෝට්
T2: බෲනෝලියම් 15%
T3: පාලිත ප්‍රතිකාරකය

ඉහත ප්‍රතිකාර කප්පාදු පෘෂ්ඨ මත ආලේප කරන ලදී. සජීවී දැව වේයාගේ ආසාදනය මීළඟ කප්පාදු කාලයේදී තක්සේරු කෙරේ.

බී එස් විතාන, ඒ එම් පී සම්මානි සහ පී ඩී සේනානායක

**ව්‍යාපෘතිය B 29. ප්‍රතිරෝධී ප්‍රභේද පර්යේෂණාගාරය තුළ දී නිර්ණය කර ගැනීමට පර්යේෂණ දියත් කිරීම**

**පර්යේෂණය E 421: තේ කඳ ගුල්ලාට එරෙහිව බීජ තේ ප්‍රභේදයන් පරික්ෂා කිරීම**

**අරමුණ:** තේ කඳ ගුල්ලාට එදිරිව සංවෘත පරිසරයක් තුල තේ ප්‍රභේද වල ප්‍රතිරෝධී/ග්‍රාහී භාවය ඇගයුම් කිරීම

කීට විද්‍යා සහ වටපණුවේදී අංශය, තේ පර්යේෂණායතනය, තලවාකැලේ

තේ කඳ ගුල්ලාට එදිරිව ප්‍රතිරෝධී/ග්‍රාහී බීජ තේ ප්‍රභේද ඇගයීම සඳහා ග්ලෙනනෝර් වතුයායෙන් තෝරා ගත් නව ප්‍රභේදවල පැළ වගා ගෘහය තුළ පවත්වා ගෙන යනු ලබේ. පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

ඒ එම් පී සම්මානි, එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල සහ පී ඩී සේනානායක

**පර්යේෂණය LE 145: තේ කඳ ගුල්ලාට එරෙහිව නව තේ ප්‍රභේදයන් පරික්ෂා කිරීම**

**අරමුණ:** තේ කඳ ගුල්ලාට එදිරිව නව තේ ප්‍රභේදවල ප්‍රතිරෝධී/ග්‍රාහී භාවය ඇගයුම් කිරීම

**පර්යේෂණ ස්ථානය:** ක්ෂේත්‍ර අංක 03, තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, දෙනියාය

**පර්යේෂණ සැලසුම:** අනුරූ 10 කින් සමන්විත සම්පූර්ණ අහඹු සැකසුම (CRD)

තේ කඳ ගුල්ලාගේ හානියට එරෙහිව නව තේ ප්‍රභේද වල ප්‍රතිරෝධී/ග්‍රාහී භාවය ඇගයුම් කිරීම සඳහා තේ කඳ ගුල්ලාගේ ස්වභාවික ආසාදනය යටතේ ජම්බෝ තේ පැළ තේ කඳ ගුල්ලාට ග්‍රාහී ප්‍රභේදයක් වන TRI 2026 වගාව අතර පවත්වා ගෙන යනු ලබේ. පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

බී එස් විතාන, ඒ එම් පී සම්මානි සහ ආචාර්ය පී ඩී සේනානායක

**ව්‍යාපෘතිය B 69. කෘමි, වටපණු සහ මයිටාවන්ගේ හානිය අඩු කිරීම සඳහා සංඥා රසායන (Semiochemicals) හඳුනා ගැනීම සහ භාවිතය**

**පර්යේෂණය E 422. තේ කඳ ගුල්ලා සඳහා ඇල්පා-පයිනින් (Alpha pinene) රසායනිකය භාවිතයෙන් ආඝ්‍රානමාන (Olfactometer) පරීක්ෂණය**

**අරමුණ:** ඇල්පා-පයිනින් සඳහා තේ කඳ ගුල්ලාගේ ප්‍රතිචාරය නිර්ණය කිරීම
**පර්යේෂණ ස්ථානය:** කීට විද්‍යා හා වටපණුවේදී අංශය, තේ පර්යේෂණායතනය, තලවකැලේ
**පර්යේෂණ සැලසුම:** අනුරූ 04 කින් සමන්විත සම්පූර්ණ අහඹු සැකසුම (CRD)

**ප්‍රතිකාරක:**
T: ඇල්පා-පයිනින් (Alpha pinene හි විවිධ මාත්‍රාවන් 20 µl, 30µl, 40µl, 50µl)
C: පාලිත ප්‍රතිකාරකය

පාලිත ප්‍රතිකාරකය සමග ඇල්පා-පයිනින් සඳහා තේ කඳ ගුල්ලාගේ ප්‍රතිචාරය ඇගයීම සඳහා බාහු 4 කින් යුත් ආඝ්‍රානමානය භාවිතයෙන් ජෛව විශ්ලේෂණය සිදු කරන ලදී. ඉහත සඳහන් කළ ඇල්පා-පයිනින් හි විවිධ මාත්‍රා පරීක්ෂා කරන ලදී. සුහුඹුල් ගැහැණු කුරුමිණියන් (වරකට 10 බැගින්) හඳුන්වා දෙන ලදී. නිරීක්ෂණ විනාඩි 20 ක පරතරයකින් සටහන් කර ගන්නා ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**
ආඝ්‍රානමාන පරීක්ෂණයේ හි ප්‍රතිඵල 1 හි වගුවේ දක්වා ඇත. පාලිත ප්‍රතිකාරකය හා සසඳන විට ප්‍රතිකාරක අතර සැලකිය යුතු වෙනසක් දක්නට ලැබිනි (P අගය <0.05). ඇල්පා-පයිනින් සඳහා තේ කඳ ගුල්ලාගේ ඉහළ ප්‍රතිචාරය ඇල්පා-පයිනින් 20 µl මාත්‍රාවෙන් පෙන්නුම් කරන ලද අතර එය අනෙකුත් මාත්‍රා වලින් සැලකිය යුතු ලෙස වෙනස් නොවූ නමුත් එහි පාලිත ප්‍රතිකාරකයෙන් සැලකිය යුතු ලෙස වෙනස් විය.

වගුව 1. ආඝ්‍රානමාන පරීක්ෂණයේදී තේ කඳ ගුල්ලාගේ ප්‍රතිචාරය (ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිකාරකය | තේ කඳ ගුල්ලාගේ ප්‍රතිචාරය (ප්‍රතිශතයක් ලෙස) (විනාඩි 20 කින් පසුව) | | ප්‍රතිචාර නොදැක්වීම (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|
| | Alpha pinene | Control | |
| T1 (20 µl) | $60^{a}$ | $27.5^{c}$ | 12.5 |
| T2 (30 µl) | $50^{ab}$ | $37.5^{bc}$ | 12.5 |
| T3 (40 µl) | $42.5^{abc}$ | $27.5^{c}$ | 30.0 |
| T4 (50 µl) | $55^{ab}$ | $37.5^{bc}$ | 7.5 |

(එකම අකුරකින් දක්වා ඇති අගයන් p = 0.05 ට සාපේක්ෂව වෙසෙසි ලෙස වෙනස් නොවේ)

එම් කේ ඩී දමයන්ති, එන් ඒ අයි එම් නිස්සංක, ඒ එම් පී සම්මානි සහ පී ඩී සේනානායක

**පර්යේෂණය E 423. පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී සහ ග්‍රාහී තේ ප්‍රභේදවල කඳෙහි අඩංගු වන ද්විතියික පරිවෘත්තීය ද්‍රව්‍ය නිස්සාරණය සහ ප්‍රමාණ කිරීම**
**අරමුණ:** විවිධ තේ ප්‍රභේදවල කඳෙහි අඩංගු වන ද්විතියික පරිවෘත්තීය ද්‍රව්‍ය නිර්ණය කිරීම
**පර්යේෂණ ස්ථානය:** ශාන්ත ජෝකීම් වතුයාය, පහතරට තේ පර්යේෂණ ආයතනය, රත්නපුර
පහතරට සජීවී දැව වේයාට එරෙහිව ප්‍රතිරෝධී සහ ග්‍රාහී තේ ප්‍රභේදවල කැටචින්, පොලිෆීනෝල් සහ කැෆේන් නිස්සාරණය කිරීම සඳහා තේ ප්‍රභේද ශාක අභිජනන අංශය මගින් පවත්වා ගෙන යනු ලබයි. ද්විතියික පරිවෘත්තීය ද්‍රව්‍ය නිස්සාරණය කිරීම සඳහා තේ කඳන් සුදුසු විෂ්කම්භයක් දක්වා වර්ධනය වන තෙක් නඩත්තු කරගෙන යනු ලැබේ.

බී එස් විතාන, ඒ එම් පී සම්මානි, එන් ඒ අයි එම් නිස්සංක සහ පී ඩී සේනානායක
(ජෛව රසායන විද්‍යා අංශය සමග සහයෝගිතා ව්‍යාපෘතිය)

**ව්‍යාපෘතිය B 100. තේ ප්‍රභේදවල ව්‍යුහාත්මක හා කායික විද්‍යාත්මක තත්ත්ව තේ පළිබෝධකයන් වන තේ කඳ ගුල්ලා, පහතරට සජීවී දැව වේයා සහ වටපණුවන්ට එරෙහිව ස්ථාපනය කිරීම**
**අරමුණ:** ශාක ප්‍රභාසංස්ලේෂණය මත තේ කඳ ගුල්ලාගේ හානියේ බලපෑම නිර්ණය කිරීම
**පර්යේෂණ ස්ථානය:** කීට විද්‍යා හා වටපණුවේදී අංශය, තේ පර්යේෂණායතනය, තලවාකැලේ

පැරාමිති ලබා ගැනීම සඳහා TRI 2025 තේ ප්‍රභේදයේ පැළ නිසි වර්ධන මට්ටමට පැමිණෙන තෙක් වගා ගෘහය තුළ පවත්වා ගෙන යනු ලබයි. අත්හදා බැලීම දිගටම කරගෙන යයි.

ඒ එම් පී සම්මානි, එන් ඒ අයි එම් නිස්සංක, පී ඒ ඩී එස් සුමතිපාල සහ පී ඩී සේනානායක
(ශාක කායික විද්‍යාත්මක අංශය සමග සහයෝගිතා ව්‍යාපෘතිය)

**ව්‍යාපෘතිය B 133. තේ පළිබෝධකයන් පාලනය සඳහා නැනෝ පළිබෝධනාශක වැඩි දියුණු කිරීම**
(I) තේ පර්යේෂණායතනයේ පරීක්ෂණ සඳහා SLINTEC ආයතනය විසින් නැනෝ Hexaconazole සහ *Beauvaria bassiana* (micro encapsulated) වැඩි දියුණු කර නිපදවන ලදී.

(II) තේ කඳ ගුල්ලාට එරෙහිව *Beauvaria bassiana* (micro encapsulated) හි ජෛව කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ආරම්භ කරන ලද රසායනාගාර ජෛව විශ්ලේෂණය සම්පූර්ණ කරන ලදී.

(III) දිලීර වර්ධනයට බාධා කරන නැනෝ Hexaconazole හි ජෛව කාර්යක්ෂමතාවයේ අවම සාන්ද්‍රණය සොයා ගැනීම සඳහා තේ කඳ ගුල්ලා *Fusarium ambrosium* දිලීරය සමග පවතින සහජීවනයට එරෙහිව නැනෝ හෙක්සකොනසෝල් හි සාන්ද්‍රණ 4ක් (1%, 2%, 4% සහ 8%) පාලිත ප්‍රතිකාරකය සමග පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී. රසායනිකය මගින් දිලීරයේ මයිසීලියා (mycelia) වර්ධනය නිෂේධනය කිරීමේ ප්‍රතිශතය ගණනය කිරීම සඳහා *Fusarium ambrosium* දිලීරයේ වර්ධන විෂ්කම්භය දිලීර නාශකය පවතින විට (විවිධ සාන්ද්‍රණවල දී) සහ පාලිත ප්‍රතිකාරකය සමග දින 4 ක පරතරයකින් මනිනු ලැබේ. පරීක්ෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

පී ඩී සේනානායක, එන් ඒ අයි එම් නිස්සංක සහ එස් පී ආර් විජේවර්ධන
(SLINTEC ආයතනය සමඟ සහයෝගිතා ව්‍යාපෘතිය)

**ව්‍යාපෘතිය B 134. බුබුළු අංගමාරය රෝග කළමනාකරණය සඳහා දුරස්ථ සංවේදන ක්‍රම (remote sensing techniques) සංවර්ධනය කිරීම, වලංගුගත කිරීම සහ භාවිතය**

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ක්ෂේත්‍ර තත්ත්ව යටතේ බුබුළු අංගමාර රෝගය හඳුනා ගැනීම සහ ප්‍රමාණනය කිරීම සඳහා සුදුසු දුරස්ථ සංවේදක ක්‍රමවේදයක් හඳුනා ගැනීම යි. ශාක පත්‍රයේ සිට ස්මාට් ජංගම දුරකතනය දක්වා ස්ථාවර දුරින් ගසට සම්බන්ධව විවිධ ස්වභාවික ආලෝක තත්ව ග්‍රහණය කර ලබා ගන්නා ලද ඡායාරූප ඇසුරින් බුබුළු අංගමාර රෝග තක්සේරුකරණය සඳහා ප්‍රමාණාත්මක ප්‍රවේශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යයනය සැලසුම් කර ඇත. RGB මත පදනම් වූ වර්ණ දර්ශක ගණනය කිරීම සඳහා රූප සාමාන්‍යකරණය කිරීමෙන් පසුව රතු, කොළ සහ නිල් (RGB) වර්ණ නාලිකා උපුටන ලදී. බිබිලි අංගමාරය රෝගයේ තීව්‍රතා අවධීන් සමඟ වඩාත් සුදුසු වර්ණ දර්ශකය හඳුනා ගැනීම සඳහා දත්ත විශ්ලේෂණය කෙරිණ. ප්‍රතිඵලවලට අනුව, H/H¬S¬V (HSV= Hue" Saturation" Value) හි රූප-ව්‍යුත්පන්න සාමාන්‍යය බුබුළු අංගමාර රෝග තීව්‍රතා අවධීන් සමඟ ශක්තිමත් රේඛීය සම්බන්ධතාවක් (R2 = 86 %) පෙන්නුම් කරයි.

ජී ඩී සින්නයියා, ඩී ජී එන් පී කරුණාජීව සහ
කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**ව්‍යාපෘතිය B 146. තේ වගාවේ ප්‍රධාන රෝග සහ කෘමි පලිබෝධකයන් පාලනය කිරීම සඳහා ජෛව පලිබෝධනාශක සංවර්ධනය හා යෙදවීම**

කෘත්‍රිම පලිබෝධනාශක අධික ලෙස භාවිතය සම්බන්ධ ගැටළු විසඳීමට සහ දේශගුණික විපර්යාස සඳහා තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරිවර්තනය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූල වීම සඳහා ඒකාබද්ධ පලිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා වන ජෛව පලිබෝධනාශක භාවිතය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියෙහි ඉලක්ක ගත අරමුණු වේ. තේ සඳහා ජෛව පලිබෝධනාශක වාණිජකරණය කිරීමේ අරමුණ ඇතිව, ට්‍රයිකොඩර්මා (*Trichoderma*), සියුඩොමොනාස් (*Pseudomonas*) පදනම් කරගත් ජෛව පාලන කාරක තුනක් සහ බියුවේරියා(*Beauveria*) සහ මෙටාරයිසියම් (*Metarhizium*) පදනම් කරගත් කෘමි පාලන කාරක පිළිවෙළින් රෝග සහ කෘමි පලිබෝධ පාලනය කිරීම සඳහා වැඩි දියුණු කිරීම සහ මහා පරිමාණ නිෂ්පාදනය සිදු කරන ලදී.

GL 391 විශේෂ ව්‍යාපෘතිය සඳහා, භාණ්ඩාගාර අරමුදල් යටතේ ජෛව ප්‍රතික්‍රියාකාරකයක් (bioreactor) සහිත ක්ෂුද්‍රජීවී සැකසුම් හලක් ස්ථාපිත කර ක්‍රියාත්මක විය. ට්‍රයිකොඩර්මා ජෛව පලිබෝධනාශක ජෛවීය කොටස් මහා පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ජෛව ප්‍රතික්‍රියාකාරකය සුසර කිරීම සිදු කෙරෙමින් පවතී.

**ට්‍රයිකොඩර්මා සහ සියුඩොමොනාස් ජෛව පලිබෝධනාශක:**

පෝරියා මූල රෝග ආසාදනය පාලනය අරමුණු කරමින් පැළ සිටුවන අවස්ථාවේ වළට ජෛව පලිබෝධනාශක ප්‍රතිකාරය එක් කර ප්‍රතිඵල ඇගයීම සඳහා ක්ෂුද්‍ර බිම් අත්හදා බැලීමක් ස්ථාපිත කරන ලදී. රෝපණ වළ සඳහා ප්‍රතිකාරක යෙදීම රෝපණ අවස්ථාවේදීම අවසන් කර ඇත. පැළ සිටුවීමෙන් පසු 2 වන සහ 3 වන ප්‍රතිකාර යෙදුම සිදු කරන ලදී. අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

පෝරියා මූල රෝගය ආසාදනයට එරෙහිව ට්‍රයිකොඩර්මා ජෛව පලිබෝධනාශකයේ මාත්‍රා ප්‍රතිචාරය පරීක්ෂා කිරීම සඳහා බඳුන්ගත පරීක්ෂණයක් ස්ථාපිත කරන ලදී. අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

මූල රෝග සඳහා ස්ථාපිත කරන ලද ට්‍රයිකොඩර්මා (*Trichoderma*) සහ සියුඩොමොනාස් (*Pseudomonas*) ක්ෂේත්‍ර පරීක්ෂණ අවසන් කර ඇත.

බුබුළු අංගමාර රෝගයට එරෙහිව ට්‍රයිකොඩර්මා (*Trichoderma*) සහ සියුඩොමොනාස් (*Pseudomonas*) ජෛව පලිබෝධනාශක පිළිබඳ මූලික පරීක්ෂණයෙන් සෑහීමකට පත් විය හැකි රෝග කළමනාකරණයක් නොලැබුණි.

***Beauveria* ජෛව පළිබෝධනාශක:**
කම්බිලි පණුවාට එරෙහිව *Beauveria brongniartii* හි ජෛව කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ස්ථාපිත කරන ලද බඳුන්ගත පරීක්ෂණය අවසන් කරන ලදී. ලබා ගත් ජෛව කාර්යක්ෂමතාවය සෑහීමකට පත් විය හැකි මට්ටමක නොමැත.

තේ කඳ ගුල්ලාට එරෙහිව *Beauveria bassiana* හි කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් ස්ථාපිත කර ඇත. අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

***Metarhizium* ජෛව පළිබෝධනාශක:**
රසායනාගාර ජෛව විශ්ලේෂණයන් සාර්ථකව නිම කිරීමෙන් පසු, උඩරට සජීවී දැව වේයාට එරෙහිව මෙටාරයිසියම් (*Metarhizium*) ඒකලිත (isolate) 1 සහ ඒකලිත 2 වෙන වෙනම පරීක්ෂා කිරීම සඳහා බඳුන්ගත අත්හදා බැලීම් සිදු කරන ලදී. ප්‍රතිඵල ලෙස මෙටාරයිසියම් (*Metarhizium*) ඒකලිත දෙකෙහිම වේයන්ගේ මරත්‍යතා අනුපාතය 90% යක් විය.

කම්බිලි පණුවාට එරෙහිව මෙටාරයිසියම් (*Metarhizium*) ඒකලිත (isolate) 2 හි කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර ජෛව විශ්ලේෂණයන් සහ බඳුන්ගත පරීක්ෂණ සිදු කරන ලදී. පිළිවෙලින් ජෛව විශ්ලේෂණ සහ බඳුන්ගත පරීක්ෂණ සඳහා කීටයන්ගේ සාමාන්‍ය මරත්‍යතා අනුපාතය 67% සහ 60% ක් බැව් අනාවරණය විය.

පී ඩී සින්නයියා, ඩී පී එන් පී කරුණාජීව, ආර් පී වී ටී චන්ද්‍රලාල්,<br>
කේ එල් එස් සී ගුණවර්ධන (ශාක ව්‍යාධිවේදී අංශය) සහ<br>
එම් පී සම්මානි, එන් ඒ අයි එම් නිශ්ශංක, බී එස් විතාන, බී එම් පී කේ ගොඩවිට<br>
සහ පී ඩී සේනානායක (කීට විද්‍යා සහ වටපණු අංශය)

**ප්‍රධාන ව්‍යාපෘතිය DENTO 1. ඒකාබද්ධ පළිබෝධ පාලනය සඳහා ආරක්ෂක පළිබෝධනාශක හඳුනාගැනීම**

**පර්යේෂණය LE 143. කම්බිලි පණුවන්ට එරෙහිව පැචෝන් තෘණ විශේෂය (Pakchong grass) සතු දරා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම**

**අරමුණ:** කම්බිලි පණුවන් සඳහා පැචෝන් තෘණ විශේෂයෙහි ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීම

**පර්යේෂණ ස්ථානය:** පහතරට තේ පර්යේෂණ ආයතනය, රත්නපුර

**පර්යේෂණ සැකසුම:** අනුරූ 08 කින් සමන්විත සම්පූර්ණ අහඹු සැකසුම (CRD)

**ප්‍රතිකාරක:**

T1- පැචෝන් තෘණ විශේෂය + කම්බිලි පණුවන්

T2- පැචෝන් තෘණ විශේෂය කම්බිලි පණුවන් රහිතව

පස පුනරුත්තාපනය සඳහා පර්යේෂණ මට්ටමේ පවතින පැචෝන් තෘණ විශේෂය බඳුන් 16 ක රෝපණය කරන ලදී. එම බඳුන් අතරින් බඳුන් 08 කට කම්බිලි පණුවන් හඳුන්වා දීම සිදු කළ අතර කම්බිලි පණුවන්ගේ පැවැත්ම, පැචෝන් තෘණ විශේෂයෙ හි වර්ධන ක්‍රියාකාරිත්වය සහ මූල බර පාලිත පරීක්ෂණය (T2) සමග සසඳනු ලැබේ. පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

බී එස් විතාන සහ පී ඩී සේනානායක

**පර්යේෂණය E 418 (I). කම්බිලි පණුවන්ට එරෙහිව කොහොඹ පුන්නක්කුවල කාර්යක්ෂමතාවය අධ්‍යයනය කිරීම**

අරමුණ: තේ වගාවේ කම්බිලි පණුවන් පාලනය සඳහා කොහොඹ පුන්නක්කුවල කාර්යක්ෂමතාවය ඇගයීම

පර්යේෂණ ස්ථානය: කීට විද්‍යා හා වටපණුවේදී අංශය, තේ පර්යේෂණායතනය, තලවකැලේ

පර්යේෂණ සැකසුම: අනුරූ 04 කින් සමන්විත සම්පූර්ණ අහඹු සැකසුම (CRD)

ප්‍රතිකාරක:

T1- කොහොඹ පුන්නක්කු යෙදීම (100 g/pot, බඳුනක් තුල පස් 4 kg ක් අඩංගු වේ)
T2- කොහොඹ පුන්නක්කු යෙදීම (200 g/pot)
T3- කොහොඹ පුන්නක්කු යෙදීම (250 g/pot)
T4- කොරජන් (ක්ලෝරන්ට්‍රනිලිප්‍රෝල් 200 g/L SC) මි.ලි 250 ml ක් බඳුනක් සඳහා
T5- පාලිත ප්‍රතිකාරකය (ජලය මි.ලි 250 ml ක් බඳුනක් සඳහා)

ඉහත ප්‍රතිකාර ක්‍රම තේ පැළ සහිත බඳුන්වල වෙන වෙනම පස් සමඟ මිශ්‍ර කරන ලද අතර විවිධ කීට අවධීන් වන (පළමු කීට අවධියෙන් කීටයන් 4 ක්, 2 වන කීට අවධියෙන් කීටයන් 4 ක් සහ තෙවන අවධියෙන් කීටයන් 4 ක්) *Holotrichia disparilis*, *Microtrichia costata* සහ *Anomala walkeri* කම්බිලි පණුවන් මිශ්‍රණය සෑම බඳුනකටම හඳුන්වා දෙන ලදී (බඳුනකට කම්බිලි පණුවන් 12 බැගින්). බඳුන් සංවෘත පරිසරයක් තුළ 22±2 °C ක සාමාන්‍ය උෂ්ණත්වයක සහ 89±5% ක සාමාන්‍ය ආර්ද්‍රතාවයක පවත්වා ගෙන යන ලදී. කම්බිලි පණුවන්ගේ මරණ අනුපාතය දින 7 ක පරතරයකින් යුතුව මාසයක් දක්වා සටහන් කෙරිනි. SAS මෘදුකාංගය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයට පෙර කම්බිලි පණුවන්ගේ මරණ ප්‍රතිශතය ආර්ක්සයින් අගයන් බවට පරිවර්තනය කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

වගුව 2 ට අනුව පාලිත ප්‍රතිකාරකය සමඟ සසඳන විට විවිධ ප්‍රතිකාරකයන් හි කම්බිලි පණුවන්ගේ මරණ ප්‍රතිශතයෙහි සැලකිය යුතු වෙනසක් ඇති බව දක්නට ලැබිණි ($P < 0.05$). T4 සහ T5 ප්‍රතිකාරක සමඟ සසඳන විට T1, T2 සහ T3 එකිනෙකෙ හි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි. පාලිත ප්‍රතිකාරකය සමඟ සසඳන විට, කොහොඹ පුන්නක්කු කම්බිලි පණුවන්ට එරෙහිව සැලකිය යුතු ඉහළ කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි, කෙසේ වෙතත්, කොහොඹ පුන්නක්කුවල කාර්යක්ෂමතාව T4 ට වඩා අඩුය.

වගුව 2. කොහොඹ පුන්නක්කු මගින් ඇතිවූ කම්බිලි පණුවන්ගේ මරණ ප්‍රතිශතය (මසකින් පසුව)

| ප්‍රතිකාරකය | කම්බිලි පණුවන්ගේ මරණ ප්‍රතිශතය (මධ්‍යයනය) |
|---|---|
| T1 : කොහොඹ පුන්නක්කු යෙදීම (100 g/pot) | $38{\pm}9^{b}$ |
| T2: කොහොඹ පුන්නක්කු යෙදීම (200 g/pot) | $42{\pm}7^{b}$ |
| T3: කොහොඹ පුන්නක්කු යෙදීම (250 g/pot) | $48{\pm}11^{b}$ |
| T4: කොරජන් (ක්ලෝරන්ට්‍රනිලිප්‍රෝල් 200 g/L SC) මි.ලි 250 ml | $77{\pm}8^{a}$ |
| T5: Control (Water 250 ml/pot) | $19{\pm}4^{c}$ |

ඒ එම් පී සම්මානි, පී ඒ ඩී එස් සුමතිපාල, එන් ඒ අයි එම් නිස්සංක,
එම් කේ ඩී දමයන්ති සහ ආචාර්ය පී ඩී සේනානායක

**පර්යේෂණය E 419 (I). රතු මකුළු මයිටාවන්ට (*Oligonychus coffeae*) එරෙහිව Flipper (ශාක සාරය) හි කාර්යක්ෂමතාවය ඇගයීම**

අරමුණ: රසායනාගාර තත්වයන් යටතේ රතු මකුළු මයිටාවන්ට එරෙහිව Flipper හි ඵලදායී සාන්ද්‍රණය නිර්ණය කිරීම

පර්යේෂණ ස්ථානය: කීට විද්‍යා හා වටපණුවේදී අංශය, තේ පර්යේෂණායතනය, තලවකැලේ

පර්යේෂණ සැකසුම: අනුරූ 04 කින් සමන්විත සම්පූර්ණ අහඹු සැකසුම (CRD)

රතු මකුළු මයිටාවන්ට එරෙහිව Flipper හි විවිධ සාන්ද්‍රණයන් පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර පර්යේෂණ ආරම්භ කරන ලදී. පරීක්ෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

එස් පී ආර් විජේවර්ධන, පී ඒ ඩී එස් සුමතිපාල සහ ආචාර්ය පී ඩී සේනානායක

**මැක්‍රොසෙන්ට්‍රස් (*Macrocentrus homonae*) ගහනය පවත්වා ගෙන යාම හා වර්ධනය**

ටී ටෝට්‍රික්ස් දළඹුවාගේ ඒකාබද්ධ පලිබෝධ පාලනයේ එක් ක්‍රමවේදයක් වන මැක්‍රොසෙන්ට්‍රස් කීට පරපෝෂිතයන්ගේ ගහණය නිරතුරුව පවත්වා ගෙන යාම සඳහා පර්යේෂණාගාරය තුළ මොවුන් ජනිත කර උඩරට තේ වතුවලට මුදා හරින ලදී.

එම් කේ ඩී දමයන්ති සහ ආචාර්ය පී ඩී සේනානායක

**D/PL/PA/1 – අංශය ආශ්‍රිත කාර්යයන්**

**රෝග විනිශ්චය සහ පිළියම් නිර්දේශ කිරීම**

රත්නපුර ප්‍රදේශය ආශ්‍රිත ක්ෂේත්‍රයක තේ පඳුරු මිය යාමක් පිළිබඳ වාර්ථා වූ අතර ගැටලුව මූල ආසාදනයක් සමඟ සම්බන්ධ වී ඇති බව හඳුනාගෙන ඇත. ක්ෂේත්‍රයේ විවිධ ස්ථානවලින් ලබාගත් මූල සාම්පල හයෙන් තුනක් පරීක්ෂා කර මූල ආසාදන ඇති බව තහවුරු විය. *Botyosphaeriaceae* දිලීරය හේතුවෙන් හටගන්නා පිළිකාව ග්‍රැවිලියා ශාකවල පසු මැරීමේ රෝගයට හේතුව වන බව අනාවරණය වී ඇත. තවත් සාම්පල විශ්ලේෂණයේදී *Pestalotia* ආසාදන සොයා ගන්නා ලදී. පත්‍ර සාම්පල විශ්ලේෂණයේදී පත්‍ර පුල්ලි ආසාදනය හඳුනාගෙන ඇත.

**බුබුළු අංගමාර රෝග තීව්‍රතාව කෙරෙහි දළු නෙලීමේ කාල අන්තරවල බලපෑම ගණනය කිරීම**

ආසාදිත අංකුර ක්ෂේත්‍රයෙන් නිතර ඉවත් කිරීමෙන් රෝගය පාලනය කිරීම සඳහා බිබිලි අංගමාරය සමයේදී දළු රවුම කෙටි කිරීම හෙවත් අඩු කාලාන්තර වලින් දළු නෙලීම සාමාන්‍යයෙන් නිර්දේශ කෙරේ. සංඛ්‍යානමය වශයෙන් නිර්මාණය කරන ලද අත්හදා බැලීම් වලින් පසුව, බුබුළු අංගමාර රෝග තීව්‍රතාව කෙරෙහි දළු නෙලීමේ කාල අන්තරවල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා සාමාන්‍ය දළු නෙලන ක්ෂේත්‍ර තුළ ප්‍රතිනිර්මාණය නොකළ විශාල කට්ටි (පඳුරු 150) යොදා ගනිමින් අත්හදා බැලීම් සිදු කරන ලදී.

ලැම්ලියර් කොටසේ ක්ෂේත්‍ර අංක 8 හි පඳුරු 150 බැගින් අනුයාත කට්ටි දෙකක් සලකුණු කරන ලදී. කට්ටි සඳහා තෝරා ගන්නා ලද ප්‍රභේදය TRI 2025 වන අතර ක්ෂේත්‍රය කප්පාදු චක්‍රයේ පළමු වසරේ විය. 2022 ජූනි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ අධ්‍යයනය සිදු කල අතර එක් කට්ටියක් දින 7ක දළු නෙලීමේ වටයකට ද අනෙක් කට්ටිය දින 10ක දළු නෙලීමේ වටයකට ද ලක් කරන ලදී. කට්ටි වල දළු අස්වැන්න සහ බුබුළු අංගමාර රෝග තීව්‍රතාව සම්මත ක්‍රම භාවිතයෙන් නිර්ණය කරන ලදී. මෙම අත්හදා බැලීම ශාන්ත කූම්බ්ස් වතුයායේ ඉහළ කොටසේ ක්ෂේත්‍ර අංක 3 හිදී ද නැවත සිදු කරන ලදී.

රූපසටහන 8 හි දැක්වෙන්නේ පිළිවෙළින් දින 7 සහ දින 10 නෙලීමේ වටවලට යටත් වූ බිම් කොටස්වල පර්යේෂණාත්මක කාලසීමාව තුළ රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) අනුව සම්පූර්ණ දළු අස්වැන්න සහ බුබුළු අංගමාර රෝග තීව්‍රතාවයි. ස්ථාන දෙකෙහිම, දින 7 ක නෙලීමේ වටයට යටත් වූ බිම් කැබලිවල වැඩි දළු අස්වැන්නක් සහ අඩු බුබුළු අංගමාර රෝග තීව්‍රතාවයක් වාර්තා වූ අතර, දින 10 නෙලීමේ වටය සඳහා ප්‍රතිලෝම සත්‍ය විය.




රූපසටහන 6. ශාන්ත කුම්බිස් වතුයායේ ක්ෂේත්‍ර අංක 3, ඉහළ කොටසේ සහ ක්ෂේත්‍ර අංක 8 ලැමිලියර් කොටසේ බිම් කොටස්වල පර්යේෂණාත්මක කාලසීමාව තුළ දින 7 සහ දින 10 දළු නෙලීමේ වටවලට යටත්ව රෝග උන්නති වක්‍ර වර්ගඵලය (AUDPC) අනුව සම්පූර්ණ තේ දළු අස්වැන්න සහ බුබුළු අංගමාර රෝග තීව්‍රතාව.

පී ඩී සින්නයියා, ඩී පී එන් පී කරුණාජීව, ආර් පී වී ටී චන්ද්‍රලාල්
සහ කේ එල් එස් සී ගුණවර්ධන

# දේශගුණික විපර්යාසයන් හි බලපෑම අධ්‍යයනය



**ප්‍රධාන ව්‍යාපෘතිය A 50. තේ කර්මාන්තයේ ඵලදායිතාව සහ ලාභදායිත්වය කෙරෙහි ගෝලීය දේශගුණික විපර්යාසවල බලපෑම තක්සේරු කිරීම**

**ව්‍යාපෘතිය A 50. 4 දේශගුණික විපර්යාසයන් තේ වගාවේ පළිබෝධ කෙරෙහි බලපෑම අධ්‍යයනය කිරීම**

ජීවන චක්‍රයේ විවිධ අදියරවල කාලය තීරණය කිරීම සඳහා 25°C උෂ්ණත්වය හා 80% සාපේක්ෂ ආර්ද්‍රතාවය යටතේ පර්යේෂණයක් පරීක්ෂණාගාරය තුළ සිදු කරන ලදී. මෙම ආරම්භක පර්යේෂණයෙන් ලැබූ තොරතුරු මත පදනම්ව ප්‍රතිනිර්මාණාත්මක පරීක්ෂණයක් ඉදිරියේ දී සිදු කිරීමට නියමිතය.

පී ජී ඩී එස් අමරසේන, ඒ එම් පී සම්මානි, ජී කේ ඩබ්ලිව් එච් ධර්මදාස,
එන් ඒ අයි එම් නිස්සංක සහ එල් ආර් යූ එල් සෙනෙවිරත්න

**ව්‍යාපෘතිය A 50.5. තේ වගා කරන විවිධ ප්‍රදේශවල දේශගුණික වෙනස්වීම් විශ්ලේෂණය. හා කාලගුණික පුරෝකථන**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන පුරෝකථන තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන් හරහා තේ ගොවීන් දැනුවත් කිරීම පිණිස උපදෙස් හා ව්‍යාප්ති නිළධාරීන් වෙතට රැගෙන යන ලදී. තලවාකැලේ, රත්නපුර හා මහනුවර මධ්‍යස්ථානවලින් ලබාගන්නා වර්ෂාපතන හා උෂ්ණත්ව දත්ත විශ්ලේෂණය කර පසුගිය දශකයේ අගයන් හා සංසන්දනය කර වාර්ථා සකස්කරන ලදී. ප්‍රතිඵල පහත පරිදි වේ.

2022 වර්ෂයේදී රත්නපුර (පහතරට) මධ්‍යස්ථානයේ වර්ෂාපතනය (මි.මි 850.7) පසුගිය වසරට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා ලදී. පහත ප්‍රස්ථාරයෙහි (රූපසටහන 1) දක්වා ඇති පරිදි 2022 ජූලි හා සැප්තැම්බර් මාසවල වර්ෂාපතනය පසුගිය දශකයේ සාමාන්‍යයට වඩා අඩු අගයක් ගෙන ඇත. එසේ වුව ද මැයි, අගෝස්තු හා අවසන් කාර්තුවෙහිදී එය පසුගිය දශකයේ සාමාන්‍යයට වඩා ඉහළ අගයක පැවතිනි. පළමු කාර්තුවේ සහ ජූනි මාසයේ දී මහනුවර මධ්‍යස්ථානයේ වාර්තා වූ වර්ෂාපතනය පසුගිය දශකයේ සාමාන්‍යයට වඩා අඩු විය. එනමුදු ජූලි-සැප්තැම්බර් දක්වා කාලයේදී එය ඉහල අගයක පැවතිනි (රූපසටහන 2). තලවකැලේ මධ්‍යස්ථානයේ 2022 වසරෙහි මාස 5ක් ඒවායේ සාමාන්‍යය වර්ෂාපතනයට වඩා අඩු අගයක් වාර්තාකොට ඇති අතර තවත් මාස 3කදී සාමාන්‍යයට වඩා ඉහළ වර්ෂාපතනයක් ලැබී ඇත (රූපසටහන 3).




රූපසටහන 1. රත්නපුර මධ්‍යස්ථානයේ වර්ෂාපතනය (වසර 10ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාල අගයන් කුලුණුවලින් ද පෙන්වා ඇත).




රූපසටහන 2. මහනුවර මධ්‍යස්ථානයේ වර්ෂාපතනය (වසර 10 ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාල අගයන් කුලුණුවලින් ද පෙන්වා ඇත).




රූපසටහන 3. තලවාකැලේ මධ්‍යස්ථානයේ වර්ෂාපතනය (වසර 10ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාල අගයන් කුලුණුවලින් ද පෙන්වා ඇත).

වසර 10ක සාමාන්‍යය හා සසඳා බලන විට පහතරට ප්‍රදේශවල (රත්නපුර) 2022 හි උෂ්ණත්වයේ හැසිරීම සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති වුවත් ජනවාරි සහ පෙබරවාරි මාසවල එය සාමාන්‍යයට වඩා ඉහළ අගයක පැවතිනි (රූපසටහන 4). මහනුවර මධ්‍යස්ථානයේ අගෝස්තු සිට දෙසැම්බර් මස දක්වා උෂ්ණත්වය පසුගිය දශකයේ සාමාන්‍යයට වඩා අඩු අගයක පැවතිනි (රූපසටහන 5). එනමුදු පළමු මාස දෙකෙහි දී සාමාන්‍යයට වඩා වැඩි උෂ්නත්වයක් පෙන්නුම් කරයි. උඩරට ප්‍රදේශයේ (තලවාකැලේ) වසරෙහි පළමු කාර්තුවේ උෂ්ණත්වය පසුගිය දශකයේ සාමාන්‍ය අගයට වඩා ඉහළ මට්ටමක පැවතිනි (රූපසටහන 6).




රූපසටහන 4. රත්නපුර මධ්‍යස්ථානයේ සාමාන්‍ය උෂ්ණත්වය (වසර 10ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාළ අගයන් o සලකුණුවලින් ද පෙන්වා ඇත).




රූපසටහන 5. මහනුවර මධ්‍යස්ථානයේ සාමාන්‍ය උෂ්ණත්වය (වසර 10ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාල අගයන් o සලකුණුවලින් ද පෙන්වා ඇත).




රූපසටහන 6. තලවාකැලේ මධ්‍යස්ථානයේ සාමාන්‍ය උෂ්ණත්වය (වසර 10ක සාමාන්‍ය අගය තනි රේඛාවකින් ද එය වෙනස් වීමේ පරාසය තිත් ඉරිවලින් ද 2022 ට අදාල අගයන් ๐ සලකුණුවලින් ද පෙන්වා ඇත).

එම් ඒ විජේරත්න

**ව්‍යාපෘතිය B 131. දේශගුණික විපර්යාසයන් මගින් තේ වගාවට සිදුවිය හැකි හානි අවම කිරීම සදහා කළ හැකි ශීඝ්‍ර මැදිහත්වීම් පිළිබදව විමර්ශනය කිරීම**

සියලුම ජීවීන්ටත්, සෑම ක්ෂේත්‍රයකටමත් දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම තර්ජනයක් වෙමින් පවතී. එබැවින් රසායන ද්‍රව්‍යයන් යොදා ගනිමින් කෙටිකාලීන නියඟයන්හි දී තේ ශාක නොනැසී පවත්වා ගනිමින් යම් අස්වැන්නක් ලබා ගැනීම සදහා මැදිහත්විය හැකි ආකාරය සහ ඒවායේ ඇති ආර්ථික සාධ්‍යතාව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය විය. මෙම පුළුල් පරමාර්ථය මුදුන්පත් කර ගැනීම සදහා නියඟයන්හිදී විවිධ රසායන ද්‍රව්‍ය භාවිතා කර විවිධ තේ ප්‍රභේදයන්ගේ ශාක කායික විද්‍යාත්මක සහ ජීව රසායනික ප්‍රතිචාර අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මේ සදහා තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ පාලිත තත්ව යටතේ පර්යේෂණ පෙළක් සිදුකිරීමට නියමිත වේ (1382 m amsl).

**අත්හදා බැලීම 1: නියඟයකදී තේ (*Camellia sinensis*) ශාකයේ හෝමෝන නියාමනය මගින් සිදුවන කායික විද්‍යාත්මක වෙනස්කම්**

මෙම පර්යේෂණයේ දී සැලිසිලික් අම්ලය, ඇබ්සිසික් අම්ලය, ගිබෙරලික් අම්ලය සහ ඒවායේ සම්මිශ්‍රණ/අන්තර්ක්‍රියා බාහිරව යොදා ගනිමින් නියඟයකදී ශාකවල ශාක කායික විද්‍යාත්මක සහ ජීව රසායනික ප්‍රතිචාර අධ්‍යයනය කිරීම තුලින් කෙටි කාලීන නියඟයකදී නොමේරූ සහ මේරූ තේ ශාක නොනැසී පවත්වා ගැනීම සදහා හෝමෝන යොදා ගනීමේ හැකියාව පිළිබදව විමර්ශනය කරනු ලැබේ.

**පළමුවන ක්ෂේත්‍ර ඇගයීම**

මෙම පර්යේෂණය තලවාකැලේ (WU2) බෙයාර්වෙල් වතුයායේ ෆෙයාර්ෆීල්ඩ් කොටසෙ හි ඇති ක්ෂෙත්‍ර අංක 08NC (උච්චත්වය මුහුදු මට්ටමේ සිට උස මීටර 1440, අක්ෂාංශ 6° 53' 6.84" N

සහ දේශාංශ 80° 40' 17.95" E) හිදී වසර තුනක් වයසැති ටීආර්අයි 4078 නියගයට ඔරොත්තු දෙන තේ ප්‍රභේදය යොදා ගනිමින් සිදු කරන ලදී. එහි දී තේ පැළ ආර්සීබීඩී (RCBD) සැලැස්මට අනුව පර්යේෂණ කුට්ටි 3 කින් සමන්විතව පහත පර්යේෂණ සැලැස්ම යොදා ගනිමින් සිදු කරන ලදී. තේ පැළ මධ්‍යස්ථ තෙතමන ආතතියකට (ගුරුමිතික ජල අන්තර්ගතය 28.93%) ලක්වූ පසුව, එක් එක් තේ පැළ කාණ්ඩයට විවිධ ශාක හෝර්මෝන සැලිසිලික් අම්ලය (SA), ඇබ්සිසික් අම්ලය (ABA) සහ ගිබෙරලික් අම්ලය (GA) පාලිත තත්ව යටතේ මීට ඉහත දී සිදු කරනු ලැබූ පර්යේෂණවල ප්‍රතිඵල ඇසුරෙන් තෝරාගන්නා ලද සාන්ද්‍රණවලින් දියර ලෙස පත්‍ර මතට ඉසීමක් සිදු කරන ලදී. මීට සමගාමීව ජලය ද (WS) පත්‍ර මතට ඉසීමක් සිදු කරන ලද අතර කිසිම ප්‍රතිකාරකයක් පත්‍ර මතට ඉසිනු නොලැබූ (NS) තේ පැළ කාණ්ඩ ද පර්යේෂණය ප්‍රතිකාරක ලෙස මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී.

දත්ත ලබා ගැනීම ප්‍රතිකාරක ලබාදීමෙන් දින (DAS) 7, 14, 21 කට පසුව සහ වර්ෂාවට පසු තේ පැළ නැවත යථා තත්වයට පත්වීමේ දත්ත ප්‍රතිකාරක ලබාදීමෙන් දින 21කට පසුව සිදු කරන ලදී. ශාක කායික විද්‍යාත්මක දත්ත (වායු හුවමාරු පරාමිතිකයන්ගේ දත්ත සහ සාපේක්ෂ ජල අන්තර්ගතය) සහ ජීව රසායනික පරාමිතික (ශාක පත්‍රවල අඩංගු මුලු ද්‍රාවක සීනි ප්‍රමාණය, ප්‍රෝලීන ප්‍රමාණය, පොලිෆීනෝල ප්‍රමාණය, ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වය සහ වර්ණක සාන්ද්‍රණය), මුල පද්ධතිය අවට පාංශු තෙතමනයට සමගාමීව උදෑසන 9.00 සිට දහවල් 12.30 වනතෙක් මෑතක දී උපරිම ලෙස මෝරන ලද ශාක පත්‍ර යොදා ගනිමින් මනිනු ලැබීය. අතෙහි ගෙනයා හැකි ප්‍රභාසංශ්ලේෂණමානයක් (model: LI- 6400XT, Li-Cor Inc., USA) යොදා ගනිමින් ප්‍රභාසංශ්ලේෂණ වේගය, උත්ස්වේදන වේගය සහ පූටිකාවල හැසිරීම මනිනු ලැබීය. තවත් එවැනිම වූ ශාක පත්‍ර කිහිපයක් දත්ත ලබා ගැනීමට විනාඩි 30 කට පෙර ඇලුමිනියම් කොළවලින් වසා තබා තේ ශාක පත්‍රවල අඳුරු ශ්වසනය ද මනිනු ලැබීය.

ශාක පත්‍රවල සාපේක්ෂ ජල අන්තර්ගතය, ශාක පත්‍රවල අඩංගු මුලු ද්‍රාවක සීනි ප්‍රමාණය, ප්‍රෝලීන ප්‍රමාණය, පොලිෆීනෝල ප්‍රමාණය, ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වය සහ වර්ණක සාන්ද්‍රණය(ක්ලෝරොෆිල් ඒ, බී සහ කැරොටිනොයිඩ්) ආදී පරාමිතික සම්මත ක්‍රමවේද අනුගමනය කරමින් මනිනු ලැබීය.

මෙම ක්ෂේත්‍ර පර්යේෂණයේදී සියලුම ප්‍රතිකාරක වල පාංශු තෙතමන අගයන්ගේ සාමාන්‍යය ප්‍රතිකාරක ලබාදීමෙන් දින (DAS) 7, 14, 21 කට පසුව සහ වර්ෂාවට පසුව පිළිවෙලින් 27.6%, 24.99%, 19.63% සහ 30.2% ලෙස දක්නට ලැබිණි. නියගයේ තීව්‍රතාවය වැඩිවීමට සමගාමීව ශාක පත්‍රවල සාපේක්ෂ ජල අන්තර්ගතය ද අඩුවන බව දක්නට ලැබුණි. ප්‍රතිකාරක ලබාදීමෙන් දින (DAS) 14 ක් හා 21 කට පසුව සහ වර්ෂාවට පසුව ABA සහ SA ප්‍රතිකාරක ලෙස ඉසින ලද ශාක පත්‍රවල සාපේක්ෂ ජල අන්තර්ගතය සැලකිය යුතු ලෙස ඉහළ අගයන් දක්නට ලැබුණු අතර GA, WS සහ NS ප්‍රතිකාරකවල ට පාත්‍ර වූ ශාක පත්‍රවල සාපේක්ෂ ජල අන්තර්ගතය සැලකිය යුතු ලෙස අඩු ($p<0.05$) බවද දක්නට ලැබුණි.

නියගයේ තීව්‍රතාවය වැඩිවීමට සමගාමීව ශාක පත්‍රවල වායු හුවමාරු පරාමිතිකයන්ගේ විවිධ ප්‍රතිචාර දක්නට ලැබුණි.

**දෙවන ක්ෂේත්‍ර ඇගයීම**

මෙම පර්යේෂණය තලවාකැලේ (WU2) ශාන්ත කූම්බ්ස් වතුයායේ පහළ කොටසෙ හි ඇති ක්ෂේත්‍ර අංක 10 හිදී වසර විසි තුනක් වයසැති පරිණත තේ වගාව යොදා ගනිමින් සිදු කරන ලදී. එහි දී ද තේ පැළ ආර්සීබීඩී (RCBD) සැලැස්මට අනුව පර්යේෂණ කුට්ටි 3 කින් සමන්විතව පහත පර්යේෂණ සැලැස්ම යොදා ගනිමින් සිදු කරන ලදී. තේ පැළ මධ්‍යස්ථ තෙතමන

ආතතියකට ලක්වූ පසුව, එක් එක් තේ පැළ කාණ්ඩයට විවිධ ශාක හෝර්මෝන සැලිසිලික් අම්ලය (SA), ඇබ්සිසික් අම්ලය (ABA) සහ ගිබෙරලික් අම්ලය (GA) පාලිත තත්ත්ව යටතේ මීට ඉහත දී සිදු කරනු ලැබූ පර්යේෂණවල ප්‍රතිඵල ඇසුරෙන් තෝරාගන්නා ලද සාන්ද්‍රණවලින් දියර ලෙස පත්‍ර මතට ඉසීමක් සිදු කරන ලදී. මීට සමගාමීව ජලයද (WS) පත්‍ර මතට ඉසීමක් සිදු කරන ලද අතර කිසිම ප්‍රතිකාරකයක් පත්‍ර මතට ඉසිනු නොලැබූ (NS) තේ පැළ කාණ්ඩ ද පර්යේෂණය ප්‍රතිකාරක ලෙස මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. ඉහත විස්තර කළ ආකාරයටම ඉහත දැක්වූ කාල පරාසවලින් එම පරාමිතිකම, මෙම පර්යේෂණයේදී ද මනිනු ලැබීය.

මෙම ක්ෂේත්‍ර පර්යේෂණ දෙකෙන් සොයා ගන්නා ලද රසවත් තොරතුරු සහ මීට පෙර වසරවල දී වාර්ෂික වාර්තාවලට ඇතුළත් කරන ලද තොරතුරු නිබන්ධනයක් ලෙස ගොනු කරන ලද අතර මේ දිනවල දී එහි නිවැරදි කිරීම් සිදුකරමින් පවතී.

එම් එම් එන් දමයන්ති, ටී එල් විජේරත්න සහ
ජේ ඩබ්ලිව් දමුණුපොල (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**අත්හදා බැලීම 2: නියඟයකදී දිගු දාම මේද මධ්‍යසාර මගින් තේ (*Camellia sinensis*) ශාකයේ කායික විද්‍යා සහ ජීව රසායනික ක්‍රියාවලියන් දියුණු කිරීමට දක්වන දායකත්වය ඇගයීම**

මෙම පර්යේෂණයේ දී නියඟයකදී දිගු දාම මේද මධ්‍යසාර පත්‍ර මතට ඉසීමක් මගින් නොමේරූ තේ ශාකයේ කායික විද්‍යා සහ ජීව රසායනික ක්‍රියාවලියන්ට සිදු කළ හැකි බලපෑම අධ්‍යයනය කිරීමටත්, කෙටි කාලීන නියඟයකදී තේ ශාක නොමැරී පවත්වාගෙන යාම සඳහා දිගු දාම මේද මධ්‍යසාර සහිත වාණිජ නිෂ්පාදනයක් පත්‍ර මතට ඉසීමක් මගින් ලබා ගත හැකි දායකත්වය පිළිබඳව විභවය විමර්ශනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ.

මෙම පර්යේෂණය පියවර දෙකකින් එනම් 1 වීදුරු ගෘහයක් හෝ වැසි ආවරණයක් තුළ පාලිත තත්ව යටතේ තේ තවාන් පැළ සඳහාද 2 නොමේරූ තේ පැළවල ප්‍රතිචාර ඇගයීම සඳහා ක්ෂේත්‍ර තත්ව යටතේද සිදු කරන ලදී.

**අත්හදා බැලීම 2.1. වීදුරු ගෘහයක් හෝ වැසි ආවරණයක් තුළ පාලිත තත්ව යටතේ තේ තවාන් පැළවල ප්‍රතිචාර ඇගයීම සඳහා සිදු කරන ලද පර්යේෂණය**

මෙම අධ්‍යයනය පර්යේෂණ මාලවක් ලෙස වීදුරු ගෘහයක් හෝ වැසි ආවරණයක් තුළ පාලිත තත්ව යටතේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේදී සිදු කරනු ලැබීය. බඳුන් ගත කරන ලද වසරක් වයසැති ටීආර්අයි 2025 (නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සහිත) සහ ටීආර්අයි 2023 (නියඟයට ඔරොත්තු දීමේ හැකියාවෙන් අඩු) ප්‍රභේද යොදා ගනිමින් මෙම පර්යේෂණය ද තලවාකැලේ තේ පර්යේෂණායතනයේ පාලිත තත්ව යටතේ සිදු කරන ලදී. එහි දී තේ පැළ ආර්සීබීඩී (RCBD) සැලැස්මට අනුව කුට්ටි 2 කින් සමන්විතව වීදුරු ගෘහය තුලද සීආර්ඩී (CRD) සැකැස්මට අදාළව ප්‍රතිවලිත දහයකින් සමන්විතව වැසි ආවරණය තුලද සිදු කරන ලදී. ඉන් පසුව තේ පැළ ක්ෂේත්‍ර ධාරිතාවයට එනතෙක් ජලය සැපයීමෙන් අනතුරුව ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර පහත පරිදි පර්යේෂණ ප්‍රතිකාර ලබා දෙන ලදී.

1. GM660: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර හෙක්ටයාරයකට දිගු දාම මේද මධ්‍යසාර මිලි ලීටර 600 ක් ජලය ලීටර 200ක වශයෙන් දියකර තේ පත්‍ර මතට ඉසීම
2. GM1000: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර හෙක්ටයාරයකට දිගු දාම මේද මධ්‍යසාර මිලි ලීටර 1000ක් ජලය ලීටර 200ක වශයෙන් දියකර තේ පත්‍ර මතට ඉසීම
3. WS: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර හෙක්ටයාරයකට ජලය ලීටර 200ක් වශයෙන් තේ පත්‍ර මතට ඉසීම

4. $K_2SO4$: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර හෙක්ටයාරයකට පොටෑසියම් සල්ෆේට් 2% ද්‍රාවණයක් තේ පත්‍ර මතට ඉසීම
5. KCl: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර හෙක්ටයාරයකට පොටෑසියම් ක්ලෝරයිඩ් 2% ද්‍රාවණයක් තේ පත්‍ර මතට ඉසීම
6. WW: හොඳින් තෙතමනය සහිතව පවත්වාගෙන යන ලද තේ පැළ (positive control)
7. NS: ජල සැපයුම නවතා වියළි චක්‍රයකට භාජනය කර කිසිම දියරයක් පත්‍ර මතට ඉසීමකින් තොරව පවත්වාගෙන යන ලද තේ පැළ (negative control).

දියර ඉසීමෙන් පසු දින 3, 7, 14 සහ 21 ආදී ලෙස එක් එක් ප්‍රතිකාරවලින් අහඹු ලෙස තෝරා ගත් තේ පැළ 5 බැගින් දත්ත එකතු කිරීම සිදුකරන ලදී. මීට සමගාමීව මූල පද්ධතිය අවට ගුරුමිතික පාංශු තෙතමනය (SMC) ද ලබා ගන්නා ලදී.

ශාක කායික විද්‍යාත්මක දත්ත, එනම් වායු හුවමාරු දත්ත (ප්‍රභාසංශ්ලේෂණ වේගය) (A), පූටිකාවල හැසිරීම (Gs), උත්ස්වේදන වේගය (E), ජලය භාවිතයේ කාර්යක්ෂමතාවය (WUE) සහ ශාක පත්‍රවල උෂ්ණත්වය (Tleaf), අතේ ගෙනයාමට හැකි අධෝරක්ත වායු විශ්ලේෂකය (Model: CIRAS3, PP Systems, USA) මගින් මනිනු ලැබීය. ශාකයේ සාපේක්ෂ ජල අන්තර්ගතයද සම්මත ක්‍රමවේද අනුගමනය කරමින් මනින ලද අතර ශාක පත්‍රවල අඩංගු මුලු ද්‍රාවක සීනි ප්‍රමාණය සහ ප්‍රෝලීන ප්‍රමාණය සම්පත් හිඟතාවය නිසා දියර ඉසීමෙන් දින 21 කට පසුව පමණක් සම්මත ක්‍රමවේද අනුගමනය කරමින් මනිනු ලැබීය. මෙයට අමතරව ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 සහ 21 කට පසුව තේ පැළවල බාහිර ස්වභාවයේ දත්ත ද ලබා ගෙන නියඟයට පාත්‍රවීමේ ලක්ෂණ නොපෙන්වන ශාක ප්‍රතිශතය ගණනය කරන ලදී.

එක් එක් ප්‍රතිකාර සඳහා ලබා ගන්නා දත්තයන් හොඳින් ජලය යොදා පවත්වාගෙන යනු ලැබූ ප්‍රතිකාරකයෙන් ලබාගත් දත්තවලට සාපේක්ෂව ගණනය කිරීම තුලින් නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකයක් ගණනය කල අතර ඔබගේ පහසුව සඳහා උදාහරණයක් පහත දක්වා ඇත.

DTI for A = (A_trt / A_WW) ×100

ඉහත සමීකරණයේ DTI for A යනු ප්‍රභාසංශ්ලේෂණ වේගය සඳහා ගණනය කරනු ලැබූ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකය වන අතර A_trt යනු එක් එක් ප්‍රතිකාරකයට අදාළ දත්ත ලබාගන්නා ලද විශේෂිතවූ දිනයට අදාළ වූ ප්‍රභාසංශ්ලේෂණ වේගයවේ. A_WW යනු එයට අනුරූපීව හොඳින් ජලය යොදා පවත්වා ගෙන යනු ලැබූ ප්‍රතිකාරකයෙන් ලබාගත් ප්‍රභාසංශ්ලේෂණ වේගය වේ. ලබා ගන්නා ලද දත්ත සම්මත ආකරයට SAS v9 සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණ මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. බහු නිර්ණායක ක්‍රමවේදයක් වන ශ්‍රේණිගත සාරාංශ දර්ශකයක් (rank summation index (RSI)) යොදා ගෙන ප්‍රතිකාරකවල ඵලදායීතාවය පිළිබඳ අවසාන තීරණය ලබා ගන්නා ලදී.

ඒ අනුව, එක් එක් පරාමිතීකයන්ගේ වැඩිවීම නියඟයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිකිරීමට ප්‍රයෝජනවත් වන අවස්ථාවල එම ප්‍රතිකාරක අවරෝහණ පිළිවෙලට සකසා 1 සිට 6 දක්වා ශ්‍රේණි ලබා දුන් අතර 1 යනු හොඳම ප්‍රතිකාරකය ලෙසත් 6 යනු නරකම ප්‍රතිකාරකය ලෙසත් සලකන ලදී. එලෙසම එක් එක් පරාමිතීකයන්ගේ අඩුවීම නියඟයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිකිරීමට ප්‍රයෝජනවත් වන අවස්ථාවල එම ප්‍රතිකාරක ආරෝහණ පිළිවෙලට සකසා 1 සිට 6 දක්වා ශ්‍රේණි ලබාදුන් අතර 1 යනු හොඳම ප්‍රතිකාරකය ලෙසත් 6 යනු නරකම ප්‍රතිකාරකය ලෙසත් සලකන ලදී.

අවසානයේ සියලුම පරාමිතීකයන්ට අදාළව එක් එක් ප්‍රතිකාරකයට එක් එක් දත්ත ලබා ගත් කාල පරතරයන්හිදී ලබා දුන් සියලුම ශ්‍රේණිවල එකතුව RSI ලෙස ගණනය කරන ලදී.

මෙම පර්යේෂණය වීදුරු ගෘහය සහ වැසි ආවරණය තුළ කිහිප වාරයක් නැවත නැවතත් සිදු කරනු ලබුවද ලබා දුන් කිසිම ප්‍රතිකාරකයක් ජලය පත්‍ර මතට ඉසිනු ලැබූ (WS) හෝ ජලය නොයෙදූ (NS) ප්‍රතිකාරවලට සාපේක්ෂව සැලකිය යුතු වෙනසකම් නොපෙන්වන ලදී (වගුව 1). ලබා දුන් ප්‍රතිකාරක කෙසේ වෙතත් තවාන් පැළවල හොඳින් වර්ධනය වූ මූල පද්ධතියක් නොමැති වීමත් බදුන් ගත පැළවල මුල්වල පරිමාව සීමාසහිතවීමත් මේ සඳහා බලපාන්නට ඇත.

වගුව 1. නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඇගයීම සඳහා දර්ශක ලෙස යොදා ගන්නා ලද එක් එක් ශාක කායික විද්‍යාත්මක දත්ත සඳහා ලබා දුන් ශ්‍රේණි (R) සහ ගණනය කරනු ලැබූ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකයේ (RSI) සාමාන්‍ය අගයන්

| Cul | DAS | Treatment | DTI_A | R | DTI_Gs | R | DTI_E | R | DTI_WUE | R | DTI_Tleaf | R | DTI_RWC | R | RSI |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| TRI 2023 | 3 | GM1000 | 0.76$^{a}$ | 1 | 0.53$^{a}$ | 1 | 0.75$^{a}$ | 6 | 1.09$^{ba}$ | 2 | 1.03$^{cb}$ | 3 | 1.05$^{a}$ | 1 | 14 |
| | | GM660 | 0.69$^{ba}$ | 4 | 0.48$^{ba}$ | 2 | 0.65$^{ba}$ | 2 | 1.00$^{bc}$ | 4 | 1.01$^{d}$ | 1 | 1.00$^{ba}$ | 3 | 16 |
| | | $K_2SO_4$ | 0.68$^{ba}$ | 4 | 0.37$^{c}$ | 5 | 0.66$^{ba}$ | 2 | 0.97$^{c}$ | 5 | 1.05$^{a}$ | 5 | 0.98$^{b}$ | 5 | 26 |
| | | KCl | 0.75$^{a}$ | 1 | 0.47$^{ba}$ | 2 | 0.67$^{ba}$ | 2 | 1.12$^{ba}$ | 2 | 1.02$^{c}$ | 2 | 1.05$^{a}$ | 1 | 10 |
| | | WS | 0.74$^{a}$ | 1 | 0.42$^{bc}$ | 4 | 0.61$^{b}$ | 1 | 1.16$^{a}$ | 1 | 1.03$^{b}$ | 4 | 1.00$^{ba}$ | 3 | 14 |
| | | NS | 0.57$^{b}$ | 6 | 0.37$^{c}$ | 5 | 0.67$^{ba}$ | 2 | 0.74$^{d}$ | 6 | 1.06$^{a}$ | 5 | 0.97$^{b}$ | 5 | 29 |
| | 7 | GM1000 | 0.46$^{ba}$ | 2 | 0.56$^{a}$ | 1 | 0.62$^{a}$ | 5 | 1.12$^{a}$ | 1 | 1.00$^{ba}$ | 3 | 0.95$^{a}$ | 1 | 13 |
| | | GM660 | 0.37$^{bc}$ | 3 | 0.35$^{bc}$ | 4 | 0.42$^{bc}$ | 2 | 0.76$^{bc}$ | 4 | 1.00$^{ba}$ | 3 | 0.93$^{a}$ | 1 | 17 |
| | | $K_2SO_4$ | 0.43$^{b}$ | 5 | 0.35$^{bc}$ | 4 | 0.43$^{bc}$ | 2 | 1.03$^{ba}$ | 2 | 1.00$^{ba}$ | 3 | 0.98$^{a}$ | 1 | 17 |
| | | KCl | 0.39$^{bc}$ | 3 | 0.48$^{ba}$ | 3 | 0.53$^{ba}$ | 4 | 0.65$^{c}$ | 5 | 0.99$^{b}$ | 2 | 1.00$^{a}$ | 1 | 18 |
| | | WS | 0.58$^{a}$ | 1 | 0.60$^{a}$ | 1 | 0.61$^{a}$ | 5 | 0.88$^{ba}$ | 2 | 0.96$^{c}$ | 1 | 0.94$^{a}$ | 1 | 11 |
| | | NS | 0.29$^{c}$ | 6 | 0.22$^{c}$ | 6 | 0.28$^{c}$ | 1 | 0.60$^{c}$ | 5 | 1.01$^{a}$ | 6 | 0.94$^{a}$ | 1 | 25 |
| | 14 | GM1000 | 0.16$^{ba}$ | 2 | 0.30$^{a}$ | 1 | 0.38$^{a}$ | 6 | 0.38$^{b}$ | 5 | 1.00$^{b}$ | 2 | 0.81$^{a}$ | 1 | 17 |
| | | GM660 | 0.08$^{bc}$ | 3 | 0.12$^{cb}$ | 4 | 0.16$^{dc}$ | 2 | 0.92$^{ba}$ | 4 | 0.99$^{b}$ | 2 | 0.93$^{a}$ | 1 | 16 |
| | | $K_2SO_4$ | 0.11$^{bc}$ | 3 | 0.17$^{b}$ | 3 | 0.22$^{c}$ | 4 | 1.54$^{a}$ | 1 | 1.00$^{b}$ | 2 | 0.95$^{a}$ | 1 | 14 |
| | | KCl | 0.06$^{c}$ | 6 | 0.12$^{cb}$ | 4 | 0.16$^{dc}$ | 2 | 0.54$^{b}$ | 5 | 1.02$^{a}$ | 6 | 0.94$^{a}$ | 1 | 24 |
| | | WS | 0.12$^{bc}$ | 3 | 0.26$^{a}$ | 1 | 0.28$^{b}$ | 5 | 1.38$^{a}$ | 1 | 0.97$^{c}$ | 1 | 0.82$^{a}$ | 1 | 12 |
| | | NS | 0.22$^{a}$ | 1 | 0.10$^{c}$ | 6 | 0.13$^{d}$ | 1 | 1.67$^{a}$ | 1 | 1.00$^{b}$ | 2 | 0.87$^{a}$ | 1 | 12 |
| TRI 2025 | 3 | GM1000 | 0.55$^{bc}$ | 5 | 0.36$^{bc}$ | 4 | 0.58$^{bc}$ | 2 | 0.97$^{a}$ | 1 | 1.03$^{c}$ | 3 | 1.07$^{a}$ | 1 | 16 |
| | | GM660 | 0.64$^{bac}$ | 4 | 0.53$^{ba}$ | 2 | 0.72$^{ba}$ | 4 | 1.03$^{a}$ | 1 | 0.99$^{e}$ | 1 | 1.02$^{a}$ | 1 | 13 |
| | | $K_2SO_4$ | 0.47$^{c}$ | 6 | 0.34$^{c}$ | 6 | 0.51$^{c}$ | 1 | 0.93$^{a}$ | 1 | 1.02$^{d}$ | 2 | 0.87$^{b}$ | 6 | 22 |
| | | KCl | 0.68$^{ba}$ | 3 | 0.39$^{bc}$ | 4 | 0.62$^{bc}$ | 2 | 1.11$^{a}$ | 1 | 1.03$^{cb}$ | 4 | 1.05$^{a}$ | 1 | 15 |
| | | WS | 0.79$^{a}$ | 1 | 0.62$^{a}$ | 1 | 0.88$^{a}$ | 6 | 0.96$^{a}$ | 1 | 1.04$^{b}$ | 5 | 1.05$^{a}$ | 1 | 15 |
| | | NS | 0.78$^{a}$ | 1 | 0.46$^{bac}$ | 3 | 0.72$^{ba}$ | 4 | 1.01$^{a}$ | 1 | 1.06$^{a}$ | 6 | 0.98$^{ba}$ | 5 | 20 |
| | 7 | GM1000 | 0.34$^{b}$ | 3 | 0.23$^{bc}$ | 5 | 0.31$^{ba}$ | 2 | 1.08$^{cb}$ | 5 | 1.00$^{b}$ | 2 | 0.97$^{a}$ | 1 | 18 |
| | | GM660 | 0.37$^{b}$ | 3 | 0.27$^{ba}$ | 2 | 0.37$^{a}$ | 3 | 1.41$^{b}$ | 2 | 1.01$^{ba}$ | 5 | 0.90$^{a}$ | 1 | 16 |
| | | $K_2SO_4$ | 0.65$^{a}$ | 1 | 0.31$^{a}$ | 1 | 0.40$^{a}$ | 3 | 1.41$^{b}$ | 2 | 1.00$^{b}$ | 2 | 0.97$^{a}$ | 1 | 10 |
| | | KCl | 0.34$^{b}$ | 3 | 0.26$^{ba}$ | 2 | 0.33$^{a}$ | 3 | 0.88$^{c}$ | 6 | 1.00$^{b}$ | 2 | 1.02$^{a}$ | 1 | 17 |
| | | WS | 0.59$^{a}$ | 1 | 0.28$^{ba}$ | 2 | 0.34$^{a}$ | 3 | 1.96$^{a}$ | 1 | 0.97$^{c}$ | 1 | 1.00$^{a}$ | 1 | 9 |
| | | NS | 0.28$^{b}$ | 3 | 0.16$^{c}$ | 6 | 0.22$^{b}$ | 1 | 1.44$^{b}$ | 2 | 1.02$^{a}$ | 6 | 0.94$^{a}$ | 1 | 19 |
| | 14 | GM1000 | 0.12$^{c}$ | 4 | 0.09$^{c}$ | 5 | 0.13$^{b}$ | 1 | 1.01$^{bc}$ | 3 | 1.01$^{b}$ | 2 | 0.85$^{a}$ | 1 | 16 |
| | | GM660 | 0.10$^{c}$ | 4 | 0.09$^{c}$ | 5 | 0.13$^{b}$ | 1 | 0.77$^{c}$ | 5 | 1.01$^{b}$ | 2 | 0.92$^{a}$ | 1 | 18 |
| | | $K_2SO_4$ | 0.19$^{b}$ | 3 | 0.12$^{ba}$ | 3 | 0.17$^{b}$ | 1 | 0.96$^{bc}$ | 3 | 1.01$^{b}$ | 2 | 0.78$^{a}$ | 1 | 13 |
| | | KCl | 0.23$^{ba}$ | 2 | 0.09$^{bc}$ | 4 | 0.14$^{b}$ | 1 | 1.67$^{a}$ | 1 | 1.01$^{b}$ | 2 | 0.83$^{a}$ | 1 | 11 |
| | | WS | 0.11$^{c}$ | 4 | 0.13$^{a}$ | 1 | 0.17$^{b}$ | 1 | 0.86$^{c}$ | 5 | 0.98$^{c}$ | 1 | 0.76$^{a}$ | 1 | 13 |
| | | NS | 0.27$^{a}$ | 1 | 0.15$^{a}$ | 1 | 0.22$^{a}$ | 6 | 1.37$^{ba}$ | 2 | 1.03$^{a}$ | 6 | 0.85$^{a}$ | 1 | 17 |

Cul: ප්‍රභේදය DAS: දියර ඉසීමෙන් පසු දින ගණන, A: ප්‍රභාසංශ්ලේෂණ වේගය (µmol $m^{-2}$ $s^{-1}$), Gs: පූටිකා විවර වීම (mmol $m^{-2}$ $s^{-1}$), E: උත්ස්වේදන වේගය (mmol $m^{-2}$ $s^{-1}$), WUE: ජල භාවිතයේ කාර්යක්ෂමතාවය (A/E), Tleaf: ශාක පත්‍රයේ උෂ්ණත්වය (°C), RWC: සාපේක්ෂ ජල අන්තර්ගතය (%), TSS: මුලු ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය (mg $g^{-1}$ dry weight), PRO: ප්‍රෝලීන ප්‍රමාණය (µg $g^{-1}$ dry weight), R: ශ්‍රේණිය සහ RSI: නියඟයට ඔරොත්තු දී මේ හැකියාව දක්වන දර්ශකය. WS, NS, $K_2SO_4$, KCl, GM1000 සහ GM660 යනු ඉහත විස්තර කරන ලද ප්‍රතිකාරක වේ

නියඟයට ඔරොත්තු දීමේ හැකියාවෙන් අඩු ටීආර්අයි 2023 ප්‍රභේදයේ පුටිකා විවරවීමට අදාළ ඩීටීඅයි අගය, GM1000 ප්‍රතිකාරකයට පසුව පර්යේෂණය පුරාවටම සැලකිය යුතු ලෙස ඉහළම අගයක් පෙන්වන ලදී. නියඟයට ඔරොත්තු දීමේ හැකියාවෙන් වැඩි ටීආර්අයි 2025 ප්‍රභේදයේ විශේෂයෙන්ම ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව නියඟය තීව්‍රවීමේ දී දිගු දාම මේද මධ්‍යසාර සාන්ද්‍රණ දෙක මගින්ම පුටිකා විවර වීමට අදාළ ඩීටීඅයි අගය අවම වන බව පෙන්නුම් කරන ලදී. මෙ මඟින් ඇඟවෙනුයේ GM1000 ප්‍රතිකාරකය මගින් නියඟයට පාත්‍ර තේ ප්‍රභේදයන්ගේ (ටීආර්අයි 2023) නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවමින් ආතති තත්ව අවම කිරීමට දායකත්වයක් දක්වන නමුදු එම ක්‍රියාවලියත් ශාක පත්‍ර මතට ජලය ඉසීමත් අතර සැලකිය යුතු වෙනසක් නොමැති බවයි. එසේ නමුදු මෙම ප්‍රවණතාවය නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සහිත තේ ටීආර්අයි 2025 ප්‍රභේදයෙහි දක්නට නොලැබුණි. ටීආර්අයි 2025 හි ප්‍රතිකාර ලබාදීමෙන් දින් 7 කට පසුව $K_2SO_4$ ප්‍රතිකාරකය මගින් පුටිකා විවරවීමට අදාළ ඩීටීඅයි අගය සැලකිය යුතු ලෙස ඉහළම අගයක් පෙන්වූ නමුත් එම අගය KCl, WS හෝ GM660 සමඟ සැලකිය යුතු වෙනසක් නොපෙන්වන ලදී. තව ද නියඟය තීව්‍රවීමේදී නියඟයට ඔරොත්තු දීමේ හැකියාවෙන් වැඩි ටීආර්අයි 2025 ප්‍රභේදයේ විශේෂයෙන්ම ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව එයට ආවේණික වූ නියඟයට ඔරොත්තුදීමේ හැකියාව පෙන්වන ලක්ෂණවල බලපෑම ලබාදෙන ලද ප්‍රතිකාරකවලට වඩා සැලකිය යුතු ලෙස වැඩි වෙන බවද නිරීක්ෂණය කෙරිණි (රූපසටහන 7).




රූපසටහන 7. ප්‍රතිකාරක ලබාදීමෙන් පසු සහ තේ පැළ තීව්‍ර වෙමින් යන නියඟයකට භාජනය කිරීමෙන් පසුව පර්යේෂණය පුරාවට a) ටීආර්අයි 2023 (TRI 2023) සහ b) ටීආර්අයි 2025 (TRI 2025) ප්‍රභේදවල පුටිකා විවර වීමට අදාළ ඩීටීඅයි අගය (ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත)

GM1000 ප්‍රතිකාරක ලබාදීමෙන් ටී ආර් අයි 2025 ප්‍රභේදයේ උත්ස්වේදන වේගය අඩු වුවත් එම අඩු වීම NS හෝ WS ප්‍රතිකාරකවලට සාපේක්ෂකව සැලකිය යුතු වෙනසක් නොපෙන්වන ලදී (රූපසටහන 8).




රූපසටහන 8. ප්‍රතිකාරක ලබාදීමෙන් පසු සහ තේ පැළ තීව්‍ර වෙමින් යන නියඟයකට භාජනය කිරීමෙන් පසුව පර්යේෂණය පුරාවට a) ටීආර්අයි 2023 (TRI 2023) සහ b) ටීආර්අයි 2025 (TRI 2025) ප්‍රභේදවල උත්ස්වේදන වේගයට අදාළ ඩීටීඅයි අගය (ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත )

සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණයේ දී එම මොඩලවල සැලකිය යුතු වෙනස්කම් දැකගත නොහැකිවීම නිසා තේ ශාක පත්‍රවල මුලු ද්‍රාව්‍ය සීනි සහ ප්‍රෝලීන ප්‍රමාණ සඳහා මෙම ප්‍රතිකාරකවල බලපෑම පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට නොහැකි විය. තවද ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට සහ 21 කට පසුව ලබා ගත් දෘශ්‍යමය දත්තයන්ගේද ලබා දෙන ලද විවිධ ප්‍රතිකාරක අතර වෙනස්කම් දැකගත නොහැකි විය. අවසාන තීරණය සදහා යොදා ගන්නා ලද සංඛ්‍යාත්මක දත්ත සහ ගණනය කරන ලද RSI අගයන් ටීආර්අයි 2023 සහ ටීආර්අයි 2025 සඳහා පිළිවෙලින් වගුව 2 සහ වගුව 3 හි දක්වා ඇත. එක් එක් ප්‍රතිකාරකය සදහා ගණනය කරන ලද RSI අගයන් ප්‍රතිකාරක ලබාදීමට පසුව දත්ත ලබා ගන්නා ලද එක් එක් දිනයට අදාළ සාමාන්‍ය අගයට සමාන හෝ අඩු වූ ප්‍රතිකාරක තේ තවාන් පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සදහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග ලෙස හදුනා ගන්නා ලදී.

වගුව 2. ටීආර්අයි 2023 තේ ප්‍රභේදය සදහා අවසාන තීරණය සදහා යොදා ගන්නා ලද සංඛ්‍යාත්මක දත්ත සහ ගණනය කරන ලද RSI අගයන්

| DAS | Treatment | RSI | Min | Max | Median | Mean |
|---|---|---|---|---|---|---|
| 3 | KCl | 10 | 10 | 29 | 15 | 18 |
| | GM1000 | 14 | | | | |
| | WS | 14 | | | | |
| | GM660 | 16 | | | | |
| | $K_2SO_4$ | 26 | | | | |
| | NS | 29 | | | | |
| 7 | WS | 11 | 11 | 25 | 17 | 17 |
| | GM1000 | 13 | | | | |
| | GM660 | 17 | | | | |
| | $K_2SO_4$ | 17 | | | | |
| | KCl | 18 | | | | |
| | NS | 25 | | | | |
| 14 | WS | 12 | 12 | 24 | 15 | 16 |
| | NS | 12 | | | | |
| | $K_2SO_4$ | 14 | | | | |
| | GM660 | 16 | | | | |
| | GM1000 | 17 | | | | |
| | KCl | 24 | | | | |

DAS: ප්‍රතිකාරක දියර ලෙස ඉසීමෙන් පසු දින ගණන, Treatment: ප්‍රතිකාරක, RSI: නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකය, Min: අවම අගය, Max: උපරිම අගය, Median: මධ්‍යන්‍ය අගය, Mean: සාමාන්‍ය අගය, WS, NS, $K_2SO_4$, KCl, GM 1000 සහ GM 660 යනු ඉහත විස්තර කරන ලද ප්‍රතිකාරක වේ.

ඒ අනුව ටීආර්අයි 2023 සඳහා ලබදුන් ප්‍රතිකාරකය මඟින් එම ප්‍රභේදයේ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දත්ත ලබාගන්නා ලද සියලුම කාල පරාසවලදී වැඩි කරනු ලැබූව ද, එම වැඩි වීමත් WS ප්‍රතිකාරකය මඟින් සිදුකරනු ලැබූ වැඩි වීමත් අතර සැලකිය යුතු වෙනස්කමක් දක්නට නොලැබුණි. තව ද ටීආර්අයි 2025 ප්‍රභේදයේ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව WS ප්‍රතිකාරකයට සාපේක්ෂව වැඩි කිරීමට දත්ත ලබාගන්නා ලද කිසිම කාල පරාසයකදී කිසිම ප්‍රතිකාරකයකට නොහැකි විය (වගුව 3).

වගුව 3. ටීආර්අයි 2025 තේ ප්‍රභේදය සඳහා අවසාන තීරණය සඳහා යොදා ගන්නා ලද සංඛ්‍යාත්මක දත්ත සහ ගණනය කරන ලද RSI අගයන්

| DAS | Treatment | RSI | Min | Max | Median | Mean |
|---|---|---|---|---|---|---|
| 3 | GM660 | 13 | 13 | 22 | 16 | 17 |
| | KCl | 15 | | | | |
| | WS | 15 | | | | |
| | GM1000 | 16 | | | | |
| | NS | 20 | | | | |
| | $K_2SO_4$ | 22 | | | | |
| 7 | WS | 9 | 9 | 19 | 17 | 15 |
| | $K_2SO_4$ | 10 | | | | |
| | GM660 | 16 | | | | |
| | KCl | 17 | | | | |
| | GM1000 | 18 | | | | |
| | NS | 19 | | | | |
| 14 | KCl | 11 | 11 | 18 | 15 | 15 |
| | $K_2SO_4$ | 13 | | | | |
| | WS | 13 | | | | |
| | GM1000 | 16 | | | | |
| | NS | 17 | | | | |
| | GM660 | 18 | | | | |

DAS: ප්‍රතිකාරක දියර ලෙස ඉසීමෙන් පසු දින ගණන, Treatment: ප්‍රතිකාරක, RSI: නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකය, Min: අවම අගය, Max: උපරිම අගය, Median: මධ්‍යන්‍ය අගය, Mean: සාමාන්‍ය අගය, WS, NS, $K_2SO_4$, KCl, GM1000 සහ GM660 යනු ඉහත විස්තර කරන ලද ප්‍රතිකාරක වේ.

අවසාන නිගමනය ලෙස දිගු දාම සහිත මේද මධ්‍යසාර පත්‍ර මතට ඉසීම තුළින් තේ තවාන් පැළවල නියඟයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිකිරීම හෝ උත්ස්වේදනය අඩු කිරීම කෙරෙහි පත්‍ර මතට ජලය ඉසීමට සාපේක්ෂව කිසිදු අමතර වාසියක් අත් කර ගත නොහැකි බව සොයා ගන්නා ලදී.

**2.2. ක්ෂේත්‍ර තත්ව යටතේ නොමේරූ තේ පැළවල ප්‍රතිචාර ඇගයීම සඳහා සිදු කරන ලද පර්යේෂණය**

ලබාදෙන ලද ප්‍රතිකාරකවලින් තේ තවාන් පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම වෙනුවෙන් පාලිත තත්ව යටතේ වීදුරු ගෘහය හෝ වැසි ආවරණය තුළ සිදු කරන ලද පර්යේෂණයෙන් කිසිදු අමතර වාසියක් නොලැබීම නිසා හොඳින් ජලය ලබාදෙන ලද ප්‍රතිකාරකය හැර අන් සියලුම ප්‍රතිකාරක ක්ෂේත්‍ර තත්ව යටතේ නොමේරූ තේ පැළවල ප්‍රතිචාර ඇගයීම සඳහාද ලබාදෙන ලදී. මෙම පර්යේෂණය තලවාකැලේ (WU2) බෙයාර්වෙල් වතුයායේ ෆෙයාර්ෆීල්ඩ් කොටසේ ක්ෂේත්‍ර අංක 08NC හිදී වසර තුනක් වයසැති ටීආර්අයි 4078 නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සහිත තේ ප්‍රභේදය යොදා ගනිමින් සිදු කරන ලදී. මෙම ප්‍රදේශයේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර 2250ක් ද උපරිම සහ අවම උෂ්ණත්වය පිළිවෙලින් සෙන්ටිග්‍රේඩ් අංශක 22.5ක් සහ 14 ක් ද වේ. ආර් සී බී ඩී පර්යේෂණ සැලැස්ම භාවිතා කරමින් කාණ්ඩ දෙකක් සහිතව සංඛ්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. තේ පැළ මධ්‍යස්ථ පාංශු තෙතමන ආතතියකට ලක්වීමෙන් පසුව එනම් ගුරුමිතික පාංශු තෙතමන අන්තර්ගතය 28.93%ක් වූ පසුව ඉහත විස්තර කල පරිදි හොඳින් ජලය ලබාදුන් ප්‍රතිකාරකය හැර අනෙකුත් ප්‍රතිකාරක ලබාදෙන ලදී. ඉහත පර්යේෂණය 2.1 හි විස්තර කළ පරිදි ශාක කායික විද්‍යාත්මක සහ ජීව රසායනික පරාමිතික ප්‍රතිකාරක ලබාදීමෙන් දින 7, 14 සහ 21කට පසුව අස්වනු සංරචක ද සමග ලබා ගන්නා ලදී. වර්ෂාපතනයට පසුව තේ පැළ නැවත යථා තත්වයට පත්වීමේ ප්‍රවණතාවය ද ඉහත විස්තර කළ පරාමිතිකම යොදා ගනිමින් සැලකිය යුතු වර්ෂාපතනයකට පසුව එනම් ප්‍රතිකාරක ලබාදීමෙන් දින 75කට පසුව මනිනු ලැබීය.

ලබා ගන්නා ලද දත්ත සම්මත ආකරයට SAS v9 සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණ මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. බහු නිර්ණායක ක්‍රමවේදයක් වන ශ්‍රේණිගත සාරාංශ දර්ශකයක් (Rank

Summation Index - RSI) යොදා ගෙන ප්‍රතිකාරකවල ඵලදායීතාවය පිළිබඳ අවසාන තීරණය ලබා ගන්නා ලදී.

මෙම ක්ෂේත්‍ර අධ්‍යයනයෙ හි දී සාමාන්‍ය ගුරුමිතික පාංශු තෙතමනය ප්‍රතිකාරක ලබාදීමෙන් දින 7 සහ 1 හි දී සැලකිය යුතු ලෙස වෙනසක් නොපෙන්වන ලද අතර එහි අගය ආසන්න වශයෙන් 22%-23% විය සාමාන්‍ය ගුරුමිතික පාංශු තෙතමනය ප්‍රතිකාරක ලබාදීමෙන් දින 21 කට පසුව අවම අගයක් එනම්, 19.9% ලෙස දක්නට ලැබුණි. තව ද වර්ෂාපතනයට පසුව තේ පැළ නැවත යථා තත්වයට පත්වීම පිළිබඳව දත්ත ලබා ගන්නා ලද දිනයේ දී එම අගය උපරිම (27.04%) බව ද දක්නට ලැබුණි. නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඇගයීම සඳහා දර්ශක ලෙස යොදා ගන්නා ලද එක් එක් ශාක කායික විද්‍යාත්මක සහ ජීව රසායනික දත්ත සඳහා ලබා දුන් ශ්‍රේණි (R) සහ ගණනය කරනු ලැබූ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකයේ (RSI) සාමාන්‍ය අගයන් වගුව 4 හි දක්වා ඇත. ඒ අනුව විවිධ දත්ත ලබාගනු ලැබූ කාල පරාස සහ ලබාදුන් ප්‍රතිකාරක සඳහා දක්නට ලැබුණු ප්‍රතිචාර විවිධාකාර බව දක්නට ලැබුණි.

ප්‍රතිකාරක ලබාදීමෙන් දින 7 කට පසුව ලබා දෙන ලද විවිධ ප්‍රතිකාරක සඳහා අධ්‍යයනය කරනු ලැබූ පරාමිතිකවල පැහැදිලි වෙනස්කම් රටාවන් දැක ගත නොහැකි වුව ද නියඟය තීව්‍ර වත්ම නියඟයේ බලපෑමත් ලබාදුන් විවිධ ප්‍රතිකාරකවල වෙනස් ප්‍රතිචාර රටාවනුත් පැහැදිලිව දැක ගත හැකිවිය.

වගුව 4. ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලද නොමේරූ තේ පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඇගයීම සඳහා දර්ශක ලෙස යොදා ගන්නා ලද එක් එක් ශාක කායික විද්‍යාත්මක සහ ජීව රසායනික දත්ත සඳහා ලබා දුන් ශ්‍රේණි (R) සහ ගණනය කරනු ලැබූ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකයේ (RSI) සාමාන්‍ය අගයන්

| DAS | Treatment | A | R | Gs | R | E | R | WUE | R | Tleaf | R | RWC | R | TSS | R | Proline | R | RSI |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | GM1000 | 6.1 $^{a}$ | 1 | 95.9 $^{a}$ | 1 | 3.1 $^{b}$ | 1 | 2.0 $^{a}$ | 1 | 31.8 $^{ba}$ | 5 | 81.65 $^{ba}$ | 2 | 57.09 $^{c}$ | 5 | 51.57 $^{ba}$ | 2 | 19 |
| | GM660 | 6.5 $^{a}$ | 1 | 113.4 $^{a}$ | 1 | 3.3 $^{ba}$ | 5 | 2.0 $^{a}$ | 1 | 31.5 $^{bc}$ | 2 | 77.20 $^{b}$ | 5 | 59.24 $^{c}$ | 5 | 73.55 $^{ba}$ | 2 | 22 |
| | $K_2SO_4$ | 6.1 $^{a}$ | 1 | 115.2 $^{a}$ | 1 | 3.4 $^{a}$ | 6 | 1.8 $^{ba}$ | 5 | 31.5 $^{bc}$ | 2 | 83.54 $^{a}$ | 1 | 78.21 $^{b}$ | 2 | 92.05 $^{a}$ | 1 | 19 |
| | KCl | 5.9 $^{a}$ | 1 | 99.7 $^{a}$ | 1 | 3.1 $^{b}$ | 1 | 1.9 $^{a}$ | 1 | 31.2 $^{c}$ | 1 | 80.74 $^{ba}$ | 2 | 62.53 $^{cb}$ | 3 | 35.88 $^{b}$ | 4 | 14 |
| | WS | 5.8 $^{a}$ | 1 | 94.3 $^{a}$ | 1 | 3.0 $^{b}$ | 1 | 1.9 $^{a}$ | 1 | 31.6 $^{b}$ | 4 | 76.79 $^{b}$ | 5 | 60.59 $^{cb}$ | 3 | 45.05 $^{b}$ | 4 | 20 |
| | NS | 4.8 $^{b}$ | 6 | 118.1 $^{a}$ | 1 | 3.1 $^{b}$ | 1 | 1.7 $^{b}$ | 6 | 32.1 $^{a}$ | 6 | 80.94 $^{ba}$ | 2 | 96.81 $^{a}$ | 1 | 31.40 $^{b}$ | 4 | 27 |
| 14 | GM1000 | 4.3 $^{c}$ | 3 | 67.7 $^{c}$ | 5 | 2.3 $^{c}$ | 1 | 2.0 $^{a}$ | 1 | 32.0 $^{a}$ | 5 | 81.20 $^{c}$ | 5 | 94.53 $^{a}$ | 1 | 45.05 $^{a}$ | 1 | 22 |
| | GM660 | 5.4 $^{a}$ | 1 | 164.2 $^{a}$ | 1 | 3.5 $^{a}$ | 6 | 1.6 $^{b}$ | 4 | 30.6 $^{c}$ | 1 | 83.75 $^{ba}$ | 2 | 71.26 $^{b}$ | 4 | 34.97 $^{a}$ | 1 | 20 |
| | $K_2SO_4$ | 4.4 $^{c}$ | 3 | 66.6 $^{c}$ | 5 | 2.3 $^{c}$ | 1 | 2.0 $^{a}$ | 1 | 32.2 $^{a}$ | 5 | 81.99 $^{bc}$ | 4 | 83.92 $^{ba}$ | 3 | 35.60 $^{a}$ | 1 | 23 |
| | KCl | 4.9 $^{b}$ | 2 | 101.0 $^{b}$ | 2 | 2.7 $^{b}$ | 3 | 1.8 $^{a}$ | 1 | 30.9 $^{cb}$ | 3 | 85.18 $^{a}$ | 1 | 95.53 $^{a}$ | 1 | 23.90 $^{b}$ | 5 | 18 |
| | WS | 4.0 $^{c}$ | 3 | 102.6 $^{b}$ | 2 | 2.8 $^{b}$ | 3 | 1.4 $^{b}$ | 4 | 30.8 $^{c}$ | 1 | 82.95 $^{bac}$ | 3 | 73.44 $^{b}$ | 4 | 37.97 $^{a}$ | 1 | 21 |
| | NS | 4.0 $^{c}$ | 3 | 96.4 $^{b}$ | 2 | 2.8 $^{b}$ | 3 | 1.5 $^{b}$ | 4 | 31.3 $^{b}$ | 4 | 80.86 $^{c}$ | 5 | 45.29 $^{c}$ | 6 | 23.83 $^{b}$ | 5 | 32 |
| 21 | GM1000 | - | - | 361.1 $^{b}$ | 6 | - | - | - | - | 31.6 $^{a}$ | 6 | 82.82 $^{ba}$ | 2 | 141.04 $^{a}$ | 1 | 134.58 $^{a}$ | 1 | 17 |
| | GM660 | - | - | 505.0 $^{a}$ | 1 | - | - | - | - | 29.0 $^{c}$ | 1 | 78.03 $^{c}$ | 6 | 63.91 $^{c}$ | 5 | 86.08 $^{dc}$ | 4 | 18 |
| | $K_2SO_4$ | - | - | 474.7 $^{ba}$ | 5 | - | - | - | - | 31.1 $^{ba}$ | 3 | 80.02 $^{bc}$ | 3 | 86.43 $^{bc}$ | 4 | 101.42 $^{bc}$ | 3 | 19 |
| | KCl | - | - | 570.7 $^{a}$ | 1 | - | - | - | - | 30.7 $^{ba}$ | 3 | 85.66 $^{a}$ | 1 | 127.96 $^{ba}$ | 2 | 70.18 $^{d}$ | 6 | 14 |
| | WS | - | - | 524.7 $^{a}$ | 1 | - | - | - | - | 30.3 $^{b}$ | 2 | 79.86 $^{bc}$ | 3 | 62.99 $^{c}$ | 5 | 79.67 $^{dc}$ | 4 | 16 |
| | NS | - | - | 506.1 $^{a}$ | 1 | - | - | - | - | 30.9 $^{ba}$ | 3 | 80.12 $^{bc}$ | 3 | 138.56 $^{ba}$ | 2 | 121.00 $^{ba}$ | 2 | 12 |
| 75 | GM1000 | - | - | 855.3 $^{b}$ | 6 | - | - | - | - | 31.0 $^{bc}$ | 2 | 83.13 $^{cb}$ | 3 | 57.86 $^{c}$ | 4 | 25.83 $^{b}$ | 2 | 17 |
| | GM660 | - | - | 1241.5 $^{a}$ | 1 | - | - | - | - | 30.6 $^{bc}$ | 2 | 82.55 $^{c}$ | 4 | 44.25 $^{d}$ | 6 | 52.18 $^{b}$ | 2 | 15 |
| | $K_2SO_4$ | - | - | 1027.8 $^{ba}$ | 3 | - | - | - | - | 30.2 $^{bc}$ | 2 | 91.06 $^{a}$ | 1 | 83.50 $^{a}$ | 1 | 33.35 $^{b}$ | 2 | 9 |
| | KCl | - | - | 1347.0 $^{a}$ | 1 | - | - | - | - | 29.6 $^{c}$ | 1 | 86.67 $^{b}$ | 2 | 76.75 $^{ba}$ | 2 | 41.31 $^{b}$ | 2 | 8 |
| | WS | - | - | 1087.3 $^{ba}$ | 3 | - | - | - | - | 32.9 $^{a}$ | 6 | 81.88 $^{c}$ | 4 | 61.43 $^{c}$ | 4 | 110.16 $^{a}$ | 1 | 18 |
| | NS | - | - | 1015.1 $^{ba}$ | 3 | - | - | - | - | 31.5 $^{ba}$ | 5 | 79.50 $^{c}$ | 4 | 70.03 $^{bc}$ | 3 | 17.93 $^{b}$ | 2 | 17 |

DAS: ප්‍රතිකාරක දියර ලෙස ඉසීමෙන් පසු දින ගණන, A: ප්‍රභාසංශ්ලේෂණ වේගය ($\mu$mol $m^{-2}$ $s^{-1}$), Gs: පූටිකා විවර වීම (mmol $m^{-2}$ $s^{-1}$), E: උත්ස්වේදන වේගය (mmol $m^{-2}s^{-1}$), WUE: ජල භාවිතයේ කාර්යක්ෂමතාවය (A/E), Tleaf: ශාක පත්‍රයේ උෂ්ණත්වය ($^{o}$C), RWC: සාපේක්ෂ ජල අන්තර්ගතය (%), TSS: මුලු ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය (mg g-1 dry weight), PRO: ප්‍රෝලීන ප්‍රudKh ($\mu$g $g^{-1}$ dry weight), R: ශ්‍රේණි සහ RSI: නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකය. WS, NS, $K_2SO_4$, KCl, GM1000 සහ GM660 යනු ඉහත විස්තර කරන ලද ප්‍රතිකාරක වේ.

GM1000 සහ $K_2SO_4$ ප්‍රතිකාරක ලබාදෙන ලද ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලද නොමේරූ තෙ පැළවල උත්ස්වේදන වේගයේ සැලකිය යුතු අඩුවීමක් ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව දැක ගත හැකිවිය. මෙම ප්‍රතිකාරක නිසාවෙන් තේ ශාක පත්‍රවල ජල වාෂ්ප සඳහා අවම පූටිකා විවර වීමක් පෙන්නුම් කිරීම මේ සඳහා හේතු වන්නට ඇත. තවද GM1000, $K_2SO_4$ සහ KCl ප්‍රතිකාරක මගින් උපරිම ජල භාවිතයේ කාර්යක්ෂමතාවයක්ද ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව පෙන්වන ලදී. උත්ස්වේදන වේගය මැනීමට යොදා ගන්නා ලද උපකරණවල දෝෂ ඇතිවීම නිසා ඒ පිළිබඳව ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව තවදුරටත් දත්ත ලබා ගැනීමට නොහැකි වුවද GM1000 ප්‍රතිකාරකය මගින් පර්යේෂණය පුරාවටම ජල වාෂ්ප සඳහා පූටිකා විවර වීම සැලකිය යුතු ලෙස අඩු කරන බව දක්නට ලැබුණි. උත්ස්වේදන වේගය සහ පූටිකා විවර වීම අතර සැලකිය යුතු ධනාත්මක සම්බන්ධතාවයක් පවතින (දත්ත පෙන්වා නොමැත) නිසා එම GM1000 ප්‍රතිකාරකය මගින් උත්ස්වේදන වේගයේද සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය. තේ ශාක පත්‍ර වල මුලු ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය (KCl සහ $K_2SO_4$ ප්‍රතිකාරක සමග සැලකිය යුතු වෙනසක් නොමැත) සහ ප්‍රෝලීන ප්‍රමාණය (GM660 සහ $K_2SO_4$ ප්‍රතිකාරක සමග සැලකිය යුතු වෙනසක් නොමැත) GM1000 ප්‍රතිකාරකය මගින් ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව සැලකිය යුතු ලෙස ඉහළම අගයක් එනම් නියගයට ඔරොත්තු දීම සඳහා ධනාත්මක ප්‍රතිඵල ලබා දුන්න ද එමගින් ශාක පත්‍රවල සාපේක්ෂ ජල අන්තර්ගතය සැලකිය යුතු ලෙස අවම කරනු ලැබීය (NS, $K_2SO_4$ සහ WS ප්‍රතිකාරක සමඟ සැලකිය යුතු වෙනසක් නොමැත). එය එසේ වුවද ප්‍රතිකාරකය ලබාදුන් ශාක පත්‍ර වල ප්‍රතිකාරක ලබාදීමෙන් දින් 14 කට පසුව සැලකිය යුතු ලෙස උපරිම උත්ස්වේදන වේගයක් දක්නට ලැබුණි. මේ සඳහා එම ප්‍රතිකාරකය මගින් ශාක පත්‍රවල සැලකිය යුතු ලෙස ඉහළ දමන ලද පූටිකා විවර වීම බලපාන්නට ඇත. තවද මෙම ප්‍රතිකාරකය නිසා තේ ශාක පත්‍රවල සැලකිය යුතු ලෙස අවම ජල භාවිතයේ කාර්යක්ෂමතාවයක්ද පෙන්වන ලද අතර එම අගය එම දත්ත ලබා ගන්නා ලද කාල පරාසයේ දී WS සහ NS ප්‍රතිකාරක සමග සැලකිය යුතු වෙනසක් නොපෙන්වන ලදී. GM ප්‍රතිකාරකයේ මෙවැනි එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලපෑම් මඟින් ගම්‍ය වනුයේ එමගින් අපේක්ෂිත ශාකවල උත්ස්වේදන වේගය අඩුකිරීමේ සහ ආතතිය අඩු කිරීමේ බලපෑම ලබා ගැනීමට නම් නිවැරදි මාත්‍රාව තෝරාගත යුතු බවයි.

අවසාන තීරණය සඳහා යොදා ගන්නා ලද සංඛ්‍යාත්මක දත්ත සහ ගණනය කරන ලද RSI අගයන් වගුව 5හි දක්වා ඇත.

වගුව 5. අවසාන තීරණය සඳහා යොදා ගන්නා ලද සංඛ්‍යාත්මක දත්ත සහ ගණනය කරන ලද RSI අගයන්

| DAS | Treatment | RSI | min | max | median | Mean |
|---|---|---|---|---|---|---|
| 7 | **KCl** | **14** | 14 | 27 | 20 | **20** |
| | **GM1000** | **19** | | | | |
| | **$K_2SO_4$** | **19** | | | | |
| | **WS** | **20** | | | | |
| | GM660 | 22 | | | | |
| | NS | 27 | | | | |
| 14 | **KCl** | **18** | 18 | 32 | 22 | **23** |
| | **GM660** | **20** | | | | |
| | **WS** | **21** | | | | |
| | **GM1000** | **22** | | | | |
| | **$K_2SO_4$** | **23** | | | | |
| | NS | 32 | | | | |
| 21 | **NS** | **12** | 12 | 19 | 17 | **16** |
| | **KCl** | **14** | | | | |
| | **WS** | **16** | | | | |
| | GM1000 | 17 | | | | |
| | GM660 | 18 | | | | |
| | $K_2SO_4$ | 19 | | | | |
| 75 | **KCl** | **8** | 8 | 18 | 16 | **14** |
| | **$K_2SO_4$** | **9** | | | | |
| | GM660 | 15 | | | | |
| | GM1000 | 17 | | | | |
| | NS | 17 | | | | |
| | WS | 21 | | | | |

DAS: ප්‍රතිකාරක දියර ලෙස ඉසීමෙන් පසු දින ගණන, Treatment: ප්‍රතිකාරක, RSI: නියඟයට ඔරොත්තු දීමේ හැකියාව දක්වන දර්ශකය, Min: අවම අගය, Max: උපරිම අගය, Median: මධ්‍යන්‍ය අගය, Mean: සාමාන්‍ය අගය, WS, NS, $K_2SO_4$, KCl, GM1000 සහ GM660 යනු ඉහත විස්තර කරන ලද ප්‍රතිකාරක වේ.

මෙම අධ්‍යයනයේදී නොමේරූ තේ පැළවල ආතති තත්වයන් මඟහැරවීමට දායකවේ යැයි සලකන ලද ලක්ෂණ අටක් නම් වශයෙන් ප්‍රභාසංශ්ලේෂණ වේගය (A), පූටිකා විවර වීම (Gs), උත්ස්වේදන වේගය (E), ජල භාවිතයේ කාර්යක්ෂමතාවය (WUE), ශාක පත්‍රයේ උෂ්ණත්වය (Tleaf), සාපේක්ෂ ජල අන්තර්ගතය (RWC), මුලු ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය (TSS), සහ ප්‍රෝලීන ප්‍රමාණය (PRO) ඇගයීම සඳහා යොදා ගන්නා ලදී. එක් එක් ප්‍රතිකාරකය සඳහා ගණනය කරන ලද RSI අගයන් ප්‍රතිකාරක ලබාදීමට පසුව දත්ත ලබා ගන්නා ලද එක් එක් දිනයට අදාළ සාමාන්‍ය අගයට සමාන හෝ අඩු වූ ප්‍රතිකාරක නොමේරූ තේ පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග ලෙස හඳුනා ගන්නා ලදී.

ඒ අනුව ප්‍රතිකාරක යෙදීමෙන් දින 7 කට පසුව එනම් මධ්‍යස්ථ පාංශු තෙතමන ආතතියකදී KCl, K2SO4, GM1000 ප්‍රතිකාරක මෙන්ම WS ප්‍රතිකාරකය මඟින්ද නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට මෙන්ම ආතති තත්ව සමනය කිරීමටද උපකාරීවෙයි. එසේම කාලයත් සමගම GM660 ප්‍රතිකාරකයද ඉහත දැක්වූ ප්‍රතිකාරක මෙන්ම ප්‍රතිකාරක ලබාදීමෙන් දින 14 කට පසුව මධ්‍යස්ථ නියඟයකදී තේ පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සඳහා ධනාත්මකව යොදා ගත හැකිය. තවදුරටත් නියඟය තීව්‍ර වීමේදී එනම් ප්‍රතිකාරක ලබාදීමෙන් දින 21 කට පසුව NS, KCl

සහ WS ප්‍රතිකාරක පමණක් නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සඳහා දායක වූ අතර $K_2SO_4$ ප්‍රතිකාරකය ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශය පරිදි නැවත යෙදීමේ අවශ්‍යතාවය ඉස්මතු කරමින් වාසිදායක ප්‍රතිඵල නොපෙන්වන ලදී. එවැනි අවස්ථාවල ඒ හා සමානවම GM1000 ප්‍රතිකාරකය නවත නැවත දින 14 කට වරක් පත්‍ර මතට ඉසීම තුලින්ද නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කර ගත හැකි බව මෙයින් අනුමාන කල හැකිය. නමුත් වර්ෂාපතනයට පසුව තේ පැළ යථා තත්වයට ගෙන ඒමේ ප්‍රවණතාවය සැලකීමේදී KCl සහ $K_2SO_4$ යන ප්‍රතිකාරක පමණක් ධනාත්මක ප්‍රතිචාර ලබාදෙන ලදී. වාර්ෂික බෝගයක් මෙන් නොව තේ වැනි බහු වාර්ෂික බෝගයක් සැලකීමේදී නියඟයකදී ශාක නොනැසී පවත්වා ගැනීම පමණක් නොව නියඟයකට පසුව වර්ෂාපතනය ලැබීමෙන් අනතුරුව නැවතත් ශාක යථා තත්වයට පත්වීමත් එක හා සමානව වැදගත් වේ. මක් නිසාද යත් තේ ශාකවල ජීවන කාලය තුලදී ඒවාට නියඟයන් කිහිපයකටම නැවත නැවත මුහුණ දීමට සිදුවන බැවිනි. එම නිසා ක්ෂේත්‍රයේ ස්ථාපිත නොමේරූ තේ පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට සහ ආතති තත්වයන් සමනය කිරීම සඳහා KCl සහ $K_2SO_4$ යන ප්‍රතිකාරක පමණක් ප්‍රයෝජනවත් වන බව නිගමනය කල හැක.

මෙම ප්‍රතිකාරක ලබාදුන් පසුව තේ අස්වැන්නට ඇතිවූ බලපෑම සැලකීමේදී GM660 ප්‍රතිකාරකය ලබාදීමෙන් දින 7 කට පසුව සැලකිය යුතු ඉහළම අස්වැන්නක් වාර්තා වූ අතර එම අස්වැන්න සහ KCl, WS සහ $K_2SO_4$ ප්‍රතිකාරක ලබාදුන් තේ පැළ වලින් ලබාගත් අස්වැන්නත් අතර සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි (දත්ත පෙන්වා නොමැත). කෙසේ වෙතත් මෙවන් උපරිම අස්වැන්නක් ලබාදීම සඳහා GM660 ප්‍රතිකාරකය මඟින් ඉහත විස්තර කරන ලද ආකාරයට නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ධනාත්මකව බලපෑම් සිදු කරන ප්‍රයෝජනවත් ලක්ෂණ කිහිපයක්ම නැති කරගෙන ඇත. තව ද $K_2SO_4$, KCl සහ WS යන ප්‍රතිකාරක මගින්ද GM660 ප්‍රතිකාරකය මගින් ලබාදෙන ලද අස්වැන්නට සැලකිය යුතු වෙනසක් නොපෙන්වන ලදී. මෙයින් ගම්‍ය වනුයේ නොමේරූ තේ ශාකවල ඵලදායීතාවය ඉහළ දැමීම කෙරෙහි මෙම මැදිහත්වීම් ධනාත්මකව බලපෑම් ඇති කරන බවයි.

දිගු දාම මේද මධ්‍යසාර (GM) නිවැරදි සාන්ද්‍රණයකින් එනම් මිලි ලීටර 1000 ක් ජලය ලීටර 200 ක් දිය කර හෙක්ටයාරයකට ඉසීම (GM1000) තුලින් තේ ශාක පත්‍රවල ජල වාෂ්ප සඳහා පූටිකා විවර වීම පර්යේෂණය පුරාවටම සැලකිය යුතු ලෙස අඩු වූ අතර ඒ හා සමගාමීව උත්ස්වේදන වේගයේ අඩු වීමක්ද බලාපොරොත්තු විය හැකිය. නියඟයකදී නොමේරූ තේ ශාක නොමැරී පවත්වා ගෙන යාම පමණක් සැලකුවහොත් KCl, $K_2SO_4$, GM1000 සහ WS යන ඕනෑම ප්‍රතිකාරකයක් ප්‍රයෝජනවත් ලෙස යොදා ගත හැකිය. කෙසේ වෙතත්, ඉහත විස්තර කල පරිදි, නියඟයකදී තේ ශාක නොනැසී පවත්වා ගැනීම පමණක් නොව නියඟයකට පසුව වර්ෂාපතනය ලැබීමෙන් අනතුරුව නැවතත් ශාක යථා තත්වයට පත්වීමත් එක හා සමානව වැදගත් වන නිසා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වර්තමානයේ නිර්දේශිත ප්‍රතිකාරක හැර මෙම පර්යේෂණයට භාජනය කරන ලද අන් කිසිදු ප්‍රතිකාරකයක් නොමේරූ තේ පැළවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට සහ නියඟ මගින් ඇතිවන ආතති තත්වයන් මග හැර ගැනීමට උචිත නොවේ.

එම නිසා නොමේරූ තේ වගාවෙහි නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වර්තමානයේ පවතින නිර්දේෂය වන නියඟය ඇතිවීමට මාසයකට පමණ පෙර සිට තේ ශාක පත්‍ර මතට 2% පොටෑසියම් සල්ෆේට හෝ ක්ලෝරයිඩ ද්‍රාවණයක් ඉසීම, එලෙස නියඟය හරිහැටි පුරෝකතනය කිරීමට නොහැකිවීම හෝ වෙනයම් කරුණක් නිසා සිදු කල නොහැකි වූ විට එම රසායනික ප්‍රතිකාරකම මධ්‍යස්ත නියඟයකට පාත්‍ර වූ නොමේරූ තේ පැළ සඳහා ද යොදා ගත හැකිය. මෙම පර්යේෂණය සාර්ථකව නිමා කරන ලදී.

ටී එල් විජේරත්න, ඩී එම් එස් නවරත්න, වි සිදාකරන්, ඒ ඩී අයි යූ ජයවර්ධන
සහ එන් එම් විතානගේ

**පර්යේෂණ 3. නියං කාලය තුල තේ (*Camellia sinensis*) වල කායික හා ජෛව රාසායනික ප්‍රතිචාර වැඩි දියුණු කිරීම සඳහා ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය ඇගයීම**.
බදුන් ගත කරන ලද ටීආර්අයි 2025 (නියගයට ඔරොත්තු දීමේ හැකියාව සහිත සහ ටීආර්අයි 2023 (නියගයට ඔරොත්තු දීමේ හැකියාවෙන් අඩු ප්‍රභේද යොදා ගනිමින් මෙම පර්යෙෂණය තලවාකැලේ තේ පර්යෙෂණායතනයේ වැසි ආවරනය යටතේ සිදු කරන ලදී. එහිදී තේ පැළ සීආර්ඩී සැලස්මට අනුව සංවිධානය කරන ලදී.

තේ පර්යේෂණායතනයේ ශාක ව්‍යාධිවේදී අංශය විසින් සකස් කරන ලද ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය මෙම සඳහා යොදා ගන්නා ලදී.. 1:100 අනුපාතයකින් කොම්පෝස්ට් සමඟ මිශ්‍ර කිරීම සහ ප්‍රතිකාර යෙදීමට පෙර සතියක් බිජෞෂණය සඳහා තබා ඇත. එ අතරතුරදී පැළ ක්ෂේත්‍ර ධාරිතාව තෙක් රැගෙන එන ලදී. අනතුරුව ජලය දැමීම නතර කිරීම මගින් වියලි චක්‍රයකට භාජනය කරන ලදී. මෙහිදී පැළවල පාංශු තෙතමන ප්‍රමාණය මධ්‍යන ප්‍රමාණයකට අඩුවූ විට ප්‍රතිකාර ලබා දිම සිදු කරන ලදී .

T1 : ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග එක් මාත්‍රාවක් පමණක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය.
T2 : ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා නොකර නිපදවූ ප්‍රතිකාරකය.
T3 : ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග මාත්‍රා දෙකක් පමනක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය.

ප්‍රතිකාර කිරීමෙන් පසු නියගයේ ප්‍රගතියත් සමග පාංශු තෙතමනය (SMC) සමග පහත දක්වා ඇති ශාක කායික හා ජෛව රසායනික දත්ත එකතු කිරීම තෝරා ගත් පැළවල දින (DAS) 7 දින (DAS) 14 දත්ත එකතු කරනු ලැබු සියලුම අවස්ථාවලදී ලබා ගන්නා ලදී. වායු හුවමාරු දත්ත සඳහා අතේ ගෙන යා හැකි පොරොමීටර්යක් (portable porometer cum fluorometer- Model: LI600, LiCor, USA) මගින් පූටිකාවල හැසිරීම (gsw), උත්ස්වේදන වේගය (E), ප්‍රභා පද්ධති II (phips2) හි කාර්යක්ෂමතාව ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය (ETR), පත්‍රවල උෂ්ණත්වය (Tleaf) මනිනු ලැබේ.

ශාක පත්‍ර නියදි කඩා ගනිමින් ශාකයේ සාපේක්ෂ ජල අන්තර්ගතය (RWC) සම්මත ප්‍රොටෝකෝලය භාවිතයෙන් මනිනු ලැබේ. ශාක පත්‍ර වල ද්‍රාවක (TSS) සීනි ප්‍රමාණය සම්මත ක්‍රම භාවිතයෙන් තීරණය කරන ලදී. එමෙන්ම ඔවුන්ගේ පෙනුම ප්‍රතිකාර කිරීමෙන් දින (DAS) 14 කට පසු ශාක දෘශ්‍යමය වශයෙන් තක්සේරු කිරීම සහ සාමාන්‍ය පෙනුම සහිත ශාක ප්‍රතිශතය ගණනය කරන ලදී.

ටීආර්අයි 2023 ප්‍රභේදයේ සම්පූර්ණ ද්‍රාවක (TSS) සීනි ප්‍රමාණය වෙනස් වීම පිලිබඳ අදහස් දැක්වීමට නොහැකි අතර ටීආර්අයි 2025 ප්‍රභේදයේ ප්‍රතිකාර කිරීමෙන් දින (DAS) 14 කට පසු ලබා ගත් දත්ත අතර සංඛ්‍යාත්මක වෙනස්කම් දැකිය නොහැකි බව පෙන්වා ඇත.

නමුත් ප්‍රතිකාර කිරීමෙන් දින (DAS) 7කට පසු ටීආර්අයි 2025 ප්‍රභේදයේ සම්පූර්ණ ද්‍රාවක (TSS) සීනි ප්‍රමාණය ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය අඩු වු බව පැහැදිලි ලෙස නිරික්ෂණය විය (රූපසටහන 9).



රූපසටහන. 9 පර්යේෂණය සිදු කරන කාලය තුල ටිආර්අයි 2023 ප්‍රභේදයේ සහ ටිආර්අයි 2025 ප්‍රභේදයේ නියඟයත් සමග ද්‍රාවක සීනි ප්‍රමාණය වෙනස් වූ ආකාරය. මෙහි පිළිවෙලින් දින (DAS) 7 සහ දින (DAS) 14 ප්‍රතිකාර කිරීමෙන් පස T1 ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග එක් මාත්‍රාවක් පමණක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය T2 ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා නොකර නිපදවූ ප්‍රතිකාරකය T2 ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග මාත්‍රා දෙකක් පමනක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය
(එක් එක් මිනුම් කාල පරතරය යටතේ එක් එක් ප්‍රභේදය යටතේ අක්ෂර මගින් එකිනෙක අතර සැලකිය යුතු වෙනස්කම් දැකිය හැකි බව පෙන්වා ඇත).

*මෙහිදී සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය සැලකිය යුතු වෙනස්කම් නොපෙන්වයි.

ද්‍රාවක සීනි (TSS) ප්‍රමාණය ට ප්‍රතිවිරුද්ධ ආකාරයට, ප්‍රභේද දෙකේ ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග එක් මාත්‍රාවක් පමණක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකයේ ප්‍රෝලීන ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. එහිදී ටිආර්අයි 2023 ප්‍රභේදයේ ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග මාත්‍රා දෙකක් (T3) පමනක් භාවිතා කර නිපැද වු ප්‍රතිකාරකය ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝගය හා භාවිතා නොකර නිපදවූ ප්‍රතිකාරකය (T2) සැලකිය යුතු වෙනස්කම් නොපෙන්වයි. නමුත් ප්‍රතිකාර කිරීමෙන් දින 14 කට පසු ටිආර්අයි 2025 සැලකිය යුතු ලෙස වැඩි වී ඇත (රූපසටහන 10).




රූපසටහන 10. පර්යේෂණය සිදු කරන කාලය තුල ටිආර්අයි 2023 ප්‍රභේදයේ සහ ටිආර්අයි 2025 ප්‍රභේදයේ ප්‍රෝලීන ප්‍රමාණය වෙනස් වූ ආකාරය. මෙහි පිලිවෙලින් දින(DAS) 7 සහ දින(DAS) 14 ප්‍රතිකාර කිරීමෙන් පසු දින 7 සහ දින 14 දක්වයි. ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග එක් මාත්‍රාවක් පමණක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය (T1) ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා නොකර (T2) නිපදවූ ප්‍රතිකාරකය ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග දෙකක් (T3) පමනක් භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය එක් එක් මිනුම් කාල පරතරය යටතේ එක් එක් ප්‍රභේදයේ යටතේ අක්ෂර මගින් එකිනෙක අතර සැලකිය යුතු වෙනස්කම් ($p<0.05$) දැකිය හැකි බව පෙන්වා ඇත. මෙහිදී සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය සැලකිය යුතු වෙනස්කම් නොපෙන්වයි.

රසායනික විශ්ලේෂණය සහ සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය සිදු වෙමින් පවතී.

ටී එල් විජෙරත්න, ඒ ඩී අයි යූ ජයවර්ධන සහ එන් එම් විතානගේ

**ව්‍යාපෘතිය C / MET:**

C/MET පර්යේෂණ ව්‍යාප්තිය යටතේ, දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය මෙන්ම, දෙනියාය, හන්තාන(මහනුවර), කොට්ටව (ගාල්ල), පස්සර, රත්නපුර සහ තලවකැලේ කෘෂි කාලගුණික මධ්‍යස්ථාන නඩත්තුව සහ පවත්වාගෙන යාම සිදු කරනු ලබයි. තේ කර්මාන්තය නියෝජනය කරමින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ RIMES ආයතනය එකාබද්ධව පවත්වනු ලබන මෝසම් සැසිය (Monsoon Forum) සඳහා සහභාගී විය. පහතරට මධ්‍යස්ථානයේ, ස්වයංක්‍රිය කෘෂි කාලගුණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී.

එන් පී එස් එන් බණ්ඩාර

**D/PHYS. අංශයේ අතිරේක කාර්යයන්**

**පර්යේෂණ 1: ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය තේ (*Camellia sinensis*) වල වර්ධන පරාමිතීන්ට බලපාන ආකාරය අධ්‍යයනය.**

මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ වැසි ආවරණය යටතේ සිදු කරන ලදී. මෙහිදී පෝච්චි සඳහා තවාන් කල ටිආර්අයි 2025 (නියඟයට ඔරොත්තු දෙන) සහ ටිආර්අයි 2023 (නියඟයට ගොදුරු විය හැකි) නම් ප්‍රභේද දෙකක තේ පැළ යොදා ගන්නා ලදී.

සිආර්ඩී (CRD) අනුව අත්හදා බැලීම සංවිධානය කරන ලදී. එක් ප්‍රතිකාරයක් සඳහා පැළ දහයක් යොදා ගන්නා ලදී. තේ පර්යේෂණ ආයතනයේ ශාක ව්‍යාධිවේදී අංශය විසින් සකස් කරන ලද ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග මෙම අධ්‍යනය සඳහා භාවිතා කරන ලදී.

1:100 අනුපාතයකින් කොම්පෝස්ට් සමඟ එක් කිරීම සහ ප්‍රතිකාර යෙදීමට පෙර සතියක් බිජෞෂණය සඳහා තබා ඇත. සතියක් බිජෞෂණය සිදු කිරීමෙන් අනතුරුව ඉහත ප්‍රතිකාර යොදා ගන්නා අතර හොදින් තෙතමනය සහිතව පවත්වා ගෙන යන ලදී.

T1 : ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා කර නිපදවූ ප්‍රතිකාරකය
T2 : ට්‍රයිකොඩර්මා ක්ෂුද්‍ර ජීවී සංයෝග භාවිතා නොකර නිපදවූ ප්‍රතිකාරකය

ප්‍රතිකාර කිරීමෙන් පසු ශාක කායික හා ජෛව රසායනික දත්ත ලබාගැනීම තෝරා ගත් පැළ වලින් දින (DAS)7 සහ දින (DAS)14 කදී සිදු කරන ලදී. උස සහ වට ප්‍රමාණය (බිම් මට්ටමෙ සිට ඉහළ අඟල් 1 කින් මනිනු ලැබේ) මෙය ප්‍රතිකාර ක්‍රියාත්මක කළ දින සිට මනිනු ලබන අතර මාස 8 ක් දිගටම පවත්වා ගෙන යන ලදී.

පාංශු තෙතමනය සමඟ පහත දක්වා ඇති ශාක කායික විද්‍යාත්මකව පර්යේෂණ දත්ත එකතු කරනු ලැබූ සියලුම අවස්ථාවලදී ලබා ගන්නා ලදී. වායු හුවමාරු දත්ත සදහා අතේ ගෙන යා හැකි පොරොමීටර්යක් [portable porometer cum fluorometer- Model: LI600, LiCor, USA) මගින් (පූටිකාවල හැසිරීම (gsw), උත්ස්වේදන වේගය (E), ප්‍රභා පද්ධති II (phips2) හි කාර්යක්ෂමතාව, ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය (ETR), පත්‍රවල උෂ්ණත්වය (Tleaf)] මනිනු ලැබේ.

ශාක පත්‍ර වල නියදි කඩා ගනිමින් ශාකයේ සාපේක්ෂ ජල අන්තර්ගතය (RWC) සම්මත ප්‍රොටොකෝලය භාවිතයෙන් මනින ලදී. ශාක පත්‍ර වල ද්‍රාවක සීනි (TSS) ප්‍රමානය සහ ප්‍රෝලින ප්‍රමානය සම්මත ක්‍රම භාවිතයෙන් තීරණය කරන ලදී. එමෙන්ම අතිරේකව ඔවුන්ගේ පෙනුම ප්‍රතිකාර කිරීමෙන් දින (DAS) 14 කට පසු ශාක දෘශ්‍යමය වශයෙන් තක්සේරු කර සාමාන්‍ය පෙනුම සහිත ශාක ප්‍රතිශතය ගණනය කරන ලදී.

T1 යෙදීමත් සමඟ ශාක වට ප්‍රමාණය T2 ට වඩා සැලකිය යුතු ලෙස අඩු විය (රූපසටහන 11).




රූපසටහන 11. T1: ට්‍රයිකොඩර්මා මිශ්‍ර කිරීමෙන් පසු තේ පැළවල වට වර්ධක අනුපාතය (මි.මී./වසර) සකස් කිරීම සහ T2: ට්‍රයිකොඩර්මා භාවිතා කිරීමෙන් තොරව (එක හා සමාන ස්තම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකින් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත.)

කෙසේ වෙතත්, තේ පැළවල ප්‍රතිකාර දෙක අතර වට ප්‍රමාණයේ සාපේක්ෂ වර්ධන වේගයෙහි සැලකිය යුතු වෙනසක් නොවීය (රූපසටහන 12).




රූපසටහන 12: වට ප්‍රමාණයේ සාපේක්ෂ වර්ධන වේගයේ (RGR) විචලනය (පවතින පඳුරු වට ප්‍රමාණය අනුව වට ප්‍රමාණයේ වෙනස මි.මී වසරකට) T1 එන්නත් කිරීමෙන් පසු තේ පැළ ට්‍රයිකොඩර්මා සහිත සහ T2 ට්‍රයිකොඩර්මා භාවිතා කිරීමකින් තොරව(එක හා සමාන ස්තම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකින් අතර සැලකිය යුතු වෙනස්කම් p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත)

සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය සිදු වෙමින් පවතී.

ටී එල් විජේරත්න, ඒ ඩී අයි යු ජයවර්ධන සහ එන් එම් විතානගේ

**පර්යේෂණ 2: තේවල ඒකාබද්ධ පෝෂ්‍ය පදාර්ථ කළමනාකරණය කිරීම සඳහා කාබනික පොහොර පරීක්ෂා කිරීම**

රසායනික පොහොර ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනවත් යෙදවුම් ලෙස ක්‍රියාකරයි. කෙසේ වුවද, රසායනික පොහොරවල අක්‍රමවත්, අධික මාත්‍රාවක් භාවිතා කිරීම මගින් බොහෝ සෘණාත්මක ප්‍රතිඵල ඇති කරයි. උදාහරණ ලෙස කාලයත් සමග පසෙහි වාසය කරන හිතකර ක්ෂුද්‍ර ජීවීන් අඩුවීම, පස හායනය, බෝග අස්වැන්න අඩු වීම වැනි බලපෑම් ඇති වේ. එහි අවසාන ප්‍රතිඵලයක් ලෙස ආර්ථික මෙන්ම පාරිසරික ගැටලු ඇති කරයි.

එම නිසා එවැනි ගැටළු අවම කර ඒකාබද්ධ පෝෂක කළමනාකරණය ප්‍රවර්ධනය කර තේ වගාවේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් සාමූහික ප්‍රයත්නයක් ලෙස ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

කාබනික පොහොර නිෂ්පාදන 62 ක් පිළිබඳ විස්තර අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී. නමුත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත ලබා දෙන ලද්දේ කාබනික නිෂ්පාදන 36ක් පමණි. 15 ඝන පොහොර සහ 21 දියර පොහොර විය.

රසායනික සංයුතිය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව රසායනාගාරයේදී ලැබුණු එක් එක් පොහොර පිළිබඳව ලබාගත් දත්ත සැලකිල්ලට ගනිමින් කාබනික පොහොරවල N පෝෂක අන්තර්ගතය තේ සඳහා වඩාත්ම ඉල්ලුම ඇති පෝෂකය වන බැවින් එය පදනම් කරගෙන එක් එක් පොහොරවල නයිට්‍රජන් (N) අන්තර්ගතයට (2% සහ ඊට වැඩි) පොහොර නිෂ්පාදන 19 පරීක්ෂා කිරීම සඳහා තෝරා

ගන්නා ලදී. ඉහත නිර්ණායක මත ඝන පොහොර 8 ක් සහ දියර පොහොර 11 ක් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේදී පරීක්ෂා කරන ලදී.

මෙම පර්යේෂණය තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වීදුරු ගෘහයක් තුල වසරක් පමණ වයස තේ පැළ යොදාගෙන  අනුරූ තුනක් සහිතව දළ වශයෙන් දින 200ක් කලයක් තුල සිදු කරන ලදී.

ඝන පොහොර නවයක් (S1-S9) සහ දියර පොහොර ප්‍රතිකාර දහ හතක් (L1-L17) මෙම පර්යේෂණය යටතේ පරීක්ෂා කර ඇත. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත T200 රසායනික පොහොර මිශ්‍රණය (S8) පාලක ප්‍රතිකාරය ලෙස භාවිතා කරන ලදී.. මාස 8 ක් පමන වයසැති තේ පැළ පොච්චි  වල සිටුවන ලදී.

පහත සඳහන් පස් වර්ග හයක් භාජන මාධ්‍ය ලෙස භාවිතා කරන ලදී.
M1: පහතරට (පල්ලේගොඩ පස් මාලාව- මොරගොල්ල වත්ත, ගාල්ල)
M2: පහතරට (පල්ලේගොඩ පස් මාලාව- ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර)
M3: මැද-රට (මහනුවර පස් මාලාව- රොත්ස්චිල්ඩ් වත් පුස්සැල්ලාව)
M4: උඩරට (මට්ටකැලේ පස් මාලාව- මට්ටකැලේ වත්ත, තලවාකැලේ)
M5: උඩරට (මස්කෙළිය පස් මාලාව -ස්ට්‍රැත්ෆි වත්ත, මස්කෙළිය)
M6: ඌව (මහවලතැන්න පස් මාලාව- ගෝනකැලේ වත්ත, පස්සර)

ද්වි-සාධක අත්හදා බැලීමකට අනුව මෙම පර්යේෂණය සංවිධානය කරන ලදී ප්‍රධාන සාධකය ලෙස පොහොර වර්ගය සහ උප සාධකය ලෙස පස් වර්ගය භාවිතා කරන ලදී. වර්ධනය පිළිබඳ දත්ත ලෙස (ශාකයේ උස, වට ප්‍රමාණය, පත්‍ර ගණන, මල් පොහොට්ටු/ගෙඩි සංඛ්‍යාව, ක්‍රියාකාරී අංකුර සහ බැන්ජි අංකුර), පත්‍ර වර්ණක සහ පසෙහි pH අගය අවස්ථා කිහිපයකදී ලබා ගන්නා ලදී.

කායික විද්‍යාත්මක දත්ත ප්‍රභා පද්ධති II (PhiPS2) හි කාර්යක්ෂමතාව සහ ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය (ETR) තේ පැළ පෝෂක ඌනතාවය හෝ අසමතුලිතතාවය හේතුවෙන් කිසියම් ආතතියකට ලක් වී ඇත්දැයි  දැන ගැනිම සඳහා විවිධ කාලවලදී අධ්‍යයනය කරන ලදී . අවසාන වශයෙන්, ශාක විවිධ පොහොර වලට ප්‍රතිචාර වශයෙන් ශාක වල ජෛව ස්කන්ධ බෙදීමේ විචලනය ලබා ගැනීම සඳහා ශාක මුලිනුපුටා ගන්නා ලදී. මුලිනුපුටා ගන්නා ලද ශාක  ශාක පත්‍ර, කඳන්, කඳ සහ මුල වෙන් කරන කොටස (collars) සහ මුල් ලෙස වෙන්කර, පසුව  ඒවායේ ජෛව ස්කන්ධය මනින ලදි. පත්‍රයේ වර්ගඵලය, පසෙහි pH අගය සහ පත්‍ර නයිට්‍රජන් ප්‍රමාණය ද මනින ලදී..

දත්ත SAS මෘදුකාංග පැකේජය භාවිතයෙන් සංඛ්‍යානමය වශයෙන් විශ්ලේෂණය කරන ලදී. ඩනට්ගේ T පරීක්ෂණය භාවිතයෙන් මධ්‍යන්‍යයන් වෙන් කිරීම සිදු කරන ලදී. වැඩි පැහැදිලි බව සඳහා ඝන සහ දියර පොහොර වෙන වෙනම විශ්ලේෂණය කරන ලදී..

**1.. ඝන පොහොරවල ප්‍රතිචාර**

S8 එනම් පාලකය හා සසඳන විට පරීක්ෂා කරන ලද බොහෝ පරාමිතීන්හි සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. , කෙසේ වෙතත්, විවිධ වෙනස්කම්වල පැහැදිලි රටා නොතිබූ බැවින් පැළවල සාර්ථක වර්ධනය සඳහා වඩාත් වැදගත් පරාමිතීන් පමණක්  ඒකාබද්ධ පෝෂක කළමනාකරණ සඳහා පොහොර තෝරාගැනීමට භාවිතා කරන දර්ශකය සඳහා භාවිතා කිරීමට තීරණය විය.

එබැවින්, S8 ට සාපේක්ශව සැලකිය යුතු ලෙස අඩු නොවූ සෑම පරාමිතියකgම 6 වගුවේ දක්වා ඇති පරිදි “+1” හෝ නැතිනම් “0” ලබා දී ඇත.

වගුව 6.. තේ පැළ සඳහා විවිධ ඝන පොහොර වර්ග ඒකාබද්ධ පෝෂක කළමනාකරණය සඳහා භාවිතා කිරීමේදී යෝග්‍යතාවයට ලැබුණු ලකුණු.

| ඝන පොහොර | පත්‍රවල ජෛව ස්කන්ධය (g) | ක්ලෝරෝෆිල් වර්ණක සාන්ද්‍රණය (μg $g^{-1}$) | කැරොටිනොයිඩ් වර්ණක සාන්ද්‍රණය (μg $g^{-1}$) | PhiPS2 | ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය (μmol $m^{-2}$ $s^{-1}$) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| S1 | 1 | 1 | 0 | 1 | 1 | 4 |
| S2 | 0 | 1 | 0 | 1 | 1 | 3 |
| S3 | 1 | 1 | 0 | 1 | 1 | 4 |
| S4 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| S5 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| S6 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| S7 | 0 | 1 | 1 | 0 | 1 | 3 |
| S9 | 0 | 1 | 1 | 0 | 0 | 2 |

මූලික ප්‍රතිඵල මත පදනම්ව (වගුව 6), ඝන පොහොර නිෂ්පාදන හතරක් (එනම් S1, S2, S3 සහ S7) ලකුණු 2 ට වඩා වැඩියෙන් ලබා ගත් අතර ඒවා ඒකාබද්ධ පෝෂක කළමනාකරණය තුළ වැඩිදුර පරීක්ෂණ සඳහා සුදුසු නිෂ්පාදන ලෙස තෝරා ගන්නා ලදී .

පාංශු පොහොර සමග ඒකාබද්ධව භාවිතා කරන පාංශු ශ්‍රේණිවලට ශාක දක්වන ප්‍රතිචාරයට අදාළව රැස් කර ඇති දත්ත පරීක්ෂා කර ඇත.

**2. දියර පොහොරවල ප්‍රතිචාර**

ඝන පොහොරවලට සමානව දියර පොහොර S8 හා සසඳන විට පරීක්ෂා කරන ලද බොහෝ පරාමිතිවල ප්රතිචාරවල සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය (දත්ත පෙන්වා නැත).

ඝන පොහොරවලට ලබා දුන් ලෙසම S8 වලට සාපේක්ශව සැලකිය යුතු ලෙස අඩු නොවූ සෑම පරාමිතියක්ම 7 වගුවේ දක්වා ඇති පරිදි “+1” හෝ නැතිනම් “0” ලබා දී ඇත.

වගුව 7. විවිධ දියර පොහොර වර්ග සඳහා ඒවායේ යෝග්‍යතාවය පරීක්ෂා කර ලැබුණු ලකුණු.

| දියර පොහොර | පත්‍රවල ජෛව ස්කන්ධ (g) | ක්ලෝරෝෆිල් වර්ණක සාන්ද්‍රණය ($\mu g\ g^{-1}$) | කැරොටිනොයිඩ් වර්ණක සාන්ද්‍රණය ($\mu g\ g^{-1}$) | PhiPS2 | ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය ($\mu mol\ m^{-2}\ s^{-1}$) | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| L1 | 0 | 1 | 1 | 0 | 1 | 3 |
| L2 | 0 | 1 | 1 | 0 | 0 | 2 |
| L3 | 1 | 1 | 1 | 0 | 1 | 4 |
| L4 | 1 | 1 | 1 | 0 | 1 | 4 |
| L5 | 0 | 1 | 1 | 1 | 1 | 4 |
| L6 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| L7 | 0 | 1 | 1 | 0 | 1 | 3 |
| L8 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| L9 | 1 | 1 | 0 | 0 | 1 | 3 |
| L10 | 1 | 1 | 0 | 0 | 1 | 3 |
| L11 | 1 | 1 | 0 | 0 | 1 | 3 |
| L12 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| L13 | 0 | 1 | 1 | 1 | 1 | 4 |
| L14 | 0 | 1 | 0 | 0 | 1 | 2 |
| L15 | 0 | 1 | 1 | 0 | 1 | 3 |
| L16 | 1 | 1 | 0 | 0 | 1 | 3 |
| L17 | 0 | 1 | 1 | 0 | 1 | 3 |

2 ට වඩා වැඩි ලකුණු ලබා ගත් දියර පොහොර තේ පැළ සඳහා වූ ඒකාබද්ධ පෝෂක කළමනාකරණ තුළ වැඩිදුර පරීක්ෂණ සඳහා සුදුසු නිෂ්පාදන ලෙස තෝරා ගන්නා ලදී . තේ පැළ සඳහා වන ඒකාබද්ධ පෝෂක කළමනාකරණ යේදී L1, L3, L4, L5, L7, L9, L10, L11, L13, L15, L16 සහ L17 දියර පොහොර තවදුරටත් පරීක්ෂා කිරීමට තෝරා ගන්නා ලදී. මෙම විශේෂ අත්හදා බැලීම අවසන් කර එහි ප්‍රතිඵල ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

ටී එල් විජේරත්න, ඩි එම් එස් නවරත්න, වි සිදාකරන්, ඒ ඩි අයි යු ජයවර්ධන
සහ එන් එම් විතානගේ

**පර්යේෂණය 3: කායික විද්‍යාත්මක ප්‍රතිචාර භාවිතා කරමින් කප්පාදු කරන ලද ශාක කොටස් වලදැමීමේ ප්‍රතිලාභ තීරණය කිරීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් සහ ව්‍යාප්ති අංශය මගින් පවත්වාගෙන යනු ලබන ආදර්ශන භූමිය භාවිතා කරමින් තලවාකැලේ ක්ෂේත්‍ර අංක 10, ශාන්ත කූම්බ්ස් වත්තෙහි, දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරකමක් ලෙස කප්පාදු කරන ලද ශාක කොටස් වලදැමීමේ ප්‍රතිලාභ හඳුනාගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

අහඹු ලෙස සම්පූර්ණ කරන ලද බ්ලොක් සැලසුමට අනුව, වළලනු ලැබූ (B) සහ වළලනු නොලබන (NB) යන ප්‍රතිකාර ක්‍රම දෙකකින් කුට්ටි තුනකින් සහ දළ වශයෙන් පඳුරු 25 ක් සහිත මෙම පර්යේෂණය සිදු කරන ලදී. ප්‍රතිකාර ක්‍රම යෙදීමෙන් වසර 1 කට පමණ පසු දත්ත රැස් කර ඇත. අතෙහි ගෙනයා හැකි ප්‍රභාසංශ්ලේෂණමානයක් (model: LI- 6400XT, Li-Cor Inc., USA) යොදා ගනිමින් ප්‍රභාසංශ්ලේෂණ වේගය, උත්ස්වේදන වේගය සහ පූටිකාවල හැසිරීම ක්ෂේත්‍රයේදී මනිනු ලැබීය. වායු හුවමාරු මිනුම් වලට පෙර මිනිත්තු 30 ක් සඳහා ඇලුමිනියම් තීරු වලින් කොළ ආවරණය කිරීමෙන් අඳුරු ශ්වසනය ද වෙනත් කොළ කට්ටලයකින් මනිනු ලැබේ. වායු හුවමාරු මිනුම් සමග

ගුරුත්මිතික පාංශු  තෙතමනය ද මනිනු ලැබේ. මූල ජෛව ස්කන්ධ දත්ත සහ මුල් දිග මනිනු ලැබුවේ ශාක පාමුල සිට මීටර් 0.30 සහ මීටර් 0.60 ක් දුරින් සහ සම්මත ක්‍රමවේදයන් (destructive sampling method) භාවිතා කරමිනි.

0.30 x 0.30 $m^2$ සිවුරැස්ස (quadrat) භාවිතා කරමින් අස්වැන්න මනින ලද අතර සක්‍රීය සහ බැන්පී අංකුර ගණන සහ ඒවායේ වියළි බර පසුව මනින ලදි. සම්මත ක්‍රමවේදයන් භාවිතයෙන් දත්ත සංඛ්‍යානමය වශයෙන් විශ්ලේෂණය කරන ලදී..

ප්‍රභාසංශ්ලේෂණ වේගය, උත්ස්වේදන වේගය සහ පූටිකාවල හැසිරීම වැනි වායු හුවමාරු පරාමිතීන් වළලනු ලැබූ ප්‍රතිකාරයේදී වළලනු නොලබන ප්‍රතිකාරවලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගනී. කෙසේ වෙතත්, ප්‍රතිකාර දෙක අතර පත්‍ර උෂ්ණත්වයේ සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි (රූපසටහන 13).









රූපසටහන 13. තේ පත්‍රවල ප්‍රභාසංස්ලේෂණ වේගය (ඉහළ වමේ), පූටිකාවල හැසිරීම (ඉහළ දකුණ), උත්ස්වේදන වේගය (පහළ වමේ) සහ පත්‍ර වල උෂ්ණත්වය (පහළ දකුණ) වළලනු ලැබූ (B), වළලනු නොලබන (NB) ප්‍රතිචාර වශයෙන් (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත).

අඳුරු ශ්වසන මිනුම්වල ද සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි (දත්ත පෙන්වා නැත). දත්තවල සංඛ්‍යානමය විශ්ලේෂණය සිදු වෙමින් පවතී.

ටී එල් විජේරත්න, ඩී එම් එස් නවරත්න, එම් එම් එන් දමයන්ති, සහ එන් එම් විතානගේ

**පර්යේෂණය 4. පරිණත තේ පැළවල ජල භාවිත කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම (*Camellia sinensis*)**

තේ පැළවල ජල පරිහරණ කාර්යක්ෂමතාවයට බලපාන සාධක හඳුනාගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ කියු උද්‍යානය සහ බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලය සමග සහයෝගී අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය සිදු කරන ලදී. විවිධ

තේ වර්ගවල නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සංසන්දනය කිරීම සඳහා තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වත්ත, ක්ෂේත්‍ර අංක 12දී සහ පස්සර ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර අංක 04 දී මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ටීආර්අයි 2043, DN, ටීආර්අයි 2025, ප්‍රවේශ 5, 21, 88, 208 සහ 210 තලවාකැලේ තේ පැළවල ජල පරිහරණ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම සඳහා තෝරා ගන්නා ලදී. ඉහත ප්‍රභේද සහ ප්‍රවේශයන් වලට අමතරව ටීආර්අයි 2023, ප්‍රවේශය 89, සාලාව (Salawa) ශාන්තකූම්බ්ස් (St. Coombs) සහ රූකාසල් (Rucastle) යන බීජ පැළ පස්සර පර්යේෂණය සඳහා තෝරා ගන්නා ලදී.

වායු භුවමාරු පරාමිතීන් පුටිකා සන්නායකතාවය (gsw), උත්ස්වේදනය (E), ප්‍රභාසංස්ලේෂණ පද්ධති II (PhiPS2), ඉලෙක්ට්‍රෝන ප්‍රවාහන අනුපාතය (ETR) සහ පත්‍ර උෂ්ණත්වය අතේ ගෙන යා හැකි පොරොමීටර්යක් (portable porometer cum fluorometer- Model: LI600, LiCor, USA) භාවිතයෙන් මනින ලදී.

පත්‍ර සාපේක්ෂ ජල ප්‍රමාණය (RWC) නියැදීමක් භාවිතයෙන් සහ පසේ ගුරුමිතික තෙතමන අන්තර්ගතය (වියළි බර පදනම) සම්මත ක්‍රමවේදයක් භාවිතයෙන් මනින ලදී. පත්‍රවල හරිතප්‍රද ප්‍රමාණය SPAD (Konica Minolta, USA) මීටරය භාවිතයෙන් මනින ලදී. මීට අමතරව, පත්‍ර ජල විභවය සහ පුටිකා ඝනත්වය ද මනින ලද අතර කාබන් සමස්ථානික වෙනස්කම් කිරීම සඳහා පත්‍ර සාම්පල එකතු කරන ලදී (දත්ත පෙන්වා නැත). මෙම දත්ත ස්ථාන දෙකේදීම එකතු කරන ලදී. අතෙහි ගෙනයා හැකි ප්‍රභාසංශ්ලේෂණමානයක් (model: LI- 6400XT, Li-Cor Inc., USA) යොදා ගනිමින් ප්‍රභාසංශ්ලේෂණ වේගය, උත්ස්වේදන වේගය සහ පූටිකාවල හැසිරීම තලවාකැලේ ක්ෂේත්‍රයේදී මනිනු ලැබීය.

තලවාකැලේ ප්‍රදේශයේ ගුරුමිතික පාංශු තෙතමන ප්‍රමාණය 36 - 40% අතර ප්‍රමාණයකින් වෙනස් වූ අතර එය මැන බැලීමේදී ශාක තෙතමන ආතතියකින් නොසිටි බව පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස පරීක්ෂා කරන ලද බොහෝ පරාමිතීන්හි පැහැදිලි වෙනස්කම් රටා හඳුනාගත නොහැකි විය. සම්පත් සීමාකාරී විම හේතුවෙන් SPAD මීටර කියවීම විනාශකාරී නොවන හරිතප්‍රද මිනුම ලෙස ගත් නමුත් ප්‍රවේශ 210 තේ පත්‍ර වල SPAD කියවීම හැර සියලුම දත්ත පාහේ 50 ට වඩා වැඩි විය (රූපසටහන 14). SPAD කියවීම් තේ පත්‍රවල ඇති ක්ලෝරෝෆිල් අන්තර්ගතයට රේඛීය සම්බන්ධතාවයක් ඇත්තේ 50 දක්වා පමණක් වන අතර ඉන් ඔබ්බට සම්බන්ධතාවය රේඛීය නොවේ.




රූපසටහන 14. තලවාකැලේ පරීක්ෂා කරන ලද විවිධ ප්‍රභේද/ප්‍රවේශයන් අතර පත්‍ර හරිතප්‍රද අන්තර්ගතය සංසන්දනය කිරීම සඳහා SPAD මීටර දත්ත (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත).

පස්සර ප්‍රදේශයේ ගුරුමිතික පාංශු තෙතමන ප්‍රමාණය 16.9% - 28.5% සිට පළමු දිනය තුළ වෙනස් වූ අතර එය අනපේක්ෂිත වර්ෂාපතන සිදුවීම හේතුවෙන් 2 දින තුළ 20.1% - 29.4% දක්වා ඉහළ ගොස් ඇති අතර සාමාන්‍ය පාංශු තෙතමනය දින 1 සහ දින 2 පිළිවෙලින් 24.3% සහ 24.8% කි. අනපේක්ෂිත වර්ෂාපතනය මෙන්ම ක්ෂේත්‍රය තුළ නිරීක්ෂණය වූ පාංශු තෙතමන අන්තර්ගතයේ විශාල විචලනය හේතුවෙන්, ඉදිරි කාලය තුළ දීර්ඝ නියඟයකින් පසුව නැවත මෙම අධ්‍යයනය සිදු කිරීමට තීරණය කළේය. කලින් වාර්තා කළ පරිදි, සම්පත් සීමාව හේතුවෙන් SPAD මීටර කියවීම විනාශකාරී නොවන හරිතප්‍රද මැනීම ලෙස ගත් නමුත්, සාලාව පැළවල තේ පත්‍රවල SPAD කියවීම හැර සියලුම දත්ත පාහේ 50 ට වඩා වැඩි විය (රූපසටහන 15).




රූපසටහන 15. පස්සර පරීක්ෂා කරන ලද විවිධ ප්‍රභේද/ප්‍රවේශයන් අතර පත්‍ර හරිතප්‍රද අන්තර්ගතය සංසන්දනය කිරීම සඳහා SPAD මීටර දත්ත (එක හා සමාන ස්ථම්භයන් මත දක්වා ඇති සමරූපී අක්ෂර මගින් එකිනෙකක් අතර සැලකිය යුතු වෙනස්කම් (p=0.05) දැකිය නොහැකි බව පෙන්වා ඇත.

ටී එල් විජේරත්න, ඩී එම් එස් නවරත්න, එම් එම් එන් දමයන්ති, ඒ ඩී අයි යූ ජයවර්ධන,
එම් ඒ බී රණතුංග, කේ එම් මොහොට්ටි (තේ. ප. ආ.),
ඒ ජේ මොහොට්ටි (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) සහ එච්. ඇලිස්ටෙයාර් (බ්‍රිස්ටල් සරසවිය)

## ක්ෂේත්‍ර ක්‍රියා යාන්ත්‍රීකරණය




### ප්‍රධාන ව්‍යාපෘතිය A 20. කුඩා තේ වතු ක්ෂේත්‍රවල යන්ත්‍ර ප්‍රචලිත කිරීම

**ව්‍යාපෘතිය A 20.9. යාන්ත්‍රික දළු නෙළීමේදී සිදුවන අස්වනු හානිය අවම කිරීම සඳහා තේ පත්‍ර මතට ඉසින ක්ෂුද්‍ර පෝෂක මිශ්‍රණ පරීක්ෂා කිරීම (2019)**

පත්‍ර මතට ඉසින ක්ෂුද්‍ර පෝෂක මූලද්‍රව්‍යයන් (Zn, Mn සහ B) මගින්, යාන්ත්‍රික දළු නෙළීමේදී සිදුවන අස්වනු අඩුවීම අවම කිරීමට ඇති හැකියාව සොයා බැලීම මෙම පරීක්ෂණයේ අරමුණයි. මේ සඳහා ශාන්ත කුම්බ්ස් වතුයායේ සිදුකරන මෙම පර්යේෂණයේ ප්‍රතිකාරක තත්ව පහත දක්වා ඇත.

දළු නෙලන ක්‍රමය

1. අතින් (පාලකය)
2. යන්ත්‍රයෙන් (කවසාකි NV 60H)

පොහොර යොදන ක්‍රමය

1. පාංශු පොහොර පමණක් (පාලකය)
2. පාංශු පොහොර + පත්‍ර මතට Zn (සම්මතය)
3. පාංශු පොහොර + පත්‍ර මතට Zn, Mn, B

පොහොර යොදන ක්‍රමය මත තේ දළු අස්වැන්නේ වෙනසක් නොපෙන්වන ලද අතර, අතින් දළු නෙලීමට (තෝරා දළු නෙලීම) සාපේක්ෂව යන්ත්‍රානුසාරයෙන් (දළු තේරීමක් නොවන) දළු නෙලීමේදී සියයට **30**ක පමණ දළු අස්වැන්නේ අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී. තවද, යන්ත්‍ර මගින් නෙලාගත් දළු වල බර අනුව සියයට **11**ක් පමණ මේරූ කොල (නඩත්තු පත්‍ර) අඩංගු විය.

කප්පාදු අතු වල බර ප්‍රමාණ සහ පත්‍ර වල විශිෂ්ඨ පත්‍ර ක්ෂේත්‍රඵලය (Specific Leaf Area – SLA) සංසන්දනය කර බැලීමේදී, එම පාරාමිතීන් දළු නෙලන ක්‍රමය මත වෙනසකට ලක් නොවන බව නිරීක්ෂණය කරන ලදී.

ඉන්ධන ලබාගැනීමේ අපහසුතා හේතුවෙන්, දළු නෙලීම සහ දත්ත රැස් කිරීම ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු සඳහා සැලකිය යුතු ලෙස බාධා එල්ල විය.

පර්යේෂණය තව දුරටත් සිදු කෙරෙමින් පවතී.

**ව්‍යාපෘතිය A. 20.10 යන්ත්‍රානුසාරයෙන් දළු නෙලීම සඳහා සුදුසු තේ ප්‍රභේද පිලිබඳ අධ්‍යයනය (2019)**

විවිධ තේ ප්‍රභේදයන්හි දළු වර්ධනය සහ අස්වැන්න කෙරෙහි යාන්ත්‍රික දළු නෙලීම මගින් සිදුකරන බලපෑම අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණයි.

දළු නෙලන ක්‍රම, භාවිත වන විභව තේ ප්‍රභේද සහ පාලක ලෙස යොදාගත් තේ ප්‍රභේදය පහත පරිදි වෙයි.

<u>දළු නෙලන ක්‍රම:</u>

අතින් (පාලකය), යන්ත්‍රයෙන්) කවසාකි NV 60H(

<u>5000 කාණ්ඩයට අයත් අයත් විවිධ ප්‍රවේණි දර්ශ හෙවත් විභව තේ ප්‍රභේද:</u>

62, 107, 139, 174, 12/11, 5/23

<u>පාලකය</u>

TRI 4042

අතින් දළු නෙලීමට සාපේක්ෂව එක දිගටම යන්ත්‍රානුසාරයෙන් දළු නෙලීමේදී සිදුවූ තේ අස්වැන්නේ අඩුවීම, පර්යේෂණය සඳහා භාවිතා කල තේ ප්‍රභේදයන් මත වෙනසක් දක්නට නොවීය. අතින් දළු නෙලීමට සාපේක්ෂව, තෝරා දළු නෙලීමට නොහැකි යන්ත්‍ර භාවිතයේදී, සිදුවූ අස්වැන්න අඩුවීමේ සාමාන්‍යය සියයට 40ක් පමණ වන බව නිරීක්ෂණය කරන ලදී.

යන්ත්‍රානුසාරයෙන් දළු නෙලීමේදී විභව තේ ප්‍රභේද අංක 107, 62, සහ 174 වැඩිම අස්වැන්නක් වාර්තා කළ අතර, අංක 139 අවම අස්වැන්නක් ලබා දෙන ලදී. කෙසේ වෙතද, අංක 139 ලබාදුන් එම අස්වැන්න තේ.ප.ආ. ප්‍රභේද අංක TRI 4042 සහ විභව ප්‍රභේද අංක 23/5 ලබාදුන් අස්වනු සමග සංසන්දනාත්මක විය.

අතින් දළු නෙලීමේ දී වැඩිම අස්වැන්නක් වාර්තා කරන ලද්දේ විභව තේ ප්‍රභේද අංක 62 සහ 107 වන අතර, 174, 12/11 සහ TRI 4042 පිළිවෙලින් අඩු අගයන් වාර්තා කරන ලදී. කෙසේ වෙත ද, විභව ප්‍රභේද අංක 139 සහ 23/5 සාපේක්ෂව අවම අස්වැන්නක් වාර්තා කරන ලදී.

මෙම පර්යේෂණයේ දළු නෙලීම සඳහා භාවිත කරනු ලැබූයේ බැටරි බලයෙන් ක්‍රියා කරන, සෙ.මී. 30ක කැපුම් තලයක් සහිත, කවසාකි වෙළඳ නාමය යටතේ බෙදාහැරෙන දළු නෙලන යන්ත්‍රයකි. පහතරට දේශගුණික තත්ව යටතේ, එම යන්ත්‍රය වසර පුරා දින 14කට වරක් භාවිතා කල අතර අතින් දළු නෙලීම තේ.ප.ආ. නිර්දේශ කර ඇති පරිදි දින 7කට වරක් සිදු කරන ලදී.

යන්ත්‍ර මගින් දළු නෙලීමේදී අතින් නෙලීමට සාපේක්ෂව, අරිම්බු දළු සහ නෙලාගැනීමට සුදුසු දළු ඝනත්වයෙහි අඩුවීමක් නිරීක්ෂනය කරන ලදී. කෙසේ වෙතත්, වංගි දළු වල එබඳු වෙනසක් නොදක්නා ලදී.

පර්යේෂණය තව දුරටත් සිදුවෙමින් පවතී.

එස් ආර් ඩබ් පතිරණගේ සහ පාංශු පෝෂක අංශය

**ව්‍යාපෘතිය A 20.12. නව යන්ත්‍ර අත්හදා බැලීම**

වර්ෂ 2022 තුල නව මාදිලියේ දළු නෙලන යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය පරීක්ෂාවට ලක් කරන ලදී. එම යන්ත්‍රය බැටරි බලයෙන් ක්‍රියා කළ අතර තනි පුද්ගලයෙකු මගින් හැසිරවීමට නිර්මාණය කරන ලද්දකි. යන්ත්‍රය කිලෝ ග්‍රෑම් 3ක් පමණ බර වූ අතර කරේ එල්ලාගෙන යා හැකි නයිලෝන් බෑගයක බහා ඇති බැටරිය කි.ග්‍රෑ. 3.5ක පමණ බරකින් යුතු විය. එහි මෝටරය මගින් තිරස් අක්ෂයේ සකසා ඇති කූරු/දඬු හතරක් කරකවන අතර, ඒවා සමග තනි තනි කැපුම් තලයක් (සෙ.මී. 18.5) කැරකෙමින් ස්පර්ශ වන අයුරින් නිර්මාණය කර ඇත. තේ දළු එම තලය සහ කූරු අතරට සිරවී ඉහලට ඇදෙමින් නෙලා ගැනෙන අතර, ඉදිරිපස ඇති පංකා මගින් ඇතිකරන වායු දහරාවක් මගින් යන්ත්‍රය පිටුපසට සවිකර ඇති නයිලෝන් බෑගය තුලට නෙලාගත් දලු යොමු කෙරේ.




රූපසටහන 1. නව දළු නෙලන යන්ත්‍රයේ දළ සටහනක්.

මෙම යන්ත්‍රය මගින් දිනකට දළු කිලෝ 25ක් පමණ නෙලිය හැකිවූ අතර, ඉන් සියයට 15ක් පමණ බෑගය තුලට එකතු නොවී එලියට විසිවී යාමක් නිරීක්ෂණය කරන ලදී. තවද නෙලාගත් දළු වලින් සියයට 33ක් පමන හොඳ තත්වයේ දළු වූ අතර, සියයට 48ක් පමණ තැලී පොඩිවූ දළු ද, සියයට 3ක පමණ මේරූ කොල (නඩත්තු පත්‍ර) ප්‍රමාණයක්ද වාර්තා විය. යන්ත්‍රය භාවිතයෙන් දිනකට අක්කර භාගයක පමණ තේ ඉඩම් වපසරියක දළු නෙලීමට හැකි විය.

යන්ත්‍රය භාවිතය අරඹා මාස 4කට පසු, අළුතින් දළු හටගැනීම කෙරෙහි යන්ත්‍රය සිදු කරන බලපෑම සොයා බැලූ අතර එහිදී අරිම්බු දළු සහ නෙලාගත හැකි දළු ප්‍රමාණ වල සැලකිය යුතු අඩුවීමක් සහ වංගි දළු ඇතිවීමේ වැඩි ප්‍රවණතාවයක් වාර්තා විය.

උස්ව නොවැඩෙන වංගි දළු යන්ත්‍රය මගින් ඉවත් නොවූ අතර මේ හේතුවෙන් වංගි එක්රැස්වීම අධික විය. එමෙන්ම යන්ත්‍රයේ ඇති කැරකෙන තලය සහ අනෙක් කොටස් වටා දළු එතී තේ පඳුර තුලට සිරවීම නිසා භාවිතයේදී අපහසුතා නිරීක්ෂණය විය. එමෙන්ම යන්ත්‍රය මගින් දිනකට නෙලන දළු බර (කි.ග්‍රෑ. 25) යන්ත්‍රයක් සඳහා සතුටුදායක ප්‍රමාණයක් නොවිණ. මෙසේ මෙම යන්ත්‍රයට ශ්‍රී ලංකාව වැනි දේශගුණික තත්වයක වැවෙන තේ වගාවක් සඳහා භාවිතයට ගැනීමට තරම් විභවයක් නොමැති බව වටහා ගන්නා ලදී.

යන්ත්‍රය පිලිබඳ පර්යේෂණ කටයුතු නිමා කරන ලදී.

එම් ඒ විජේරත්න, සම්පත් පතිරණගේ, පද්මිණී ප්‍රේමතුංග

**ව්‍යාපෘතිය GL 389. ස්වයංක්‍රීයව තේ දළු තෝරා නෙලා ගත හැකි නවීන යන්ත්‍රයක් නිර්මාණය**

ස්වයංක්‍රීයව තේ දළු තෝරා නෙලා ගත හැකි නවීන යන්ත්‍රයක් නිර්මාණය කර තේ වගාකරුවන් වෙත හඳුන්වාදීම අරමුණු කොට, මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, වර්ෂ 2021 දී ආරම්භ කෙරුණු මෙම විශේෂ ව්‍යාපෘතිය සඳහා පාර්ශවකරුවන් / නිර්මාණ කරුවන් දෙදෙනෙකු (ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය සහ B&N ඔප්ටිමස් පුද්ගලික සමාගම) තෝරාගැනීම 2022 වර්ෂයේ දී සිදු කෙරුණු අතර, ඔවුන් විසින් නිර්මාණය කරන ලද පළමු පියවර යන්ත්‍ර මූලාකෘති රත්නපුර සහ තලවාකැලේ තේ පර්යේෂණ ආයතන පරිශ්‍රයන් හි දී මූලික අත්හදා බැලීම්වල ට ලක් කරන ලදී. ව්‍යාපෘතියෙහි වැඩකටයුතු උපදේශන සහ අධීක්ෂණ කමිටුවක් මගින් නියාමනය කෙරෙන අතර, මූලික අදියරේ මූලාකෘති නිර්මාණ වැඩකටයුතු සිදුකෙරෙමින් පවතී.

එම් ඒ විජේරත්න සහ  සම්පත් පතිරණගේ

# තේ තවාන් පාලන ක්‍රම



**ප්‍රධාන ව්‍යාපෘතිය A 53. තවාන් කළමනාකරණය සහ ක්‍රමවේද සංවර්ධනය**

**ව්‍යාපෘතිය A 53.0. තවාන් මලුවල ප්‍රමාණය තේ (*Camellia sinensis . L*) ශාකයේ වර්ධනයට සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීම**

තවාන් ස්ථානවල වඩා හොඳ ජලාපවහනය පහසු කිරීම සඳහා සුදුසු තවාන් පාත්ති වර්ගයක් ඇගයීම සඳහා රත්නපුර පහතරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ අත්හදා බැලීමක් ආරම්භ කරන ලදී. TRI 2026 වගාව භාවිතයෙන් පහත ප්‍රතිකාර ක්‍රම යොදන ලදී.

T1: Normal raised (15cm) nursery bed (control)

T2: Plants staked in a wooden rack

T3: Sloppy nursery bed, covered with a polythene

T4: Plants staked in a gravel stone (15cm height) bed


Shoot no
Week no
T1
T2
T3
T4
25
20
15
10
5
0
0
1
2
3
4
5
6
7

# තේ සැකසුම් තාක්ෂණය හා නිපැයුම් වැඩි දියුණු කිරීම



**තේ කර්මාන්තශාලා සහ ඒවායේ තේ නිෂ්පාදනයට භාවිත යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.**

**ප්‍රධාන ව්‍යාපෘතිය A 48. තේ නිෂ්පාදනය ස්වයංක්‍රිය කිරීමට සහ තේ නිෂ්පාදන වියදම අඩු කර ගැනීම සඳහා කළ යුතු ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග**

**ව්‍යාපෘතිය A 48. 10. තරල පත්ල වියලනය සඳහා දූලි ඉවත් කරන ක්‍රමවේදයක් සැකසීම.**
ශාන්ත කූම්බ්ස් කර්මාන්තශාලාවේ ඇති තරල පත්ල වියලනය (TRI- CCC FBD) සඳහා වාසුළි ක්‍රමයේ දූලි ඉවත්කරණ ඒකකයක් පාලන පද්ධතියක් ද සමඟින් 2021 වසරේදී සැලසුම් කරන ලදී. පද්ධතිය ස්ථාපනය සඳහා 2022 වසරට වෙන් කරන ලද වැය ප්‍රමාණවත් නොවිණි. අවශ්‍ය මුදල් ලබා ගැනීමටත් ස්ථාපනය සඳහාත් කැමති ඉංජිනේරු ආයතනයක් සමඟ සහයෝගීව ක්‍රියා කිරීමට අපේක්ෂා කෙරේ.

කේ රවීන්ද්‍රන්, ඩබ් එම් එස් වීරවර්ධන, එල් ජයසිංහ, යූ පී ඩී පී රණතුංග
සහ ඊ පී ඩී එන් එම් විජයවර්ධන

**ව්‍යාපෘතිය A 48..12. ඕතොඩොක්ස් රෝලර් යන්ත්‍රයේ ඇඹරුම් පරාමිතීන් නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ක්‍රමවේදයක් සංවර්ධය කිරීම.**

ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවේ ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍ර සඳහා PLC පදනම් කරගත් පාලන පද්ධතියක් වතු ගිණුම උපයෝගි කරගනිමින් ස්ථාපනය කරන ලදි. විවිධ ක්‍රියාවලි පරාමිතීන් පාලනය කිරීමටත් එමඟින් නිම් තේ වර්ගවල අනුපාතය සහ මුළු විකුණුම් සාමාන්‍ය වර්ධනය ගැන 2023 වසරේදී අධ්‍යයනය කිරීමට සුදුසුවන පාලන ක්‍රමවේදයක් ගොඩනංවා පරීක්ෂණ පැවැත්වීමට අදහස් කෙරේ.

එම් ඒ චමින්ද්‍ර, කේ රවීන්ද්‍රන්, එල් ජයසිංහ, කේ ඒ එල් සී කොඩිතුවක්කු,
ඩබ් එම් අයි සත්සරනි, කේ රවීන්ද්‍රන් සහ එම් ඒ චමින්ද්‍ර

**ව්‍යාපෘතිය A 48. 15. උණු ජලය සංසරණය සහ භූමාලය විකිරණය මඟින් වඩා කාර්යක්ෂම උණුසුම් වායුව ලබා ගැනීමේ ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම.**

**D/Tech - තාක්ෂණ අංශයේ කටයුතු**

**ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවට අදාළව පර්යේෂණාත්මක සැකසුම් තාක්ෂණ වැඩි දියුණු කිරීමේ කර්මාන්තශාලාවක් බවට පත් කිරීම.**

කර්මාන්තශාලාවේ සහ යන්ත්‍රවල වැඩිදියුණු කිරීම් දිගටම සිදුවිය. රෝල් කාමරයේ ක්‍රියාදාමයන් වාහක පටි / ස්වයංක්‍රීය කිරීම්, වැඩිදියුණු කරන ලද ඇඹරුම් යන්ත්‍ර සහ රෝල් බ්‍රේකර් යන්ත්‍ර සුදුසු ලෙස ස්ථානගත කර අවශ්‍ය විදුලිබල සැපයුම් ලබාදීම සිදු කරන ලදි. තව් මැරීමේ ද්‍රෝණිකා හයක අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදි. තව් මැරීමේ ද්‍රෝණිකා දෙකක අලුත්වැඩියාවන්ට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම් සිදුකරන ලදි. අමතර වියලන යන්ත්‍රයට අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකරන ලදි. පළමු මහලේ දැවමය බිමට අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකරන ලදි. කම්කරුවන්ගේ විවේක කාමරයට සහ උඳුන් කාමරයට ඉහළින් ඇති කොන්ක්‍රීට් ස්ලැබ් වල පැවති කාන්දුවීම් සකසන ලදි. බිම් මහලේ වහල වැහි පිහිලි සහ නල අලුතින් නිමවන ලදි. පළමු මහලේ වහල, වැහි පිහිලි සහ නල ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම් සිදුකරන ලදි.

කේ රවීන්ද්‍රන් සහ එම් ඒ චමින්ද්‍ර

**තේ කර්මාන්ත ශාලාවල ශුද්ධ නිම් තේ අනුපාතය ස්ථාපනය කිරීම සඳහා වන සංගණනය**

තේ කර්මාන්තශාලාවල සාක්ෂාත් කරගත හැකි ශුද්ධ නිම් තේ අනුපාතය තහවුරු කරගැනීමට ඉවහල් වන වාණිජ මට්ටමේ පරීක්ෂණ සහ තේ කර්මාන්ත ශාලා 37 ක් සහභාගි කරගනිමින් පවත්වන සංගණනයක් ආරම්භ කරන ලදි. සංගණනය සඳහා ලබා ගන්නා අමු තේ දළු වල තෙතමනය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන අලුතින් මිළදී ගන්නා ලද පරීක්ෂණාගාර උඳුන් දෙකක එහි ධාරිතාවය වැඩි කිරීම සඳහා වැඩිපුර රාමු සහ ඊට අවශ්‍ය තට්ටුද එක්කර වලහන්දුව සහ මතුගම ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලට බාර දෙන ලදි. තවද, මේ සඳහා අවශ්‍ය වන සංඛ්‍යාංක තරාදියක් මතුගම ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත බාර දෙන ලදි. මෙම සංගණනයෙදී භාවිතා කිරීම සඳහා අළුතින් මිළදී ගන්නා ලද සංඛ්‍යාංක තරාදි 21ක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් අතර බෙදා දෙන ලදි.

මෙම සංගණනයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා නිළධාරින් සහභාගි වූ අතර තේ කර්මාන්තශාලා නිරීක්ෂණ සඳහා ගමන්වාර කිහිපයකට සහභාගි විය. සංගණනයේදී ලබා ගන්නා ලද අමු තේ දළු සාම්පල 2,622 ක තෙතමනය පරීක්ෂා කර බලන ලදි. ශුද්ධ නිමි තේ අනුපාතය (NOT) පරීක්ෂණයේ මුල් කෙටුම්පත සකස් කරගැනීමට ඉවහල් වන පරීක්ෂණ වාර දෙකක් ශාන්ත කූම්බ්ස් කර්මාන්ත ශාලවේදි සිදුකරන ලදි. සංගණයේ ප්‍රගති වාර්ථාවක් MPI වෙත ජූලි මස 11 වන දින බාර දෙන ලදි. සංගණනයේ ප්‍රගතිය සමාලෝචනය සහ වාණිජ මට්ටමේ පරීක්ෂණ ගැන සාකච්ඡා කිරීම සඳහා අභ්‍යන්තර මට්ටමේ රැස්වීමක් ජූලි මස 18 වන දින පවත්වන ලදි. සංගණනය සමාලෝචනය කිරීමේ අතථ්‍ය රැස්වීමක් SLTB සහ TSHDA නිළධාරින් සමග ජූලි මස 26 වන දින පවත්වන ලදි. NOT පරීක්ෂණයේ මුල් කෙටුම්පත සමලෝචනය කිරීම සඳහා CCR විශේෂ රැස්වීමක් පවත්වන ලදි. මෙම NOT සංගණනය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට එය SLTB හි තේ කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලදි. රත්නපුර ප්‍රදේශයේ  සහකාර තේ කොමසාරිස් සහ තේ පරීක්ෂක මහතුන්ගේ සහභාගිත්වයෙන් සංගණනයේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් සැප්තැම්බර් මස 2 වන දින පවත්වන ලදි. මෙම වසර තුලදි වාණිජ මට්ටමේ NOT පරීක්ෂණ වාර හතරක් සිදු කරන ලදි.

කේ රවීන්ද්‍රන්, එම් ඒ චමින්ද්‍ර සහ ඩබ් එම් එස් වීරවර්ධන

**කුඩා පරිමාණයේ දළු යොදා ගනිමින් කරන නිෂ්පාදන කටයුතු ඇතුළු අංශයේ වෙනත් කටයුතු**

- කීට විද්‍යා, වට පණු විද්‍යාවේදි, ශාක ව්‍යාධිවේදී, ශාක කායික විද්‍යා යන අංශ මගින් බාරදෙන ලද අමු දළු සාම්පල 234 කුඩා පරිමාණයේ යන්ත්‍ර උපයෝගී කර ගනිමින් නිෂ්පාදනය කර වර්ගීකරණය සහ ශුද්ධ කිරීම් සිදුකර ඇසුරුම් කිරීමෙන් පසුව නැවත බාරදෙන ලදී.
- “තේ පර්යේෂණායතනයේ ප්‍රධාන මධ්‍යස්ථානයේ කර්මාන්තශාලාව යොදා ගනිමින් පර්යේෂණාත්මක සැකසුම් තාක්ෂණ සංවර්ධන කර්මාන්තශාලාවක් ස්ථාපනයට” අදාළ ව්‍යාපෘති වාර්තාවක් සහ පර්යේෂණාත්මක සැකසුම් තාක්ෂණ සංවර්ධන කර්මාන්තශාලාවක් ස්ථාපනය කිරීම - අදියර 2 (ශාන්ත ජෝකිම් වත්ත) අදාලව ව්‍යාපෘති වාර්තා MPI වෙත අනුමැතිය සඳහා බාරදෙන ලදි.
- තලවාකැලේ තේ පර්යේෂණ ආයතන ප්‍රධාන මධ්‍යස්ථානයේ සහ අනෙකුත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 6 සඳහා බල ශක්ති පරිභෝජනයට අදාළ කාර්තුවක් සඳහා වූ වාර්තා සකස් කරන ලදී.
- කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක සඳහා පැවති ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදය, පර්යේෂණ සහ ව්‍යප්ති සංසදය සහ TRI වතු සඳහා වන උපදේශක කමිටු රැස්වීම් සඳහා නිළධාරින් සහභාගි විය.
- කඩවත මධ්‍ය විද්‍යාලයේ සිසුන් 250ක් සඳහා තේ නිෂ්පාදන තාක්ෂණයට අදාලව ආදර්ශනයක් පැවැත්විය.
- කඩදාසි මළු සාම්පල 19 සඳහා මිනුම් සහ බර ප්‍රතිශතය නිර්ණය කිරීම් සඳහා නිළධාරින් සහභාගි විය.

කේ රවීන්ද්‍රන්, එම් ඒ චමින්ද්‍ර, ඩබ් එම් එස් වීරවර්ධන, එල් ජයසිංහ, යූ පී ඩි පි රණතුංග, ඊ පි ඩි එන් එම් විජයවර්ධන, කේ ඒ සී එල් කොඩිතුවක්කු සහ ඩබ් එම් අයි සත්සරනි

## තේ නිෂ්පාදනය සඳහා අවශ්‍යවන විකල්ප බලශක්ති ප්‍රභවයන් ඇගයීම

**ප්‍රධාන ව්‍යාපෘතිය A 25. තේ නිෂ්පාදනයේදී භාවිතා වන බල ශක්ති පිරිවැය අඩු කර ගැනීම සඳහා අවශ්‍ය වන තාක්ෂණය වැඩි දියුණු කිරීම.**

**ව්‍යාපෘතිය A 25.3. තේ කර්මාන්තශාලා වල දැනට පවතින වායු උඳුන් පද්ධතිය වෙනස් කිරීම (2017)**
කැබලි කරන ලද දර කැබලි පෝරණුව තුලට දැමීම සඳහා අර්ධ ස්වයංක්‍රීය යන්ත්‍රයක් නිම කොට සාර්ථක ලෙස අත්හදා බැලීම 2021 වසර තුලදී සිදු කරන ලදි. අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමෙන් පසුව ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවේ පෝරණුවට මෙය එක් කිරීමෙන් අනතුරුව ආදර්ශණයන් සිදු කිරීමට අදහස් කොට තිබේ.

නන්දන එදිරිසිංහ, කේ රවීන්ද්‍රන්, එල් ජයසිංහ, එම් ඒ චමින්ද්‍ර සහ ඩබ් එම් අයි සත්සරනි

**ව්‍යාපෘතිය A 25.6. තරල පත්ල වියලනය සහ අධෝරක්ත කිරණ සහසම්බන්ධව තේ වියලීමේදී එය නිමි තේවල ගුණාත්මක බවට සහ පිරිවැයට බලපාන අයුරු සාමාන්‍ය තරල පත්ල වියලීම සමඟ සංසන්දනය කර බැලීම (2015)**
තේ වියලීම සඳහා අධෝරක්ත (FIR) ක්‍රමයේ ආදර්ශකයක වියලනයක් සැලසුම් කිරීමෙන් අනතුරුව එය පාලන පද්ධතියක් සමගින් නිපදවා තිබේ. යන්ත්‍රය පාලනය කිරීම සඳහා පාලන පද්ධතියද වැඩිදියුණු කොට තිබේ.

කේ රවීන්ද්‍රන්, එල් ජයසිංහ, ඩබ් එම් එස් වීරවර්ධන, යූ ජී ඩී පී රනතුංග,
සහ ඊ පී ඩී එන් එම් විජයවර්ධන

**ව්‍යාපෘතිය A 25.10. පෝරණුව සඳහා දහනය පාලනය කිරීමේ ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම.**
ශාන්ත කුම්බිස් කර්මාන්තශාලාවේ උණු ජල ජනකයේ දර දහනය පාලනය කිරීම සඳහා පාලන පද්ධතියක් සැලසුම් කොට සවිකිරීමෙන් අනතුරුව එහි පරීක්ෂණ සහ එහි වලංගුභාවයද සොයා බලන ලදි.

කේ රවීන්ද්‍රන්, එල් ජයසිංහ, ඩබ් එම් එස් වීරවර්ධන, යූ ජී ඩී පී රනතුංග
සහ ඊ පී ඩී එන් එම් විජයවර්ධන

## නිෂ්පාදිත තේවල තත්වය වැඩි දියුණු කිරීම

**ප්‍රධාන ව්‍යාපෘතිය A 46. නිමි තේ වල ගුණාත්මක බව සහ ගුණාත්මක බව රඳවා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණය සංවර්ධනය කිරීම**
**ව්‍යාපෘතිය B 58. පහතරට නිෂ්පාදිත තේවල කළු පැහැති බව සහ ඇඹරුණු ස්වභාවයට බලපාන සාධක හඳුනා ගැනීම.**
නිමි තේවල කළු පැහැයට සහ ඇඹරුණු ස්වභාවයට බලපාන සාධක හඳුනා ගැනීමට ඉවහල් වන පරීක්ෂණයක් සැලසුම් කරන ලදි. පරීක්ෂණයට අවශ්‍ය වන රසායන ද්‍රව්‍ය පහක් සඳහා මිලදී ගැනීම් ඇනවුම් ඉදිරිපත් කළමුත් ඉන් රසායන ද්‍රව්‍ය දෙකක් පමණක් ලබා ගත හැකි විය. ඉතිරි රසායන ද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු කරණු ඇත.

කේ රවීන්ද්‍රන්, එම් ඒ චමින්ද්‍ර, කේ ඒ එල් සී කොඩිතුවක්කු සහ ඩබ් එම් අයි සත්සරනි

**ව්‍යාපෘතිය B 106. නිම් තේවල පොලිෆීනොල් අන්තර්ගතයට බලපැම් කරන සාධක පිළිබඳ අධ්‍යයනය සහ පොලිෆීනොල්වලින් පොහොසත් නිම් තේ නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනය කිරීම**
**'සිලෝන් ටී' සන්නාමය තහවුරු කිරීම සඳහා භූ රසායනික ප්‍රවේශය පිළිබඳ නියමු ව්‍යාපෘතිය**
මෙම අධ්‍යයනය 2021 වර්ෂයේ ආරම්භ කරන ලදී. තෙත් සහ වියළි කාලවලදී සියලුම කලාපවලින් තේ නියැදි එකතු කිරීම් අවසන් කරන ලදී. මහනුවර කලාපයේ වියළි කාලයේදී පමණක් නියැදි එකතු කිරීම සිදු කරන ලදී. සමස්ථානික විශ්ලේෂණය සඳහා සම්මත ක්‍රමයට අනුව කළු තේ සාම්පල 1342 සකස් කරන ලදී.

කළු තේවල රසයට බලපාන වැදගත් රසායනික සංඝටක වන්නේ පොලිෆිනෝල්, කැෆේන්, සීනි, කාබනික අම්ල, වාෂ්පශීලී රසකාරක සංයෝග සහ ඇමයිනෝ අම්ල වේ. ශ්‍රී ලංකාවේ තේ වගා කරන සියලුම ප්‍රදේශ නියෝජනය කරන කළු තේවල රසායනික ලක්ෂණ පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සීමිතය. එබැවින්, කළු තේවල රසායනික සංයුතිය සැලකිල්ලට ගනිමින්, ප්‍රාදේශීය තේවල රසායනික සංයුතිය විශ්ලේෂණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. එබැවින්, භූ රසායනික ප්‍රවේශයන් සමඟ, සම්පූර්ණ පොලිෆිනෝල් සහ ඇමයිනෝ අම්ලය, එල් -තියනින් (L-theanin), තියාෆ්ලවින්/තියාරුබිගින්ස් (Theaflvin/Thearubigin (TF/TR) වැනි රසායනික පරාමිතීන් තේ වගා කරන සියලුම කලාප නියෝජනය වන පරිදි විශ්ලේෂණය කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, කළු තේ සාම්පලවල සම්පූර්ණ පොලිෆිනෝල් අන්තර්ගතය (සාම්පල 209), TF/TF (සාම්පල 317), සම්පූර්ණ ඇමයිනෝ අම්ල අන්තර්ගතය (සාම්පල 177), සහ එල්-තියනින් අන්තර්ගතය (සාම්පල 59) විශ්ලේෂණය කරන ලදී.

කේ පී එන් පී පියසේන, ඊ එන් යූ එදිරිසිංහ, ඩබ්ලිව් එස් ජයසිංහ, ජේ ජයේන්ද්‍රන්,
පි ඒ එම් ජයවර්ධන, එස් එම් යු ජේ යු බණ්ඩාර
(ශාක අභිජනන අංශය සහ පාංශු හා ශාක පෝෂණ අංශය සමසහයෝගී අධ්‍යයනයකි )

**ව්‍යාපෘතිය B 107. වෙළඳපොළෙහි ඇති සීනිවලින් අපමිශ්‍රණය වූ නිම් තේ හඳුනා ගැනීම සඳහා සරල ක්‍රමවේදයන්**
නිම් තේවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO) කළු තේ සඳහා ප්‍රමිතීන් ස්ථාපිත කර ඇත. ISO 3720 ප්‍රමිතීන්ට අනුව පිළිගත හැකි ක්‍රියාවලියකින් තේ නිෂ්පාදනය කළ යුතු අතර තේ සැකසීමේදී කිසිදු ආගන්තුක ද්‍රව්‍යයක් එකතු නොකළ යුතුයි. කෙසේ වෙතත් ඇතැම් තේ නිෂ්පාදකයින් කළු තේවල පෙනුම සහ බර වෙනස් කිරීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේදී විවිධ ද්‍රව්‍ය/රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බවට චෝදනා ඇත. මෑතකදී කළු තේ සැකසීමේදී මෝල්ටොඩෙක්ස්ට්‍රින් එකතු කරන බවට සඳහන් වී ඇත. මෝල්ටොඩෙක්ස්ට්‍රින් යනු ඉරිඟු, අර්තාපල් පිෂ්ඨය හෝ තිරිඟුවලින් සාදන ලද සුදු පැහැයෙන් යුතු ද්‍රව්‍යයක් වන අතර එය වියළන ලද කුඩු හෝ සාන්ද්‍ර දියර ආකාරයෙන් ලබා ගත හැකිය. මෝල්ටොඩෙක්ස්ට්‍රින්හි ඩෙක්ස්ට්‍රෝස් අණු 3-20 පරාසයක් අඩංගු බහුඅවයවික් වේ. මෝල්ටොඩෙක්ස්ට්‍රින් පිෂ්ඨයට වඩා ජලයේ ද්‍රාව්‍ය වන අතර අනෙකුත් ආහාරයට ගත හැකි හයිඩ්‍රොකොලොයිඩ් වලට වඩා ලාභදායී වන අතර එහි ද්‍රාවණය මෘදු රසයක් ඇත.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ මෝල්ටොඩෙක්ස්ට්‍රින් සමඟ මිශ්‍ර වූ කළු තේ හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමයි. මෝල්ටොඩෙක්ස්ට්‍රින් සමඟ මිශ්‍ර වූ කළු තේ ගුණාත්මකව හඳුනා ගැනීම සඳහා HPLC (High Performance of Liquid Chromatography) සමඟ ELSD (Evaporative Light Scattering Detector) ක්‍රමවේදයක් සකස් කරන ලදී. විශ්ලේෂණය සඳහා Zorbax NH2 column (150 x 4.6 mm (5 µm) ), ජලයේ දියකරන ලද ඇසිටොනයිට්‍රයිල් (70% සිට 83%) (mobile phase) භාවිතා කරන ලදී. මෝල්ටොඩෙක්ස්ට්‍රින් සමඟ මිශ්‍ර වූ කළු තේ හඳුනා ගැනීම සඳහා මෙම ක්‍රමය සාර්ථකව භාවිතා කළ හැකිය.

කේ පී එන් පී පියසේන, ඩබ්ලිව් එස් ජයසිංහ, ඊ එන් යූ එදිරිසිංහ, සහ ඒ ඒ බී අබයරත්න

**කළු තේ සැකසීමේ දී වාතනය/ඔක්සිකරණ කාලය තුළ සීනිවල ගතික වෙනස්කම් අධ්‍යයනය කිරීම**

**(Quantification of dynamic changes of sugars during the aeration/oxidation period of black tea processing)**

ශ්‍රී ලංකාවේ ඉහළ උන්නතාංශවල ඇතැම් කර්මාන්තශාලා කළු තේ නිෂ්පාදනය සඳහා විවිධ ප්‍රවේශයන් අනුගමනය කර ඇති බව වර්තමාන අධ්‍යයනයේදී අනාවරණය විය. විශේෂයෙන්ම ලා පැහැයෙන් යුත් තේ නිෂ්පාදනයේදී මෙම කර්මාන්තශාලා සාමාන්‍යයෙන් අනුවර්තනය කරන ලද වාතනය කිරීමේ පියවර මඟ හැර ඇති අතර තේ දළු ඇඹරීමෙන් පසුව වහාම වියළීමේ ක්‍රියාවලිය සිදු කරන ලදී. ඉහළ උන්නතාංශවල අහඹු ලෙස තෝරාගත් වෙනත් කර්මාන්තශාලා මඟින් නිෂ්පාදනය කරන කළු තේවල ඇති සුක්‍රෝස් ප්‍රමාණයට සාපේක්ෂව මෙම තේ කම්හල්වල නිෂ්පාදනය කරන කළු තේවල සුක්‍රෝස් සාන්ද්‍රණය වැඩි බව අපගේ අධ්‍යයනයෙන් හෙළි විය. එබැවින් වාතනය/ඔක්සිකරණ කාලය තුළ මෙම සීනි සාන්ද්‍රණයේ ගතික වෙනස්කම් පුළුල් ලෙස විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වත්තෙන් 2022 පෙබරවාරි මාසයේදී දළු නෙළා (අංකුරය සහ පළමු කොළ දෙක) කළු තේ නිෂ්පාදනය කරන ලදී. තේ නිෂ්පාදනයේදී නැවුම් දළු, මැලවීමෙන් පසුව, දළු ඇඹරීමෙන් පසුව සෑම විනාඩි 15 වරක්ම තේ ධූලි එකතු කර ෆෲක්ටෝස්, ග්ලූකෝස් සහ සුක්‍රෝස් සාන්ද්‍රණය සඳහා තේ සාම්පල විශ්ලේෂණය කරන ලදී.

ප්‍රතිඵලවලට අනුව කළු තේ සැකසීමේදී මෙන්ම වාතනය කරන කාලය තුළ සීනි සාන්ද්‍රණය සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත. මිනිත්තු 75 යි විනාඩි 90 කින් එකතු කරන ලද පැසුණු ධූලි සහ කළු තේවල ඉහළම ෆෲක්ටෝස් අන්තර්ගතය අඩංගු විය. නැවුම් කොලවල ඉහළම ග්ලූකෝස් අන්තර්ගතය නිරීක්ෂණය කරන ලදී. අඩුම ෆෲක්ටෝස් අන්තර්ගතය මැලවී ගිය තේ දළු වල නිරීක්ෂණය කරන ලද අතර අඩුම ග්ලූකෝස් අන්තර්ගතය මැලවී ගිය සහ අඹරන ලද තේ කොළ වල වාර්තා විය. කළු තේ සැකසීම පුරාවට තේ සාම්පලවල සුක්‍රෝස් සාන්ද්‍රණයේ සැලකිය යුතු වෙනසක් සිදු විය. උපරිම සුක්‍රෝස් අන්තර්ගතය මැලවී ගිය කොළ වල නිරීක්ෂණය කරන ලද අතර අඩුම සුක්‍රෝස් අන්තර්ගතය නැවුම් කොළ සහ කළු තේ වල දක්නට ලැබුණි. ෆෲක්ටෝස් සහ ග්ලූකෝස් අන්තර්ගතය මැලවීමේ කාලය පුරාම අඩු වූ අතර සුක්රෝස් අන්තර්ගතය වැඩි විය. ඉන්පසුව, වාතනය කරන කාලය පුරාවටම සුක්‍රෝස් ප්‍රමාණය අඩු වන අතර එය නිමි තේවල තවදුරටත් අඩු විය. මෙම අධ්‍යයනයේ දී මැලවී යාමේදී සුක්‍රෝස් සාන්ද්‍රණය වැඩි වී කළු තේ සැකසීමේදී උච්චාවචනය වූ බව පැහැදිලිව පෙන්වා දී ඇත. වාතනය කිරීමේ ක්‍රියාවලිය මග හරිමින් අඹරන ලද කොළ භාවිතයෙන් සකස් කරන ලද කළු තේවල සැලකිය යුතු ලෙස ඉහළ සුක්‍රෝස් අන්තර්ගතයක් නිරීක්ෂණය විය. ලබාගත් ප්‍රතිඵලවලට අනුව, කළු තේ සැකසීම පුරාවට, ග්ලූකෝස් සහ ෆෲක්ටෝස්වලට සාපේක්ෂව සුක්‍රෝස් අන්තර්ගතය කැපී පෙනෙන ලෙස වෙනස් වූ අතර විවිධ සැකසුම් අවස්ථාවලදී තේ සාම්පලවල සුක්‍රෝස් අන්තර්ගතය ෆෲක්ටෝස් සහ ග්ලූකෝස්වලට වඩා වැඩි විය.

කේ ජී එන් පී පියසේන, ඩබ්ලිව් එස් ජයසිංහ, ඊ එන් යූ එදිරිසිංහ සහ ඒ ඒ බී අබයරත්න

**ආසන්න අධෝරක්ත වර්ණාවලීක්ෂය (FT-NIR) සහ chemometrics භාවිතයෙන් කළු තේ සාම්පලවල ග්ලූකෝස් සහ සුක්‍රෝස් අන්තර්ගතය පිළිබඳ පුරෝකථනය**

**(Prediction of glucose and sucrose contentsf black tea samples using NIR spectroscopy and chemometrics)**

උඩරට, මැදරට සහ පහතරට කලාප සඳහා උපරිම අවසර ලත් ෆෲක්ටෝස්, ග්ලූකෝස් සහ සුක්‍රෝස් සාන්ද්‍රණය සාර්ථකව ස්ථාපිත කර ඇත. ඉහළ ක්‍රියාකාරී ද්‍රව වර්ණලේඛ ශිල්පය (HPLC) යනු ආහාරවල සීනි මට්ටම තීරණය කිරීම සඳහා වඩාත් විශ්වාසදායක සහ බහුලව භාවිතා වන ක්‍රමයයි. කෙසේ වෙතත්, HPLC විශ්ලේෂණය කාලය ගතවන සහ මිල අධික ක්‍රමයක් වන අතර කෙටි කාලයක් තුළ සාම්පල විශාල සංඛ්‍යාවක් විශ්ලේෂණය කිරීමට සුදුසු නොවේ. එබැවින් කළු තේ වල සීනි මට්ටම හඳුනා ගැනීම සඳහා විකල්ප Near Infrared (NIR) තාක්ෂණය භාවිතා කළ හැකිය.

ආසන්න අධෝරක්ත වර්ණාවලීක්ෂය (FT-NIR) සහ chemometrics තේ වල තත්ත්ව පාලනය සඳහා වැදගත් විශ්ලේෂණ මෙවලමකි. FT-NIR වර්ණාවලීක්ෂය භාවිතයෙන් කළු තේවල ඇති සීනි එනම් සුක්‍රෝස් සහ ග්ලූකෝස් ප්‍රමාණනය කිරීම සඳහා ප්‍රමාණකරණ ක්‍රමයක් සකස් කර වලංගු කරන ලදී. කළු තේවල ෆෲක්ටෝස්, ග්ලූකෝස් සහ සුක්‍රෝස් සාන්ද්‍රණය ඉහළ ක්‍රියාකාරී ද්‍රව වර්ණලේඛ ශිල්පය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. 5878-3595 $cm^{-1}$ (1701-2782 nm) අතර NIR වර්ණාවලි කලාපය කළු තේ වල ග්ලූකෝස්, සුක්‍රෝස් සහ ෆෲක්ටෝස් සාන්ද්‍රණය පුරෝකථනය කිරීම සඳහා හොඳම පරාසය ලෙස තෝරා ගන්නා ලදී. සුක්‍රෝස් සඳහා සකස් කරන ලද ක්‍රමාංකන ආකෘතියේ ඉහළ RPD (4.29) සහ $r^2$ (0.95) ඇති අතර එමගින් කළු තේවල ආවේණික සුක්‍රෝස් අන්තර්ගතය ඉහළ නිරවද්‍යතාවයකින් පුරෝකථනය කිරීමේ හැකියාව පෙන්නුම් කරයි. ග්ලූකෝස් සඳහා සකස් කරන ලද ක්‍රමාංකන ආකෘතියේ RPD 2.73 සහ $r^2$ 0.87ක් ඇති අතර නිරවද්‍යතාවයකින් කළු තේ වල ග්ලූකෝස් අන්තර්ගතය පුරෝකථනය කිරීමේ හැකියාව පෙන්වයි.

කේ ජී එන් පී පියසේන, ඩබ්ලිව් එස් ජයසිංහ, ඊ එන් යූ එදිරිසිංහ සහ ඒ ඒ බී අබයරත්න,
එම් ඒ බී රණතුංග ශාක අභිජනන අංශය සමග සහයෝගී අධ්‍යයනයකි

**ව්‍යාපෘතිය A 46.7 උසස් තත්වයේ හරිත තේ නිෂ්පාදනය කිරීම සඳහා නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දීම.**

**B140 තත්ත්වයෙන් උසස් ආහාර අරමුණු කර ගනිමින් ක්ෂුද්‍රජීවීන් මගින් නිමි තේ අපවිත්‍ර වීම අවම කිරීම සඳහා තේ නිෂ්පදන ක්‍රියාවලියේ තීරණාත්මක පියවර විශෝධනය**

කළු තේ උපස්තරය ලෙස භාවිතා කරන ඇෆ්ලොටොක්සින් නිපදවීමේ විභවයක් සහිත පුස් වර්ග පිළිබඳවත්, ඒවායේ වර්ධනය, ගුණනය සහ උපස්තරයට ඇෆ්ලොටොක්සින් මුදා හැරීමේ හැකියාව කෙරෙහි සාපෙක්ෂ ආර්ද්‍රතාවයේ සහ උෂ්ණත්වයේ බලපෑම අධ්‍යයනය කිරීමත් මෙහි අරමුණු විය. ඇෆ්ලොටොක්සින් සම්මතකාරක (aflatoxin standards) වන B1, B2, G1, සහ G2 භාවිතා කරමින් නිමි තේ වල ඇෆ්ලොටොක්සින් හඳුනාගැනීම සඳහා HPLC ක්‍රමවේදය ප්‍රශස්තකරණය කරන ලදී. HPLC සමග ELISA ක්‍රමය වලංගු ගත කිරීම සිදු වෙමින් පවතී.

ජී. ඩී. සින්නයියා, එම්. නිරංජන් සහ ජෛව රසායන අංශය

## තේවල සෞඛ්‍ය ප්‍රතිලාභ

### ශ්‍රී ලංකා තේ ප්‍රභේදයන්වල සෞඛ්‍යමය වැදගත් ප්‍රතිලාභ සහ ගුණාංග විමර්ශනය කිරීම (2019)

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකා තේ වගාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ බලපෑම් විමර්ශනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් කලින් කරන ලද අධ්‍යනය හා සම්බන්ධයි. මෙම අධ්‍යයනයේ දී ශීත කළ වියළන ලද කළු තේ ද්‍රාවනය සහ ශීත කළ වියළන ලද නැවුම් තේ රිකිලිවල මෙතනෝල් සාරය ඇතුළුව තේ සාර 60 ක් භාවිතා කරන ලදී. Elastase, xanthine oxidase, nitrous oxide, and ORAC bioassays තේ සාර 60 සඳහා කරන ලදී. දත්ත විශ්ලේෂණය සිදු වෙමින් පවතී.

කේ ජී එන් පී පියසේන, ඒ ඒ බී අබයරත්න සහ ශාක අභිජනන අංශය, තේ ප ආයතනය
ජාතික මූලික අධ්‍යයන ආයතනය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග සහයෝගී අධ්‍යයනයකි

**ශ්වේත (සුදු) තේ වල ජීව විද්‍යාත්මක ලක්ෂණ**

ශ්‍රී ලංකාවේ සුදු තේ සම්බන්ධ ජීව විද්‍යාත්මක පරීක්ෂණ සීමිතය. ශ්‍රී ලාංකික සම්භවයක් ඇති "ශ්වේත (සුදු) තේ" සාම්පල පහළොවක් 2019 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවෙන් පහතරට (මීටර් 0-600), මැදරට (මීටර් 600-1,200) සහ උඩරට (මීටර් 1200) කලාපවලින් එකතු කරන ලදී. රසායනික විශ්ලේෂණය සහ ජීව විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය සඳහා ශීත කළ වියළන ලද තේ ද්‍රාවනය භාවිතා කරන ලදී. ප්‍රතිඵලවලට අනුව, විවිධ උන්නතාංශ මට්ටම්වලින් එකතු කරන ලද සුදු තේ සාම්පල සඳහා මෙම අධ්‍යයනයේ දී භාවිතා කරන ලද ජෛව විශ්ලේෂණය භාවිතයෙන් ජනනය කරන

ලද ප්‍රතිඵල අතර සැලකිය යුතු වෙනස්කම් දක්නට නොලැබුණි. ශ්‍රී ලංකා සුදු තේවල ඉහළ ප්‍රතිඔක්සිකාරක "acetylcholine esterase" α-glucosidase iy xanthine oxidase නිෂේධන ක්‍රියාකාරිත්වයක් ඇත. තවද, සුදු තේවල මධ්‍යස්ථ lipase සහ tyrosinase නිෂේධන ක්‍රියාකාරකම් පෙන්නුම් කරයි. එබැවින් සුදු තේ ස්වභාවික ආහාර ප්‍රතිඔක්සිකාරක සඳහා ප්‍රයෝජනවත් අනුපූරකයක් විය හැකි අතර පෝෂ්‍ය පදාර්ථ සහ රූපලාවන්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගත හැකිය.

කේ ජී එන් පී පියසේන, ඩබ්ලිව් එස් ජයසිංහ, ඊ එන් යූ එදිරිසිංහ සහ ඒ ඒ බී අබයරත්න,
ශාක අභිජනන අංශයේ එම්. ඒ. බී. රණතුංග සමඟ සහයෝගී අධ්‍යයනයකි

**තේ සුවඳ සංවෘත කිරීම සඳහා ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම සහ සංවෘත තේ සුවකෂෙහි විභවතාවය ඇගයීම**

මෙම අධ්‍යයනය 2020 වර්ෂයේ ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කරන්නේ තේ සුවඳ සාන්ද්‍රණය සඳහා ප්‍රශස්ත කිරීම සඳහා සුදුසු ද්‍රව්‍ය සහ ශිල්පීය ක්‍රම කෙරෙහි ය. තවද, එම තේ සුවඳ සාන්ද්‍රණය භාවිතයෙන් ක්ෂණික තේවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ හැකියාව අධ්‍යයනය කෙරේ.

තේ සුවඳ සඳහා වඩාත් කාර්යක්ෂම ආවරණය කිරීමේ ක්‍රමය තෝරා ගැනීම සඳහා ඉසින-වියලීම (spray drying) සහ ශීත කිරීමේ-වියළීමේ (freeze-drying) ක්‍රම පරීක්ෂා කරන ලද අතර, ඉසින-වියලීමේ (spray drying) ක්‍රමයට සාපේක්ෂව අධි සාන්ද්‍රණයකින් තේ සුවඳ සංයෝග පරාසයක් ශීත කිරීමේ-වියළීමේ (freeze-drying) ක්‍රමය මඟින් ආවරණය කරන බව සොයා ගන්නා ලදී. තේ සුවඳ සාන්ද්‍රණයට සමගාමී පටල සාන්ද්‍රණය (membrane filtration) සහ ශීත කිරීමේ-වියළීමේ (freeze-drying) තේ සුවඳ සාන්ද්‍රණය සඳහා යෝග්‍ය ක්‍රියාවලිය ලෙස තෝරා ගන්නා ලද අතර එහි ඇති සාරවත් සුවඳ පැතිකඩ සහ සංවේදී ගුණ නිසා තේ සුවඳ/ ශීත කළ වියලීමේ ක්‍රියාවලියට පෙර සාන්ද්‍රණයට සාපේක්ෂව තේ සුවඳ සාන්ද්‍රණය සඳහා සුදුසු ක්‍රියාවලිය ලෙස තෝරා ගන්නා ලදී. ක්ෂණික තේ (instanat tea) සහ තේ සාන්ද්‍රණය (tea concentarate) යන දෙකෙහිම සුවඳ පැතිකඩ වැඩි දියුණු කිරීම සඳහා හොඳම සංස්ථාගත කිරීමේ මට්ටම් ලෙස තේ සාන්ද්‍රණය මිලි ලීටර් 100 ක (තනුක කළ) 0.01% ක් සහ ක්ෂණික තේ ග්‍රෑම් 100 ක සුවඳ කුඩු 1.0% ක් තෝරා ගන්නා ලදී. විවිධ ගබඩා තත්වයන් යටතේ සුවඳ සංයෝගවල සාන්ද්‍රණයේ සුළු අඩුවීමක් ඒවායේ ගබඩා කිරීමේදී නිරීක්ෂණය විය. තේ සුවඳ තිර කිරීම සඳහා සංවර්ධිත ක්‍රියා පටිපාටිය දැන් පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතී.

කේ ජී එන් පී පියසේන, ඊ එන් යූ එදිරිසිංහ සහ
ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සමඟ සහයෝගී අධ්‍යයනයකි

Digi-nose **ඇරෝමා හඳුනාගැනීමේ පද්ධතිය සහ e-vision පද්ධතිය සමඟ සහසම්බන්ධය ඇති කිරීමේ හැකියාව විමර්ශනය කිරීම සඳහා කළු තේ පැසවීමේදී ජෛව රසායනික සංයෝග විශ්ලේෂණය කිරීම.**

මෙම අධ්‍යයනය 2020 වර්ෂයේ ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා තේ සාම්පල තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායේ තේ කර්මාන්තශාලාවෙන් ලබා ගන්නා ලදී. "පළමු ධූල්" තේ සාම්පල වාතනය අතරතුර සෑම විනාඩි 15 කට වරක් එකතු කරන ලදී. මෙම සාම්පල විනාඩි 20 ක් 120 ° C උඳුන තුල වියළා ගනු ලැබේ. වියළි තේ සාම්පල (SPME) භාවිතයෙන් සහ වායු වර්ණලේඛ -ස්කන්ධ වර්ණාවලීක්ෂ (GC-MS) විශ්ලේෂණය කිරීමෙන් සංයෝග හඳුනා ගන්න ලදී.

තේ වාෂ්පශීලී සංයෝග 72 ක් හඳුනාගන්න ලදී. මෙම සංයෝග ඇල්ඩිහයිඩ්, කීටෝන, එස්ටර, ඇල්කොහොල් සහ හයිඩ්‍රොකාබනවල රසායනික කාණ්ඩවලට වර්ගීකරණය කරන ලද අතර එක් එක් සංයෝගයේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%) ගණනය කරන ලදී. වාතනය/ඔක්සිකරණ වීමේදී එම රසායනික කණ්ඩායම්වල අන්තර්ගතයේ විචලනය අධ්‍යනය කරන ලදී. හයිඩ්‍රොකාබනවල සංයුතිය

29.02 ± 0.18 % සිට 22.89 ± 0.16 % දක්වා ක්‍රමානුකූලව අඩු වී ඇති බව ප්‍රතිඵල පෙන්නුම් කරන අතර ඇල්කොහොල් සහ එස්ටරවල අන්තර්ගතය පිළිවෙලින් 26 % සහ 4 % පමණ උච්චාවචනය විය. ඇල්ඩිහයිඩ් වල අන්තර්ගතය (5.25 ± 0.05% සිට 8.88 ± 0.12 % දක්වා) වැඩි වූ අතර වතනය් වීමේ කාලයත් සමඟ කීටෝනවල අන්තර්ගතය (3.01 ± 0.03% සිට 1.80 ± 0.02 % දක්වා) අඩු විය. E-2-hexanal සහ cis-3-hexenol තෘණ ගන්ධයක් ඇති කරන වාෂ්පශීලී රස සංයෝග (VFC) කාණ්ඩය I ලෙසත්, ලිනලූල්, ලිනලූල් ඔක්සයිඩ්, මෙතිල් සැලිසිලේට්, ෆීනයිල් ඇසිටැල්ඩිහයිඩ්, ජෙරනියෝල්, බෙන්සයිල් ඇල්කොහොල්, 2, ෆීනයිල්තන්නෝල්, VFC කාණ්ඩය II ලෙසත් වර්ගීකරණය කර ඇත. එය මිහිරි මල් සුවඳක් ජනනය කරයි. රස දර්ශකය ගණනය කිරීම සඳහා මෙම කණ්ඩායම් දෙක භාවිතා කරන ලද අතර එය වාතනය/ඔක්සිකරණ ක්‍රියාවලිය අවසානයේ 5.23 අගයට වාතනය/ඔක්සිකරණ කාලය සමඟ වැඩි වන ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. එය මුලින් 2.94 විය. කළු තේ සඳහා ප්‍රශස්ත වාතනය/ඔක්සිකරණ කාලය තීරණය කිරීම සඳහා උපකරණයක් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ වලදී මෙම අධ්‍යයනය තව දුරටත් කරනු ලැබේ.

කේ පී එන් පී පියසේන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ සහයෝගී අධ්‍යයනයකි

**තේ සාරය යොදා ගනිමින් අලිගැටපේර බටර් සෑදීම**

මෙම බටර් සෑදීමේදී ඔලිව් තෙල්, අලිගැටපේර, ලුණු සහ කුරුඳුවලට නිස්සාරණය කරන ලද නැවුම් තේ දළු සාරය භාවිතා කර ඇත. 60% නැවුම් තේ දළු සාරයෙන් 10 ml අඩංගු අලිගැට පේර සාන්ද්‍රණය හොඳම සංවේදී පැතිකඩ පෙන්නුම් කළේය. ඔලිව් තෙල්වලට නිස්සාරණය කරන ලද 60% නැවුම් තේ දළු මිලි ලීටර් 10 ක් අලිගැට පේර ඉස්ම ග්‍රෑම් 100 ක්, කුරුඳු 0.3% සහ ලුණු 2% ක් බටර් සකස් කිරීම සඳහා යොදා ගන්නා ලදී. බටර් සති 4 ක් සඳහා -18 °C දී තබා ඇති අතර ස්වභාවික හරිත වර්ණය කාලය පුරාවටම පැවතුනි. I'S 3507 1966 ආහාර විශ්ලේෂණයට අනුව සකස් කරන ලද බටර් විශ්ලේෂණය කරන ලදී. බටර් වල 72% තෙතමනය, 18% මේදය, 7% මේද රහිත ඝන සහ 2% ලුණු අඩංගු විය. බටර්වල pH අගය 6.9 ක් සහ ආම්ලිකතාවය 0.062 ට ඔලෙයික් අම්ලය/ට විය. යීස්ට් සහ පුස් ගණන 10 cfu/ml විය. 5 point hedonic scale අනුව රසය, ශරීරය සහ වයනය, වර්ණය සහ සමස්ත පිළිගැනීම සඳහා සංවේදී ලකුණු පිළිවෙලින් 3.73±0.57, 4.06±0.77, 4.06±0.67 සහ 3.73±0.67 (n=30) වේ.

කේ පී එන් පී පියසේන සහ ඒ ඒ බී අබයරත්න

# සමාජ ආර්ථික හා සම්පත් සැලසුම්කරණය



**ප්‍රධාන ව්‍යාපෘතිය A 31. තේ ක්ෂේත්‍රයේ විවිධ කලාපයන් හි සේවක හිඟය මඟහරවා ගැනීම සඳහා සමාජ-ආර්ථික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම**

**ව්‍යාපෘතිය A 31.8. තේ වගා කරන ප්‍රදේශවල ඉඩම් පරිහරණය සහ ඉඩම් ආවරණයේ ගතික වෙනස්වීම් ආදර්ශනය කිරීමෙන් තේ පාදක ඉඩම් වර්ගීකරණය හා ගමන් පථ හඳුනා ගැනීම.**

කුඩා තේ වතු අංශය (TSHs) තේ කර්මාන්තයේ ප්‍රධාන උප අංශයක් වන අතර ඔවුන් වෙනත් ආදායම් මාර්ග සමඟ අතිරේක ආදායම් මාර්ගයක් ලෙස තේ වගා කරයි. ඔවුන්ගේ ඉඩම් පරිහරණය ආර්ථික වශයෙන් ලාභදායී සහ පාරිසරික වශයෙන් තිරසාර කිරීමට විකල්ප ඉඩම් පරිහරණ ප්‍රවේශයන් යොදා ගැනීමේ හැකියාවක් ඇත. එසේම, කුඩා තේ වතුවල තනි බෝග වගාවේ සිට බහු බෝග වගා ක්‍රමයට අපසරනය වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැක. කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් පරිහරණයේ වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු නොමැති බැවින්, කුඩා තේ වතු හිමියන්ගේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීම සහ පවතින තේ මත පදනම් වූ ඉඩම් පරිහරණ පද්ධතිවල සමාජ-ආර්ථික හා පාරිසරික ප්‍රතිවිපාක හඳුනා ගැනීම වැදගත් වේ.

එබැවින් ශ්‍රී ලංකාවේ පහතරට (රත්නපුර) ප්‍රදේශයේ තේ ආශ්‍රිත වගා පද්ධති හඳුනා ගැනීමට සහ වර්තමාන වගා පද්ධතිවල ක්‍රියාකාරීත්වය ඇගයීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, කුරුවිට, ඉඹුල්පේ, කලවාන සහ ඕපනායක යන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස පහ (DSD) යටතේ ග්‍රාම නිලධාරී වසම් 44 ක ගොවි පවුල් තුන්සිය විස්සක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

වර්ගීකරණ ක්‍රියාවලියේදී වර්ගීකරණ සහ අඛණ්ඩ විචල්‍යයන් හැසිරවීම සඳහා පියවර පොකුරු විශ්ලේෂණයන් (Two Step Cluster Analyses) දෙකක් භාවිතා කරන ලදී. මෙම පද්ධතිවල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා, ප්‍රතිශත, අවම සහ උපරිම අගයන්, මධ්‍යන්‍යයන්, පරාසය සහ සම්මත අපගමනය ඇතුළුව විස්තරාත්මක සංඛ්‍යාලේඛන භාවිතයෙන් සමාජ-ජනවිකාස සාධක විශ්ලේෂණය කරන ලදී. වර්තමාන අධ්‍යයනයේ ගණනය කර ඇති ප්‍රධාන ආර්ථීක දර්ශක වූයේ ඒකක ප්‍රදේශයකට මුළු පිරිවැය, නිෂ්පාදන මිනුමකට ශුද්ධ ප්‍රතිලාභය වේ.

විස්තරාත්මක සංඛ්‍යාලේඛනවලට අනුව, නියැදිය 74%ක් පිරිමි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සහ 26%ක් කාන්තා ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සමන්විත වේ. ප්‍රතිචාර දැක්වූවන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 54ක් වූ අතර අවමය අවුරුදු 23ක් සහ උපරිමය අවුරුදු 87ක් විය. පවුල්වල පිරිමි සහ ගැහැණු අනුපාතය 1:1 වූ අතර වැඩ කරන කාණ්ඩය සඳහා එම අනුපාතය 4:3 විය. කුඩා වතු හිමියන්ගේ සාමාන්‍ය මට්ටමේ පළපුරුද්ද සම්බන්ධයෙන් සැලකූවිට නියැදියෙ හි කුඩා තේ වතු හිමියන්හට වසර 25 ක පළපුරුද්දක් තිබුණි. සාමාන්‍ය භූමි ප්‍රමාණය අක්කර 1.92ක් වූ අතර අවම වශයෙන් අක්කර 0.1ක් සහ උපරිම වශයෙන් අක්කර 13.5ක් විය.

සියළුම ගොවිපලවල් තේ වගා කිරීමේදී සමාන වුවද, අනෙකුත් බෝග සහ ගොවිපලවල විවිධ ප්‍රමාණයන් නිසා ගොවීන් අතර වෙනස්කම් ඇති විය. එබැවින් කුඩා තේ වතු වර්ගීකරණය සඳහා වගා පද්ධති වර්ගීකරණ ප්‍රවේශය භාවිතා කරන ලදී. තේ තනි වගාව, මිශ්‍ර බෝග සහිත තේ, පොල් වගාව, රබර් වගාව, වී සහ කුරුඳු මෙන්ම පවතින බෝග කාණ්ඩ අනුව සහ වගා කරන ලද ප්‍රදේශය, ගොවිපළෙන් පිටත ඇති ආදායම් මාර්ග සහ පවුලේ ශ්‍රම ප්‍රතිශතය වැනි කරුණු වර්ගීකරණය සඳහා සලකා බලන ලදී. වර්ගීකරණය සඳහා, එස්පීඑස්එස් සංඛ්‍යාන මෘදුකාංග භාවිතයෙන් පියවර දෙකක පොකුරු විශ්ලේෂණය (TSCA) භාවිතා කරන ලදී. වර්ගීකරණ ක්‍රියාපටිපාටියේ ප්‍රතිඵලය ලෙෂ තේ තනි බෝග (T), මිශ්‍ර බෝග සහිත තේ (T¬M), පොල් වගාව (CC), වී (P) සහ රබර් (R) වගාව වැනි පූර්ණ වෙන්වීමක් සහිත පොකුරු පහක් හඳුනා ගෙන ඇත. (රූපසටහන 1).




රූපසටහන 1. ප්‍රතිඵල ප්‍රතිදානය, පොකුරු විස්තරය

තෝරා ගත් පොකුරු (වගා පද්ධති) පිළිබඳ විස්තර 1 වගුවේ දක්වා ඇත.

වගුව 1. විවිධ වගා පද්ධති පිළිබඳ විස්තරය

| වගා පද්ධති | බෝග සංයෝජනය | නියෝජනය | සාමාන්‍ය ගොවිපළ ප්‍රමාණය (ac) |
|---|---|---|---|
| පොකුර 1 | T+CC+P | 43% | 2.85 |
| පොකුර 2 | T+T M+ CC | 30% | 2.06 |
| පොකුර 3 | T+CC | 28% | 1.44 |
| පොකුර 4 | T+R | 12% | 2.72 |
| පොකුර 5 | T | 17% | 1.21 |




රූපසටහන 2. විවිධ වගා පද්ධතිවල ශ්‍රම භාවිතය

රූපසටහන 2 හි දැක්වෙන්නේ විවිධ වගා ක්‍රමවල ශ්‍රම උපයෝජනය වන අතර අනෙකුත් වගා ක්‍රම හා සසඳන විට 5 වන පොකුරේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් ශ්‍රමය වැඩියෙන් යොදවා ඇත.

පොකුරු 1 සහ 4 හි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි කොටසක් අඩුම ආයෝජන කාණ්ඩයට (රු. මිලියන 0.15/අක්කරයට) අයත් වූ අතර, පොකුරු 5 හි බහුතරයක් රු. මිලියන 0.15 -2.0 අක්කරයට ආයෝජන කාණ්ඩයට අයත් විය (රූපසටහන 3).




රූපසටහන 3. ආයෝජන මට්ටම ප්‍රතිශතයක් ලෙස

ආදායම් උත්පාදනය සම්බන්ධයෙන්, තේ තනි බෝග වගා ක්‍රමය අනෙකුත් වගා ක්‍රමවලට සාපේක්ෂව ඉහළ ආදායමක් පෙන්නුම් කරයි (රූපසටහන 4). හොඳ කෘෂිකාර්මික පිළිවෙත් සහ නිසි කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම මෙයට හේතු විය හැක.




රූපසටහන 4. විවිධ පොකුරුවල ආදායම් මට්ටම් බෙදා හැරීම

බෝග ව්‍යවසායන්හි ප්‍රධාන මුදල් ආදායම් උත්පාදකයා ප්‍රධාන වශයෙන් තේ බෝගය වේ. කෙසේ වෙතත්, කුඩා තේ වතු හිමියන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ගොවිපලෙන් බැහැර ක්‍රියාකාරකම්වල යෙදී සිටින බව අනාවරණය විය (වගුව 2).

වගුව 2. තේ හැර අනෙකුත් ද්විතියික මූලාශ්‍රවලින් ලැබෙන ආදායම

| මූලාශ්‍ර | T+CC+P | T+TM+CC | T+CC | T+R | T |
|---|---|---|---|---|---|
| ගොවිපලෙන් බැහැර ආදායමක් නොමැති | 30 | 55 | 57 | 68 | 64 |
| ගොවිපලෙන් බැහැර ආදායමක් ඇති | 70 | 45 | 43 | 32 | 36 |

පවතින තේ ආශ්‍රිත වගාවන්වල ප්‍රතිපත්ති පුනර්ජීවනය කිරීම සහ අවශ්‍යතා මත පදනම් වූ ඉලක්ක-නැඹුරු ප්‍රවේශය වෙත ප්‍රබල මැදිහත්වීමක අවශ්‍යතාවය ප්‍රතිඵල මගින් අනාවරණය විය. තවද, මෙම අධ්‍යයනය මගින්, වගාවන් හි තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීමේදී ගොවි පවුල්වල සමාජ ආර්ථික සැකසුම්වල විවිධ ව්‍යුහයන් සලකා බැලීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. එසේම, සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල තේ ආශ්‍රිත වගා ක්‍රමවල විෂමතාවය සැලකිල්ලට ගනිමින් තේ අතුරු බෝග වගාව දියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය ඇඟවුම් භාවිතා කිරීමට යෝජනා කරන ලදී.

**ප්‍රධාන ව්‍යාපෘතිය A 37. ව්‍යාප්ති පර්යේෂණ**

**ව්‍යාපෘතිය B 127. ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ස්ථිර කාර්ය සාධනය කෙරෙහි නිෂ්පාදන නවෝත්පාදනයේ බලපෑම: ජපානයේ තීක්ෂණ බුද්ධිය ඇසුරින්**

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයට සාපේක්ෂව ජපානය නිෂ්පාදනය කරන්නේ 25%ක් පමණ වන තේ ප්‍රමාණයක් වුවද, ජපානය විසින් නිෂ්පාදනය කරන ලද තේ විවිධ නව්‍ය තේ පාන වර්ග 25ක් සහ පාන වර්ග නොවන නිෂ්පාදන සිය ගණනක් (උදා: විලවුන්, ආහාර අතිරේක සහ රසකැවිලි, ආදිය) නිෂ්පාදනය සඳහා යොදා ගනී. ජපාන තේ ඉතිහාසයේ සාගා ප්‍රාන්තය ප්‍රසිද්ධ වන්නේ 1191 දී තේ වගාව ආරම්භ වූ ස්ථානය ලෙසයි (Brekell, 2018). ශ්‍රී ලංකාව හා සමානව ජපානයේ ද මහා පරිමාණ වැවිලි මෙන්ම තේ වගා කරන කුඩා පරිමාණ ගොවි පවුල් ද ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මෙන් නොව, ජපානයේ තේ සැකසීමේ යෙදී සිටින කුඩා තේ වගාකරුවන් බොහෝමයක් විවිධ වර්ගයේ නව්‍ය බීම තේ සහ තේ පදනම් කරගත් පාන වර්ග නොවන නිෂ්පාදන නිෂ්පාදනය කරයි. මෙම නවෝත්පාදනයන් බොහොමයක් දිගුකාලීන උත්සාහයන් සහ ආයෝජනවල ප්‍රතිඵල පමණක් නොව නිවැරදි ආයතනික සහයෝගය යටතේ ව්‍යවසායකයන්ගේ චින්තනයේ ප්‍රතිඵල බව පැහැදිලිය. උදාහරණයක් ලෙස, මෑතකදී ජපානයේ කෘෂිකර්ම, වන හා ධීවර අමාත්‍යාංශය තේ ඇතුළු කෘෂිකර්මයේ කලාපීය නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා "හයවන කාර්මීකරණය" නමින් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේය. මෙහි දී ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදනය (ප්‍රාථමික කර්මාන්තය); සැකසීම (ද්විතියික කර්මාන්තය) සහ සේවා (තෘතියික කර්මාන්තය) සමඟ ඒකාබද්ධ වේ. මෙම පසුබිම සමඟ, අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ තේ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේම උපාය මාර්ග සැලසුම් කිරීමට පාඩම් ඉගෙන ගැනීම උදෙසා කුඩා පරිමාණයේ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ජපන් හයවන කාර්මීකරණ උපාය මාර්ගයේ ප්‍රායෝගික ප්‍රවේශයන් අවබෝධ කර ගැනීමයි.

හයවන කාර්මීකරණය යටතේ සිදු කරන ලද සිද්ධීන් පිළිබඳ පුළුල් සමාලෝචනයක් හරහා විශේෂිත ලක්ෂණ පහළොවක් හඳුනා ගන්නා ලදී. විස්තාරණය කිරීමේ පහසුව සලකා, මෙම අංග පහළොව 1. ව්‍යුහය, 2. උපායමාර්ග, 3. කුසලතා සහ 4. උපකාරක ආයතන ලෙස තේමා හතරකට වර්ග කර ඇත: "ව්‍යුහය" සමාගම සතු මූලික නිෂ්පාදන සාධකවලට අදාළ ලක්ෂණ වලින් සමන්විත වේ (1. ඉඩම්/ශ්‍රමය සහ ප්‍රාග්ධනය දැඩි ලෙස භාවිතා කිරීම සහ 2. උසස් තාක්ෂණයේ යෙදීම). ආයතනික ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා සමාගමේ ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය සම්පත්වලට ගැලපෙන තීරණ සහ ක්‍රියා මාලාව "උපාය" යටතේ වර්ගීකරණය කර ඇත. (1. තිරස් විවිධාංගීකරණය, 2. සිරස් විවිධාංගීකරණය, 3. විවිධ වර්ගයේ කර්මාන්ත-ආර්ථික සම්බන්ධ කිරීම, 4.ක්ෂේත්‍රය තුළ සැකසීම මගින් අගය එකතු කිරීම., 5. දේශීය වෙළඳ නාමකරණය, 6. අවසාන පරිශීලකයා සමඟ සෘජු සම්බන්ධතා ඇති කර ගැනීම සහ 7. වෙළඳපල දිශානතිය). "නිපුණතා" යනු ව්‍යවසායකත්ව ලක්ෂණ සහ නිරීක්ෂණය කරන ලද දැනුම් සමුච්චය (1. ස්වයං-කාර්යක්ෂමතාව, 2. නවෝත්පාදනය සඳහා ඇති ආශාව සහ 3. දැනුම සමුච්චය කිරීම සහ බෙදාගැනීම) සම්බන්ධ අංගයන්ගෙන් සමන්විත වන්නක් වන අතර "ආධාරක ආයතනය" යනු ප්‍රතිපත්ති රාමුව සහ අදාළ සංවිධාන වැනි බාහිර පරිසරයට අදාළ ප්‍රධාන අංග ඇතුළත් වන්නක් වේ (1. අධ්‍යාපනය, 2. පර්යේෂණ සහ 3. මූල්‍ය ආයතන).

මෙම අධ්‍යයනය පදනම් වූයේ ජපානයේ සාගා ප්‍රාන්තයේ පවුලක් (ඔවුන්ගේ පුතා සමඟ යුවළක්) විසින් පවත්වාගෙන යනු ලබන තේ ගොවිපළක (X ගොවිපල) ජනවාර්ගික සිද්ධි අධ්‍යයනයක් මත ය. Yin (2018) අනුව, සිද්ධි අධ්‍යයන වඩාත් ගැලපෙන්නේ පර්යේෂණ ප්‍රශ්න ගවේෂණාත්මක ස්වභාවයක් ඇති විට ය. (එනම් "කෙසේද" සහ "ඇයි") දත්ත රැස් කිරීම ක්‍රම දෙකකින් සමන්විත වේ: 1) ගැඹුරු සාකච්ඡා සහ 2) X ගොවිපලේ මසක් පුරා පැවති ජනවාර්ගික අධ්‍යයනය (2021 ජනවාරි සහ අප්‍රේල් මාස තුළ). සියලුම සාකච්ඡා ශ්‍රව්‍ය පටිගත කරන ලද අතර හයවන කර්මාන්ත රාමුවේ හඳුනාගත් ප්‍රධාන ලක්ෂණ අනුව ප්‍රතිචාර විශ්ලේෂණය කරන ලදී.

ඒ අනුව, 1970 දශකයේ 20 ගණන්වල මුල් භාගයේදී තම දෙමාපියන් සමඟ වගා කිරීමට එකතු වූ සාම්ප්‍රදායික තේ වගා කරන පවුලකින් පැමිණි පවුලේ පියා (අවුරුදු 71, 2 වන පරම්පරාව) X ගොවිපල හිමිකර ගන ඇත. එකල ගොවිපළේ හෙක්ටයාර් 0.4ක තේ ඉඩමක්, හෙක්ටයාර 1.5ක කුඹුරු යායක් සහ මැන්ඩරින් (*Citrus unshiu*) හෙක්ටයාර 1ක් තිබුණි. 1980 දී පියා පාවිච්චි කරන ලද හරිතාගාරයක් (හෙක්ටයාර 0.1 ක වපසරියකින්) මිල දී ගෙන එළවළු වගා කිරීමට පටන් ගත්තේය. පුතා 2000 දී පූර්ණ කාලීනව ගොවිපළට සම්බන්ධ විය. පසුව, හරිතාගාර තුළ එළවළු කොටසක් සම්ප්‍රදායික මැන්ඩරින් වගාවෙන් ප්‍රතිස්ථාපනය කරන ලද අතර පසුව 2010 දී එය දෙමුහුන් මැන්ඩරින් වගාවකින් ප්‍රතිස්ථාපනය විය.

2000 වසරේ සිට පවුලේ පුත්‍රයා ගොවිපල සමඟ පූර්ණ කාලීනව සම්බන්ධ වී තවත් හෙක්ටයාර 2.5ක ඉඩමක් මිල දී ගෙන නව තේ වගාවක් ස්ථාපිත කළේය. ඒ වන විටත් ගොවිපල විවිධ බෝග (එනම් තේ, සහල්, සුදුළූණු, එළවළු සහ මැන්ඩරින්) නිෂ්පාදනය කිරීම ආරම්භ කර තිබූ බැවින්, ප්‍රාන්ත කාර්මික මධ්‍යස්ථානය ආහාර සැකසුම් ඒකකයක් පිහිටුවීමට අදහසක් යෝජනා කළේය. 2010/2011 දී, ගොවිපල ආහාර සැකසුම් ඒකකයක් ආරම්භ කළ අතර එහිදී මව පූර්ණ කාලීන ව්‍යාපාරයට සම්බන්ධ වීමට පටන් ගත්තේය. තවද, ඔවුන්ගේ යෝජනාවට අනුව, ගොවිපළෙහි කුඹුරු ඉඩමෙන් 2/3 ක් තිරිඟු සහ කළු සහල් මගින් ප්‍රතිස්ථාපනය කළේය.

අ) ව්‍යුහය

2021 වන විට X ගොවිපල හෙක්ටයාර 5ක භූමි ප්‍රමාණයක තේ ප්‍රධාන බෝගය ලෙස (හෙක්ටයාර 2.9), සහල්/තිරිඟු (හෙක්ටයාර 1.5), මැන්ඩරින් (හෙක්ටයාර 0.1), එළවලු සහ කැපූ මල් (හෙක්ටයාර් 0.5)වගා කරන ලදී. වගා කරන ලද බෝග හයෙන් ප්‍රධාන බෝගය වන තේ බෝගය වගා භූමි ප්‍රමාණයෙන් අඩකට වඩා (63%)ප්‍රමාණයක් ආවරණය කරයි. ගොවිපළ මූලික වශයෙන් පවුලේ ශ්‍රමය මත යැපුණු අතර ගොවිපළේ සියලු කෘෂිකාර්මික කටයුතු සම්පූර්ණයෙන්ම යාන්ත්‍රිකකරණය විය.

ආ) උපාය මාර්ගය

විවිධ වර්ගයේ අමු ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම තිරස් විවිධාංගීකරණය වේ. නිෂ්පාදනය කරන ලද අමුද්‍රව්‍ය භාවිතා කරමින්, X ගොවිපල විවිධ නිෂ්පාදන වර්ග 15 ක් සකසන ලදී. මෙය සිරස් විවිධාංගීකරණය වේ. උදාහරණයක් ලෙස, අමු තේ දළු *Tamaryo kucha* සහ *Sencha* ලෙස සාදන ලද තේ වර්ග දෙකක් බවට පරිවර්තනය වේ. තවද, ගොවිපල තේ කුඩු තමන්ගේම තිරිඟු පිටි සමඟ මිශ්‍ර කර තේ-කේක්, තේ-පාන් සහ කරින්ටෝ වැනි රසකැවිලි සැකසීම සඳහා භාවිතා කරයි. X ගොවිපලෙහි නිරීක්ෂණය කරන ලද උපායමාර්ගයේ උප-ලක්ෂණ වගුව 7 හි සාරාංශ කර ඇත.

වගුව 7. X ගොවිපල මගින් සිදු කරන නිෂ්පාදන ලැයිස්තුව

| තිරස් විවිධාංගීකරණය | සිරස් විවිධාංගීකරණය | උපාය යටතේ අනෙකුත් උප විශේෂාංග |
|---|---|---|
| තේ | *Tamaryokucha, Sencha,* තේ-ජෙලි | - අගය දාමය ඔස්සේ අගය එකතු කිරීම<br>- නිෂ්පාදන X සන්නාමය යටතේ ගොවි වෙළඳපොලේ (මාර්ග දෙපස ස්ථාන), සුපිරි වෙළඳසැල්වල සහ JA (ජපන් කෘෂිකර්ම සමුපකාරය) විකුණනු ලැබේ.<br>- පාරිභෝගික-අභිමුඛ නිෂ්පාදන ඉදිරිපත් කිරීම සඳහා මග දෙපස ස්ථානවල ගනුදෙනුකරුවන් සමග සම්බන්ධතා.<br>- ඉදිරි සම්බන්ධතා (උදා. සාගා ජපන් කෘෂිකර්ම සමුපකාර හරිත තේ කර්මාන්තශාලාව, හරක් මස් ගව ගොවිපල) සහ පසුගාමී සම්බන්ධතා (උදා. බිත්තර නිෂ්පාදක) |
| තේ සහ තිරිඟු | තේ-කේක්, තේ-පාන්, *Karinto* | |
| තිරිඟු සහ මැන්ඩරින් | මැන්ඩරින්-කේක් | |
| තිරිඟු සහ කළු සහල් | කළු සහල් පාන් | |
| මැන්ඩරින් | ඇසුරුම් කළ මැන්ඩරින්, කැන්ඩිඩ් පීල්, ජෑම් | |
| කළු සහල් | ඇසුරුම් කළ කළු සහල් | |
| කළු බත් සහ එළවළු | දිවා ආහාර පාර්සල් | |
| එළවළු | ඇසුරුම් කළ එළවළු | |
| සුදුළූණු | සැකසූ කළු සුදුළූණු | |
| කැපූ මල් | කැපූ මල් සැකසුම් | |
| බත් | ගව මස් ගොවිපල සඳහා සයිලේජ් | |

මූලාශ්‍රය: සිද්ධි අධ්‍යයනයේ කතුවරුන්ගේ නිරීක්ෂණ

ඇ) කුසලතා

දැනුම සමුච්චය කිරීම සහ බෙදාගැනීම, ස්වයං කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය සඳහා ඇති ආශාව සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන ලද විශේෂාංග "කුසලතා" යටතේ වර්ගීකරණය කර ඇත. මුලදී ගොවි පවුලේ මව ප්‍රාන්ත කාර්මික මධ්‍යස්ථානය (දැනුම සමුච්චය කිරීම) විසින් හඳුන්වා දුන් සම්පත් දායකයෙකුගෙන් බේකරි නිෂ්පාදන (කේක් සහ කුකීස්) පිළිබඳ පැහැදිලි දැනුමක් ලබා ගත්තාය. ක්‍රමක්‍රමයෙන් X ගොවිපල ඇයගේ දැනුම (ස්වයං කාර්යක්ෂමතාව) භාවිතා කරමින් විවිධ රසයන් එකතු කරමින් විවිධ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී.

ආහාර නවෝත්පාදන සාහිත්‍යයට අනුව, අන්තර්ක්‍රියා හරහා බෙදා ගන්නා දැනුම විශේෂයෙන් ආහාර පාන නවෝත්පාදනයන් හි දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ගොවි සමාජයේ තවත් සාමාජිකයෙකුගේ හවුල් අත්දැකීමක් අනුව, X ගොවිපල අසම්පූර්ණ හැඩයෙන් යුත් මැන්ඩරින් යොදා ගනිමින් ජෑම් සැකසීමට සහ ඒවා මාර්ග දෙපස නැවතුම්පලවල් අසල (දැනුම බෙදාගැනීම) අලෙවි කිරීමට පෙලඹුණි.

ඈ) උපකාරක ආයතන

ජපානයේ කෘෂිකර්ම, වන විද්‍යා සහ ධීවර අමාත්‍යාංශය (MAFF) 2011 මාර්තු මාසයේදී හයවන කාර්මීකරණ පනත ස්ථාපිත කරන ලදී. මෙම පනත ප්‍රධාන ක්‍රියාකාරකම් හතරකින් සමන්විත විය: 1. කෘෂිකර්මය/වන විද්‍යාව හෝ ධීවර නවෝත්පාදන සම්බන්ධයෙන් උපාය මාර්ග සැකසීම (නාගරික උපාය මාර්ගය), 2. ජාලකරණය සඳහා සහනාධාර ලබා දීම, 3. පුද්ගලික පුහුණුව සහ සංවර්ධනය සඳහා සහනාධාර සැපයීම සහ 4. ප්‍රාග්ධන අවශ්‍යතා මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය ලබා දීම. මෙම පනත යටතේ, ප්‍රථමයෙන් ප්‍රාන්ත කාර්මික මධ්‍යස්ථානය විසින් X ගොවිපල වෙත ගොවිපළට අනුබද්ධ ආහාර සැකසුම් ඒකකයක් පිහිටුවීමට යෝජනා කරන ලදී. ඉන්පසු, ඔවුන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ දැනුම ලබා ගත හැකි පරිදි ගොවිපල සම්බන්ධ කළේය (උදා: ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙකු). තෙවනුව, එක් සේවකයෙකු (මෙම කරුණේදී මව) පුහුණුව හා සංවර්ධනය යටතේ ආහාර සැකසීම පිළිබඳ නොමිලේ පාඨමාලාවක් ලබා ගත්තා ලදී. ස්ථාන ගාස්තුව, පෙළ සකස් කිරීමේ ගාස්තුව, දේශන ගාස්තුව, කථිකාචාර්යවරයාගේ ගමන් වියදම්

යනාදිය සම්පූර්ණයෙන්ම රජය විසින් ගෙවන ලදී. සිව්වනුව, X ගොවිපළට ප්‍රාග්ධන භාණ්ඩ (එනම් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, තේ දළු ඇඹරුම් යන්ත්‍රය, කුකර් ආදිය) මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය ලැබුණි.

හයවන කාර්මීකරණය දේශීය සම්පත් භාවිතා කරමින් නිෂ්පාදන නවෝත්පාදනයන් වැඩි කිරීමට උපකාරී වූ බව සිද්ධි අධ්‍යයනයෙන් අනාවරණය විය. හයවන කාර්මීකරණ ව්‍යාපෘතිය යටතේ, පළමුව රජය (Prefectural Industrial Centers) විභවයක් සහිත ගොවීන් හඳුනාගෙන ඔවුන්ගේ ව්‍යාපාර සඳහා වඩාත් ගැලපෙන උපාය මාර්ග සැකසීමට ඔවුන්ට උපකාර කරන ලදී. ඉන්පසු ඔවුන් ගොවීන්ට පුහුණුව සහ සංවර්ධනය ලබා දෙමින් අවශ්‍ය මානව ප්‍රාග්ධනය දියුණු කරන ලදී. ඒ අතරම, ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ගෙන ඒම සඳහා ජපාන කෘෂිකාර්මික සමුපකාර සහ අනෙකුත් සංවිධාන විසින් මාර්ග අසල ස්ථාන (ගොවි වෙළඳපොළ) පිහිටුවන ලදී. එබැවින්, මෙම කරුණෙහි සාර්ථකත්වය, ව්‍යුහය (සම්පත්), උපාය (ක්‍රියා සහ තීරණ), ශක්තිමත් රාජ්‍ය අනුග්‍රහය යටතේ ව්‍යවසායකයාගේ කුසලතාවල (සහාය ආයතන) නිවැරදි සහයෝගීතාවයෙන් පැන නගින X ගොවිපල විශේෂයෙන් ශ්‍රී ලංකාවේ විභවයන් සහිත සහ තේ වගාවට කැමැත්තක් දක්වන තේ වගා කරන්නන් සඳහා තේ ව්‍යවසායකයින් ලෙස උසස් වීමට අවශ්‍ය පියවර තැබීමට උනන්දු කරවන යහපත් ආදර්ශයක් විය හැකිය.

**ව්‍යාපෘතිය A41. තේ අංශයට සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම විශ්ලේෂණය කිරීම**

**ව්‍යාපෘතිය B 143. ශ්‍රී ලංකාවේ මහා පරිමාණ තේ වතුවල විකල්ප සේවකයන් යෙදවීමේ ආකෘතිවල සමාජ හා ආර්ථික බලපෑම් විමර්ශනය කිරීම**

දත්ත රැස්කිරීම අඛණ්ඩව සිදුකෙරෙමින් පවතින අතර දත්ත රැස්කිරීම අවසන් කරන ලද වතු ලැයිස්තුව 3 වගුවේ දක්වා ඇත.

වගුව 3. දත්ත රැස් කිරීම සම්පූර්ණ කළ වතු ලැයිස්තුව

| සමීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ | වතු |
|---|---|
| කළමනාකරුවන්ගේ සමීක්ෂණ | ඩෙස්ෆෝර්ඩ්, ඇනිෆීල්ඩ්, කෙනිල්වර්ත්, දෙනියාය, අනිංකන්ද, එල්ටැබ්, නහවිල, වුඩ්සයිඩ්, කැලෑබොක්ක වත්ත |
| ප්‍රධාන යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ කම්කරුවන්ගේ දැනුම මට්ටම මැන බැලීම සඳහා | ඇල්කඩුව වතුයාය |
| කම්කරුවන් සම්බන්ධ සමාජ-ආර්ථික සමීක්ෂණය | රත්වත්ත, ගල්ලූල, දෙනියාය, අනිංකන්ද, නහවිල |

**විකල්ප සේවක යෙදවුම් ආකෘතිවල (AWDM) සාර්ථකත්වයේ සහ අසාර්ථකත්වයේ මට්ටම**

තේ කර්මාන්තය රටේ ක්‍රියාකාරී ශ්‍රම බලකායෙන් 10% කට වඩා අවශෝෂණය කර ගන්නා අතර අඩු ආදායම්ලාභීන්ගේ සමාජ හා මූල්‍ය තත්වය නංවාලීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, තේ වගාවේ ඇති එක් ගැටලුවක් වන්නේ නියමිත වැඩ සැලැස්මට අනුව දෛනික කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් ශ්‍රමිකයන් නොමැති වීමයි. මෙය තේ වතුවල ඉඩම් හා ශ්‍රම ඵලදායිතාවයට අහිතකර ලෙස බලපාන අතර ඇතැම් විට තේ ඉඩම් අත්හැර දැමීමට ද සිදුවේ. එබැවින් ශ්‍රී ලංකාවේ තේ වතු සඳහා වත්මන් ශ්‍රම හිඟ තත්ත්වය තුළ එහි ඵලදායිතාව සහ ලාභදායිත්වය වර්ධනය කර පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් අවශ්‍ය වේ. තේ වතු සඳහා AWDM හඳුන්වාදීම ශ්‍රම හිඟයේ අහිතකර බලපෑම් අවම කිරීමටත්, අත්හැර දමා ඇති තේ ඉඩම් වැඩිදියුණු කිරීමටත්, කම්කරුවන්ට අමතර ආදායමක් උපයා ගැනීමටත් සුදුසු සංකල්පයක් වනු ඇත.

වතුවල AWDM ක්‍රියාත්මක කිරීමේ මට්ටම සහ ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීම සඳහා තේ පර්යේෂණ ආයතනය විසින් සමීක්ෂණයක් පවත්වන ලදී. තේ වතු විසින් බහුලවම අනුගමනය කරන ලද විකල්ප සේවක යෙදවුම් ආකෘතිය අත්පිට මුදලට දළු නෙළීම (වතුවලින් 70% ක් AWDMs භාවිතා කර ඇත)

බව පැහැදිලිව දක්නට ලැබිණි. තේ වතු විසින් සිදු කරන ලද අනෙකුත් ප්‍රමුඛ විකල්ප සේවක යෙදවුම් ආකෘති වූයේ කොන්ත්‍රාත් පදනම මත වගාව (36%) සහ කොන්ත්‍රාත් පදනම මත වැඩ පැවරීම (33%) ය. වතුවලින් 18% ක් පමණ බ්ලොක් ආකාරයට දළු නෙලීම අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, වතු 4 ක් (2%) පමණක් පිටතින් පැමිණි වගාකරුවන් මගින් වගා කිරීමේ ක්‍රමය භාවිතා කර ඇත (වගුව 4).

වගුව 4. විවිධ විකල්ප සේවක යෙදවුම් ආකෘති භාවිතා කරන ලද වතු ගණන

| | උඩරට | මැදරට | පහතරට | ඌව | එකතුව |
|---|---|---|---|---|---|
| කොන්ත්‍රාත් පදනම මත වගාව | 23 | 19 | 20 | 12 | 74 (36) |
| පිටතින් පැමිණි වගාකරුවන් මගින් වගා කිරීමේ | 2 | 1 | 1 | 0 | 4 (2) |
| බ්ලොක් ආකාරයට දළු නෙලීම | 22 | 5 | 5 | 5 | 37 (18) |
| අත්පිට මුදලට දළු නෙලීම | 66 | 21 | 23 | 36 | 145 (70) |
| කොන්ත්‍රාත් පදනම මත වැඩ පැවරීම | 43 | 5 | 13 | 7 | 69 (33) |

වරහන් තුළ ඇති සංඛ්‍යා යනු විවිධ AWDM භාවිතා කළ වතුවල ප්‍රතිශතයයි.
මූලාශ්‍රය: සමීක්ෂණය 2019.

වගුව 5. විවිධ විකල්ප සේවක යෙදවුම් ආකෘති අසාර්ථක වීමට හේතු

| හේතුව | (%) |
|---|---|
| ශ්‍රම හිඟය (වතු ශ්‍රම හිඟයේ මට්ටම / පවුලේ ශ්‍රමය ලබා ගැනීමේ හැකියාව) | 52 |
| වතු ඵලදායිතාව (අඩු අස්වැන්නක් සහිත තේ ඉඩම්) | 40 |
| කළමනාකරණ ප්‍රතිපත්ති | 32 |
| සේවක අභිප්‍රේරණය අඩු වීම | 72 |

**ශ්‍රම හිඟය හේතුවෙන් අසාර්ථක වීම**

විවිධ විකල්ප සේවක යෙදවුම් ආකෘති අසාර්ථක වීමට එක් හේතුවක් වන්නේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී වතුයායේ ශ්‍රම හිඟයේ තීව්‍රතාවය සැලකිල්ලට නොගැනීමයි. වැඩට නොපැමිණීම අවම කිරීම, වැඩ කරන පැය/දින වැඩි කිරීම සහ වතුයාය තුල ලියාපදිංචි නොවූ ශ්‍රම බලකාය යොදා ගැනීම මගින් වතුවල ශ්‍රමය ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම අවශ්‍ය වේ. එබැවින්, සුදුසු විකල්ප සේවක යෙදවුම් ආකෘතියක් තෝරා ගැනීම සඳහා ශ්‍රම හිඟයේ මට්ටම/ ශ්‍රමය ලබා ගත හැකි මට්ටම ප්‍රධාන නිර්ණායකයක් වනු ඇත. මීට අමතරව, ශ්‍රම හිඟය හේතුවෙන් බලපෑමට ලක් වූ ක්‍රියාකාරකම් සහ තේ භූමි ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් තිබිය යුතුය. සාමූහික වැටුප් ගිවිසුමට අනුව සියලුම කම්කරුවන් නිතිපතා සේවයේ යෙදවීමට ප්‍රමාණවත් තේ භූමි ප්‍රමාණයක් තිබීම වැදගත් වේ. එපමනක් නොව, විවිධ විකල්ප සේවක යෙදවුම් ආකෘති, විශේෂයෙන්ම කොන්ත්‍රාත් වගා ක්‍රමය හෝ පිටතින් පැමිණි වගාකරුවන් මගින් වගා කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් පවුල් ශ්‍රම සංරචකයක් සහිත විභව ශ්‍රම බලකායක් තෝරා ගැනීම ද අවශ්‍ය වේ.

**අඩු ඉඩම් ඵලදායිතාව හේතුවෙන් අසාර්ථක වීම**

ශ්‍රමය ලබා ගැනීමට ඇති හැකියාව සහ ශ්‍රම ඵලදායිතාවය යන කරුණු ඉඩම් ඵලදායිතාව මත බෙහෙවින් බලපාන බැවින් තේ ක්ෂේත්‍රයේ අස්වැන්න, කම්කරුවන් සඳහා ඉඩම් කොටස් ලබා දීමේ දී සලකා බැලිය යුතු තවත් කරුණක් වේ. ඔවුන්ගේ පවුලේ ශ්‍රමයේ පිරිවැයට සරිලන සාධාරණ ආදායමක් ලබා ගැනීම සඳහා කළමනාකරණය කළ හැකි ප්‍රමාණයේ තේ ඉඩම් වෙන් කිරීම අවශ්‍ය වේ. මෙම තත්ත්වය යටතේ, විකල්ප සේවක යෙදවුම් ආකෘතිවල තිරසාර බව සලකන විට ක්ෂේත්‍රයේ අස්වැන්න තීරණාත්මක සාධකයකි. මෙයට අමතරව, නිවැරදි වේලාවට සුදුසු විකල්ප සේවක යෙදවුම් ආකෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තීරණ ගැනීම ද අවශ්‍ය වේ. එයින් අදහස් වන්නේ ඉඩම් ඵලදායිතාව සැලකිය යුතු ලෙස පහත වැටීමට පෙර විකල්ප සේවක යෙදවුම් ආකෘති ක්‍රියාත්මක කළ යුතු බවයි.

**කළමනාකරණ ප්‍රතිපත්ති නිසා ඇති වන අසාර්ථකත්වයන්**

සමහර වතු පිළිබඳ සලකා බැලීමේදී කම්කරුවන් තෝරා ගැනීම, තේ ඉඩම්, ගෙවීම් යනාදී සලකා බැලිය යුතු නිර්ණායක පිළිබඳව පූර්ව විශ්ලේෂණයකින් තොරව සමාගම් ප්‍රතිපත්තියක් ලෙස සම්පූර්ණ වත්ත සඳහාම විකල්ප සේවක යෙදවුම් ආකෘති ක්‍රියාත්මක කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින් ඔවුන්ට තම වත්ත හෝ විශේෂිත ක්ෂේත්‍රයකට සුදුසු විකල්ප සේවක යෙදවුම් ආකෘති හඳුනා ගැනීමට අවස්ථාවක් නොමැත. අවසානයේදී, මෙය අසාර්ථක වීමේ සම්භාවිතාව වැඩි වීමට හේතු විය හැක. ස්ථාවර, සමාගම් හෝ කළමනාකරණ ප්‍රතිපත්ති ඇතත්, තීරණ ගැනීමේදී කළමනාකරුවන්ට සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට නම්‍යශීලී බවක් ලබා දිය යුතුය.

**කම්කරු පවුලක් සඳහා ලැබෙන අඩු ආදායමක් හේතුවෙන් අසාර්ථක වීම**

තේ වතු අංශයේ ශ්‍රම හිඟයට ප්‍රධාන සාධකයක් වන්නේ ශ්‍රමය, වතුයායෙන් පිටතට සංක්‍රමණය වීමයි. ශ්‍රමය  පිටතට සංක්‍රමණය වීම සඳහා ආදායම තීරණාත්මක සාධකයක් බව අතීත අධ්‍යයනයන් ඔප්පු කර ඇත. එම නිසා වතුයායේ මානව සම්පත රඳවා තබා ගැනීම සඳහා කම්කරු පවුලකට සරිලන ආදායමක් ලබාදීමට අවධානය යොමු කළ යුතුව ඇත. පවුලකට සරිලන සාධාරණ ආදායමක් ලබා ගැනීම සඳහා බිලොක් එකක ප්‍රමාණය සහ අමු දළු සඳහා සිදු කරන ගෙවීම තීරණය කළ යුතුය. බොහෝ අසාර්ථකත්වයන් සිදුවී ඇත්තේ කොන්ත්‍රාත් ගොවීන්/බාහිර වගාකරුවන්හට වෙන්කර ඇති කොටසෙන් ප්‍රමාණවත් ආදායමක් නොලැබීම හේතුවෙන් ඔවුන් අධෛර්යමත් වීම නිසාවෙනි. සමහර වතු වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා එක් අයෙකුට එක් කොටසකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් හෝ විශාල ප්‍රමාණයේ කොටසක් සැපයීමට නැඹුරු වී ඇත. එහෙත්, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් පවුල් ශ්‍රමය නොමැතිකම හේතුවෙන් විශාල ප්‍රමාණයේ කොටසක් සැපයීමද අසාර්ථක වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. එම නිසා ක්ෂේත්‍ර කටයුතු සඳහා කුලී ශ්‍රමය යෙදවීමට සිදු වේ. එම නිසා ඇතැම් අවස්ථාවලදී, බිලොක් හිමිකරුවන්හට විකල්ප සේවක යෙදවුම් ආකෘති තුළින් ලාභ නොලැබෙන තත්වයකට පත්ව ඇත. එසේම සමහර කම්කරුවන් විශාල බිලොක් ප්‍රමාණයන් කළමනාකරණය කිරීමේ දුෂ්කරතාවන්ටද මුහුණ දෙති. එබැවින්, කම්කරු පවුල් සඳහා කළමනාකරණය කළ හැකි සහ ප්‍රමාණවත් විශාලත්වයක් ඇති බිලොක් සැපයීම අවශ්‍ය වේ.

එච් ඩබ්ලිව් ශ්‍යාමලී, කේ ඩබ්ලිව් එන් නදීෂානි සහ ආර් එම් ඒ ටී රත්නායක

# සේවාලාභීන් සඳහා සේවාවන්



## සේවාලාභීන් සඳහා සේවාවන්

### උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්යභාරය

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ප්‍රධාන වගකීම වන්නේ තේ වගාව පිළිබඳ තාක්ෂණික දැනුම සේවාලාභීන් හට බෙදා හැරීම සහ එමඟින් ක්ෂේත්‍ර මට්ටමින් නව තාක්ෂණයන් යොදා ගැනීම හා නිවැරදි කෘෂිකාර්මික භාවිතයන් සඳහා දායක වීමයි. තවද, කර්මාන්තයේ තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගැනීමෙහි ද මෙම අංශය නිරතව සිටී. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ප්‍රධාන මධ්‍යස්ථානය තලවාකැලේ පිහිටා ඇති අතර ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථාන 6ක් රත්නපුර, මහනුවර, පස්සර, දෙනියාය, කොට්ටව සහ මතුගම යන ප්‍රදේශවල පිහිටුවා ඇත. මෙම පරිච්ඡේදය යටතේ තලවාකැලේ ප්‍රධාන මධ්‍යස්ථානය, රත්නපුර සහ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථාන මඟින් මෙම වසර තුළ සිදු කරන ලද සේවාවන් දක්වා ඇති අතර අනෙකුත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන මඟින් සපයන ලද සේවාවන් අදාල ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය යටතේ සවිස්තරව දක්වා ඇත.

**D/ADV 1 ව්‍යාපෘතිය : සාමාන්‍ය උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන්**

D/ADV ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් තලවාකැලේ ප්‍රධාන මධ්‍යස්ථානයට පමණක් සීමා වූ අතර එයට විවිධ සම්මන්ත්‍රණ, රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා තේ පර්යේෂණ ආයතනයේ ශ්‍රවණාගාර පහසුකම් සැපයීම සහ ශ්‍රවණාගාරය හා තේ තොරතුරු මධ්‍යස්ථානය නඩත්තු කටයුතු සිදු කිරීම ඇතුළත් වේ. මෙම වසර තුල ශ්‍රවණාගාරයේදී සම්මන්ත්‍රණ, වැඩමුළු සහ රැස්වීම් 29 ක් පැවැත්වීමට පහසුකම් සපයන ලදී. තේ තොරතුරු මධ්‍යස්ථානය තුල සහ ක්ෂේත්‍ර ආදර්ශන පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් ඇතුළු අමුත්තන් 1528 ක් සඳහා සේවාවන් සපයා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වන්නේ තේ වතු සඳහා උපදේශන සේවා සැපයීම සහ සමාගම් වතු (විධායක නිළධාරීන්, ක්ෂේත්‍ර නිළධාරීන් හා වතු කම්කරුවන්) සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමයි. මේ සඳහා ප්‍රාදේශීය වතු සමාගම්, මධ්‍ය පරිමාණ තේ වතු හිමියන් සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉල්ලීම මත විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. කුඩා තේ වතු හිමියන්ගේ ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරයි. මෙම වසර තුල සිදු කරන ලද උපදෙස් හා ව්‍යාප්ති සේවාවන් පහත දක්වා ඇත.

වගුව 1. මෙම වසර තුළ සිදු වු උපදේශක හා ව්‍යාප්ති සේවාවන්වල සාරාංශය

| ප්‍රධාන ක්‍රියාකාරකම් | තලවාකැලේ | රත්නපුර | මහනුවර | එකතුව |
|---|---|---|---|---|
| උපදෙස් සේවා සඳහා ක්ෂේත්‍ර චාරිකා | 83 | 81 | 33 | 197 |
| උපදෙස් සේවා සඳහා ලිපි හුවමාරුව | 180 | 135 | 60 | 375 |
| සේවාලාභීන් සඳහා පුහුණු වැඩසටහන් | 49 | 20 | 33 | 102 |
| උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සඳහා පුහුණු වැඩසටහන් | 7 | 6 | 7 | 20 |
| ප්‍රකාශන බෙදා හැරීම් | 804 | 340 | 149 | 1293 |
| පස් සාම්පලවල පී.එච්. පරීක්ෂා කිරීම් | - | - | 515 | 515 |
| වාණිජ රිකිලි තේ තවාන් පරීක්ෂා කිරීම් | - | - | 47 | 47 |
| රැස්වීම් සඳහා සහභාගී වීම් | 22 | 12 | 15 | 49 |
| සමීක්ෂණ සඳහා ක්ෂේත්‍ර චාරිකා | - | 10 | 2 | 12 |

මෙම වර්ෂය තුළ වගාකරුවන්ගේ ඉල්ලීම මත උපදේශන චාරිකා මගින් තේ නැවත සිටුවීම සඳහා ඉඩම් යෝග්‍යතාව පරීක්ෂා කිරීම, සෙවණ ශාක ඉවත් කිරීම, තේ පඳුරු දුර්වලවීම, පළිබෝධ සහ රෝග, තේ තවාන්, අස්වැන්න අඩුවීම, ශාක පෝෂක කාර්යක්ෂමතාව, නව තේ වගාවන්ගේ තේ පැළ වර්ධනය බාල වීම සහ වෙනත් විෂයයන් ආවරණය කරන ලදි.

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන නේවාසික පුහුණු වැඩසටහන්**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සම්බන්ධීකරණය මත නේවාසික පුහුණු වැඩසටහන් රාශියක් තේ පර්යේෂණ ආයතනයේදී පවත්වා ඇති අතර, එහි විස්තර පහත වගු අංක 2 න් දැක්වේ. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය විසින් වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදී.

වගුව 2. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි නේවාසික පුහුණු වැඩසටහන්

| වැඩසටහන | දිනය/කාලසීමාව/ස්ථානය |
|---|---|
| වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5 | 2022 ජනවාරි මස 27 දින සිට පෙබරවාරි 01 දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ තේ.ප.ආ.තලවාකැලේ |
| වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - NVQ 6 | 2022 පෙබරවාරි මස 18 දින සිට 25 දක්වා සහ 2022 මාර්තු මස 18 දින සිට 25 දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ තේ.ප.ආ.තලවාකැලේ සහ පස්සර |
| ජාත්‍යන්තර උසස් සහතික පත්‍ර පාඨමාලාව | 2022 නොවැම්බර් මස 17 දින සිට 18 දක්වා තේ.ප.ආ. රත්නපුර |

තලවාකැලේ සහ රත්නපුර තේ.ප.ආ. උපදෙස් හා ව්‍යාප්ති, ශෂ්‍ය විද්‍යා, පාංශු හා ශාක පෝෂණ, කීට විද්‍යා සහ වටපණු විද්‍යා, නිමි තේ තාක්ෂණ, සහ ව්‍යාධිවේදි විද්‍යා යන අංශයන්ගේ නිලධාරීන් සම්පත් දායකත්වය දක්වන ලදි.
වැඩසටහන සම්බන්ධීකරණය - උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ආර්.එම්.ඒ.එම්. රත්නායක සහ එස්.පී.ඒ.කේ.පී. ජයරත්න විසිනි

**උසස් අධ්‍යාපන ආයතන සඳහා අධ්‍යාපනික වැඩසටහන්**

උසස් අධ්‍යාපන ආයතනවල ඉල්ලීම මත තේ පර්යේෂණ ආයතනයට පැමිණෙන සිසුන් සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශය අනෙකුත් පර්යේෂණ අංශ හා ඒකාබද්ධව අධ්‍යාපනික වැඩසටහන් සිදු කරනු ලැබිණි. මීට අමතරව රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ඉල්ලීම පරිදි අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලද අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 3. උපදෙස් සහ ව්‍යාප්ති අංශය මගින් පවත්වනු ලැබූ අධ්‍යාපනික වැඩසටහන්

| වැඩසටහන | දිනය/කාලසීමාව/ස්ථානය |
|---|---|
| කාලගුණ විද්‍යා ස්ථානයේ ක්‍රියාවලිය සහ එහි ක්‍රියාකාරකම් - ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 මාර්තු 25, කෘෂි විද්‍යාලය - කරපිංච, රත්නපුර |
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 ජුනි 3, සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් |

| වැඩසටහන | දිනය/කාලසීමාව/ස්ථානය |
|---|---|
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 ජුනි 20, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ 2 වන වසරේ උපාධි අපේක්ෂක සිසුන් |
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 අගෝස්තු 1, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පළමු වසරේ උපාධි අපේක්ෂක සිසුන් |
| තේ වගාව පිළිබඳ පුහුණු වැඩසටහන- මැදරට | 2022 සැප්තැම්බර් 22, රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ තේ තාක්ෂණ ඩිප්ලෝමා සිසුන් |
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 සැප්තැම්බර් 29, සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් |
| තලවාකැලේ තේ.ප.ආ. වෙත අධ්‍යාපනික චාරිකාව | 2022 ඔක්තෝබර් 21, සබරගමුව විශ්ව විද්‍යාලය, 4 වන වසරේ උපාධි අපේක්ෂක සිසුන් |
| තේ වගාව පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 ඔක්තෝබර් 25, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් |
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 නොවැම්බර් 4, කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය |
| තේ වගාව පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 නොවැම්බර් 5, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ |
| තේ තවාන් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | කෘෂිකර්ම පීඨයේ පළමු වසරේ උපාධි අපේක්ෂක සිසුන් |
| තේ වගාව පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 නොවැම්බර් 9, යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් |
| ශෂ්‍ය විද්‍යා පිළිවෙත් පිළිබඳ ප්‍රායෝගික ත්‍රිත්ව වැඩසටහන | 2022 නොවැම්බර් 17, අම්පාර හාඩ්ඩි උසස් තාක්ෂණ ආයතනයේ සිසුන් |
| තේ වගාව පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | 2022 නොවැම්බර් 29 සහ 30, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් |
| | 2022 නොවැම්බර් 30, හසලක කාර්මික විද්‍යාලයේ සිසුන් |

තලවාකැලේ, රත්නපුර, සහ හන්තාන උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලදී.

**C/SIA ව්‍යාපෘතිය: සේවාලාභී අන්තර් සම්බන්ධතා වැඩසටහන්**
**ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදය (RTEF)**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකරුවන් යටතේ ඇති කලාප 8ක් ආවරණය වන පරිදි කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමග සහයෝගයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ (TSHDA) නිළධාරීන් සහ කුඩා තේ වතු සමිතිවල නිලධාරීන් සඳහා ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද වැඩසටහන් විශේෂයෙන් නිර්මාණය කර ඇත. මෙම සංසදයේ මතු වූ විශේෂ ගැටළු සහ එම ගැටළු තවදුරටත් සාකච්ඡා කර පසු විපරම් කටයුතු ආරම්භ කර ඇත. කුඩා තේ වතු සංවර්ධන අධිකාරි කලාප වල පවත්වන ලද ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ. (වගුව 4)

වගුව 4. කුඩා තේ වතු සංවර්ධන අධිකාරි කලාපවල පවත්වන ලද ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද

| කලාපය | ආවරණය කරන ලද විෂයයන් | සම්පත් දායකයින් | සහභාගීවූවන් |
|---|---|---|---|
| ඌව සහ නුවරඑළිය | පළමු වැඩසටහන (2022.03.04) | | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නුවරඑළිය සහ ඌව කලාපයේ ප්‍රාදේශීය කළමණාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන්, ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක නිළධාරීන් සහ තේ පරීක්ෂක නිළධාරීන් |
| | ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය සඳහා දේශගුණික විපර්යාසවල බලපෑම සහ එම බලපෑම් අවම කිරීමට ගත හැකි පියවර | ආචාර්ය එම්.ජී. විජේරත්න මහතා ප්‍රධාන පර්යේෂණ නිලධාරී | |
| | තේ වගාව සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදනය | ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | |
| | දෙවන වැඩසටහන (2022.12.13) | | |
| | තේ වගාව සඳහා රසායනික පොහොර යෙදීමේ විද්‍යාත්මක පදනම | ආචාර්ය එල් ආර් එම් සී ලියනගේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | |
| | දළු ගුණාත්මය ආරක්ෂා කර ගැනීම සඳහා අතින් සහ යාන්ත්‍රික දළු නෙලීම සහ පරිහරණය | ආචාර්ය වී.එස්. සිඩාකරන් මහතා අංශ ප්‍රධානි, උපදෙස් සහ ව්‍යාප්ති අංශය | |
| රත්නපුර | පළමු වැඩසටහන (2022.03.04) | | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ රත්නපුර සහ කෑගල්ල කලාපයේ ප්‍රාදේශීය කළමණාකරුවන්, සහකාර ප්‍රාදේශීය |
| | කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් සඳහා ලාභ සහ පිරිවැය සාධක විශ්ලේෂණය | ආචාර්ය එච් ඩබ්ලිව් ශ්‍යාමලී අංශ ප්‍රධානි, කෘෂි ආර්ථික අංශය | |

| | | | |
|---|---|---|---|
| | යාන්ත්‍රික අස්වනු නෙලීම සඳහා තේ වගාවන් ස්ථාපිත කිරීම | ආචාර්ය සම්පත් පතිරණගේ මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | කළමණාකරුවන්, ජ්‍යේෂ්ඨ තේ පරීක්ෂක නිළධාරීන් සහ තේ පරීක්ෂක නිළධාරීන් |
| | ශාක පෝෂක තාර්කික භාවිතය සහ නිර්දේශිත T-1240 නව පොහොර මිශ්‍රණ | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| | "තේ උපදේශක ජංගම යෙදුම" (තේ උපදේශක) හඳුන්වා දීම | ජී එස් ප්‍රදීප්, ව්‍යාප්ති නිලධාරි | |
| | දෙවන වැඩසටහන (2022.12.13) | | |
| | තේ වල ගුණාත්මකභාවය සඳහා එහි අඩංගු රසායනික සංයෝගවල සංයුතියේ බලපෑම | ආචාර්ය එන් පියසේන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | |
| | වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා තේ අස්වනු නෙලීමේ විද්‍යාත්මක පසුබිම | ආචාර්ය සම්පත් පතිරණගේ මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | |
| මහනුවර | පළමු වැඩසටහන (2022.04.01) | | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මහනුවර කලාපයේ ප්‍රාදේශීය කළමණාකරු, සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන් සහ තේ පරීක්ෂක නිළධාරීන් |
| | පාංශු තත්ත්ව දර්ශකය සහ එහි භාවිතය | ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | |
| | තේ වගාවේ පෝෂක කළමනාකරණය | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| | දෙවන වැඩසටහන (2022.12.23) | | |
| | ශුද්ධ විකුණුම් මිල සහ මිලදී ගත් දළු මිල සඳහා දලුවල ගුණාත්මකභාවය බලපාන්නේ කෙසේද? | එම්.ජී. චමීන්ද්‍ර පර්යේෂණ නිලධාරි | |
| | තේ වගාවේ පත්‍ර මතට පෝෂක ඉසීම | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| දෙනියාය | පළමු වැඩසටහන (2022.03.03) | | |
| | තේ වගාව සඳහා නියඟයෙන් වන හානිය අවම කිරීමේ පිළිවෙත් සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් සඳහා ජල | ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මාතර කලාපයේ |

| | | | |
|---|---|---|---|
| | සම්පාදන පද්ධති | | ප්‍රාදේශීය කළමණාකරු, සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන්, ජ්‍යේෂ්ඨ තේ පරීක්ෂක නිලධාරීන්, තේ පරීක්ෂක නිලධාරීන් සහ කුඩා තේ වතු සමිති විධායක නිලධාරීන් |
| | කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල පාංශු සංරක්ෂණයේ වැදගත්කම | ආචාර්ය වී.එස්. සිධාකරන් මහතා අංශ ප්‍රධානි, උපදෙස් සහ ව්‍යාප්ති අංශය | |
| | පාංශු සාරවත් බව, පාංශු පෝෂක සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල T 1240 පොහොර මිශ්‍රණයේ භාවිතය | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| | දෙවන වැඩසටහන (2022.12.14) | | |
| | පාංශු සාරවත් බව, පාංශු පෝෂක සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල පොහොර භාවිතය පිළිබඳ නවතම TRI නිර්දේශයන් | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| | කුඩා තේ වතු අංශයේ ඵලදායී සන්නිවේදනය සඳහා සමාජ මාධ්‍ය භාවිතය | ආචාර්ය සී ජේ ලියනආරච්චි උපදේශක නිලධාරි | |
| මතුගම | පළමු වැඩසටහන (2022.04.28) | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මතුගම සහ බඳුරලිය කලාපයේ සහකාර තේ කොමසාරිස්වරුන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මතුගම සහ බඳුරලිය කලාපයේ ප්‍රාදේශීය කළමණාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන්, ජ්‍යේෂ්ඨ තේ පරීක්ෂක නිලධාරීන් සහ තේ පරීක්ෂක නිලධාරීන් මතුගම කලාපයේ කුඩා තේ වතු හිමියන්ගේ සමිතිවල නිලධාරීන් සහ, ප්‍රගතිශීලී ගොවීන් |
| | කුඩා තේ වතු හිමියන්ගේ තේ ඉඩම් සඳහා ජල සම්පාදන පද්ධති වල ප්‍රායෝගික භාවිතයන් | ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර මහතා ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී | |
| | අගය එකතු කළ තේ සඳහා තේ ප්‍රභේද | ආචාර්ය එම් ඒ බී රණතුංග අංශ ප්‍රධානි, ශාක අභිජනන අංශය සහ ආචාර්ය ජේ එච් එන් පියසුන්දර ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරි | |
| | පාංශු සාරවත් බව කළමනාකරණය | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි | |
| | දෙවන වැඩසටහන (2022.12.22) | | |
| | සංවාද සන්නිවේදනය ඇසුරෙන් තේ දළු අස්වැන්න සහ එහි ගුණාත්මකභාවය පිළිබඳ දැනුවත්කිරීම සඳහා සමාජ මාධ්‍ය භාවිතය | ආචාර්ය සී ජේ ලියනආරච්චි උපදේශක නිලධාරි | |

| | | | |
|---|---|---|---|
| | නිම් තේවල ගුණාත්මකභාවය කෙරෙහි තේවල අඩංගු රසායනික සංයුතියේ බලපෑම | ආචාර්ය එන් පියසේන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | |
| ගාල්ල | පළමු වැඩසටහන (2022.03.30)<br><br>ටී-1240 නව පොහොර මිශ්‍රණ නිර්දේශය සමග ඒකාබද්ධ පෝෂක කළමනාකරණය<br><br>විසිර ජලසම්පාදන ක්‍රමය ස්ථාපිත කිරීමෙන් දේශගුණික විපර්යාස අවම කිරීම | ඩබ්ලිව් එම් සමන් විජේතුංග පර්යේෂණ නිලධාරි සහ ආචාර්ය එල් ආර් එම් සී ලියනගේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි<br><br>ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගාල්ල කලාපයේ ප්‍රාදේශීය කළමණාකරු, සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන්, ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක නිළධාරීන්, තේ පරීක්ෂක නිළධාරීන් සහ කුඩා තේ වතු සමිති නියෝජිතයින් |

**ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු (RSC) ක්‍රියාකාරකම්**

වගුව 5 දැක්වෙන පරිදි තේ. ප. ආ. රත්නපුර සහ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථාන මගින් රත්නපුර, කෑගල්ල සහ කළුතර යන කලාපයන් සඳහා එක් වැඩසටහනක් සංවිධානය කරන ලදී.

වගුව 5. ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු (RSC) ක්‍රියාකාරකම්

| කලාපය | ආවරණය කරන ලද විෂයයන් | සම්පත් දායකයින් | සහභාගීවූවන් |
|---|---|---|---|
| රත්නපුර, කෑගල්ල සහ කළුතර | 2022.07.12<br><br>ඒකාබද්ධ පෝෂක කළමනාකරණ පිළිවෙත් සහ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ<br><br>තේ වගාවේ ක්ෂේත්‍ර මෙහෙයුම් යාන්ත්‍රිකකරණය සහ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ | ආචාර්ය වී.එස්. සිධාකරන් මහතා අංශ ප්‍රධානි, උපදෙස් සහ ව්‍යාප්ති අංශය<br><br>ආචාර්ය එච් ඩබ්ලිව් ශ්‍යාමලී අංශ ප්‍රධානි, කෘෂි ආර්ථික අංශය<br><br>ආචාර්ය සම්පත් පතිරණගේ මහතා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | රත්නපුර, කෑගල්ල සහ කළුතර කලාපයේ වතු අධිකාරිවරුන් සහ සහකාර වතු අධිකාරිවරුන් |

**කුඩා තේ වතු අංශය සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය (E&E)**

මෙම සංසදයේ 42 වැනි වැඩසටහන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ තේ සංවර්ධන සමිති සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් තේ පර්යේෂණ ආයතනයේ රත්නපුර මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ව්‍යාප්ති නිළධාරි එස් පී ඒ කේ පී ජයරත්න මහතා විසින් වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදි.

මෙහි දී ඉදිරිපත් කරන ලද ප්‍රධාන මාතෘකා වූයේ,

- "ශාක පෝෂක භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ පෝෂක කළමනාකරණ ප්‍රවේශයක් " - එම් ඒ එච් නිශාන්ති, උපදේශක නිලධාරි, තේ.ප.ආ.
- "ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ පිළිවෙත් භාවිතා කිරීමේ ආර්ථික වැදගත්කම" - ආචාර්ය එච් ඩබ්ලිව් ශ්‍යාමලී අංශ ප්‍රධානි, කෘෂි ආර්ථික අංශය, තේ.ප.ආ.

**ප්‍රදර්ශන**
තේ පර්යේෂණ ආයතනය මෙම වසර තුලදී මහනුවර ප්‍රදේශයේ පවත්වන ලද ප්‍රදර්ශනයක් සඳහා දායකත්වය සැපයීය. එහිදී උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ සහ පර්යේෂණ අංශයන්ගේ කාර්ය මණ්ඩලය විසින් ප්‍රදර්ශන භාණ්ඩ සැකසීම, ප්‍රදර්ශන කුටිය මෙහෙයවීම සිදුකරන ලදී.

වගුව 6. උපදෙස් සහ ව්‍යාප්ති අංශය විසින් දායකත්වය දැක් වූ ප්‍රදර්ශන පිළිබඳ විස්තර

| **මාසය** | **දිනයන්** | **ප්‍රදර්ශනයේ තේමාව** | **පවත්වන ලද ස්ථානය** |
|---|---|---|---|
| නොවැම්බර් | 11-12 | " ආහාර උළෙල " | සහස් උයන, මහනුවර |

**C/ADV 1 ව්‍යාපෘතිය: ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක නිපදවීම**
තොරතුරු බෙදා හැරීම සහ ව්‍යාප්ති කටයුතු වලදී භාවිතා කිරීම සඳහා මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක ද්‍රව්‍ය ඇතුළු ව්‍යාප්ති හා අධ්‍යාපනික ද්‍රව්‍ය සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

වගුව 7. ව්‍යාප්ති සහ අධ්‍යාපනික ද්‍රව්‍ය

| අයිතම | විස්තරය | සකස් කළේ | ප්‍රගතිය |
|---|---|---|---|
| පොත් පිංච | "තේ වගාවේ කොම්පෝස්ට් නිෂ්පාදනයට අත්වැලක්" | ඒ අබේසූරිය<br>ජී එස් ප්‍රදීප්<br>එස් පියරුවන්<br>වී එස් සිධාකරන් | නිකුත් කර ඇත |
| චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ | "ශාක පෝෂක සුදුසු ලෙස භාවිතය සහ තේ නිෂ්පාදනය ආශ්‍රිතව තේ වගාවේ උපාය මාර්ගික පිරිවැය සංරචක කලමනාකරණය පිළිබඳ අතුරු මාර්ගෝපදේශය". (සිංහල සහ ඉංග්‍රීසි) | එම් ඒ එච් නිශාන්ති<br>එම් ඒ විජේරත්න<br>එච් ඩබ්ලිව් ශ්‍යාමලී | නිකුත් කර ඇත<br><br>නිකුත් කර ඇත |
| | තේ ප ආ උපදෙස් චක්‍රලේඛ - "තේ වගාවේ තිරසාර ඵලදායිතාවය, ශාක පෝෂණය හා පාංශු සාරවත් බව සුරක්ෂිත කිරීම උදෙසා ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමවේදයන්" | එම් ඒ එච් නිශාන්ති | |
| | කුඩා තේ වතු හිමියන් සඳහා වන එෆ් එෆ් එස් මාර්ගෝපදේශය සඳහා කෙටුම්පත සංවර්ධනය කිරීම සඳහා දෙවන කතුවරයා ලෙස දායක විය. (එෆ්. ඒ. ඕ./ආර්. ඩී. ඊ. එල්. ව්‍යාපෘති යටතේ) | කේ ආර් ඩබ්ලිව් බී කහඳව, උපදේශක නිලධාරී | |

| අයිතම | විස්තරය | සකස් කළේ | ප්‍රගතිය |
|---|---|---|---|
| පොත් | සංශෝධිත සංස්කරණය "ක්ෂේත්‍ර මාර්ගෝපදේශක පොත" | එම් ඒ එච් නිශාන්ති (සම්බන්ධීකරණය සහ සංස්කරණය) | නිකුත් කර ඇත |
| ලිපි | යූරියා පොහොරවල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා නැනෝ යූරියා භාවිතය | කේ ඒ මහේෂිකා, ව්‍යාප්ති නිලධාරී | ප්‍රකාශයට පත්කර ඇත |
| | "තිරසාර තේ වගාවක් සඳහා පොහොර භාවිතය" | එම් ඒ එච් නිශාන්ති උපදේශක නිලධාරී | ප්‍රකාශයට පත්කර ඇත |
| වීඩියෝ වැඩසටහන් | තේ වගාවේ ක්ෂේත්‍ර ක්‍රියාවන් යාන්ත්‍රිකකරණය "සැඟවුනු කහවනු" වැඩසටහන | කේ ආර් ඩබ්ලිව් බී කහඳව, උපදේශක නිලධාරී | රූපවාහිනියේ විකාශය විය |
| අවවාදාත්මක සටහන | තේවල පොහොර භාවිතය | එම් ඒ එච් නිශාන්ති උපදේශක නිලධාරී | නිකුත් කර ඇත |

**C/ADV 2 ව්‍යාපෘතිය: ටී.ආර්.අයි. 3000 සහ 4000 කාණ්ඩ වල තේ රිකිලි සැපයීම - ඒ.ඩී.බී. මව් වගා වැඩසටහන**

ටී.ආර්.අයි. 3000 සහ 4000 කාණ්ඩයේ මව් වගා ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2015 දී නිම කරන ලදී. කෙසේ වෙතත්, තේ වගා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ව්‍යාපෘතිය අඛණ්ඩව සම්බන්ධීකරණය කරන ලදී. 2022 ජූනි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි මව් වගා ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස උපදේශක නිලධාරී ආචාර්ය සී ජේ ලියනආරච්චි මහතා පත් කරන ලදී.

මෙම වසර තුළ ටී.ආර්.අයි. 3000 සහ 4000 කාණ්ඩ අතු මිලියන 3.21 ක් පමණ නිකුත් කර ඇති අතර අපේක්ෂිත ප්‍රමාණය මිලියන 5.96 ක් විය (රූපසටහන 1).




රූපසටහන 1. 2022 වසර තුළ නිකුත් කරන ලද රිකිලි ගණන

පවතින ආර්ථික දුෂ්කරතාවන් (විශේෂයෙන් ඉන්ධන හිඟය) සහ තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ පැවති අහිතකර කාලගුණික තත්වයන් (මීදුම සහිත තත්ව වලදී) තුළදී බිබිලි අංගමාර රෝගය වැළඳීම හේතුවෙන් සමහර මව් වගා ක්ෂේත්‍ර දලු නෙලීමේ තේ ක්ෂේත්‍ර බවට පත් කර ඇත. රසායනික පොහොර හිඟ වීම, ඇතැම් මව් ක්ෂේත්‍රයන්ගේ තේ පඳුරු දුර්වල වීම, ඇතැම් තේ ප්‍රභේද සඳහා අඩු ඉල්ලුමක් පැවතීම හා මව් වගා ක්ෂේත්‍ර කළමණාකරන ගැටළු හේතුවෙන් නියමිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය.

**ටී.ආර්.යි. 5000 කාණ්ඩයේ මව් වගා වැඩසටහන (ජී.එල්. 340)**

ටී.ආර්.අයි. 5000 කාණ්ඩයේ මව් වගා වැඩසටහනෙහි ප්‍රධානතම කාර්යය වනුයේ මව් වගාවන් ස්ථාපනය සඳහා පහසුකම් සැපයීම සහ 5000 කාණ්ඩයේ තේ ප්‍රභේද වල අතු කැබලි වගාකරුවන් වෙත ලබා දීමය. 2022 ජුනි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි මව් වගා ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස උපදේශක නිලධාරී ආචාර්ය සී ජේ ලියනආරච්චි මහතා පත් කරන ලදී.

අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම් සහ අධීක්ෂණ කටයුතු සඳහා මව් වගා සම්බන්ධීකාරක විසින් සෑම මව් වගා ක්ෂේත්‍රයකම අඛණ්ඩව නිරීක්ෂණ චාරිකා සිදු කරයි.

මෙම මව් වගා ක්ෂේත්‍ර අධීක්ෂණය හා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා උපදේශන චාරිකා දාහතරක් (14) ක් සිදු කරන ලදී.

ව්‍යාපෘති කාලසීමාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ අතර, TRI 5000 කාණ්ඩයේ මව් වගා ක්ෂේත්‍ර 26 ක් දිවයිනේ සියලුම තේ වගා කරන ප්‍රදේශ ආවරණය කරමින් පිහිටුවා ඇත. තේ වගා කරන සියලුම ප්‍රදේශවල මව් පඳුරු වගා කරන ලද මුළු ප්‍රමාණය හෙක්ටයාර් 20.86 වන අතර එය අදාළ ක්ෂේත්‍ර කළමනාකරුවන් විසින් නඩත්තු කරනු ලැබේ.

**D/ADV 3 ව්‍යාපෘතිය: අධීක්ෂණය, ඇගයීම සහ ව්‍යාප්ති පර්යේෂණ**

ප්‍රකාශන / ඉදිරිපත් කරන ලද පත්‍රිකා

- කුඩා තේ වතු සංවර්ධන සමිතිවල කාර්යක්ෂමතාවය සාමූහික ක්‍රියාකාරකම් මගින් වැඩි දියුණු වී තිබේද? යන මැයෙන් සාරාංශයක් PGIA සම්මේලනයේ දී ඉදිරිපත් කරන ලදී. (කේ ජී ජේ පී මහින්දපාල)
- "ශ්‍රී ලංකාවේ සමාගම් වතු අංශයේ තේ වගාවේ යාන්ත්‍රික අස්වනු නෙලීම" පිළිබඳ ගවේෂණාත්මක බහු සිද්ධි අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් 2022 දෙසැම්බර් 6 වැනි දින පැවති ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 12 වැනි වාර්ෂික පර්යේෂණ සැසියේදී ඉදිරිපත් කරන ලදී. (ටී පී එන් මහින්ද, එම් ඉෂාම් සහ එච් එස් ආර්.රොසයිරෝ )
- "රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් සඳහා ව්‍යාප්ති ක්‍රියා මාලාවන් සහ උපදේශන සංසදයන් සඳහා "WhatsApp" ජංගම යෙදුම භාවිතයේ ඵලදායිතාව" යන මාතෘකාව පිළිබඳ පර්යේෂණ ප්‍රතිඵල 2022 PGIA සම්මේලනයේ දී (එස්. පී. ඒ. පී. කේ ජයරත්න, යූ. අයි දිසානායක) ඉදිරිපත් කරන ලදී.
- "2013 වසරේ සිට ජාතික තේ නිෂ්පාදනය පහත වැටීම පිළිබදව සාක්ෂි පදනම් වූ විශ්ලේෂණය" උපදේශන සහ ව්‍යාප්ති අංශයේ ප්‍රධානී වී සිධාකරන් විසින් 2022 දෙසැම්බර් 16 වැනි දින 240 වැනි පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේදී ඉදිරිපත් කරන ලදි. (කර්තෘන්: වී එස් සිධාකරන්, එම් ඒ විජේරත්න, එච් ඩබ්ලිව් ශ්‍යාමලී, ජී එස් ප්‍රදීප්, කේ ජී ලක්මාලි, ආර් මුරලිතාසන්)
- "තේ. ප. ආ. කෙටිපණිවිඩ සේවාව මගින් යවන ලද පණිවිඩ ඇගයීම" යන මැයෙන් පත්‍රිකාවක් Tea Bulletine -2020 ප්‍රකාශනයේ ප්‍රකාශ කරන ලදී. (කේ ආර් ඩබ් බී කහඳව, ජේ ඩබ් ගුනපාල, එච් ඊ එම් යු සී එස් ඒකනායක)
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව "ප්‍රමිතිගත තේ පැළ තවාන් 138 ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය" පිළිබඳ සමීක්ෂණ වාර්තාව සහ " තේ වගාවන් සඳහා T 1240 පොහොර මිශ්‍රණය භාවිතය " පිළිබඳ සමීක්ෂණ වාර්තාව සකස් කරන ලදී. (එම් ඒ එච් නිශාන්ති)
- දෙනියාය ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන අවස්ථාවේ දී කුඩා තේ වතු හිමියන් විසින් නිර්දේශිත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය පිළිබඳ ව්‍යාප්ති සමීක්ෂණ වාර්තාවක් සකස් කරන ලදී. (සී ඊ මුණසිංහ, එච් බී තරංගිකා)

**D/ADV 5 ව්‍යාපෘතිය: රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාප්ති ප්‍රවේශය**
අන්‍යෝන්‍ය වශයෙන් වාසි සහිත අරමුණු ඇතිව හවුල්කරු / සහයෝගිතා සංවිධාන එකට වැඩ කරන ව්‍යාපෘතී ක්‍රමයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාප්ති ප්‍රවේශය හඳුනා ගත හැක. වගකීම් ලෙස කාලය, සම්පත්, දැනුම සහ විශේෂඥතාව සහයෝගිතා සංවිධාන (තේ පර්යේෂණ ආයතනය සහ පෞද්ගලික සංවිධාන) අතර බෙදා ගැනේ.

**සමාගම් වතුවල අවශ්‍යතාව මත නිර්මාණය කල පුහුණු වැඩසටහන්**
සමාගම් වතුවල අවශ්‍යතාව මත නිර්මාණය කළ පුහුණු වැඩසටහන යනු තේ වතු වල විධායක නිලධාරීන්ගේ සහ ක්ෂේත්‍ර සේවකයින්ගේ තාක්ෂණික නිපුණතාවය ඉහළ නැංවීමේ අරමුණින් තේ පර්යේෂණ ආයතනය සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් ගනු ලැබූ සහයෝගී ව්‍යාපෘතියකි. එක් එක් තේ වගා කරන කලාපයට අදාළ කාලෝචිත විෂයයන්/ ගැටලු පදනම් කරගෙන එක් එක් වැවිලි සමාගම්වල උනන්දුව මත එක් එක් පුහුණු වැඩසටහන සඳහා තේමාවන් තෝරා ගන්නා ලදී. වර්ෂය තුළදී, හැටන්, නමුනුකුල, බලන්ගොඩ, මඩොල්සිම, පුස්සැල්ලාව, හපුගස්තැන්න සහ ඇල්කඩුව යන කලාපීය වැවිලි සමාගම් හතෙහි විධායක නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ වතු කම්කරුවන් සඳහා එවැනි වැඩසටහන් දහසයක් සංවිධානය කර ඇත. මෙම වැඩසටහනේ වලදී තේ දළු නෙලීම, කප්පාදු කිරීම, පත්‍ර ඉසින යෙදීම, තේ පඳුරු උදුරා දැමීම, තේ නැවත වගා කිරීම සහ පසු රැකවරණය, පංශු සහ පත්‍ර නියැදි ලබා ගැනීම, තේ තවාන් කළමනාකරණය, තේ ඉඩම් වල පාංශු සංරක්ෂණය සහ පෝෂක කළමනාකරණය, පසු අස්වනු පරිහරණය සහ වල් පැළෑටි පාලනය, උපාය මාර්ගික පිරිවැය කළමනාකරණය, යහපත් කෘෂිකාර්මික භාවිතයන් සහ නිමි තේ නිෂ්පාදනය යන විෂයයන් සාකච්ඡා කරන ලදි.

තේ පර්යේෂණ ආයතන තලවාකැලේ, රත්නපුර, හන්තාන, පස්සර සහ
දෙනියාය මධ්‍යස්ථානයන් හි උපදෙස් හා ව්‍යාප්ති අංශ කාර්ය මණ්ඩලය
සමඟ නිමි තේ තාක්ෂණ අංශය

**පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය:**
පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය (පී.ඊ.ඒ.), තේ පර්යේෂණ ආයතනය සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන බිම් මට්ටමේ ව්‍යාප්ති ප්‍රවේශයකි. මෙම ව්‍යාපෘතියේදී විවිධ වතුවල සේවයේ නියුතු දක්ෂ නවෝත්පාදක ක්ෂේත්‍ර නිලධාරි කණ්ඩායම් නිසි පුහුණුවක් ලබා දීමෙන් පසු පරිපූරක ව්‍යාප්ති පුහුණුකරුවන් ලෙස සවිබල ගැන්වීමත් පසුව ඔවුන් මඟින් අදාල තේ වතුයායේ බිම් මට්ටමේ සේවකයින් (තේ වතු කම්කරුවන් සහ කන්ගානීවරුන්) පුහුණුකිරීමත් සිදු කරනු ලැබේ. එමෙන්ම වතු සේවකයන්ගේ දැනුම, ආකල්ප හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා වන අනුගත වීම ඉහල නැංවීම තුලින් ඵලදායීතාවය ඉහල නැංවීම සහ තේ වතුයායන්හි බිම් මට්ටමේ තාක්ෂණික ව්‍යාප්ති පද්ධතියක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. මතුරට වැවිලි සමාගම (ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ඇතුළු කම්කරුවන් 130 දෙනෙකු සඳහා වැඩසටහන් 7ක්), බළන්ගොඩ වැවිලි සමාගම සහ මඩොල්සිම වැවිලි සමාගම (ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ සේවකයින් සඳහා වැඩසටහන් 6ක්) යන ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි. තේ අස්වනු නෙලීම, අමු දළු ප්‍රමිතීන්, පොහොර යෙදීම් සහ අනෙකුත් ප්‍රධාන කෘෂිකාර්මික පිළිවෙත් මෙම වැඩසටහන් මගින් ආවරණය කරන ලදී.

වී එස් සිධාකරන්, පී එස් ප්‍රදීප්, කේ ජී ලක්මාලි, ආර් මුරලිතාසන්,
ඒ අබේසූරිය සහ කේ ජී නිරෝෂා ගමගේ

**D/ADV 7 ව්‍යාපෘතිය: සයිබර් ව්‍යාප්ති කටයුතු**
සයිබර් ව්‍යාප්තියේ දී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිතයෙන් විවිධ ව්‍යාප්ති ක්‍රියාකාරකම් ආවරණය කරයි. ප්‍රධාන පරමාර්ථය වන්නේ තේ වගාකරුවන් ඇතුළු අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සඳහා තේ. ප. ආ. නිර්දේශ සහ තොරතුරු පිරිවැය ඵලදායී හා කාර්යක්ෂමව බෙදා හැරීම සහතික කිරීම සහ එමඟින් දැනුවත් කිරීම සහ යෙදවුම් වැඩිදියුණු කිරීමයි. මේ යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී

**SMS Gateway - තාක්ෂණික කෙටි පණිවිඩ**
වර්ෂය තුළ දී, තේ වගාකරුවන් සඳහා කාලීන ගැටළුවලට අදාළ මාසික කෙටි පණිවිඩ (මොබිටෙල්) විසි හතරක් (24) හඬ පණිවුඩ (ඩයලොග්) විසි හතරක් දිවයින පුරා ලියාපදිංචි සේවාලාභීන් සඳහා සකස් කර බෙදා හරින ලදී. ඩිජිටල් ව්‍යාප්ති ද්‍රව්‍ය බෙදා හැරීම ද මෙයට ඇතුළත් විය.

තේ තොරතුරු සේවා ඇමතුම් මධ්‍යස්ථානය 2021 වසරේ පළමු කාර්තුවේදී තේ පර්යේෂණ ආයතනයේ මැදරට මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද අතර එය 2021 ජුනි මස සිට මහජනතාව සඳහා ක්‍රියාත්මක විය. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඇමතුම් 110ක් පිළිතුරු ඉදිරිපත් කර ඇත.

ගොවි මිතුරු යෙදුම යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් විශේෂ රැස්වීමක් ඩයලොග් සමාගම සමඟ 2022 අගෝස්තු මාසයේදී පවත්වන ලදී.

**D/AR ව්‍යාපෘතිය: ගොවීන් විසින් අනුගමනය කිරීම සඳහා නව තාක්ෂණයන්හි යෝග්‍යතාවය ඇගයීම සඳහා අනුවර්තී පර්යේෂණ**

පර්යේෂණයන් තුලින් ගොඩනගන ලද නව තාක්ෂණයන්, සැබෑ වගා තත්වයන්හිදී යෝග්‍යතාවය පරීක්ෂා කිරීම අනුවර්තී පර්යේෂණ මගින් සිදු කෙරේ. අනුවර්තී පර්යේෂණයන් තේ වගා ක්ෂේත්‍ර තුල වගාකරුවන් විසින් සිදු කරනු ලබන අතර පර්යේෂණ හා ව්‍යාප්ති නිළධාරීන් විසින් අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සිදු කරයි. මෙම නව තාක්ෂණයන් හඳුන්වාදීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු සහ සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ අධ්‍යයනයන්ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබයි.
පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- නන්-හයිබ්‍රිඩ් යූරියා-හයිඩ්‍රොක්සිඇපටයිට් පිළිබඳ අනුවර්තී අත්හදා බැලීම රත්නපුර දිස්ත්‍රික්කයේ පොතුපිටිය තේ පරීක්ෂක කලාපයේ සිදු වෙමින් පවතී. (අත්හදා බැලීම 2022 නොවැම්බර් 21 වන දින ආරම්භ වූ අතර මාස 6 ක කාලයක් සඳහා අඛණ්ඩව පැවැත්වේ)
- මාතර දිස්ත්‍රික්කයේ මොරවක සහ අකුරැස්ස ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් වල TRI 5000 කාණ්ඩයේ වගාවන් සඳහා අනුවර්තී අත්හදා බැලීම් දෙකක් ස්ථාපිත කරන ලද අතර, ශාක අභිජනන අංශය, තේ. ප. ආ. සහ කු. තේ. ස. අ. සහයෝගීතාවයෙන් අධීක්ෂණය කෙරේ.
- පාංශු සහ ශාක පෝෂක අංශයේ කාර්ය මණ්ඩලය සමඟ එක්ව තේ වගාව සඳහා දැව අළු භාවිතය පිළිබඳ එක් අත්හදා බැලීමක් කිරුවානගඟ වතුයායේ සිදු වෙමින් පවතී.
- දෙනියාය ප්‍රදේශයේ පල්ලේගම සහ බෙවර්ලි ප්‍රදේශයන්හි පිහිටුවා ඇති තේ පඳුරු දුර්වල වීම පාලනය කිරීම පිළිබඳ තේ. ප. ආ. නිර්දේශයන් නිරූපණය සඳහා ආදර්ශ තේ ඉඩම් දෙකක් අධීක්ෂණය කෙරේ.
- ටී.ආර්.අයි 5000 කාණ්ඩයේ අනුවර්තී අත්හදා බැලීම් සොයිසා වත්ත, පැලවත්ත, සහ හොරණ යන ස්ථානවල අධීක්ෂණය කෙරේ.
- ශාන්ත කුම්බිස් වතුයායේ පහළ කොටස, ක්ෂේත්‍ර අංක 10 කප්පාදු අතුවල දැමීමෙන් ඇති වන බලපෑම පිළිබඳ අනුවර්තී අත්හදා බැලීම් කෙරේ.

වී එස් සිධාකරන්, පී එස් ප්‍රදීප්, ආර් මුරලිතාසන්, කේ පී ලක්මාලි, ටී පී එන් මහින්ද,<br>එස් පී ඒ කේ පී ජයරත්න, පී වෙත්තසිංහ, සී ඊ මුණසිංහ, එච් බී තරංගිකා,<br>එච් ජයවීර සහ ජේ කේ ඒ ඩී කල්හාරි

**අනෙකුත් සිදු වෙමින් පවතින පර්යේෂණ අත්හදා බැලීම්**

**කීට විද්‍යා සහ වටපණු විද්‍යා අංශය**

■ වටපණුවන් සහ කඳ විදින ගුල්ලාගේ හානිය සඳහා ටී.ආර්.අයි 5000 කාණ්ඩයේ ප්‍රභේදයන් පරීක්ෂා කිරීම පිළිබඳ අත්හදා බැලීම් දෙකක් කීට විද්‍යා හා වටපණු විද්‍යා අංශයේ සහයෝගයෙන් තේ පර්යේෂණ ආයතන දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ දී සිදු කෙරේ.

ශාක අභිජනන අංශය

- ටී.ආර්.අයි 5000 කාණ්ඩය: ■ LVP අදියර 3 අත්හදා බැලීම් හතරක් තේ පර්යේෂණ ආයතන දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සහ ඉන්දෝල, කිරුවානගඟ සහ දෙනියාය වතුයාය වල අධීක්ෂණය කෙරෙමින් පවතී.
- කිරුවානගඟ වතුයායේ වැඩිදියුණු කළ බීජ උද්‍යාන දෙකක් අධීක්ෂණය කෙරේ.
- වරාපිටිය කුඩා තේ වතු හිමියෙකුගේ ඉඩමක බීජ පැළ ඇගයීමේ අත්හදා බැලීමක් අධීක්ෂණය කෙරේ.

සී.ඊ මුණසිංහ සහ එච්.බී තරංගිකා

**වැඩිදියුණු කළ බීජ පැළ ව්‍යාපෘතිය**

- කිරුවනගඟ, ලංකාබේරිය සහ විල්පිට යන වතුයායන් ආශ්‍රිතව හුදකලා බීජ උද්‍යාන තුනක් ස්ථාපිත කර ඇති අතර ඒවා ශාක අභිජනන අංශයේ සහයෝගයෙන් අධීක්ෂණය කෙරේ.
- වෝගන් සහ රයිගම් වතුයායේ බීජ උද්‍යාන දෙකක් අධීක්ෂණය කෙරේ.

**C/AVU ව්‍යාපෘතිය: ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවාවන්**

පර්යේෂණ, ව්‍යාප්ති හා අධ්‍යාපනික අවශ්‍යතාවන් සඳහා තාක්ෂණික විෂයයන් පිළිබඳ වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය හෝ ගුණ කිරීම, සහ සම්මන්ත්‍රණ වැඩසටහන් වලදී තාක්ෂණික ව්‍යාප්තිය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා සැපයීම සහ තේ පර්යේෂණ ආයතන වෙබ් අඩවිය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය සැකසීම මෙම ව්‍යාපෘතියේ අරමුණු අතර වේ.

මීට අමතරව ශ්‍රව්‍ය, දෘෂ්‍ය පුස්තකාලය නඩත්තු කිරීම, තේ පර්යේෂණ ආයතනය මඟින් නිෂ්පාදනය කරන ලද ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීම සිදු වේ.

නෙවිල් ඒකනායක

**වෙනත් පැවරුම්**

**විශේෂ ව්‍යාපෘතිය (GL 386): තේ ඉඩම් වලට දේශගුණික විපර්යාස මගින් වන බලපෑම අවම කිරීමේ පියවරක් ලෙස පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කිරීමට කප්පාදු අතු වැළලීම හා ඒ පිළිබඳ දැනුවත් භාවය වැඩි කිරීම සහ අගල් කැපීමේ/ අතු කැබලි කරන යන්ත්‍රය සංවර්ධනය කිරීම.**

2021 අයවැය කතාවෙන් වෙන් කරන ලද අරමුදල් වල ප්‍රතිඵලයක් ලෙස වැවිලි අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර ඇතිව තේ. ප. ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. එය ශෂ්‍ය විද්‍යා අංශයේ සහාය ඇතිව උපදෙස් සහ ව්‍යාප්ති අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.
තේ කප්පාදු අතු වැළලීම මගින් පස ලිහිල් වීම සහ පසෙහි කාබනික ද්‍රව්‍ය වැඩි කෙරෙන බැවින් අනෙකුත් පාංශු රසායනික හා භෞතික ගුණාංග වැඩිදියුණු වීම සහ පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි වීමත් එමගින් දේශගුණික විපර්යාසයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා සමස්ත පාංශු තත්වයන් වැඩිදියුණු වීම යන තිරසාර විසඳුමක් ලබා දේ. ව්‍යාපෘතිය පහත සඳහන් අරමුණු අනුව ගොඩ නගා ඇත.

- තේ. ප. ආ. ඉඩම්, සමාගම් තේ වතු, මධ්‍ය පරිමාණ තේ වතු සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල කප්පාදු අතු වළ දැමීම ආදර්ශනය කිරීම සඳහා 2021 වසරේ දී පිහිටුවනු ලැබූ වගා ආදර්ශන ස්ථාන අධීක්ෂණය කිරීම.
- දේශගුණික විපර්යාස වලින් වන බලපෑම අවම කිරීම සහ අත්‍යාවශ්‍ය කෘෂි විද්‍යාත්මක භාවිතයන් පිළිබඳ කුඩා තේ වතු හිමියන්, මධ්‍යම පරිමාණ වැවිලිකරුවන්, සමාගම් සහ රාජ්‍ය අංශයේ වැවිලිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**විශේෂ ව්‍යාපෘතිය (GL 387): තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ජංගම විද්‍යාගාර (01ක්) මඟින් කඩිනම් විශ්ලේෂණ සහ ව්‍යාප්ති සේවාවන් සැපයීම**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර මත තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ජංගම විද්‍යාගාර (01 ක්) මඟින් කඩිනම් විශ්ලේෂණ සහ ව්‍යාප්ති සේවාවන් සැපයීම යන විශේෂ ව්‍යාපෘතිය යටතේ ජංගම රසායනාගාර සහ ව්‍යාප්ති ඒකකය යන සංකල්පය මගින් ගොවීන්ට පහසු ස්ථානවල අවශ්‍ය ස්ථානීය විශ්ලේෂණ සහ ව්‍යාප්ති සේවා සැපයිය සඳහා 2021 වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස ජංගම විද්‍යාගාර සහ ව්‍යාප්ති ඒකකයක් ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත. තේ ප ආ විශ්ලේෂණ සහ ව්‍යාප්ති සේවාවේ ප්‍රධාන අරමුණ වන්නේ තේ වගාකරුවන්ට තේ. ප. ආ. විශ්ලේෂණාත්මක සහ ව්‍යාප්ති සේවාව පහසුවෙන් ප්‍රවේශ විය හැකි බවට පත් කිරීම සහ සේවා ස්ථානගතව සැපයීමයි.

මෙම ව්‍යාපෘතිය උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් අදාළ පර්යේෂණ අංශ (පාංශු හා ශාක පෝෂණ, ශාක ව්‍යාධිවේදි, කීට විද්‍යා සහ නිමි තේ සැකසුම් තාක්ෂණ) සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කර ඇත. නවීන විශ්ලේෂණ පහසුකම් සහිත ජංගම රසායනාගාර සහ ව්‍යාප්ති ඒකකය තේ වගාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා 2022 සැප්තැම්බර් 9 වන දින තේ. ප. ආ. පහතරට පර්යේෂණ, උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ

ව්‍යාප්ති නිලධාරීන් සහ කුඩා තේ වතු හිමියන් සඳහා වන 42 වැනි පර්යේෂණාත්මක හා ව්‍යාප්ති සංසදයට (E&E) සමගාමීව පැවති සමාරම්භක උත්සවයේ දී වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය ගරු රමේෂ් පතිරණ මහතා අතින් විවෘත විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, පුද්ගලික තේ කම්හල් සහ කුඩා තේ වතු හිමියන්ගේ සමිති සමග එක්ව සහයෝගීතාවයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර මට්ටමේ වගා සායන පවත්වන ලදී.

| ස්ථානය | ගොවීන් සංඛ්‍යාව | පවත්වන ලද්දේ |
|---|---|---|
| තේ ප ආ , කොට්ටාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 60 | තේ ප ආ , කොට්ටාව සහ දෙණියාය ප්‍රාදේශීය මධ්‍යස්ථාන |
| ශිහාරා තේ කර්මාන්තශාලාව, තවලම | 120 | |
| හල්විටිගල | 100 | |
| තවලම | 100 | |
| ගුරුබැවිල්ල සහ බලංගොඩ | 70 | රත්නපුර ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය |
| තේ. ප. ආ. , කොට්ටව ප්‍රාදේශීය මධ්‍යස්ථානය සහ දේවගිරි තේ කර්මාන්තශාලාව | 32 | තේ. ප. ආ. , කොට්ටව සහ දෙණියාය ප්‍රාදේශීය මධ්‍යස්ථාන |
| මීපලව මහා විද්‍යාලය | 57 | |
| නන්දන තේ කර්මාන්තශාලාව, අකුරැස්ස | 80 | |
| අකුරැස්ස | 200 | |
| උලින්දුවාව | 75 | |
| කිරිවැල්දොල | 85 | |
| මොරවක | 125 | |
| කැටන්විල | 130 | |
| පල්ලේගම | 110 | |

උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන), පර්යේෂණ අංශවල කාර්ය මණ්ඩලය (පාංශු හා ශාක පෝෂණ අංශය, ශෂ්‍ය විද්‍යා අංශය, ශාක ව්‍යාධිවේදී අංශය, කීට විද්‍යා අංශය සහ ශාක අභිජනන අංශය)

**සේවාලාභීන් සඳහා වෙනත් සේවාවන්**

**වාණිජ තේ තවාන් පරීක්ෂාව**

වාණිජ තේ තවාන්වල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත උපදෙස් හා ව්‍යාප්ති අංශය මඟින් වාණිජ තවාන් පරීක්ෂා කිරීම සහ ගුණාත්මක තේ තවාන් පැළ පිළිබඳ වාර්තා ලබාදීම සිදු කෙරිණි. මෙම වසර තුළ වාණිජ තවාන් 89 ක් පරීක්ෂා කල අතර ඒ පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

වගුව 8. වාණිජ තවාන් පරීක්ෂාව - 2022

| ප්‍රාදේශීය මධ්‍යස්ථානය | පරීක්ෂා කරන ලද වාණිජ තවාන් ප්‍රමාණය |
|---|---|
| තලවාකැලේ | - |
| හන්තාන | 47 |
| රත්නපුර | - |
| දෙනියාය | - |
| කොට්ටව | 10 |
| මතුගම | 5 |
| පස්සර | 27 |
| එකතුව | 89 |

වගුව 9. පී එච් අගය සහ කාබන් විශ්ලේෂණය කරන ලද පාංශු සාම්පල ගණන -2022

| ප්‍රාදේශීය මධ්‍යස්ථානය | පී.එච් පරීක්ෂාවන් ගණන | කාබන් පරීක්ෂාවන් ගණන |
|---|---|---|
| තලවාකැලේ | - | - |
| හන්තාන | 515 | - |
| රත්නපුර | - | - |
| දෙනියාය | 587 | - |
| කොට්ටව | 326 | - |
| මතුගම | 583 | - |
| පස්සර | 1162 | 699 |

**විශේෂ ව්‍යාප්ති වැඩසටහන්**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණ ආයතනය සමඟ එක්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් "සහකම්පන" නමින් තේ දළු ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ ජාතික වැඩසටහන දියත් කරන ලදී.

අදාළ පාර්ශ්වකරුවන්, කලාපීය සමාගම් වතු වැවිලිකරුවන්, මධ්‍ය පරිමාණ වැවිලිකරුවන් සහ රාජ්‍ය වැවිලිකරුවන්, දළු ප්‍රවාහනය කරන්නන්, තේ කම්හල් හිමියන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තේ පර්යේෂණ ආයතන උපදෙස් සහ ව්‍යාප්ති අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ එක්ව පුහුණු වැඩසටහන් 70 ක් පවත්වන ලදී.

**ව්‍යාපෘතිය C /SPN : පාංශු පෝෂක අංශය - සේවාලාභීන් සඳහා වන සේවාවන්**
**ප්‍රදේශ මට්ටමෙන් පාංශු, ශාක හා පොහොර විශ්ලේෂණ සේවාවන් වැඩි දියුණු කිරීම.**
**අරමුණු**
අ) ප්‍රධාන අරමුණ වූයේ පස්, පත්‍ර, කාබනික පොහොර සහ රසායනික පොහොර විශ්ලේෂණය සඳහා පාර්ශ්වකරුවන්ට විශ්ලේෂණ පහසුකම් සැපයීම සහ තේ වගාකරුවන්ට ස්ථානීය පොහොර යෙදීම සඳහා සහාය වීමයි.
ආ) කලාපීය පාදක ක්ෂේත්‍ර අත්හදා බැලීම්වල පර්යේෂණ සාම්පල විශ්ලේෂණය සිදු කිරීම.

සමාලෝචිත කාලසීමාව තුළ තලවාකැලේ, වලහන්දුව සහ රත්නපුර යන ස්ථානවල පස්, ශාක, රසායනික පොහොර සහ කාබනික පොහොර සම්බන්ධයෙන් සිදු කරන ලද සම්පූර්ණ විශ්ලේෂණ සංඛ්‍යාව පිළිවෙලින් (10,835), (2,009), (704) සහ (334) කි. මෙම විශ්ලේෂණයන් අතුරින්, පසෙහි pH අගය (10,331) සඳහා වැඩිම විශ්ලේෂණ සංඛ්‍යාවක් සිදු කරන ලද අතර දෙවනුව, පාංශු කාබනික කාබන් ප්‍රතිශතය (6,099) විශ්ලේෂණ කිරීම සිදු කරන ලදී. සිදු කරන ලද මුළු විශ්ලේෂණයන් ගණන 40,508 කි.

එල් ආර් එම් සී ලියනගේ, ඩබ්ලිව් එම් එස් විජයතුංග, ඕ ජී කේ ගුණරත්න, ඩබ්ලිව් ටී බී ඩී. ප්‍රියන්ත , ජේ ආර් වයි අබේවර්ධන, එස් කේ වීරතුංග, එස් පී එස් කේ විජේසිංහ, බී එම් ටී ටී කේ සේනාරත්න, ආර් එම් එන් එස් බංඩාර, ඩී එන් කහවෙව්තාන, බී වී ආර් සනාලි, එම් ජී කේ මධුශානි, ඩී ආර් ගමගේ

**ව්‍යාපෘතිය C /PATH : ශාක ව්‍යාධිවේදී අංශය - සේවාලාභීන් සඳහා වන සේවාවන්**
**ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සේවා**
නිමි තේ නියැදි 33 ක් ක්ෂුද්‍රජීවී තත්ත්ව සඳහා පරීක්ෂා කරන ලදී. විශේෂිත තේ සැකසුම් (speciality tea processing factory) කම්හලක පිරිසැකසුම් පරිසරයේ සහ සේවකයින්ගේ සනීපාරක්ෂක තත්ත්වය තක්සේරු කරන ලදී.

*ජී. ඩී. සින්නයියා, ඩී. ජී. එන්. පී. කරුණාජීව,* ආර් පී වී ටී චන්ද්‍රලාල්, කේ එල් එස් සී ගුණවර්ධන
ජී. ඩී. සින්නයියා, එම්. නිරංජන්, ඩී. ජී. එන්. පී. කරුණාජීව

**ව්‍යාපෘතිය C /ENTO: කීටවිද්‍යා අංශය - සේවාලාභීන් සඳහා වන සේවාවන්**

(1) නුවරඑළිය වතුයායෙන් වාර්තා වූ තේ මයිටාවන්ගේ උවදුර නිරීක්ෂණය කර පාලන ක්‍රම නිර්දේශ කරන ලදී.
(2) කුඩා තේ වතු හිමියෙකුගේ ඉඩමකින් වාර්තා වූ කුහුඹු උවදුර විමර්ශනය කර නිර්දේශ ලබා දෙන ලදී.
(3) ගෞරවිල සහ ග්ලෙනුපි වතුයායන්හි වාර්තා වූ කම්බිලි පණුවන්ගේ උවදුර පරීක්ෂා කිරීම සඳහා උපදේශන චාරිකාවක් සිදු කරන ලද අතර නිර්දේශ ලබා දෙන ලදී.

බී එස් විතාන, ඒ එම් පී සම්මානි සහ පී.ඩී.සේනානායක

**ව්‍යාපෘතිය C /PHYS : ශාක කායික විද්‍යා අංශය - සේවාලාභීන් සඳහා වන සේවාවන්**
තේ ඉඩම්වල ක්ෂේත්‍ර කප්පාදු කිරීමට පවතින යෝග්‍යතාවය පිළිබඳව නිර්ණය කිරීම සඳහා කප්පාදුවට පෙර සිදු කරනු ලබන තේ මුල්වල පිෂ්ඨය පරීක්ෂා කිරීම සඳහා, ශාක කායික විද්‍යා අංශය වෙත ලැබුණු මුල් නියැදි 15 ක පිෂ්ඨ පරීක්ෂාව සිදු කර අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලදී. අනෙකුත් නියැදි අදාළ පිරිවිතරයන්ට නොගැළපීම නිසා නිසි ආකාරයෙන් මුල් නියැදි ලබා ගන්නා ආකාරය ඇතුලු අනෙකුත් අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප කරන ලදී. තවද තේ මුල් වල පිෂ්ඨ පරීක්ෂාව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය වන අයඩින් ද්‍රාවණ පිළියෙල කර කප්පාදුවට පෙර තේ මුල්වල සංචිත පිෂ්ඨය පරීක්ෂා කරන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමෙන් අනතුරුව මහ වතු අංශයේ තේ වතු 1 කට සහ තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ උපදෙස් සහ ව්‍යාප්ති අංශයට ඔවුන්ගේ ඉල්ලීම් පරිදි අයඩින් ද්‍රාවණ ලබා දෙන ලදී. තේ පර්යේෂණ ආයතනයේ ජංගම විද්‍යාගාරයටද අයඩින් ද්‍රාවණය පිළියෙල කර ලබාදෙන ලදී. මට්ටකැලේ සහ සමර්සෙට් වතුයායන්වල නියෝජිතයන්ට තේ ශාකවල මුල්වල පිෂ්ඨ පරීක්ෂාව සිදුකිරීම පිළිබඳව දැනුවත් කරන ලදී.

මෙම පරීක්ෂාව සඳහා මුල් නියැදි ලබා ගන්නා ආකාරය සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම මාර්ගෝපදේශයක් ලෙස සකස් කර තේ පර්යේෂණ ආයතනයේ නිළ වෙබ් අඩවියේ පල කිරීම උදෙසා නැවත වරක් ආයතනයේ අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එහි දමිළ පරිවර්තනය සිදු කෙරෙමින් පවතී.

ටී එල් විජේරත්න, ඩී එම් එස් නවරත්න, වි සිදාකරන්, ඒ ඩී අයි යූ ජයවර්ධන
සහ එන් එම් විතානගේ

**C/TECH පිරි සැකසුම් තාක්ෂණ අංශයෙන් සැපයෙන සේවාවන්**

- කර්මාන්තශාලා 58 ක තේ නිෂ්පාදනයේ විවිධ අංශ වලට අදාල උපදෙස් සේවාවන් සඳහා නිළධාරීන් නිරත විය.
- කර්මාන්තශාලා 28කින් ලැබුනු තෙතමනය මනින උපකරණ ක්‍රමාංකනය කොට වාර්තා සැපයීම නිළධාරීන් මඟින් සිදු විය.
- කර්මාන්තශාලා 17 කින් ලැබුනු උෂ්ණත්වමාන ක්‍රමාංකනය කොට වාර්තා සැපයීම නිලධාරීන් මඟින් සිදු විය.
- නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා මඟින් ලැබුණු සාම්පල 1173 ක තෙතමනය පරීක්ෂා කොට වාර්තා සපයන ලදි.
- නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා මඟින් ලැබුණු සාම්පල 08 ක රසායනික පරාමිතීන් පරීක්ෂා කොට වාර්තා සපයන ලදි.
- සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ආස්තරන 2කින් යුත් තේ ඇසුරුම් මළුවක බිම හෙලීමේ පරීක්ෂණය සහ තෙතමන බාධක ගුණය පරීක්ෂා කරන ලදි. සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ආස්තරන 3 කින් යුත් තේ ඇසුරුම් මළුවක බිම හෙලීමේ පරීක්ෂණය සිදු කරන ලද අතර තෙතමන බාධක ගුණය පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදි.
- JEDB නියෝජ්‍ය සභාපති සහ කළමණාකරු සමඟ කර්මාන්තශාලා නවීකරණය හා සම්බන්ධ වෙන් වෙන් වූ සාකච්ඡා වට තුනක් සඳහා නිළධාරීන් සහභාගි විය.

- ඉන්දොල තේ වතු යායේ පවත්වන ලද අතින් සාදන ලද තේ නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුවකට නිලධාරීන් දායක විය.
- "ගුණාත්මක බවින් යුතු නිෂ්පාදනයකට කුඩා ව්‍යවසායකයන්ගේ වගකීම්" යන මැයෙන් සණස තේ කර්මාන්තශාලාව මගින් සංවිධානය කළ සම්මන්ත්‍රණයකට නිලධාරීන් සහභාගි විය.
- නිලධාරීන් විසින් වැවිලි බෝග තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් සඳහා ශ්‍රේණි කිරීම, මිශ්‍ර කිරීම සහ මළු ගත කිරීම පිළිබඳ දේශනයන් සහ NIPM විසින් සංවිධානය කරන ලද කර්මාන්තශාලා නිළධාරීන් 20 ක් සඳහා වන තේ නිෂ්පාදනය පිළිබඳ දේශන සහ වැඩමුළුවලට සහභාගි විය.
- කළුතර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා කුඩා පරිමාණයේ නිෂ්පාදනය පිළිබඳ කරුණු දැක්වීම් සිදු කරන ලදි.
- නිලධාරීන් විසින් Houpe වතුයායේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ඉංජිනේරු සහ කළමනාකාර තුමා සමග තේ නිෂ්පාදනයේදී අගය එකතු කිරීම, කුඩා පරිමාණයේ නිෂ්පාදනය සහ තව් මැරීම පිළිබඳ සාකච්ඡා වට දෙකක් සඳහා සහභාගි විය.
- නුවරඑළිය කර්මාන්ත සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද තේ රස බැලීම සහ වර්ග කිරීම පිළිබඳ දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් සඳහා වන පුහුණු වැඩමුලුවකට නිලධාරීන් දායක විය.
- නිලධාරීන් විසින් රජ්ජුරුවත්ත තේ කර්මාන්තශාලාවේ නිලධාරීන් සහ කම්කරුවන්, නිව් විතානකන්ද කර්මාන්තශාලාවේ නිළධාරීන්, කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් 180 ක් සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ දෙවන වසර සිසුන් සඳහා පුහුණු සැසි සහ වැඩමුළු පැවත්වීය.
- SLTB විසින් සංවිධානය කරන ලද කර්මාන්තශාලා හිමිකරුවන්, බටන්ගොඩ දළු එකතුකරන්නන්, KDU දළු එකතුකරන නිලධාරීන් සඳහා දළුවල ප්‍රමිතිය පිළිබඳ දේශන පැවත්වීය.
- දේවගිරි කර්මාන්තශාලාව විසින් කුඩා වැවිලි කරුවන්, නිව් හෝප්වෙල් කර්මාන්තශාලාව, විකිලිය කර්මාන්තශාලාව, කරවිට කර්මාන්ත ශාලාව සහ කරඳන කර්මාන්තශාලාව යන අය විසින් සංවිධානය කරන ලද තේ දළු වල ප්‍රමිතිය පිළිබඳ දේශන නිලධාරීන් විසින් පැවත්වීය.
- තේ පර්යේෂණායතනය මගින් සංවිධානය කරන ලද වැවිලි බෝග සායනය සඳහා නිලධාරීන් සහභාගි විය.
- වනරාජා වතුයායේ ආධුනික සහකාර කළමනාකරුවන් සඳහා තේ නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකට නිලධාරීන් දායක විය.
- CECB ඉංජිනේරුවන් සඳහා බලශක්ති සංරක්ෂණ විභවයන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ශාන්ත කුම්බිස් කර්මාන්තශාලාව තුලදී සිදුකරන ලදි
- කර්මාන්ත අමාත්‍යාංශය සංවිධානය කරන ලද නිමි භාණ්ඩ ඇසුරුම්කරණ තත්ත්ව ගොඩනැන්වීම සඳහා පවත්වන ලද රැස්වීමට නිලධාරීන් සහභාගි විය.

කේ රවීන්ද්‍රන්, එම් ඒ චමින්ද්‍ර, ඩබ් එම් එස් වීරවර්ධන, එල් ජයසිංහ, යූ පී ඩී පි රනතුංග, ඊ පි ඩී එන් එම් විජයවර්ධන, කේ ඒ එල් සී කොඩිතුවක්කු සහ ඩබ් එම් අයි සත්සරනි

## C/MECH. කාර්මික වැඩපල මඟින් සිදුකළ සේවාවන්

වැඩපල කාර්මිකයන් වාහන අළුත්වැඩියාවන් 24 ක්ද, ආයතනයේ කර්මාන්තශාලාවල යන්ත්‍ර අළුත්වැඩියාවන් 66 ක්ද, පර්යේෂණ සහ උපදෙස් අංශ සහ සේවා අංශ සඳහා නිමවීම් සහ නඩත්තු කටයුතු 66 ක් සඳහාද දායක විය

එන් ඒ බෝවී, වී සිවකුමාර්

## පුස්තකාලය

තේ පර්යේෂණායතනය එහි පුස්තකාල සේවාවන් සිය කාර්ය මණ්ඩලය වෙත මෙන්ම තේ පර්යේෂණායතනයට අනුයුක්තව තම අධ්‍යයන ව්‍යාපෘති වල නියැලෙන උපාධි අපේක්ෂක සහ අනෙකුත් කෘෂිකර්ම පාඨමාලා හදාරන සිසුන් සඳහා ලබාදෙන අතර ලිඛිත ඉල්ලීම් මත පිටස්තර විද්වතුන්ට හා පුස්තකාලවලට ලබාදීම සිදුකරයි.

පොත්පත් අයත් කර ගැනීම, සුචිගත කිරීම, වර්ගීකරනය, පුස්තකාල පොත් බැහැර දීම, අන්තර් පුස්තකාල කටයුතු, ඡායා පිටපත් සේවය මෙන්ම පුවත්පත් ලිපි ගොනුව පවත්වාගෙන යාම යනාදී කටයුතු වර්ෂය තුලදී සිදු කරන ලදී.

දැනට පවතින 4792 ක් වූ පොත් එකතුව සඳහා පරිත්‍යාග ලෙස ලැබුනු පොත් 4 ක් අලුතින් එකතු වෙන ලදී. වාර්ෂික දායකත්වය මත හා පරිත්‍යාග / හුවමාරු ක්‍රමය යටතේ වාර සඟරා 57 ක් ලැබුණි. වර්ෂය තුල පශ්චාත් උපාධි නිබන්ධන එකතුවට ආචාර්ය උපාධි නිබන්ධන දෙකක් එකතු විය. ජාත්‍යන්තර තේ කවුන්සිලය (International Tea Committee, UK) මගින් ප්‍රකාශිත ලෝකයේ තේ කර්මාන්තය පිළිබඳ වූ සංඛ්‍යාලේඛන ඇතුලත් මාසික ප්‍රකාශනයට (ITC Monthly Bulletin of Statistics) අදාල වර්ෂය සඳහා දායකත්වය අලුත් කරන ලදී. එම ආයතනය මගින්ම ප්‍රකාශයට පත් කරනු ලබන, වාර්ෂික දායකත්ව මුදල බ්‍රිතාන්‍ය පවුම් 266ක් වටිනා තේ කර්මාන්තය පිළිබඳ වූ සංඛ්‍යාලේඛන ඇතුලත් වාර්ෂික ප්‍රකාශනය (ITC Annual Bulletin of Statistics) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී මනුජ පීරිස් මහතා විසින් පරිත්‍යාගයක් ලෙස මෙම වර්ශයේ දී අප පුස්තකාලය වෙත ප්‍රදානය කරන ලදී.

තේ පර්යේෂණායතන පර්යේෂණ කාර්ය මණ්ඩලය මගින් වර්ෂය තුල දී පුස්තකාලයෙන් බැහැර ගෙන යන ලද පොත්පත් ප්‍රමාණය 146 කි. වර්ෂය තුල පුවත්පත් ලිපි ගොණුව වෙත එකතු වූ පුවත්පත් ලිපි සංඛ්‍යාව 256 කි. පර්යේෂණ සහ අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත පිටු 376 ක ඡායා පිටපත් ප්‍රමාණයක් බැදි වාර සඟරා එකතුවෙන් හා අනෙකුත් පොත්පත් වලින් වර්ෂය තුලදී ලබා දෙන ලදී.

## ඡායාරූප ඒකකය

ආයතනයේ පැවැත්වෙන සියලුම පර්යේෂණ අංශ සහ කාර්යයන්ට අදාළ ඩිජිටල් ඡායාරූප ගැනීම සඳහා ඡායාරූපකරණ ඒකකය සහභාගී වූ අතර ඩිජිටල් ඡායාරූප 1189 ක් ලබා ගන්නා ලදී.

වසර තුළ සිදුවීම් දහයක් ආවරණය කර ඇති අතර TRI වෙබ් අඩවිය සහ ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම සඳහා ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකයට ඡායාරූප ලබා දී ඇත. තවද, ඡායාරූප 14,000 ක් පමණ වර්ග කර ඡායාරූප ගබඩාවේ එකතුවට ඇතුළත් කරන ලදී.

## ප්‍රකාශන හා ප්‍රචාරක ඒකකය

ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකය, වසර තුළ ආයතනයේ වාර්ෂික ප්‍රකාශන හරහා පර්යේෂණ ව්‍යාප්ති ක්‍රියාවලිය සිදු කිරීම සඳහා සහාය සේවා සපයයි. තවද, ආයතනය තුළ සහාය සේවා සපයන්නෙකු ලෙස ආයතනයේ සේවා සැපයීම සඳහා පහසුකම් සැපයීම සිදු කරයි.

2022 වර්ෂය සඳහා සැලසුම් කළ කටයුතු සාර්ථකව සිදු කරන ලදී. මුද්‍රණ කටයුතු සඳහා අධික පිරිවැය සහ නිතර මිල උච්චාවචනයන් හේතුවෙන් වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව, සහ 2021 සහ 2022 ප්‍රවෘත්ති පත්‍ර මුද්‍රණ කටයුතුවලට එය බලපෑවේය. කෙසේ වෙතත්, ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් පාර්ශ්වකරුවන්ට තොරතුරු බෙදා හැරීමට අදාළ මෙහෙයුම් සිදු කිරීමේදී ඒකකය සහාය ලබා දුන්නේය.

### ගෘහස්ථ මුද්‍රණ/ අනුපිටපත් කිරීමේ සේවාව

ඉල්ලීම මත පර්යේෂණ අංශ/ ඒකක සඳහා ඒකකය මුද්‍රණ පහසුකම් සපයා ඇත. ප්‍රකාශන ඒකකය වසර තුළ රු. 15,725.00 ක් වටිනා ඩිජිටල් මුද්‍රණ කටයුතු සම්පූර්ණ කර ඇත. 2022 වර්ෂය සඳහා උපදේශන චක්‍රලේඛ, මාර්ගෝපදේශ, අත්පත්‍රිකා, අයවැය වාර්තාව, කලාපීය තාක්ෂණික සහ ව්‍යාප්ති

සංසදය සඳහා අත්පත්‍රිකා සහ පොහොර, පළිබෝධනාශක ආදියට අදාළ පර්යේෂණ ප්‍රකාශන මුද්‍රණ පැවරුම සම්පූර්ණ කරන ලදී.

තවද, ප්‍රකාශන ඒකකය ආයතනයේ ප්‍රධාන ඡායා පිටපත් කිරීමේ සේවාවේ ඡායා පිටපත් සැදීමේදී අනෙකුත් අංශ/ඒකක සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සේවය කර ඇත. ප්‍රධාන ඡායා පිටපත් යන්ත්‍රයේ ඇති වූ බිඳවැටීම හේතුවෙන්, ඡායා පිටපත් කිරීමේ සේවාව වසර තුළ ක්‍රියාත්මක නොවීය.

**ප්‍රකාශන අලෙවිය**

ප්‍රකාශන අලෙවිය ඒකකය විසින් සිදු කරන ලද ප්‍රධාන මෙහෙයුමයි. රුපියල් 920,495.00 ක් වටිනා ප්‍රකාශන අලෙවිය වසර තුළ සිදු කරන ලදී. විකුණුම් පිළිබඳ සාරාංශයක් 01 වගුවේ දක්වා ඇත. 2021 වසරට සාපේක්ෂව, 2022 වසර තුළ විකුණුම් වැඩි විය. තේ පිළිබඳ අත්පොත සහ ක්ෂේත්‍ර මාර්ගෝපදේශ පොතේ නව සංස්කරණය ඉහළ ඉල්ලුමක් ඇති ප්‍රකාශන විය. තවද, මූල්‍ය අංශයේ සහාය ඇතිව, මාර්ගගත ගෙවීම් පහසුකම් තහවුරු කිරීම හරහා ප්‍රකාශන මිලදී ගැනීමට කොටස්කරුවන්ට පහසුකම් සපයයි.

| වර්ෂය | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ශ්‍රව්‍ය දෘශ්‍ය | එකතුව |
|---|---|---|---|---|---|
| 2019 | 572,375.00 | 30,090.00 | 6,190.00 | 850.00 | 609,505.00 |
| 2020 | 79,990.00 | 11,785.00 | 3,270.00 | 900.00 | 95,945.00 |
| 2021 | 159,465.00 | 6,010.00 | 1,800.00 | 250.00 | 167,525.00 |
| 2022 | 895,190.00 | 8,825.00 | 15,580.00 | 900.00 | 920,495.00 |

ඉංග්‍රීසි ප්‍රකාශන

| No. | Description | Price (Rs.) | Quantity | Amount (Rs.) |
|---|---|---|---|---|
| 1 | Advisory Circular Folders (English) | 600 | 48 | 28,800 |
| 2 | Chemical Control of Tea Pests | 150 | 17 | 2,550 |
| 3 | Correction of nutrient deficiency symptoms in tea Poster | 15 | 2 | 30 |
| 4 | Proceedings of Regional Scientific Committee - 1988 | 250 | 2 | 500 |
| 5 | Field Guidebook (English) (Issued to TRI Officers with Discount) | 1000 | 1 | 1000 |
| 6 | Field Guidebook (English) | 1500 | 444 | 666,000 |
| 7 | Nuwara Eliya District Tea Development Plan | 150 | 2 | 300 |
| 8 | Shoot growth and harvesting of tea | 100 | 24 | 2,400 |
| 9 | Monograph No.4 - Tea Manufacture in Ceylon, EL Keegal | 750 | 22 | 16,500 |
| 10 | Monograph No.5 - One day course in tea manufacture, EL Keegal | 350 | 13 | 4,550 |
| 11 | Monograph No.6 - Insect and mite pests of tea in Ceylon, JE Cranham | 100 | 6 | 600 |
| 12 | Monograph No.7 - Facets of the tea research in practice, RL Wickremasinghe | 100 | 42 | 4,200 |
| 13 | Cost of tea Cultivation from nursery to the field | 400 | 4 | 1,600 |
| 14 | Tea and Health | 750 | 7 | 5,250 |
| 15 | Tea for Health | 100 | 9 | 900 |
| 16 | Weeds of Tea lands in Sri Lanka | 200 | 8 | 1,600 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | Twentieth Century tea research in Sri Lanka | 2,000 | 1 | 2,000 |
| 18 | Poster on Soil conservation with vetiver grass | 30 | 2 | 60 |
| 19 | Wall chart on Major pests of tea in Sri Lanka | 100 | 5 | 500 |
| 20 | Handbook on Tea-1st Edition (Issued to TRI Officers with Discount) | 1,500 | 3 | 4,500 |
| 21 | Handbook on Tea (Reprint 2019) | 2,000 | 26 | 52,000 |
| 22 | Handbook on Tea - Reprinted 2019 Price Revised (Issued to TRI Officers with Discount) | 2000 | 1 | 2,000 |
| 23 | Handbook on Tea- Reprinted 2019 (Price Revised) | 2,500 | 35 | 87,500 |
| 24 | Integrated Soil Fertility Management | 500 | 18 | 9,000 |
| 25 | Soil Conservation in Tea Lands | 20 | 9 | 180 |
| 26 | Common Diseases on Tea Cultivation Poster (English) | 100 | 1 | 100 |
| 27 | Sri Lanka Journal of Tea Science | 100 | 2 | 200 |
| 28 | Tea Bulletin | 50 | 1 | 50 |
| 29 | TRI Update | 20 | 1 | 20 |
| 30 | Annual Reports | 100 | 3 | 300 |
| | | | Sub-total | 895,190 |

සිංහල ප්‍රකාශන

| No. | Description | Price (Rs.) | Quantity | Amount (Rs.) |
|---|---|---|---|---|
| 1 | උපදෙස් චක්‍රලේඛ ගොනුව | 500 | 13 | 6,500 |
| 2 | සැවැන්දරා වගා කර පස සුරකිමු (පෝස්ටරය) | 30 | 1 | 30 |
| 3 | සුව රැකුමට තේ | 125 | 5 | 625 |
| 4 | ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සහ තේ පර්යේෂණ ආයතනය | 10 | 7 | 70 |
| 5 | තේ වගාවට සරු පසක් | 50 | 14 | 700 |
| 6 | තේ ඉඩම්වල පස සංරක්ෂණය | 20 | 15 | 300 |
| 7 | තේ වගාවේ ප්‍රධාන රෝග හඳුනා ගනිමු (පෝස්ටරය) | 100 | 1 | 100 |
| 8 | තේ තවාන් පාලනය (පෝස්ටරය) | 100 | 5 | 500 |
| | | | Sub-total | 8,825 |

දමිළ ප්‍රකාශන

| No. | Description | Price (Rs.) | Quantity | Amount (Rs.) |
|---|---|---|---|---|
| 1 | Advisory Circular Folders | 500 | 28 | 14,000 |
| 2 | Correction of nutrient deficiency symptoms in tea Poster (Tamil) | 15 | 3 | 45 |
| 3 | Field Guide Book (Tamil) | 125 | 11 | 1,375 |
| 4 | Poster on Soil conservation with vetiver grass (Tamil) | 30 | 3 | 90 |
| 5 | Tea Industry and TRI of Sri Lanka (Tamil) | 10 | 7 | 70 |
| | | | Sub-total | 15,580.00 |

ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය

| No. | Description | Price (Rs.) | Quantity | Amount (Rs.) |
|---|---|---|---|---|
| 1 | Plucking and Pruning CD | 100 | 7 | 700 |
| 2 | Soil Conservation CD | 50 | 4 | 200 |
| | | | Sub-total | 900 |
| | | | Total | 920,495 |

**කලාපීය පර්යේෂණ, උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන හරහා කොටස්කරුවන්ට ප්‍රකාශන බෙදා හැරීම**

ප්‍රාදේශීය පර්යේෂණ, උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන හයක් හරහා ආයතනික ප්‍රකාශන කොටස්කරුවන්ට බෙදා හැරීමේ කටයුතු සිදු කරන ලදී. (වගුව 3).

වගුව 03. ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ප්‍රකාශන බෙදා හැරීමේ සාරාංශය

| | ප්‍රාදේශීය මධ්‍යස්ථානය | වාර්ෂික ප්‍රකාශන | ආයතනික උපදෙස් චක්‍රලේඛ | පොත් | පෝස්ටර | ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය |
|---|---|---|---|---|---|---|
| 1 | පහතරට | 03 | 10 | 429 | 60 | - |
| 2 | මැදරට | 02 | 10 | 85 | - | - |
| 3 | කළුතර | 02 | - | 25 | - | - |
| 4 | ගාල්ල | 02 | 20 | 75 | - | - |
| 5 | දෙනියාය | 02 | - | 50 | - | - |
| 6 | ඌව | 02 | 20 | 140 | - | - |
| | එකතුව | 13 | 60 | 804 | 60 | - |
| | වටිනාකම (රු) | - | 32,000.00 | 1,117,500.00 | 600.00 | - |

වාර්ෂික ප්‍රකාශනවල නොමිලේ නිකුත් කිරීම් හැර, අලෙවි කටයුතු සඳහා කලාපීය මධ්‍යස්ථාන හය අතර බෙදා හරින ලද ප්‍රකාශනවල වටිනාකම රු. 1,150,100.00 කි.

මීට අමතරව, නිර්දේශ (උපදේශක චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ / අනතුරු ඇඟවීමේ සටහන්) විද්‍යුත් මාධ්‍ය හරහා ඉල්ලීම මත පාර්ශවකරුවන්ට, පර්යේෂකයින්ට, ආයතන/ සංවිධානවලට නිකුත් කරන ලදී. තොරතුරු බෙදා ගැනීම, තේ වගාකරුවන්, විශ්ව විද්‍යාල, විදේශීය ආයතන, විද්‍යුත් තැපෑල හරහා ලැබුණු විමසීම් සඳහා විද්‍යුත් තැපෑල, ෆේස්බුක් සහ වෙබ් පිටුව භාවිතා කිරීම අඛණ්ඩව සිදු විය.

1. වාර්ෂික වාර්තා (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ)

ඉහළ වෙළඳපල මිල උච්චාවචනයන් හේතුවෙන් ආයතනයේ වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම අභියෝගාත්මක කාර්යයක් විය. කෙසේ වෙතත්, වසර තුළ ත්‍රිභාෂා භාෂාවෙන් 2019 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම අවසන් කරන ලදී. 2022 මාර්තු 30 දිනැති "පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලයේ කාර්යාලය" විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට අනුව, මුද්‍රිත පිටපත් ප්‍රමාණය අඩු කරන ලද අතර පාර්ලිමේන්තුවට සහ අභ්‍යන්තරයට සහ පාර්ශවකරුවන් අතර ඉදිරිපත් කිරීම සඳහා සීඩී තැටි (මෘදු පිටපත්) ගණන වැඩි කරන ලදී.

වසරේ තුන්වන කාර්තුවේදී 2020 වාර්ෂික වාර්තාව සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණු අතර 2021 වාර්ෂික වාර්තාව තේ පර්යේෂණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සම්පාදනය කර

අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 2021 වාර්ෂික වාර්තාව සමාලෝචනය කිරීමෙන් පසුව අමාත්‍යාංශය විසින් එක් කළ යෝජනා අනුව සංශෝධනය කර ඒ අනුව ඒවා නිවැරදි කරන ලදී.

දෙමළ වාර්ෂික වාර්තාව පරිවර්තනය කිරීම නිලධාරීන්ගේ සහාය ඇතිව උපදේශක සහ ව්‍යාප්ති අංශයේ සම්බන්ධීකාරක ජී එස් ප්‍රදීප් මහතා විසින් සිදු කරන ලදී. ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීමේ මණ්ඩලයේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ඉංග්‍රීසි සහ සිංහල වාර්තා සම්පාදනය කර සංස්කරණය සම්පූර්ණ කරන ලදී.

2. ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව සමාලෝචනය

ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව තේ විද්‍යාවේ සියලුම අංශ ආවරණය වන පරිදි තේ පිළිබඳ වත්මන් පර්යේෂණ ප්‍රකාශයට පත් කරමින් සිටී. සඟරාවේ අන්තර්ගතය සම-සමාලෝචනය කර ඇත. සඟරාව මුද්‍රිත ආකාරයෙන් ප්‍රකාශයට පත් කර තේ කර්මාන්තයේ කොටස්කරුවන්ට නොමිලේ කලාපයක් ලෙස බෙදා හරිනු ලැබේ.

ලිපි සමාලෝචන ක්‍රියාවලිය අවසන් වීමත් සමග 83 වන වෙළුම, 84 වන වෙළුම සහ 85 වන වෙළුම මුද්‍රණ ක්‍රියාවලින් ආරම්භ කරන ලදී. බාහිර විෂය විශේෂඥයින් දහහතර දෙනෙකු විසින් සමාලෝචනය කරන ලද ලිපි නවයෙන්, 83 වන වෙළුමේ (1 සහ 11 කොටස) ප්‍රකාශනය සඳහා ලිපි පහක් අනුමත කරනු ලැබීය.

සම්මන්ත්‍රණ ලේකම් කාර්යාලයේ අවසරය ඇතිව 7 වන වැවිලි බෝග පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා තෝරාගත් ලිපි 84 වන වෙළුමේ (1 සහ 11 කොටස) සහ 85 වන වෙළුමේ (1 සහ 11 කොටස) ඇතුළත් කර ඇත.

86 වන වෙළුම සහ 87 වන වෙළුම සඳහා ලිපි එකොළහක් ලැබුණු අතර සම-සමාලෝචන ක්‍රියාවලිය වසර තුළ සිදු කරන ලදී. ලිපි 11 න් ලිපි නවයක් වෙළුම් දෙක සඳහා අනුමත කරනු ලැබීය.

3. ආයතනික පුවත් ලිපිය යාවත්කාලීන කිරීම (ඉංග්‍රීසි) සහ තේ තතු (සිංහල)

ජුනි සහ දෙසැම්බර් මාසවල වසරකට දෙවරක් ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන වන තේ තතු සහ TRI Update (ඉංග්‍රීසි). තේ කර්මාන්තය, පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම ව්‍යාප්තිය යනාදිය පිළිබඳ යාවත්කාලීන තොරතුරු සපයන ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් ප්‍රවෘත්ති පත්‍ර වර්ගයේ සඟරා දෙක ඒවා විය. ශාක අභිජනන අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය නොයෙල් පියසුන්දර TRI Update සම්බන්ධීකාරක ලෙස දිගටම කටයුතු කළේය. උපදේශන සහ ව්‍යාප්ති අංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී එම්.ඒ.එච්. නිශාන්ති මහත්මිය තේ තතු (සිංහල) ප්‍රවෘත්ති පත්‍රයේ සම්බන්ධීකාරක ලෙස දිගටම කටයුතු කළාය.

"TRI Update" වෙළුම 19 (නිකුතු 1 සහ 2) ප්‍රකාශයට පත් කර ඇති අතර 20 වන වෙළුම (නිකුතු 1 සහ 2) සඳහා ලිපි සමාලෝචනය කර සංස්කරණය කරන ලදී.

තවද, තේ තතු වෙළුම 17 (නිකුතුව 2) සහ 18 වන වෙළුම (නිකුතු 1 සහ 2) සම්බන්ධීකාරක විසින් සමාලෝචනය කර සංස්කරණය කරන ලද අතර මුද්‍රණය ආරම්භ කරන ලදී.

ප්‍රවෘත්ති පත්‍ර දෙකෙහිම සම්බන්ධීකාරකවරුන් ඉදිරි වෙළුම් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඔවුන්ගේ කටයුතු දිගටම කරගෙන ගොස් ඇත.

4. තේ විවරණිකාව
තේ විවරණිකාව යනු තේ අංශයේ වැවිලිකරුවන්ට සහ කුඩා වතු හිමියන්ට ප්‍රයෝජනවත් වන කෙටි හා සරල භාෂාවකින් තේ පිළිබඳ වත්මන් යාවත්කාලීන කිරීම් සපයන වාර්ෂික ප්‍රකාශනයකි. තේ විවරණිකාව හි 29 වන වෙළුම (1 සහ 11 කොටස) මුද්‍රණය කිරීමේ ක්‍රියාවලියේ පැවතුනි.

විවරණිකාව සම්බන්ධීකාරක, උපදේශක සහ ව්‍යාප්ති අංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී එස්.පී. රත්නායක මහතා ඉල්ලා අස්විය.

5. අවවාදාත්මක සටහන්
2022 ජූලි 19 දිනැති "තේ වගාවේ පොහොර භාවිතය පිළිබඳව" නිකුත් කරන ලද සිංහල අවවාදාත්මක සටහනක්.

6. උපදෙස් චක්‍රලේඛ
පාංශු සාරවත් බව කළමනාකරණය සහ ශාක පෝෂණය (SP 11 - තේ වගාවේ තිරසාර ඵලදායිතාවය උදෙසා ශාක පෝෂණය සහ පාංශු සාරවත් බව සුරක්ෂිත කිරීමේ ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමවේදයන්)) නව උපදේශන චක්‍රලේඛයක් 2022 අගෝස්තු මාසයේදී නිකුත් කර ඇත.

ඉදිරි ප්‍රකාශන සහ ප්‍රවර්ධනය
1. ශ්‍රී ලංකාවේ තේ ඉඩම්වල වල් පැළෑටි හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශය
කෘෂි විද්‍යා අංශයේ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් සම්පාදනය කරන ලද පොත නැවත සමාලෝචනය කර කෙටුම්පත් කිරීමට, ජාතික විද්‍යා පදනමේ ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ මහාචාර්ය සිරිල් විජේසුන්දර මහතාට යොමු කරන ලදී. සමාලෝචනය කරන ලද "ශ්‍රී ලංකාවේ තේ ඉඩම්වල වල් පැළෑටි හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශය" පොතේ පළමු සංස්කරණය යාවත්කාලීන කරන ලද අතර පොතේ තාක්ෂණික අන්තර්ගතය වැඩිදියුණු කිරීම සඳහා ඔහුගේ දායකත්වය ලබා දෙන ලදී.

2. ක්ෂේත්‍ර මාර්ගෝපදේශ පොත
ඉංග්‍රීසි ක්ෂේත්‍ර මාර්ගෝපදේශ පොතේ පළමු සංස්කරණය මුද්‍රණය කර වසර තුළ තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනවලට එක් කරන ලදී. පොත සිංහල සහ දෙමළ භාෂාවෙන් ලබා දීමට ආයතනය මූලික පියවර ගෙන ඇත. සිංහල පොත පරිවර්තනය ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී එම්.ඒ.එච්. නිශාන්ති මහත්මිය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර දෙමළ පරිවර්තනය තලවාකැලේ උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ ව්‍යාප්ති නිලධාරී ජී.එස්. ප්‍රදීප් මහතා විසින් සම්බන්ධීකරණය කරන ලදී.

3. "තේ වගාවේ කොම්පෝස්ට් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශය" පිළිබඳ ත්‍රි භාෂා පොත් පිංච
උපදෙස් සහ ව්‍යාප්ති අංශය විසින් "කොම්පෝස්ට් සකස් කිරීමේ මාර්ගෝපදේශය" ත්‍රි භාෂා පොත් පිංච සකස් කරන ලද අතර ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකය මුද්‍රණය සඳහා සහාය ලබා දෙන ලදී. සිංහල පොත් පිංච මුද්‍රණය කිරීම අවසන් කරන ලදී. ඉංග්‍රීසි සහ දෙමළ පළමු සෝදුපත් කියවීම අවසන් කරන ලද අතර වැඩ කටයුතු සිදුවෙමින් පවතී.

4. ප්‍රවර්ධන ද්‍රව්‍ය මුද්‍රණය කිරීම
උපදෙස් සහ ව්‍යාප්ති අංශය විසින් නිර්ත්මාණය කරන ලද ත්‍රි භාෂා ස්ටිකර් ; "පාංශු සංරක්ෂණය" පිළිබඳ කාර් ස්ටිකරයක් සහ සාමාන්‍ය ස්ටිකරය මුද්‍රණය සඳහා ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකය විසින් සහාය ලබා දුන් අතර, මුද්‍රණය සාර්ථකව නිම කරන ලදී.

ආයතනික ප්‍රකාශන සඳහා ISBN අංකය ලබා ගැනීම
ආයතනික ප්‍රකාශන සඳහා ISBN අංක ලබා ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා "ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථානය" වෙබ් අඩවිය සමඟ මාර්ගගත පිවිසුමක් නිර්මාණය කිරීමට ප්‍රකාශන සහ

ප්‍රචාරක ඒකකය විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව මාර්ගගත පිවිසුම ඔස්සේ ආයතනික ප්‍රකාශන 06ක් සඳහා අන්තර්ජාතික පොත් අංකය ලබා ගැනීම සිදු කර ඇත.

කළමනාකරණ තොරතුරු පද්ධතියේ මෙහෙයුම් ආරම්භ කිරීම
ආයතනික මෙහෙයුම් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය ඔස්සේ කටයුතු ආරම්භ කිරීමත් සමඟ, ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකයේ ප්‍රධාන මෙහෙයුම් වන ප්‍රකාශන තොග කළමනාකරණ ක්‍රියාකාරකම්, ප්‍රකාශන තොග සහ විකුණුම් ආශ්‍රිත මෙහෙයුම් ස්වයංක්‍රීය කිරීමට යෝජනා කරන ලදී. ඊළඟ මට්ටමේ මෙහෙයුම් සමඟ ඉදිරියට යාමට අපේක්ෂා කරන ඒකකයේ ප්‍රකාශන තොගය පද්ධතියට යාවත්කාලීන කරන ලදී. පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා සහ 2023 වසරේ පළමු කාර්තුවේදී අත්හදා බැලීමේ අනුවාදය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සේවාදායක තොරතුරු ද සම්පාදනය කරන ලදී.

ආයතනයේ ඡායාරූප එකතුව
අතිරේක අධ්‍යක්ෂවරයාගේ මඟ පෙන්වීම සහ ඡායාරූප ඒකකය, තොරතුරු සහ සන්නිවේදන ඒකකය සමඟ සහ සියලුම පර්යේෂණ අංශ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සහයෝගීතාවයෙන්, 2021 වසර තුළ ඡායාරූප ගබඩාවක් සංවර්ධනය කිරීමට මුලපිරීම් ගෙන ඇති අතර එහි ඡායාරූප එකතුව යාවත්කාකාලීන කිරීම ද දිගටම කරගෙන ගියේය.

පර්යේෂණ සහ සංවර්ධන, අංශ පර්යේෂණ, දින දර්ශන සිදුවීම්, විශේෂ රැස්වීම්, විශේෂ අමුත්තන් එක්රැස් කිරීම සහ කාර්ය මණ්ඩල සමාජ සිදුවීම්වල ඡායාරූප නොවැම්බර් මස අවසානය වන විට සාර්ථකව යාවත්කාලීන කරන ලදී. 2022 වසරේ දින දර්ශනයට අදාළව පවත්වන ලද වැඩසටහන් 16 ට අමතරව, අඛණ්ඩ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු යාවත්කාලීන කිරීම් සමඟ ඡායාරූප 3000 ක් පමණ එකතුවට ඇතුළත් කරන ලදී.

5. ආයතනික ෆේස්බුක් පිටුවේ සහ වෙබ් පිටුවේ යාවත්කාලීන කිරීම්
ඡායාරූපකරණය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ සහාය ඇතිව, ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකය පහත කටයුතුවලට/ වැඩසටහන්වලට අදාළව මුහුණු පොත සහ වෙබ් පිටු සටහන් යාවත්කාලීන කරන ලදී;

1. උඩව කලාපය සඳහා TRI 5000
2. 2021 / 2022 වසර සඳහා තේ පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයින්
3. පහතරට පර්යේෂණ, උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය
4. සංශෝධිත විශ්ලේෂණ සේවා ගාස්තු
5. ජංගම රසායනාගාරයේ කටයුතු ආරම්භ කිරීම
6. තාක්ෂණ හුවමාරු කාර්යාලයේ දැන්වීම
7. ශාක ව්‍යාධි විද්‍යා ක්ෂුද්‍රජීවී රසායනාගාරය විවෘත කිරීම

ඇමතුම් මධ්‍යස්ථානයේ තාක්ෂණික පණිවිඩ: මැදරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය භාර නිලධාරී කහඳව මහතාගේ මඟ පෙන්වීම යටතේ, ආයතනික මුහුණු පිටුවට (FB Page), තේ වගාකරුවන්ට කර්මාන්තයේ වත්මන් ගැටළු සහ ඒ සඳහා පිළියම් පිළිබඳව නිර්මාණය කරන ලද පණිවිඩ යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. සමාජ මාධ්‍ය වේදිකාව හරහා තේ වගාකරුවන් දැනුවත් කිරීම සඳහා භාවිතා කරන ලද පණිවිඩ 22 ක් වසර තුළ දී FB පිටුවට ඔස්සේ බෙදා හැරීම ද සිදු කරන ලදී.

වෙනත් පැවරුම්
ප්‍රකාශන/ප්‍රචාරක නිලධාරී විසින් ආයතනික වාර්ෂික වාර්තා, වෙබ් අඩවිය සහ මුහුණු පොත යාවත්කාලීන කිරීමට අදාළව පෝස්ට් නිර්මාණය කිරීම සහ අන්තර්ගතයන් සැකසීම, ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදී.

ප්‍රකාශන/ප්‍රචාරක නිලධාරිනිය වාර්ෂික ප්‍රකාශන සහ පොත් / පොත් පිංච සහ ස්ටිකර්, උපදේශන චක්‍රලේඛ ෆෝල්ඩර සහ ලිපි ද්‍රව්‍ය ගබඩා මුද්‍රණය කිරීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකාවක් ලෙස සිය සේවය ලබා දෙන ලදී.

2022 දෙසැම්බර් 31 වන දින සිට ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරී එන්. ඒකනායක මහතා විශ්‍රාම යාම හේතුවෙන්, ප්‍රකාශන සහ ප්‍රචාරක නිලධාරිනිය විසින් ඡායා පිටපත් යන්ත්‍ර ඒකකයේ කටයුතු සහ එන්. ඒකනායක මහතා විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා පොත් භාර ගන්නා ලදී.

අධ්‍යයන වැඩසටහන්

ප්‍රකාශන සහ ප්‍රචාරක නිලධාරිනි ඩබ්ලිව්. එච්. ටී. සී. සිල්වා, කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයනය සම්පූර්ණ කළාය.

ප්‍රකාශන සහ ප්‍රචාරක නිලධාරිනිය ඩබ්ලිව්. එච්. ටී. සී. සිල්වා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයේ, පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව සම්පූර්ණ කළාය.

# තාක්ෂණ හුවමාරු කාර්යාලය

තාක්ෂණ හුවමාරු කාර්යාලය අථත්‍ය කාර්යාලයක් ලෙස වුවද සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

කාර්ය මණ්ඩල වෙනස්වීම්
තාක්ෂණ හුවමාරු කාර්යාලයේ සහකාර ලෙස සේවය කළ උපදේශක සහ ව්‍යාප්ති අංශයේ උපදේශක නිලධාරී, ඒ ආර් එම් ඒ එම් රත්නායක මහත්මිය 2022 දෙසැම්බර් 20 වන දින සිට තනතුරෙන් ඉල්ලා අස් වූ අතර, ඒ සඳහා ආචාර්ය එච් එම් සී ජී පිලපීය මෙනෙවිය, 2022 දෙසැම්බර් 21 වන දින සිට රාජකාරි භාර ගන්නා ලදී.

බුද්ධිමය දේපළ තහවුරු කර ගැනීමේ අයදුම්පත් ගොනු කරන ලදී
2022 තුළ, කලින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර අයදුම්පත් දෙකකට සංශෝධන ඉදිරිපත් කරන ලදී;
1. තේ වියළීම සඳහා ගණිතමය ආකෘතිය පදනම් කරගත් පාලන පද්ධතිය
2. ට්‍රයිකොඩර්මා ඇස්පෙරෙලම් තේ රෝග කළමනාකරණය සහ ශාක වර්ධනය වැඩි දියුණු කිරීම සඳහා සකස් කිරීමේ ක්‍රමය සහ යෙදුම් ක්‍රමය

නවෝත්පාදන වාණිජකරණය
තේ වයින් නිෂ්පාදන ක්‍රියාවලිය (පේටන්ට් අංක 13621) වාණිජකරණය කිරීම සඳහා උනන්දුව ප්‍රකාශ කිරීම (EOI) ඉල්ලා සිටි අතර ඇගයීම් මාලාවකින් පසුව ජාත්‍යන්තර ඩිස්ටිලර්ස් සමාගම විභවතාවයක් ඇති වාණිජ හවුල්කරු ලෙස හඳුනාගෙන ඇත. 2023 මුල් භාගයේදී ගිවිසුම අත්සන් කෙරෙනු ඇත.

ආයතනයේ බුද්ධිමය දේපළ ප්‍රතිපත්තිය
තේ පර්යේෂණ මණ්ඩලය විසින් තාවකාලිකව අනුමත කරන ලද ආයතනික ප්‍රතිපත්තිය සහ හෙළිදරව් කිරීමේ පෝරමය ක්‍රියාත්මක කිරීමට පෙර තේ පර්යේෂණ ආයතන කාර්ය මණ්ඩලය අතර බෙදා හැර ඇත.

අනෙකුත් ක්‍රියාකාරකම්
ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් සංවිධානය කරන ලද නවෝත්පාදන පරිසර සක්‍රීය කිරීමේ වැඩසටහන යටතේ සංවිධානය කරන ලද දුරස්ථ උපදේශන වැඩසටහනේ සිව්වන වටය 2021 ඔක්තෝබර් 27 වන දින ආරම්භ වූ අතර එය 2022 මාර්තු 8 වන දින දක්වා සෙන්ගිස් ටර්හාන් මහතාගේ උපදේශකත්වයෙන් පැවති අතර කුළුබඩු සහිත තේ සෝස් සහ සකස් කිරීමේ ක්‍රමය යන මාතෘකාව යටතේ වැඩසටහන සඳහා එක් තාක්ෂණයක් තෝරා ගන්නා ලදී.

## තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



# පහතරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය - රත්නපුර

**එම්. ඒ. විජේරත්න**
**කෘෂි විද්‍යා උපාධි (රුහුණ, ශ්‍රී ලංකාව)**
**පශ්චාත් උපාධි (ලන්ඩන්)**

**ප්‍රධානී**

රජයේ විශේෂ වැඩසටහනට අනුව යමින් කාර්යාල හා නේවාසිකාගාර පරිශ්‍රවල හා නිල නිවාස ගෙවතුවල අල වර්ග හා එළවළු වැනි ආහාර බෝග වගාකිරීමේ වැඩසටහන් දියත්කරන ලදී. තේ තවාන් ස්ථාපනය සඳහා සුදුසු ඉඩමක් පරීක්ෂා කිරීම පිණිස ගරු රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මැතිතුමන් 18.03.2022 දින පහතරට මධ්‍යස්ථානයේ චාරිකාවක නියැළිණි. තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති, තේ පර්යේෂණායතන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ-පර්යේෂණ (නිෂ්පාදන) හා අංශ ප්‍රධානීන් ගේ සහභාගිත්වයෙන් තේ පර්යේෂණායතනයේ ජංගම විද්‍යාගාරය ගරු වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමන් අතින් පහතරට මධ්‍යස්ථානයේ දී 09.09.2022 දින විවෘත කරන ලදී.

**කාර්ය මණ්ඩලයේ වෙනස් වීම්**
විදුලි කාර්මික ටී.එම්.පී.ඩබ්.ජයවීර මහතා 2022.03.10. දින තලවාකැලේ සිට රත්නපුරයටත්, ඉංජිනේරු සහකාර (විදුලි) එස්.එච්.පී.දයාරත්න මහතා 2022.03.10 දින සිට තලවකැලේ ප්‍රධාන කාර්යාලයටත් ස්ථානමාරු ලැබිය. තාක්ෂණ අංශයේ තාක්ෂණ නිලධාරී ඒ.සී.එල්. කොඩිතුවක්කු මහතා 2022.05.23 දින ප්‍රධාන කාර්යාලයේ සිට රත්නපුරයටත් එ ලෙසින්ම තාක්ෂණ නිළධාරී එම්.කේ.ඩි.දමයන්ති මිය ද 2022.12.12 දිනදී ස්ථාන මාරු ලැබිය. ව්‍යාප්ති නිළධාරී පී.වෙත්තසිංහ මිය 2022.12.12 දින රත්නපුර සිට ගාල්ල මධ්‍යස්ථානයටත් තාක්ෂණ අංශයේ තාක්ෂණ නිළධාරී ඩබ්.එම්.සත්සරණී මිය 2022.12.19 දින ප්‍රධාන කාර්යාලයේ සිට රත්නපුරයටත් ස්ථාන මාරු ලැබීය. පොදු සේවක පී.පී.චන්ද්‍රකීර්ති මහතා 2022.12.31 දින සිට සේවයෙන් විශ්‍රාම ලැබීය.

**පර්යේෂණ, උපදෙස් හා ව්‍යාප්ති කටයුතු**
ශෂ්‍ය විද්‍යා, ශාක අභිජනන, කීට/වටපණු විද්‍යා සහ පිරිසැකසුම් තාක්ෂණ අංශවල ක්ෂේත්‍ර හා විද්‍යාගාර පර්යේෂණ තවදුරටත් සිදුකරමින් පවතී. එවැනි පර්යේෂණ 49 කට වඩා වැඩි ගණනක් ඇත. දැනට නඩත්තුකරන බීජ උයන් 9 ට අමතරව තවත් නව බීජ උයන් 10 ක් ශාක අභිජනන අංශය විසින් පහතරට වතුවල ස්ථාපනය කරන ලදි. අදාල පර්යේෂණ ව්‍යාපෘති යටතේ ඒ පිළිබඳව වැඩි විස්තර වාර්තාකර ඇත.

උපදෙස් හා ව්‍යාප්ති නිලධාරීන් මහ වතු අංශයේ හා කුඩා තේ වතුවල උපදේශන චාරිකා 82 ක් හා පුහුණු වැඩමුළු 8 ක් පවත්වන ලදි. ඔවුන් ගොවි කේන්ද්‍රීය ජෛව-කාබනික පර්යේෂණ 13 ක් හා T1230 පෙහොර මිශ්‍රණ යෙදූ ක්ෂේත්‍ර 8 ක් නිරීක්ෂණය කරන ලදී. තේ මණ්ඩලයේ විශේෂ වැඩසටහනක් යටතේ පහතරට කලාපයේ ආරම්භ කළ තේ තවාන් 27 ක්ද ඔවුන්ගේ නිරීක්ෂණයට ලක්විය. මහ වතු අංශයෙන්, මධ්‍යම ප්‍රමාණයේ වතුවලින් හා කුඩා තේ වතුවලින් පැමිණි තේ වගාකරුවන් 160 කට වැඩි ගණනක් පැමිණ උපදෙස් ලබාගෙන ඇත.

පිරිසැකසුම් තාක්ෂණ අංශයේ නිලධාරීන් තේ කර්මාන්තශාලා 23 ක චාරිකා කරමින් තේ නිෂ්පාදනය හා යන්ත්‍ර සූත්‍ර වල ගැටලු නිරාකරණය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති අතර තවත් පුහුණු වැඩසටහන් 24 ක් පවත්වා ඇත. පර්යේෂණ නිළධාරී එම්.ඒ.චාමින්ද මයා කර්මාන්තශාලා සඳහා යන්ත්‍ර මිල දී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත.

රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක නියෝජනය කරන කුඩා තේ වතු අංශය සඳහා ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසද දෙකක් 2022.03.29 හා 2022.12.13 යන දෙදින තුළ පහතරට මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. රත්නපුර, කෑගල්ල හා කලුතර දිස්ත්‍රික්ක නියෝජනය කරන මහ වතු අංශය සඳහා වන ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණය 2022.07.12 වන දින මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. සිංහල මාධ්‍යයෙන් කුඩා තේ වතු අංශය සඳහා වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය 2022.09.09 දින පහතරට මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ආදර්ශ තේ ගොවින්ගේ නිෂ්පාදිතාව ඉහළ නැංවීමේ අරමුණින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමග එක්ව සම්මන්ත්‍රණයක්

පවත්වන ලදී. බලංගොඩ වැවිලි සමාගමේ නිලධාරීන් සඳහා තේ අස්වනු නෙළීම පිළිබඳව සම්මන්ත්‍රණයක් 2022.04.26 දින පවත්වන ලදී. ගාල්ල මධ්‍යස්ථානයේදී 2022.11.9 දින පවත්වන ලද බෝග සායනයට පහතරට මධ්‍යස්ථාන නිලධාරීන් සහභාගිත්වය ලබාදුනි.

උපදෙස් හා ව්‍යාප්ති නිලධාරීන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුහුණුවන්නන් සහ විවෘත විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 2 ක් පිලිවෙලින් 2022.11.17-18 සහ 2022.12.02 තෙදින තුල පවත්වන ලදී. පහතරට මධ්‍යස්ථානයේ නිළධාරීන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එක්ව පවත්වන ලද "සහකම්පනය" වැඩසටහන් මාලාවට දායකත්වය සපයන ලදී. 2022.07.26 දින ශෂ්‍ය විද්‍යා අංශය විසින් මස්කෙලිය වැවිලි සමාගමේ නිළධාරීනට යාන්ත්‍රික දලු නෙළීම පිළිබද ක්ෂේත්‍ර පුහුණු වැඩමුළුවක් තලවකැලේහිදී පවත්වන ලදී. එවැනි තවත් වැඩමුළුවක් කොටගල වැවිලි සමාගම වෙනුවෙන් රයිගම වත්තේදී 2022.09.28 දින පවත්වන ලදී. ශෂ්‍ය විද්‍යා අංශය විසින් පන්විලතැන්න ඔරේන්ජ් ෆීල්ඩ් කර්මාන්තශාලාවේ දලු සැපයුම්කරුවන්ට දලු කතුරු භාවිතය පිලිබදව පුහුණු වැඩසටහනක් 2022.12.14 දින පවත්වන ලදී. අමතරව ශෂ්‍ය විද්‍යා අංශය විසින් ජල සම්පාදනය පිලිබද පුහුණු සැසි පවත්වා ඇත. STaRR ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් කිහිපයක් පහතරට මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, STaRR ව්‍යාපෘතිය හා තක්සේරු දෙපාර්තමේන්තුව විවිධ වැඩමුළු සඳහා පහතරට මධ්‍යස්ථානයේ සම්මන්ත්‍රණ ශාලා පහසුකම් භාවිතාකරන ලදී.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා පහතරට මධ්‍යස්ථ ප්‍රධානී තනතුරට අමතරව ශෂ්‍ය විද්‍යා අංශයේ අංශ ප්‍රධානී ලෙසින් තවදුරටත් කටයුතු කරයි. ඔහු තේ පර්යේෂණායතනයේ පර්යේෂණ උපදේශන කමිටුවේ කැඳවුම්කරු/ලේකම් ලෙසින් කමිටු රැස්වීම් 4 ක් සංවිධානය කර ඇත. ආචාර්ය එම් ඒ විජේරත්න මහතා පේරාදෙණිය පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ බෝග විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසින් හා රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙසින්ද සේවා සපයයි. තව ද ඔහු ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා පත් කළ කමිටුවේ සාමාජිකයෙකු ලෙසින්ද දායකත්වය සපයා ඇත. ඔහු ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ කමිටු සාමාජිකයෙකු ලෙස 2022.02.23 දින පැවති රැස්වීමට මාර්ග ගත ක්‍රමය ඔස්සේ සහභාගි විය. මීට අමතරව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම්වලට ද ආයතනය නියෝජනය කරමින් සහභාගී විය. රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨය 2022.12.05 දින පවත්වන ලද සම්මන්ත්‍රණයේ ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. ඔහු 2022.12.19 දින කොළඹ පැවති තේ ප්‍රතිපත්තිය සකස් කිරිමේ වැඩමුළුවට ද සහභාගී විය.

**විශ්ලේෂණ කටයුතු හා අනෙක් සේවා**

ශෂ්‍ය විද්‍යා අංශයේ හා STaRR ව්‍යාපෘතියේ නිලධාරීන් පහතරට කුඩා තේ වතුවලින් ලබාගත් පස් සාම්පල 2820 කට වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කර පාංශු තත්ව දර්ශක වාර්තා සපයා ඇත. මේ සඳහා ශෂ්‍ය විද්‍යා අංශයේ නිළධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබාදුනි. වටපණු විද්‍යා අංශයේ නිලධාරීන් සාම්පල 141 ක් පරීක්ෂාකර වාර්තා ලබාදී ඇත. පාංශු හා ශාක පෝෂක අංශය මගින් පස් සාම්පල් 1002 ක් රසායනික පොහොර සාම්පල් 77 ක් සහ කාබනික පොහොර සාම්පල 24 ක් විශ්ලේෂණය කර වාර්තා ලබා දී ඇත. මීට අමතරව පිරිසැකසුම් තාක්ෂණ අංශය මගින් කර්මාන්තශාලාවල උපකරණ ක්‍රමාංකනය හා පිරිසැකසුම් තාක්ෂණයට අදාල ගැටලු නිරාකරණය පිණිස උපදෙස් ලබා දී ඇත.

**මානව සම්පත් සංවර්ධනය හා පුහුණු කිරීම**

ජ්‍යෂ්ඨ උපදෙස් නිලධාරි ටී.ජී.එන් මහින්ද මහතා සබරගමුව විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වැඩ කටයුතු ආරම්භ කල අතර ජ්‍යෂ්ඨ උපදෙස් නිලධාරි ජානක මහින්දපාල මහතා පහතරට මධ්‍යස්ථානයේ රාජකාරීවල නියැලෙමින් තම පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල තවදුරටත් නියැලිනි.

**වෙනත් විවිධ කටයුතු**

පහතරට මධ්‍යස්ථානයේ නිළධාරීන් තේ පර්යේෂණ ආයතනයේ සහ වෙනත් බාහිර ආයතන වල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස කටයුතු කර ඇත. මහා භාණ්ඩාගාරයේ විශේෂ අරමුදල් වලින් ක්‍රියාත්මක වන ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවේ වැඩිදියුණු කිරිමේ වැඩ කටයුතු නිමා වෙමින් පැවතිනි.

ශෂ්‍ය විද්‍යා අංශය මගින් ක්‍රියාවට නංවන ලද ස්වයංක්‍රීය තෝරා දලු නෙලන යන්ත්‍ර නිර්මාණය කර හඳුන්වා දිමේ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර 9 ක් පවත්වා ඇත. ආචාර්ය එම් ඒ විජේරත්න මහතා සහ ආචාර්ය සම්පත් පතිරණගේ මහතා එක්ව නිර්මාණකරුවන් නිමවන ලද යන්ත්‍ර ආකෘති පහතරට මධ්‍යස්ථානයේ දී හා තලවකැලේ දී පරික්ෂාකර බලා අවශ්‍ය උපදෙස් ලබා දුනි.

ශාන්ත ජෝකිම් වත්තේ වගා කරන ලද හෙක්ටයාර් දෙකක CO3 තෘණ වගාව ශෂ්‍ය විද්‍යා අංශය මගින් නඩත්තු කර කුඩා තේ වතු වලට හා STaRR ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට රෝපණ ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරන ලදි. මිට අමතරව ඩෙරිස් සෙවණ ශාක තවාන්පැළ සකස්කර තේ වගාකරුවන්ට ලබාදීමටද කටයුතු කර ඇත. ශාක අභිජනන අංශය මගින් ශාන්ත ජෝකිම් වත්තේ සහ වෙනත් පහතරට වතුවල බීජ උයන් හා මව් ශාක වගාවන් ස්ථාපනය හා නඩත්තු කිරිම සිදුකරන ලදී. එම අංශය මගින් වැඩි දියුණු කල තේ බීජ වගාකරුවන්ට සපයාදීමට ද කටයුතු කරන ලදී.

## ගොඩනැගිලි හා යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

### ගොඩනැගිලි හා පරිශ්‍ර

ආගන්තුක නිවාසයේ කාමර 3ක නාන කාමර අලුත්වැඩියා කර එම කාමර වල බිම තීන්ත ආලේප කරන ලදී. එහි තිබූ තවත් නඩත්තු හා සුළු අලුත්වැඩියා කටයුතු 2022.09.09 දිනට යෙදී තිබූ ජංගම විද්‍යාගාරය විවෘත කිරිමේ උත්සවයට ප්‍රථම නිමා කරන ලදී. B2 සහ C7 නිවාසවල වහල වැහිපීලි වඩිම්බු සහ සිවිලිම්වල අලුත් වැඩියා කටයුතු ද හරිතාගාරයේ සහ ශෂ්‍ය විද්‍යා අංශයේ ක්ෂේත්‍ර කාර්යාලයේ වහල අලුත්වැඩියා කටයුතුද සිදු කරන ලදී, සම්මන්ත්‍රණ ශාලාවේ ලී ඇතුරූ පොලවෙහි වේයන් කාදමන ලද කොටස් සහ තෙරතුරු ඒකකයේ සිවිලිම් කොටස අලුත් වැඩියා කරන ලදී, ආගන්තුක නිවාසයේ රියදුරු කාමරයේ දොරට වීදුරු යොදා සකස්කර තීන්ත පින්තාරු කරන ලදී. D8 නිවාසයේ වහලය, මුළුතැන්ගෙය සහ කානු පද්ධතිය පිලිසකර කරන ලදී. ස්ථිර වහලයක් හා කෘතිම සෙවණ දැල් සවිකර වගා ආදර්ශන කොටසේ පිහිටි තවාන් කාමරය අලුත්වැඩියා කරන ලදී. ඩෙංගු මර්දන සතිය තුල මහජන සෞඛ්‍ය පරික්ෂකගේ උපදෙස් අනුව කාර්යාල හා ගොඩනැගිලි පරිශ්‍ර පිරිසිදු කර මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. එනමුදු තණකොල කැපීම හා වල් ඉවත් කිරිම යන්ත්‍රවලට අවශ්‍ය ඉන්ධන නොලැබීම හේතුවෙන් සම්පූර්ණයෙන් නිම කිරිම ට නොහැකි විය. ශාක අභිජනන අංශයේ තවානෙහි වැලි පාත්ති සහ කාණු අලුත්වැඩියා කරන ලදී. ක්‍රීඩා සමාජ ශාලාවේ සහ අනෙක් ගොඩනැගිලිවල අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු ද සිදු කරන ලදී.

### විදුලි සැපයුම් හා නඩත්තු කටයුතු

ශාන්ත ජෝකිම් තේ කර්මාන්තශාලාවේ විදුලි ජනක යන්ත්‍රයේ හා Capacitor Bank වල සේවා කටයුතු සිදුකර අලුතින් ස්ථානගත කල මෝටර සඳහා විදුලි සැපයුම් ලබා දුනි. ජල පොම්ප නැවත එතීම, කර්මාන්තශාලාවේ ජල විසිරුම් පද්ධතිය, ගිනිගෙන හානිවූ තේ වියලනයේ අලුත්වැඩියාවන් සහ වතු අධිකාරී නිල නිවාසයේ හා තොරතුරු ඒකකයේ විදුලි සැපයුම්වලට අදාල අලුත්වැඩියාවන් නිම කරන ලදී. පරිපාලන අංශයේ වායු සමිකරණ යන්ත්‍ර 3 ක් අලුත්වැඩියා කරන ලදී. ශෂ්‍ය විද්‍යා අංශයේ විෂ දුම් කැබිනෙට්ටුවේ මෝටරය හා සුලං පෙත්ත අලුත්වැඩියා කර නැවත සවි කරන ලදී. C1 නිවාසයේ සහ ආගන්තුක නිවාසයේ නාන කාමරවල විදුලි සැපයුම් වලට අදාල අලුත්වැඩියාවන්, එහි රූපවාහිනියේ යන්ත්‍රයේ සහ සීතකරණයේ අලුත්වැඩියාවන් නිමකරන ලදී. පැරණි බල්බ වෙනුවට නව (LED) බල්බ සවිකර ආගන්තුක නිවාසයේ විදුලි පාරිභෝජනය අඩුකිරිමට කටයුතු යොදා ඇත. දේශන ශාලාවේ ප්‍රක්ෂේපන යන්ත්‍රය සිවිලිමෙහි සවිකර නව විදුලි සැපයුමක් ලබා දෙන ලදී. ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවේ සහ වතු කාර්යාලයේත් ක්‍රීඩා සමාජ ශාලාවේ සහ නේවාසිකාගාරයේ විදුලි සැපයුමට අදාල අනෙකුත් අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සිදු කරන ලදී. දේශන ශාලාවේ විදුලි ජනක යන්ත්‍රයේ පැවති දෝෂ නිවැරදි කර නව බැටරි ආරෝපනයක් සවිකරන ලදී.

### ප්‍රවාහන කටයුතු

පාසල් බස් රථයේ සීට් අලුත් වැඩියා කර බසය පින්තාරු කරන ලදී. මෙම කාලය තුල හන්තාන මධ්‍යස්ථානයේ බස් රථය ලබාගෙන පාසල් ළමුනට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබාදුනි. ජංගම විද්‍යාගාර බස් රථය සහ ශාන්ත කූම්බ්ස් ලොරි රථය පහතරට මධ්‍යස්ථානයේ තාවකාලිකව ස්ථානගත කරන ලදී.

මුදල් ප්‍රතිපාදනවලට අනුකූලව කාර්යාලයට අයත් වාහන වල අලුත්වැඩියා හා සේවා කටයුතු හැකි මට්ටමින් සිදු කරන ලදී.

**ආධුනිකයින් පුහුණු කිරීම**
රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨ උපාධි අපේක්ෂකයෙකු පුහුණු කටයුතු නිම කරන ලදී.

**ආරක්ෂක සේවය**
ආරක්ෂක සේවා සැපයුම ලබාදුන් J & T Security and Investigation Services සමාගමේ සේවාවන් දුර්වල මට්ටමක පැවති හෙයින් එම සේවය 2022.8.01 දින සිට ගොල්ඩන් හාර්ට් ආයතනයට පවරන ලදී.

**කාලගුණය**
මෙම වසරේ මුළු වර්ෂාපතනය මි.මි. 4776.5ක් වූ අතර එය පසුගිය දශකයේ සාමාන්‍යයට වඩා මි.මි. 850.3ක වැඩිවීමකි. වාර්ෂික මුළු වැසි දින ගණන 181 ක් විය. මැයි සහ ඔක්තෝම්බර් මාසවල අධික වර්ෂාපතනයක් (පිලිවෙලින් මි.මි.851.8 සහ 887.6ක්) වාර්තා විය. ජූලි සහ සැප්තැම්බර් මාස වල ඉතා අඩු වර්ෂාපතනයක් ලැබී ඇත. මැයි,අගෝස්තු හා ඔක්තෝම්බර්-දෙසැම්බර් මාසවල වර්ෂාපතනය පසුගිය දශකය හා සසඳන විට පහල අගයක් ගෙන ඇත

ජනවාරි හා පෙබරවාරි මාසවල උෂ්ණත්වය පසුගිය දශකය හා සසඳන විට වැඩි අගයක් ගනී. එනමුදු දෙසැම්බර් මාසයේ උෂ්ණත්වය පහත් අගයක පැවතිනි.

# මැදරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය


**කේ. ආර්. ඩබ්ලිව්. බී. කහඳව**
**කෘෂිකර්ම විද්‍යාවේදී (පේරාදෙණිය, ශ්‍රී ලංකාව),**
**විද්‍යාපති (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)**

**ස්ථාන භාර නිලධාරී**


තේ පර්යේෂණ ආයතනයේ මැදරට පර්යේෂණ, උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, මහනුවර හන්තාන මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවලත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටසකත් පිහිටි තේ වගාවන් සඳහා ආයතනයේ පර්යේෂණ උපදෙස් හා ව්‍යාප්ති වැඩහටහන් ක්‍රියාත්මක කරමින් සේවා සපයයි. මෙම ආයතනයේ සේවාවන් රාජ්‍ය අංශයේ වතු 37කට, ප්‍රාදේශීය වැවිලි සමාගම් වතු 23කට, මධ්‍යම පරිමාණ වතු 200 කට පමණ සහ 33,000 පමණ වූ කුඩා තේ වතු හිමියන්හටත් සැපයෙයි. මධ්‍යස්ථානයේ පර්යේෂණ කටයුතු පාංශු හා ශාක පෝෂණ, ශෂ්‍ය විද්‍යා, කීට විද්‍යා හා වටපණු විද්‍යා සහ ශාක අභිජනන විෂයයන් සමඟ උපදෙස් හා ව්‍යාප්ති අංශවලට අදාළව ක්‍රියාත්මක කෙරේ. කෘෂි ආර්ථික ඒකකයක් ද මෙහි පිහිටුවා ඇති අතර රෝපණ ද්‍රව්‍ය බෙදා දීම, පර්යේෂණ අත්හදාබැලීම්, ආදර්ශන සහ පුහුණු අවශ්‍යතා සඳහා ක්ෂේත්‍රයක් ද පවත්වාගෙන යනු ලැබේ. රටේ පැවති තත්වය මත විවිධ බාධාවන් මධ්‍යයේ වුව ද මෙම වර්ෂයේ ද මධ්‍යස්ථානය විසින් විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් ගණනාවක් පාර්ශවකරුවන් සඳහා මෙහෙයවන ලදී.

| **භූමි උපයෝගීතා රටාව** | **වපසරිය (හෙක්ටයාර)** |
|---|---|
| බීජ තේ | 1.50 |
| රිකිලි තේ | 5.00 |
| රිකිලි තේ නැවත වගාව | 1.00 |
| නොමේරූ තේ | 2.50 |
| මව් ශාක | 2.75 |
| තවාන | 0.20 |
| මානා තෘණ වගාව | 1.50 |
| පලතුරු ශාක | 0.40 |
| පොල් | 0.81 |
| වන වගාව | 1.20 |
| වගුරු බිම් | 0.62 |
| ගොඩනැගිලි, ගෙවතු මං මාවත් | 5.77 |
| **එකතුව** | **23.25** |

**කාර්ය මණ්ඩල වෙනස් වීම්.**

01. 2022 දෙසැම්බර් 31 දින සිට පර්යේෂණ නිලධාරී, ඩබ්ලිව්.එම්.එස් විජයතුංග මහතා සේවයෙන් විශ්‍රාම ලැබීය.
02. 2022 දෙසැම්බර් 12 දින සිට තාක්ෂණික නිලධාරිනී ඩී.ආර්.ගමගේ මිය ප්‍රධාන කාර්යාලයේ සිට තේ පර්යේෂණ ආයතනයේ මැදරට මධ්‍යස්ථානය වෙත ස්ථාන මාරු ලැබීය.
03. 2022 දෙසැම්බර් 15 දින සිට තාක්ෂණික නිලධාරිනී එච්.එම්.එම්.එච් ජයරත්න මෙනවිය ප්‍රධාන කාර්යාලයේ සිට තේ පර්යේෂණ ආයතනයේ මැදරට මධ්‍යස්ථානය වෙත ස්ථාන මාරු ලැබීය.

**උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන්**

2022 වර්ෂය තුළ දී පුහුණු සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගණනාවක් මහ වතු හා කුඩා තේ වතු අංශ සඳහා සහ උසස් අධ්‍යාපන සිසුන් සඳහා මෙහෙයවන ලදී. ඒ අතර දළු නෙලීම සම්බන්ධයෙන් පැවති අතුරු ව්‍යාප්ති වැඩසටහන් දෙකක් ඇල්කඩුව,රත්වත්ත,හුණුගල සහ පිටකන්ද වතුවල තෝරාගත් සේවකයන් සඳහා, ඇල්කඩුව වැවිලි සමාගමේ තේ වගාකරන සියලු වතුවල ක්ෂේත්‍ර කාර්යමණ්ඩල සහභාගිත්වය ඇතිව පවත්වන ලදී. තව ද, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ

සභාපතිතුමා සහ සියලු වතුවල විධායක කාර්යමණ්ඩලය සඳහා කප්පාදුව, දළු නෙලීම සහ තේ නැවත වගාව පිලිබඳ පුහුණු වැඩසටහනක් 2022 මාර්තු මස පවත්වන ලදී. එසේම දම්රෝ ව්‍යාපාර සමූහය යටතේ ඇති පුස්සැල්ලාව වැවිලි සමාගමේ සියලු වතු සහ අගලවත්ත වැවිලි සමාගමේ උඩරට වතු තුනක සහකාර කළමනාකාරවරුන් සඳහා කෘෂිකාර්මික පිලිවෙත් පිලිබඳ පුහුණු වැඩසටහන් දෙකක් වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී පවත්වන ලදී. ඇල්කඩුව වැවිලි සමාගමේ වතු 6ක ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකළ අතර, වතුවල අස්වැන්න අඩු වීම පිලිබඳ විශ්ලේෂණාන් සිදුකර සමාගමේ සභාපතිතුමා සහ කළමනාකාරිත්වය වෙත එහි වාර්තාව ඉදිරිපත් කිරීම ද උපදෙස් හා ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරුණි. උපදේශක නිලධාරී විසින් තේ වගාවේ කෘෂිකාර්මික ක්‍රියා යාන්ත්‍රීකරණය කිරීම පිලිබඳ හන්තාන කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානයේ දී මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් 7 ක් සඳහා දේශන ඉදිරිපත් කරමින් සහභාගි විය. මෙම වැඩ සටහන්මාලාව කුඩා තේ වතු හිමියන් අතරින් තෝරා ගත් තරුණ ව්‍යවසායකයන් කණ්ඩායමක් ඉලක්ක කරගෙන සංවිධානය කෙරුණු අතර වසරේ පළමු සහ අවසන් කාර්තුවල දී මෙම වැඩහන් පවත්වන ලදී. "රටේ පවතින තත්වය තුළ තේ නිෂ්පාදන ගුණාත්මය පවත්වා ගැනීම" යන මැයෙන් තේ කම්හල් හිමියන් සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා පැවති වැඩසටහන් දෙකක දී උපදේශක නිලධාරී විසින් ඉදිරිපත් කිරීම් දෙකක් පවත්වන ලද අතර මෙම වැඩසටහන් දෙක කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. ප්‍රාදේශීය තාක්‍ෂණික හා ව්‍යාප්ති සංසදයේ රැස්වීම් දෙකක් මධ්‍යස්ථානය විසින් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකරු, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරීන් සඳහා පවත්වන ලදී. මෙහි දී විවිධ මාතෘකා හතරක් පිලිබඳ සාකච්ඡා කෙරුණු අතර, පර්යේෂණ අංශවල නිලධාරීන් මෙම ප්‍රාදේශීය තාක්‍ෂණික හා ව්‍යාප්ති සංසද රැස්වීම් සඳහා දේශන ඉදිරිපත් කරන ලදී.

වසරේ අවසන් කාර්තුවේ දී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කළ දළු ගුණාත්මය සඳහා සහකම්පනය නම් වැඩසටහන් මාලාව සඳහා "කළු තේ නිෂ්පාදනයේ දී ගුණාත්මය පවත්වා ගැනීම" පිලිබඳ දේශන ඉදිරිපත් කරමින් උපදේශක නිලධාරී විසින් සහභාගිත්වය දක්වන ලදී.

තේ පර්යේෂණ ආයතනයේ "කෙටි පණිවිඩ සේවා ද්වාරය" තේ වගාකරුවන් දැනුවත් කිරීම සඳහා කාර්ය මණ්ඩලය විසින් පවත්වාගෙන යන ලදී. ඩයලොග් ගොවි මිතුරු පණිවුඩ සේවාව සඳහා තාක්‍ෂණ අන්තර්ගතය සංස්කරණය කිරීම ද අංශයේ නිලධාරීන් අතින් සිදු විය. මීට අමතරව තේ පර්යේෂණ ආයතනයේ තාක්‍ෂණ තොරතුරු සහ උපදෙස් සේවාව (තේ.ප.ආ ඇමතුම් මධ්‍යස්ථානය) විවිධ ආකාරයේ සේවාලාභීන්ගේ ඇමතුම් සඳහා පිළිතුරු දෙමින් අංශයේ නිලධාරී මඩුල්ල විසින් සාර්ථකව පවත්වාගෙන යන ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය දියත් කළ ගොවි කේන්ද්‍රීය කාබනික පොහොර අත්හදා බැලීම්වල දත්ත එකතු කිරීම, උපදේශක නිලධාරී සහ ව්‍යාප්ති නිලධාරීන් විසින් සිදු කල අතර දත්ත විශ්ලේෂණය සඳහා එම දත්ත ප්‍රධාන කාර්යාලය වෙත භාර දෙන ලදී. එමෙන් ම, කුඩා තේ වතු හිමියන් අතර T1240 පොහොර භාවිතය පිලිබඳ දත්ත එකතු කිරීම සඳහා ද එම කාර්ය මණ්ඩලය සහභාගි විය. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය විසින් අවශ්‍ය පරිදි, පර්යේෂණ අංශවල ද සහභාගිත්වය ඇතිව ඉහත සියලු වැඩසටහන් සම්බන්ධීකරණය කර පවත්වන අතර ම, මහා වතු සහ කුඩා තේ වතු සඳහා සිදු කරන වගා ගැටළු පිළිබඳ උපදේශන චාරිකා 36 ක් සිදු කර අදාල වාර්තා වැවිලි සමාගම් වතු, රජය සතු වතු, මධ්‍යම පරිමාණ වතු සහ කුඩා තේ වතු හිමියන් වෙත ලබා දෙනු ලැබුවේ වසරේ මාස කිහිපයක ම, රටේ පැවති තත්වය මත ඇති වූ ප්‍රවාහන ගැටළු ආදිය මධ්‍යයේය.

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය මහනුවර සහස් උයන සංකීර්ණයේ පැවති "අහරට උළෙලක්" තෙදින ප්‍රදර්ශනයට ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් සහභාගි විය. මහනුවර මහ නගර සභාව සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කර තිබුණි.

**ශාක විද්‍යා අංශය**

A 34 ව්‍යාපෘතිය යටතේ ඇල්කඩුව වත්තේ දෝතලාව කොටසේ සිදු කරන විවිධ සෙවණ ශාක ඇගයීමට ලක් කිරීමේ අත්හදා බැලීම තවදුරටත් ක්‍රියාත්මක වූ අතර පරීක්‍ෂණ කොටුවල අවශ්‍ය කෘෂිකාර්මික ක්‍රියාවන් සිදු කෙරුණි. විවිධ පුනරුත්ථාපන තෘණ විශේෂ පිලිබඳ පරීක්‍ෂණ අත්හදා බැලීම A 10.01 මධ්‍යස්ථානය තළ ක්‍රියාත්මක විය. මෙම පරීක්‍ෂණ කොටුවල ආම්ලිකතාව හා කාබන්

ප්‍රතිශතයන් පරීක්ෂා කෙරිණ. අංශයේ කාර්ය මණ්ඩලය විසින් C/MET ව්‍යාපෘතිය යටතේ කාලගුණ දත්ත වාර්තා කිරීම ද අංශයේ නිලධාරීන් අතින් සිදු විය.

**කීට විද්‍යා/වටපණු විද්‍යා අංශය**

ප්‍රභේද තෝරා ගැනීමේ A 45 ව්‍යාපෘතිය යටතේ රොඩපොලොස් සිමිලිස් හි TRI 5000 කාණ්ඩයට අදාලව අවසාන ඇගයීම සිදු කළ අතර ප්‍රතිඵල විශ්ලේෂණය සඳහා භාර දී තිබිණි. CO-3, ලොමේන්ද්‍රා, පක්චොන්ග්, මානා සහ ගෝතමාලා, TRI 2025 ප්‍රභේදය සමඟ මැදරට වටපණු විශේෂය වන "රොඩොපොලොස් සිමිලිස්" සඳහා සිදු කරගෙන යන ලදී.

හේවාහැට සහ වත්තේගම තේ පරීක්ෂක කලාපවල කුඩා තේ වතු ඉඩම්වල පස් හා මුල් සාම්පල 22 ක් ස්ටාර් ව්‍යාපෘතිය යටතේ පරීක්ෂාව සිදු කෙරුණ අතර උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් භාර දුන් කුඩා තේ වතුවලින් ලබා ගත් සාම්පල 8 ක් වටපණු පරීක්ෂාව සිදු කෙරිණි.

**පාංශු සහ ශාක පෝෂණ අංශය**

රයිසො බැක්ටීරියා සහිත ආමුකුලක ඇගයීමේ පරීක්ෂණ තුනක් මඩුල්කැලේ කැලෑබොක්ක වත්තේ දි, උකුවෙල රත්වත්ත වත්තේ දී සහ මහනුවර හන්තාන වත්තේ දී තේ වලට යෝග්‍ය ජෛව කාබනික සහ ඛනිජ හෝ සංයෝග පොහොර සකස් කිරීමේ ක්‍රම පිලිබඳ A 15.03 ව්‍යාපෘතිය යටතේ ආරම්භ කෙරිණි. ප්‍රතිකාරකයටක තේ පඳුරු 1000 බැගින් වන සේ පරීක්ෂණ කොටු ලකුණු කරන ලදී. පූර්ව ප්‍රතිකාරක අස්වැන්න පරීක්ෂා කිරීම සිදු කෙරුණු අතර පරීක්ෂණ ඉදිරියට කරගෙන යන ලදී. ආම්ලික හා ස්වාරක්ෂක ක්‍රියාව මැනීම සඳහා A 15.4 ව්‍යාපෘතිය යටතේ පන්විල ඔපල්ගල වත්තේ දී හා දොලොස්බාගේ ක්‍රේග්හෙඩ් වත්තේ දී පර්යේෂණ දිගටම ක්‍රියාත්මක විය. අත්හදා බැලීම් නිලධාරී පොහොර සමාලෝචන කමිටු රැස්වීම් වලට සහ ජෛව පොහොර ප්‍රමිතියන් සකස් කිරීමේ කමිටු සඳහා සහභාගි විය.

**ශාක අභිජනන අංශය**

නව තාක්ෂණික නිලධාරිණියක් ප්‍රධාන කාර්යාලයේ සිට ස්ථාන මාරු ලබා පැමිණීමත් සමඟ අංශයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය වසර හතකට පමණ පසුව නැවත ආරම්භ විය.

**යටිතල පහසුකම් සංවර්ධනය**

කාර්යාල ගොඩනැගිල්ලේ වහලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කරන ලදී. විද්‍යාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු රටේ පැවති තත්වය මත යම් ආකාරයක ප්‍රමාදයන් මධ්‍යයේ වුව ද, බොහෝ දුරට අවසන් කෙරුණි. කාර්යාල සහ නිල නිවාස ගොඩනැගිලිවල වර්ණාලේප කිරීම්, අත්‍යවශ්‍ය අළුත්වැඩියා කිරීම් සහ වාහන සංචිතයේ අළුත්වැඩියා කිරීම් සිදු කරන ලදී. අධික වර්ෂාව නිසා හානියට පත් මාර්ගවල අළුත්වැඩියා කිරීම ආරම්භ විය. TRI 5000 කාණ්ඩයේ ප්‍රභේදවල නව මව් වගා පුළුල් කිරීමේ GL 395 ව්‍යාපෘතිය යටතේ බිම් සකස් කිරීමේ සහ මට්ටම් කිරීමේ කටයුතු හෙක්ටයාර 0.7 ක ක්ෂේත්‍රයේ අවසන් කෙරුණි. අවසාන වර්ෂා කාලය තුළ ඉන් කොටසක මානා වගා කිරීම අවසන් කරන ලදී.

**විවිධ ක්‍රියාකාරකම්**

ස්ථානභාර නිලධාරී/උපදේශක නිලධාරී කේ.ආර්.ඩබ්ලිව්.බී කහඳව මහතා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ භායනයට පත් කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ගොවි ක්ෂේත්‍ර පාසැල් කොටසේ විශේෂඥ කණ්ඩායමට, තේ පර්යේෂණ ආයතනය නියෝජනය කළ අතර ගොවි ක්ෂේත්‍ර පුහුණු පාසල් මාර්ගෝපදේශ කෙටුම්පත සංවර්ධනය කිරීම සඳහා දෙවන කතෘවරයා ලෙස ද සහභාගි විය.

උපදෙස් නිලධාරී/ස්ථාන භාර නිලධාරී කේ. ආර්. ඩබ්ලිව්. බී කහඳව මයා 14.01.2022 දින ජාතික රූපවාහිනියෙන් ප්‍රචාරය වූ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ "සැඟවුනු කහවනු" වීඩියෝ වැඩසටහන සඳහා "තේ වගාවේ කෘෂිකාර්මික ක්‍රියා යාන්ත්‍රීකරණය" පිලිබඳව කරුණු ඉදිරිපත් කරමින් සහභාගි විය.

**අස්වැන්න : 2022 වසර තුල නෙලූ අමු තේ දළු අස්වැන්න පහත දැක්වේ.**

| මාසය | නෙලූ/ විකිණූ අස්වැන්න (කි.ග්‍රෑ) | ඒකක මිල | ලැබූ ආදායම |
|---|---|---|---|
| ජනවාරි | 1132 | 96.28 | 108,988.96 |
| පෙබරවාරි | 551 | 92.51 | 50,973.01 |
| මාර්තු | 903 | 108.98 | 98,408.94 |
| අප්‍රේල් | 1865 | 158.05 | 294,763.25 |
| මැයි | 1358 | 151.06 | 205,139.48 |
| ජූනි | 1017 | 137.06 | 139,390.02 |
| ජූලි | 607 | 136.32 | 82,746.24 |
| අගෝස්තු | 457 | 170.00 | 77,690.00 |
| සැප්තැම්බර් | 1137 | 190.00 | 216,030.00 |
| ඔක්තෝම්බර් | 315 | 165.00 | 51,975.00 |
| නොවැම්බර් | 846 | 173.48 | 146,764.08 |
| දෙසැම්බර් | 699 | 168.12 | 117,515.88 |
| **එකතුව** | **10,877** | | 1,590,384.86 |

**2022 වසරේ ආදායම**

| ක්‍රියාකාරකම | | ආදායම (රුපියල්) |
|---|---|---|
| තේ රිකිලි (300,900) | - | 451,350.00 |
| රිකිලි තේ පැළ (12,798) | - | 383,940.00 |
| අමු දළු විකිණීමෙන් ලද ආදායම (කි.ග්‍රෑ 10,887) | - | 1,590,384.86 |
| ආගන්තුක නිවාස නවාතැන් ගාස්තු | - | 60,950.00 |
| පොහොර, පස් සහ ආම්ලිකතා පරීක්ෂාවන් | - | 71,925.00 |
| තේ.ප.ආ ප්‍රකාශන අලෙවිය | - | 72,725.00 |
| විවිධ ආදායම් | - | 20,610.00 |
| **එකතුව** | | **2,651,884.86** |

**මධ්‍යස්ථානය වෙත ආ අමුත්තන්.**

| | | |
|---|---|---|
| තේ වැවිලිකරුවන් | - | 205 |
| ශිෂ්‍යයන් (උසස් අධ්‍යාපන) | - | 443 |
| සාමාන්‍ය අමුත්තන් | - | 21 |
| **එකතුව** | **-** | **669** |

# ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය - පස්සර

**ඒ අබේසූරිය**
**කෘෂිකර්ම විද්‍යාවේදී (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)**

**ස්ථානභාර නිලධාරී**

**හැඳින්වීම**
තේ පර්යේෂණ ආයතනයේ පළමු ප්‍රාදේශීය මධ්‍යස්ථානය ලෙස 1931 වසරේදී කහඹිලි පණුවාගේ හානිය අධ්‍යයනය කිරීම සඳහා ඌව උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටුවන ලදී. වර්තමානයේ දී මෙම මධ්‍යස්ථානය මඟින් ඌව කලාපයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් වතු 62ක් මධ්‍ය පරිමාණ වතු 60 පමණ සහ කුඩා තේ වතු හිමියන් 29,000ක් පමණ සඳහා සේවා සපයනු ලබයි.

ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, කුඩා විද්‍යාගාරයකින් සමන්විත අතර එ මඟින්, පසේ ආම්ලිකතාවය සහ කාබන් ප්‍රතිශතය විශ්ලේෂණය සිදු කරනු ලබයි.

හෙක්ටාර 14.98 වපසරියෙන් යුත් භූමියේ ක්ෂේත්‍ර අත්හදා බැලීම්, මව් ශාක වගාව සහ පරිණත තේ වගාව ආදී වශයෙන් පහත ආකාරයට ස්ථාපිතව ඇත.

වගුව 1. ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ භූමි භාවිතය

| **භූමි පරිහරණය** | | **වපසරිය (හෙක්.)** |
|---|---|---|
| පරිණත තේ වගාව | - | 3.80 |
| නොමේරූ තේ වගාව (අත්හදා බැලීම්) | - | 0.70 |
| මව් වගාව | - | 3.53 |
| බීජ උයන | - | 0.16 |
| ගොඩනැගිලි/මාර්ග | - | 1.24 |
| තිරසාර ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය | - | 0.30 |
| කැලය/වන වගාව/තෘණ භූමි | - | 5.23 |
| කාලගුණ මධ්‍යස්ථානය/තේ තවාන | - | 0.02 |
| **එකතුව** | **-** | **14.98** |

**සේවක මාරුවීම්**
එම්. රාමසාමි මහතා 2022.04.06 දින සිට බලපැවැත්වෙන පරිදි ආගන්තුක නිවාස භාරකරු ලෙස පත් කරන ලදී.

**උපදෙස් හා ව්‍යාප්ති සේවා**
2022 වසර තුළ ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් ඌව කලාපයේ පිහිටි වතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ විශාල ප්‍රමාණයක් සිදු කර අදාල නිර්දේශයන් ලබා දෙන ලදී. එමෙන්ම මධ්‍යස්ථානය මගින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වතු හා කුඩා තේ වතු හිමියන් සඳහා උපදෙස් හා ව්‍යාප්ති සේවාවන්, පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

2022 වර්ෂය තුළ ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසද රැස්වීම් 2ක් පවත්වන ලදී.

- පළමු ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසද රැස්වීම 2022 මාර්තු මස 04 වැනි දින තේ පර්යේෂණ ආයතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඌව උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පවත්වන ලදී. 'තේ කර්මාන්තය කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම' සහ 'නියං කාලය තුළ ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම භාවිතය' යන කරුණු සාකච්ඡාවට බඳුන් විය.

- දෙවන ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසද රැස්වීම 2022 දෙසැම්බර් මස 13 වැනි දින තේ පර්යේෂණ ආයතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඌව සහ නුවරඑළිය ප්‍රාදේශිකයන්ගේ නිලධාරීන්ගේ මෙන්ම කුඩා තේ වතු සමිති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී පවත්වන ලදී. 'රසායනික පොහොර භාවිතයේ විද්‍යාත්මක පදනම' සහ 'තේ වගාවට පොහොර යෙදීමේ ආර්ථික විද්‍යාත්මක පදනම' යන කරුණු සාකච්ඡාවට බඳුන් විය.

ඌව ප්‍රදේශයේ තේ වගාකරුවන් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

- මඩොල්සිම වතු සමාගමේ වතු කාර්ය මණ්ඩලය සඳහා තේ දළු නෙලීම සම්බන්ධව පුහුණු වැඩසටහන් මාලාවක් තලවාකැලේ තේ පර්යේෂණායතනයේ නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ඌව කලාපයේ අමු තේ දළු එකතු කරන්නන් සඳහා 2022 ජනවාරි සහ දෙසැම්බර් මාස වලදී 'ඌව කලාපයට නිර්දේශිත තේ ප්‍රභේද' සහ 'පසු අස්වනු හානිය අවම කිරීම' යන කරුණු සම්බන්ධව සම්මන්ත්‍රණ පවත්වන ලදී.
- වර්වික් වතුයායේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා 'ක්ෂේත්‍ර සකස් කිරීම, පාංශු පුනරුත්ථාපනය සහ සංරක්ෂණය' පිලිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් 2022 පෙබරවාරි මස පවත්වන ලදී.
- තේ පඳුරු කප්පාදුව සහ තේ වගාවේ පාලු සිටවීම සම්බන්ධව ජාතික වැවිලි කළමණාකරන ආයතනයේ සිසුන්ට මාර්ගගත ක්‍රමයට පුහුණු සැසි වාරයන් 2022 මාර්තු මස පවත් වන ලදී.
- ආගරපතන සහ මස්කෙලිය වැවිලි සමාගම්හි තේ දළු නෙලන්නන් හට තෝරා දළු නෙලනය මගින් දළු නෙලීම සම්බන්ධව පුහුණු වැඩසටහන් පවත් වන ලදී.
- ක්‍රේග් වතු යායේ සේවකයන් සඳහා "ආරක්ෂාකාරී පළිබෝධනාශක භාවිතය" පිළිබද පුහුණු වැඩසටහනක් 2022 මැයි මස පවත්වන ලදී.
- හපුගස්තැන්න වැවිලි සමාගමේ නිලධාරීන් සඳහා 'පාංශු සංරක්ෂණය සහ පාංශු පෝෂක කළමණාකරනය සම්බන්ධ පුහුණු වැඩසටහන් දෙකක් 2022 අගෝස්තු මස පවත්වන ලදී.
- වැරැල්ලපතන වතු යායේ කාර්ය මණ්ඩලය සඳහා ගැඩවිලි පොහොර නිෂ්පාදනය සම්බන්ධව පුහුණු වැඩසටහනක් 2022 ඔක්තෝම්බර් මස පවත්වන ලදී.
- පාසල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ඌව උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ දී පැවැත්වුණි
- තේ නිෂ්පාදනය සහ පසු අස්වනු හානිය සම්බන්ධව පුහුණු වැඩසටහනක් අරුණ තේ කර්මාන්ත ශාලාවේ කාර්යමණ්ඩලය සඳහා 2022 අගෝස්තු මස පවත්වන ලදී
- තේ දළු නෙලීම සම්බන්ධ පුහුණු වැඩසටහන් සමූහයක් 'තේ වගාව උදෙසා සහකම්පනය' වැඩසටහනට සමගාමීව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහ තේ මණ්ඩලයේ ද සහභාගීත්වයෙන් 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා පැවැත්විණි
- ඌව කලාපයේ තේ කර්මාන්තශාලා හිමියන්, වතු අධිකාරීවරුන් සහ අමු තේ දළු එකතු කරන්නන් සඳහා 'පසු අස්වනු හානිය අවම කිරීම' යන කරුණ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී

වගුව 2. උපදෙස් හා ව්‍යාප්ති කටයුතුවල සාරාංශය - 2022

| විස්තරය | | ගණන |
|---|---|---|
| උපදේශන චාරිකා | - | 84 |
| උපදේශන ලිපි නිකුත් කිරීම් | - | 106 |
| සම්මන්ත්‍රණ ක්ෂේත්‍ර දින පුහුණු වැඩසටහන් | - | 52 |
| ප්‍රාදේශීය සම්මන්ත්‍රණ | - | 02 |
| සහභාගී වූ සම්මන්ත්‍රණ හා රැස්වීම් | - | 42 |
| පාංශු පී.එච්. විශ්ලේෂණ | - | 1162 |
| පාංශු කාබන් විශ්ලේෂණ | - | 699 |
| නිකුත් කරන ලද තේ රිකිලි | - | 661,400 |
| අලෙවි කල තේ පැළ | - | 17,866 |
| අලෙවි කරන ලද ප්‍රකාශන | - | 114 |
| වාණිජ තවාන් පරීක්ෂා | - | 27 |

**ක්ෂේත්‍ර පර්යේෂණ හා අනුවර්ති පර්යේෂණ**

තේ පර්යේෂණ ආයතනයේ අදාළ පර්යේෂණ අංශයන්හි අධීක්ෂණය යටතේ පහත සඳහන් ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කරන ලදී.

- ක්ෂේත්‍ර අංක 03 හි ඇති ජාන ප්ලාස්ම එකතුව නඩත්තු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 02 හි පී.පී.පී.බී යූ.වී.පී. 11 පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 03 හි පී.පී.පී.බී යූ.වී.පී. 12 සහ යූ.වී.පී. 13 පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදයන්හි වටපණුවන්ගේ ප්‍රතිරෝධීතාවය සඳහා ඇගයීම් සිදු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 02 හි පී.පී.පී.බී යූ.වී.පී. 14 පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 03 හා 04 හි ඇති බීජ තේ ඇගයීම් කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 04 හි බහු ක්ලෝන බීජ උයනේ පර්යේෂණ හා ඇගයීම් කටයුතු ශාක අභිජනන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 05 හි පස පුනරුත්ථාපන තෘණ වර්ග පිළිබඳ පර්යේෂණය ශෂ්‍ය විද්‍යා අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 02 හි යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ ක්ෂේත්‍ර පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 05 හි ඇති ජාන ප්ලාස්ම එකතුව සම්බන්ධ පර්යේෂණ ක්‍රියාත්මක කරමින් පවතී

ශාක අභිජනන අංශය හා එක්ව බීජ තේ උයන් 03 ක් වැලිමඩ, හාලිඇල සහ පස්සර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍රයන්හි ස්ථාපිත කර ඇත.

**ඒ.ඩී.බී. මව් වගා ව්‍යාපෘතිය**

ඉලක්ක කරන ලද තේ රිකිලි 400,000 වෙනුවට ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් 2022 වසර තුල තේ රිකිලි 661,400 ක් ප්‍රදේශයේ තවාන්කරුවන් වෙත ලබා දෙන ලදී.

**ප්‍රාදේශීය ගැටළු සහ වෙනත් ක්‍රියාකාරකම්**

- ස්ථාන භාර නිළධාරී සහ ව්‍යාප්ති නිළධාරී විසින් ඌව කලාපයේ කුඩා තේ ඉඩම් ආශ්‍රිතව කාබනික පොහොර භාවිතය පිළිබඳ අනුවර්ති පර්යේෂණය සඳහා පස් සහ පත්‍ර සාම්පල ලබා ගන්නා ලදී.
- ස්ථාන භාර නිළධාරී සහ ව්‍යාප්ති නිළධාරී විසින් ඌව කලාපයේ කුඩා තේ ඉඩම් ආශ්‍රිතව ටී 1240 පොහොර භාවිතය පිළිබඳ සමීක්ෂණය සඳහා පස් සහ පත්‍ර සාම්පල ලබා ගන්නා ලදී.

- ස්ථාන භාර නිළධාරී සහ ව්‍යාප්ති නිළධාරී විසින් ඌව කලාපයේ වාණිජ තවාන් 27 ක අවසාන අධීක්ෂණය සිදු කරන ලදී.
- බදුල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා තේ පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් ස්ථාන භාර නිළධාරී සහභාගී විය.
- බදුල්ල දිස්ත්‍රික් වැවිලිකරුවන්ගේ සංගමයේ වැඩසටහන් සඳහා තේ පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් ස්ථාන භාර නිළධාරී සහභාගී විය.

**දළු අස්වැන්න සහ ආදායම**

ඌව උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ තේ දළු අස්වැන්න වගු අංක 3 සහ ආදායම වගු අංක 4 පරිදි වේ.

වගුව 3. තේ දළු අස්වැන්න - 2022

| මාසය | අමු දලු (කිලෝ ග්‍රෑම්) | ඒකක මිල (රු.) | මුළු මුදල (රු.) |
|---|---|---|---|
| ජනවාරි | 1,637 | 89.64 | 141,829.68 |
| පෙබරවාරි | 1,522 | 86.12 | 131,074.64 |
| මාර්තු | 2,602 | 104.43 | 271,726.86 |
| අප්‍රේල් | 3,602 | 169.15 | 609,278.30 |
| මැයි | 3,755 | 157.65 | 591,975.75 |
| ජූනි | 2,701 | 143.77 | 388,322.77 |
| ජූලි | 2,754 | 167.92 | 462,451.68 |
| අගෝස්තු | 2,321 | 175.55 | 407,451.55 |
| සැප්තැම්බර් | 2,002 | 185.07 | 370,510.14 |
| ඔක්තෝබර් | 1,988 | 158.81 | 315,714.28 |
| නොවැම්බර් | 1,484 | 155.68 | 231,029.12 |
| දෙසැම්බර් | 1,299 | 175.65 | 228,169.35 |
| **එකතුව** | **27,667** | | **4,149,534.12** |

**ආදායම**

වගුව 4. උපයන ලද ආදායම 2022

| විස්තරය | ආදායම (රුපියල්) |
|---|---|
| අමු දළු අලෙවිය කිලෝ ග්‍රෑම් (**27,667**) | 4,149,534.12 |
| තේ රිකිලි අලෙවිය | 992,100.00 |
| තේ පැළ අලෙවිය | 535,980.00 |
| පාංශු විශ්ලේෂණ ගාස්තු | 624,125.00 |
| ප්‍රකාශන අලෙවිය | 131,305.00 |
| ආගන්තුක නිවාස ගාස්තු | 91,750.00 |
| දර අලෙවිය | 37,660.00 |
| වෙනත් | |
| **එකතුව** | **6,562,454.12** |

**අමුත්තන්ගේ පැමිණීම**

2022 වසරේ ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත විවිධ අවශ්‍යතා සඳහා පැමිණි අමුත්තන් පිළිබඳ තොරතුරු වගු අංක 5 යටතේ දක්වා ඇත.

වගුව 5. ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත පැමිණි අමුත්තන් - 2022

| **කාණ්ඩය** | | **ගණන** |
|---|---|---|
| විදේශිකයින් | - | 5 |
| වැව්ලිකරුවන් | - | 110 |
| කුඩා තේ වතු හිමියන් | - | 420 |
| වෙනත් | - | 245 |
| පාසල් සිසුන් | - | 40 |
| තේ.ප.ආ. නිළධාරීන් | - | 75 |
| **එකතුව** | **-** | **895** |

# උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය - ගාල්ල


## පී ඩී ද අල්විස්
## කෘෂි විද්‍යා උපාධි විශේෂ ගෞරව (රුහුණ, ශ්‍රී ලංකාව)

## ස්ථාන භාර නිලධාරී


දකුණු ලක ගාල්ල දිස්ත්‍රික්කය සඳහා උපදෙස් හා ව්‍යාප්ති සේවය සැලසීමේ මූලික අරමුණ පෙරදැරි කරගෙන, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ගාල්ල, කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය වර්ෂ 1961 දී ස්ථාපිත කරන ලදි. තේ කර්මාන්තයේ උන්නතිය උදෙසා, උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සැලසීම මෙන්ම පසේ පී.එච්. (pH) අගය නිර්ණය කිරීම සඳහා කුඩා පරිමාණයේ රසායනාගාරයක් ද මෙම ආයතනය සතුව ඇත. පිඹුරු අංක GA/YKK/2012/65 සහ GA/YKK/2012/66 ට අනුව මෙහි හෙක්ටයාර් 28.96 ක ඉඩම් පරිහරණ සැලැස්ම පහත පරිදි වේ.

වගුව 1. ඉඩම් පරිහරණ සැලැස්ම - 2022

| **ඉඩම් පරිහරණය** | **වපසරිය (හෙක්ටයාර්)** |
|---|---|
| දළු නෙලන පරිණත තේ වගාව | 2.73 |
| නව තේ වගාව | 0.40 |
| මව් වගාව (නොමේරූ සහ මේරූ) | 5.06 |
| රිකිලි තේ පැළ තවාන | 0.81 |
| පාංශු පුනරුත්ථාපන තෘණ (මානා) | 1.00 |
| පාංශු පුනරුත්ථාපන තෘණ (CO-03) | 1.00 |
| CO-03 තෘණ වගාව | 0.40 |
| බීජ තේ උද්‍යානය | 0.83 |
| පොල් සහ අනෙකුත් බෝග | 1.52 |
| වගුරු බිම් | 1.22 |
| වන වගාව | 5.08 |
| ගොඩනැගිලි, ගෙවතු, පාරවල්, කාලගුණ මධ්‍යස්ථානය | 8.91 |
| **සම්පූර්ණ බිම් ප්‍රමාණය** | **28.96** |

ආයතනය බුක්ති විඳින මෙම ඉඩම සඳහා දීර්ඝ කාලීන (වසර 30) බදු ඔප්පුවක් ලබා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතියි.

පර්යේෂණ අංශයන් හි උපදෙස් සහ මග පෙන්වීමට අනුව ප්‍රදේශයේ කුඩා තේ වතු, සමාගම් වතු, මෙන්ම පෞද්ගලික වතුවල විවිධ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු මෙ මඟින් සිදුකරගෙන යනු ලබයි.

**මධ්‍යස්ථානය මගින් 2022 වර්ෂය තුල සිදුකරන ලද ප්‍රධාන ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් සඳහා වන ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසදය 2022 මාර්තු මස සාර්ථක අන්දමින් පවත්වන ලදි. එහිදී තේ පර්යේෂණ ආයතනය විසින් පහත සඳහන් දේශන පවත්වන ලදි

  (1)"පරිණත තේ වගාව සඳහා නව පොහොර නිර්දේශය (T-1240) සමග තේ වගාවේ ඒකාබද්ධ පෝෂක කළමනාකරණය" - ඩබ්.එම්.එස්. විජේතුංග මහතා, අංශ ප්‍රධානී, පාංශු හා ශාක පෝෂණ අංශය.

(2) "තේ වගාවට කාලගුණික විපර්යාස වලින් වන බලපෑම අවම කර ගැනීම - විසිරුම් ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම" - ආචාර්ය එන්.පී.එස්.එන්. බණ්ඩාර, ප්‍රධාන පර්යේෂණ නිලධාරි, ශෂ්‍ය විද්‍යා අංශය.

- පාංශු පෝෂක කළමනාකරණය සහ නව තේ ප්‍රභේද පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් කොට්ටව- බටහිර සහ යටලමත්ත කුඩා තේ වතු සංවර්ධන සමිති සාමාජිකයින් සඳහා පවත්වන ලදි.
- "පුහුණු කරන්නන් පුහුණු කිරීමේ" (TOT) වැඩසටහන යටතේ තේ වගා කිරීමට සුදුසු ඉඩම් තෝරා ගැනීම, තේ පැළ සිටුවීම, තේ දළු නෙලීම, තේ පඳුරු කප්පාදුව සහ සෙවණ කළමනාකරණය පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහනක්, හින්ගල්ගොඩ සහ නෙළුව මැදගම තේ කර්මාන්තශාලා පාදක ව්‍යාප්ති නිලධාරින් සඳහා පවත්වන ලදි. මෙම වැඩසටහන කුඩා තේ වතු කර්මාන්තශාලා පොදු සමාගම සහ CIC කෘෂි ව්‍යාපාර සමාගම මගින් සංවිධානය කරන ලදි.
- "පුහුණු කරන්නන් පුහුණු කිරීමේ" වැඩසටහන යටතේ තේ පැළ සිටුවීම සහ නොමේරූ පුෂ්ප අංකුර හටගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්, දිවිතුර වතුයායේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා පවත්වන ලදි.
- තේ වගාවේ සියළු ක්‍රියාකාරකම් ඇතුලත් පුහුණු කිරීමේ වැඩසටහනක්, හිනිදුම සහ හින්ගල්ගොඩ කුඩා තේ වතු සංවර්ධන සමිති සාමාජිකයින් සඳහා පවත්වන ලදි.
- තේ පඳුරු කප්පාදුව පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහනක්, ගාල්ල, වලහන්දුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ සේවකයන් සඳහා පවත්වන ලදි.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද "සහකම්පන" වැඩ සටහන යටතේ, තේ දළුවල ප්‍රමිතිය පිළිබඳව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් ගාල්ල තේ කර්මාන්තශාලා හිමියන් සහ අමු තේ දළු එකතු කරන්නන් සඳහා පවත්වන ලදි.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අදාළ තේ කර්මාන්තශාලා විසින් සංවිධානය කරන ලද "සහකම්පන" වැඩ සටහන් සඳහා තේ දළුවල ප්‍රමිතිය පිළිබඳව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයන්ට සමගාමීව තේ පර්යේෂණ ආයතනයේ ජංගම රසායනාගාර සේවය ලබා දීම සහ බෝග සායන වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදි.
- දෙපේළි ක්‍රමයට තේ පැළ සිටුවීම පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහනක් ගාල්ල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරින් සඳහා පවත්වන ලදි.
- "තේ වගා කිරීමට සුදුසු ඉඩම් තෝරා ගැනීම හා තේ පැළ සිටුවීම, පාංශු පෝෂක කළමනාකරණය, රෝග-පළිබෝධ කළමනාකරණය, තේ තවාන් පාලනය, වල් පැළෑටි පාලනය, තේ දළු නෙලීම සහ නව තේ ප්‍රභේද හඳුන්වාදීම" පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් ගාල්ල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ උනන්විටිය හා වලකුඹුර කුඩා තේ වතු සංවර්ධන සමිති සාමාජිකයින් සඳහා පවත්වන ලදි.

**උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

වගුව 2. උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම් - 2022

| **ක්‍රියාකාරකම** | **ප්‍රමාණය** |
|---|---|
| මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් (කුඩා තේ වතු, සමාගම් වතු/පෞද්ගලික වතු හිමියන්, ශිෂ්‍යයින්, විදේශිකයන් සහ අනෙකුත්) | 437 |
| ලිපි මගින් උපදෙස් සැපයීම | 80 |
| උපදෙස් සහ ව්‍යාප්ති චාරිකා | 47 |
| පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/සාමූහික සාකච්ඡා/ක්ෂේත්‍ර දින/ආදර්ශන | 31 |
| සහභාගි වූ රැස්වීම් | 32 |
| ප්‍රකාශන /පත්‍රිකා/පොත් නිකුත් කිරීම (නොමිලේ ලබාදෙන ලද ඒවා ද ඇතුලත්ව) | 66 |
| අලෙවිකරන ලද රිකිලි (cuttings) ගණන | 305,750 |
| අලෙවිකරන ලද රිකිලි තේ පැළ ගණන | 13,250 |
| පී.එච්. අගය විශ්ලේෂණය කිරීම සඳහා පරීක්ෂා කරන ලද පස් සාම්පල ගණන | 326 |
| පර්යේෂණ චාරිකා (අනුවර්තී පර්යේෂණ ද ඇතුලත්ව) | 02 |

**කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**

ක්ෂේත්‍ර නිලධාරි පී.එස්. කුලසිරි මහතා වර්ෂ 2022 දෙසැම්බර් මස 31 දින විශ්‍රාම යන ලදි.

**පර්යේෂණ ව්‍යාපෘති (දැනට පවත්නා පර්යේෂණ, අත්හදාබැලීම්)**

මෙම මධ්‍යස්ථානය තුල පහත සඳහන් පර්යේෂණ/අත්හදාබැලීම් තේ පර්යේෂණායතනයේ අදාල අංශයන්හි අධීක්ෂණය හා සහයෝගය ඇතිව සිදුකරනු ලබයි.

**(1) ශාක අභිජනන අංශය**

<u>TRI 5000 කාණ්ඩයේ නිරීක්ෂණ/ගුණනය කිරීමේ බිම් කොටස් - ක්ෂේත්‍ර අංක.02</u>

TRI 5000 කාණ්ඩයේ (12/11, 10/1, 107, 23/5) පර්යේෂණ කොටු 4 ක් ක්ෂේත්‍ර අංක 02 තුල වර්ෂ 2014 දී ස්ථාපිත කර ඇත. මේ වන විට 12/11 සහ 23/5 ප්‍රභේදවල රිකිලි අතු නිකුත් කරන අතර අනෙකුත් ප්‍රභේදයන්හි දළු නෙලීම සිදුකරයි.

**(2) පාංශු හා ශාක පෝෂණ අංශය**

"ශාක වර්ධනය වැඩි දියුණු කරන රයියොබැක්ටීරියා පදනම් වූ ආමුකූලක පහත රට තේ තවාන් සඳහා යොදාගැනීම" සඳහා සිදු කරන ලද පර්යේෂණය අවසන් කරන ලදි.

**මව් වගා ව්‍යාපෘතිය**

TRI 4000 කාණ්ඩයේ වැඩි දියුණු කරන ලද රිකිලි තේ ප්‍රභේදවලින් මෙම වසරෙහි නිෂ්පාදනය කරන ලද සම්පූර්ණ රිකිලි ප්‍රමාණය 305,750 ක් වූ අතර එය හෙක්ටාර් 1.1 ක පමණ මව් වගාවෙන් සහ මව් වගාවට පරිවර්තනය කරන ලද දළු නෙලන වගාවෙන් ලබා ගන්නා ලදි. මෙය ගාල්ල මධ්‍යස්ථානය මගින් ප්‍රදේශයේ තේ වගාකරුවන්හට ලබා දෙන ලද ප්‍රධාන සේවාවක් වන අතර විශේෂයෙන් ප්‍රාදේශීයව පවතින රෝග-පළිබෝධ හානිවල ට සහ වියළි කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන TRI 4000 කාණ්ඩයේ රිකිලි තේ ප්‍රභේද වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම මෙහි මූලික අරමුණකි.

තේ පැළ 13,250 ක් ප්‍රදේශයේ තේ වගාකරුවන්හට අලෙවි කරන ලද අතර තේ පැළ 4,270 ක් මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර තුල පාළු සිටුවීමට යොදා ගන්නා ලදි.

**මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන්**

මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් සංඛ්‍යාව 437 ක් වූ අතර එය පහත වගුවෙහි දැක්වේ.

වගුව 3. මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් - 2022

| කාණ්ඩය | ගණන |
|---|---|
| කුඩා තේ වතු හිමියන්, සමාගම් වතු/පෞද්ගලික වතු හිමියන් | 404 |
| විශ්ව විද්‍යාල/ඩිප්ලෝමා ශිෂ්‍යයින් සහ අනෙකුත් | 33 |
| එකතුව | 437 |

**යටිතල පහසුකම් දියුණු කිරීම හා නඩත්තුව**

- ආයතනයේ ප්‍රධාන පිවිසුමෙහි සිට සංචාරක බංගලාව දක්වා වූ ප්‍රවේශ මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිමකරන ලදි.
- ක්ෂේත්‍ර අංක 06 හි සේවක විවේකාගාරය අඩු වියදමින් නවීකරණය කරන ලදි.
- මධ්‍යස්ථානයෙහි නිල රථය ගාල් කිරීම සඳහා වූ ගරාජය අඩු වියදමින් නවීකරණය කරන ලදි.

**ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු**

- ක්ෂේත්‍ර අංක 6 හි පාළු පැළ 4270 ක් ස්ථාපිත කරන ලදි.
- හෙක්ටාර් 02 ක නොමේරූ මව් වගා කොටස් සඳහා විසිරුම් ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ජල පොම්පාගාරය තැනීම සහ ජල නල එලීමේ කටයුතු සිදුකරමින් පැවතුනි.
- ශාක අභිජනන අංශයේ විශේෂ ව්‍යාපෘතියක් වන "මව් වගාව ප්‍රසාරණය කිරීමේ" ව්‍යාපෘතිය යටතේ, ක්ෂේත්‍ර අංක 02 සහ 04 හි හෙක්ටාර් 01 ක වපසරියක බිම් සකස් කිරීම හා CO-3 පාංශු පුනරුත්ථාපන තෘණ සිටුවීම සම්පූර්ණ කරන ලදි.
- ඉහත ව්‍යාපෘතිය යටතේම ක්ෂේත්‍ර අංක 3 හි තවත් හෙක්ටාර් 02 ක වපසරියක බිම් සකස් කිරීම සම්පූර්ණ කරන ලදි.

**සුවිශේෂී සිදුවීම්**

- ප්‍රදේශයේ තේ කර්මාන්තයේ නියැලෙන්නන්හට තේ පර්යේෂණ ආයතනයේ ජංගම රසායනාගාර සේවාව උත්සවාකාරයෙන් ආරම්භ කර ලද අතර, විශේෂයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අදාළ තේ කර්මාන්තශාලා විසින් සංවිධානය කරන ලද "සහකම්පන" වැඩ සටහන් සඳහා මෙම සේවාව සමඟ බෝග සායන වැඩසටහන් පවත්වන ලදි.
- තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), ශෂ්‍ය විද්‍යා, වටපණු හා කීට විද්‍යා, ශාක ව්‍යාධිවේදී යන අංශයන්හි අංශ ප්‍රධානීන් සහ තේ පර්යේෂණ ආයතනයේ අනෙකුත් නිලධාරීන්, මෙන්ම STaRR ව්‍යාපෘතියේ නිලධාරීන් ඇතුළත් කණ්ඩායමක් විසින් පනංගල ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ඉඩම් නිරීක්ෂණ චාරිකාවක් සිදුකරන ලදි.
- ආහාර සුරක්ෂිතතාව පිළිබඳ වූ විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමක් සඳහා ස්ථානභාර නිලධාරි සහභාගි විය. ගරු අග්‍රාමාත්‍ය තුමා ප්‍රධාන අමත්තා වූ මෙම අවස්ථාව සඳහා ගරු වැව්ලි අමාත්‍යතුමා ද සහභාගි විය.

**මාසික අමු දළු අස්වැන්න**

වගුව 4. අමු දළු අස්වැන්න සහ ආදායම - 2022

| මාසය | අස්වැන්න (කිලෝ.ග්‍රෑ.) | ලැබුන මිල (කිලෝවකට රු. ශත) | මාසික ආදායම (රු. ශත) |
|---|---|---|---|
| ජනවාරි | 1866 | 123.00 | 229,518.00 |
| පෙබරවාරි | 972.5 | 130.00 | 126,425.00 |
| මාර්තු | 1639 | 155.00 | 254,045.00 |
| අප්‍රේල් | 2150 | 245.00 | 526,750.00 |
| මැයි | 2062.5 | 260.00 | 536,250.00 |
| ජූනි | 2009.5 | 260.00 | 522,470.00 |
| ජූලි | 2165 | 294.00 | 636,510.00 |
| අගෝස්තු | 1914.5 | 291.00 | 557,119.50 |
| සැප්තැම්බර් | 1738.5 | 292.00 | 507,642.00 |
| ඔක්තෝබර් | 1322 | 264.00 | 349,008.00 |
| නොවැම්බර් | 2177.5 | 245.00 | 533,487.50 |
| දෙසැම්බර් | 2102.5 | 257.00 | 540,342.50 |
| එකතුව | 22119.5 | | 5,319,567.50 |

**ආදායම**

මධ්‍යස්ථානයෙහි ආදායම සහ එහි සංරචක පහත වගුවෙහි දැක්වේ.

වගුව 5. ආදායම් ඉපයීම - 2022

| ආදායම් මාර්ගය | ආදායම (රු. ශත) |
|---|---|
| අමු තේ දළු අලෙවිය | 5,319,567.50 |
| තේ රිකිලි අතු අලෙවිය | 458,625.00 |
| තේ පැළ අලෙවිය | 397,500.00 |
| පී.එච්. අගය විශ්ලේෂණය කිරිම | 11,597.90 |
| ප්‍රකාශන අලෙවිය | 15,665.00 |
| සංචාරක බංගලාවේ නවාතැන් සැපයීම | 6,090.00 |
| විවිධ ආදායම් | 9,540.00 |
| එකතුව | 6,218,585.40 |

**වාර්ෂික කාලගුණික දත්ත**

2022 වසර තුළ වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3148.8 ක් වූ අතර එය පසුගිය වසරෙහි (2021) අගයට වඩා සැලකිය යුතු ලෙස අඩුවිය. නමුත් මාසික වර්ෂාපතනයේ පැතිරීම අසමාකාර විය. මෙම වසර තුල අවම උෂ්ණත්ව සාමාන්‍යය සෙල්සියස් අංශක 23.1 ක් වූ අතර උපරිම උෂ්ණත්ව සාමාන්‍යය සෙල්සියස් අංශක 30.9 ක් ලෙස වාර්තා විය. මෙම වසර තුළ සූර්ය දීප්ත පැය ගණනෙහි සාමාන්‍ය අගය පැය 6.0 ක් විය. පසුගිය වසර 10 හි සාමාන්‍යය සමඟ සසඳන විට ඉහත සියළු සංරචකයන් හි පැහැදිලි වෙනසක් වාර්තා නොවිණි.

# දෙනියාය උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය

**සී ඊ මුණසිංහ**
**කෘෂිකර්ම විද්‍යාවේදී (වයඹ විශ්වවිද්‍යාලය)**
**දර්ශනපති (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)**

**ප්‍රධානී**

**පොදු කරුණු**

දෙනියායේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථානය තේ වගාව සම්බන්ධ උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සිදුකරන ස්ථානයක් වන අතර එය පාංශු විශ්ලේෂණ කටයුතු සඳහා වන කුඩා ප්‍රමාණයේ විද්‍යාගාරයකින් සහ හෙක්ටාර 02 ක (අක්කර 05 ක) පමණ වන භූමි භාගයකින් සමන්විත වේ.

මෙම ස්ථානයේ භූමි පරිහරණ විස්තර පහත පරිදි වේ (වගුව 01).

**වගුව 01. ආයතනයේ භූමි පරිහරණ විස්තර**

| භූමි පරිහරණය | භූමි ප්‍රමාණය (හෙක්ටාර) |
|---|---|
| පරිණත තේ වගාව | 0.32 |
| පර්යේෂණ සඳහා වෙන් වූ ක්ෂේත්‍ර | 0.16 |
| නව වගාව (TRI 3000/4000) | 0.20 |
| නව වගාව (TRI 5000 මව් වගාව) | 0.40 |
| ගොඩනැගිලි, මාර්ග, තේ තවාන ආදිය | 0.92 |
| එකතුව | 2.0 |

මෙම මධ්‍යස්ථානය විසින් තලවකැලේ පිහිටි ප්‍රධාන කාර්යාලය හා එක්ව මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල තේ වගාකරුවන් වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටුකරන අතර ක්ෂේත්‍ර පරීක්ෂාවන්, තේ වගා පුහුණු වැඩ සටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ යනාදිය ඒ අතරින් ප්‍රධාන වේ. මෙම සියලු සේවාවන් මහා පරිමාණ තේ වගාකරුවන් හා කුඩා තේ වතු හිමියන් යන දෙපාර්ශවයටම ලබාදෙන අතර වගාකරුවන්ගේ අවශ්‍යතාවය මත ආයතනය තුළ දී හෝ ඉන් පිටතට දී අදාළ සේවා සපයනු ලැබේ. තේ වගා පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර වැඩසටහන්වල දී විශේෂයෙන්ම තේ තවාන් කළමනාකරණය, පස සංරක්ෂණය, සෙවණ වගාව, දළු නෙළීම, කප්පාදුව හා රෝග පලිබෝධ කළමනාකරණය පිළිබඳ වැඩි අවධානයක් යොමුකරන අතර දෙනියාය ප්‍රදේශයේ බහුලව වාර්තා වන තේ පඳුරු දුර්වල වීමේ තත්වය කළමනාකරණය කිරීම පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලබේ.

**ආයතනයේ මානව සම්පත**

1. කාර්ය මණ්ඩලය (2022.12.31 දිනට)
   - සී. ඊ. මුණසිංහ මයා - උපදේශක නිළධාරි/ආයතන ප්‍රධානී AR 1/ II ශ්‍රේණිය (කෘෂිකර්ම විද්‍යාවේදී - වයඹ විශ්වවිද්‍යාලය) (දර්ශනපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
   - එච්. බී. තරංගිකා මිය - ව්‍යාප්ති නිලධාරිනී - MA 4 / III ශ්‍රේණිය (ආහාර නිෂ්පාදන හා තාක්ෂණ කළමණාකරණ විද්‍යාවේදී - වයඹ විශ්වවිද්‍යාලය) (ව්‍යාපාර කළමණාකාර පශ්චාත් උපාධි - කොළඹ විශ්වවිද්‍යාලය)

- ඩබ්. එස්. ටී. විජේසිංහ මිය - ස්ථාන සහකාර - MA 1 – 2 / IV ශ්‍රේණිය
  (සිවිල් ඉංජිනේරු ඩිප්ලෝමා)
- යූ ඩබ් පී කුමාර මයා - සංවර්ධන නිළධාරි - 111 ශ්‍රේණිය
  (කලා උපාධිදාරි - රුහුණ විශ්වවිද්‍යාලය )
- එම්. ඩී. චන්දන මයා - රියැදුරු - PL 11 ශ්‍රේණිය
- ආර් පී ශිරාන් මයා - ආගන්තුක නිවාස භාරකරු - PL 111 ශ්‍රේණිය

2. ආයතනයේ ශ්‍රම බලකාය
   ආයතනය තුළ සේවයේ නියුතු මුළු චෙක්රෝල් කම්කරුවන් සංඛ්‍යාව 04 කි.

**ආයතනයේ කාර්යසාධනය (2022 වර්ෂය)**

**1. උපදෙස් හා ව්‍යාප්ති කටයුතු**

කොවිඩ් 19 වසංගත තත්වය හා අර්බුදකාරි වාතාවරණය හමුවේ 2022 වර්ෂය තුළ මෙම මධ්‍යස්ථානයෙන්, පහත දැක්වෙන උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සිදුකරන ලදි (වගුව 02).

**වගුව 2. උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම් 2022**

| | ක්‍රියාකාරකම / අයිතමය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ආයතනයට පැමිණෙන්නන් හට සේවය සැපයීම (වැවිලිකරුවන් / කුඩා තේ වතු හිමියන්/ශිෂ්‍යයන්/වෙනත් ) | | 891 |
| 2 | ලිපි ලේඛන සැපයීම (උපදෙස් හා ව්‍යාප්ති /පරිපාලන) | | 501 |
| 3 | මහා පරිමාණ වතු හා කුඩා තේ වතු සඳහා ක්ෂේත්‍ර ඉඩම් පරීක්ෂාවන් (ඉල්ලුම මත හා නිතිපතා සිදුවන) හා ව්‍යාප්ති කටයුතු | | 78 |
| 4 | පුහුණු වැඩ සටහන් /සම්මන්ත්‍රණ /සාකච්ඡා /ක්ෂේත්‍ර දින / ආදර්ශන /අධ්‍යාපනික /රැස්වීම් | | 26 |
| 5 | ප්‍රකාශන පත්‍රිකා බෙදා හැරීම | නොමිලේ | 130 |
| | | මුදලට | 24 |
| 6 | පාංශු පී. එච්. පරීක්ෂාවන් | | 587 |
| 7 | පාංශු කාබන් පරීක්ෂාව | | - |
| 8 | වටපණු පරීක්ෂාවන් | | 49 |
| 9 | අලෙවිකරන ලද සහ ආයතනයේ තවානට නිකුත් කළ රිකිලි අතු කොටස් (Cuttings) | | 12854 |
| 10 | වානිජ තේ තවාන් පරීක්ෂණ | | - |
| 11 | බෝග සායන ජංගම සේවා | | 10 |
| 12 | පර්යේෂණ ක්ෂේත්‍ර පරීක්ෂාවන් (අත්හදාබැලීම්, අනුවර්තී පර්යේෂණ හා මව් වගාවන්) | | 39 |
| 13 | අලෙවි කළ තේ පැළ ප්‍රමාණය | | 12615 |

**ප්‍රධාන උපදෙස් හා ව්‍යාප්ති කටයුතු 2022 -** (ව්‍යාපෘතිය D/ADV)

- මාතර දිස්ත්‍රික්කයට අයත් දෙණියාය හා කොළවෙණිගම තේ පරීක්ෂක කොට්ඨාශ තුළ කුඩා තේ ඉඩම් ආශ්‍රිතව වාර්තා වන තේ පඳුරු දුර්වල වීමේ තත්වය පාලනය කිරීම පිළිබඳව, එම කොට්ඨාශ තුළ කුඩා තේ වතු සමිති නියෝජිතයින් ඉලක්ක කර ගනිමින් ක්ෂේත්‍ර ගත පුහුණු වැඩසටහන් හා දැනුවත්කිරීම් ක්‍රියාත්මක කරන ලදි.

- දෙනියාය තේ පර්යේෂණායතනය විසින් මාතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණායතනයේ පාංශු හා ශාක පෝෂණ අංශයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරන ලද "තේ ඉඩම් සඳහා උචිත කාබනික පොහොර වර්ග පිළිබඳ අනුවර්තී පර්යේෂණ" 07 ක් සාර්ථකව අවසන් කරනු ලැබීය.

- මාතර දිස්ත්‍රික්කයේ තේ කර්මාන්තයේ නියුතු සමුපකාර සමිතිවල සාමාන්‍යාධිකාරිවරුන්ණි කළමනාකරුවන් හා කම්හල් පාදක නිළධාරීන් සඳහා "තේ වගාව හා තවාන් ආශ්‍රිතව පිරිවැය කළමනාකරණය හා ඵලදායිතාවය ඉහළ නැංවීමට නිර්දේශිත උපායමාර්ගික ක්‍රියාකාරකම්" යන මාතෘකාව යටතේ දේශනයක්, මධ්‍යස්ථාන ප්‍රධානී සී ඊ මුණසිංහ මහතා විසින්, 2022 මැයි 18 දින පවත්වන ලදී.

- මාතර දිස්ත්‍රික්කයේ නමුණුකුල වැවිලි සමාගමට අයත් සියලුම වතුයායන්වල වතු අධිකාරිවරුන්, සහකාර වතු අධිකාරිවරුන් හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා තේ නැවත වගාව පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් 2022 ජූනි 23 දින පවත්වන ලදී.

- අන්තර්කාලීන පොහොර නිර්දේශයක් ලෙස තේ පර්යේෂණායතනය විසින් හඳුන්වාදෙන ලද T1240 පොහොර නිර්දේශය පිළිබඳව, මාතර දිස්ත්‍රික්කයේ කුඩා තේ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාරය නිරීක්ෂණය කිරීම සඳහා නියැදි සමීක්ෂණයක් උපදෙස් හා ව්‍යාප්ති අංශයේ අංශ ප්‍රධානීගේ මගපෙන්වීම යටතේ දෙනියාය තේ පර්යේෂණායතනය විසින් සිදුකරනු ලැබීය.

- "ගුණාත්මය උදෙසා සහකම්පනය" වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ තේ දළු ගුණාත්මය ඉහළ නැංවීම සඳහා තේ මණ්ඩලය විසින් 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සංවිධානය කරන ලද වැඩසටහන් මාලාව සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය දෙනියාය තේ පර්යේෂණායතනය විසින් සපයන ලදී.

- තේ පර්යේෂණායතනයේ ජංගම විද්‍යාගාර සේවාව මගින් පාංශු විශ්ලේෂණ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා මාතර දිස්ත්‍රික්කය ආවරණය කරමින් විශේෂ බෝග සායන වැඩසටහන් 06 ක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ, තේ මණ්ඩලයේ හා තේ කම්හල් හිමියන්ගේ සහය ඇතිව දෙනියාය තේ පර්යේෂණායතනය විසින් 2022 නොවැම්බර් හා දෙසැම්බර් කාලය තුළ පවත්වන ලදී.

- තේ වගාවේ පස හා පොහොර භාවිතයේ නවතම නිර්දේශ පිළිබඳව ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල පුද්ගලික පොහොර අලෙවිකරන සමාගම්වල නියෝජිතයින්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා විශේෂ ව්‍යාප්ති වැඩසටහනක් දෙනියාය තේ පර්යේෂණායතනය විසින් 2022 දෙසැම්බර් 15 දින පවත්වන ලදී.

**1. පර්යේෂණ අත්හදා බැලීම් (Research Trials)**

අදාල පර්යේෂණ අංශ හා එක්වී පහත සඳහන් පර්යේෂණ අත්හදා බැලීම සිදු කරමින් පවතී.

- ශාක ව්‍යාධිවේදී හා වටපණු අංශය
  ටී ආර් අයි 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදවල කඳ ගුල්ලා හා වටපණු හානියට ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ බිම් කැබලි 02 ක් දෙනියාය පරිශ්‍රය තුළ පවත්වාගන යනු ලබයි.

- ශාක අභිජනන අංශය
  1) ටී. ආර්. අයි. 5000 කාණ්ඩයේ අදියර III පර්යේෂණ බිම් කැබලි 04 ක් (LVP phase iii trials) දෙනියාය තේ පර්යේෂණායතන පරිශ්‍රයේ සහ ඉන්දොළ, කිරුවානගඟ හා දෙණියාය යන වතුයායන් ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබයි.
  2) වැඩි දියුණු කළ බීජ තේ ක්ෂේත්‍ර 02 ක් (Improved seedling trials) කිරුවානගඟ වතුයායේ පවත්වාගන යනු ලබයි.
  3) බීජ තේ වර්ග ඇගයීමේ ක්ෂේත්‍රයක් (Seedling Evaluation Trial) වරාපිටිය ප්‍රදේශයේ කුඩා තේ ඉඩමක පවත්වාගන යනු ලබයි.

**2. අනුවර්තී පර්යේෂණ (Adaptive / Observation trials)** (ව්‍යාපෘතිය - D/ AR)

- ටී. ආර්. අයි. 5000 කාණ්ඩයේ නවතම තේ ප්‍රභේදවල යෝග්‍යතාවය නිරීක්ෂණය කිරීම සඳහා මොරවක හා අකුරැස්ස ප්‍රදේශවල කුඩා තේ ඉඩම් 02 ක් ආශ්‍රිතව ශාක අභිජනන අංශය හා එක්ව අනුවර්තී පර්යේෂණ 02 ක් පවත්වාගන යනු ලබයි.

- තේ වගාවේ පොහොර වර්ගයක් ලෙස දර අළු භාවිතා කිරීම පිළිබඳ අනුවර්තී පර්යේෂණයක් පාංශු හා ශාක පෝෂක අංශය හා එක්ව කිරුවානගඟ වතුයායේ පවත්වාගන යනු ලබයි.

- දෙනියාය ප්‍රදේශයේ බහුලව වාර්තා වන තේ පඳුරු දුර්වලවීමේ තත්වය තේ පර්යේෂණායතනයේ නිර්දේශයන් ට අනුකූලව පාලනය කරන ආකාරය විදහා දැක්වෙන වගා ආදර්ශන 02 ක් පල්ලේගම හා බෙවර්ලි ප්‍රදේශවල කුඩා තේ ඉඩම් 02 ක් තුළ පවත්වාගන යනු ලබයි.

**3. TRI 5000 කාණ්ඩයේ මව් පඳුරු ව්‍යාපෘතිය** (ව්‍යාපෘතිය - GL 340)

- ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවනට සපයාදීම සඳහා නවතම ටී. ආර්. අයි. 5000 කාණ්ඩයට අයත් 2018 ජුනි/ජූලි කාලසීමාවේ දී ස්ථාපනය කරන ලද අංක '84' හා '23/5' දරණ තේ ප්‍රභේදයන්ගේ පැළ 3682 ක් දෙනියාය තේ පර්යේෂණායතන පරිශ්‍රය තුළ නඩත්තු කරමින් පවතී.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් අලපලාදෙණිය හා රක්වාන පිහිටා ඇති යෝජිත මව් වගා ඉඩම් සහ තෝරාගත් කුඩා තේ ඉඩම් කිහිපයක් සඳහා දෙණියාය තේ පර්යේෂණායතන තවානේ නිෂ්පාදනය කරන ලද ටී. ආර්. අයි. 5000 කාණ්ඩයට අයත් තේ පැළ 3815 ක් ලබාදෙන ලදි.
- තේ පර්යේෂණායතනයේ මව් වගා සම්බන්ධීකාරක හා ශාක අභිජනන අංශය සමග එක්ව මාතර දිස්ත්‍රික්කය තුළ ටී. ආර්. අයි. 5000 කාණ්ඩයේ මව් වගා බිම් 06 ක (කිරුවානගඟ වතුයාය, දියදාව, කොටපොල, එරමුදුගොඩ, අලපලාදෙණිය හා මාවරල) අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී

**2. වැඩි දියුණු කළ බීජ තේ ව්‍යාපෘතිය** (ව්‍යාපෘතිය - GL 390)

- ශාක අභිජනන අංශය සමග එක්ව ක්ෂුද්‍රකලා තේ බීජ උයන් 03 ක් කිරුවානගඟ , විල්පිට හා ලංකාබෙරිය යන වතුයායන්වල ආරම්භ කරන ලද අතර ඒවායේ වැඩ කටයුතු අධීක්ෂණය සිදුකරනු ලබයි.

**ඉදිකිරීම්, යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව**

- සංචාරක නිවාසයේ බිත්ති වල තීන්ත ආලේප කිරීමේ වැඩකටයුතු ඉංජිනේරු අංශයේ අධීක්ෂණය යටතේ ආරම්භ කරන ලදී (ව්‍යාපෘතිය - C/ DENI).
- ආයතනයට අයත් තේ තවානේ විසිරි ජල සම්පාදන පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකරමින් පවතී (ව්‍යාපෘතිය - C/DENI).
- කාර්යාලය ඉදිරිපස ක්ෂේත්‍ර අංක 01 කොටසේ තේ නැවත වගාකිරීමේ කටයුතු ආරම්භ කරන ලදි (ව්‍යාපෘතිය - C/DENI).

**ප්‍රදේශයෙන් හඳුනාගත් විශේෂිත ගැටළු**

- ➢ දෙණියාය, කොළවෙණිගම හා බෙරලපනාතර යන තේ පරික්ෂක කලාප තුළ කුඩා තේ ඉඩම් කිහිපයක් ආශ්‍රිතව තේ පඳුරු දුර්වලවීමේ තත්වය පිළිබඳව වාර්තා වූ අතර, එම ඉඩම් නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකරන ලදී. පළිබෝධ හානි, තේ පඳුරු වයස්ගත වීම හා ඇතැම් නිර්දේශිත කෘෂිකාර්මික උපදෙස් ක්‍රියාත්මක නොවීම යන කාරණා මේ සඳහා

හේතු වී ඇති බව හඳුනාගන්නා ලද අතර, මෙම තත්වය පාලනය කිරිමට අවශ්‍ය උපදෙස් එම වගාකරුවන්ට ලබාදෙන ලදි.

**අස්වනු වාර්තා හා ආදායම් විස්තර**

2022 වර්ෂය තුළ අදායම හා එහි සංරචක පහත පරිදි වර්ග කළ හැක (වගුව අංක 3).

**වගු අංක 3. වාර්ෂික ආදායම හා එහි සංරචක 2022**

| | අයිතමය | ප්‍රමාණය | ආදායම (රු) |
|---|---|---|---|
| 01 | අමු තේ දලු අලෙවිය | කි ග්‍රෑම් 3,327 | 828,367.11 |
| 02 | ප්‍රකාශන අලෙවිය | 24 | 13,580.00 |
| 03 | තේ රිකිලි අලෙවිය | 5,575 | 8,362.50 |
| 04 | තේ පැළ අලෙවිය | 8,565 | 256,950.00 |
| 05 | පාංශු විශ්ලේෂණය (pH ) | 5,87 | 48,045.00 |
| 06 | ආගන්තුකයින් | 79 | 38,450.00 |
| 07 | විවිධ | - | 1,582.00 |
| | **මුළු ආදායම** | | **1,195,336.61** |

**ආයතනයට පැමිණි ආගන්තුකයන් (Visitors)**

2022 වර්ෂය තුළදී ආගන්තුකයන් 891 ක් ආයතනය වෙත පැමිණ ඇති අතර, එය පහත පරිදි වර්ග කළ හැකිය (වගුව 4).

**වගුව 4. ආයතනයට පැමිණි ආගන්තුකයින් - 2022**

| ආගන්තුකයින් කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| මහා පරිමාණ වතුවල වැවිලිකරුවන් | 10 |
| මධ්‍ය පරිමාණ වතු හිමියන් | 38 |
| කුඩා තේ වතු හිමියන් | 276 |
| රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල නිළධාරීන් | 138 |
| උසස් අධ්‍යාපන සිසුන් | 05 |
| පාසල් සිසුන් | 264 |
| වෙනත් | 160 |
| එකතුව | 891 |

කාලගුණ දත්ත (2022 වර්ෂය)

2022 වර්ෂයේ සාමාන්‍ය වර්ෂාපතනය මි. මි. 4026.8 ක් ලෙස වාර්තා වූ අතර එය පසුගිය වසරේ (2021) වර්ෂාපතනය (මි. මි. 4452.2) හා සැසඳීමේ දී මි. මි. 9ක අඩුවීමකි. 2022 වර්ෂයේ මාසික ඉහළම වර්ෂාපතනය මැයි මස දී වාර්තා වූ අතර, එම අගය මි. මී. 671.7 ක් විය. වසරේ අවම මාසික වර්ෂාපතනය ජූනි මස දී වාර්තා වූ අතර, එම අගය මි. මි. 141.4 කි. 2022 වසරේ සමස්ත වර්ෂා දින සංඛ්‍යාව 170 ක් වූ අතර එය පසුගිය 2021 වර්ෂයේ එම අගයට (වර්ෂා දින 182) සාපේක්ෂව 7 % ක අඩුවීමකි. තව ද, 2022 වසරේ සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් 26.0 ($^0$C) ලෙස වාර්තා විය.

**විවිධ ක්‍රියාකාරකම්**

**1. විශේෂ ජංගම සේවා**

දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය මඟින්, 2022 මාර්තු මස 19/20 සහ දෙසැම්බර් මස 11 දින සංවිධානය කරන ලද විශේෂ ජංගම සේවා වැඩසටහන් 02 ක් සඳහා දෙනියාය තේ පර්යේෂණායතනය විසින් තේ වගාව ආශ්‍රිත කරුණු පිළිබඳව ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරිම හා කුඩා තේ ඉඩම් හිමියන් දැනුවත් කිරිම සිදුකරන ලදි.

## කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය

## හැරන් ජයවීර
## MBA (Malaysia) CMI (UK) CIPM (Sri Lanka)


# ස්ථානභාර නිලධාරි

**හැඳින්වීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම, නිවිතිගලකැලේ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතන පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය මඟින්, උපදෙස් හා ව්‍යාප්ති සේවා සිදුකරන අතර එයට අමතරව පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව පාංශු පී.එච් විශ්ලේෂණය සඳහා කුඩා විද්‍යාගාරයක් ද ස්ථාපනය කර ඇත.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ, අංශ ප්‍රධානිගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන් හි සමාගම් වතු, ඉඩම් හිමි වැවිලිකරුවන්ගේ වතු හා කුඩා තේ වතු හිමිකරුවන් ට තේ වගා පිළිබඳ දැනුම, කුසලතා වර්ධනය කිරීම සහ නව තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර චාරිකා, ක්ෂේත්‍ර දින, තේ වගා වැඩමුළු ආදි වැඩසටහන් රාශියක් සිදුකරනු ලබයි. මේ යටතේ, වැඩි අවධානයක් තේ වගාවේ පාංශු සංරක්ෂණය, සෙවණ කළමනාකරණය, රෝග හා පළිබෝධ පාලනය, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යන අංශ සඳහා යොමු කර ඇත.

**ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදය (RTEF)**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක කොට්ඨාශ සියල්ලම ආවරණය වන පරිදි ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද දෙකක් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ සංවර්ධන සමිති සාමාජිකයන්ගේ සහභාගීත්වය ඇතුව සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ කළුතර, උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ දී සාර්ථකව පවත්වන ලද අතර ඉන් පළමු සංසදයේ දේශන දෙකක් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කෙරුණි. මෙම සංසදයන් තුළ දී සාකච්ඡා කළ විෂය ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

- පහතරට කලාපයේ කුඩා තේ ඉඩම්වල විසිරි ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකාවේ අගය එකතු කළ තේ නිෂ්පාදනය හා ඊට අදාළ වන තේ ප්‍රභේදයන්
- පහතරට කලාපයේ කුඩා තේ ඉඩම්වල පාංශු සාරවත්බව කළමනාකරණය
- සංවාද සන්නිවේදනය මඟින් තේ දළු අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම පිළිබඳ දැනුම්වත් වීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කරන්නේ කෙසේද?
- නිමි තේවල ගුණාත්මය සඳහා තේ පත්‍රයේ අඩංගු රසායනික සංයෝගවල සංයුතිය සිදු කරනු ලබන බලපෑම

**ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම (RSC)**

කළුතර, රත්නපුර, සහ කෑගල්ල දිස්ත්‍රික්කයන් සඳහා සිදු කරනු ලබන ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම (RSC) මාර්ගගත ක්‍රමය ඔස්සේ 2022 ජූලි මස 12 වන දින, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ රත්නපුර සහ කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයන් එක්ව, ඉතාමත් සාර්ථකව පවත්වන ලදී. "තේ වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණය සහ ක්ෂේත්‍ර භාවිතයන් යාන්ත්‍රීකරණය තුළින් නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම" යන තේමාව යටතේ "ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණය සහ එහි ආර්ථික ප්‍රතිලාභ","තේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් යාන්ත්‍රීකරණය සහ එහි ආර්ථික ප්‍රතිලාභ" යන මාතෘකා යටතේ දේශන පවත්වන ලදී. මෙම කමිටුව සඳහා කළුතර, රත්නපුර, සහ කෑගල්ල දිස්ත්‍රික්කවල සමාගම් වතු

අංශය නියෝජනය කරමින් සාමාන්‍යාධිකාරිවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, වතු කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන් සහ වතු අධිකාරිවරුන් සහභාගී විය.

**පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර දින**

- ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා ඇතුළු කාර්යය මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ රත්නපුර මධ්‍යස්ථානයේ නිලධාරින්ගේ සහය ඇතුව, කොටගල වැවිලි සමාගමේ පහතරට කලාපයේ පිහිටි වතුවල විධායක නිලධාරින් ඇතුළු සියළුම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා ක්ෂේත්‍ර දිනයක් සාර්ථකව පවත්වන ලදී. මෙහිදී ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් යාන්ත්‍රිකරණය (දළු නෙලීම, කප්පාදු කිරිම, වලවල් හෑරිම), පැළ සිටුවීම සහ පාළු සිටුවීම, පාංශු සංරක්ෂණ ක්‍රම, කප්පාදු අතු වැළලීම, සහ තේ ක්ෂේත්‍රයන් මුල්ලු කිරිම වැනි ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානයක් ලබා දෙන ලදී.
- ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා ඇතුළු කාර්යය මණ්ඩලය, සමාගම් වතු, ඉඩම් හිමි වැවිලි කරුවන්ගේ වතු හා කුඩා තේ වතු හිමියන්ගේ නිමි තේ වල ප්‍රමිතිය ඉහල නැංවීම සඳහා සිදු කරනු ලැබූ දළු නෙලීම පිළිබඳ පුහුණු වැඩ සටහන් සාර්ථකව පැවැත්වීම සඳහා ක්‍රියාකාරිව දායකත්වය ලබාදෙන ලදී.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව නිමි තේ ගුණාත්මය ඉහළ නැංවීමේ B-60 ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරනු ලැබූ "සහකම්පනය" පුහුණු වැඩසටහන් මාලාවක් සඳහා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා සහ ව්‍යාප්ති නිලධාරිනී ක්‍රියාකාරිව සහභාගී විය. මේ සඳහා කලාපයේ තේ කම්හල් හිමියන්, කළමණාකරුවන්, දළු සැපයුම් කරුවන් සහ කුඩා තේ වතු හිමියන් සහභාගී විය.
- ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා ඇතුළු කාර්යය මණ්ඩලය, මධ්‍යම පරිමාණ තේ වගා කරුවන් සඳහා දළු නෙලීම සහ යාන්ත්‍රීකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් මාලාවක් සාර්ථකව පැවැත්වීම සඳහා ක්‍රියාකාරීව දායකත්වය ලබාදෙන ලදී.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉල්ලීම පරිදි සහනාධාර ලබා ගන්නා වාණිජ තේ තවාන් සමීක්ෂණය සඳහා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා සහ ව්‍යාප්ති නිලධාරිනී ක්‍රියාකාරිව සහභාගී විය.
- ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීතුමා, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ මණ්ඩලය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරිව දායකත්වය ලබාදෙන ලදී.

**උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | වැඩසටහන් ගණන |
|---|---|
| උපදෙස් සමීක්ෂණ වාර්තා | 71 |
| ක්ෂේත්‍ර චාරිකා<br>(සමාගම් වතු/ ඉඩම් හිමි වැවිලි කරුවන්ගේ වතු/ කුඩා තේ වතු) | 63 |
| පුහුණු වැඩසටහන් /ක්ෂේත්‍ර දින | 16 |
| ප්‍රකාශන විකුණුම් | 11 |
| පස් පරික්ෂා කිරීම ( පාංශු pH) | 58 |
| වාණිජ තේ තවාන් සමීක්ෂණ | 05 |
| 5000 කාණ්ඩයේ මව් ශාක ව්‍යාපෘති චාරිකා | 14 |
| අනුවර්තී පර්යේෂණ චාරිකා | 37 |
| සහභාගී වූ රැස්වීම් | 37 |
| වෙනත් චාරිකා | 06 |

**අනුවර්තී පර්යේෂණ සහ ආරම්භ කිරීම්**
තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව, කළුතර දිස්ත්‍රික්කය තුළ TRI 5000 කාණ්ඩය සඳහා අනුවර්තී පර්යේෂණ තුනක් පැලවත්ත, හොරණ, මීගහතැන්න යන ප්‍රදේශවලින්, තෝරා ගත් කුඩා තේ හිමියන් තිදෙනෙකුගේ ක්ෂේත්‍ර තුළ ස්ථාපනය කර ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.

**අත්හදා බැලීම්**
- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ තලවකැලේ සහ රත්නපුර මධ්‍යස්ථානවල පිරිසැකසුම් තාක්ෂණ අංශයේ සහය ඇතිව කලාපයේ තේ පරික්ෂක කොට්ටාශ තුනක තේ කර්මාන්තශාලා පහක් පාදක කර ගනිමින් Net Out Turn (NOT) සමීක්ෂණය සඳහා දත්ත ලබා ගැනීම සිදු කරනු ලබයි.
- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහයෝගය ඇතිව යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ අත්හදා බැලීමක් මීගහතැන්න සොයිසා වතුයායේ දී ස්ථාපනය කර ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.
- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ තලවකැලේ සහ රත්නපුර මධ්‍යස්ථානවල කීට විද්‍යා අංශයේ සහයෝගයෙන් තේ වගාවට හානි කළ වටපණු ගහනය පිළිබඳ සිදු කළ අත්හදා බැලීම මහකළුපහන ප්‍රදේශයේ ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.

**ආදර්ශ වගාබිම**
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ රත්නපුර මධ්‍යස්ථානයේ ශාක අභිජනන අංශයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව, කළුතර ප්‍රදේශයේ තේ වගා කරුවන්ගේ, නව ප්‍රභේද පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා, TRI 4000 සහ TRI 5000 කාණ්ඩ වගා කරන ලද තේ වගා ආදර්ශයක් ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර ඇත.

**මව් ශාක වැඩසටහන**
තේ වගා කරුවන් අතර නව තේ ප්‍රභේදයන් බෙදාහැරීම තේ කර්මාන්තය නගා සිටුවීම සඳහා සිදු කරනු ලබන එක් වැදගත් සේවාවකි. තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහ මව් ශාක වැඩසටහනේ සම්බන්ධීකාරක වරයාගේ සහයෝගය ඇතිව වෝගන් වතුයායේ ආරම්භ කළ TRI 5000 කාණ්ඩයේ මව් ශාක ක්ෂේත්‍රය සහ පැළ තවාන ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.

කලාපීය පාර්ශ්වකරුවන්ට උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැපයීමේ අරමුණින්, තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහ මව් ශාක වැඩසටහනේ සම්බන්ධීකාරකවරයාගේ සහයෝගය ඇතිව නිවිතිගලකැලේ රබර් පර්යේෂණායතන පරිශ්‍රය තුළ අක්කර 0.58ක පමණ භූමි ප්‍රමාණයක TRI 5000 කාණ්ඩයේ 12/11, 23/5 අනුවර්තී කාණ්ඩයන් සහ TRI 4049 ප්‍රභේධයේ තේ පැළ දෙදහස් නවසියයක් (2900) පමණ ස්ථාපනය කර ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.

**බීජ උද්‍යාන වැඩසටහන**
තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහයෝගය ඇතිව කළුතර දිස්ත්‍රික්කය තුළ බීජ උද්‍යාන පිහිටුවීම සඳහා තෝරා ගත් වෝගන් වතුයායේ සහ රයිගම් වතුයායේ, ඉඩම් කොටස් දෙකක බීජ උද්‍යාන ස්ථාපනය කර, ස්ථානභාර නිලධාරීතුමාගේ අධීක්ෂණය යටතේ පවතී.

**විශේෂ සිදුවීම්/රැස්වීම්**
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු සහ දිස්ත්‍රික් සංවර්ධන කමිටු සඳහා ස්ථානභාර නිලධාරීතුමා ක්‍රියාකාරීව සහභාගී විය.

**යටිතල පහසුකම් සංවර්ධන හා නඩත්තුව**
ආයතන ගොඩනැගිල්ල අළුත් වැඩියාකිරීම සහ නඩත්තු කිරීම, ආයතන වටපිටාව පිරිසිදු කිරීම, ආයතනයේ වාහනය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම, 2022 වර්ෂය තුළ සිදු කරනු ලැබූ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන හා නඩත්තු ක්‍රියාරකම් ලෙස දැක්විය හැක.

නව ප්‍රදර්ශනාත්මක පුවරු හයක් ස්ථාපනය කිරීම මගින්, ව්‍යාප්ති මධ්‍යස්ථානයේ තොරතුරු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමට පියවර ගන්නා ලදි.

**වෙනත් ක්‍රියාකාරකම්**
රජයේ වැවිලි ආයතන නිලධාරින් සඳහා, වැවිලි අමාත්‍යංශයේ පවත්වනු ලැබූ රුස්වීමක් සඳහා ස්ථානභාර නිලධාරිතුමා සහභාගී විය.

ශ්‍රී ලංකා ප්‍රත්පත්ති අධ්‍යයන ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ ලාංකීය තේ සඳහා භූගෝලීය දර්ශකය (GI) ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පැවති හඳුන්වාදීමේ වැඩසටහනට, 2022 නොවැම්බර් 22 වන දින මධ්‍යස්ථානයේ ව්‍යාප්ති නිලධාරිනිය සහභාගී විය.

දේශිය සහ විදේශිය සංචාරකයන්, ශිෂ්‍යයන් සහ අනෙකුත් නරඹන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ, පාංශු හා ශාක පෝෂන අංශය, උපදෙස් හා ව්‍යාප්ති අංශයේ මගපෙන්වීම යටතේ කළුතර දිස්ත්‍රික්කයේ තේ පරික්ෂක කොට්ටාශ දෙකක (මීගහතැන්න සහ හොරණ) කුඩා තේ වතු හිමියන් අට දෙනෙකු පදනම් කර ගනිමින් T1240 පොහොර මිශ්‍රණය පිළිබඳ සමීක්ෂණයක් සිදු කර, දත්ත රුස් කිරීම සාර්ථකව සිදු කරන ලදි.

**අමුත්තන්ගේ පැමිණීම**
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් පහත සඳහන් පරිදි සාරාංශ ගත කර ඇත.

| කාණ්ඩය | ප්‍රමාණය |
|---|---|
| වැවිලි සමාගම් | 09 |
| කුඩා වතු හිමියන් | 44 |
| විශ්වවිද්‍යාල සිසුන් | 05 |
| කෘෂි විද්‍යාල සිසුන් | 06 |
| තේ පර්යේෂණ ආයතනයේ නිලධාරින් | 11 |
| එකතුව | 75 |

**ආදායම**
කළුතර තේ පර්යේෂණ ආයතනය ලැබූ ආදායම හා ඊට අදාළ ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැක.

| ක්‍රියාකාරකම් | ආදායම (රු.) |
|---|---|
| ප්‍රකාශන විකිණීම | 12,440.00 |
| පස් පරීක්ෂා කිරීම | 8,090.00 |
| සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම | 5,500.00 |
| තේ දළු ආදායම | 2,710.00 |
| එකතුව | 28,740.00 |

**වාර්ෂික කාළගුණය**

2022 වර්ෂය සඳහා සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 304.96ක් වූ අතර වැඩිම වර්ෂාපතනය ඔක්තෝම්බර් මාසයේදී (මි.මී 304.94) නිරික්ෂණය වූ අතර අවම වර්ෂාපතනය ජනවාරි මාසයේ දී (මි.මී 65.9) වාර්තා විය.

# සම්මාන, ප්‍රතිපාදන, අධ්‍යයන වැඩසටහන්, ප්‍රකාශන සහ විශේෂ ඉදිරිපත් කිරීම්

## කෘෂි ආර්ථික විද්‍යා අංශය

**අධ්‍යයන වැඩසටහන්**

පර්යේෂණ නිලධාරිනී එච්.එම්.සී.පී. පිලපිටිය මෙනවිය ජපානයේ සාගා විශ්වවිද්‍යාලයේදී සිය ආචාර්ය උපාධිපාඨමාලාව සාර්ථකව නිමකර 2022 මාර්තු 29 වැනි දින නැවත රාජකාරි ආරම්භ කළාය.

**ප්‍රකාශන**

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී, කේ.ඩබ්ලිව්.එන්. නදීෂානි, ආර්.එම්.ඒ.ටී. රත්නායක සහ ඩබ්ලිව්.ටී.ආර්.පී. විමලරත්න. ශ්‍රී ලංකාවේ කුඩා තේවතු අංශයේ සේවක හිඟය පිළිබඳ විමර්ශනය. Sri Lanka Journal of Tea Scienceහි ප්‍රකාශනය සඳහා ඉදිරිපත්කර ඇත.

කේ.ඩබ්ලිව්.එන්. නදීෂානි, එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී, ජේ.ගුණතිලක. ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ තේ පදනම් කරගත් කුඩා තේවතු හිමියන්ගේ පද්ධති. ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික සංගමයේ 16 වැනි වාර්ෂික පර්යේෂණ සංසදයේ ප්‍රකාශනය සඳහා ඉදිරිපත්කරන ලදී.

වී. එස් සිධාකරන්, එම්.ඒ විජේරත්න, එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී, පී. එස් ප්‍රදීප්, කේ. පී ලක්මාලි, ආර්. මුරලිදාසන් 2013 සිට ජාතික තේ නිෂ්පාදනය පහත වැටීම: සාක්ෂි මත පදනම් වූ විශ්ලේෂණය. 2022 දෙසැම්බර් 16 වැනි දින පවත්වන ලද 240 වැනි මහා වතු අංශය සඳහා වූ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය

චමිලා පිලපිටිය සහ සාලිය ද සිල්වා. *Camellia Sinensis* ජපානයේ නව්‍ය තේ සැකසීම: ශ්‍රී ලංකා තේ කර්මාන්තය සඳහා පාඩම්. TRI UPDATEහි ප්‍රකාශනය සඳහා ඉදිරිපත් කරන ලදී.

**විශේෂ ඉදිරිපත්කිරීම්**

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී තේ නිෂ්පාදන පිරිවැය සහ ලාභදායිතාවය පිළිබඳව තේ ක්ෂේත්‍රයට අදාළ ආයතනවල නිලධාරීන් සඳහා වැවිලි අමාත්‍යාංශයේදී ඉදිරිපත් කිරීමක් (ජනවාරි 4 වැනි දින) සිදුකරන ලදී.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී කුඩා තේ ඉඩමක ආදායම සහ වියදම පිළිබඳ විශ්ලේෂණයක් රත්නපුර RTF හි මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කළාය. (මාර්තු 28)

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී විසින් තේ ඉඩම්වල පාංශු සාරවත් කළමනාකරණ පිළිවෙත්වල ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ ඉදිරිපත් කිරීමක් රත්නපුර RSC හිදී මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. (ජූලි 15)

කේ.ඩබ්ලිව්.එන්.නදීශානි විසින් ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ පහතරට ප්‍රදේශයේ තේ ආශ්‍රිත වගා ක්‍රම සහ ආකෘති නිර්මාණය සහ ඉඩම් ආවරණ ගතික වෙනස්කම් පිළිබඳව ඉදිරිපත් කිරීමක් පේරාදෙණිය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පෘථිවි විද්‍යා අධ්‍යයන මණ්ඩලයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා ඉදිරිපත් කරන ලදී. (ජූලි 26) .

එච්.එම්.සී.පී. පිලපිය විසින් (අගෝස්තු 19) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ශ්‍රවණාගාරයේ දී තේ අපනයනකරුවන් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ තේ පර්යේෂණායතනයේ නිලධාරීන් සඳහා "නව වෙළඳපොළට නව නිෂ්පාදන -ශ්‍රී ලංකාවේ තේ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා මාර්ග" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී විසින් ඒකාබද්ධ ශාකපෝෂක කළමනාකරණ ක්‍රමවේද භාවිතයේ ආර්ථික වැදගත්කම පිළිබඳ දේශනයක් තේ පර්යේෂණායතනයේ පහතරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ත මධ්‍යස්ථානයේ (සැප්තැම්බර් 9)ශ්‍රවණාගාරයේ පැවත පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (කුඩාතේ වතු අංශය) හි දී ඉදිරිපත් කරන ලදී. .

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී විසින් තේ වතු තක්සේරු කිරීමේදී සලකා බැලිය යුතු කරුණු පිළිබඳව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉදිරිපත් කිරීමක් (ඔක්තෝබර් 29) සිදුකරන ලදී.

එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී විසින් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී (නොවැම්බර් 2) කෘෂිකාර්මික ආර්ථික විද්‍යා අංශයේ නව පර්යේෂණ ක්ෂේත්‍ර පිළිබඳ ඉදිරිපත් කරන ලදී.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී විසින් පොහොර භාවිතය සහ යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ ආර්ථික විශ්ලේෂණයක් පිළිබඳ නුවරඑළිය RTEF සංසදයේදී (දෙසැම්බර් 13) ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

**විවිධ ක්‍රියාකාරකම්**

**කමිටු සාමාජිකයන්**

ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතියේ සමාලෝචන කමිටු සාමාජිකාවක් ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකාවක් ලෙෂ සේවය කරන ලදී.

ජාතික විද්‍යා පදනම විසින් පවත්වනු ලබන ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණය -2020 සඳහා තේ පර්යේෂණ ආයතනයේ සම්බන්ධකයෙකු ලෙස ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී සේවය කරන ලදී.

ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී NASTEC විසින් පවත්වනු ලබන ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණ -2020 සඳහා තේ පර්යේෂණ ආයතනයේ සම්බන්ධකයෙකු ලෙෂ සේවය කරන ලදී.

ආචාර්ය එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී තාක්ෂණික ඇගයීම් කමිටු දෙකෙහි (හන්තාන විද්‍යාගාර සහ කෘෂි ආර්ථික අංශය ප්‍රතිසංස්කරණය කිරීම) සභාපතිනිය ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී කොළඹ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයේ පර්යේෂණ දීමනා අනුකමිටු සාමාජිකාවක් ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී 2021 මාර්තු සිට 2024 පෙබරවාරි දක්වා කාලය සඳහා වන වගා අංශයේ ජාතික කමිටුවේ කමිටු සාමාජිකාවක් ලෙස කටයුතු කරන ලදී.

**වාර්තා**

ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම උදෙසා එහි පාර්ශවකරුවන්ට පවතින ගැටළු හා යෝජිතවිසඳුම් සාකච්ඡා කිරීම පිළිබඳ වාර්තාවක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

TRI ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා යෝජනාවක් සකස් කිරීම

තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායේ විකල්ප ආදායම් උත්පාදන කටයුතු සඳහා යෝජනාවක් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ වැවිලි බෝග සඳහා ග්ලයිෆොසේට් භාවිතය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

ආර්පීසී සහ තේ කම්හල් මත සමාජ ආරක්ෂණ බද්දෙහි (එස්එස්එල්) බලපෑම පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

වන්දි ගණනය කිරීම් පිළිබඳ වාර්තා (කෝට්ලොජ් වත්ත, එක්කරුල්ල වත්ත, පාර්ක් වත්ත, කැටබූල වත්ත, දවුලගල කුඩා තේ වතු හිමියෙකුගේ ඉඩම) සකස් කිරීම

ග්ලිරිසීඩියා වගාව සඳහා තේ ඉඩම් උප බදු දීමේ ඉල්ලීම පිළිබඳ නිරීක්ෂණ වාර්තාවක් සකස් කිරීම

මධ්‍යම පළාත් ප්‍රාදේශීය භෞතික සැලැස්ම සකස් කිරීම සඳහා තේ ආශ්‍රිත දත්ත ඇතුළත් වාර්තාවක් 2035 සකස් කිරීම

තේ සැකසුම් අංශයේ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් පිළිබඳ යෝජනාවක් සකස් කිරීම

අමාත්‍යාංශයේ විශේෂ ව්‍යාපෘති යටතේ "ශ්‍රී ලංකාවේ නව්‍ය තේ නිෂ්පාදකයින් පිළිබඳ මූලික අධ්‍යයනය" පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ තේ වගාකරුවන් සඳහා පොහොර සහනාධාරය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

2015-2021 කාලය තුළ කල් දැමූ සහ අත්හැර දැමූ ව්‍යාපෘති පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

**රැස්වීම්/සංසද සඳහා සහභාගී වීම්**

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී පෙබරවාරි 8 වන දින මධ්‍යම පළාත් සංවර්ධන සැලසුම සකස් කිරීම සම්බන්ධයෙන් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද රැස්වීමට සහභාගී වූවාය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී අප්‍රේල් 1 වැනි දින තේ පර්යේෂණ ආයතනයේ මැදරට පර්යේෂණ සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේ පැවති මහනුවර ප්‍රාදේශීය තාක්ෂණික ව්‍යාප්ති සංසදය (RTEF) සඳහා සහභාගී විය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී සහ එච්.එම්.සී.ජී. පිලපිටිය 2022 අගෝස්තු 19 වැනි දින ශ්‍රී ලංකා තේ මණ්ඩල ශ්‍රවණාගාරයේ දී "නව නිෂ්පාදන නව වෙළඳපොළට - ශ්‍රී ලංකාවේ තේ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා මාර්ගː ජපානයෙන් තීක්ෂණ බුද්ධිය" පිළිබඳ ඉදිරිපත් කිරීමකට සහභාගී විය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී  සහ එච්.එම්.සී.ජී. පිලපිටිය ඔක්තොම්බර් 29 වන දින මාර්ගගතව පැවති ආර්ථිකමිතික ආකෘති නිර්මාණය පිළිබඳ වැඩමුළුවට සහභාගී විය.

එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී  නොවැම්බර් 02 වන දින තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ පැවති 191 වන අංශ ප්‍රධාන රැස්වීමට සහභාගී විය.

එච්.එම්.සී.ජී. පිලපිටිය නොවැම්බර් 30 වැනි දින මහනුවර Okray හෝටලයේ පැවති Ceylon Tea CI ලියාපදිංචිය පිළිබඳ කලාපීය වැඩමුළුවට සහභාගී විය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී දෙසැම්බර් 12 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී පැවැත්වූ"ශ්‍රීලංකාවේ තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම උදෙසා එහි පාර්ශවකරුවන්ට පවතින ගැටළු හා යෝජිතවිසඳුම් සාකච්ඡා කිරීම"පිළිබඳ රැස්වීමකට සහභාගි විය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී සහ එච්.එම්.සී.ජී. පිලපිටිය දෙසැම්බර් 16 වැනි දින තේ පර්යේෂණායතන ශ්‍රවණාගාරයේ පැවති E & E සංසදයට සහභාගී විය.

එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී දෙසැම්බර් 20 වැනි දින හන්තාන රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානයේ පැවති RTEF සඳහා සහභාගී විය.

එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී දෙසැම්බර් 21 වැනි දින තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ පැවැති වතු පිළිබඳ උපදේශක කාරක සභාවට සහභාගි විය.

එච්.ඩබ්ලිව්. ශ්‍යාමලී දෙසැම්බර් 25 වැනි දින අගමැති කාර්යාලය විසින් සංවිධානය කරන ලද ජාතික බලශක්ති විභවය සහ උපාය මාර්ග පිළිබඳ රැස්වීමට සහභාගී විය (මාර්ගගත ක්‍රමය ට)

ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) ලිමිටඩ් හි මෘදුකාංග සංවර්ධන කණ්ඩායම සමඟ දෙසැම්බර් 28 වන දින පැවති රැස්වීමට එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී සහභාගී විය.

එච්. ඩබ්ලිව්.ශ්‍යාමලී දෙසැම්බර් 30 වැනි දින තේ පර්යේෂණායතනයේ දී වතු ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීමට පැවැති රැස්වීමට සහභාගි වූවාය.

තේ කර්මාන්තයේ සංවර්ධන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද, දැනට පවතින පොහොර නිර්දේශ සමාලෝචනය කිරීම සහ තේ සඳහා පොහොර භාවිතය පිළිබඳ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ ස්වාධීන කමිටුවේ දෙමුහුන් රැස්වීම, Net out turn පිළිබඳ මාර්ගගත ක්‍රමය ට පැවති රැස්වීම් සඳහා එච්. ඩබ්ලිව්.ශ්‍යාමලී සහභාගී වූවාය.

**ශිෂ්‍ය අධීක්ෂණය**
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂිකාවක් වන ඩබ්ලිව්.එම්.ඒ.එම්.වීරසිංහ ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී මහත්මියගේ අධීක්ෂණය යටතේ සිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කළාය.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ගණිත විද්‍යා අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂක ටී.ඩබ්ලිව්.පී. ජේ. ඥානසිරි ආචාර්ය එච්.ඩබ්ලිව්.ශ්‍යාමලී මහත්මියගේ අධීක්ෂණය යටතේ සිය වෘත්තීය පුහුණුව ලබා ගත්තාය.

## උපදෙස් හා ව්‍යාප්ති අංශය

**අධ්‍යයන වැඩසටහන්**
උපදේශක නිලධාරී සී.ජේ. ලියනාරච්චි මහතා වසර තුනක පූර්ණ කාලීන අධ්‍යයන නිවාඩුවෙන් පසු 2022 ජනවාරි 5 වන දින නැවත රාජකාරි වාර්තා කළ අතර "ශ්‍රී ලංකාවේ සමාගම් වතු අංශයේ තේ වතු අතර තාක්ෂණික ව්‍යාප්තිය සඳහා සමාජ මාධ්‍ය තුළ සංවාද සන්නිවේදනය ඒකාබද්ධ කිරීම" පිළිබඳ සිය ආචාර්ය උපාධි වැඩසටහන 2022 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණ කළේය.

ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී ජනක මහින්දපාල මහතා වසර තුනක පූර්ණ කාලීන අධ්‍යයන නිවාඩුවෙන් පසු 2022 ජූනි 26 වන දින නැවත රාජකාරි වාර්තා කළ අතර "කුඩා තේ වතු සංවර්ධන සමිතිවල කාර්යක්ෂමතාවයට දායක වන ප්‍රධාන සාධක විශ්ලේෂණය" පිළිබඳ ඔහුගේ ආචාර්ය උපාධි වැඩසටහන පිළිබඳ නිබන්ධනය ලිවීම සම්පූර්ණ කර PGIA හි අධීක්ෂකවරුන් වෙත ඉදිරිපත් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී ටී ජී එන් මහින්ද මහතා සබරගමුව විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන නිවාඩු ලබා දී මුදා හරින ලදී. ඔහුගේ ව්‍යාපෘති යෝජනාව ශ්‍රී "ලංකාවේ සමාගම් වැවිලි අංශයේ තේවතු වල යාන්ත්‍රිකකරණ තාක්ෂණයන් අනුගමනය කිරීම" යන්නය.

උපදේශක නිලධාරී ඒ එල් ආර් යු කුමාර මහතා 2022 මැයි මස 8 වන දින සිට මැලේසියාවේ පුට්‍රා විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන නිවාඩු ලබා දී මුදා හරින ලදී. ඔහුගේ ව්‍යාපෘති යෝජනාව "ශ්‍රී ලංකාවේ මධ්‍ය පරිමාණ තේ වතුවල තිරසාරභාවය සඳහා ප්‍රජා සංවර්ධන කෘෂි ව්‍යාපාර පදනම් කරගත් ව්‍යාප්ති ආකෘතිය" යන්නය.

වී.එස්. සිධාකරන්, කේ ආර් ඩබ් බී කහඳව, අමිල ජයරත්න සහ ආර් මුරලිතාසන් යන මහත්වරුන් සහ වත්සලා ගුනපාල මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ති දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ තාක්ෂණ කළමනාකාරිත්ව පුහුණු වැඩසටහනට සහභාගී වී සාර්ථකව නිම කරන ලදී.

ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී එස්.පී. රත්නායක මහතා වසර තුනක පූර්ණ කාලීන අධ්‍යයන නිවාඩුවෙන් පසු 2022 ජූලි 25 වන දින නැවත රාජකාරි වාර්තා කරන ලදී. ඔහු පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකරන ලද අතර 2022 ඔක්තෝබර් 10 දින සිට ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුරෙන් ඉල්ලා අස්විය.

## කීට විද්‍යා හා වටපණුවේදී අංශය

**ප්‍රකාශන**

R. D. S. M. Gamlath, P. D. Senanayake, G. D. Sinniah and R.G.S.C. Rajapakse (2022) In vitro Bio Efficacy of *Beauveria* sp. against Tea Shot-hole Borer (*Euwallacea fornicatus* Eichh.). Proceedings of the 42nd Annual Sessions of Institute of Biology, Sri Lanka 30th September 2022, Marino Beach Hotel, Colombo, 26p.

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

ආචාර්ය පී.ජී.ඩී.එස්. අමරසේන මහත්මිය විසින් තේ තවාන් වල ඒකාබද්ධ වටපණු (නෙමටෝඩා) කළමනාකරණය සහ වටපණු උවදුර වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ආදර්ශනයක් 2022 අගෝස්තු මස 31 දින කඳපොළ කෝට් ලොජ් වතුයායේදී අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පවත්වන ලදී.

ආචාර්ය පී.ජී.ඩී.එස්. අමරසේන මහත්මිය විසින් STaRR ව්‍යාපෘති නිලධාරීන් සඳහා ඒකාබද්ධ වටපණු කළමනාකරණය සහ වටපණු ගහණය නිර්ණය කිරිම සඳහා නියැදි ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ආදර්ශනයක් පෙබරවාරි මස 25 වන දින රත්නපුර TRI පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

ආචාර්ය පී.ඩී. සේනානායක මහත්මිය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා තේ පළිබෝධකයින්ගේ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳව ඉදිරිපත් කිරීමක් තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී (ජුනි 8 දින) පවත්වන ලදී.

සබරගමුව සහ රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුන් 2022 ජුනි මස රත්නපුර TRI පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කීට විද්‍යා රසායනාගාරයට අධ්‍යාපනික චාරිකාවක් සඳහා සහභාගි විය.

බී එස් විතාන මහත්මිය විසින් සබරගමුව විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා 2022 සැප්තැම්බර් මස රත්නපුර TRI පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී තේ පළිබෝධ පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

ඒ එම් පී සම්මානි මහත්මිය විසින් යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන් සඳහා නොවැම්බර් මස 9 වැනි දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී තේ පළිබෝධකයින්ගේ ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයාවක් තලවාකැලේ තේ පර්යේෂණායතනයේ කීට විද්‍යා හා වටපණුවේදී අංශයේ (පෙබරවාරි-මැයි 2022) පුහුණු වන ලදී.

වනරාජා වතුයායේ අභ්‍යාසලාභී සහකාර කළමනාකරු විසින් තලවාකැලේ තේ පර්යේෂණායතනයේ සංචාරයක් සඳහා නොවැම්බර් මස 16 දින පැමිණෙන ලදී.

බී එස් විතාන මහත්මිය විසින් NIPM හි සිසුන් සඳහා රත්නපුර TRI පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී 2022 නොවැම්බර් මස තේ පළිබෝධකයන් පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

බී.එස්. විතාන මහත්මිය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සිසුන්ට රත්නපුර TRI පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී 2022 නොවැම්බර් මස තේ පළිබෝධකයන් පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

ආචාර්ය පී.ඩී. සේනානායක මහත්මිය විසින් තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී දෙසැම්බර් මස 15 වන දින වයඹ විශ්වවිද්‍යාලයේ සිසුන්ට තේ පළිබෝධකයන් ඒකාබද්ධ පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

ආචාර්ය පී.ඩී. සේනානායක මහත්මිය විසින් තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී දෙසැම්බර් මස 15 වන දින වයඹ විශ්වවිද්‍යාලයේ සිසුන්ට තේ පළිබෝධකයන් ඒකාබද්ධ පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

ඒ එම් පී සම්මානි මහත්මිය විසින් NIPM හි සිසුන් සඳහා තලවකැලේ තේ පර්යේෂණායතනයේදී 2022 දෙසැම්බර් මස තේ පළිබෝධකයන්ගේ ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳව ආදර්ශනයක් පවත්වන ලදී.

බී.එස්. විතාන මහත්මිය ගුරුබැවුලගම, වේවල්වත්ත ප්‍රදේශයේ 2022 දෙසැම්බර් මස පැවති බෝග සායනයට සහභාගී විය.

## ශාක අභිජනන අංශය

**විශේෂ ඉදිරිපත් කිරීම්**

- එම්.ඒ.බී. රණතුංග, විසින් චීනයේ යුනෑන් ප්‍රදේශයේ සංවිධානය කර තිබූ "කෘෂිකාර්මික නවෝත්පාදනයයන් හරහා දිළිඳුකම පිටුදැකීම" යන මැයෙන් වූ සම්මේලනයේ දී ශ්‍රී ලංකා සැසියේ දී ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී ( මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සිදුකරන ලදී.)
- ජේ. එච්.එන්. පියසුන්දර, විසින් සබරගමුව විශ්ව විද්‍යාලය මගින් සංවිධානය කර තිබූ සිව්වැනි කෘෂිවිද්‍යා අන්තර්ජාතික සම්මේලනයේදී (AgInsight 2022) ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී (මාර්ගගත ක්‍රමවේද ඔස්සේ)

**ප්‍රකාශන**

කොට්ටාවආරච්චි, ,.J.Dරණතුංග, ,.M.A.B අමරකෝන්, A.M.T', ගුණසේකර, M.T.K., ශර්මා, R.K., චෞද්රි, H.K., සුධි, V.K., කැටෝච්, R., බන්යාල්, D.K., පියසේන, K.G.N.P., එදිරිසිංහ, E.N.U. සහ අත්තනායක, R.N. (2022). ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර ජාන බැංකුවල ස්ථාපිත කර ඇති විදේශීය සම්භවයක් ඇති තේ ප්‍රභේද/දර්ශ එකතුවෙහි අඩංගු කැටචින් සහ කැෆෙන් අන්තර්ගතයේ විවිධත්වයට අනුව වැඩිදියුණු කළ ගුණාත්මයන් හා ඖෂධීය ගුණ සහිත ප්‍රභේද නිපදවීමේ විභවයන් ඇගයීම Variation of catechin and caffeine content in exotic collection of tea [*Camellia sinensis* (L.) O.Kuntze] in Sri Lanka and potential implication in breeding cultivars with enhanced quality and medicinal properties(. *Food Chemistry Advance* doi.org/10.1016/j.focha.2022.100108

කොට්ටාවආරච්චි, ,.J.D රණතුංග, ,.M.A.B සහ අබේසිරිවර්දන සුමිත්, .de Z, (2022). විවිධ පරිසරයන් හරහා තේ)] Camellia sinensis (L.) O.Kuntze)] අනුවර්තනය වීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා බහු-ස්ථානීය අස්වනු ඇගයීම් සඳහා GGE biplot ක්‍රම භාවිතා කිරීම )Utilization of within location non-replicated multi-locational yield trials and GGE biplot methods for testing adaptability of Tea [(*Camellia sinensis* (L.) O.Kuntze)] over diverse environments(. *Indian Journal of Genetics and Plant Breeding*

කොට්ටාවආරච්චි, ,.J.Dරණතුංග, ,.M.A.B අමරකෝන්, A.M.T', ගුණසේකර, M.T.K., ශර්මා, R.K., චෞද්රි, H.K., සුධි, V.K., කැටෝච්, R., බන්යාල්, D.K., එදිරිසිංහ, E.N.U. සහ අත්තනායක, R.N.

(2022*ග ප්‍රවේණික සහ සෘතුමය වෙනස්කම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදේශීය සම්භවයක් ඇති තේ ප්‍රභේද/දර්ශ එකතුවෙහි අඩංගු කැටචින් සහ කැෆෙන් අන්තර්ගතයේ විවිධත්වයේ විචලනය )Genotypic and seasonal variations of catechin and caffeine content in exotic tea [(*Camellia sinensis* (L.) O.Kuntze)] germplasm in Sri Lanka (. *Himachal Journal of Agricultural Research* 48(1): 8-16

රණවීර, K.K, රණතුංග, .M.A.B, ඊශ්වර, J.P., තිලකරත්න, S. සහ කැඩෝනො, H., (2022). ගතික ද්‍රව මාධ්‍යයක තුල සිදුකරන දෛහික කළල ජනනය මගින් TRI 5001නව තේ ප්‍රභේදයෙහි පැළ නිපදවීම )Regeneration of tea [*Camellia sinensis* (L.) Kuntze] cv. TRI 5001 plants through somatic embryogenesis in a liquid dynamic medium(. *Tropical Agricultural Research* 33(4): 364-375

අමාලි, R.K.A., අබේවීර, N.H.A.S., ගුණරත්න ,O.G.K.A., ගුණරත්න, G.P. සහ කොට්ටාවආරච්චි, J.D. (2022). නව ප්‍රභේද විවිධ නයිට්‍රජන් පොහොර මට්ටම්වලට දක්වන ප්‍රතිචාර / කාර්ය සාධනය ඇගයීම )Performance evaluation of newly developed tea (*Camellia sinensis* L.) cultivars in response to different levels of nitrogen fertilizer(. *International Journal of Agricultural Research* 17 (4): 201-209

පියසුන්දර, .J.H.N රණතුංග, .M.A.B සහ මුදලිගේ,.A.K )2022( තේ බීජ ඵලදායී ලෙස භාවිතා කිරීම සහ තේ බීජ උද්‍යානවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීම අරමුණුකොට විවිධ උද්‍යාන වලින් ලබාගත් බීජ වල ලක්ෂණ /වෙනස්කම් ඇගයීම )Assessment of seed characteristics of progenies in tea (*Camellia sinensis* L.) seed gardens: Towards facilitating effective utilization of tea seeds and the productivity enhancement of the gardens (Proceedings of the 4th International Conference of Agricultural Sciences (AgInsight 2022) Sabaragamuwa University of Sri Lanka. 87-91pp

බණ්ඩාර, W.M.D.M., පියසේන, K.G.N.P. ජයතිලක, D.V., ලියනගේ, N.M.N. සහ රණතුංග, .M.A.B (2022) අඩු කැෆෙන් තේ දෙමුහුන් හඳුනා ගැනීමට CafLess-TCS1 සලකුණු භාවිතා කිරීම පිළිබඳ ශක්‍යතාව ඇගයීම Feasibility Assessment of Using CafLess-TCS1 Marker to Identify Low caffeine Tea Hybrids Proceedings of the Faculty of Agriculture Undergraduate Research Symposium, 28th December 2022 –pp124

**ව්‍යාප්ති කටයුතු - ආදර්ශන සහ වගා සායන**

ජේ. එච්.එන්. පියසුන්දර, විසින් සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය කණ්ඩායමක් හට "තේ ශාක අභිජනනය" යන මැයෙන් ඉදිරිපත් කිරීමක් හා ආදර්ශනයක් සිදුකරන ලදී .

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ නව සංකල්පයක් වන "ජංගම විද්‍යාගාරය" එළිදැක්වීම සඳහා රත්නපුර පිහිටි පහත රට මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබූ සමාරම්භක උත්සව අවස්ථාව අතරතුර දී ශාක අභිජනන අංශයේ නිලධාරීන් විසින් නව තේ ප්‍රභේද සම්භන්දයෙන් ආදර්ශනයක් සිදුකරන ලදී

ගාල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන 02 ක සංවිධානය කර තිබූ වගා සායනවල දී ශාක ශාක අභිජනන අංශයේ නිලධාරීන් විසින් නව තේ ප්‍රභේද සම්භන්දයෙන් ආදර්ශනයන් සිදුකරන ලදී

**සේවා**

එම්.ඒ.බී. රණතුංග මහතා තේ පර්යේෂණායතන ප්‍රකාශන හා ඉදිරිපත්කිරීම් පිළිබඳ කමිටුවේ (PPP) සභාපතිවරයා ලෙස සහ තාක්ෂණ හුවමාරු කාර්යාලයේ (TTO Office) කළමනාකරු ලෙස තවදුරටත් කටයුතු කරන ලදී

ජේ.එච්.එන්. පියසුන්දර මහතා TRI Update ප්‍රකාශනයේ සම්බන්ධීකාරකවරයා ලෙස තවදුරටත් කටයුතු කරන ලදී

**පුහුණුවන්නන්**

- ප්‍රථම උපාධි හදාරන සිසුන් තිදෙනෙකු, සිය පර්යේෂණ ව්‍යාපෘති සහ ආයතනික පුහුණුව අවසන් කරන ලදී

## ශාක ව්‍යාධිවේදී අංශය

**පශ්චාත් උපාධි අධ්‍යයන**

එම් නිරංජන්, පර්යේෂණ නිලධාරී, 2021 ඔක්තෝම්බර් මාසයේදී ජපානයේ ඔකායාමා විශ්ව විද්‍යාලයේ පරිසර හා ජීව විද්‍යා උපාධි පාසලේ ආචාර්ය උපාධිය සඳහා වන පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහනක් ආරම්භ කරන ලදී (MEXT ශිෂ්‍යත්වය පිරිනමන ලදී).

**ප්‍රකාශන**

M Niranjan, GD Sinniah, CDN Priyadarshani, SMSM Samarakoon, DGNP Karunajeewa (2022). Botryosphaeriaceae fungi causing canker and die-back on Grevillea robusta in tea plantations of Sri Lanka. Australasian Plant Pathology. https://doi.org/10.1007/s13313-022-00875-8

RDSM Gamlath, GD Sinniah, RGSC Rajapakse and PD Senanayake (2022) Isolation, identification and development of *Trichoderma* as a biocontrol agent against tea root pathogens. In Proc: Plant Health 2022, The Second National Symposium of Sri Lanka Association for Mycology and Plant Pathology (SLAMPP), 25th June 2022, PGIS University of Peradeniya, Sri Lanka. pp: 27.

RDSM Gamlath, PD Senanayake, GD Sinniah and RGSC Rajapakse (2022) In vitro Bio Efficacy of Beauveria sp. Against Tea Shot-hole Borer (*Euwallacea fornicatus* Eichh.). Proceedings of the 42nd Annual Sessions of Institute of Biology, Sri Lanka 30th September 2022, Marino Beach Hotel, Colombo.

Jayawickrama JASS, Salgadoe ASA, Sinniah GD and Ranasinghe WMAM (2022) Development of Smartphone-based Method for Quantifying Blister Blight Severity (*Exobasidium vexans* Massee) in Tea Leaves. Proceedings of 20th Agricultural Research Symposium, Wayamba University Sri Lanka. pp. 420-424

**සම්මන්ත්‍රණ/ඉදිරිපත් කිරීම්/දේශන**

ජී. ඩී. සින්නයියා විසින් බලංගොඩ සහ මඩුල්සිම වතු ආශ්‍රිත විධායක නිලධාරීන් සඳහා වත්මන් තත්ත්වය යටතේ බුබුළු අංගමාර රෝග කළමනාකරණය පිළිබඳ දේශන 3ක් පවත්වන ලදී.

ජී. ඩී. සින්නයියා විසින් NIPM සිසුන් සඳහා තේ රෝග කළමනාකරණය පිළිබඳ දේශන පවත්වන ලදී. පේරාදෙණිය සහ සබරගමුව විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශාක රෝග පිළිබඳ ආදර්ශන / කෙටි දේශන පවත්වන ලදී.

හේලීස්, බලංගොඩ සහ මඩුල්සිම වතුකරයේ ක්ෂේත්‍ර කටයුතු පුහුණුවන්නන් සඳහා හුරු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**කෙටි පාඨමාලා/පුහුණු**

ජී. ඩී. සින්නයියා මාර්තු 10-11 දිනවල පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද කලාපීය ජෛව සුරක්ෂිතතාව පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයකට සහභාගී විය.

## ශාක කායික විද්‍යා අංශය

**අධ්‍යාපන වැඩසටහන්**

ආචාර්ය උපාධියක් ලබා ගැනීම සඳහා වූ අධ්‍යයන කටයුතු එම්. එම්. එන්. දමයන්ති විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කරගෙන යනු ලැබූ අධ්‍යයනය සාර්ථකව අවසන් කරන ලදී.

**ප්‍රකාශන**

Damayanthi, M. M. N., Wijeratne, T. L., Damunupola, J. W. (2022). Exogenous Salicylic Acid Induced Drought Stress Tolerance in Immature Tea (Camellia sinensis L.) Plants. Accepted for publication in the Journal of Tropical Agricultural Research (in progress).
Vithanage, N. M., Gunasekera, H. K. L. K. and Wijeratne, T. L. (2022). Effect of Foliar Application of Glycine Betaine on immature Tea (Camellia sinensis L.) plants during drought. Accepted for publication in the Asian Journal of Plant and Soil Sciences (in progress).

Damayanthi, M. M. N., Wijeratne, T. L., Damunupola, J. W. (2022). Effect of exogenous application of salicylic acid on alleviation of drought stress of immature tea (Camellia sinensis L.) plants. Accepted for publication in Israel Journal of Plant Sciences (in progress).

Damayanthi M M N, Wijeratne T L and Damunupola J W 2022 Alleviation of Drought Stress on Immature Tea (*Camellia sinensis*) Plants by Exogenous Application of Abscisic Acid (ABA). In proceedings of the International Conference on Applied and Pure Sciences (ICAPS) 2022. Faculty of Science, University of Kelaniya, Sri Lanka, 7.

Damayanthi M M N, Wijeratne T L and Damunupola J W 2022 Exogenous Salicylic Acid Induced Drought Stress Tolerance in Immature Tea (*Camellia sinensis* L.) Plants. *In* Proceedings of the 34$^{th}$ Annual Congress of the Post graduate Institute of Agriculture. 18$^{th}$ November 2022, Peradeniya, Sri Lanka, 10.

**විශේෂ ඉදිරිපත් කිරීම්**

Dr TL Wijeratne delivered a presentation for the stakeholder group at Melstacorp on the “Importance of Shade Managementin Tea”.

## පාංශු හා ශාක පෝෂක අංශය

### ප්‍රකාශන

ලියනගේ, එල්. ආර්. එම්. සී., හනාෆි, එම්. එම්., සුලයිමාන්, එම්. එෆ්., ඉස්මයිල්, ආර්., ගුණරත්න, ජී. පී., ධර්මකීර්ති, ආර්. එස්., රූපසිංහ, එම්. ජී. එන්.සහ මායාකඩුව ඒ. පී. (2022). කාබනික යෙදවුම් භාවිතයෙන් හායනයට පත්වූ තේ වගා කරන පසෙහි පාංශු සෞඛ්‍ය ප්‍රතිසාධනය සඳහා නයිට්‍රජන් ඛනිජකරණ ගතිකයේ ප්‍රතිවිපාක චිලී කෘෂිකර්ම පර්යේෂණ සඟරාව, 82 (2) http://dx.doi.org/10.4067/S0718-5839202200020 0199

රගුරාජ්, එස්., කාසිම්, එස්., මොහොමඩ් ජාෆර්, එන්., සහ නස්ලි, එම්. එච්. (2022). තේ තවාන් පැළවල වර්ධනයට කුකුළු පිහාටු වලින් ලබාගත් ප්‍රෝටීන් හයිඩ්‍රොලයිසේට් විවිධ අනුපාතවලින් යෙදීමෙන් වන බලපෑම. *Agronomy*, *12 (2)* https://doi.org/10.3390/agronomy12020299

රගුරාජ්, එස්., කාසිම්, එස්., මොහොමඩ් ජාෆර්, එන්., සහ නස්ලි, එම්. එච්. අමාලි, ආර්. කේ. ඒ. (2022). රසායනික සංයුතිය, වර්ණාවලීක්ෂ ගුණ සහ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම් මත ලිග්නයිට් ව්‍යුත්පන්න හියුමික් ද්‍රව්‍ය සමග කසල තේ වල ව්‍යුත්පන්නක් වූ හියුමික් වැනි ද්‍රව්‍ය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්. *Environmental Science and Pollution Research*. https://doi.org/10.1007/s11356-022-20060-0.

අමාලි, ආර්. කේ. ඒ., අබේවීර, එන්. එච්. ඒ. එස්., ගුණරත්න, ඕ. පී. කේ. ඒ., ගුණරත්න, ජී. පී, කොට්ටච-ආරච්චි, ජේ. ඩී. (2022). විවිධ නයිට්‍රජන් පොහොර අනුපාතයන්වලට ප්‍රතිචාර වශයෙන් අලුතින් දියුණු කරන ලද තේ (*Camellia sinensis* L.) ප්‍රභේදවල ක්‍රියාකාරීත්වය ඇගයීම, *International Journal of Agricultural Research.* 17 201–209. https://doi.org/10.3923/IJAR.2022.201.209.

අමාලි, ආර්. කේ. ඒ., ලිම්, එච්. එන්. අයි. ඊබ්‍රහිම්, සයිනාල්, ඉසෙඩ්., අහමඩ්, එස්. ඒ. ඒ. (2022). A copper-based metal-organic framework decorated with electrodeposited $Fe_2O_3$ nanoparticles for electrochemical nitrite sensing, *Microchimica Acta.* 189 1–10. https://doi.org/10.1007/S00604-022-05450-Y

අමාලි, ආර්. කේ. ඒ., ලිම්, එච්. එන්. අයි. ඊබ්‍රහිම්, සයිනාල්, ඉසෙඩ්., අහමඩ්, එස්. ඒ. ඒ. (2022). Silver nanoparticles-loaded copper (II)-terephthalate framework nanocomposite as a screen-printed carbon electrode modifier for amperometric nitrate detection, *Journal of Electroanalytical Chemistry*. 918 116440. https://doi.org/10.1016/j.jelechem.2022.116440.

### අධ්‍යාපන වැඩසටහන්

එස් රගුරාජ් මහතා (පර්යේෂණ නිලධාරි) සහ ආර් කේ ඒ අමාලි මෙනෙවිය (පර්යේෂණ නිලධාරිනි) මැලේසියාවේ පුත්‍රා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයනයෙන් පසු 2022 දෙසැම්බර් 30 වන දින නැවත සේවයට වාර්තා කරන ලදී.

### විශේෂ ඉදිරිපත් කිරීම්

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 දෙසැම්බර් 16 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේ පැවති 240 වන පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයේදී (ඉංග්‍රීසි) "නිවර්තන කලාපයේ තේ වගා කරන හායනයට ලක් වූ පස ප්‍රතිසාදනය කිරීමේදී කාබනික ද්‍රව්‍යවල කාබන් ඛනිජකරණ ගතිකත්වය සහ ඒවායේ භාවිතය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 සැප්තැම්බර් 21 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී හැටන් වැව්ලි කළමණාකරුවන් සහ සහකාර කළමනාකරුවන් සඳහා පස් සහ

පත්‍ර සාම්පල ලබාගැනීම සහ ස්ථානීය විශේෂිත පොහොර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 අප්‍රේල් 28 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී බළන්ගොඩ වැවිලි සමාගමේ විධායක නිලධාරීන් සඳහා කසල තේ භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව තේ ඉඩම්වල පසේ කාබනික ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම සහ කොම්පෝස්ට් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 මැයි 27 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේ දී මඩුල්සීම වැවිලි සමාගමේ විධායක නිලධාරීන් සඳහා කසල තේ භාවිතය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව තේ ඉඩම්වල පසේ කාබනික ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම සහ කොම්පෝස්ට් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 දෙසැම්බර් 13 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී නුවරඑළිය සහ බදුල්ල ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ කුඩා තේ වතු හිමියන් සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 දෙසැම්බර් 13 වන දින තලවාකැලේ තේ පර්යේෂණායතනයේ දී දෙනියාය ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයේදී කුඩා තේ වතු සංවර්ධන අධකාරියේ නිලධාරීන් සහ කුඩා තේ වතු හිමියන් සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා විසින් 2022 අප්‍රේල් 26 වන දින රත්නපුර තේ පර්යේෂණායතනයේදී බළන්ගොඩ වැවිලි සමාගමේ විධායක නිලධාරීන් සඳහා කසල තේ භාවිතය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව තේ ඉඩම්වල පාංශු කාබනික ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම සහ කොම්පෝස්ට් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඩබ්ලිව් ටී බී ඩී ප්‍රියන්ත, ජේ ආර් වයි අබේවර්ධන, ඕ පී කේ ඒ ගුණරත්න සහ එම් පී කේ මධුෂානි යන මහත්ම මහත්මීන් 2022 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී ගාල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල " සහකම්පන" වැඩසටහන් හා සමගාමීව පැවැත්වූ ජංගම රසායනාගාර සේවාව සමඟ බෝග සායන වැඩසටහන් සඳහා සහභාගී වූහ.

එස් කේ වීරතුංග මහතා විසින් 2022 නොවැම්බර් 16 වන දින වනරාජා තේ වතුයායේ සහකාර කළමනාකරුවන් සඳහා තේ වගාව සඳහා පොහොර නිර්දේශය සහ පාංශු පරීක්ෂාව පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

එස්.කේ වීරතුංග මහතා විසින් 2022 ඔක්තෝම්බර් 27 වන දින යාපනය විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා තේ වගාව සඳහා නිර්දේශිත පොහොර පිළිබඳ ආදර්ශනයක් සහ පුහුණුවක් පවත්වන ලදී.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 අගෝස්තු 31 සහ සැප්තැම්බර් 2 යන දිනවල පුස්සැල්ලාව වැවිලි සමාගමේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

එල් ආර් එම් සී ලියනගේ මහතා සහ ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා රත්නපුර, කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා 2022 ජූනි 16 වන දින පැවති ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණයට සහභාගී විය.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 මැයි 19 වන දින පැවති කළුතර ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයේදී පාංශු සාරවත්බව කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 මාර්තු 30 වන දින TRI කොට්ටව උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති ගාල්ල ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයේදී නව පොහොර නිර්දේශය T1240 සහ පාංශු සාරවත්බව කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 මාර්තු 29 වන දින TRI පහතරට තේ පර්යේෂණ උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේදී රත්නපුර ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයේදී නව පොහොර නිර්දේශය T1240 සහ පාංශු සාරවත්බව කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඩබ්ලිව් එම් එස් විජයතුංග මහතා විසින් 2022 අප්‍රේල් 1 වන දින TRI මදරට පර්යේෂණ උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති මහනුවර ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදයේදී වත්මන් තත්ත්වයන් යටතේ තේ වගාවේ පෝෂණ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ඕ ජී කේ ඒ ගුණරත්න මහතා 2022 දෙසැම්බර් 13 වන දින TRI පහතරට රත්නපුර තේ පර්යේෂණ උපදේශන සහ ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද රැස්වීමට සහභාගී විය.

**වෙනත් ක්‍රියාකාරකම්**

**නව බඳවා ගැනීම්, උසස්වීම්, ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැනීම්**
ඩී.ආර්. ගමගේ, එම්.ජී.කේ. මධුෂානි, බී.වී.ආර්. සනාලි, ආර්.එම්.එන්.එස්. බණ්ඩාර, බී.එම්.ටී.ටී.කේ. සේනාරත්න සහ පී.ජී.එන්.ඩී. ගාල්ලගේ යන මහත්මීන් 2022 පෙබරවාරි 14 වැනිදා පාංශු සහ ශාක පෝෂණ අංශයට තාක්ෂණ නිලධාරීන් ලෙස බඳවා ගන්නා ලදී.

පී.ජී.එන්.ඩී. ගාල්ලගේ මහතා 2022 අප්‍රේල් 30 වැනිදා පාංශු සහ ශාක පෝෂණ අංශයේ තාක්ෂණික නිලධාරී තනතුරෙන් ඉල්ලා අස්විය.

තාක්ෂණික නිලධාරිනියක වන ඩී.එන්. කහවෙවිතාන මෙනවිය 2022 මැයි මස 17 වැනිදා කෘෂිකර්ම ආර්ථික අංශයේ සිට තාක්ෂණික නිලධාරිනියක ලෙස පාංශු සහ ශාක පෝෂණ අංශය වෙත මාරු කරන ලදී.

තාක්ෂණික නිලධාරිනියක වන ඩී.ආර්. ගමගේ දෙසැම්බර් 12 වන දින හන්තානේ මැද රට පර්යේෂණ හා උපදේශන මධ්‍යස්ථානයේ පාංශු සහ ශාක පෝෂණ අංශය වෙත මාරු කරන ලදී.

තාක්ෂණික නිලධාරියෙකු වන එන් සී වීරකෝන් තලවාකැලේ ජෛව රසායන විද්‍යා අංශයේ සිට පාංශු සහ ශාක පෝෂණ අංශයේ වලහන්දූව රසායනාගාරය වෙත දෙසැම්බර් 12 වන දින ස්ථාන මාරු කරන ලදී.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග අංශ ප්‍රධානී (වැඩ ආවරනය කරන)/ පාංශු සහ ශාක පෝෂණ අංශය සහ අත්හදා බැලීමේ නිලධාරියෙකු වන ඩබ්ලිව්.ටී.බී. ප්‍රියන්ත 2022 දෙසැම්බර් 31 වන දින තේ පර්යේෂණායතන සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

එල් ආර් එම් සී ලියනගේ, ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරි , පාංශු සහ ශාක පෝෂණ අංශයේ අංශ ප්‍රාදානී තනතුරේ වැඩ ආවරනය කිරීම සඳහා 2022 දෙසැම්බර් 01 දින පත් කරන ලදී.

# ශාන්ත කුම්බිස් වත්ත - තලවාකැලේ

## එම්. කේ. ඩී. ප්‍රියන්ත මහතා

## වතු අධිකාරි

| නම | තනතුර | සේවයට බඳවා ගත් වර්ෂය |
|---|---|---|
| **කාර්යාලය** | | |
| කේ.ඒ. මනොජ් චතුරංග මහතා | පරිපාලන නිළධාරී | 2021 |
| එම්. පි. ඩී. දිල්රුක්ෂි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු | 2014 |
| පි.පි.රූපසිංහ මහතා | කනිෂ්ඨ සහකාර ලිපිකරු | 2016 |
| එන්.ඩබ්ලිව්.එච්.ඒ.හරුණි පමල්කා මිය | කනිෂ්ඨ සහකාර ලිපිකරු | 2017 |
| ආර්. ක්‍රිෂාන්කුමාර් මහතා | ගබඩා භාරකරු/ ලිපිකරු | 2015 |
| **ක්ෂේත්‍රය** | | |
| එන්.ඉලන්ගේෂ්වරන් මහතා | ක්ෂේත්‍ර නිලධාරී | 1998 |
| එස්.සුරේෂ් මහතා | ක්ෂේත්‍ර නිලධාරී | 2005 |
| එස්.එල්. රොද්‍රිගෝ මහතා | ක්ෂේත්‍ර නිලධාරී | 2017 |
| එස්.ඩී.පෙරේරා මහතා | සහකාර ක්ෂේත්‍ර නිලධාරී | 2005 |
| පි.භක්තකුමාර් මහතා | කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී | 2015 |
| ආර්.සත්‍යරාජ් | කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී | 2016 |
| **කර්මාන්තශාලාව** | | |
| කේ.ඩබ්ලිව්.ටී.යු.එස්. ද සිල්වා | ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී | 2017 |
| එස්.එම්.සුනිල් ශාන්ත මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී | 1992 |
| පි.මොහොට්ටි මහතා | සහකාර කර්මාන්තශාලා නිලධාරී | 2001 |
| එම්.සරත්කුමාර් මහතා | කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී | 2013 |
| පී.එන්.එල්.කුමාර | කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී | 2015 |
| **රියදුරන්** | | |
| එස්. ක්‍රිස්ටොපර් මහතා | රියදුරු | 2005 |
| ආර්. උදයකුමාර් මහතා | රියදුරු | 2005 |
| ඩී. සුන්දරේසන් මහතා | රියදුරු | 2008 |
| **සෞඛ්‍යය** | | |
| පි.අයි. ක්‍රිස්ටි මහත්මිය | වතු වෛද්‍ය සහයක නිලධාරී | 2022 මැයි |
| ඩී.පුන්‍යමූර්ති මහතා | සුභසාධක නිලධාරී | 2005 |
| පි.එන්.සිල්වෙස්ටර් මිය | ළමා උයන් පාලිකා | 2008 |
| කේ.ජෝති මහත්මිය | ළමා උයන් පාලිකා | 2011 |
| ටි.පොන්මනි මිය | ළමා උයන් පාලිකා | 2011 |




**පොදු**

- මෙතෙක් ශාන්ත කුම්බස් වතුයායෙහි තැරැව්කරුවන් ලෙස කටයුතු කළ ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් පුද්. සමාගම, මෙම වසර පුරාවටද ශාන්ත කුම්බස් නිමි තේ කොළඹ වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන ලදී.
- ශාන්ත කුම්බිස් වතුයායේ නිරික්ෂක නියෝජිත වන සෙරත් පහත්කුඹුර මහතා 2022.07.28 දින වතුයාය නිරික්ෂණය කරන ලදි.

**වත්තේ භූමිය පිළිබඳ විස්තර 2022.12.31 දිනට**

| | ශාන්ත කුම්බිස් | ලැම්ලියර් | එකතුව |
|---|---|---|---|
| බීජ තේ | 1.10 | 1.00 | 2.10 |
| ක්ලොන තේ | 84.21 | 46.25 | 130.46 |
| **වතුයායේ තේ වගාකර ඇති මුළු හෙක්ටයාර ප්‍රමාණය** | **85.31** | **79.25** | **132.56** |
| ADB ව්‍යාපෘතිය | 11.39 | 2.60 | 13.99 |
| නැවත තේ වගා කිරිම | 0.25 | | 0.25 |
| තේ.ප.ආ. පර්යේෂණ සදහා | 4.64 | | 4.64 |
| තේ.ප.ආ. පර්යේෂණ සදහා | 1,20 | | 1,20 |
| **මුළු තේ වගාව** | **103.04** | **49.85** | **152.89** |
| නිවාස | 2.09 | | 2.09 |
| ගොඩනැගිලි/පාරවල් | 34.28 | 14.72 | 49.00 |
| කානු/අතහැර ඇති ඉඩම් | 32.37 | 1.35 | 33.72 |
| **මුළු හෙකටයාර ප්‍රමාණය** | **171.78** | **65.92** | **237.70** |

**ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්**

2022 වර්ෂයේ පහත දැක්වෙන ක්ෂේත්‍රවල තේ කප්පාදුව සිදුකරන ලදි.

| කොටස | ක්ෂේත්‍ර අංකය | හෙක්ටයාර ප්‍රමාණය |
|---|---|---|
| ඉහළ | 4B, 5 | 11.40 |
| පහළ | 7,13A,13G | 7.67 |
| ලැමිලියර් | 10,11, 13 | 11.15 |

- තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව ඇස්තමේන්තු කරන ලද හෙක්ටයාර ප්‍රමාණය නිම කරන ලදි
- තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව පොහොර යෙදීම සිදු කරන ලදි.

**ආසියානු සංවර්ධන බැංකු මව්ශාක වගා ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශිත ටී.ආර්.අයි. 3000 සහ 4000 ශ්‍රේණිවල රිකිලි තේ අතු 258 303 ක් කුඩා තේ වතු හිමියන් වෙත හා වාණිජ වැවිලි සමාගම් වෙත නිකුත් කරන ලදී.

**අස්වැන්න පිළිබඳ විස්තර**

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | **නිමි තේ** | **හෙක්. කි.ග්‍රෑ** | **නිමි තේ** | **හෙක්. කි.ග්‍රෑ** |
| ශාන්ත කුම්බිස් | 147,152 | 1751 | 165,180 | 1940 |
| ලැමිලියර් | 67,334 | 1429 | 74,815 | 1581 |
| **එකතුව** | 214,486 | 1636 | 239,995 | 1811 |
| මිල දී ගත් තේ දළු | 55,886 | | 24,153 | - |
| **මුළු එකතුව** | **270,372** | | **264,148** | |

ඉහත දක්වා ඇති වගුවට අනුව 2022 වර්ෂයේ හෙක්ටයාරයකට නිමි තේ කිලෝ 1636 ලෙස වාර්තා විය.

**තේ කර්මාන්ත ශාලාව හා නිෂ්පාදනය**

- 2022 වසර සඳහා ශාන්ත කුම්බිස් දළ විකුණුම් සාමාන්‍යයය අගය රු. 1133.18 ක් වූ අතර එය බටහිර උස්බිම් වැවිලි කාණ්ඩය යටතේ පිහිටීම අනුව විකුණුම් සාමාන්‍යයයට වඩා රු. 14.57 ක වර්ධනයකි.

**කාලගුණ තත්වය**

2022 වර්ෂයේ  වර්ෂාපතනය මි.මී.- 3627 සහ දින 150ක් ලෙස වාර්තා විය.

**කාරක ආදායම**

ශාන්ත කුම්බිස් වතුයාය 2022 වර්ෂය සඳහා රු. 61,064,568 ක ශුද්ධ ලාභයක් ලබා ගන්නා ලදී.

**කාර්ය මණ්ඩලයේ විස්තර**

**කර්මාන්තශාලාව**

- එස්. එම්. එස්. ශාන්ත මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිළධාරි තනතුරෙන් 2022 ජූනි මස 16 වන දින විශ්‍රාම යා යුතු නමුත් ඔහුගේ සේවාකාලය 2023 ජූනි මස 16 දින දක්වා දීර්ඝ කරන ලදී.

**සෞඛ්‍යය අංශය**

- වතු වෛද්‍ය සහයක තනතුර සඳහා පි.අයි.ක්‍රිස්ටි මහත්මිය මැයි මස 2වන දින සිට පත්කරන ලදී.

# ශාන්ත ජෝකිම් වත්ත - රත්නපුර

## එම් .කේ. ඩී ප්‍රියන්ත  මහතා

## වැඩ බලන වතු අධිකාරී

| | | |
|---|---|---|
| **කාර්යාලය** | එන් කෝරළගේ | ප්‍රධාන ලිපිකාරිනි |
| | කේ එම් පී එල් එල් ඩයස් | ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකාරිනි |
| | ඩබ් කේ ප්‍රසානිකා | කණිෂ්ඨ සහකාර ලිපිකාරිනි |
| | එස් සුධර්ශනී | කණිෂ්ඨ සහකාර ලිපිකාරිනි (2022-05-17 වන දින සිට සේවයෙන් ඉල්ලා අස්වෙන ලදී ) |
| **කර්මාන්තශාලාව** | ඒ.පී.ඩී. හේමන්ත කුමාර | ප්‍රධාන  කර්මාන්තශාලා නිලධාරී |
| | ඩී ඒ ජේ පුෂ්ප කුමාර | සහකාර කර්මාන්තශාලා නිලධාරී |
| | පී පී වික්‍රමරත්න | සහකාර කර්මාන්තශාලා  නිලධාරී |
| | ඩබ් එන් ඩබ් පෙරේරා | කණිෂ්ඨ සහකාර කර්මාන්ත ශාලා නිලධාරී |
| | රවීන්ද්‍ර ලක්මන | කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී |
| **ක්ෂේත්‍රය** | ජේ සේනාධීර | සහකාර ක්ෂේත්‍ර  නිලධාරී |
| | වී අරියරාජ් | කණිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරී |
| **ගබඩා අංශය** | එම් ඩබ් ජයසේකර | ගබඩා භාරකරු/ලිපිකරු |
| **ප්‍රවාහන අංශය** | එම් ඒ ජේ කුමාර | රියදුරු |
| | එච් ඊ පී ඩිලාන් ඉසුරු | රියදුරු |
| | ඒ එම් ඒ  එච් දර්ශන | රියදුරු |
| | ඩබ් පී සී පෙරේරා | රියදුරු |
| | ඩී වී ඩී ජගත් | රියදුරු |




**සාමාන්‍ය සටහන්**
ෆෝබ්ස් සහ වෝකර් තැරුව්කාර වෙළඳ සමාගම විසින් ශාන්ත ජෝකිම් තේ වෙළඳ වෙන්දේසි කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි.

**තේ කර්මාන්තශාලාවේ පහත සඳහන් සංවර්ධන කටයුතු සිදුකරන ලදී.**
කර්මාන්තශාලාවේ වහලයේ කොටසක් නව සෙවිලි තහඩු යොදා පිරිසකර කරන ලදී.




තේ ඇඹරුම් කාමරයේ සිට තේ වියලනය දක්වා නව ප්‍රවාහක පද්ධතියක් සවිකරන ලදී.







කර්මාන්තශාලාවේ පළමු මහල නව ලෑලි සවිකර පිරිසකර කරන ලදී.




කර්මාන්තශාලාවේ දෝණිකා 06 ක් පිළිසකර කරන ලදී.




සී.සී  වියලන යන්ත්‍රයේ ඇතුළත කුටිය පිළිසකර කරන ලදී.




## භූමි භාවිතය

| 2021 දෙසැම්බර් 31 දිනට භූමි ප්‍රමාණය (හෙක්ටාර්) | භාවිතය |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 47.54 |
| 5000 කාණ්ඩයේ තේ වගා බිම් (තේ .ප.ආ) | 2.20 |
| නොමේරූ තේ වගාව | 5.02 |
| පොල් වගා බිම් (තේ .ප.ආ) | 3.89 |
| වාණිජ පැළ තවාන් බිම් | 1.58 |
| නොමේරූ රබර් වගාව | 4.56 |
| පරිණත රබර් වගා බිම් (මිශ්‍ර වගාව) | 3.68 |
| කුඹුරු | 8.74 |
| මව් ශාඛා ව්‍යාප්ති ක්ෂේත්‍ර බිම් (ආසියා සංවර්ධන මව් ශාඛා ව්‍යාප්ති බිම්) | 12.41 |
| ක්ෂේත්‍ර අංක 6 මැණික් වෙන්දේසිය සඳහා වෙන්කල බිම | 2.00 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා වෙන් කල බිම- කෙෂත්‍ර අංක 06 (Co. 03 තෘණ වගාව ටී.ආර්.අයි) | 1.00 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා වෙන් කල බිම- කෙෂත්‍ර අංක 05 (Co. 03 තෘණ වගාව ටී.ආර්.අයි) | 1.00 |
| යෝජිත නිවාස ව්‍යාපෘතිය ක්ෂේත්‍ර අංක 05 | 1.00 |
| ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ගොඩනැගිලි හා පරික්ෂණාත්මක ක්ෂේත්‍ර සහිත බිම් ක්ෂේත්‍ර අංක 09 | 12.02 |
| ගොඩනැගිලි මං මාවත් ලඳු කැලෑ සහ පතන | 35.34 |
| එකතුව | 141.98 |

**2015 ඔක්තෝබර් මාසය තුළ සිදු කරන ලද තේ පැළ ගණනයට අනුව ඵලදායී තේ වගාවන් සහිත භූමි ප්‍රමාණය (හෙක්ටාර්)**

| භූමිය | ප්‍රමාණය හෙක්ටාර්) |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 12.47 |
| තේ නෙලීම් කටයුතු සඳහා නිදහස් කරන ලද මව් ශාඛා ව්‍යාප්ති ක්ෂේත්‍ර බිම් | 6.43 |
| ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයට අයත් ක්ෂේත්‍ර | 7.06 |
| මුළු ඵලදායී තේ වගා භූමි ප්‍රමාණය | 25.96 |

**ඵලදාව හා අස්වැන්න ( නිමි තේ කිලෝ ප්‍රමාණය)**

පසුගිය වසරට සාපේක්ෂව 2022 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය සහ ඵලදාව පහත අයුරින් වේ.

**තේ වගාව**

| වර්ෂය | ශාන්ත ජෝකිම් තේ නිෂ්පාදනය | මිලදී ගන්නා ලද තේ නිෂ්පාදනය |
|---|---|---|
| 2022 | 15730 | 247981 |
| 2021 | 18765 | 224457 |
| වෙනස | -3035 | +50,524 |

පසුගිය වසරට සාපේක්ෂව මෙම වර්ෂයේ වතුයායේ තේ අස්වැන්නේ කිලෝ ග්‍රෑම් 3,035 ක් අඩු වී ඇත. පසුගිය වසරට සාපේක්ෂව කුඩා තේ වතුහිමියන් හා තේ වෙළඳ මහතුන් විසින් කර්මාන්තශාලාව වෙත සපයන ලද දළු ප්‍රමාණයේ කිලෝ 50,524 ක් වැඩි වී ඇත.

**<u>එක් එක් ක්ෂේත්‍රයන්ට අදාල අස්වැන්නේ විස්තර-2022</u>**

| කෙෂත්‍ර අංකය | ප්‍රමාණය (හෙක්) | ඵලදායි (හෙක්) | නිම් තේ සැබෑ (හෙක්) | අස්වැන්න සැබෑ (හෙක් ) | අස්වැන්න ඵලදායි (හෙක්) |
|---|---|---|---|---|---|
| 1 | 2.68 | 1.10 | 1095 | 409 | 995 |
| කර්මාන්ත ශාලාව අශ්‍රිත | | 0.08 | 0 | 0 | 0 |
| 1 ඒ | 0.8 | 0.15 | 116 | 145 | 773 |
| 1බී | 0.8 | 0.50 | 590 | 739 | 1182 |
| 2 ඒ | 0.93 | 0.58 | 734 | 789 | 1266 |
| 2 එෆ් | 4 | 0.87 | 817 | 204 | 939 |
| 3 | 3 | 0.86 | 856 | 285 | 995 |
| 3 ඒ | 1 | 1 | 812 | 812 | 812 |
| 3 බී | 0.5 | 0.5 | 883 | 1766 | 1766 |
| 3 සී | 1 | 1 | 935 | 935 | 935 |
| 4 | 4.85 | 1.38 | 1073 | 221 | 778 |
| 5 | 0.6 | 0.12 | 267 | 445 | 2225 |
| 6 සී | 2 | 0.23 | | | |
| 8 ඒ | 3 | 0.1 | 9 | 3 | 90 |
| 8 සී | 1 | 1 | 873 | 873 | 873 |
| 8 ඊ | 0.5 | 0.5 | 908 | 1816 | 1816 |
| 8 එෆ් | 3 | 2.5 | 1486 | 495 | 594 |
| එඩ්බී | | | | | |
| 1 | 3.46 | 0 | 0 | 0 | 0 |
| 3 | 1.2 | 0.4 | | 0 | 0 |
| 4 | 1.62 | 1.62 | 430 | 265 | 265 |
| 5 | 0.94 | 0.94 | 538 | 572 | 572 |
| 8 | 4 | 2.87 | 1185 | 296 | 413 |
| 10 | 0.6 | 0.6 | 226 | 375 | 375 |
| තේ.පර්.ආයතනයේ කෙෂත්‍රයන් | | | | | |
| 2 | 3.52 | 3.52 | 383 | 109 | 192 |
| 3 ඒ | 1.34 | 1.34 | | | |
| 1 ඒ | 1.2 | 1.2 | 1264 | 1053 | 1053 |
| 04 | 1 | 1 | 250 | 250 | 250 |
| මුළු එකතුව | 48.54 | 25.96 | 15730 | 324 | 630 |

**රබර් වගාව- 2022**

| වර්ෂය | අස්වැන්න (කිලෝ) | අස්වැන්න හෙක්ටාර් 1ක (කිලෝ) |
|---|---|---|
| 2022 | 2030 | 246 |
| 2021 | 2510 | 304 |

**තේ වගා කෘෂිකාර්මික ක්‍රියාකාරකම්.**
වතුයාය තුල සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු සිදුකරන ලදී.

**ශාන්ත ජෝකිම් පැළ තවාන.**
2022 වර්ෂය තුල ශාන්ත ජෝකිම් පැළ තවානෙන් තේ පර්යේෂණ ආයතනයේ 5000 කාණ්ඩයේ මවු ශබා ව්‍යපෘතියට හා කුඩා තේ වතු හිමියන් වෙත තේ පැළ 48210 ක ප්‍රමාණයක් නිකුත් කරන ලදී.

**පැළ නිකුත් කිරීම**

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| (පී.එල්.340 තවානෙන් පැළ තේ පර්යේෂණායතනයේ කෘෂි කාර්මික අංශය වෙත නිකුත් කල පැළ ප්‍රමාණය | 1375 |
| වතුයායේ පැළ තවානෙන් කුඩා තේ වතු හිමියන් වෙත නිකුත් කල පැළ ප්‍රමාණය | 19875 |
| කොන්ත්‍රාත් පැළ තවානෙන් කුඩා තේ වතු හිමියන් වෙත නිකුත් කල ප්‍රමාණය | 26960 |
| මුළු පැළ නිකුත් කිරීම | 48210 |

**මව් ශබා ව්‍යාප්ති වැඩසටහන (තේ රිකිලි ලබාදීම).**
කුඩා තේ වතු හිමියන් හා වතුයායේ පැළ තවාන සඳහා රිකිලි තේ අතු 5300 නිකුත් කර ඇත.
වතුයායේ තේ තවානට රිකිලි - 2600
කුඩා තේ වතු හිමියන්ට රිකිලි - 2700

**කර්මාන්තශාලා නිෂ්පාදන ශුද්ධ මිල ගණන්.**
2021 වර්ෂයේදී 609/99 ක් වූ තේ කිලෝවක ශුද්ධ අලෙවි මිළ 2022 වර්ෂයේදී 1493/22 විය.

**සමස්ත තේ නිෂ්පාදනය.**
පසුගිය වර්ෂයට සාපේක්ෂව නිමි තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 47,489 ක වර්ධනයක් 2022 වර්ෂය තුල දක්නට ලැබුනි.

**කාලගුණය හා වර්ෂාපතනය.**
2022 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මි 4721.16 ලෙස වර්තා වූ අතර, දින 180 ක් වැසි සහිත දින ලෙස වාර්තා විය. 2021 වර්ෂයේ වර්ෂාපතනය 4533.70 මි.මි ලෙස සටහන්ව ඇති අතර වැසි සහිත දින 184 ලෙස සටහන්ව ඇත.

**වෙළඳ ප්‍රතිඵල**
ශාන්ත ජෝකිම් වත්ත සහ තේ කර්මාන්තශාලාවේ 2022 දෙසැම්බර් 31 දිනට **වෙළඳ ප්‍රතිඵල** පහත අයුරිනි.

| | 2022 | 2021 |
|---|---|---|
| මුළු ලාභ/අලාභය | රු 47,970,244.00 | රු (11,775,558.00) |

**විධායක හා කාර්ය මණ්ඩල තනතුරු වෙනස්වීම්.**
2022 අගෝස්තු මාසයේ වතු අධිකාරි ඩී. සී .සී ජයසේකර මහතා සේවයෙන් විශ්‍රාම ලබා ගන්නා ලද අතර, එදින සිට ශාන්ත කුම්බස් වතුයායේ වතු අධිකාරි එම්. කේ. ඩී. ප්‍රියන්ත මහතා වැඩ ආවරණය කරන ලදී.

කණිෂ්ඨ සහකාර ලිපිකාරිනී එස් සුදර්ශනී මහත්මිය 2022.05.17 වන දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

# පරිපාලන සහ මූල්‍ය අංශය

## සුවිශේෂ කඩඉම්

### 1. මානව සම්පත් සංවර්ධනය සහ කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම

#### අ) සේවක බලගැන්වීම හා අභිප්‍රේරණය

**නව බඳවාගැනීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී ඩී එන් එන් දයාරත්න මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ඩී ආර් ගමගේ මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ඩබ් එම් අයි සත්සරණි මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| එල් ආර් යූ එල් සෙනවිරත්න මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ඩී එන් කහවෙවිතාන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| පී පී එන් ඩී ගාල්ලගේ මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| එස් එම් ජේ යූ බණ්ඩාර මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| යූ පී ඩී පී රණතුංග මයා | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| එම් පී කේ මධුෂානි මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ආර් පී වී ටී චන්ද්‍රලාල් මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| කේ ඒ සී එල් කොඩිතුවක්කු මයා | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| පී ඒ එම් ජයවර්ධන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| එම් ටී එස් සෙව්වන්දි පෙරේරා මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ආර් බී එල් හේමකුමාර මයා | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| කේ එල් එස් සී ගුණවර්ධන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| යූ කේ ආර් කුමාරි මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ජේ ජයේන්ද්‍රන් මයා | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| එම් කේ ඩී දමයන්ති මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ඩබ් එම් එම් එස් එච් පරණයාපා මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| බී එල් ඩී එස් එම් ප්‍රනාන්දු මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| ජේ එම් කේ උදයාංගනී මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| පී කේ ඩබ් එච් ධර්මදාස මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| බී එම් ටී ටී කේ සේනාරත්න මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| බී වී සනාලි මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.14 |
| පී ඒ ඩී එස් සුමතිපාල මයා | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.21 |
| ආර් එම් එන් එස් බණ්ඩාර මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.21 |
| ඊ පී ඩී එන් එම් විජේවර්ධන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.21 |
| එස් පී ආර් විජේවර්ධන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.28 |
| ටී පී ඕ එන් ගුණවර්ධන මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.02.28 |
| එස් ආර් වික්‍රමසිංහ මිය | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | 2022.03.02 |
| ආර් පී ශිරාන් මයා | ආගන්තුක නිවාස භාරකරු | 2022.04.26 |
| පී පාතිපන් මයා | නේවාසිකාගාර භාරකරු | 2022.04.26 |
| ජේ නාසරන් මයා | නේවාසිකාගාර භාරකරු | 2022.04.26 |
| එම් රාමසාමි මයා | ආගන්තුක නිවාස භාරකරු | 2022.04.26 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එස් අයි පී එස් පියරුවන් මයා | උපදෙස් නිලධාරී | 2022.01.21 |
| පී පී එන් ඩී ගාල්ලගේ මිය | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 2022.04.30 |
| එස් පී රත්නායක මයා | ජ්‍යෙෂ්ඨ උපදෙස් නිලධාරී | 2022.10.10 |
| ඒ ආර් එම් ඒ එම් රත්නායක මිය | උපදෙස් නිලධාරී | 2022.12.16 |

**සේවයෙන් විශ්‍රාම ගැන්වීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි | අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිලධාරී | 2022.12.31 |
| ඩබ් ඒ එස් විජේතුංග මයා | පර්යේෂණ නිලධාරී | 2022.12.31 |
| ඩබ් ටි බී ඩී ප්‍රියන්ත මයා | අත්හදාබැලීමේ නිලධාරී | 2022.12.31 |
| පී කේ ජයවික්‍රම මයා | අතහදාබැලීමේ නිලධාරී | 2022.12.31 |
| එන් එස් ඒකනායක මයා | තාක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය හා දෘශ්‍ය) | 2022.12.31 |
| එස් මුතුකුමාර් මයා | පොදු සේවක | 2022.12.31 |
| එස් බාලක්‍රිෂ්නන් මයා | පොදු සේවක | 2022.12.31 |
| පී එස් කුලසිරි මයා | ක්ෂේත්‍ර සුපරීක්ෂක | 2022.12.31 |
| එස් තංගරාජ් මයා | පොදු සේවක | 2022.12.31 |
| පී වීරමුත්තු මයා | පොදු සේවක | 2022.12.31 |
| පී පී චන්ද්‍රකාන්ති මිය | පොදු සේවක | 2022.12.31 |
| එන් පුෂ්පරාජ් මයා | පොදු සේවක | 2022.12.31 |
| ඩබ් එම් එස් ජේ වීරසිංහ මයා | පොදු සේවක | 2022.12.31 |
| පී සෙල්වරාජ් මයා | පොදු සේවක | 2022.12.31 |
| එස් හෙට්ටිආරච්චි මිය | පොදු සේවක | 2022.12.31 |
| කේ ජයරත්නම් මයා | පොදු සේවක | 2022.12.31 |

**උසස්වීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ආචාර්ය එස් ආර් ඩබ් පතිරණගේ | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2022.02.01 |
| ආචාර්ය පී පී ඩී එස් අමරසිංහ (මිය) | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2022.02.01 |
| ආචාර්ය ටි එල් විජේරත්න (මිය) | ප්‍රධාන පර්යේෂණ නිලධාරී | 2022.12.12 |
| ආචාර්ය කේ පී නෙලුම් පී පියසේන (මිය) | ප්‍රධාන පර්යේෂණ නිලධාරී | 2022.12.12 |
| ආචාර්ය ජේ ඩී කොට්ටවආරච්චි | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2022.12.12 |
| එන් නෙරංජන් මයා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2022.12.12 |
| ආචාර්ය එච් එම් සී පී පිලපිටිය (මෙනවිය) | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2022.12.12 |
| ආචාර්ය සී ජේ ලියනආරච්චි | ජ්‍යෙෂ්ඨ උපදෙස් නිලධාරී | 2022.12.12 |
| එම් ඒ එච් නිශාන්ති මිය | ජ්‍යෙෂ්ඨ උපදෙස් නිලධාරී | 2022.12.12 |

**මියගිය සේවකයින්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ඒ කේ ජේ අතුකෝරල | පොදු සේවක | 2022.11.16 |

**ස්ථාන මාරුකිරීම්**

| නම | තනතුර | මාරුකල ස්ථානය | දිනය |
|---|---|---|---|
| ඒ එච් පී දයාරත්න මයා | ඉංජිනේරු සහකාර (විදුලි) | තලවකැලේ | 2022.03.10 |
| ජේ එම් පී ඩබ් ජයවීර මයා | විදුලි කාර්මික | රත්නපුර | 2022.03.10 |
| ටි ඕ පී එන් ගුණවර්ධන මයා | තාක්ෂණ නිලධාරී (ප හා සං) | රත්නපුර | 2022.03.14 |
| ආර් බී එල් හේමකුමාර මයා | තාක්ෂණ නිලධාරී (ප හා සං) | රත්නපුර | 2022.03.14 |
| කේ ඒ සී එල් කොඩිතුවක්කු මයා | තාක්ෂණ නිලධාරී (ප හා සං) | රත්නපුර | 2022.05.23 |
| කේ වි කහවෙව්තාන මිය | තාක්ෂණ නිලධාරී (ප හා සං) | පා.ශා.පෝ.අ | 2022.05.17 |
| ඩබ් එස් ටී විජේසිංහ මිය | කළමනාකරණ සහකාර (ස්ථාන) | කොට්ටව | 2022.08.08 |
| ඩි ආර් ගමගේ මිය | තාක්ෂණ නිලධාරී (ප හා සං) | හන්තාන | 2022.12.12 |
| එම් කේ ඩී දමයන්ති මිය | තාක්ෂණ නිලධාරී (ප හා සං) | රත්නපුර | 2022.12.12 |
| එන් සී වීරකෝන් මිය | තාක්ෂණ නිලධාරී (ප හා සං) | වලහන්දූව | 2022.12.12 |
| කේ ඒ එම් ප්‍රේමමාලි මිය | ව්‍යාප්ති නිලධාරී | රත්නපුර | 2022.12.12 |
| පී වෙත්තසිංහ මිය | ව්‍යාප්ති නිලධාරී | කොට්ටව | 2022.12.12 |

| | | | |
|---|---|---|---|
| එච් ඩබ් එම් එම් එම් ජයරත්න මිය | තාක්ෂණ නිලධාරි (ප හා සං) | හන්තාන | 2022.12.12 |
| ඩබ් එම් අයි සත්සරණි මිය | තාක්ෂණ නිලධාරි (ප හා සං) | රත්නපුර | 2022.12.12 |

**විදේශ පුහුණු/සම්මන්ත්‍රණ/සමුළු සහභාගිත්වය**

- ඕස්ට්‍රියාවේ සීබර්ස්ඩොර්ෆ් හි වියානා ජාත්‍යාන්තර මධ්‍යස්ථානයේ දී පැවැති 2020/2021 තාක්ෂණික සහයෝගිතාවයේ IAE නිත්‍ය වැඩසටහන යටතේ "තේවල ජානමය දියුණුවට සහයවීම" යන මැයෙන් මාස 09 මිත්‍රත්ව වැඩසටහන සඳහා ශාක අභිජනන අංශයේ පර්යේෂණ නිලධාරි කේ කේ රණවීර මයා 2022 අප්‍රේල් 19 දින සිට 2023 ජනවාරි 27 දක්වා සහභාගි විය.
- ඕස්ට්‍රියාවේ සීබර්ස්ඩොර්ෆ් හි වියානා ජාත්‍යාන්තර මධ්‍යස්ථානයේ දී පැවැති 2020/2021 තාක්ෂණික සහයෝගිතාවයේ IAE නිත්‍ය වැඩසටහන යටතේ "තේවල ජානමය දියුණුවට සහයවීම" යන මැයෙන් මාස 03ක මිත්‍රත්ව වැඩසටහන සඳහා ශාක අභිජනන අංශයේ තාක්ෂණ නිලධාරි (පර්යේෂණ හා සංවර්ධන) එච් ඩබ් එම් එම් එම් ජයරත්න මිය 2022 අගෝස්තු 1 සිට 2022 ඔක්තෝම්බර් 31 දක්වා සහභාගි විය.

- පහත සඳහන් නිලධාරීන්ගේ අධ්‍යයන කාලය දීර්ඝ කරන ලදී.
    - පාංශු හා ශාක පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරි එස් රගුරාජ් මහතා 2022 සැප්තැම්බර් මස 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මැලේසියාවේ පුත්‍ර විශ්ව විද්‍යාලයේදී

    - පාංශු හා ශාක පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරිනී කේ ඒ ඒ රත්නසේකර මිය 2022 සැප්තැම්බර් මස 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මැලේසියාවේ පුත්‍ර විශ්ව විද්‍යාලයේදී

**දේශීය පුහුණු/සම්මන්ත්‍රණ/වැඩමුළු**

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලද "තේ පරීක්ෂණය සහ ශ්‍රේණිගත කිරීම" පිළිබඳ පුහුණුව සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේ උපදෙස් නිලධාරි ඒ ආර් එම් ඒ එම් රත්නායක මිය, ව්‍යාප්ති නිලධාරි පී එස් ප්‍රදීප් මයා, ශාක අභිජනන අංශයේ තාක්ෂණ නිලධාරි (ප හා සං) එච් ඩබ් එම් එම් එම් ජයරත්න මිය සහභාගි විය (අප්‍රේල් 02).

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලද ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ 24 වෙනි පුහුණුව සඳහා ප්‍රසම්පාදන ඒකකයේ කළමනාකරණ සහකාර (ලිපිකාර) පී පී එච් විජේසේන මයා, ගිණුම් අංශයේ කළමනාකරණ සහකාර (ගිණුම්) කේ ඒ ඩී සුදත් මයා සහභාගි විය (මාර්තු 2022).

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලද "කඩදාසි රහිත කාර්යාල පරිසරයක් ගොඩ නඟන්නේ කෙසේද" යන්න පිළිබඳ පුහුණුව සඳහා පරිපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි කේ පී කේ ඒ සෙව්වන්දි මිය, ප්‍රසම්පාදන ඒකකයේ ප්‍රසම්පාදන නිළධාරි ආර් එම් එන් නයනජිත් මයා සහභාගි විය (නොවැම්බර් 3දා).

- ගණිත හා කළමනාකරණ ආයතන පුද්ගලික සමාගම විසින් පවත්වන ලද "ආර්ථික ආකෘති නිර්මාණය" පිළිබඳ වැඩමුලුවට කෘෂි ආර්ථික ඒකකයේ අංශ ප්‍රධානි ආචාර්ය එච් ඩබ් ශ්‍යාමලී, ආචාර්ය එච් එම් සී පී පිලපිටිය මිය සහභාගි විය (නොවැම්බර් 29දා).

- ගණිත හා කළමනාකරණ ආයතන පුද්ගලික සමාගම විසින් පවත්වන ලද "බෝවන රෝග ආකෘතිකරණය" පිළිබඳ වැඩමුලුව සඳහා කීට හා වටපණු විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි ආචාර්ය පී පී ඩී එස් අමරසේන මිය සහභාගි විය (නොවැම්බර් 5 දා).

## යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව

### නඩත්තු කටයුතු (විශේෂ ව්‍යාපෘති)

රත්නපුර ශාන්ත ජෝකම් තේ කර්මාන්තශාලාවේ වහලේ ප්‍රතිසංස්කරණ කටයුතු - නිමකර ඇත
රත්නපුර ශාන්ත ජෝකම් තේ කර්මාන්තශාලාවේ දැව පොළව ප්‍රතිස්ථාපනය කිරීම - නිමකර ඇත
ඒ ශ්‍රේණි නිවාසවල ගටර්ස් සහ ඩවුන් පයිප්ප ප්‍රතිස්ථාපනය කිරීමේ ඉතිරි වැඩ - නිමකර ඇත
කොට්ටව විසරණ වාරිමාර්ග පද්ධතිය - වැඩ කරමින් පවතී

### නඩත්තු කටයුතු (ප්‍රාග්ධන අයවැය)

හන්තාන කාර්යාල ගොඩනැගිල්ලේ වහල ප්‍රතිසංස්කරණ කටයුතු - නිමකර ඇත.
කොට්ටව කම්කරු නිවාස ආසන්නයේ රැඳවුම් බැම්ම - ඉදිරිකිරීම නිමකර ඇත.
කෘෂි ආර්ථික ඒකකයේ වැසිකිලිය ප්‍රතිසංස්කරණ කටයුතු - නිමකර ඇත.
කැමේලියා නේවාසිකාගාරයේ නානකාමර අලුත්වැඩියා ඉතිරි වැඩ - නිමකර ඇත.
හන්තාන විද්‍යාගාරයේ ප්‍රතිසංස්කරණය කිරීම - වැඩ සිදුකරමින් පවතී.
උපදෙස් හා ව්‍යාප්ති අංශයේ වැසිකිලිය ප්‍රතිසංස්කරණය කිරීම - වැඩ සිදුකරමින් පවතී.

### නඩත්තු කටයුතු

වාර්ෂික පින්තාරු කිරීමේ වැඩසටහන යටතේ පහත සඳහන් පින්තාරු කටයුතු අවසන් කර ඇත.
මෙම ගොඩනැගිලිවල සියලුම (වඩුවැඩ, පෙදරේරු වැඩ, ජලනල හා වහල අලුත්වැඩියා කටයුතු ඇතුලුව) අභ්‍යන්තර පින්තාරු කටයුතු සිදුකරන ලදී,

"ඒ " වර්ගයේ බංගලා 3,13
"බී " වර්ගයේ බංගලා 9,17
"සී " වර්ගයේ බංගලා 5,19,21,39,23,11,6,9,35,44
"ඩී " වර්ගයේ නිවාස 40,9,8,7

### අමතර පින්තාරු වැඩ

නව බඳවා ගැනීම් වෙනුවෙන් කැමේලියා නේවාසිකාගාරයේ නේවාසිකාගාර කාමර 15ක් පිරිසිදු කර බිම ඔප දමා සූදානම් කරන ලදී
තේ පර්යේෂණ ආයතන පරිශ්‍රයේ ආරක්ෂක සේවා කුටි අභ්‍යන්තර හා බාහිර පින්තාරු කටයුතු
අභ්‍යන්තර මාර්ගවල අලුත්වැඩියා කටයුතු
කැමේලියා මාර්ගයේ අලුත්වැඩියා කටයුතු
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීගේ කාර්යාල කාමරයේ බිම පින්තාරු කිරීමේ කාර්යයන්
උපදෙස් හා ව්‍යාප්ති අංශයේ අභ්‍යන්තර පිරිසිදු කිරීම සහ ඔප දැමීමේ කටයුතු
"ඒ " 03 බංගලාවේ ගරාජයේ වහාල පින්තාරු කිරීම
"බී " 01 බංගලාවේ වහල පින්තාරු කිරීම
ශාක ව්‍යාධිවේදී අංශයේ ප්‍රතිසංස්කරණය කරනලද කාමරයේ අභ්‍යන්තර පින්තාරු කිරීම හා බිම පින්තාරු කිරීම් කටයුතු
අමාත්‍යවරයාගේ සංචාරය වෙනුවෙන් විද්‍යාගාර ප්‍රදේශයේ හා අනෙකුත් පරිශ්‍රවල අභ්‍යන්තර

### පින්තාරු කටයුතු

"ඒ " 14 බංගලාවේ ජනෙල් සහ කවුලු සඳහා ස්ථාවර කම්බි දැල් සවිකිරීම
ශාන්ත කූම්බ්ස් වතුයායේ නිල නිවාස අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ සහ පින්තාරු කටයුතු
ජෛව රසායන අංශයට දූමායන යන්ත්‍රය සවිකිරීමට සහායවීම
කැමේලියා නේවාසිකාගාරයේ අංක 38,18,22,36,34 නේවාසික කාමර පිරිසිදු කර ඔපදැමීම
කනිෂ්ඨ කාන්තා නේවාසිකාගාරයේ අංක 06 කාමරය පිරිසිදු කිරීමේ කටයුතු

කනිෂ්ඨ කාන්තා නේවාසිකාගාරයේ අංක 04 කාමරය පින්තාරු කිරීමේ කටයුතු
ක්‍රීඩා සමාජ ශාලාවේ බිම පිරිසිදු කර වැක්ස් කිරීම
ජෛව රසායන අංශයේ ප්‍රතිසංස්කරණය කරන ලද කාමරයේ බිත්ති හා බිම පින්තාරු කිරීම
පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය වෙනුවෙන් ක්‍රීඩා සමාජ ශාලාවේ බාහිර හා අභ්‍යන්තර පින්තාරු කිරීම
| **තේ පර්යේෂණ ආයතනය** | රු. '000 | රු. '000 |
| FD එරෙහි ණය - ශාන්ත කුම්බ්ස් වතුයාය | 1,659,999.96 | 9,620,968.69 |
| FD එරෙහි ණය - ශාන්ත ජෝකිම් වතුයාය | 23,839,054.38 | 18,827,192.77 |
| | 25,499,054.34 | 28,448,161.46 |
| **ශාන්ත කුම්බ්ස් වත්ත** | | |
| තැරැව්කරු අත්තිකාරම් (ෆෝබ්ස් සහ වෝකර්) | - | - |
| | | - |
| ශාන්ත ජෝකිම් වත්ත | | |
| තැරැව්කරු අත්තිකාරම් (ෆෝබ්ස් සහ වෝකර්) | - | - |
| මුළු කෙටි කාලීන ණය ගැනීම් | **25,499,054.34** | **28,448,161.46** |

## සටහන 18 - කෙටිකාලීන ප්‍රතිපාදන

| **කෙටිකාලීන ප්‍රතිපාදන** | **2022**<br>**රු. '000** | **2021**<br>**රු. '000** |
|---|---:|---:|
| තේ පර්යේෂණ ආයතනය | | |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,356,000.00 | 1,356,000.00 |
| නිවාඩු ගෙවීම් / ප්‍රසාද දීමනා ලබා දීම | 1,061,021.73 | 981,872.60 |
| | 2,417,021.73 | 2,337,872.60 |
| ශාන්ත කුම්බ්ස් වත්ත | | |
| නිවාඩු වැටුප් සඳහා ප්‍රතිපාදන | 4,625,600.00 | 4,866,870.00 |
| පැමිණීමේ බෝනස් සඳහා ප්‍රතිපාදන | 289,000.00 | 325,500.00 |
| දිරිගැන්වීමේ ප්‍රතිපාදන (2016) | 382,335.63 | 382,335.63 |
| දිරිගැන්වීමේ ප්‍රතිපාදන (2017) | 906,670.16 | 906,670.16 |
| ලාබ බෙදීමේ බෝනස් | 40,500.00 | - |
| | 6,244,105.79 | 6,481,375.79 |
| ශාන්ත ජෝකිම් වත්ත | | |
| නිවාඩු වැටුප් සඳහා ප්‍රතිපාදන | 1,943,531.39 | 1,973,675.92 |
| පැමිණීමේ බෝනස් සඳහා ප්‍රතිපාදන | 105,395.83 | 76,250.00 |
| | 2,048,927.22 | 2,049,925.92 |
| මුළු කෙටිකාලීන ප්‍රතිපාදන | **10,710,054.74** | **10,869,174.31** |

## සටහන 19 - සේවක ප්‍රතිලාභ

| | **2022**<br>**රු. '000** | **2021**<br>**රු. '000** |
|---|---:|---:|
| **ශාන්ත කුම්බ්ස් වත්ත** | | |
| සේවක අර්ථසාධක අරමුදල | 2,648,445.86 | 3,439,230.53 |
| සේවක භාර අරමුදල | 361,151.86 | 449,745.37 |
| | 3,009,597.72 | 3,888,975.90 |
| **ශාන්ත ජෝකිම් වත්ත** | | |
| සේවක අර්ථසාධක අරමුදල | 574,424.98 | 868,591.54 |
| සේවක භාර අරමුදල | 104,030.66 | 108,510.00 |
| | 678,455.64 | 977,101.54 |
| මුළු සේවක ප්‍රතිලාභ | **3,688,053.36** | **4,866,077.44** |

## සටහන 20 - ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

| | 2022<br>රු. '000 | 2021<br>රු. '000 |
|---|---|---|
| ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | | |
| MPI විශේෂ ව්‍යාපෘති පැල අභිජනනය | (6,313,775.63) | (5,589,976.42) |
| MPI විශේෂ ව්‍යාපෘති කායික විද්‍යාව | 3,454,049.82 | 3,454,049.82 |
| MPI විශේෂ ව්‍යාපෘති ඉංජිනේරු | 1,903,091.43 | 3,989,301.25 |
| CARP විශේෂ ව්‍යාපෘති කීට විද්‍යාව | 1,615,141.06 | 1,621,651.06 |
| MPI විශේෂ ව්‍යාපෘති ඉංජිනේරු සී වර්ගයේ බංගලාව | 13,167,288.42 | 10,676,236.44 |
| ACMSC | 2,595,458.89 | 2,783,806.08 |
| ඉන්දියා ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය | 294,524.50 | 416,339.86 |
| FAO පස්සර | 64,868.71 | 192,419.71 |
| සමමුහුර්ත ජෛව තාක්ෂණ ව්‍යාපෘතිය | (285,265.97) | (285,265.97) |
| CARP විශේෂ ව්‍යාපෘති ජෛව රසායන විද්‍යාව | 130,573.40 | - |
| MPI විශේෂ ව්‍යාපෘතිය 19 ඉංජිනියර් රු මී 18 | 48,906.72 | 48,906.72 |
| MPI විශේෂ ව්‍යාපෘතිය 19 ප්‍රග්ධන උපකරණ 46 | 1,541,700.73 | 1,541,700.73 |
| JIFF නිෂ්පාදන (ශාක අභිජනනය) | 84,620.70 | 84,620.70 |
| මීවිගන් | 555,834.88 | 688,600.00 |
| JAT කෘෂි | 197,209.22 | 228,429.95 |
| StaRR ව්‍යාපෘතිය | (438,088.62) | (4,355,731.98) |
| CIC & TRI Tyara ව්‍යාපෘතිය | 838,186.40 | 838,186.40 |
| Zagro සිංගප්පූ Testing of Green Tea | 18,327.78 | 110,643.75 |
| Zagro සිංගප්පූ Testing of Herbicide | 185,081.12 | 185,081.12 |
| අමු දලු විග්‍රහයන් | 27,800.00 | 27,800.00 |
| මෙටබොලික් කලබ | 38,400.00 | 38,400.00 |
| MPI විශේෂ ව්‍යාපෘති 2020 | 3,376,395.59 | 3,078,873.34 |
| කොම්පොස් යන්ත්‍ර ව්‍යපාති (උපදෙස්) | 3,004,471.70 | 13,857,882.88 |
| ජංගම විද්‍යාගාර (උපදෙස්) | 557,427.56 | 14,522,403.69 |
| පර්යේෂණ තේ ෆැක්ටරි (තාක්ෂණික) | (66,021.74) | 30,572,165.99 |
| ස්වයං තේ නෙලීම | 7,258,847.47 | 7,530,313.63 |
| බීජ වගා පිහිටවීම් | 3,186,720.40 | 6,844,989.37 |
| වැඩිදියුනු කිරීම් - Bio Petside | 1,032,328.59 | 2,514,674.78 |
| තේ වයින් MOU | (187,137.20) | - |
| N - Tea ව්‍යාපෘතිය | 10,391,199.33 | - |
| මව් ශාක ව්‍යාපෘතිය | 15,677,584.00 | - |
| WUE- බ්‍රිස්ටල් ව්‍යාපෘතිය | 2,769,000.00 | - |
| ක්ලෝරත් පරීක්ෂා කිරීම - නව්‍ය අලෙවිකරණය | 59,300.00 | - |
| එකතුව ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | **66,784,049.26** | **95,616,502.90** |

## සටහන 21 - පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

| **සටහන 21** | **2022**<br>රු. '000 | **2021**<br>රු. '000 |
|---|---|---|
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | | |
| තේ පර්යේෂණ ආයතනය | | |
| 01/01/22 දිනට ශේෂය | 145,088,156.85 | 140,884,785.25 |
| එකතු ; වර්ෂය සඳහා ප්‍රතිපාදන | 10,857,381.90 | 17,624,291.60 |
| ප්‍රතිපාදන යටතේ | 86,000.00 | 390,990.00 |
| | 156,031,538.75 | 158,900,066.85 |
| අඩු: වර්ෂය තුළ ගෙවනු ලැබීම් | 4,557,424.00 | 13,774,785.00 |
| වැඩිපුර සැපයීම | 165,200.00 | 37,125.00 |
| 31/12/22 දිනට අවසන් ශේෂය | **151,308,914.75** | **145,088,156.85** |
| **ශාන්ත කුම්බ්ස් වත්ත** | | |
| 01/01/22 දිනට ශේෂය | 95,827,068.75 | 69,330,847.75 |
| එකතු : වර්ෂය සඳහා ප්‍රතිපාදන | 5,752,422.00 | 5,919,000.05 |
| ප්‍රතිපාදන යටතේ | - | 24,238,454.70 |
| | 101,579,490.75 | 99,488,302.50 |
| අඩු: වර්ෂය තුළ ගෙවනු ලැබීම් | 9,847,720.40 | 3,661,233.75 |
| වැඩිපුර සැපයීම | 2,099,649.11 | - |
| 31/12/22 දිනට අවසන් ශේෂය | **89,632,121.24** | **95,827,068.75** |
| **ශාන්ත ජෝකිම් වත්ත** | | |
| 01/01/22 දිනට ශේෂය | 24,559,060.38 | 20,275,286.38 |
| එකතු : වර්ෂය සඳහා ප්‍රතිපාදන | 1,562,562.50 | 1,517,735.00 |
| ප්‍රතිපාදන යටතේ | 1,608,896.50 | 4,548,550.00 |
| | 27,730,519.38 | 26,341,571.38 |
| අඩු: වර්ෂය තුළ ගෙවනු ලැබේ | 1,330,000.00 | 1,775,000.00 |
| වැඩිපුර සැපයීම | 231,916.00 | 7,511.00 |
| 31/12/22 දිනට අවසන් ශේෂය | **26,168,603.38** | **24,559,060.38** |
| පාරිතෝෂිකය සඳහා මුළු ප්‍රතිපාදන | **267,109,639.37** | **265,474,285.98** |

## සටහන 22 - පෙට්‍රල් තැන්පතු ආපසු ගෙවිය යුතු

| | **2022**<br>රු. '000 | **2021**<br>රු. '000 |
|---|---|---|
| **සටහන 22** | | |
| පෙට්‍රල් තැන්පතු ආපසු ගෙවිය යුතු | | |
| 2022/01/01 දිනට ග් ශේෂය | 11,000.00 | 12,800.00 |
| එකතු : - 2022 වර්ෂය තුළ එකතු කිරීම් | 250.00 | 250.00 |
| | 11,250.00 | 13,050.00 |
| අඩු: - 2022 වර්ෂය තුළ මුදල් ආපසු ගෙවීම | 500.00 | 2,050.00 |
| 31/12/2022 දිනට අවසන් ශේෂය | 10,750.00 | 11,000.00 |

## සටහන 23 - දිගු කාලීන ණය ගැනීම්

| දිගු කාලීන ණය ගැනීම් | 2022<br>රු. '000 | 2021<br>රු. '000 |
|---|---|---|
| තේ පර්යේෂණ ආයතනය | | |
| FD එරෙහි ණය - ශාන්ත කුම්බස් වතුයායට | 5,201,666.94 | 6,861,666.90 |
| FD එරෙහි ණය - ශාන්ත ජෝකිම් වතුයායට | 7,074,800.00 | 10,085,645.44 |
| | 12,276,466.94 | 16,947,312.34 |

## සටහන 24 - ප්‍රදාන සහ සංචිත

| ප්‍රදාන සහ සංචිත | 2022<br>රු. '000 | 2021<br>රු. '000 |
|---|---|---|
| තේ පර්යේෂණ ආයතනය | | |
| රජයේ ප්‍රතිපාදන | 134,428,046.00 | 163,986,495.91 |
| භාණ්ඩාගාර ප්‍රදාන ඩියුක්ස් බංගලාව | 24,500.00 | 28,000.00 |
| ප්‍රාග්ධන සංචිතය - එන්එස්එෆ් ව්‍යාධි විද්‍යාව | - | 566,305.09 |
| ප්‍රාග්ධන සංචිතය - ADB | 70,562,506.25 | 73,516,253.25 |
| ප්‍රාග්ධන සංචිතය - ARP | 5,345,787.17 | 5,602,653.79 |
| ප්‍රාග්ධන නැවත සිටුවීම - SLTB | 1,109,975.00 | 1,109,975.00 |
| විශේෂ ව්‍යාපෘති - 30Mn 2016 | 1,996,069.82 | 1,996,069.82 |
| විශේෂ ව්‍යාපෘති - 30Mn 2017 | 973,169.66 | 973,169.66 |
| ප්‍රාග්ධන ප්‍රදාන - ළමයින් සුරකින්න (ශාන්ත කුම්බස් වතුයාය) 2017 | 1,600,000.00 | 1,600,000.00 |
| ප්‍රාග්ධන සංචිත 30mn විශේෂ ව්‍යාපෘති - 2017 | 1,554,714.02 | 6,709,620.48 |
| ප්‍රාග්ධන සංචිත 30mn විශේෂ ව්‍යාපෘති - 2016 | 218,937.43 | 1,755,104.65 |
| ප්‍රාග්ධන සංචිතය ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය | 289,023.25 | 625,810.75 |
| ප්රාග්ධන සංචිත විශේෂ ව්යාපෘති කායික විද්යාව | 21,235.62 | 44,235.62 |
| ප්රාග්ධන සංචිත විශේෂ ව්යාපෘති ශාක අභිජනනය | 1,597,057.87 | 1,881,678.62 |
| ප්‍රාග්ධන සංචිත විශේෂ ව්‍යාපෘතිය ACMSC යුනිපවර් ව්‍යාපෘතිය | 18,745.21 | 40,745.21 |
| ප්‍රාග්ධන සංචිත විශේෂ ව්‍යාපෘතිය 2019 | 27,613,841.02 | 35,018,177.73 |
| ප්රාග්ධන සංචිත විශේෂ ව්යාපෘතිය 2018 - 99Mm | 73,899,379.41 | 75,579,855.16 |
| ප්‍රාග්ධන සංචිත භාණ්ඩාගාර විශේෂ ව්‍යාපෘතිය - ජෛව රසායන විද්‍යාව | 142,555.53 | 513,847.74 |
| ප්රාග්ධන සංචිත මිචිගන් | 108,200.05 | 122,340.05 |
| ප්රාග්ධන සංචිත StaRR ව්‍යාපෘතිය | 9,505,683.25 | 11,659,432.80 |
| ප්‍රාග්ධන සංචිත MPI විශේෂ ව්‍යාපෘතිය 2020 | 27,784,930.27 | 18,723,924.27 |
| ප්‍රාග්ධන සංචිත පර්යේෂණ තේ ෆැක්ටරි | 12,155,167.48 | 13,936,679.29 |
| ප්‍රාග්ධන සංචිත supporting Genatic වැඩිදියුනු කිරිම් | 4,532,884.79 | 5,295,798.93 |
| ප්‍රාග්ධන සංචිත ස්වයං තේ අස්වනු | 914,697.79 | - |
| ප්‍රාග්ධන සංචිත MPI විශේෂ ව්‍යාපෘතිය බයෝ පෙස්ටිසයිඩ් | 16,176,048.07 | - |
| ප්‍රාග්ධන සංචිත ජංගම බස් රථය | 20,590,315.71 | - |
| ප්‍රාග්ධන සංචිත කැපීම සහ අගල් කැපීම | 9,905,068.08 | - |
| ප්‍රාග්ධන සංචිත බීජ උද්‍යානය පිහිටුවීම | 91,898.04 | - |
| | **423,160,436.79** | **421,286,173.82** |
| **ශාන්ත කුම්බස් වත්ත** | | |
| PHDT ප්‍රදාන | 2,159,783.22 | 2,221,336.95 |
| | **2,159,783.22** | **2,221,336.95** |
| **මුළු ප්‍රදාන සහ සංචිත** | **425,320,220.01** | **423,507,510.77** |

## සටහන 25 - රජයේ අරමුදල් (පුනරාවර්තන)

| **රජයේ අරමුදල් (පුනරාවර්තන)** | **2022**<br>**රු. '000** | **2021**<br>**රු. '000** |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රතිපාදන | 419,900,000.00 | 383,500,000.00 |
| සමස්ත රජයේ අරමුදල් (පුනරාවර්තන) | **419,900,000.00** | **383,500,000.00** |
| **විලම්බිත ආදායම (ප්‍රාග්ධනය)** | | |
| පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ලැබුණු රජයේ ප්‍රතිපාදන වලින් විලම්බිත ආදායම | 56,558,449.91 | 53,008,867.38 |
| වෙනත් ප්‍රදාන වලින් විලම්බිත ආදායම | 32,773,053.38 | 30,889,572.39 |
| මුළු විලම්බිත ආදායම (ප්‍රාග්ධනය) | **89,331,503.29** | **83,898,439.77** |

## සටහන 26 - වෙනත් ආදායම්

| තේ රිකිලි අලෙවිය | **2022**<br>**රු. '000** | **2021**<br>**රු. '000** |
|---|---|---|
| හන්තාන | 438,600.00 | 763,650.00 |
| කොට්ටව | 468,000.00 | 967,127.50 |
| පස්සර | 977,100.00 | 966,675.00 |
| දෙනියාය | 8,362.50 | 44,063.00 |
| | 1,892,062.50 | 2,741,515.50 |
| **අමු දළු අලෙවිය** | | |
| තලවාකැලේ | 451,780.25 | 298,920.75 |
| හන්තාන | 1,591,598.86 | 1,893,202.32 |
| කොට්ටව | 5,319,567.50 | 2,383,438.83 |
| පස්සර | 4,149,594.06 | 2,162,091.61 |
| දෙනියාය | 838,265.38 | 583,978.65 |
| | 12,350,806.05 | 7,321,632.16 |
| **තේ පැල විකුණුම්** | | |
| හන්තාන | (143,081.64) | (132,346.70) |
| කොට්ටව | (76,083.70) | 60,559.38 |
| දෙනියාය | (17,516.55) | 29,104.00 |
| පස්සර | 187,235.68 | 22,312.75 |
| රත්නපුර | - | - |
| | (49,446.21) | (20,370.57) |

| | 2022<br>රු. '000 | 2021<br>රු. '000 |
|---|---|---|
| **විවිධ** | | |
| ප්‍රකාශන අලෙවිය | 1,213,496.00 | 148,300.00 |
| පොලී සහ කුලී | 1,076,437.11 | 1,018,864.48 |
| විශ්ලේෂණ සේවා | 16,897,565.00 | 5,337,115.00 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම පිළිබඳ ගිණුම්කරණ ලාභය | 4,455,000.00 | - |
| විවිධ | 4,199,944.53 | 1,777,466.34 |
| | 27,842,442.64 | 8,281,745.82 |
| ආයෝජන සඳහා පොළිය | 12,247,160.78 | 4,712,672.30 |
| | 12,247,160.78 | 4,712,672.30 |
| මුළු වෙනත් ආදායම | **54,283,025.76** | **23,037,195.21** |

## සටහන 27 - වතු දෙකේ ශුද්ධ ලාභය / ශුද්ධ අලාභය

| වතු දෙකේ ශුද්ධ ලාභය / ශුද්ධ අලාභය | 2022<br>රු. '000 | 2021<br>රු. '000 |
|---|---|---|
| ශාන්ත කූම්බ්ස් වතුයායේ ශුද්ධ ලාභය (අලාභය ) (උපලේඛන | 61,066,755.54 | (41,052,214.62) |
| ශාන්ත ජෝකිම් වතුයායෙන් ශුද්ධ ලාභය/ (අලාභය) (උපලේ | 47,872,363.18 | (11,609,477.33) |
| වතු වලින් ශුද්ධ ලාභය / (පාඩු) | **108,939,118.72** | **(52,661,691.95)** |

## සටහන 28 - වියදම

| | වියදම | පරිපාලන මූල්‍ය හා පොදු සේවා | උපදේශනය ව්‍යාප්ති සහ ප්‍රචාරණ | උපපොළ රත්නපුර හන්තාන | පර්යේෂණ | 2022 රු. '000 එකතුව | 2021 රු. '000 එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01 | පිරිස් ප්‍රතිලාභ | 87,092,986.17 | 40,039,840.82 | 37,816,013.26 | 106,470,859.59 | 271,419,699.84 | 235,596,836.14 |
| 08 | විශ්‍රාම වැටුප් සහ විශ්‍රාමික ප්‍රතිලාභ | 10,366,383.07 | 5,153,721.30 | 3,778,856.52 | 14,284,741.04 | 33,583,701.93 | 31,725,866.02 |
| 08 | පාරිතෝෂික ප්‍රතිපාදන | 10,757,623.80 | | | | 10,757,623.80 | 17,980,744.10 |
| 02 | ගමන් වියදම් | 1,191,308.75 | 694,724.74 | 520,457.05 | 829,822.57 | 3,236,313.11 | 2,449,822.34 |
| 03 | සැපයුම් සහ අවශ්‍යතා | 12,686,798.97 | 2,759,632.76 | 3,176,785.13 | 5,769,967.70 | 24,393,184.56 | 12,746,742.36 |
| 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | 18,759,263.00 | 1,626,046.39 | 3,694,936.19 | 1,669,713.45 | 25,749,959.03 | 24,524,255.83 |
| 04 | ස්ථාවර වත්කම් ක්ෂය කිරීම | 102,320,372.00 | | | | 102,320,372.00 | 71,448,625.04 |
| 05 | ආරක්ෂක සේවා | 13,455,372.51 | 3,577,202.63 | 8,072,635.27 | 1,591,258.40 | 26,696,468.81 | 26,660,341.39 |
| 05 | විදුලිය සහ උණුසුම | 13,150,252.41 | 605,890.54 | 4,783,438.81 | 178,099.30 | 18,717,681.06 | 12,862,395.35 |
| 05 | සන්නිවේදන | 1,372,265.82 | 830,701.95 | 502,659.51 | 713,070.94 | 3,418,698.22 | 5,665,395.86 |
| 05 | ප්‍රවාහන , උපයෝගිතා සහ වෙනත් සේවා | 10,332,985.15 | 2,122,691.06 | 1,499,090.83 | 89,859.77 | 14,044,626.81 | 22,818,536.13 |
| 07 | දායක මුදල් ප්‍රදාන සහ සහනාධාර | 9,697,627.82 | 268,912.45 | 121,170.88 | 333,445.73 | 10,421,156.88 | 6,763,425.94 |
| 10 | මාධ්‍ය, ප්‍රචාරණය, ප්‍රචාරණය සහ තෑගි | 262,372.66 | 1,417,733.81 | 171,703.59 | 59,715.86 | 1,911,525.92 | 749,020.29 |
| 12 | විවිධ - වෙනත් | 6,065,603.90 | 32,554.70 | 398.00 | 138,540.50 | 6,237,097.10 | 3,604,018.28 |
| | පර්යේෂණ හා සංවර්ධනය | | | | | - | - |
| 13.03 | රසායනික හා වීදුරු භාණ්ඩ (දේශීය හා විදේශීය) | 116,176.78 | 665,295.19 | 4,715.00 | 15,548,098.62 | 16,334,285.59 | 10,078,981.95 |
| 13.01 | වගාව සහ ක්ෂේත්‍ර පරීක්ෂණ | - | 12,465,673.02 | 4,350,490.35 | 7,250,970.93 | 24,067,134.30 | 21,379,658.04 |
| 13.05 | තවාන් වියදම් - TRI | - | - | - | 337,863.78 | 337,863.78 | 434,393.53 |
| 14.01 | පුහුණුව - දේශීය | 23,000.00 | - | - | 463,440.31 | 486,440.31 | 346,700.00 |
| 14.02 | පුහුණුව - විදේශ | - | - | - | 513,000.00 | 513,000.00 | 135,198.00 |
| 15 | විශේෂ ව්‍යාපෘතිය - ජෛව රසායනය (ෂොතෝල් බෝරා) | - | - | - | 4,100.00 | 4,100.00 | 9,200.00 |
| 15 | විශේෂ ව්‍යාපෘතිය - යාන්ත්‍රිකරණය | - | - | - | - | - | - |
| | මුළු වියදම | **297,650,392.81** | **72,260,621.36** | **68,493,350.39** | **156,246,568.49** | **594,650,933.05** | **507,980,156.59** |

## ශාන්ත කුම්බිස් - තලවාකැලේ

**(Lat. 6.54'N; Long. 80.42 E; 1394 amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C ) | | සෙ.මි. 20ක ගැඹුරේ දී පාංශු උෂ්ණත්වය (°C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය | මුළු වාෂ්පීකරණය | වර්ෂාපතනය මසකට (මිමි) | තෙත් දින ගණන | සුළං ප්‍රවේගය (පැයට කි.මී.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | පැය 8.30 | පැය 15. 30 | පැය 8.30 | පැය 15. 30 | දිනකට පැය | (මිමි) | | | |
| ජනවාරි | - | 12.3 | - | - | 89 | 78 | 4.4 | 48.60 | 132.1 | 11 | 1.6 |
| පෙබරවාරි | 25.9 | 10.2 | 22.5 | 23.2 | 78 | 65 | 7.9 | 73.20 | 32.6 | 3 | 2.3 |
| මාර්තු | 26.0 | 13.3 | 22.4 | 23.0 | 72 | 67 | 6.5 | 76.50 | 143.5 | 6 | 2.1 |
| අප්‍රේල් | 26.5 | 13.6 | 23.3 | 24.3 | 79 | 74 | 7.6 | 73.50 | 190.9 | 6 | 1.8 |
| මැයි | 24.6 | 16.2 | 23.4 | 23.8 | 88 | 86 | 4.0 | 42.60 | 365.3 | 15 | 2.1 |
| ජූනි | 23.9 | 15.5 | 22.8 | 23.8 | 87 | 81 | 5.0 | 47.50 | 160.0 | 7 | 2.1 |
| ජූලි | 23.4 | 16.2 | 22.3 | 22.7 | 91 | 85 | 3.4 | 41.20 | 289.5 | 16 | 2.7 |
| අගෝස්තු | 22.7 | 16.1 | 22.3 | 23.1 | 93 | 86 | 2.7 | 35.6 | 181.8 | 15 | 2.0 |
| සැප්තැම්බර් | 23.5 | 16.0 | 22.5 | 23.0 | 92 | 87 | 2.8 | 36.6 | 192.8 | 12 | 1.8 |
| ඔක්තෝම්බර් | 23.9 | 15.7 | 22.4 | 22.9 | 90 | 88 | 3.6 | 31.3 | 382.1 | 19 | 2.8 |
| නොවැම්බර් | 22.9 | 15.1 | 22.0 | 22.5 | 90 | 80 | 2.7 | 38.1 | 303.9 | 21 | 1.6 |
| දෙසැම්බර් | 25.6 | 13.0 | 22.4 | 23.7 | 78 | 73 | 6.1 | 64.4 | 49.1 | 6 | 1.9 |
| මුළු ප්‍රමාණය | | | | | | | | **609.1** | **2423.6** | **137** | **24.8** |
| මධ්‍ය අගය | **24.4** | **14.4** | **20.7** | **21.3** | **85.6** | **79.2** | **4.7** | **50.8** | **202.0** | | **2.1** |

## පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය - රත්නපුර

**(Lat. 6˚ 43´ N; Long. 80˚ 21' E; 29m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C ) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය දිනකට පැය | වර්ෂාපතනය මසකට (මිමි) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (මිමි) | සුළං ප්‍රවේගය (පැයට කි.මී.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | පැය 8.30 | පැය 15. 30 | | | | | |
| ජනවාරි | 23.1 | 32.2 | 86.5 | 69.3 | 3.1 | 220.1 | 9 | 66.6 | 0.6 |
| පෙබරවාරි | 22.4 | 34.6 | 86.5 | 53.1 | 5.8 | 41.8 | 6 | 109.9 | 1.0 |
| මාර්තු | 23.3 | 34.2 | 85.3 | 68.3 | 4.8 | 301.2 | 15 | 117.1 | 0.8 |
| අප්‍රේල් | 23.9 | 34.6 | 87.0 | 71.6 | 5.9 | 316.4 | 14 | 107.3 | 1.4 |
| මැයි | 24.2 | 33.1 | 86.2 | 78.5 | 3.4 | 788.4 | 23 | 67.7 | 1.3 |
| ජූනි | 24.0 | 32.3 | 85.1 | 73.8 | 4.4 | 545.4 | 17 | 103.6 | 1.9 |
| ජූලි | 24.5 | 32.0 | 87.2 | 77.5 | 3.9 | 399.2 | 18 | 89.2 | 2.3 |
| අගෝස්තු | 24.0 | 31.2 | 85.3 | 72.4 | 3.1 | 377.6 | 15 | 96.3 | 1.9 |
| සැප්තැම්බර් | 24.2 | 31.7 | 87.4 | 76.8 | 2.6 | 451.6 | 23 | 90.9 | 1.7 |
| ඔක්තෝම්බර් | 23.7 | 32.1 | 85.9 | 77.4 | 3.4 | 528.8 | 21 | 70.0 | 1.4 |
| නොවැම්බර් | 23.2 | 31.2 | 87.8 | 80.7 | 2.2 | 576.5 | 23 | 61.7 | 1.7 |
| දෙසැම්බර් | 23.0 | 34.1 | 83.6 | 73.3 | 5.6 | 245.4 | 10 | 103.3 | 0.5 |
| මුළු ප්‍රමාණය | | | | | | **4792.40** | **194.0** | **1083.6** | **16.50** |
| මධ්‍ය අගය | **23.6** | **32.8** | **86.2** | **72.7** | **4.0** | **399.37** | | **90.30** | **1.4** |

# මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය

# (Lat. 7.26’ N; Long. 80.63 E; Elevation 762 m amsl)

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C) | | සෙ.මි. 20ක ගැඹුරේ දී පාංශු උෂ්ණත්වය (°C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය දිනකට පැය | මුළු වාෂ්පීකරණය | වර්ෂාපතනය මසකට (මිමි) | තෙත් දින ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | පැය 8.30 | පැය 15. 30 | (මිමි) | පැය 15. 30 | | | | |
| ජනවාරි | 26.4 | 19.2 | 23.4 | 24.7 | 87.8 | 83.2 | 4.0 | 45.92 | 162.3 | 10 |
| පෙබරවාරි | 26.7 | 19.0 | 24.5 | 26.8 | 87.8 | 69.6 | 6.9 | 89.02 | 7.5 | 2 |
| මාර්තු | 29.9 | 19.6 | 26.3 | 29.0 | 83.2 | 74.2 | 6.4 | 94.60 | 106.3 | 3 |
| අප්‍රේල් | 29.8 | 19.8 | 26.1 | 29.3 | 86.8 | 76.1 | 7.1 | 72.34 | 273.2 | 7 |
| මැයි | 27.8 | 20.7 | 25.1 | 27.1 | 88.6 | 81.6 | 3.6 | 45.37 | 346.8 | 15 |
| ජූනි | 27.7 | 20.5 | 25.0 | 27.6 | 85.9 | 78.9 | 5.1 | 62.94 | 117.3 | 10 |
| ජූලි | 26.5 | 20.6 | 24.7 | 26.8 | 88.5 | 87.1 | 3.9 | 42.16 | 224.5 | 11 |
| අගෝස්තු | 26.3 | 20.3 | 24.5 | 26.2 | 90.0 | 84.1 | 3.9 | 41.72 | 178.7 | 11 |
| සැප්තැම්බර් | 26.9 | 20.3 | 24.4 | 27.2 | 86.4 | 83.7 | 4.3 | 41.33 | 148.6 | 10 |
| ඔක්තෝම්බර් | 26.4 | 20.0 | 24.0 | 25.8 | 87.0 | 85.4 | 3.5 | 46.78 | 441.9 | 18 |
| නොවැම්බර් | 25.9 | 19.6 | 23.4 | 24.6 | 92.0 | 87.1 | 2.2 | 26.08 | 448.7 | 21 |
| දෙසැම්බර් | 26.9 | 19.3 | 23.9 | 26.2 | 86.1 | 80.7 | 6.2 | 54.56 | 95.3 | 8 |
| මුළු ප්‍රමාණය | | | | | | | | **662.8** | **2551.1** | **126** |
| මධ්‍ය අගය | **27.3** | **19.9** | **24.6** | **26.8** | **87.5** | **81.0** | **4.8** | **55.2** | **212.6** | **10.5** |

## ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය - පස්සර

**(Lat. 6.57'N; Long. 81.07 E; 1120 amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0C$ ) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය දිනකට පැය | මුළු වාෂ්පීකරණය (මිමි) | වර්ෂාපතනය මසකට (මිමි) |
|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | (මිමි) | පැය 15. 30 | | | |
| ජනවාරි | 23.9 | 16.5 | 93 | 91.8 | 2.7 | 1.9 | 245.8 |
| පෙබරවාරි | 24 | 16.4 | 80.8 | 80.6 | 5.3 | 3.24 | 74.3 |
| මාර්තු | 25.8 | 17.3 | 74.8 | 77 | 3.3 | 1.84 | 191.4 |
| අප්‍රේල් | 26.9 | 18.2 | 74.3 | 74.7 | 4.8 | 2.56 | 233.7 |
| මැයි | 26.3 | 18.1 | 84 | 78 | 3.9 | 2.33 | 132.3 |
| ජූනි | 27.7 | 18.7 | 72 | 69 | 4 | 2.2 | 81.7 |
| ජූලි | 26.2 | 18.4 | 79 | 80 | 3.9 | 2.21 | 46.3 |
| අගෝස්තු | 26.7 | 18.3 | 83 | 81 | 3.8 | 2.22 | 82.7 |
| සැප්තැම්බර් | 26.7 | 18.6 | 78 | 78 | 2.6 | 1.59 | 41.2 |
| ඔක්තෝම්බර් | 25.9 | 17.6 | 82 | 81 | 2.9 | 1.28 | 239.5 |
| නොවැම්බර් | 24.9 | 17.6 | 85 | 87 | 2.3 | 1.12 | 187.2 |
| දෙසැම්බර් | 25 | 16.9 | 79 | 79 | 4.5 | 2.36 | 165.3 |
| මුළු ප්‍රමාණය | | | | | | | **1721.4** |
| මධ්‍ය අගය | **25.83** | **17.72** | **80.41** | **79.76** | **3.67** | | **143.45** |

# ව්‍යාප්ති මධ්‍යස්ථානය - ගාල්ල

**(Lat. 6.05'N; Long. 80 E; 30 m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C ) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය දිනකට පැය | වර්ෂාපතනය මසකට (මිමි) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (මිමි) | සුළං ප්‍රවේගය (පැයට කි.මී.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | පැය 8.30 | පැය 15. 30 | | | | | |
| ජනවාරි | 30.8 | 22.6 | 28.1 | 29.8 | 92 | 108.3 | 203.8 | 13 | 0.84 |
| පෙබරවාරි | 32.3 | 21.8 | 28.4 | 30.7 | 87 | 64.4 | 41.7 | 09 | 1.19 |
| මාර්තු | 32.9 | 22.4 | 28.9 | 31.1 | 85 | 43.6 | 171.1 | 13 | 1.24 |
| අප්‍රේල් | 32.2 | 23.1 | 29.5 | 30.5 | 87 | 328.1 | 297.1 | 15 | 1.45 |
| මැයි | 31.2 | 23.6 | 28.9 | 30.6 | 88 | 300.4 | 455.3 | 24 | 1.96 |
| ජූනි | 31.1 | 23.7 | 28.8 | 30.2 | 91 | 160.4 | 349.3 | 23 | 2.04 |
| ජූලි | 30.6 | 24.1 | 28.2 | 30.1 | 88 | 442.1 | 311.4 | 23 | 2.69 |
| අගෝස්තු | 30.1 | 24.0 | 28.2 | 29.8 | 89 | 153.0 | 175.8 | 17 | 2.41 |
| සැප්තැම්බර් | 30.4 | 23.8 | 28.6 | 29.9 | 88 | 538.4 | 279.6 | 22 | 2.19 |
| ඔක්තෝම්බර් | 30.5 | 23.8 | 28.3 | 29.6 | 88 | 184.3 | 472.5 | 23 | 1.84 |
| නොවැම්බර් | 29.8 | 22.9 | 27.5 | 29.3 | 89 | 256.6 | 560.4 | 22 | 1.55 |
| දෙසැම්බර් | 31.7 | 23.3 | 28.2 | 29.3 | 86 | 240 | 330.4 | 15 | 1.07 |
| මුළු ප්‍රමාණය | | | | | | **2819.6** | **3648.4** | **219** | |
| මධ්‍ය අගය | **31.1** | **23.3** | **28.5** | **30.1** | **88** | **235.0** | | | **1.71** |

# දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය

## (Lat. 6.05'N; Long. 80 E; 30 m amsl)

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C ) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය | | මධ්‍ය සූර්යය පතනය දිනකට පැය | වර්ෂාපතනය මසකට (මිමි) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (මිමි) |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | පැය 8.30 | පැය 15. 30 | | | | |
| ජනවාරි | 28.7 | 20.1 | 81 | 74 | 5.2 | 205.9 | 51.9 | 12 |
| පෙබරවාරි | 30.3 | 19.1 | 79 | 73 | 7.4 | 147.0 | 76.1 | 6 |
| මාර්තු | 30.2 | 19.8 | 80 | 79 | 7.0 | 377.1 | 93.1 | 12 |
| අප්‍රේල් | 30.6 | 21.1 | 84 | 84 | 7.7 | 390.9 | 74.0 | 16 |
| මැයි | 30.1 | 22.0 | 80 | 79 | 6.1 | 808.5 | 77.2 | 21 |
| ජූනි | 29.1 | 22.5 | 78 | 71 | 7.8 | 365.6 | 88.2 | 11 |
| ජූලි | 28.4 | 21.3 | 78 | 75 | 6.3 | 303.3 | 78.0 | 15 |
| අගෝස්තු | 28.3 | 22.3 | 78 | 74 | 6.3 | 203.2 | 75.5 | 12 |
| සැප්තැම්බර් | 28.8 | 22.3 | 81 | 75 | 6.1 | 367.5 | 64.4 | 19 |
| ඔක්තෝම්බර් | 28.9 | 21.7 | 80 | 78 | 6.1 | 391.9 | 63.8 | 19 |
| නොවැම්බර් | 28.7 | 21.6 | 80 | 78 | 5.2 | 420.0 | 67.0 | 19 |
| දෙසැම්බර් | 29.8 | 20.6 | 78 | 76 | 6.6 | 404.6 | 68.4 | 15 |
| මුළු ප්‍රමාණය | | | | | **77.8** | **4385.5** | **877.6** | |
| මධ්‍ය අගය | **29.3** | **21.2** | **79.8** | **76.3** | **6.5** | **365.5** | | **14.7** |

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | පිඑල්/ඩී/ටීආර්බී/ 1/2022/03 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 අගෝස්තු 22 දින |

TEA RESEARCH BOARD
31 AUG 2023
CHAIRMAN

සභාපති,
තේ පර්යේෂණ මණ්ඩලය.

**තේ පර්යේෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 01.ලේකම් , වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
02. ලේකම්, මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/ඩීටීආර්බී/1/2022/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 අගෝස්තු 22 දින

සභාපති,

තේ පර්යේෂණ මණ්ඩලය

**තේ පර්යේෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.410,563,413 ක් වූ යන්ත්‍ර හා උපකරණ අතුරින් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ පිරිවැය රු. 210,645,678 ක් වූ යන්ත්‍ර හා උපකරණ තවදුරටත් උපයෝජනය කරමින් පැවතියද, එවායේ ඵලදායී ජීවිත කාලය නැවත අගය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 19 ඡේදය ප්‍රකාරව සේවා සැපයීම ඇතුළත් ගනුදෙනුවක, වාර්තා කරන දිනයේ දී ගනුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන ගනුදෙනුව හා ආශ්‍රිත අයභාරය හඳුනාගත යුතු වුවද වතු හිමියන් සහ වතු සමාගම් වලින් රසායනාගාර පරීක්ෂණ සඳහා ලද පස් සාම්පල් වෙනුවෙන් වූ ඇස්තමේන්තුගත රු.2,822,425 ක විශ්ලේෂණාත්මක ගාස්තු සමාලෝචිත වර්ෂයේ අයභාරයක් ලෙස හඳුනාගෙන තිබුණු නමුත් ඒ සඳහා මුදල් ලැබීම හෝ පරීක්ෂණ සිදුකිරීම හෝ මේ දක්වා සිදුවී නොතිබුණු බැවින් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම් අධිගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 21 ඡේදය ප්‍රකාරව දැනටමත් අයභාරයේ ඇතුළත් කර ඇති මුදලක් එකතුකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැන නගින විට එකතුකර ගත නොහැකි හෝ අයකර ගැනීමේ හව්‍යතාවය දුරස්වී ඇති ප්‍රමාණය වියදමක් ලෙස හඳුනාගත යුතු වුවද මේ දක්වා විශ්ලේෂණ කටයුතු සිදුකර නොමැති 2020 සහ 2021 වර්ෂයන්හිදී ගිණුම්ගතකර ඇති විශ්ලේෂණ ගාස්තු රු.328,920 ක් සම්බන්ධව එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) තලවකැලේ , රත්නපුර, හන්තාන, පස්සර සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල පැවති මහෝගනී, කොස් සහ යුකැලිප්ටස් යනාදී උස් සෙවන ශාක 5,654 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 හා 16 ඡේද ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි වාහන 03 ක් රු.3,735,000 කට ප්‍රත්‍යාගණනය කර තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු අතර, එම වාහනවල අයිතිය තේ පර්යේෂණ මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

(ඊ) යන්ත්‍ර හා උපකරණ වල සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.382,787 ක් හා ආරම්භක සමුච්චිත ක්ෂය වටිනාකම රු.91,712 ක් වැඩියෙන් දක්වා තිබුණු බැවින් 2022 වර්ෂය අවසානයට යන්ත්‍ර හා උපකරණවල ශුද්ධ අගය රු.474,499 ක් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කර තිබුණු පිරිවැය රු. 23,873,451 ක් වූ බස් රථ, උපකරණ හා මාර්ග යනාදී වත්කම් වර්ග 9 ක ක්ෂය වටිනාකම ගණනය කිරීමේ දෝෂයක් නිසා රු.313,122 කින් අධිගණනය වී තිබුණි.

(ඌ) පිළිවෙලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, තලවකැලේ වැවිලි සමාගමට හා රජයට අයිති ඉඩම් වල මණ්ඩලය විසින් රු.72,956,788 ක් වැයකර වලහන්දුව,දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ඉදිකර මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණි. එම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගෙන නොතිබුණු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ), (ඉ), යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
| --- | --- |
| ----------------------------- | ---------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මු.රෙ. 571 (3) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද රු.449,198 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ii) මු.රෙ. 756 (9)

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළයුතු වුවත්, 2021 සහ 2022 වර්ෂයන්හි එම වාර්තා, 2023 ජූලි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 (1) වගන්තිය යටතේ වූ තේ පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල 1959 ජුනි 01 දින සිට අනුමත අර්ථසාධක අරමුදලක් බවට 2014 ඔක්තෝබර් 30 දින කම්කරු කොමසාරිස් විසින් සහතික කර තිබුණි. මෙම අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහයේ 4 ( i ) වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ භාරකාර මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා (භාරකාර මණ්ඩලයේ සභාපති), අරමුදලේ සභාපති විසින් අධ්‍යක්ෂවරු අතරින් නම් කළ සාමාජිකයින් 02 ක් හා අරමුදලේ සාමාජිකයින් අතරින් මහා සභාවේදී පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කළ අරමුදලේ සාමාජිකත්වය නොදරන නිලධාරින් දෙදෙනෙකුද ඇතුළුව සාමාජිකයන් 07 ක ගෙන් සමන්විත විය යුතු වුවද සභාපති විසින් තේ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනා 2023 ජූලි 31 විගණන දින විටත් භාරකාර මණ්ඩලයට පත්කර නොතිබුණි.

(ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් 2017 සහ 2018 වර්ෂයන්හිදී මණ්ඩලයේ ගණකාධිකාරීන් දෙදෙනෙකු සහ කර්මාන්තශාලා නිලධාරීන් තිදෙනෙකු විසින් සිදුකර තිබුණු මූල්‍ය වංචාවන් හේතුවෙන් අහිමි වූ මුදල ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ රු. 10,299,327 ක ණයගැති ශේෂයක් වර්ෂ 05 කට වැඩිකාලයක සිට පවතින නමුත් අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ විශේෂ ව්‍යාපෘති යටතේ දේශගුණික විපර්යාස සඳහා තේ ශාකයේ අනුවර්තීය ප්‍රතිචාර අධ්‍යයනය කිරීම සඳහා 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් උපකරණය, (Walk in Type Environmental Controlled Facility) අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීම හා එහි ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමින් නොපැවතීම මත වසර 5 ක් ගතවී තිබුණද පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගතව සිට නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2022 වර්ෂය අවසානය වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඉ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහ තේ මණ්ඩලයට තේ විකුණුම් මත ලැබිය යුතු රු.527,414 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට ශාන්ත කුම්බස් වතුයායේ විවිධ ණයගැති ගිණුමෙහි ඇතුළත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017 , 2018 හා 2020 වර්ෂයන්හිදී රබර් පැළ සිටුවීම, තේ අලෙවිසැලක් සඳහා වන පිරිසැකසුම් කරන ලද කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීම සහ ලිපිගොනු රාක්කයක් පිළියෙල කිරීම යන කාර්යයන්ට අදාළව කෙරීගෙනයන වැඩ ගිණුමේ පැවති රු.1,296,164 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද, වැඩ අවසන් කර ගිණුම් වලට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මහා භාණ්ඩාගාරය වෙත නිරවුල් කළ යුතු වසර 03 ක් ඉක්මවා තිබුණු පිළිවෙලින් රු. 480,000 ක සහ රු. 699,717 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබුණු අතර යාන්ත්‍රීකරණය සම්බන්ධයෙන් වූ විශේෂ ව්‍යාපෘතිය (Special project on Mechanization) සඳහා 2018 වර්ෂයේදී අතිරේකව වියදම් වූ රු. 110,224 ක මුදල මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද විගණන දින වන විටත් එය ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශාන්ත කුම්බස් වතුයායේ විවිධ තොග සැපයුම්කරුවන් වෙත වර්ෂ 02 සිට 10 දක්වා ගෙවිය යුතු එකතුව රු. 1,906,780 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(එ) ශාන්ත කුම්බිස් වතුයායේ චෙක් රෝල් සේවකයින් සඳහා ලබා දී ඇති උත්සව අත්තිකාරම් සහ අනෙකුත් විශේෂ අත්තිකාරම් නැවත අයකර ගැනීමට නොහැකිවීම මත රු. 937,102 ක ලැබිය යුතු ශේෂයක් 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතියද, එය අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ඉහත ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. 912,696 ක් හඳුනාගැනීම සඳහා උපලේඛන නොමැති බවද නිරීක්ෂණය විය.

(ඒ) තේ පර්යේෂණ ආයතනයට අයත් තලවකැලේ ලැමලියර් වතුයායේ හෙක්ටයාර 1.367 ක භූමි ප්‍රමාණය, කර්මාන්තශාලාව හා සියලුම ගොඩනැගිලි 2003 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලපරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම මත 2016 වර්ෂයේදී අදාළ දේපළ නැවත අත්පත් කරගෙන තිබුණු නමුත් අත්පත්කරගත් දින සිට 2023 ජුනි 07 දින දක්වා එනම් වසර 07 ක් ඉකුත් වී ඇතත් එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඔ) ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමණාකරන තොරතුරු පද්ධතියක් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විස් ලිමිටඩ් වෙත 2020 අප්‍රේල් 22 දින රු.4,228,700ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී 2020 අගෝස්තු 20 දින රු.1,141,749 ක අත්තිකාරම් මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි.සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන අනුව ඇණවුම් නිකුත් කළ දිනයේ සිට දින 120 තුළ වැඩ අවසන් කළ යුතු වුවද, 2023 ජුනි 30 වනවිට වසර 3ක් ඉක්මවා ගියද එහි ප්‍රගතිය සියයට 51ක් පමණක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඕ) මණ්ඩලයේ අභ්‍යන්තර පාලන නිර්දේශ අනුව කර්මාන්තශාලාවේ විවිධ අදායම් මඟින් එහි කිසිදු වියදමක් දැරිය නොහැකි අතර රු.500,000 ක රක්ෂණාවරණ සීමාව ඉක්මවා යන්නේනම් එදිනම හෝ එසේ නොමැතිනම් සතියකට එක වතාවක් හෝ බැංකු ගත කිරීම කළ යුතු වුවද, 2022 දෙසැම්බර් මාසයේ ශාන්ත කුම්බිස් කර්මාන්තශාලාවේ දිනපතා එකතු වූ මුදල් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී, රු.1,268,935ක එකතු වූ මුදල්, එම දිනයේ සිට තැන්පත් කරන දින දක්වා දින 5 සිට දින 16ක කාලයක් කර්මාන්තශාලවේ රඳවාගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(ක) මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජොෂ්ඨ කළමණාකරන තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 23 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානී තනතුරු 04 ක්ද ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 11 ක්ද ප්‍රධාන උපදෙස් නිලධාරී තනතුරු 05 ක්ද අභ්‍යන්තර උසස්වීම් මඟින් පිරවිය යුතු වුවද වර්ෂ 03 කට වැඩි කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ග) මණ්ඩලයේ මෙහෙයුම් සහ උපදෙස් නිලධාරී තනතුරුවලින් සියයට 52 ක්ද තාක්ෂණ හා තාක්ෂණික නොවන කළමණාකරන සහකාර තනතුරුවලින් සියයට 42 ක්ද ප්‍රාථමික මට්ටමේ

(ප්‍රහුණු) තනතුරු වලින් සියයට 55ක් ද ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) තනතුරු වලින් සියයට 46ක්ද පුරප්පාඩුව පැවතුණි.එමෙන්ම ජ්‍යෙෂ්ඨ අධ්‍යාන හා පර්යේෂණ නිලධාරි තනතුරු 17 ක් හා අධ්‍යාන හා පර්යේෂණ නිලධාරි තනතුරු 27 ක් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් ඉන් තනතුරු 5ක් හා 14ක් පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරු වල පුරප්පාඩුව වීම ආයතනයේ පර්යේෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි ඍජුව බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ජ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබුණු දින 180 ඉක්මවූ සේවකයින් 93 කට 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද එම සේවකයින් මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඣ) මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද අවසන් කර නොතිබුණි.



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති